# නිර්ඝාත ගෝලීය දේශපාලන විද්‍යාව

# නිර්ඝාත ගෝලීය දේශපාලන විද්‍යාව

**ග්ලෙන් ඩී. පේජ්**

*පරිවර්තනය*

**සුනිල් විජේසිරිවර්ධන**

සර්වෝදය

**විශ්ව ලේඛා**

ප්‍රකාශකයෝ

**41 ලුම්බිණි මාවත රත්මලාන**

ප්‍රථම මුද්‍රණය 2004

ISBN 955-599-389-0
© සුනිල් විජේසිරිවර්ධන
කංචුක නිර්මාණය: අර්ජුන ක්‍රිෂ්ණරත්න

මුද්‍රණය

විශ්ව ලේඛා

41 ලුම්බිණි මාවත රත්මලාන

රිචඩ් සී. ස්නයිඩර්
1916 – 1997

එච්. හියුබට් විල්සන්
1909 – 1977

දේශපාලන විද්‍යාඥයින්, ගුරුවරුන්
සහ මිතුරන් වෙත

තමන්ගේ පුරෝගාමීන් අමතක කරන්නට
පැකිලෙන විද්‍යාවක් අතරමං වන්නේය.

\- ඇල්ෆ්‍රඩ් නෝර්ත් වයිට්හෙඩ්

# පටුන


* ප්‍රකාශක සටහන xi
* පෙරවදන xv
* ස්තුතිය xviii
* පරිවර්තක සටහන xxii
* හැඳින්වීම – නිර්සාත ප්‍රතිපදාවේ විද්‍යාවෝ xxiii

1 පරිච්ඡේදය
**නිර්සාත සමාජයක් ඇතිවිය හැකිද?** 1

2 පරිච්ඡේදය
**නිර්සාත සමාජයක් සඳහා හැකියා – අවස්ථා** 31

3 පරිච්ඡේදය
**දේශපාලන විද්‍යාව සඳහා ගම්‍යමාන** 89

4 පරිච්ඡේදය
**ගැටළු විසඳීමේ ගම්‍යමාන** 123

5 පරිච්ඡේදය
**ආයතනික ගම්‍යමාන** 156

6 පරිච්ඡේදය
**ගෝලීය නිර්සාත දේශපාලනය** 179

උපග්‍රන්ථය A 203

උපග්‍රන්ථය B 205

උපග්‍රන්ථය C 208

උපග්‍රන්ථය D 213

ආශ්‍රිත ග්‍රන්ථ 221

# ප්‍රකාශක සටහන

මෙය **"Non-Killing Global Political Science"** නමැති ග්‍රන්ථයේ සිංහල පරිවර්තනයයි. සමාජ සම්මුතියට ප්‍රතිවිරුද්ධ යමක් ප්‍රකාශ කිරීම සඳහා අසාමාන්‍ය චිත්ත ධෛර්යයකුත් සුවිශේෂ ආත්ම විශ්වාසයකුත් තිබිය යුතුයයි ඉංග්‍රීසි භාෂාවෙන් පළ වූ ඉන්දියානු සංස්කරණයට පෙර වදනක් සැපයූ එන්. රාධක්‍රිෂ්ණන් මහතා විසින් පවසා ඇත. එහි ගැබ්වූ සත්‍යතාවය පිළිබඳ අත්දැකීම් සම්භාරයක් ගෙවී ගිය දශක සතරකට වැඩි කාලයකදී සර්වෝදය ඉතිහාසය තුළින් මම අත් දුටුවෙමි. මූලික අවධියේදී සර්වෝදය දැක්ම හා ක්‍රියාකාරීත්වය දිහා වපරැසින් බැලූ පිරිස අද සර්වෝදය යාවජීව සාමාජිකයින් බවට පත්ව සිටිති. එද පැවති සමාජ සම්මුතිය නිසා පීඩාවට පත්වූ හා පසුව සර්වෝදය මාර්ගයෙන් හිස ඔසවාගත් ගැමියෝ අද ගම්මාන 15,000ක් පුරා ජීවත් වෙති. ඔවුහු මිනිස් වටිනාකම් වර්ධනය කරගෙන ආත්ම ගෞරවයකින් යුතුව දෙපයින් නැඟී සිටීමට සමත්ව සිටින්නාහ.

සර්වෝදය පිළිබඳ මා දුටු සිහිනයට සමාන සිහිනයක් මහාචාර්ය ග්ලෙන් ඩී. පේජ් මහතා විසින් ද දකිනු ලබන බව මේ පොත කියවීමේදී මට හැඟී ගියේය. මිනිස් ඝාතනවලින් තොර ගෝලීය සමාජයක් ඇතිකර ගත හැකිවේද? බුදු දහම අදහන බෞද්ධ සංස්කෘතියක් තුළ හැදුණු වැඩුණු අපට එය කළ හැකි බව පැකිළීමකින් තොරව ප්‍රකාශ කිරීම අසීරු නොවේ. බුදු දහමේ පළමු ශික්ෂාපදය ආරක්ෂා කිරීමට හා පිළිපැදීමට ලෝකවාසී වැඩි දෙනා ප්‍රතිඥා දෙන්නේ නම්, මහාචාර්ය පේජ් මහතාගේ සිහිනය සැබෑවීම සිකුරුය.

කාලිංග දේශයේදී කළ බිහිසුණු මිනිස් සංහාරයෙන් පසුව බෞද්ධයෙකු වූ අශෝක අධිරාජ්‍යයාගේ හදවත කරුණාවෙන් තෙත්වූ පරිද්දෙන්ම 1950 දශකයේ පැවති කොරියානු සංග්‍රාමයට සහභාගි වූ උසස් හමුදා නිලධාරියෙකු වූ පේජ් මහතා, මිනිස් ඝාතනවලින් තොරව ප්‍රශ්න විසඳගත හැකි මාර්ගයක් සෙවීමට උත්සුක විය. මේ පිළිබඳ වැඩිදුර කරුණු හැදෑරීමට ඔහු තෝරා ගත්තේ අශෝක අධිරාජ්‍යයාගේ නිජබිම වූ මහා භාරතයයි. පසුව ඔහුගේ අවධානය

යොමුවූයේ අහිංසා දේශපාලනයේ පුරෝගාමියා වූ මහත්මා ගාන්ධිගේ ඉගැන්වීම් වෙතය. එතුමාගේ අහිංසාවාදී ක්‍රියා පිළිවෙත පේජ් මහතාගේ විප්ලවකාරී අදහසට නව පණක්, නව ජවයක් ලබා දුන්නේය.

මුල් කාලයේදී පේජ් මහතාගේ අදහස කෙරෙහි ජනතාව දැක්වූයේ සැකමුසු අවඥා සහගත ආකල්පයකි. එහෙත් පසුකාලයක සමාජ දේශපාලනයෙහි ඇති වූ වෙනස්කම් නිසා පේජ් මහාචාර්යවරයාගේ විරෝධාර ප්‍රයත්නයන් අගය කිරීමට සැදී පැහැදී සිටින පිරිසක් ද බිහිවූ බව පෙනේ. "අහිංසාවාදී දේශපාලන විද්‍යාව: දමරික කාලසීමාවක් තුළින්" යන පේජ් මහතාගේ කෘතියක් පිළිබඳ විග්‍රහයක යෙදෙන මහාචාර්ය ජොහාන් ගල්තුං මෙසේ පවසයි. "වහල් භාවය පැවති කාලයේදී සම්මත සමාජ දර්ශනය වූයේ වහල්භාවය සාමාන්‍ය දෙයක් බවත්, එය මිනිස් ස්වභාවයේ අංගයක් බවත්ය. ඒ සමයේ විසූ ග්ලෙන් පේජ්ලා නිසැකයෙන්ම මෙවැනි ප්‍රශ්නයක් නඟන්නට ඇතැයි මට සිතේ. "වහල් භාවයෙන් තොර ගෝලීය සමාජයක් ගැන සිතීමට හැකිද?," එද මීට ලැබුණු පිළිතුරට සමාන පිළිතුරක්, ග්ලෙන් මහතා අද නඟන ප්‍රශ්නයට ද ලැබිය හැකිය. එද "සාධාරණ වහල් භාවයක්" ගැන මත වාදයක් ඉදිරිපත් කළ විද්වතුන් සිටි බවද අපට අමතක කළ නොහැකිය.

**නිර්ඝාතක ගෝලීය දේශපාලන විද්‍යාව** නමින් සිංහලෙන් හඳුන්වා දෙනු ලබන මේ පොත, සංස්කරණය සඳහා දශක තුනක කාලයක් ගතවීම මවිතයට කරුණක් විය නොහැක. තමාගේ අදහස කෙරෙහි පේජ් මහතා තුළ වූ කැපවීම මින් මොනවට පැහැදිලි වේ. මේ කාලය තුළ පේජ් මහතා විසින් කරන ලද පර්යේෂණ, භාවනා, වාද විවාද ආදියට ලොව සිටි ඉහළම විද්වතුන් සහභාගි වූ බව වාර්තාවේ.

සමහර විට මේ ග්‍රන්ථය, ප්‍රකාශන ක්ෂේත්‍රයේ කැපී පෙනෙන සටහනක් සනිටුහන් කරනු ඇත.

තමන් ඉදිරිපත් කළ අදහස ක්‍රියාත්මක කළ හැකි බවට පේජ් මහතා තර්ක විතර්ක ඉදිරිපත් කරන්නේ පුදුම ආත්ම විශ්වාසයකින් යුතුවය. ඝාතනය මිනිසාට හා සමාජයට ආවේණික වූ ස්වභාවයක් බවට ඉදිරිපත් කෙරෙන මතවාදවල කිසිම හරයක් නොමැති බව ග්ලෙන් ඩී. පේජ් මහතා මේ පොතින් පැහැදිලිව විස්තර කර දෙයි.

මේ පොත දැනට දෙමළ භාෂාව ඇතුළු භාෂා දෙළහකට පරිවර්තනය කර ඇත.

දශක තුනක කාලයක සිට ග්ලෙන් ඩී. පේජ් මහතා මම හොඳින් දනිමි. එතුමාගෙන් බොහෝ දේ මම ඉගෙන ගතිමි. මේ පොත ප්‍රකාශයට පත්කිරීමට ලැබීම එක් අතකින් කෘතගුණ සැලකීමකි. බොහෝ මහන්සියෙන් පොත පරිවර්තනය කළ සුනිල් විජේසිරිවර්ධන මහතාට අපි පින් දෙමු. එසේම සෝදුපත් බලා නොයෙක් අයුරින් උදව්කළ පියසේන වික්‍රමගේ හා පී.බී. නවරත්න මහතුන්ටත් සර්වෝදය විශ්ව ලේඛාවේ සේවක සේවිකාවන්ටත්, කලට වෙලාවට පොත මුද්‍රණය කරදුන් විශ්ව ලේඛා ආයතනයටත් පින් දෙමු.

**ඒ.ටී. ආරියරත්න.**
සභාපති
ලංකා සර්වෝදය ශ්‍රමදාන
සංගමය.

# පෙර වදන

විද්‍යාර්ථින්ගේ සිට ඉහළ මහාචාර්යවරුන් දක්වා ලෝකය පුරා වූ දේශපාලන විද්‍යා ශාස්ත්‍රඥයින්ගේ අවධානය සහ විචාරාත්මක අවලෝකනය සඳහා මේ කෘතිය ප්‍රධාන කොටම සම්පාදනය වී ඇත. දේශපාලන න්‍යාය සහ භාවිතාව තුළ ඝාතනය මනුෂ්‍ය පැවැත්මේ අනිවාර්ය කොන්දේසියක් වශයෙන් ව්‍යාප්තව භාර ගැනීමේ තත්වය වයස හෝ පාණ්ඩිත්‍යය සමග සම්බන්ධ නැති බව පෙනී යයි. මෙකී පිළිගැනීම ප්‍රශ්න කිරීමටත්, නිර්ඝාත ගෝලීය අනාගතයක් උදෙසා සිතීමේ සහ ක්‍රියාවේ ගල්පඩි තවදුරට ඉදිකරන්නටත් මගේ පාඨකයින් ඉදිරිපත් වනු ඇතැයි යන්න මගේ අපේක්ෂාවයි.

Nonkilling (නිර්ඝාතය) යන යෙදුම, නමේ සඳහන් වන්නාවූ ඉංග්‍රීසි භාෂාවෙන් රචිත ප්‍රථම කෘතිය මෙය විය යුතුය. මෙම යෙදුම අසම්ප්‍රදායයිකය. එය "සාමය" සහ "අහිංසාව" යන සංකල්පවලින් ඔබ්බට, මනුෂ්‍ය ජීවිතය කඩ කිරීමේ සාධක වෙතට, අවධානය තියුණු ලෙස නාභි ගත කිරීමට උත්සාහ කරයි. බොහෝ දෙනෙකුගේ ආරම්භක ප්‍රතිචාරය විය හැක්කේ නිර්ඝාත ප්‍රතිපදාව කෙරේ නාභිගතව යොමුවීම වඩාත් වැදගත් ගැටළුවලින් අවධානය ඉවත් කරන සුළු, ඍණාත්මක, පටු ආස්ථානයක් වන බවයි. සමහර විට ගාන්ධිගේ අහිංසා සංකල්පය (නිර්ප්‍රචණ්ඩත්වය, සිතිවිල්ලෙන්, වචනයෙන් හා ක්‍රියාවෙන් හිංසා නොකිරීම), නිර්ඝාත සංකල්පයෙන් ආදේශ කළහොත් ප්‍රචණ්ඩත්වයට එරෙහි වර්ධනයන්ගේ පසුබෑමක් ද වේ යැයි ඔවුන් සිතනු ඇත.

එහෙත්, සමහරවිට, ඝාතනය සියළුම ප්‍රචණ්ඩත්වයේ ප්‍රභවය සහ පෝෂක මූලාශ්‍රය ලෙස කරුණු සහිතව පෙන්වා දෙනු ලැබී නම්, ගාන්ධි ද, අහිංසාවාදී දේශපාලන විද්‍යාව ඉදිරියට ගෙන යෑමට නිර්ඝාත සංකල්පයේ වැදගත් කම ඒත්තු ගන්නට තිබිණැයි මම සිතමි. එය මිනිස් ජීවිතය සොරා ගැනීමේ දේශපාලනයේ සිට මිනිස් ජීවිතය ආරක්ෂා කිරීමේ හා තහවුරු කිරීමේ දේශපාලනයක් කරා ගමන් කිරීමකි.

මේ කෘතිය ඉදිරිපත් කර සිටින ප්‍රවාදය නම් නිර්ඝාත ගෝලීය සමාජය සඳහා හව්‍යතාවක් ඇති බවත්, දේශපාලන විද්‍යා ශාස්ත්‍ර ධාරාවේ සහ එහි සමාජ භූමිකාවේ පරිවර්තනයන් මගින් එකී අනාගතය උදා කිරීමට ආධාර විය හැකි බවත්ය. මනුෂ්‍ය ස්වභාවයේ සහ සමාජ ජීවිතයේ අනිවාර්ය ලක්ෂණයක් ලෙස ඝාතනය සංකල්පගතවීම දේශපාලන අධ්‍යයනයන් සහ භාවිතාවන් විසින් භාරගනු ලැබීම පහත දැක්වෙන පරිදි ප්‍රශ්නයට බඳුන් කෙරේ; ප්‍රථමයෙන් මනුෂ්‍යයන් වනාහි ජීව විද්‍යාත්මකව සහ තත්වාරෝපණය හේතුවෙන් ඝාතනයට හෝ නිර්ඝාතයට එකසේ හැකියාවක් පෙන්වන බව පිළිගනු ලැබේ. දෙවනුව, මාරක හැකියාවන් තිබෙන්නේ වුවද අති බහුතරයක් මිනිසුන් මිනීමරුවන් නොවූ බව හා නොවන බව නිරීක්ෂිතය. තෙවනුව, සමාජ ආයතන පුළුල් පරාසයක් හරහා, නිර්ඝාත හැකියාවන්, දැනටමත් සංනිදර්ශනය කොට තිබේ. ඒවා නිර්මාණශීලීව සංයෝජනය කිරීමෙන් සහ අනුවර්තනය කිරීමෙන් නිර්ඝාත සමාජ උදකර ගැනීම සඳහා සංරචක දයකත්වයන් ඇති කර ගත හැකිය. සතර වෙනුව,ඝාතනයේ හේතු ප්‍රත්‍යයන්, නිර්ඝාත පැවැත්මේ හේතු ප්‍රත්‍යයන්, ඝාතනයේ සිට නිර්ඝාත තත්වය දක්වා සංක්‍රාන්තියේ හේතු ප්‍රත්‍යයන් දැනට පවත්නා සහ අපේක්ෂිත විද්‍යාභිවර්ධනය නිසා ප්‍රාමාණික වශයෙන් අවබෝධ කර ගැනීමට හැකිවීමේ තත්වය නිර්ඝාත පරිවර්තක මැදිහත් වීම් සඳහා ප්‍රබල ආධාරකයක් වේ. පස්වෙනුව, දේශපාලන විද්‍යාවේ සහ දේශපාලන භාවිතයේ පදනම වශයෙන් මාරක මනුෂ්‍ය ස්වභාවය පිළිබඳ සම්මුතීන් භාර ගැනීමම, එකී ශාස්ත්‍රීය විෂය ධාරාවේ මූලික රාමුවම ප්‍රශ්නයට භාජනය කරන සුළුය. සයවෙනුව, ප්‍රජා සහ ගෝලීය ජීවිතයෙන් මාරකත්වය ඉවත් කිරීමේ තත්වයන් කරා ළඟාවනු පිණිස, නිර්ඝාත සමාජ පරිවර්තනයක් සඳහා මනුෂ්‍යයාට හැකියාවක් නැතැයි මේ දක්වා පිළිගන්නා දේශපාලන විද්‍යාඥයින් වෙත පහත දැක්වෙන ආරාධනය කරනු ලැබේ; උද්ගාමී සහ නිගාමී සංරචක සංයෝජනය කරමින් ශුද්ධ න්‍යායික ව්‍යායාමයක් ලෙස මෙකී හව්‍යතාවය පිළිබඳ ගැටළුව අධ්‍යයනය කිරීමට එකතු වන්න. කල්පිත විශ්ලේෂණය සහ භූමිකා රංගනය යන ක්‍රමවේද, විශ්වාස කරන්නන් මෙන්ම අවිශ්වාස කරන්නන් විසින් ද මෙහෙයේ යොදවනු ලබන්නේ නම් නිර්ඝාත පරිවර්තනයේ ශාස්ත්‍ර

අභිවෘද්ධියට මහත් රුකුලක් වනු ඇත. න්‍යෂ්ටික අවිහරණය සඳහා වූ ව්‍යාපාරයන් විසින්, ප්‍රජා සහ ගෝලීය පරිමාණ තුළ, සීමිත සහ ව්‍යාප්ති න්‍යෂ්ටික යුද්ධ අවස්ථාවන් ගැන කරන ලද න්‍යායික සහ ආදර්ශනගත ගවේෂණ ඉතා සාර්ථක ප්‍රතිඵල පෙන්වූහ. ඒ ආකාරයටම, නිර්ඝාතය සහ ප්‍රචණ්ඩත්වය භාර ගන්නා දේශපාලන විද්‍යාඥයන් දෙපිරිසටම ගෝලීය ජීවිතය තුළ නිර්ඝාත තත්ත්වයන් උදාකර ගැනීමට අදාළ පූර්ව–සාධක, ක්‍රියාවලීන් සහ කැපවීම්වල බලපෑම් ගැන විචාරාත්මක සහ නව්‍යකාරී ගවේෂණයන් සඳහා අත්වැල් බැඳ ගත හැකිය.

මේ කෘතිය දේශපාලන විද්‍යාව හදාරන සහ භාවිතා කරන අය සඳහා යොමු කරනු ලැබුවත්, සියළුම ශාස්ත්‍රධාරාවන්ගේ සහ වෘත්තීන්ගේ සොයා ගැනීම් සහ දායකත්වය රහිතව නිර්ඝාත සමාජ උදා කර ගත නොහැකි වන බව පැහැදිලිය. හාවාඩ් හි සමාජ විද්‍යාඥයෙක් වන පිතිරිම් ඒ. සරෝකින් ගේ The Ways and Power of Love (**ආදරයේ ස්වභාවයන් සහ බලය** – 1954) යන කෘතිය පරාර්ථකාමී ආදරය පිළිබඳ ව්‍යවහාරික විද්‍යාවක් ගොඩනැගීම දෙසට පිය නබමින් ඉහත කරුණට දීප්තිමත් උදහරණයක් සපයයි. අපට, නිර්ඝාත ස්වභාවික විද්‍යාවන් සහ ජීව විද්‍යාවන් ද, නිර්ඝාත සමාජ විද්‍යාවන් ද, නිර්ඝාත මානව ශාස්ත්‍ර ද, නිර්ඝාත වෘත්තීන් ද සහ සමාජයේ සෑම තරාතිරකම නිර්ඝාත මිනිසුන් ද අවශ්‍යය. තවදුරටත් කියන්නේ නම්, අතීත සහ වර්තමාන මනුෂ්‍ය හැකියාවන්ගේ පූර්ණ පරාසය අවබෝධ කර ගැනීමට නම්, අප ප්‍රජා සන්දර්භයන් සහ සංස්කෘතීන්ගේ සීමාවෙන් ඔබ්බට පියමන් කරමින් දැනුම සහ අත්දැකීම් බෙදා හදා ගත යුතුය. ප්‍රතිමානක වශයෙන් සංවේදී වීමට, සංජානනමය වශයෙන් නිරවද්‍ය වීමට, සහ ප්‍රායෝගික වශයෙන් අදාළ වීමට සංකල්පනාත්මකව සහ ව්‍යවහාරිකව නිර්ඝාත දේශපාලන විද්‍යාව ගෝලීය විය යුතුය.

# ස්තුතිය

මේ පොත බිහිවීම සඳහා, අතීතයේ ජීවත් වූ සහ වර්තමානයේ ජීවත්වන බොහෝ දෙනා, ඔවුන්ගේ දැනීම ඇතිව ද එසේ නැතිව ද අප්‍රමාණ ලෙස දායක වී ඇත්තාහ. ඒ සියළු දෙනා වෙත මගේ ණයගැතිභාවයේ ගැඹුර සහ පළල ප්‍රකාශ කිරීමට වචනවලට නොහැකිය. මේ ගැන සුළු ඉඟියක් මේ සටහනින් ද ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය තුළින් ද ප්‍රකාශ වේ. මම හවායි හි ජනතාවට කෘතඥ වෙමි. ඔවුන්ගේ ශ්‍රමය මෙම ශාස්ත්‍රීය චාරිකාවට පිටුබලයක් ම විය. 1978–1992 කාලය තුළ උපාධි අපේක්ෂක පාඨමාලා සහ උපාධි සම්මන්ත්‍රණ තුළ "අහිංසාවාදී දේශපාලන විකල්පය" පිළිබඳ ගවේෂණය සඳහා දේශ–දේශාන්තරවලින් පැමිණි හවායි විශ්ව විද්‍යාලයේ සිසුන්ට ද මගේ ස්තුතිය හිමිවේ. ඔවුන'තර සිටි, පසුව ආචාර්ය උපාධි පර්යේෂකයන් බවට පත්ව, අනතුරුව ශාස්ත්‍රීය සේවය සඳහා විවිධ ස්ථාන බලා පිටත් වූ ෆ්‍රැන්සිස් බ්ලූම්, චයිවාට් සතානන්ද් සහ මහපාඩෝ ඒ. මුස්ලිම් විශේෂයෙන් මතක් කරමි.

මේ පොත සම්පාදනයේදී, ප්‍රින්ස්ටන්හි දේශපාලන විද්‍යා ශ්‍රේෂ්ඨ ගුරුවරුන් දෙපළකගේ ආභාසය ලැබුණු බව මා දැනුවත්ය. ඔව්හු නම් රිචඩ් සී. ස්නයිඩර් සහ එච්. හියුබට් විල්සන්ය. විද්‍යාව පිළිබඳ ගෞරවය, අන්තර්විෂයික පර්යාලෝකය, විකල්පයන් අතර තෝරා ගැනීමට ඇති හැකියාව දේශපාලනයේ හරය වේය යන හැඟීම, සෑම මට්ටමක අධ්‍යාපනය පිළිබඳ උනන්දුව, සහ වටිනාකම් පිළිබඳ අවධාරණය – වටිනාකම්, ප්‍රක්ෂේප ලාම්පුවක් මෙන් අඳුරුව සැඟ වී ඇති දේ නිරාවරණය කිරීමට යොදා ගත හැකිය යන දැනීම යනාදිය සම්බන්ධයෙන් ස්නයිඩර් හට කෘතඥතාපූර්වක ගෞරවය හිමිවේ. නිදහස් සහ සාධාරණ සමාජයක් උදා වීමට නම් ශාස්ත්‍රඥයින් සහ පුරවැසියන්, තමන්ට හුදකලාව සිට ගන්නට සිදු වුවත්, තමන් දකින සත්‍යය ගැන විවෘතව කතා කිරීමට සූදානම් විය යුතුය යන උදාහරණය ජීවමානව පෙන්වීම සම්බන්ධයෙන්, විල්සන් වෙත, පසුව ගාන්ධි වෙතට ද යොමු වන, මගේ කෘතඥතාපූර්වක ගෞරවය හිමිවේ.

ශාස්ත්‍රාලීය ප්‍රජාවට ඔබ්බෙන් සිටින බොහෝ දෙනෙකු සැම ශාස්ත්‍රඥයෙකුටම මෙන් මටද උපදේශනයේ සහ අනුප්‍රාණයේ මූලාශ්‍ර වී ඇත; තුල්සි සහ මහාප්‍රඥා යන ආචාර්යවරුන් ට ද, ෆිලිප් ජේ. බෙන්ට්ලි නම් වූ රාබිතුමාට ද, සිඩ්නි හින්ක්ස් පූජක තුමාට ද, දයිසකු ඉකේඩා (ජ්‍යෙෂ්ඨ) සහ ඇනා මැකනානි ටද, දෙබූම් තුල්කු ලාමාතුමාට ද, ජෝර්ජ් සබෙල්කා පියතුමාටද, අබ්දුර් රහමන් වහීඩ් හට ද වශයෙන් අධ්‍යාත්මික ගුරුවරුන් රාශියක් වෙත මගේ ගෞරව ප්‍රණාමය පුද කරමි. ස්වභාවික විද්‍යා, ජීව විද්‍යා සහ සමාජ විද්‍යා ක්ෂේත්‍රවල පහත කියැවෙන විද්වතුන් විශේෂයෙන් කෘතඥතා පූර්වකව මතක් කරමි; ආන්න් වුංසි, වුං යුන්ජේ, ජේම්ස් ඒ. ඩේටර්, ජොහාන් ගල්තුං, පියරෝ ගියෝර්ගි, හොන්සන් වික්, ලී ජේ–බොන්ග්, බ්‍රයාන් මාටින්, රොනල්ඩ් එම්. මැකානි, බෘස් ඊ. මෝටන්, කිංහයිඩ් මූෂකෝජි, යෙරෙමි පාර්නොව්, ඉල්යා ප්‍රිගොගින්, තෝමස් රැම්සේ, ඊ යොං–පීල්, හිරොහාරු සේකි, විලියම් ස්මීර්නොව්, ලෙස්ලි ඊ. ස්පොන්සල්, ජීනේ ෂාප්, සහ රැල්ෆ් සුමී. මානව ශාස්ත්‍ර විද්වතුන් අතර මගේ ස්තුතිපූර්වක ප්‍රණාමය වෙසෙසින් පහත අයවලුන් වෙත පිරිනැමේ; ඒ.එල්. හර්මන්, රිචඩ් එල්. ජොන්සන්, මයිකල් එන්. නගලර්, චාමන් නහාල්, ජෝර්ජ් සිම්සන්, තත්යානා යාකුෂ්කිනා සහ මයිකල් ට්රූ. මා මෙහිලා සිහි කළ යුතු පුස්තකාලයාධිපතිවරුන් දෙදෙනෙකි; රූත් බින්ස් සහ බෘස් ඩී. බොන්ටා යන දෙදෙනාය. දේශපාලන සහ සමාජ නායකයින් අතුරින්, ජේම්ස් වී. ඇල්බර්ටිනි, එම්. ආරාම්, ඒ.ටී. ආරියරත්න, ඩැනිලෝ ඩොල්සි, ග්විත්ෆෝර් ඒවන්ස්, හ්වං යන්–සොප්, පෙට්රා කේ.කේලි, ජීන් සඩාකෝ කිං, මයිරොඩ් කොරිගන් මැගුවා, අබ්දුල් සලාම් අල්මජාලි, රොනල්ඩ් මැලෝන්, උර්සුලා මැලෝන්, අන්දොස් පෙස්ත්‍රානා, ඊවා ක්විස්ටෙරප්, ෂිගු, ඉක්‍රම් රබානි රානා, සුලක් ශිවරාක්ෂා, සහ ටී.කේ.එන්. උනිතාන් යන අයගේ නම් ස්තුති පූර්වකව මතක් කරමි. අධ්‍යාපනඥයින් අතරින් ජොසෙ වී. අබුයේවා, එන්. රාධක්‍රිෂ්ණන්, ජී. රාමචන්ද්‍රන්, ජොආකින් උරේයා, සහ රිට්ටා වහ්ල්ස්ට්‍රොම් යන අය වෙත ආචාරය පුදමි. අහිංසාවාදී පුහුණුකරුවන් අතර ධර්මානන්ද, චාල්ස් එල්. ඇල්ෆින් (ජ්‍යෙෂ්ඨ), සහ බර්නාඩ් ලාෆයේට් (කනිෂ්ඨ) ද, වෛද්‍යවරුන් සහ චිකිත්සකයන් අතර, තියොං එච්. තාම්, ජීන් ආර්. ලෙබූස්, රැමොන් ලොපෙස් රීයෙස්, රී ඩොන්ෂික්, රෝ ජෙඋන්ග්– වූ සහ වෙස්ලි වොං ද ප්‍රණාම පූර්වකව

සිහි කරමි. නව්‍යකරණයේ විශිෂ්ටයන් අතර, විජේ කේ. භාරද්වා, කාරෙන් ක්‍රොස්, ලැරි ආර්. ක්‍රොස්, වැන්සි එන්ගල්මන්, එස්.එල්. ගාන්ධි, සාරා ගිලියාට්, ලූ ඇන් හාආහියෝ ග්වංසොං, මැන්ෆ්‍රඩ් හෙනින්ග්සන්, තියඩෝර් එල්. හර්මන්, ෂේ හියාන් ලියො, ඇන්තනි ජේ. මාර්සෙල්ලා, රිචඩ් මෝස්, රොමොලා මෝස්, ස්කොට් මැක්වේ, හේලා මැක්වේ, ගෙඩොං බැගෝස් ඕකා, බර්ටන් එම්, සැපින්, ස්ටැන්ලි ෂැබ්, විලියම් ජී. ෂෝ, ජොආන් නැම්බානා, වොල්ඩිමාර් තෝමුස්ක්, ජෝන් ට්‍රෙන්ට් සහ අල්වාරෝ වර්ගාස් යන අයගේ නම් හිස නමා සිහිකරමි.

මෙම කෘතියේ මුල් අත්පිටපත බලා ත්‍යාගශීලී ලෙස විවිධ කෝණවල සිට ප්‍රතිචාර දක්වූ සැමට මගේ ගෞරව ප්‍රණාමය හිමිවේ. ඔවුනතරඃ ආන්න් වුන්ග්-සී, ඒ.ටී. ආරියරත්න, ජේම්ස් මැක්ග්‍රෙගර් බර්න්ස්, චයිවාට් සතා-ආනන්ද්, වැන්සි එන්ගල්මාන්, ජොහාන් ගල්තුං, ලූවිස් ජේවියර් බොයෙට්රො, අමීදියො තොට්නො, එලිසබෙතා ෆොර්නි, ලූ ආන් හාහියා ගුඅන්සොන්, කී හිබර්ට්, තියඩෝර් එල්. හර්මන්, හොන්ග් සූංචික්, එඩ්වර්ඩ් ඒ. කොලොඩ්ජිජ්, රැමොන් ලොපෙස්-රියෙස්, කයික්සියාලු, මයිරෙඩ් කොරිගන් මැගුඩා, බ්‍රියාන් මාටින්, මෙලිසා මැෂ්බර්න්, ජෙවින් ඩී. මොන්ට්ගොමෙරි, බෲස් ඊ.මෝර්ටන්, මුනිමහේන්ද්‍ර කුමාර්, වින්සන්ට්, කේ. පොලාඩ්, ඉල්යා ප්‍රිගොගින්, එන්.රාධක්‍රිෂ්නන්, ෆ්‍රෙඩ්.ඩබ්.රිග්ස්, ජේම්ස් ඒ. රොබින්සන්, බර්ටන් එම්. සැපින්, නම්රථ ෂර්මා, ජෝජ් සිම්සන්, ඩේවිඩ් සින්ගර්, චන්සු සොං, රැල්ෆ් සුමී, කොන්සනත්තින් තියොසොව්, වොල්ඩිමාර් තෝමුස්ක්, මයිකල් ටෲ, එස්. පී. උදයකුමාර්, ටී.කේ.එන්. උනිතාන්, අල්වාරෝ වර්ගාස්, සහ බාඔක්සු ෂාඩ්, වෙති.

1999 පෙබරවාරි මාසයේ දී මුල්ම පිටපත කියවා බැලූ ප්‍රථම පාඨකයා ජේම්ස් ඒ. රොබින්සන්ය. රිචඩ් ස්නයිඩර් සිහිගන්වන සුළු ශාස්ත්‍රඥ සන්ධානමය ගුණයෙන් යුතුව හේ මේ කෘතියට හැඳින්වීමක් සම්පාදනය කිරීම භාර ගත්තේය. ඔහුට මා හද පත්ලෙන්ම ස්තුති කරමි.

අවුරුදු විසිපහක් තිස්සේ මගේ සෑම රචනාවක් හා පොතක්ම ටයිප් කළ ඇ ග්ලෙන්ඩා හට්සුකෝ නයිතො පේජ්ය. ඇය වෙනද මෙන්ම මේ කෘතියේදී ද පරිපාලනමය සහයෝගය ලබා දුන්නාය. ඇ සිය වෘත්තික කටයුතුවල යෙදෙද්දීම බාලි, බැංකොක්, බෙයිජිං,

බර්ලින්, බ්‍රිස්බේන්, හිරෝෂිමා. ලන්ඩන්, මොස්කව්, නවදිල්ලිය, නිව්යෝර්ක්, පැරිස්, ප්‍රොවින්සිටවුන්, ප්යොංයැන්, සෝල්, ටෝකියෝ සහ උලාන් බතෝර් යන නගර හරහා වූ නිර්සාත ගවේෂණ චාරිකාවන් සඳහා නොපැකිල එක් වූවාය. මා ඇයට සදාකාලිකව ණය ගැතිය.

කොලම්බියා යුනිවර්සිටි ප්‍රෙස් ආයතනයට විශේෂ ස්තූතියක් හිමි විය යුතුය. ඒ ජෝජ් බර්ගස්ගේ 'Reminiscences of an American Scholar' කෘතියෙන් උපුටනයක් පළ කිරීමට කාරුණික අවසරය ලබා දුන් බැවිනි.

# පරිවර්තක සටහන

මහාචාර්ය ග්ලෙන් පේජ්, සිය පෙරවදනේ ලා, 'nonkilling' යන වදන ඉංග්‍රීසියෙන් ලියැවුණු පොතක නමකට යොද ගත්තා පළමු අවස්ථාව මෙය විය හැකි යැයි කියයි. එහි සිංහල පරිවර්තනය සම්බන්ධයෙන් ද සමාන දෙයක් කිව හැකිය. **නිර්ඝාතය** යන වදන මීත් පෙර යෙදී නැත. එසේ වී ඇත්තේ මහාචාර්යවරයා ඉඟි කරන සංකල්පීය නිඟතම නිසා පමණක් නොව, වර්තමාන ව්‍යවහාරික සිංහල භාෂාවේ එබඳු වදනක් නොමැති හෙයිනි. මේ නිසා nonkilling යන වදන විසින් මේ ග්‍රන්ථයේ ලා සංගෘහිත සංකල්පය ප්‍රමාණවත් ලෙස සංඥා කරන වචනයක් සොයන්නට සිදුවිය. එම වදන හුදෙක් "ඝාතන රහිත" යන අර්ථය පමණක් නොව ඝාතන තර්ජන හෝ ඝාතන බිහි කරන්නා වූ සමාජ-දේශපාලන-සංස්කෘතික ව්‍යුහාත්මක හේතුන් හෝ රහිත යන අර්ථ ද ගැබ් කර ගත යුතුය. නිර්ඝාත යන වදන පැරණි භාෂාවේ ඉඟි ඇසුරින් මා තනා ගත්තෙමි.

ශාස්ත්‍රවන්තයින් සඳහාම එල්ල කෙරුණු ඉතා ඉහළ ගණයේ ශාස්ත්‍රීය ග්‍රන්ථයක්, භාෂාවේ නිරවද්‍යතාවය, සුවිනිශ්චිතභාවය හා සංක්ෂිප්තභාවය ලක්ෂණ කර ගනී. එය පරිවර්තකයෙක් ඉදිරියේ තබන්නේ දුෂ්කර අභියෝගයකි. සිංහල පරිවර්තනය, කෙසේ නමුත්, දේශපාලන විද්‍යාඥයින්ට, විද්‍යාර්ථීන්ට සහ විශේෂඥයින්ට අමතරව, වඩා මානුෂික සමාජයක් වෙනුවෙන් වෙහෙසෙන සියළු සමාජ-සංස්කෘතික ක්‍රියාකාරීන්ගේ අවධානයට යොමු වෙතැයි බලාපොරොත්තු වේ.

මේ ග්‍රන්ථය පරිවර්තනය කරන්නට ලැබීම මගේ සමාජ-සංස්කෘතික ක්‍රියාකාරී ජීවිතයේ භාග්‍යමත් අවස්ථාවකි. එය උදකර දීම සම්බන්ධයෙන් ගෞරව ප්‍රණාමය සර්වෝදය නායක ආචාර්ය ඒ.ටී. ආරියරත්නයන් වෙත පුද කර සිටිමි. ඔහු නිසා පසුගිය වර්ෂ දෙකක පමණ කෙටි කාලයක් තුළ විකල්පයන් නිර්මාණය කිරීමට අදළ දැනුම ගොඩ නැගීම හා සම්බන්ධව සිටින පුමුඛ පෙළේ විදේශික විද්වතුන් කිහිප දෙනෙක් සහ ඔවුන්ගේ කටයුතු සමීපව හඳුනා ගැනීමේ අවස්ථාව මට ලැබිණ.

අපේ රටේ මෙබඳු පොතක පරිවර්තනය බඳු බැරෑරුම් කටයුත්තක් කරන්නට වෙන්නේ අනෙකුත් දහසකුත් කටයුතු මැදය. කලට වේලාවට පරිවර්තන කටයුතු හමාර කර ගන්නට නොහැකි වේ දෝයි යන සැකය නිසා, මේ ක්ෂේත්‍රයේ ප්‍රමාණික පරිවර්තකයින් කිහිප දෙනෙකුගෙන්ම උදව් ලබා ගැනීමට උත්සාහයක් දැරුවෙමි. එහිදී මා මිත්‍ර ආනන්ද වක්කුඹුර මහතා, මෙහි 5 පරිච්ඡේදය පරිවර්තනය කිරීමට සහය දීම භාර ගත්තේය. ඔහු විසින් කරන ලද එම මූලික පරිවර්තනය මට මහඟු ආධාරයක් විය. ඔහුට මගේ ස්තූතිය හිමිවේ.

**සුනිල් විජේසිරිවර්ධන**

# හැඳින්වීම

## නිර්ඝාත ප්‍රතිපදාවේ විද්‍යාවෝ

*Caveat lector* (අවවාදයයි). ඔබ මේ අත දරා සිටින පොත, ලොව පුරා පුළුල් ලෙස කියැවීමට භාජනය වුවහොත්, බැරෑරුම් සැලකිල්ලට භාජනය වුවහොත් ගෝලීය වශයෙන් පිළිගැනෙන ඇතැම් මූලික වටිනාකම් ද, එම වටිනාකම් හැඩ ගස්වන ආයතන පද්ධතීන් ද විප්ලවීය පරිවර්තනයකට හසු කෙරෙනු ඇත. එකී වටිනාකම්, අරමුණු, ප්‍රමුඛතා, අපේක්ෂිත ප්‍රතිඵල, සිද්ධීන් සහ ක්‍රියාවන් මෙන්ම ඒවාට අදාළ ආයතන වනාහී බලය අත්පත් කර ගැනීමටත් බලය ක්‍රියාත්මක කිරීමටත් සම්බන්ධ ඒවා වෙති. “බලය” යනුවෙන් මෙහි ලා අදහස් කෙරෙන්නේ මිනිසුන් තමාත් අනෙක් අය සඳහාත් තීරණ ගැනීම උදෙසා සහභාගි වන්නා වූ ක්‍රියාවලීන් සහ එකී ක්‍රියාවලීන්ට ඔවුන් අනුගත කෙරෙන, අවශ්‍ය නම් බලහත්කාරය ඔස්සේ පවා පැනෙන, බැඳීමයි. (Laswell and Kaplan 1950:75). බලයට අනුබද්ධ වටිනාකම් ආශ්‍රිතව ක්‍රියාත්මක වෙන ආයතන පද්ධතීන් වූ කලී යුද්ධය දියත් කරන්නා වූ සහ පොදු සම්මුතික පිළිවෙත් හා විධානයන්ට එරෙහිව යන අයට ඇතැම් විට මරණය ද ඇතුළත් වන දඬුවම් පමුණුවන්නා වූ ආණ්ඩු සහ එකී තීරකයන් පමණක් නොවේ. එම මාර්මික බල ආයතන සමග අන්තර්-ක්‍රියා කරන්නා වූ, සංවිධිත ව්‍යවසායකයින් විසින් මෙහෙයවනු ලබන ආර්ථිකයන් ද තිබේ. මොවුන්ගෙන් ඇතැමෙක් ධනය නිපදවන්නේ ආයුධ පිළිබඳ නව සොයාගැනීම්වලින්, ඒවා නිපදවීමෙන්, විකිණීමෙන් සහ ඒවා භාවිතා කිරීමේ තර්ජනවලින්ය. එබඳුම විශ්ව විද්‍යාලද වෙති. සමහර ඒවායේවල ඇතැම් නිර්මාණශීලි පර්යේෂකයෝ “ප්‍රරෝධනාත්මක රාජ්‍ය තාන්ත්‍රික” සහ බලකාමී උපායමාර්ග සම්පාදනයේ ලා පර්යේෂණවල යෙදී සිටිති; එමෙන්ම ප්‍රචණ්ඩ ක්‍රීඩා සහ ආශ්වාදන කර්මාන්තයේ යෙදී සිටින පුහුණු ක්‍රීඩකයෝ සහ කලා ශිල්පීහුය; වෛද්‍ය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගෞරවයට පාත්‍ර වූ පුද්ගලයින්ට අයත් රෝහල් හා සායන තුළ ගබ්සාවෙන්ද, සුඛමෘත්‍යු සේවාවන්ගෙන් ද ජීවය ප්‍රචණ්ඩ ලෙස සිඳිනු ලැබේ; ඒ තරම් රහස්‍ය නොවන සමාජ සේවන්

(පුද්ගලික හමුදා) මහජන ආණ්ඩුවලට අභියෝග කරමින් හෝ ඒවායේ අනුග්‍රහය රහසේ නැතහොත් වක්‍රව ලබමින් මාරක අවි නිපද වෙති; ඒවා ඇති පදම් භාවිතා කරති; තමා අතරම ප්‍රචණ්ඩත්වය ඉවසන්නා වූ හෝ දියත් කරන්නා වූ සාමාජිකයන් සහිත පවුල් තුළ නැතහොත් සංස්කෘතීන් තුළ අනුමත මාදිලියට හරස්ව යන අඹු-සැමියන්, දරුවන්, ඥාතීන් ඝාතනය කිරීමට අනුබල දෙනු ලැබේ; එලෙසම ඇතැම් ආගමික සංවිධාන තුළ සම්මත සූත්‍ර, ප්‍රඥාප්තිවලින් බැහැරව යන අනුගාමිකයින් ඝාතනය කිරීමට සූදානම් වූ භක්තිවන්තයෝ සිටිති.

සමාජයේ සෑම ප්‍රධාන අංශයක්ම සිය ප්‍රජාවන් තුළ බල පවත්වන බල ක්‍රියාවලීන් හේතු කොට යම් ආකාරයක බන්ධන ඇති කරයි; බන්ධනයන්ට ලක් වෙයි. කෙසේද කිවහොත් ඒ ඒ කොටස් අනෙක් කොටස් අධීක්ෂණයට ලක් කරයි. යාමනයට ලක් කරයි. මැදිහත් වෙයි. නිරවද්‍ය කරයි. එසේ කරන්නේ ඒ අතර ඇතැම් විට ඝාතනය පවා කැඳවමින්, උදාහරණ ලෙස, රෝහල් සහ සායන තුළ, විනෝදශ්වාදය ආයතන සංකීර්ණ තුළ, සමාගම් හමු තුළ, ඇතැම් විට පවුල් ඉඩකඩම් තුළ හා පල්ලි දේවස්ථාන තුළ පවා, ආරක්ෂක අංශ විසින් පවත්වාගෙන යනු ලබන ආවෘත කාර්යයන් තුළදී මෙන් ධනාත්මක මෙන්ම ඍණාත්මක හේතු ප්‍රත්‍යයයන් සහ ආවරණයන් බිහි කරමින්ය.

ප්‍රමාණික නිරීක්ෂකයන් මෙන්ම සක්‍රිය සහභාගිකයන් ද විසින් වාර්තා කරනු ලබන පරිදි ඝාතනය හෝ ඝාතන තර්ජන ඇතුලත් කර ගන්නා දුරට බල ආයතන සහ වෙනත් සමාජ ආයතන අතර අන්තර්-ක්‍රියාවන් නවීන සහ පශ්චාත් නවීන සමාජ මුහුණ දෙන බරපතල ගැටළු බිහි කරන්නට එක්ව තිබේ.

මහාචාර්ය ග්ලෙන් ඩී. පේජ් මානව කම්කටයුතු තුළ ඝාතනය සහ ඝාතන තර්ජන පුද්ගල, ප්‍රජා හා ගෝලීය පරිමාණයන් ආශ්‍රිත ක්‍රමානුකූල විමසුමකට භාජනය කරයි. එක් අතකින් පොදුවේ බෙදා හදා ගන්නා මානව අධ්‍යාශයන්, ඉල්ලීම්, ප්‍රමුඛතාවන් සහ ආත්ම ගෞරවය පිළිබඳ රාජ්‍ය සහ මහජන අවම පිළිවෙත් සඳහා වූ අයිතිය එක් පසෙකින් තිබෙද්දී, අනෙක් පසින් එකී මූලික අභිමතාර්ථ සමාජ සංවිධානයේ සෑම ඉසව්වක හා තලයක දීම -කුඩා කණ්ඩායම්,

ප්‍රජාවන්, ලෝකයේ ජාතීන් මෙන්ම රාජ්‍යය, ආර්ථික, අධ්‍යාපන, පුහුණු, වෛද්‍ය, සමාජ, ආගමික ආයතනවලින් ද - ප්‍රතික්ෂේප වීම නිසා මතු කෙරෙන ආනුභවික සහ තාර්කික නොපෑහීම සහ නොගැලපීම සංනිදර්ශනගත කිරීම හරහා ඔහු මූල ගැටළු නිර්වචනය කරයි.

මේ ග්‍රන්ථය මේ මොහොතේ එළි දැකීමෙන් ඝාතනයේ ගැටළුව මෑත කාලීන සම්භවයකින් යුක්ත බවක් හෝ එය හඳිසි හඳුනා ගැනීමකට පාත්‍ර වූ බවක් හෝ අදහස් නොවෙයි. එමෙන්ම මේ පොතේ බිහිවීම ශාස්ත්‍රාලීය විද්වතෙක් වශයෙන් ඔහුගේ පරිකල්පනයේ හා කෞෂල්‍යයන්ගේ අහඹු භාවිතාව මත හුදෙක් පදනම් වී ඇති බවක් ද ගම්‍ය නොවේ; ලොව පුරා පිරිමින්ට සහ ගැහැණුන්ට ගැටළු - විසඳීමේ ප්‍රවේශයන් සහ විශ්ලේෂණ උපකරණ පද්ධතියක් හිඟවීම, සෑම මානව ක්ෂේත්‍රයකම සියළු සාරධර්ම කෙරේ ධනාත්මක බලපෑමක් ඇති වන පරිදි, ඝාතනය සඳහා ඇති අවස්ථා සාර්ථක ලෙස අඩු කරමින්, නිර්ඝාතන ජීවන ප්‍රතිපදාවන් මිනිස් අන්තර් - සබඳතා තුළ පෝෂණය කිරීම උදෙසා විකල්ප ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග නිර්ණය කිරීමට සහ සම්මත කර ගැනීමට අපහසු වීම වැනි කරුණු අපගේ අවධානයට හසු විය යුතුය; ඉදින්, මානව සංවිධාන සහ ප්‍රජාවන් තුළ ඝාතනය විසින් රඟන ලද මාර්මික භූමිකාව හඳුනා ගන්නා ලද මුත් මේ ග්‍රන්ථය මීට පෙර නිකුත් නොවී දැන් පාඨකයා ඉදිරියට ඒමට හේතු කාරක වන පසුබිම එබඳුය.

මෙවැනි වැඩසටහන් සංකීර්ණයක්, තමා සහ තම ආයතන අවට ඝාතන සිදුවෙද්දීම, නැතහොත් ඒවා නිසා, බොහෝ ශාස්ත්‍රඥයින්, විද්වතුන් සහ වෙනත් ප්‍රබුද්ධ මිනිසුන් අත ඒකරාශි වූ දැනුම් සහ කුසලතා සම්භාරයක් ආශ්‍රයභූමි කරගනියි. දර්ශනිකයෝ ගැටළු සූත්‍රගත කිරීමට දායක වෙති. එනම්, පරමාර්ථමය වටිනාකම් මෙන්ම භාවිතාවේදී අඩාල වූ හෝ ඇද වැටුනු ප්‍රමුඛතාවන් උපග්‍රහණය කොට පැහැදිලි කර ගැනීමට හෝ නිරවුල් කර ගැනීමටය. ඉතිහාසඥයෝ, ජන විකාශ විද්‍යාඥයෝ, ආර්ථික විද්‍යාඥයෝ සහ වෙනත් අය, ඝාත - නිර්ඝාත ප්‍රක්ෂේප මාර්ගයන්ගේද, සියළුම මානව පරමාර්ථ සහ ප්‍රමුඛතා පර්යාලෝකයන්ගේ නැගීම් සහ වැටීම්වලද ප්‍රවණතා පිළිබඳ විස්තර වාර්තා සම්පාදනය කරති. මානව විද්‍යාඥයෝ, ජීව විද්‍යාඥයෝ, මනෝ විද්‍යාඥයෝ, සහ සමාජ

විද්‍යාඥයෝ මෙකී ප්‍රවණතාවල යටිතලයේ ඇති සාධක නිරාවරණය කර ගැනීම සඳහා ප්‍රයත්න දරති;

රළු සහ අරුචිකර ප්‍රවණතාවන්ගේ ගමන අඩාල කිරීමට ආධාරක වන්නා වූද, ජීව-ධාරක ප්‍රවණතාවන් වඩ වඩා ප්‍රවර්ධනය කිරීමට හිතකර වන්නා වූද භූමීන් සහ අවස්ථාවන් සොයා පාද ගැනීම මෙහිලා ඔවුන්ගේ අභිප්‍රාය වන්නේය. තවත් සමහරු, යට කී අනභිමත ප්‍රවණතාවන්ට ප්‍රතිරෝධය පෑමට සහ රුචිකර ඒවා පෝෂණය කිරීමට පිටුබලය දෙන මැදිහත්වීම් නොමැති විටක, එකී ප්‍රවණතාවන්ගේ අනාගත ප්‍රක්ෂේප මාර්ගයන් අනුමාන කිරීම සඳහා කෞශල්‍යයන් සහ නිපුණතා මෙහෙයේ යොදවති. මෙපරිද්දෙන්, ව්‍යවහාරික අගයක් ඇති, උචිත, ප්‍රතිපත්ති-අධ්‍යයන විකල්ප පාඨමාලා ගොඩ නැගීමට සමත් ප්‍රමාණික සැලසුම්කරුවෝ, මහජන ගෝලය තුළ ක්‍රියාත්මක වන ප්‍රබුද්ධ සහ අත්දැකීම් බහුල ගැහැණුන් සහ පිරිමින් අතුරින් ගුණාත්මකව ද ප්‍රමාණාත්මකවද වර්ධනය වෙමින් සිටින්නාහ. මෙම ගැහැණුන්ට සහ පිරිමින්ට ක්‍රියාත්මක වන්නට සිදුවන්නේ නිර්ඝාත අනාගතයක් සඳහා නව්‍යකරණයේ යෙදිය හැකි ප්‍රභූ ශ්‍රේණී තුළ සිට නොව, වැඩි කොට මැද-ප්‍රභූ ශ්‍රේණිවල සිටය. එය එසේ වුවද, මානව ප්‍රවණතා, තත්වයන් සහ ප්‍රක්ෂේප මාර්ගයන් පිළිබඳ ප්‍රබුද්ධ කතිකාවන්ගේ විශේෂඥයන් වශයෙන් ඔව්හු, පසුගිය ශතවර්ෂය මිනිස් ඉතිහාසයේ වඩාත්ම ලේ වැකි එකක් බවට පත් කළ ප්‍රවණ්ඩත්වයේ විශේෂඥයින් ඉදිරියේ, මග හැර යා නොහැකි ප්‍රතියෝජනාත්මක විකල්පයක් ලෙස ඉදිරිපත් වෙන්නාහ. මෙලෙස ඔව්හු වනාහි, මනුෂ්‍ය ගරුත්වයට වඩාත් හිතකර විකල්ප ප්‍රස්ථිතීන් ද පර්යාලෝකයන් ද දරාගෙන තමන්ගේ වාරය එනතුරු බලා සිටිති. නිර්ඝාත ප්‍රතිපද විද්‍යාවන්ගේ මතුවීම සහ ආයතනීකරණය, ලේ වැකි විසිවන සියවසේ දීම සිදුවීම උච්චතර එහෙත් ඉතා රුචිකර උත්ප්‍රාසයක් වන්නේය.

තමන්ගේ යුගයේ ඝාතන යාන්ත්‍රණ සහ ශක්‍යතා සමග ග්ලෙන් පේජ් මුහුණට මුහුණ ලා සම්මුඛ වූයේ කොරියන් යුද්ධය සඳහා පුහුණුවීම සහ අනතුරුව යුදබිමේ ඝාතනයට සහභාගි වීම පසුබිම් කරගෙනය. ආපසු සිය ශාස්ත්‍රාලීය කාර්ය-කටයුතු වෙත යොමුවන්නට ඉඩ ලද විට හේ, ජාතීන් අතර සබඳතා පිළිබඳ,

විශේෂයෙන් ආණ්ඩුවල ප්‍රධාන තීරකයින් විසින් සම්පාදිත විදේශ ප්‍රතිපත්ති අගැයුම්කරණය පිළිබඳ ගුරුවරයෙක් සහ ශාස්ත්‍රඥයෙක් ලෙස ක්‍රමානුකූලව පුහුණුවෙන්නට පටන් ගත්තේය. (Shyder, Bruck and Spain 1962). සමාජ විද්‍යාවන් පිළිබඳ ඉතා පුළුල් අධ්‍යාපනයකින් ද, භාෂා කිහිපයක පරිචයෙන් ද සන්නද්ධ ජේජ්, දේශපාලන විද්‍යාවේ අනුශාඛා කිහිපයකටම වැදගත් දායකත්වයක් ලබා දී තිබේ. (e.g.,Paige 1977). ඝාතනයේ ගැටළු, අභිමතාර්ථ, ප්‍රවණතා, තත්ව-සාධක සහ ප්‍රක්ෂේප මාර්ග පිළිබඳ විවිධ පර්යාලෝක සමග ද, අනිත් අතට, ඝාතනය අවම කිරීම සඳහා භාවිතා කළ හැකි අධ්‍යාපනයේ සහ පොදුජන කටයුතු තුළ විකල්ප ක්‍රියා පිළිවෙත් සමගද, අඩ සියවසක ශාස්ත්‍ර චාරිකාවේ අතර මැදදී, ස්වකීය පුද්ගල අභිමතාර්ථ විශ්ලේෂණයට ලක් කිරීම නිසා, ඔහුට මුහුණට මුහුණ ලා සම්මුඛ වන්නට සිදුවිය. ක්‍රමානුකූලව ඔහු පය ගසා සිටින අති-මූලික ආස්ථානය බවට පත් වූයේ, රාජ්‍යය පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයන් සහ ඉදහිට ඇසෙන අභියෝගාත්මක හඬවල් මැද්දේම, රාජ්‍යය පිළිබඳ මූලික සම්මුතීන්, නිර්ඝාත ප්‍රතිපදවට ඉහළින් ඝාතනය තබන්නා වූ ඇබවුම් තුළ මුල් බැස ඇති බවයි. මේ අනුව මේ ග්‍රන්ථය ලේඛකයාගේ දීර්ඝ ශාස්ත්‍ර ගවේෂණයේ දෙවන භාගයේ මූලික අස්වැන්න අඩංගු කරගනී. එය යට කී ආධිපත්‍යධාරී සම්මුතීන්ට බලගතු ප්‍රහාරයක් වන අතරේම, ඒවාට විකල්පයක් ද වන්නේය. අවසානයේ දී එය නිර්ඝාත ගෝලීය දේශපාලන විද්‍යාව වෙනුවෙන් නැගී සිටින සම්භාව්‍ය ප්‍රකාශයක් බවට මෝරමින් පාඨකයා ඉදිරියට පැමිණ සිටී.

ඝාතනයේ සහ ඝාතන තර්ජනයේ බර, රාමුව සහ ක්ෂේත්‍රය අධිකතර ප්‍රසාරණයට ලක්වීම නිසා අතිශයින් අප්‍රසන්න වන්නා වූ ද, අනෙක් අතින් ඒ පිළිබඳ ප්‍රබුද්ධත්වය විශාල ලෙස ඉහළ යාම නිසා අතිශයින් ප්‍රසන්න වන්නා වූද යුගයකින් දශක හතරකටත් වඩා කාලයක් මම මේ ලේඛකයා හඳුනමි. නිර්ඝාත ගෝලීය චර්යාවන්ගේ ප්‍රවර්ධනය සමග අනන්‍ය වෙමින්, කවර ප්‍රජාවක් තුළ හෝ කවර ක්ෂේත්‍රයක් තුළ හෝ වේවා ක්‍රියාත්මකව සිටින්නා වූ ලෝක පුරවැසි ප්‍රජාතන්ත්‍රවාදී සහක්‍රියාකාරීන් අමතා මේ කෘතියේ වටිනාකම ගැන කියන්නට මා පෙළැඹෙන්නේ මිත්‍රත්වය නිසා පමණක් හෝ, ගෞරවය හේතු කොට ගෙන පවා හෝ නොවේ. ඒ

දෙකම වැදගත් බව වෙනම කාරණයකි. සියළු වට්නාකම් හැඩගැසීමේ දී සහ හුවමාරු වීමේදී ඌණිත සහ ප්‍රචණ්ඩ මැදිහත්වීම්වලට ප්‍රතිපක්ෂව පූර්ණවාදී සහ සාමකාමී ඒවා පිළිබඳ මනුෂ්‍යවර්ගයා විසින් සොදුවේ බෙදු හදු ගනු ලබන උනන්දුව සහ ආවේශයන් හා සබැඳි බොහෝ විද්‍යාත්මක සහ ශාස්ත්‍රීය ඥාණ ශාඛාවන්ගෙන් මගේ මැදිහත් වීම අභිප්‍රේරණය වී ඇත්තේය.

මේ ග්‍රන්ථය දේශපාලන විද්‍යාඥයෙකුගේ ව්‍යායාමයන්ගේ ඵලයක් වීම එහි ශක්තීන් සහ දුබලතා ගැන යමක් කියයි.

සමාජ විද්‍යාවන් අතර 'විද්‍යාව' යන්න, එම වදන නූතනයේ සංකල්පිත වී ඇති ආකාරයට අනුව අවධාරණය කරන්නා වූ අන්තිමයා, 'දේශපාලන විද්‍යාවයි.' නිශ්චිත ශාස්ත්‍ර ධාරාවක් වශයෙන් (discipline), එලෙස එය හැඳින්වීමට සුදුසු නම්, එහි දුබලතා එහි සීමාවල පුළුල් බව නිසා තුලනය වන්නේය. මෙම වාසිය හරහා නව ශාඛාවක් හෙවත් දිශානතියක් මතුවිය. එය නම් සමාජ සංසිද්ධීන් කෙරේ බහු-වට්නාකම් දරන්නා වූද, බහු-ක්‍රමවේදයන් සහිත වූද ගැටළු ප්‍රවේශයක් එක්වර අවධාරණය කර සිටින ප්‍රතිපත්ති විද්‍යාවන්ය. (Lasswell and Mcdougal 1992). පේජ්ගේ කාර්ය-කටයුතු මානව ගරුත්වයේ ප්‍රතිපත්ති–කේන්ද්‍රීය සමාජ විද්‍යාවන්ගේ පෝෂණය සහ ඉසියුම්කරණය සඳහා නිර්මාණශීලී ලෙස දායක වෙති. (Robinson 1999).

මේ සටහන මා ලියන්නේ බොහෝ දෙනෙකුට වඩා ප්‍රබුද්ධත්වයේ සහ බලයේ ආයතන සමීපව හඳුනන කෙනෙකු ලෙසටයි. මම අඩ සියවසක් මුලුල්ලේ අමෙරිකානු විද්‍යායතන සහ විශ්ව විද්‍යාල ගණනාවකම අධ්‍යයන කටයුතු කළෙමි; ඉගැන්වූයෙමි, පරිපාලනයේ නියැලුනෙමි. ඒ කාලයේ දී අමෙරිකාවේ ද, වෙනත් රටවල් කිහිපයක ද ප්‍රජා, රාජ්‍ය සහ ජාතික මට්ටම්වල සහ විවිධ ක්ෂේත්‍ර තුළ බල ක්‍රියාවලීන් නිරීක්ෂණය පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා ගැනීමට මට හැකි විය. මගේ පැරණි පරිපාලන ජීවිතය මට ලබා දුන් එක් පාඩමක් නම් සංවෘත විශ්ව විද්‍යාල මණ්ඩප තුළ පවා එක්තරා දුරකට ඝාතන යන්ත්‍රණ සහ එම වෘත්තිකයින් පවතින බව අප බොහෝ දෙනෙකුගේ අවධානයට හසු නොවන බවයි. අවලෝකනයට හසුවන විට, ඝාතනය සහ ඝාතන තර්ජන නමැති මෙම සංසිද්ධිය ප්‍රවර්ගගත

කෙරෙන්නේ සහ සාධාරණීකරණය කෙරෙන්නේ 'ව්‍යවසායික පිරිවැයක්' වශයෙනි. අපගේ විද්‍යායතන සහ විශ්ව විද්‍යාල අනුවර්තනයන් සහ අනුකරණයන් වශයෙන් ද, ව්‍යවසායික, වාණිජ්‍ය සහ මූල්‍ය ආයතන සඳහා අපගේ කළමනාකරන, පරිපාලන, සංවිධාන සහ තාක්ෂණ විද්‍යා පාසල් මගින් මාර්ගෝපදේශනය සැපයීම නිසා ද සැබැවින්ම වාණිජ සමාගම්වලට අනුරූපී වෙති.

අනෙකුත් සමාජ අංශවලට වඩා දේශපාලන ජීවිතය තුළ 'හයියට' හෙවත් ද්‍රව්‍ය බලයට (force) හිමි, කේන්ද්‍රීය භූමිකාව වඩාත් තියුණු ලෙස කැපී පෙනේ. රාජ්‍යය පිළිබඳ නිර්වචන තුළ එය නිකම්ම භාර ගැනෙනවා පමණක් නොව මහජන ආරක්ෂාව, අභ්‍යන්තර ආරක්ෂාව, විදේශ සහ ආරක්ෂක ප්‍රතිපත්ති සමග සබැඳි ජාතික අයවැය යටින් එය දිව යන්නේය; මෙම ප්‍රරෝධක බලය හෙවත් හයිය, දේශපාලන සංවිධානවලට තෝරා පත්කර ගන්නා ෂෙරීෆ්වරුන්ද (සාම ආරක්ෂකයින්), මැතිවරණ ව්‍යාපාර සඳහා කැඳවනු ලබන මිලිටරි කර්මාන්ත ද මන තබන විශ්වාසය සහ යැපීම තුළින් මනාව ප්‍රකට වේ. නිවාස, පාසල්, ආරෝග්‍යශාලා සහ පුජා භූමි අසල ප්‍රාදේශීය පොලිසිය විසින් ආරක්ෂාව සහ පහසුව සැපයීම හරහා ද එය විද්‍යාමාන වේ.

බල ආයතන සහ ඒවායේ සහභාගිකයන් වෙත ශාස්ත්‍රාලීය ගවේෂණයන් නාභිගත වෙද්දී, 'හයිය' නම් සංසිද්ධියට අදාළ කාර්යභාරයන් සහ භූමිකාවන් පුළුල්ව අවබෝධ කර ගැනීමට දේශපාලන විද්‍යාව දායක වෙතැයි අපේක්ෂා කළ යුතුය. එනමුත් අමෙරිකානු දේශපාලනය, ජාතික ආණ්ඩු සන්සන්දනයට භාජනය කිරීම, ජාතීන් අතර සබඳතා යනාදි විෂය මාතෘකාවන් හඳුන්වාදෙන පාඨ ග්‍රන්ථ පෙරළා බලන විට පෙනී යන්නේ 'හයිය' සහ ප්‍රචණ්ඩත්වය මූලික විෂය තේමාවන් ලෙස අඳුනාගන්නවාට වඩා බොහෝවිට සංස්කෘතික අපගමන අවස්ථාවන් වශයෙන් තේරුම් කෙරෙන බවය. නවීන දේශපාලන විද්‍යාවේ මෙකී සීමාසහිත තත්වයන් තුළ ජේජ් විසින් යෝජිත නාභිගත සංකල්පනය බෙහෙවින් අපේක්ෂා දනවන සුළුය. මෙහිලා, පරමාර්ථ නිරවුල් කිරීම, ප්‍රවණතා ගවේෂණය, යටිනල සාධක අවබෝධ කර ගැනීම යනාදියට අදළ වැදගත් බුද්ධිමය කාර්යභාරය හා සබැඳි බලවත් ව්‍යායාමයක් කෙනෙකුට මූණ ගැසේ.

මේ කෘතිය ගෝලීය ප්‍රතිපත්තීන්ගේ ආපසු හැරීමේ ආරම්භය ලකුණු කරන්නේය. මේ වූ කලී අනෙකුත් යහපත් ප්‍රවණතාවන්ගේ පිටුබලය සහිතව ඝාතනය නිෂේධ කිරීමේ ක්‍රියාවලියේ ආරම්භයයි. නිර්ඝාත විකල්පයන්ගේ වැඩිදුර විකාශය සඳහා වූ ව්‍යායාමයන්ට ඇවැසි පදනම මෙහි ඇත්තේය. සංස්කෘතික පරිණාමය පිළිබඳ මතු වී එන විද්‍යාවන් මත පය ගසා සිටින්නා වූ පර්යාලෝක සමග ගැලපෙන ධනාත්මක ක්‍රියාවන්ට මෙකී ව්‍යායාමයෝ ආධාරක වෙති. චාරිත සහරා සහ පොත්පත් තුළ මෙම සංස්කෘතික පරිණාමය හෙවත් 'සහ-පරිණාමය' පිළිබඳ න්‍යායන් විශාල වැදගත් කමක් අත්පත් කර ගනිමින් සිටී. මෙම න්‍යායන් පොදුවේ පිළිගන්නා රාමුවක් තුළට තවම ගැලැප්සී නැති වුවද, ඒ අතර වූ ආරම්භක සූත්‍රගත කිරීම්වලින් එකක් වඩාත් ව්‍යක්ත සහ ප්‍රබනම්‍ය බවක් පෙන්වයි. නිර්ඝාත අදහස්, ආයතන සහ භාවිතාවන්ගේ ඉදිරි ගමන වේගවත් කිරීමේ දී මතුවන අවස්ථාවක් ගැන කරුණු ඇඟවීම පිණිස අපි එම න්‍යායික සංකල්පය මත යැපෙමු. (Dawkins, 1976, 1989).

නිර්ඝාතය වූ කලී ප්‍රවේණිගත නොවන ආකාරයට පරම්පරාවෙන් පරම්පරාවට දයාද විය යුතු සංස්කෘතික හැඩ ගැස්මකි. එවැනි ලක්ෂණ ජීව විද්‍යාවේ දී හැඳින්වෙන්නේ 'මෙමේ' (Meme) නමිනි. මෙලෙස නිර්ඝාතය - එහි තේමාව, සංකේතය, අදහස, භාවිතාව - පවතින්නේ හෝ විනාශ වන්නේ අනෙකුත් 'මෙමේයන්' ආකාරයටමය. පැවැත්ම හෝ විනාශය තීරණය වන්නේ අනුකරණය හෝ ආදර්ශය මතය. මෙමේයක පුනරුක්තිය හෝ ප්‍රතරාවර්තනය හෙවත් තදකාරය ඇතිවීම, තහවුරු කිරීම හා ශක්තිමත් කිරීම සංකල්පයේම දිගු කල් පැවැත්ම මගින් සහතික වේ. මේ තත්වය මෙමේ-ආකාර සංවර්ධනය තුළ නිර්ඝාත පැවැත්ම සඳහා ලබාදෙන්නේ වාසියකි. මේ වාසිය, මනුෂ්‍ය මතකය තුළද, යාඥා, විශ්වාස, ගීත, කවි, සහ සාමවාදී පර්යාලෝක සහ පිළිවෙත්වලට අදාළ වෙනත් චර්යාවන් තුළද, ඒවා පවත්වන්නට ආධාරක වන්නා වූ කෝෂ්ඨාගාර හා වෙනත් සංචිතයන් තුළද ලැගුම් ගනී. සංස්කෘතික ස්මරණ සංචිතයන් තුළ මෙසේ රැකී පවතිනවාට අමතරව, නිර්ඝාත ජීවය හා භාවිතාව ඉතා පහසුවෙන් ප්‍රතිනිෂ්පාදනය කළ හැකිය; හමුදා අහෝසි කළ ජාතීන් තුළින්, මරණ දඬුවම අහෝසි කළ ප්‍රජාවන්

තුළින්, සාම පර්යේෂණ ආයතන තුළින්, ගැටුම් සමථකරණයට සහභාගි වන සේවාවන් තුළින් ඒ හැකියාව මනාව ප්‍රකට වේ.

නිර්ඝාත භාවිතාවන්ගේ 'පල දැරීමේ ශක්තිය' ගැන මා මෙහි ඇඟවුමක් කරන්නේ, ඒවා කෙතරම් පහසුවෙන් අනුකරණය කළ හැකිද, සහ අනුකරණය කරනු ලැබුවාද යන්න මතක් කිරීමටයි. හැරත්, නිර්ඝාත ජීවය සහ ආයතන සජීවීව පවත්වා ගැනීමට ඉතා 'නිරවද්‍ය' පුනරුක්තීන්, තදකාරයන් අවශ්‍ය නොවන්නේය. එපමණක් නොව, සංස්කෘතියෙන් සංස්කෘතියට, සමාජ ශ්‍රේණියෙන් ශ්‍රේණියට, අවශ්‍යතාවෙන් අවශ්‍යතාවට, පුද්ගලයාගෙන් පුද්ගලයාට, තත්වයෙන් තත්වයට මතු කෙරෙන විවිධත්වය විකල්ප නිර්ඝාත ප්‍රතිපත්තීන් හා භාවිතාවන් ගේ පලදායකත්වය ගැන අවබෝධ කර ගැනීමට ස්වභාවික පර්යේෂණාගාරයක් ප්‍රදානය කරයි.

'මෙමේ' නව්‍යකරණයන් ඇති කරමින් යන මේ අකවරත පුනරාවර්තන ක්‍රියාවලියේ සාර්ථකත්වය රඳා සිටින සාධකය, සමහර විට, එය ඇතුල් වන්නා වූ හිතකර හෝ අහිතකර මූලාශ්‍ර සංකීර්ණයයි. ලෝක සමාජයේ වටිනාකම් ක්ෂේත්‍ර ගණනාවක් තුළම වන වෙනස් කම් සලකා බැලීමේදී නිර්ඝාත ජීවය අවධාරණාත්මකව නැවතත් මතු කිරීමට ඉඩ ලබා දෙන්නා වූ මීට වඩා උචිත අහඹු කාලපරිච්ඡේදයක් ගැන සිතිය නොහැකි තරම්ය; ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමය පැන නැගී අවුරුදු සියයකටත් අඩු කාල පරිච්ඡේදයක් තුළ ලොව පුරා ව්‍යාප්ත වූ තත්වය 20 වන සියවස විසින් ලකුණු කරන අන්දම ගැන සලකා බලන්න. (Karatnysky 2000). පසුබැසීමේ අවස්ථා සහ මන්දගාමී වීමේ අවස්ථා ගණනයට ගැනීමෙන් පසුව වුවද, ප්‍රජාතන්ත්‍රීකරණය ඉදිරියට යෑමටත්, වර්ධනය වීමටත්, ගැඹුරු වීමටත් අවකාශ විවෘතව ඇති බව පැහැදිලිය. ප්‍රජාතන්ත්‍රවාදී නොවන තන්ත්‍රයන්ට සාපේක්ෂව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යවල පාලකයින් එකිනෙකා සමග යුද්ධයට යන්නට ඇති අවස්ථා විරල බව සාක්ෂි මගින් තහවුරු වේ. (Oneal and Russet 1999; Gowa 1999). එලෙසම, ප්‍රජාතන්ත්‍රවාදී පාලකයින්, ප්‍රජාතන්ත්‍රවාදී-නොවන පාලකයින්ට සාපේක්ෂව, තම රටේ දුර්භික්ෂයක් ඇති වීම වැළැක්වීමට අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ඇති අවකාශ වඩා ඉහළය.

බලය සහ ධනය පමණක් නොව අනෙකුන් මානව වටිනාකම් ද, හැඩගැස්වීමටත්, බෙදා හදා ගැනීමටත් පුළුල් සහභාගීත්වයේ අවශ්‍යතාව ගැන එක්තරා ආකාරයක පශ්චාත්-නව්‍ය අවධාරණයක් ප්‍රජාතන්ත්‍රවාදී යුගයේ පියාපත් තුළින් මතුව ඇත. ලෝක ව්‍යාප්තව තහවුරු වන ආත්මාභිමානය සහ අනෙකාට ගරු කිරීම ඔස්සේ ප්‍රකාශිත මිනිස් ගරුත්වයේ වටිනාකම් නිර්සාත නව්‍යකරණය උදෙසා පිටුබලය සපයති. දූත් ඝාතන ආයතන තුළ පවා මෙකී 'මෙමේයන්' තහවුරුව ප්‍රකාශයට පත්වෙති. තැරලි සහ විරෝධතා ගැටුම් කෞෂල්‍යයෙන් යුතුව සහ සාමකාමීව කළමනාකරණය කරන්නට පොලීසිය උගනිමින් සිටී. එමෙන්ම වෘත්තික ආරක්ෂක හමුද 'හයිය' භාවිතාවෙන් ඔබ්බට යන වෘත්තික ප්‍රතිමානයන් ගෝලීය වශයෙන් තහවුරු කරමින් සිටිති. සමාජයේ වෙනත් අංශවලද මෙලෙසම, ඝාතනයට සහ ප්‍රචණ්ඩත්වයට විකල්පයෝ වේගයෙන් පැන නගිති. අහිංසාවාදී විෂයමාලාවල සිට, හෘදයසාක්ෂිය මත සිට හමුද සේවයට විරුද්ධ වීමේ සංකල්පය තවදුරටත් පුළුල් වීම දක්වා, අසීමිත භාවිතා පරාසයක් කෙනෙකුට මෙහිදී ලැයිස්තුගත කළ හැකිය.

නිර්සාත ලෝකයක් සඳහා පරිණාමීය අපගමනයන් වාසිදායක ලෙස යොදා ගැනීම උදෙසා අධිෂ්ඨානය සහ කැපවීම, යහපත් චේතනාව සහ මහජන මතය පමණක් ප්‍රමාණවත් වන්නේ නැත. ඒ සඳහා ක්‍රියාවන් සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ අගැයීමට ආධාරක වන්නා වූ දැනුම් මූලාශ්‍ර සහ සංචිතයන් අත්‍යවශ්‍යය. නිර්සාත දේශපාලන විද්‍යාවට මෙතැනදී අප්‍රමාණ වැදගත් කමක් ආරෝපණය වේ.

එබැවින් ගෞරවනීය පාඨකය, ඔබ අතට ගෙන ඇත්තේ විද්‍යාවේ සහ ප්‍රතිපත්ති සම්පාදනයේ නිර්මාණාත්මක ලේඛණයකි. මෙය ගැන ඔබ විනිශ්චය කළ යුත්තේ නිර්සාත ගෝලීය දේශපාලන විද්‍යාව වෙනුවෙන් වූ ප්‍රකාශයට සම්පූර්ණයෙන් සවන් දුන්නාට පසුවය. එයින් ඔබට ප්‍රස්තුතය පිළිබඳ විශ්වාසයක් ඇති නොවී නම් නිහඬතාවය මැද පෙර ලෙසටම කම්කටළු කරා යා හැකිය. එනමුත් එවිට ඔබ ඍජුව හෝ වක්‍රව ඝාතනය සහ ඝාතන තර්ජන ව්‍යවස්ථානුකූල ලෙස භාර ගනිමින්, දිගටම එම තත්වය පැවැත්වීමේ ආධාරකරුවෙක් ව සිටිනු ඇත. යම් හෙයකින් ඔබ මේ ග්‍රන්ථය ගෙන එන අදහස්

මාලාව භාර ගන්නට නැඹුරු වන්නේ නම්, එහිම මනා ලෙස විස්තර කර තිබෙන ක්‍රියා-පරාසය දෙස බලා ක්‍රියාත්මක වීම සඳහා තෝරා ගැනීමක් ඔබට කළ හැකිය. සෑම සංස්කෘතියක් තුළම, පන්තියක් තුළම, පුද්ගල පරාසයක් තුළම මේ වනවිටත් ක්‍රියාත්මක වන ගැහැණුන්ගේ සහ පිරිමින්ගේ ප්‍රබුද්ධතාවය සහ ශක්තිය, බලහත්කාරයට ප්‍රතිපක්ෂව සාමකාමී ලෙස එකඟතාවය සහ සම්මුතිය ගොඩ නැගීමේ ක්‍රියාවලින් හරහා, මානව ගරුත්වයේ ගෝලීය පොදු රාජ්‍ය මණ්ඩලයක් නිර්මාණය වීමට අදාළ වන අනේක විධ සාධක පුරමින් සිටිති.

**ජේම්ස් ඒ. රොබින්සන්**

**පෙන්සකෝලා, නත්තල් දිනය, 1999**

**බෙයිජිං, අළුත් අවුරුදු දිනය, 2000**

# ආශ්‍රිත ග්‍රන්ථ


DAWKINS, RICHARD. 1989. *The Selfish Gene*. Oxford: Oxford University Press.

GOWA, JOANNE. 1999. *Ballots and Bullets: The Elusive Democratic Peace*. Princeton: Princeton University Press.

KARATNYCKY, ADRIAN. 2000. The 1999 Freedom House survey: a century of progress. *Journal of Democracy*, 11 (1): 187–200.

LASSWELL, HAROLD D. and KAPLAN, ABRAHAM. 1950. *Power and Society: A Framework for Political Inquiry*. New Haven, Conn.: Yale Univesity Press.

LASSWELL, HAROLD D. and McDOUGAL, MYRES S. 1992. *Jurisprudence for a Free Society: Studies in Law, Science and Policy*. New Haven, Conn.: New Haven Press and Dordrecht: Martinus Nijhoff Publishers. 2 vols.

ONEAL, JOHN R. and RUSSETT, BRUCE. 1999. The Kantian peace: the pacific benefits of democracy, interdependence, and international organizations. *World Politics*, 52 (1): 1–37.

PAIGE, GLENN D. 1977. *The Scientific Study of Political Leadership*. New York: The Free Press.

ROBINSON, JAMES A. 1999. Landmark among decision-making and policy analyses and template for integrating alternative frames of reference: Glenn D. Paige, *The Korean Decision*. *Policy Sciences* 32: 301–14.

SEN, AMARTYA. 1999. *Development as Freedom*. New York: Knopf.

SNYDER, RICHARD C.; BRUCK, HENRY W.; and SAPIN, BURTON, eds. 1962. *Foreign Policy Decision Making: An Approach to the Study of International Politics*. New York: The Free Press of Glencoe, Macmillan.

## 1 පරිච්ඡේදය

# නිර්ඝාත සමාජයක් ඇති විය හැකිද ?

*දර්ශනය ආරම්භ වන්නේ යමෙක් පොදු ප්‍රශ්නයක්*
*අසන තැනදීය; විද්‍යාව ද එසේමය.*

*– බර්ට්‍රන්ඩ් රසල්*

*රටක් තමාගෙන් අසන ප්‍රශ්න වනාහි,*
*එම රටේ දේශපාලන වර්ධනයේ දර්ශකයක් වෙයි.*
*තමාගෙන් නිවැරදි ප්‍රශ්නය නොඇසීම,*
*එම රටේ අසාර්ථකත්වයට බොහෝ විට හේතු වනු ඇත.*

*– ජවහර්ලාල් නේරු*

**නිර්ඝාත සමාජය විය හැකි දෙයක්ද? බැහැ නම්, බැරි ඇයි? ඔව් නම්, ඒ ඇයි?**

එහෙත්, නිර්ඝාත සමාජයක් යනු කුමක්ද? ඒ වනාහි ඝාතනයක් සිදු නොවන, ඝාතන තර්ජන රහිත, ඉතාම කුඩා හෝ ඉතා විශාල විය හැකි, දේශීය සීමාවල සිට ජගත් පරිමාණය දක්වාම පැවතිය හැකි මානව ප්‍රජාවක් වේ; එහි මිනිසුන් මැරීම සඳහා ආයුධ නිපදවෙන්නේ නැති අතර ආයුධ භාවිතා කිරීම සඳහා හේතු සාධක පවතින්නේද නැත. එමෙන්ම පැවැත්ම හෝ පරිවර්තනය සඳහා ඝාතක බලය හෝ තර්ජනය භාවිතා කිරීම මත රඳා සිටින්නා වූ කිසියම් හෝ සමාජමය තත්වයන් ද නොමැත්තේය.

එහි මිනිස් ඝාතන සහ ඝාතන තර්ජක නැත. මේ මූල ධර්මය සත්ව රාජධානිය වෙතද, වෙනත් ජීව පදාර්ථ කරා ද ව්‍යාප්ත විය හැකිය. කෙසේ වුවද මිනිසුන් නොමැරීම අවම තත්වයයි. එහි ඝාතන තර්ජන ද නොමැතිය. එමෙන්ම එකී නිර්ඝාත තත්වය නිර්මාණය වී ඇත්තේ බිය වැද්දීම කරණ කොට ගෙන නොවේ.

මනුෂ්‍ය රුධිරය වැගිරීමේ ඉතිහාසය වාර්තා කරන කෞතුකාගාරවල හැරෙන්නට, එහි ඝාතක ආයුධ ඇත්තේ නැත. ජීවිතයක් පැහැර ගැනීම උදෙසා එහි කවර වූ හෝ නීත්‍යානුකූල

බවක් නැතහොත් සුජාත බවක් නොමැත. ඇත්තෙන්ම මිනීමැරීමට ආයුධම අවශ්‍ය නොවෙයි; අතින් ද පයින් ද එය කළ හැකිය. මෙහි නැත්තේ, එබැවින්, ඝාතක අධ්‍යාශයයි. එවිට හුදු ශාරීරික හැකියාව මගින් හෝ නැතහොත් ශරීරය තාක්ෂණික වශයෙන් සන්නද්ධ කිරීමෙන් හෝ ඝාතන සිදු කිරීමක් ගැන ප්‍රශ්නයක් පැන නගින්නේත් නැත. ආගම් විසින් ඝාතනය ශුද්ධත්වයට නැංවන්නේ නැත. ඝාතනයේ ප්‍රඥප්තීන් එහි ඇත්තේ නැත. ආණ්ඩු එය සුජාතකරණය නොකරති. දේශප්‍රේමීත්වයට එය අවශ්‍ය නොවේ. විප්ලවවාදීහු එය නිර්දේශ නොකරති. බුද්ධිමත්තු එය සාධාරණීයකරණය කිරීමට දායක නොවෙති. කලාකරුවන් අතින් එය උත්කර්ෂයට නොනැංවේ. ජන ප්‍රඥාව එය චක්‍රගත ක්‍රියාවලියක් බවට පත් කරන්නේ නැත. සාමාන්‍ය බුද්ධිය එය වර්ණනා නොකරයි. අද්‍යතන පරිගණක භාෂාව භාවිතා කරන්නේ නම්; සමාජය එය සඳහා දෘඪාංග (Hardware) හෝ මෘදුකාංග (Software) හෝ සපයන්නේ නැත.

තවද සමාජ ව්‍යුහය මාරක තත්වයන් මත රඳා පිටින්නේ නැත. එහි සමාජ සම්බන්ධතා වනාහි, ඒවායේ පැවැත්ම හෝ පරිවර්තනය උදෙසා ඝාතනය හෝ ඝාතන තර්ජන ඇණවුම් නොකරති. බහිෂ්කරණයේ හෝ ආධිපත්‍යයේ සබඳතා – (දේශ) සීමා, ආණ්ඩු ක්‍රම, දේපල ක්‍රම, සමාජ–ලෛංගික ව්‍යුහයන්, වාර්ගික හෝ පන්තිමය සැකසුම්, ආගමික හෝ ලෞකික විශ්වාස පද්ධතීන් – කවරක් වුව, ඒවා සිය පැවැත්ම සඳහා ඝාතනය භාවිතා කරන්නේ නැත. ඒවාට අභියෝග කිරීමට ද ඝාතනය අවශ්‍ය නොවේ.

එයින් අදහස් වන්නේ එම සමාජය අත්‍යවශ්‍යයෙන්ම බන්ධනයෙන් තොර බවක් හෝ විභේදනය වී නොමැති බවක් හෝ එහි ගැටුම් රහිත බවක් හෝ නොවේ. එයින් හුදෙක්ම ගම්‍ය වන්නේ එහි ව්‍යුහයන් හා ක්‍රියාවලීන් ඝාතනය මත යැපෙන්නේ හෝ ඉන් ව්‍යුත්පන්න වන්නේ හෝ නැති බවයි. ඝාතනය ආශ්‍රිත නීත්‍යානුකූල හෝ නීති–විරෝධී වෘත්තීන්ද, එම සමාජය තුළ එබැවින් දක්නට නොමැතිය.

ඒ ආදී වශයෙන් ගත් කල නිර්ඝාත සමාජයක් තුළ මානව ජීවිතය වූ කලී, මනුෂ්‍යයන් නොමැරීමද, ඝාතන තර්ජන නොමැති වීමද, ඝාතනය අරමුණ කර ගත් තාක්ෂණයක් හෝ එය

සාධාරණීයකරණය කිරීමක් නොමැති වීමද, මාරක බලය භාවිතා කිරීම හෝ එසේ කිරීමේ තර්ජනය මත යැපෙන සමාජ තත්වයන් රහිත වීමද යනාදියෙන් සංලක්ෂිත වන්නේය.

**නිර්ඝාත සමාජය; මෙය විය හැකි දෙයක්ද?**

මේ ප්‍රශ්නයට ලැබෙන පිළිතුරු පුද්ගල අනුභූතීන්ගෙන්ද, වෘත්තික පුහුණුවෙන්ද, සංස්කෘතිය ඇතුළු අවශේෂ සන්දර්භයෙන්ද – අනෙක් අයගේ චර්යාවන් විස්තර කිරීමට දේශපාලන විද්වතුන් භාවිතා කරන සෑම සියළු සාධකයන්ම – තත්වාරෝපණය වනු ඇත. එම බලපෑම් වලින් ස්වාධීන වීමට අප කිසිවෙකුටත් ප්‍රතිශක්තියක් නැත.

**කොහෙත්ම හිතන්නට බැහැ !**

බටහිර දේශපාලන චින්තනයේ සම්භාව්‍ය ග්‍රන්ථ, ශාස්ත්‍රාලීය අධ්‍යාපනයේ ලා යොදා ගැනීම අරබයා, මානව ශාස්ත්‍ර පිළිබඳ ජාතික ප්‍රදානය (National Endownment for the Humanities) විසින් 1979 දී සංවිධානය කරන ලද ග්‍රීෂ්ම ඍතු වැඩ මුළුවකදී, අමෙරිකානු දේශපාලන විද්වතුන් 20 දෙනෙකුගේ කණ්ඩායමක් විසින් කලින් සඳහන් කරන ලද ප්‍රශ්නය බඳු ප්‍රශ්නයකට දක්වන ලද ඒකමතික ප්‍රතිචාරය එබඳුය. එහිදී අසන ලද ප්‍රශ්නය වූයේ "අහිංසාවාදී දේශපාලනයක් සහ අහිංසාවාදී දේශපාලන විද්‍යාවක් පැවතිය හැකිද?" යන්නයි. අමෙරිකානු දේශපාලන විද්‍යාවේ ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් එක සමාන ලෙස එම වැඩමුළුව තුළ නියෝජනය විය. දේශපාලන න්‍යාය, අමෙරිකානු ආණ්ඩු ක්‍රමය, තුලනාත්මක දේශපාලන විද්‍යාව සහ ජාත්‍යන්තර සබඳතා වශයෙනි. එහි එක් සාමාජිකාවක් හැරෙන්නට ඉතිරි සියළුදෙනාම පිරිමි වූහ.

සම්මන්ත්‍රණයේ අවසාන කෙටි සාකච්ඡා සැසියේදී වේගවත් තර්ක 3 ක් මගින් ප්‍රශ්නය නිට්ටාවටම විසඳා අවසන් කරනු ලැබිණ; ප්‍රථම කොට, මානවයෝ චනාහි ස්වභාවයෙන්ම ඝාතකයෝ වෙති. ඔවුනු වනාහි, ඝාතනයට නිරන්තරයෙන් නැඹුරුතාවක් දක්වන භයානක සමාජ සත්ව කොට්ඨාශයකි. දෙවනුව, සම්පත්වල සීමිත බව හා හිඟකම තරඟයට, ගැටුමට හා ඝාතනයට නිරන්තරව හේතු කාරක වනු ඇත. තෙවනුව, දූෂණයක් වීමට ඇති අනවරත භව්‍යතාවය නිසා සිය සම්පස්ථ ස්ත්‍රීන් රැකගනු පිණිස, මැරීමට

සූදානම්ව සිටින්නට පුරුෂයන්ට සිදුවෙයි. (සහභාගි වූ එකම අමෙරිකානු ස්ත්‍රියගේ, ඉහත ප්‍රස්තුතය සමඟ තුලනය කළ හැකි තර්කය, හඬක් නොලබා යටපත් වී ගියේය. "කිසිවෙක් මගේ දරුවාගේ ජීවිතයට තර්ජනයක් වන්නේ නම්, මම ඔහු මරා දමමි." එමෙන්ම අවිහිංසාවාදී දේශපාලනය පිළිබඳ සිතුවිල්ලක් පවා සැණෙකින් නිහඬ කිරීමට සමත් ලෙස සැලකෙන, මේ ප්‍රශ්නයට ප්‍රතිචාර වශයෙන් සම්ප්‍රදායයිකව ඇසෙන "හිට්ලර් සහ අශුද්ධ ලෝක අග්නිහෝමය ඔබ කෙසේද අහිංසාවාදී ලෙස නතර කරන්නේ?" යන තර්කය ද එහිදී ඇසුණේ නැත)

මනුෂ්‍ය ස්වභාවය, ආර්ථික නිහඬකම්, සහ ලිංගික ප්‍රචණ්ඩත්වය යනාදී ප්‍රාථමික තර්ක විසින් නිර්ඝාත දේශපාලනය සහ එම දේශපාලන විද්‍යාව අවින්ත්‍ය විෂයක් බවට පත් කරනු ලැබිණ.

ඒ කරුණේදී, ඔවුන් තිත් උණු උණුවේ විමසුමට භාජනය වූ බටහිර දේශපාලන චින්තනයේ සම්භාව්‍ය මූලාශ්‍ර වෙතට යොමු විය යුතු බවක් පවා අවශ්‍ය යැයි කිසිවෙකුටත් හැඟුනේ නැත. ඔවුන්ගේ විශාරදත්වය කෙසේද යත්, චීනයේ දණ්ඩික නීතිවාදී සම්ප්‍රදායයේ හෝ ඉන්දියාවේ ශූර කෞටිල්‍ය සම්ප්‍රදායයේදී මෙන් එකම නිගමනයට පැමිණීම විමසුමට කලින්ම සහතික කරනු ලැබීය. නියම් හෝ අනියම් වශයෙන්, ඝාතනයට ඇති සූදානම, යහපත් සමාජයක් නිර්මාණය කිරීම මෙන්ම එය ආරක්ෂා කර ගැනීම උදෙසා ද අත්‍යවශ්‍ය කොන්දේසියක් වශයෙන් සැලකෙන බවයි මේ සියල්ලෙන් ගම්‍ය වන්නේ.

ප්ලේටෝගේ (ක්‍රි.පූ.427-347) පරමාදර්ශී ජනරජයේ රණකාමී (සහායක) ශ්‍රේනියෙන් බඳවා ගන්නා ලද දාර්ශනික පාලකයින් (ආරක්ෂකයින්), නිෂ්පාදකයින් හා වහළුන් මත තම පාලනය පවත්වාගෙන යන්නේ බලහත්කාරය හා ඒත්තු ගැන්වීම යන විධීන් යොදා ගනිමිනි. නවද ලියොන් හැරල්ඩ් ක්‍රේග් පෙන් වූ පරිදි (ප්ලේටෝගේ ජනරජයේ) දේශපාලන ජීවිතය තුළ - ඇත්තෙන්ම එහි සකල ජීවිතයම තුළ - යුද්ධය මූල සාධකයක් වේය යන කාරණය ඕනෑම අපක්ෂපාතී නිරීක්ෂයෙකුට නොපෙනී යා නොහැකිය. එම රාජ්‍යයේ ප්‍රතිඵල පිළිබඳ සෑම ගණනයක්ම කළ යුත්තේ මේ කාරණය සිතේ රුවාගෙනය. (Craig 1994: 17: cf Sagan

1979). ඇරිස්ටෝටල්ගේ **දේශපාලනය** (Politics) ග්‍රන්ථයේ ලා වර්ණිත දේශපාලන සැකසුම් තුළ – එය පාලනය වන්නේ එක් අයෙකු, කිහිප දෙනෙකු හෝ බොහෝ අය විසින් වුවද - දේ පළ හිමියෝ මාරක ආයුධ දරති. වහලුන් මර්දනය කොට තබා ගැනීමටත්, සතුරන් අතින් තමන් වහළුන් බවට පත් නොවනු පිණිසත්, හමුදා අත්‍යවශ්‍යය. ප්ලේටෝ හෝ ඇරිස්ටෝටල් සන්නද්ධ (හමුදා) මාරකත්වයේ ස්ථිර පැවැත්ම කිසි විටකත් ප්‍රශ්න නොකරති.

බොහෝ ගෞරවාදරයට ලක්වන මැකියාවෙල්ලිගේ (1469 – 1527) **කුමාරයා** (The Prince) ග්‍රන්ථය, සිය බලය පවත්වා ගැනීමටත්, ස්වකීය රාජ්‍යයන්හි කීර්තිය, ගෞරවය හා "චරිතය" ප්‍රවර්ධනය කිරීමටත්, පාලකයින් විසින් ඝාතනය භාවිතා කළ යුතු බවට විවෘත වශයෙන්ම නිර්දේශ කරයි. නරියෙකුගේ කපටි කමින් පාලනය කිරීම වඩා යහපත් නමුත්, අවශ්‍ය වූ විට සිංහයෙකුගේ ගොරබිරම් කමින් දුරස් වීම පාලකයින් විසින් නොකට යුතුය. පුරවැසි (සන්නද්ධ) බල කණ්ඩායම් මගින් ජනරජයේ බලය ශක්තිමත් කළ යුතු බවට ද ඔහු එහි ලා තවදුරටත් නිර්දේශ කරයි.

තෝමස් හොබ්ස් (1588 – 1679) නම "Leviathan" නොහොත් ***ජල මකරා*** ග්‍රන්ථයේ ලා සමාජ පිළිවෙල රැකීම සහ යුද්ධ ජයග්‍රහණ අරමුණු කොට ආණ්ඩු විසින් කරන්නා වූ ඝාතනය සාධාරනීකරණය කිරීමට තවදුරටත් දායක වෙයි. මනුෂ්‍යයෝ වනාහි, ඝාතකයෝය. එබැවින් ප්‍රකෘති තත්වයේ වූ අසංවිධිත ජීවිතය විසින් මිනීමරු ව්‍යාකූලත්වයක් ඇති කරනු ඇත. එහෙත්, මනුෂ්‍යයෝ තම පැවැත්ම හා උන්නතිය හඹා යන්නාන්ද බැවින් තම ආරක්ෂාව හා චිරස්ථිය සහතික කරගනු පිණිස මිනීමරන්නට වරම් ලද මධ්‍යම අධිකාරයකට අවනත වීමට එකඟ වන අතර, ස්වයං – ආරක්ෂාව උදෙසා ඝාතනයට ඇති අනුලංඝනීය අයිතියක්ද තමා වෙත පවරා ගනිති. කෙසේ වුවත් හොබ්ස්, ආයුධ සන්නද්ධ කැරලි සාධාරණීකරණය කිරීමට තරම් දුර නොයා මග නවතියි.

ඒ කටයුත්ත ජෝන් ලොක් (1632 – 1704) විසින් ***ආණ්ඩුව පිළිබඳ සංහිතා දෙකක්*** (Two Treatises of Government) නම් කෘතිය තුළින් සපුරා ලයි. ඔහු එහි ලා, දේශපාලන තන්ත්‍රයක් ඝාතනයට සූදානම්ව සිටීම අවශ්‍යය යන ප්‍රස්තුතය ඉදිරිපත් කරන ප්ලේටෝ, ඇරිස්ටෝටල්,

මැකියාවෙල්ලි සහ හොබ්ස් සමග එකඟ වෙයි. ඉන් නොනැවතී ඔහු විප්ලවකාරී හිංසනය සාධාරණීකරණය කිරීමටද ඉදිරිපත් වෙයි. අධිකාරියක් දරුණු ප්‍රජා පීඩකයෙක් බවට පත් වෙමින් දේපලට, නිදහසට, හා ජීවිතයට ඇති ආවේණික (ස්වභාවික) අයිතිය උල්ලංඝනය කරන විට, පීඩාවට පත් පුරවැසියනට එය විනාශ කර දැමීමට අයිතියක් මෙන්ම යුතු කමක් ද ඇත. ඝාතකයෙක් ස්වභාවික තත්වයක් තුළ ඝාතනයට ලක් විය හැකිවාක් මෙන්ම, සිවිල් සමාජයක පුරවැසියන් විසින් අත්තනෝමතික පාලකයෙක් විනාශ කර දැමිය හැකිද වෙයි.

හොබ්ස්–ලොක් සමාගමය විසින් මාරක බලය පරිහරණය කිරීම සඳහා පාලක–පාලිත දෙපක්ෂයම වෙත පිරිනමන ලද්දාවූ ද්විත්ව–සාධාරණීකරණය, කාල් මාක්ස් (1818–1883) සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස් (1820–1895) විසින් ***කොමියුනිස්ට් ප්‍රකාශනය*** එළි දක්වමින් ආර්ථික පන්ති යුද්ධයක් දක්වා තවදුරටත් ව්‍යාප්ත කරන ලදී. සිය වරප්‍රසාද ආරක්ෂා කරගනු පිණිසත්, ඒවා ප්‍රවර්ධනය කර ගනු පිණිසත් දේපල හිමි පන්තීන් විසින් මාරක බලය මෙහෙයේ යොදා ගැනීම අපේක්ෂා කළ හැකි වෙයි. එහෙත්, භෞතික හා සමාජයීය සබඳතා යම් තීරණාත්මක අවධියක් කරා ළඟා වූ කල, සූරා කෑමට භාජනය වූ පන්තීන් ප්‍රචණ්ඩ විප්ලවයක් දියත් කරමින් සමාජයේ ආර්ථික හා දේශපාලන ව්‍යුහයන් වෙනස් කිරීම උදෙසා නැඟී සිටීමද එලෙසම අපේක්ෂා කළ හැකිය. නූතන මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදය සහිත ඉතා විශේෂ අවස්ථා කිහිපයක් තුළ සාමකාමී පරිවර්තනයක් සිදුවිය නොහැකිවා නොවේ. ආර්ථික සූරාකෑම අවසන් වී ඇති කිසියම් අනාගත අවස්ථාවකදී, පන්තිය මත පදනම් වූ මාරක ස්වභාවයක් උරුම කරගත් රාජ්‍ය යන්ත්‍රය අහෝසි වී යනු ඇත. එහෙත් සංක්‍රාන්ති කාලයේදී, සමාජය තුළ ඝාතනය ක්‍රියාත්මක වීමට ආර්ථික සාධක පිටුබලයක් විය හැකිය.

ලොක් හා මාක්ස් අතර වූ කාලයේදී, හොබ්ස් සමඟ අනුකම්පනය වෙමින්, ජීන් ජාක් රූසෝ (1712–1778) ***සමාජ ගිවිසුම*** නම් කෘතිය සම්පාදනය කරමින් රාජ්‍යයේ දේශපාලන සංවිධානයේ පදනම වශයෙන් සමාජ ගිවිසුම් න්‍යාය එහි ලා ඉදිරිපත් කරයි. පුරවැසියෝ වනාහි ස්වෛරී අධිකාරියද, රාජ්‍යයේ වැසියන් ද යන දෙපක්ෂයටම සාමූහිකව අන්තර්ගත වෙති. ඔවුහු, "පොදු අධ්‍යාශයක්" තුළින්

ව්‍යුත්පන්න වන නීති සම්පාදනය කරන්නා වූ හා ඒවා ක්‍රියාත්මක කරන්නා වූ පාලක අධිකාරියකට අවනත වන්නට එකඟව කැපවෙති. ගිවිසුමට අනුකූලව රාජ්‍යය යුද්ධයට හා ආක්‍රමණයට අයිතිය දරා සිටින අතර, ඊට ද්‍රෝහීන්ගේ හිස් ගසා දැමිය හැකිය, අපරාධකරුවන් මරා දැමිය හැකිය. රාජ්‍යය උදෙසා සිය දිවි කැප කරන මෙන් පුරවැසියන්ට නියෝග කිරීමටද පාලක තන්ත්‍රයට හැකියාව ඇත;

> *'පුරවැසියෙක් අමතා පාලන අධිකාරිය විසින් "රාජ්‍යයේ චිරස්ථිතිය උදෙසා ඔබ මිය යා යුතු" යැයි කිවහොත්, ඔහු මිය යා යුතුය. මන්ද යත්, ඔහුගේ ජීවිතය වූ කලී ස්වභාවධර්මයාගේ ත්‍යාගයක් නොවේ. එය රාජ්‍යය විසින් කොන්දේසි යටතේ දෙන ලද ප්‍රදානයක් ද බැවිනි'*
> *The Social Contract Book II Chapter V*

අවසාන විග්‍රහයේදී ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ගිවිසුම මාරකත්වයෙන් සපිරි දෘඪ පිළිවෙතක් බව පැහැදිලිය.

විසිවන ශත වර්ෂයේ, ප්‍රකට ජර්මන් ජාතික දේශපාලන ආර්ථික විද්‍යාඥයා සහ සමාජ විද්‍යා න්‍යායාචාර්යවරයා – මැක්ස් වේබර් (1864–1920), 1918 දී මියුනිච් විශ්ව විද්‍යාලයේදී කළ 'වෘත්තික දේශපාලනය' නම් දේශනයෙහි ලා, දේශපාලනය නිර්සාත වෘත්තියක් විය හැකිය යන අදහස නරයේම ප්‍රතික්ෂේප කරයි. වේබර්ට අනුව "දේශපාලනයේ තීරණාත්මක මාධ්‍යය වන්නේ ප්‍රචණ්ඩත්වයයි". ඓතිහාසික වශයෙන් ගත් කල, සියළුම ආධිපත්‍යධාරී දේශපාලන සංස්ථා වනාහි බලය අරමුණු කර ගත් ප්‍රචණ්ඩ අරගල හරහාම උද්භව වූවෝ වෙති. එබැවින්, නූතන රාජ්‍යය වූ කලී "දෙන ලද භූමි ප්‍රදේශයක් තුළ භෞතික බලයේ නීත්‍යානුකූල (සුජාත) භාවිතය උදෙසා ඒකාධිකාරයක් සාර්ථක ලෙස සාක්ෂාත් කරගන්නා ලද්දා වූ මානව ප්‍රජාවක්" වශයෙන් වේබර් නිර්වචනය කරයි. මේ පසුබිම කරණ කොට, කිසිවෙක් "තමාගේත්, අනෙක් අයගේත් ආත්ම විමුක්තිය අරමුණු කරන්නේ නම්, ඔහු එය දේශපාලන මාවත ඔස්සේ සෙවීම නොකට යුතුය. මන්ද යත්, දේශපාලන ක්ෂේත්‍රයට අයත්, අරිට වඩා පූර්ණ ලෙස වෙනස් කාර්ය භාරයන් ඉෂ්ට සිද්ධ කළ හැක්කේ ***ප්‍රචණ්ඩත්වය මගින් පමණක්ම වන හෙයිනි***". (අවධාරණය එකතු කොට ඇත. Weber, 1958, 121, 78, 176)

ඒ අන්දමින් බලන විට, වේබරියානු සම්ප්‍රදායය තුළ, සහ එහි දාර්ශනික පූර්වාචාරීන්ගේ සෙවණැල්ල යට ඇති-දැඩි වූ

මහාචාර්යවරුන් විසින් තිර්සාත දේශපාලනය හා තිර්සාත දේශපාලන විද්‍යාව අවින්නාස ලෙස සැලකීම පුදුමයක් නොවේ. මේ කතිකාව යටින් දිවෙන සුවිශේෂ වෘත්තීක නැඹුරුව පහත දැක්වෙන සිද්ධියෙන් මනා ලෙස ප්‍රකට වෙයි. ජීවිත කාලයක්ම දේශපාලන විද්‍යාවට කැප කළ ජ්‍යෙෂ්ඨ අමෙරිකානු දේශපාලන ශාස්ත්‍රඥයකුගෙන් එක්තරා තරුණ විද්වතෙක් 1950 දශකයේ දිනක, "දේශපාලනය" යන සංකල්පය පිළිබඳ ඔහුගේ නිර්වචනය ගැන විමසා සිටියේය. ඔහු සිය පයිප්පයෙන් උගුරක් ඇද මෙසේ පැවසීය: "මම රාජ්‍යය සතු මාරක බලය අධ්‍යයනය කරමි."

තවදුරටත් සලකා බලන විට, අමෙරිකා එක්සත් ජනපදයේ දේශපාලන ඉතිහාසය සහ සංස්කෘතිය පුරාම දෝංකාර දෙන, මාරක දාර්ශනික සම්ප්‍රදායයේ නින්නාදයන්, ප්‍රචණ්ඩත්වය භාර ගන්නා ආගමක් විසින් ආශිර්වාද කරනු ලැබ තිර්සාත සමාජයක් පැවතිය නොහැකිය යන පුරවැසි-ශාස්ත්‍රඥයන්ගේ විශ්වාසය මහත් සේ වෙර ගන්වන බව පෙනී යයි. අමෙරිකානු විප්ලවයේ ගිනි පුපුරු දැල් වූ ලෙක්සින්ටන් හි තුවක්කු වෙඩි හඬ තුළද, නිදහස් ප්‍රකාශනයේ සංගෘහිත, කැරැල්ල පිළිබඳ ලොකියානු සාධාරණීකරණය තුළද, "නිදහස් ජීවිතයක් නැතිනම් මරණය" යන නවහැම්ප්ෂයර් රණ ඝෝෂාව තුළද එකී දෝංකාර හඬ ඇසෙයි. එය, සහසන්ධානයේ කැරැල්ල මැඩ (එක්සත්) ජනපද ජයග්‍රහණයට පණ පෙවූ "ජනරජ රණ ගීතිකාව " තුළ මෙන්ම "Dixie's" ගීයේ නැවත නැවත ගැයෙන රණකාමී ධ්‍රැව පදය තුළද, ඈත ගොඩබිම හා මුහුදේ සටන් වර්ණනා කරන නාවික ගීතිකාව තුළද ඇසෙයි. ජනාධිපතිවරයා හමුදාවන්ගේ ප්‍රධාන අණ දෙන නිලධාරියා වශයෙන් දිව්රුම් දෙන මොහොතේ පත්තු කෙරෙන, ජාතියේ ප්‍රචණ්ඩ ඉතිහාසය හා වර්තමාන හමුදා බලය ගැන සිහි කැඳවීමක් ද වන, ගෞරවාචාර වෙඩි මුර 21 තුළ එය ඇසෙයි. "අමෙරිකාව දෙවියෝ රකිත්වා" යන ජනාධිපති ආශිර්වාදය විසින් ශුද්ධත්වයට නැංවෙන, ජීවිත කැප කිරීම සහ සමූහ ඝාතනය පිළිබඳ චිත්තරූප හා මනෝභාව උද්දීපනය කරමින් ජීවිත කාලයක පුරාම නොකඩවා සිදු කෙරෙන ධජ එසවීම්, ජාතික ගීය ගැයීම්, හමුද ආචාර පෙළපාළි යනාදියේ උත්සවාකාර සංයෝජනයන් තුළ එය නැවත නැවතත් දෝංකාර දෙයි. (Twain,

1970).

අමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රභවයන්ට, භෞමික ව්‍යාප්තියට, ජාතික අනුකලනයට මෙන්ම, එහි ලෝක-ව්‍යාප්ත බල ප්‍රක්ෂේපණයට ඝාතනය දායක වී ඇත. මේ ක්‍රියාවලීන් නිසා සිදුවන දේශීය මෙන්ම විදේශීය හමුදාවේ මෙන්ම සිවිල් ජීවිත හානි හා ශාරීරික හානි ගණනය කෙරෙන්නේ නැත, සමහර විට එය කළ නොහැකිවාද විය හැකිය. එනමුත්, අමෙරිකානු රාජ්‍යයේ මාරක ස්වභාවය පිළිබඳ යථාර්ථය නම් නොදැක සිටිය නොහැකිය. වෙනත් රටවල දේශපාලන විද්වතුන්ට ද, එම රාජ්‍යයන්ගේ දේශපාලන අනන්‍යතාවය ස්ථාපනයේ ලා ඝාතනය අඩු වැඩි වශයෙන් මැදිහත් වන අන්දම සෙවීමට මේ තත්වය පෙළඹවීමක් ඇති කරනු ඇත.

අළුතින් බිහිවන ජාතියේ ගමනාරම්භය වූ කලී යටත්-විජිත රාජාණ්ඩු පාලනයට එරෙහි ජනරජ කැරැල්ලක්ය. එනමුත් තමා යටතේ තබාගෙන සිටි වහළුන්ට නිදහස දීම ගැන සංකල්පනාවක් හෝ රජය සතුව තිබුණේ නැත. නිදහසේ ධජය යටතේ ජනරජය ව්‍යාප්ත වූයේ ලේ වැගිරුණ සංහාරයක් තුළින් ස්වදේශීය ජනතාව මර්දනයට ගොදුරු කරමිනි. උතුරේ හා දකුණේ අසල්වැසි රටවල්වලට බලහත්කාරය පැමෙනි. අනතුරුව යුද්ධයට වඩා වෙළඳාමට වඩාත් රුචි වෙමින් අයිතිකරුවන්ගෙන් කුණු කොල්ලයට මිලට ගැනීමෙන් හෝ වංචාවෙන් ඉඩම් කඩා වඩා ගැනීමෙනි. ජාතික අනුකලන ක්‍රියාවලිය ඉදිරියට ගෙන ගියේද ප්‍රචණ්ඩ බලහත්කාරී මාවතක් ඔස්සේය. සිවිල් යුද්ධය තුළ සහසන්ධීයනයේ සොල්දාදුවන් 74, 542 ක් සහ ජනරජ සොල්දාදුවන් 140,414 ක් බිල්ලට දෙනු ලැබීණ.

එබඳු ක්‍රමවේදයන් ඔස්සේම මුහුදින් එතෙර ව්‍යාප්ත වෙමින්, අමෙරිකානු රාජ්‍යය හාවායි දූපත් (1898), පුඑර්ටෝරිකෝ, සහ පිලිපීනය (1898), නැගෙනහිර සැමෝවා දූපත් (1899) සහ පැසිෆික් දූපත් ප්‍රදේශ (1945) යටත් කර ගත්තේය. එසේම පිලිපීනයේ යටත් විජිත-විරෝධී කැරැල්ල මර්දනය කොට (1898-1902), අවශෝෂණය වීමට ප්‍රතිරෝධය පෑ මුස්ලිම් 'මෝරෝ' ජනතාව සමූල ඝාතනය කළේය. (1901- 1913). නවද නාවික බලය පෙන්වා තර්ජනය කොට ඒකලනවාදී ජපානය විදේශ වෙළඳාම සඳහා විවෘත කළේය.

නැගී ගෙන එන ජාතිය සිය උවමනාවන් ප්‍රක්ෂේපණය කළේ සහ රැක ගත්තේ යුද්ධ ඇතුළු බලහත්කාරී මැදිහත්වීම් මගිනි. මෙලෙස එය බ්‍රිතාන්‍යයට (1812–1814), මෙක්සිකෝවට (1846–1848), ස්පාඤ්ඤයට (1898), ජර්මනියට, ඕස්ට්‍රියාවට, හන්ගේරියාවට, තුර්කියට සහ බල්ගේරියාවට (1916–1918), ජපානයට, ජර්මනියට සහ ඉතාලියට (1941–1945), උතුරු කොරියාවට සහ චීනයට (1950–1953), උතුරු වියට්නාමයට (1961–1975) සහ ඉරාකයට (1991) එරෙහිව යුද වැදුනි. එම ඉතිහාසයේ දක්නට ලැබෙන වෙනත් රටවල් තුළට කරන ලද සන්නද්ධ මැදිහත්වීම් අතර, පීකිං (1900), පැනමා (1903), රුසියාව (1918–1919), නිකරාගුවාව (1912–1925), හයිති (1915–1934), ලෙබනනය (1958), ඩොමිනිකානු සමූහාණ්ඩුව (1965–1966) සහ සෝමාලියාව (1992) ද වේ. ආක්‍රමණයන් හරහා අමෙරිකාව ග්‍රැනඩාවේ (1983) සහ පැනමාවේ (1989) ආණ්ඩු පෙරළා දැමීමට ක්‍රියා කොට ඇත. හයිති (1992) ආණ්ඩුව පෙරළා දැමීමට ආක්‍රමණ තර්ජනය පමණක් ප්‍රමාණවත් විය. ආක්‍රමණ හෝ පහර දීම් මගින් එය කාම්බෝජය (1970), ලාඕසය (1971) "නහනම්" හා සම්බාධිත රටවල් බවට පත් කිරීමට වෙර දැරීය, ලිබියාවට (1986) ඇෆ්ගනිස්ථානයට (1998) සහ සූඩානයට (1998) එරෙහිව එලෙසම පළිගැනීමේ ක්‍රියාවන්වල යෙදුණි. එපරිද්දෙන්ම, සිය උපාය මාර්ගික අවශ්‍යතා ඒ ඒ කලාප තුළ ඉදිරියට ගැනීමේ ආධ්‍යාශය පෙන්වමින්, ඉරාකය (1993), බොස්නියාව (1995), සහ යුගොස්ලොවියාව (1999) තුළට සන්නද්ධ ප්‍රහාර දියත් කොට ඇත.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව ගත වූ අඩ සියවස තුළ ධනපති–විරෝධී රාජ්‍යයන්ට, විප්ලවවාදී ව්‍යාපාරයන්ට සහ වෙනත් සතුරන්ට එරෙහිව කරන ලද ලෝක ව්‍යාප්ත අරගල මගින් ද, අමෙරිකා එක්සත් ජනපදය ලෝක ගෝලය සිසාරා සිය මාරක බලය මුද්‍රා තැර ඇත. ස්වකීය ඉතිහාසයේ විප්ලව සමයේදී දහසකටත් අඩු හට පිරිසකගෙන් ආරම්භ වූ ජාතියේ ස්ථාවර හමුදාව, 1990 වර්ෂය වන විට පිරිමි මෙන්ම ගැහැණු සොල්දාදුවන් 15 ලක්ෂයකින් සමන්විත අති දැවැන්ත සංකීර්ණයක් බවට වැඩී තිබුණි. එයට පිටුබලය සපයමින් පෙන්ටගනයේ සැලසුම්කරුවන් 23000 ක පිරිසක්ද, සුවිශේෂ විද්‍යාඥයන් සමූහයක් ද මෙන්ම, ලෝකයේ වඩාත්ම දියුණු ආයුධ කර්මාන්තයක් ද වෙති. ඒ සියල්ල යථාර්ථයක්

බවට පෙරළීමට ඉවහල් වන මූල සාධකයක් නම්, ජනාධිපතිවරයා සහ අමෙරිකානු කොන්ග්‍රස් මණ්ඩලය විසින් වාර්ෂිකව අනුමත කොට, අමෙරිකානු ජනතාවගේ බදු මුදල්වලින් ලබාගෙන, නොකඩවා සම්පාදනය කෙරෙන, අවම වශයෙන් ඩොලර් ට්‍රිලියන කාලක් පමණවත් වන අති දැවැන්ත මූල්‍ය ශක්තියයි. ඇතැම් අවප්‍රමාණ ගණනයකට අනුව 1940–1946 කාලය තුළ න්‍යෂ්ටික ආයුධ ව්‍යාප්‍තියට පමණක් ජනතාවට දරන්නට වූ වියදම ඩොලර් ට්‍රිලියන 5.821 කි. (**Schwartz, 1998**). අමෙරිකාව, ලෝකයේ වෙන කවර වූ හෝ රටකට වඩා, විදේශීය භූමි මත හමුදා කඳවුරු ස්ථාපනය කොට ඇත. හමුදා බල ඇණි රඳවා ඇත. යුධ සන්ධාන සහ ගිවිසුම්වලට බැඳිව සිටී. එලෙසම වෙන කවර රටකටත් වඩා, (සිය සතුරන් මැරීමට, ඇතැම් විට මිතුරන් මැරීමට, එපමණක් නොව තමාගේම ජනතාව මැරීමට පවා අරමුණු කොට) විදේශීය හමුදා පුහුණු කිරීම සහ සන්නද්ධ කිරීම කරමින් සිටී. ඊට සමගාමීව, ගජ වාසි නොකඩවා ගෙන එන ඉතා තරඟකාරී ලෝක ආයුධ වෙළෙඳපළට ආයුධ සපයන්නා වූ ලෝකයේ ප්‍රමුඛතර ආයුධ නිෂ්පාදකයා බවට එය පත් වී ඇත. මනුෂ්‍ය වර්ගයාගේ මාරක නිර්මාණ ශක්තිය විසින් බිහිකළ හැකි වඩාත්ම විනාශකාරී ගොරබිරම් ආයුධ භාවිතාවට ගනිමින්, තම ඝාතක බලය පෘථිවියේ ගොඩබිමද, සාගර කලාපයන්ද, අවකාශ ගෝලයද සිසාරා ප්‍රක්ෂේපණය කිරීමට තරම් තාක්ෂණික ශක්තියක් අමෙරිකා එක්සත් ජනපදය විසින් මේ වනවිට අත්පත් කොට ගෙන හමාරය.

1976 දී නිදහස් ප්‍රකාශනය ලොවට ඉදිරිපත් කළා වූ යුද්ධයෙන් උපන් එක්සත් ජනපදය, එතැන් සිට 1990 වන විට "ලෝකයේ එකම සුපිරි හමුදා බලය සහ ලෝකයේ ප්‍රමුඛතර ආර්ථික බලය" වශයෙන් තමාව හඳුන්වන තැනට පැමිණ ඇත. (1993 පෙබරවාරි 19 දා, ජනාධිපති විලියම් ජේ. ක්ලින්ටන්ගේ ජනපද රාජ්‍ය ආමන්ත්‍රණය). හමුදා ප්‍රධානීන්ගේ ඒකාබද්ධ මධ්‍යස්ථානයේ සභාපති, ජෙනරාල් ජෝන් ෂලිකාෂ්විලි ගේ වචනවලට අනුව, අමෙරිකා එක්සත් ජනපදය රැකගත යුතු "ගෝලීය අවශ්‍යතා" සහිත "ගෝලීය ජාතියක්" බවට දැන් පත් වී ඇත. ජපානයට එරෙහි න්‍යෂ්ටික බෝම්බ ජයග්‍රහණයේ 50 වන සංවත්සරය සමරමින් 1995 හවායි දූපත්වල පවත්වන ලද හමුදා උත්සවයකදී, රැස්ව සිටි හමුදා නිලධාරීන් පිරිස් අමතා

ජනාධිපතිවරයා මෙසේ ප්‍රතිඥා දුන්නේය. "මබ ලෝකයේ හොඳින්ම සන්නද්ධ සහ හොඳින්ම පුහුණුව ලද ප්‍රහාරක බලවේගය ලෙස පවතිනු ඇත." එහිදී ඔහු මෙසේද කියා සිටියේය. "අපේ යුගයේ අන්ධකාරයේ බලවේග පරාජය කරනු පිණිස අප පෘථිවිය මත බලවත්ම ජාතිය වශයෙන් සිටිය යුතුය." ගුවන් හමුදා කාර්ය මණ්ඩල–ප්‍රධානී ජෙනරාල් රොනල්ඩ් ෆොගල්මන් ගුවන් හමුදා උපායමාර්ගික සැලසුම් පිළිබඳව 1996 දී කළ අර්ථකථනයක් තුළ යට කී අධිෂ්ඨානය එක්තරා සුවිශේෂ ආකාරයකින් පිළිබිඹු වෙයි. "පෘථිවි තලය මත චලනය වන්නා වූ සියලු දෙය සොයා ගැනීම, හඹා යාම, නාභියට හසුකර ගැනීම සහ ඉලක්ක ගත කිරීම අපගේ අරමුණයි." ඔහු තවදුරටත් හෙළිදරව් කළේ "අපට දැනටමත් එය කළ හැකිය. එහෙත් තථ්‍ය කාලය තුළ නොවේ. (එනම්, යමක් සිදුවන මොහොතේම නොවේ) – (1996, දෙසැම්බර් 13 දා වොෂින්ටනයේ Heritage Foundation හිදී කළ කථාව).

විසිවන සියවස කෙළවරට පැමිණෙන විට අමෙරිකානු නායකයෝ එය "අමෙරිකානු ශතවර්ෂය" යනුවෙන් නම් කිරීමේ පුරුද්දක් වගා කරගෙන සිටියහ. එමෙන්ම, තෙවන සහස්‍රයේ ප්‍රථම සියවස "දෙවන අමෙරිකානු ශතවර්ෂයට" බවට පත් කිරීමට තමන් තුළ ඇති අධිෂ්ඨානය ද ඔවුහු නිරතුරුව ප්‍රකාශයට පත් කළහ. ප්‍රචණ්ඩත්වයේ වටිනාකම් පිළිගැනෙන සහ උත්කර්ෂයට නැංවෙන ඒයාකාර වූ ජයග්‍රාහී සම්ප්‍රදායක් මධ්‍යයේ, නිර්ඝාත එක්සත් ජනපදයක් පනසුවෙන්ම අචින්ත්‍ය විෂයක් වෙයි. ජාතික නිදහස නිර්මාණය කර දුන්නේ ඝාතන හා ඝාතන තර්ජන විසිනි. එම ක්‍රියාමාර්ගයම වහල් භාවය අහෝසි කළේය, නාසිවාදය සහ ෆැසිස්ට්වාදය පරාජය කළේය. ලෝක අග්නිහෝමය අවසන් කළේය. න්‍යෂ්ටික ප්‍රහාරයට ලක් කරන ලද ජපානයේ ජන ජීවිත ගැලවීය. කොමියුනිස්ට් වාදයේ ගෝලීය ව්‍යාප්තිය වැළැක්වීය; සෝවියට් අධිරාජ්‍යයේ බිඳ වැටීමට මග පෑදීය. අද එනයින්ම, 21 සියවස් ලෝකය පුරා ප්‍රජාතන්ත්‍රවාදී නිදහස සහ ධනවාදී අර්ථ ක්‍රමය විසරණය කිරීමේ ප්‍රමුඛතර බලවේගය බවට අමෙරිකාව පත් වී ඇත.

ඇත්ත වශයෙන්ම, දේශපාලන විද්‍යාව හදාරන අමෙරිකානු ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්ගේ සිට ආරම්භක විද්‍යාර්ථීන් දක්වා

ශාස්ත්‍රාලීය පිරිස්වලට දර්ශනය හෝ ජාතික දේශපාලන සම්ප්‍රදායය හෝ "නිර්ඝාත සමාජයක් තිබිය නොහැකිය" යන එකී නිගමනය කරා ඒම සඳහා අවශ්‍ය වන්නේ නැත; එදිනෙදා ජීවිතය තුළ රජ කරන ඝාතනය ඊට හොඳටම ප්‍රමාණවත්ය.

වර්ෂයක් පාසා අමෙරිකානුවන් 15000 කට අධික සංඛ්‍යාවක් වෙනත් අමෙරිකානුවන් විසින් මරා දමනු ලැබේ. (1993 දී 15533, ඒ සංඛ්‍යාව 100,000 කට 5.7 කි. 1900 දී එම අනුපාතය 1.2 ක් විය). මෙම වාර්තාගත ඝාතන සංඛ්‍යාව තුළට පොලිසිය හෝ සිවිල් වැසියන් විසින් කරන ලද සාධාරණ මිනීමැරුම් වශයෙන් සැලකෙන ප්‍රමාණය ඇතුළත් කොට නැත. (1999 දී පිළිවෙළින් 294 සහ 188). දෙවන ලෝක යුද්ධයෙන් පසු ඉකුත් වූ කාලය තුළ අමෙරිකාවේ සිදු වූ සම්පූර්ණ මිනිස් ඝාතන ප්‍රමාණය (අවම වශයෙන් 750,000 ක් ලෙස ගණනය කෙරී ඇත.) එය සම්බන්ධ වූ සියළුම ප්‍රධාන යුධ ගැටුම්වලදී මියගිය සංඛ්‍යාවට (650,053) ට වඩා වැඩිය. මේ සංඛ්‍යාවන්ට "මිනීමරු ප්‍රහාර" ලෙස සැලකිය හැකි, ඝාතක අවිවලින් පහරදී දරුණු තුවාල සිද්ධ කරන ලද අවස්ථා ප්‍රමාණයද එකතු කළ හැකිය. (1999 දී 916.383 , 100,000ට 336.1 කි) (Federal Bureau of Investigation 2000; 13,23,32). අමෙරිකානු සිවිල් ජීවිතය දෙදරුම් කවන ජීවිත පැහැර ගැනීමේ මුලු සිද්ධි සංඛ්‍යාවට මිනීමැරුම් ප්‍රමාණයට වඩා දායක වන්නේ සිය දිවි නසා ගන්නා සංඛ්‍යාවයි. (1995 දී 31,284 : 100,000 ට 11.9 කි). ව්‍යවර්ථ වන සියදිවි නසා ගැනීම් සංඛ්‍යාව මේ ප්‍රමාණය මෙන් විසිපස් ගුණයකි. ඒ අතර වාර්ෂිකව සිදුකෙරෙන ගබ්සා ප්‍රමාණය 1,000,000 කට වඩා වැඩි බව වාර්තා වී ඇත.

අමෙරිකානුවන් එකිනෙකා මරා ගන්නේ කෙසේද? පහර දීමෙනි; හිස සිඳීමෙනි; බෝම්බ ගැසීමෙනි; ගිනි තැබීමෙනි; දියේ ගිල්වීමෙනි; එල්ලීමෙනි; උඩක සිට තල්ලු කිරීමෙනි; විෂ දීමෙනි; උල් ආයුධයකින් ඇනීමෙනි; හුස්ම හිර කිරීමෙනි; බෙල්ල මිරිකීමෙනි; එහෙත් වැඩිපුරම වෙඩි තැබීමෙනි. (1999 දී 64.5%). සැලසුම් සහගතව, හදිසියෙන්, ව්‍යාන්තික මට්ටමින් සහ අහම්බෙන් යනාදි නොයෙක් ආකාරයට ඝාතන සිදුවෙයි. එමෙන්ම ඒවා පසුබිමේ, අඹුසැමි ආරවුල්, දරුවන් සමග ගැටුම්, වැඩිහිටියන් සමග නොපෑහීම්, විවාද, බීමත්කම, මත්ද්‍රව්‍ය ජාවාරම, මැර කල්ලි අතර ගැටුම්, සූදුව, ඊර්ෂ්‍යාව,

පැහැරගෙන යාම්, වෛශ්‍යා වෘත්තිය, ස්ත්‍රී දූෂණය, මංකොල්ල කෑම්, මගඩි සහ වංචා මෙන්ම "දිව්‍ය" හෝ "යක්ෂ" ආඥා පනත් යනාදී නොයෙක් සංසිද්ධීන් ආශ්‍රයභූමිව තිබිය හැකිය. රටේ කිසිම තැනක් සත්‍ය වශයෙන් ආරක්ෂා සහිත නැත. ගෙවල්, පාසල්, වීදි, අධිවේගී මාවත්, රැකියා ස්ථාන, දේවස්ථාන, සිරගෙවල්, උද්‍යාන, නගර, මහා නගර හෝ   වන ආරණ්‍ය තුළ පමණක් නොව, ජාතියේ උත්තරීතර සභාගර්භය තුළද මාරක ප්‍රහාරයන්ට ගොදුරු විය හැකිය. ඝාතන තනි තනිව හෝ දම්යක් වශයෙන්, සමූහ වශයෙන් මෙන්ම, සසම්භාවී ආකාරයෙන් සිදුවේ. ඝාතනයට ලක් වන බහුතරය පුරුෂයෝය (1999 දී 76%). එනමුත් (1976–1985 කාලය තුළ) ඝාතනයට ගොදුරු වූ අඹු–සැමියන් අතරින් නම් පුරුෂයින්ගේ ප්‍රමාණය (7,115) ට වඩා බිරින්දෑවරුන්ගේ ප්‍රමාණය (9480) අධිකය. (Mercy and Saltzman, 1989). ඝාතකයන් තනිව මෙන්ම, යුගල, කල්ලි, මතවාදී කණ්ඩායම්, සංගම් සහ ත්‍රස්තවාදීන් වශයෙන් ක්‍රියාත්මක වෙති. නීතියේ ආරක්ෂකයන්ද ඒ අතරය. හඳුනාගන්නා ලද ඝාතකයින් අතර බහුතරය පිරිමි වෙති. (1999 දී 9,140; ගැහැණු 1,046). ඒ අතර ඝාතකයින්ගේ වයස එන්න එන්නම අඩුවෙමින් පවතී. 1980 දී කරන ලද ගණනයකට අනුව "සිය ජීවිත කාලය තුළ අමෙරිකානුවෙක් ඝාතනයට ලක් වීමට ඇති ඉඩකඩ – සුදු ජාතිකයින් 240 ට එකකි; කළු (සහ වෙනත් සුළුතර) ජාතිකයෙකුට 47 ට කෙනෙකි. (Rosenberg Mercy 1986; 376). සෙනෙට් මණ්ඩලයේ බහුතරයේ නායක රිපබ්ලිකන් පක්ෂයේ ට්‍රෙන්ට් ලොට්, ජනාධිපති ක්ලින්ටන්ගේ 1998 ජනවාරි 27 ද State of the Union ආමන්ත්‍රණයට ප්‍රතිචාර වශයෙන් ජාතික රූපවාහිනිය හරහා පහත දැක්වෙන නිරීක්ෂණය ඉදිරිපත් කර සිටියේය. "ප්‍රචණ්ඩ අපරාධ විසින් අපගේ රට නිදහසේ හිමිකාරයන්ගේ දේශයක සිට බියට පත් වූවන්ගේ දේශයක්" බවට පෙරළමින් තිබේ. අමෙරිකානු මාරකත්වය ගැන ජනසන්නිවේදන මාධ්‍යයද දිනපතා දෙස් දෙයි. දියණියක් මවගේ හිස සිඳ, එය රැගෙන වාහනයකට නැගී පොලිස් ස්ථානයක් ඉදිරිපිටින් යමින්, අර හිස පදික තීරුවට විසි කරයි. මවක් පුත්තු දෙදෙනෙකු දියේ ගිල්වා දමයි. පුත්තු දෙන්නෙක් දෙමව්පියන් මරා දමති. දාම ඝාතකයෙක් වෛශ්‍යාවන් හඹා යමින් මරයි. සමලිංගිකයෙක් තරුණ ගොදුරු දැලේ දමා ගනිමින් මරයි. අනතුරුව සිරුරු කැලිවලට වෙන් කොට ශීතකරණයක දමා

තබා ගනිමින් අනුභවයට ගනියි. තුවක්කු කරුවෙක් විශ්ව විද්‍යාල භූමියකදී පහළොස් දෙනෙකු මරා දමයි. ග්‍රාමීය මධ්‍යම පාසලක රයිෆල් රැගත් පිරිමි ළමුන් දෙදෙනෙක් තම පන්තියේ ගැහැනු ළමුන් හතර දෙනෙකු සහ ගුරුවරයෙකු මරා දමා, තවත් ගුරුවරයෙකුට හා සිසුන් නම දෙනෙකුට තුවාල පමුණුවයි. කොලරාඩෝ ලිට්ල්මන්හි උසස් පාසලක බරටම සන්නද්ධ පිරිමි ළමුන් දෙදෙනෙක් තම පන්තියේ යහළුවන් 13 දෙනෙකු මරා 28 දෙනෙකුට තුවාල කර අනතුරුව සිය දිවි නසා ගනිති. 1996–1999 වර්ෂ තුන තුළ වයස 11–18 දක්වා පාසල් ශිෂ්‍යයන් විසින් සහෝදර පාසල් ළමුන් 27 දෙනෙක් ද, ගුරුවරු දෙදෙනෙක් ද, මව්පියන් තිදෙනෙක් ද මරා දමා 65 දෙනෙකුට තුවාල සිදුකොට ඇත. ස්වයංක්‍රිය ගිනි අවියක් සමග පැමිණි පුද්ගලයෙක් නාගරික පාසලක ක්‍රීඩා පිටියේදී එහි සිටි දරුවන් මරා දමයි. වියට්නාම යුද්ධයේ රණවිරුවෙක් ආපන ශාලාවකදී 20 දෙනෙකු මරා 13 දෙනෙකුට තුවාල සිදු කරයි. තවත් එවැනිම, හමුදා ඇඳුමින් සැරසුනු රණවිරුවෙක් "මම කලිනුත් 1000 ක් මැරුවා, තව 1000ක් මරනවා" යැයි කෑගසමින් දේවස්ථානයක දේව මෙහෙයට සහභාගි වෙමින් සිටි පිරිස සමූහ ඝාතනයට ලක් කරයි.

සහෝදර පුරවැසියන්ගෙන් පැමිණිය හැකි භයානක හොබේසියානු අතුරු ආන්තරා ගැන සැක සංකාද, වේබරියානු රාජ්‍යය පිළිබඳ ලොකියානු අවිශ්වාසය ද හේතු කොට ගෙන අමෙරිකානුවෝ, රයිෆල් මිලියන 70, අත් තුවක්කු මිලියන 65 , සාමාන්‍ය තුවක්කු මිලියන 49 සහ වෙනත් ගිනි අවි මිලියන 8 යනාදී වශයෙන්, තුවක්කු මිලියන 200 කින් සන්නද්ධව සිටිති. (Cook and Ludwig 1997). තුවක්කු කර්මාන්තය – නිෂ්පාදනය, වෙළඳාම, ආනයනය සහ අපනයනය – වනාහි නීත්‍යානුකූල සහ නීති විරෝධී වෙළඳුන් දස දහස් ගණනින් යුත් දැවැන්ත ජාවාරමකි. රටේ වැඩිහිටි ජනගහණයෙන් මිලියන 44 ක් සතුව ගිනි අවි ඇතැයි වාර්තා වන අතර, ඒවා සෑම අමෙරිකානු නිවාස තුනෙන් එකකම ඇත. දෙමව්පියන් ඇතැම් විට නොසිතුවද බොහෝ දරුවෝ එම ගිනි අවි තිබෙන තැන දනිති. වරක්, හිලරි ක්ලින්ටන්, එවකට ජාතියේ පළමු කාන්තාව, ළමා ආරක්ෂක අරමුදලේ සංඛ්‍යා ලේඛන මත පදනම් වෙමින්, පාසල් දරුවන් 135,000ක් තුවක්කු සහ වෙනත් ගිනි අවි සිය පාසල් වෙත දිනපතාම රැගෙන යන බව වාර්තා කළාය. (1996

පෙබරවාරි 22, නිව් හැම්ප්ෂියර්, නෂුවා හි කළ කථාව). ආත්මාරක්ෂාව, දඩයම, විශ්‍රාමය සහ ආණ්ඩුවේ ප්‍රජා පීඩනයන්ට එරෙහිව ප්‍රතිරෝධය පෑම සඳහා ගිනි අවි තබා ගැනීමට අමෙරිකානු පුරවැසියන් සතුව අනුලංඝනීය අයිතියක් ඇතැයි සැලකේ. මෙය, එක්සත් ජනපද ව්‍යවස්ථාවේ 1791 දෙවන සංශෝධනයේලා මෙලෙස තහවුරු කෙරෙයි: "නිදහස් රාජ්‍යයක ආරක්ෂාව උදෙසා සංවිධිත පොලිසියක් අවශ්‍ය වන්නේ මුත්, ජනතාවට ආයුධ දැරීමට සහ භාවිතා කිරීමට ඇති අයිතිය ඉන් උල්ලංඝනය වන්නේ නැත".

සමාජය තුළ පවත්නා වූ මාරකත්වයේ අනතුරට එරෙහිව අමෙරිකානු රාජ්‍යයේ සන්නද්ධ පොලිස් හමුදාව පෙළ ගස්වා ඇත. මේ සේවාවන් අතර ෆෙඩරල් රජයට අයත් වූ මෙන්ම ප්‍රාන්ත හා ප්‍රාදේශීය මට්ටම්වල පොලිස් නිලධරයද වෙති. (1999, නිලධාරීන් 641,208: ජනගහණය 100,000ට 250 කි). 1999 දී ඝාතනයට ලක් වූ පොලිස් නිලධාරීන්ගේ සංඛ්‍යාව 42 කි. (එෆ්.බී.අයි. 2000:91). අවශ්‍යතාවය අනුව පොලිස් හමුදාව ජාතික ආරක්ෂක බල ඇණි සහ එක්සත් ජනපදයේ ෆෙඩරල් හමුදා බල ඇණි මගින් වෙර ගන්වනු ලබයි.

නොයෙකුත් අපරාධ ක්‍රියා නිසා නීතිය ඉදිරියේ වරදකරුවන් වී සිරගෙට නියම වූ 18 ලක්ෂයක් සිරකරුවන් අතර, 1999 දී 3,527 දෙනෙක් මරණ දඬුවමට නියමව සිටියහ. (Bureau of Justice 2000 b ; 2000 a). ෆෙඩරල් නීතිය යටතේත්, ප්‍රාන්ත රාජ්‍ය 50 න් 38 කත් මරණ දඬුවම බලපවත්වයි. 1977–1999 කාලය තුළ මරණ දඬුවමට ලක් වූ සංඛ්‍යාව 598 කි. 20 වන ශත වර්ෂය කෙළවරට පැමිණෙද්දී වේගයෙන් ඉහළ නගින අපරාධ රැල්ල සහ කළමනාකරණයට යටත් නොවන්නා සේ පෙනෙන ප්‍රචණ්ඩත්වය ඉදිරියේ භීතියට පත් සමාජයේ ඇතැම් පිරිස් මරණ දඬුවම වඩා ව්‍යාප්තව යෙදවීමටත්, එය නොමැති තැන්වල ඇති කිරීමටත්, වීදිවල වැඩිපුර පොලිස් බලකායන් රඳවන ලෙසටත්, සිරදඬුවම් කාලය දීර්ඝ කරන ලෙසටත්, වැඩිපුර සිරගෙවල් ඉදි කරන ලෙසටත් ඉල්ලමින් උද්ඝෝෂණය කරති. අමෙරිකාවේ ප්‍රචණ්ඩත්වය වනාහි සමාජයීය වශයෙන් පුහුණු කෙරෙන්නාවූ, සංස්කෘතික වශයෙන් බල ගැන්වෙන්නා වූ සංසිද්ධියකි. විධිමත් සහ අවිධිමත් ලෙස, නීත්‍යානුකූලව සහ නීති විරෝධී ලෙස මරණ සැටි මිනිසුන්ට කියා දෙනු ලැබේ. සිවිල් පුරවැසියන් අතර

මිලියන 24 කට වඩා වූ පිරිසක් වෘත්තික හමුද පුහුණුව සහිත මාරක ශාස්ත්‍රයන්හි ප්‍රවීණයෝ වෙති. (1999 දී 24,800,000). අමෙරිකානු වැඩිහිටියක් හතර දෙනෙකුට එක් අයෙක් මෙබඳු අත්දැකීම් සහිත හමුදා රණවිරුවෝය. බොහෝ කනිෂ්ඨ උසස් පාසල්, විද්‍යාල සහ විශ්ව විද්‍යාල ආරම්භක හමුද පුහුණුවක් සිසුන්ට ලබා දෙති. ආත්මාරක්ෂාව සඳහා මරණ සැටි උගන්වන වෙළඳ ව්‍යාපාර මෙන්ම, යුද සටන් ක්‍රම පුහුණු කරන පෞද්ගලික හමුද ද තිබේ. වීදි කල්ලි ඝාතනය අරමුණු කොට සමාජානුයුක්ත වෙති. සිර ගෙවල් දමරිකත්වයේ පුහුණු ආයතන ලෙස ක්‍රියාත්මක වෙති. කුලී සටන් කරුවන් (හමුද) සඳහා පළ කෙරෙන වාර සඟරා සටන් තාක්ෂණ උගන්වයි, ආයුධ විකුණයි, කුලී ඝාතකයින්ගේ ප්‍රචාරක දැන්වීම් පළ කරයි. මාරක තාක්ෂණය පුළුල් පරාසයක් තුළ උපයෝගි කර ගනු ලබනු වීදි සටන්වල සිට, ගොඩබිම, ගුවන්, මුහුදු සහ අභ්‍යවකාශ සටන් දක්වා වූ සටන් තුළින් රංග ඝාතන අවස්ථා පිරි නමන්නා වූ වීඩියෝ සහ පරිගණක 'ක්‍රීඩා' තරුණ ක්‍රීඩකයින්ට නිරතුරුව ආශ්වාදය සපයති. පරිගණකයෙන් මැවූ රුවක් හෝ පරිසරයක් ඇතුළත මැවූ රුවක පිහිටෙන් නරඹන්නන්ට ප්‍රතික්‍රියා කළ හැකි යථාර්ථයක් (Virtual reality) අලෙවි කරන ව්‍යාපාර විසින්, ඇඩ්රිනලින් පොම්ප කරන්නා වූ, 'මරනු – නැතහොත් මරණයට භාජනය වනු' වර්ගයේ උග්‍ර ආස්වාදයන් විකුණති. විද්‍යාල භූමි තුළ වරින් වර මතුවන විනෝද ක්‍රීඩාවක් වන්නේ සහෝදර සිසුන් "ඝාතනය කිරීමේ" රංග ක්‍රීඩාවයි. මේ රංග ඝාතන මෙන්ම සැබෑ ඝාතන, සෙල්ලම් අවි දරා කුඩා වියේ කළ ක්‍රීඩාවල ස්වභාවික විස්තාරණයක් වන්නා සේය.

ජන සන්නිවේදන මාධ්‍ය මාරකත්වය පිළිබඳ පෘථුල ආදේශක අධ්‍යාපන ක්‍රියාවලියක් ගොඩ නඟමින්, මනුෂ්‍ය ජීවිතයේ වටිනාකම පිළිබඳ අසංවේදීකරණයකට ජනතාව භාජනය කරයි. මෙහිදී ගුරුවරුන් වන්නේ කාටූන් සහ සිනමා නිර්මාණ, ටෙලිවිෂන් සහ රේඩියෝ වැඩසටහන්, ගීත, පොත්, සඟරා සහ වෙළඳ දැන්වීම් සම්පාදනය කරන උදවියයි. ළමා වියේ සිට වැඩිහිටි විය දක්වා අනොරක් නැතිව මිනිසුන්, දේපල, සතුන් හා ස්වභාව ධර්මය වීරයන් මෙන්ම දුෂ්ටයන් විසින් ප්‍රචණ්ඩ ලෙස විනාශ කරන ආකාරය දැක්වෙන ගොරබිරම් රූප දහස් ගණනින් මතයේ කෙටවෙයි. ලේ

නැලීමේ සහ හිංසනයේ රූප, ලිංගික රූප සමග වේගවත් ප්‍රත්‍යාවර්තන පෙළ ගැස්වීම් මගින් සංයෝජනය කෙරෙනු වඩ වඩා දක්නට ලැබෙන අතර, ප්‍රචණ්ඩත්වය කේන්ද්‍ර කරගත් එබඳු සිනමා නිර්මාණ ඉතා සියුම් ලෙස මාරකත්වය කෙරේ උපද්වාරික පෙළඹවීමක් ඇති කරයි.

ඉතිහාසයේ කිසිම ජනතාවකගේ මොළ තුළ මාරක රූප මේ තරම් අධික ප්‍රමාණයක් සටහන්ගත වී නැත. කොමාන්ඩෝ භටයන් සහ ඝාතකයන් පුහුණු කිරීමේදී, මරන්නට ඔවුන් තුළ ඇති අරුචිය ඉවත් කිරීමේ හමුදා තාක්ෂණ ක්‍රම අතර, බීලේච්ඡ කෲර අපරාධ දර්ශන සහිත චිත්‍රපට දිගින් දිගටම නරඹන්නට බලහත්කාරය යොදා සැලැස්වීම ඉතා සාර්ථක ක්‍රමයක් ලෙස තහවුරුව තිබේ. (Watson 1978 : 248-51). එම තාක්ෂණයම ඉතා ව්‍යාප්තව යොද ගනිමින් ජීවිතය පිළිබඳ වූ සුහද ගෞරවය විනාශ කොට, ඒ වෙනුවට ඝාතනය උදාසීනව පිළිගන්නා තත්වයක් ඇති කරන්නා වූ අසංවේදීකරණයකට මුළු ජාතියම භාජනය කෙරෙන්නා සේය. අධිකරණය වාර්තා කරන පරිදි, මනුෂ්‍ය ජීවිතය පිළිබඳ කිසිදු ගෞරවයක් යොවුන් ඝාතකයන් විසින් එන්න එන්නම නොදක්වන බවක් ද පෙනී යයි.

එහෙත් සමාජයට කෙතරම් හානිකර වුවත්, මාධ්‍ය විසින් ප්‍රචණ්ඩත්වය සමාජගත කිරීම වෘත්තික දේශප්‍රේමී ඝාතකයන් උවමනා කරන රාජ්‍යයකට ප්‍රයෝජනවත්ය. අමෙරිකානු පාපන්දු ක්‍රීඩාවේ ජනප්‍රිය Super Bowl තරඟ මාලාවේ රූපවාහිනී ප්‍රචාරණයක් තුළදී, දශලක්ෂ ගණන් ග්‍රාහකයින්ට දැක ගත හැකි වූ, හමුදාවට නවකයින් බඳවා ගැනීමේ ඩොලර් දශ ලක්ෂයක ප්‍රචාරක දැන්වීමක් එකී රාජ්‍ය අභිලාෂය සංකේතවත් කරන සුලබ සංනිදර්ශනයක් වන්නේය. වීඩියෝ සටන් "ක්‍රීඩාවල" එන අසිපත්ධාරී මධ්‍යකාලීන නයිට්වරයෙක්, වක් කඩුවක් ලෙලවන නූතන එක්සත් ජනපද නාවික භටයෙක් බවට රූපාන්තරණය වෙයි.

මාරකත්වය වූ කලී ස්වභාවිකය, මග හැර යා නොහැකිය – යන දෘෂ්ටිය ජනනය කරමින් භාෂාව එය පරාවර්තනය කරයි; බල ගන්වයි. අමෙරිකානු ආර්ථිකය "නිදහස් ව්‍යවසායික" ධනවාදය මත පදනම් ව ඇත. ඉදින් අමෙරිකානුවෝ "කොටස් වෙළඳ පළේ සිදු

කරන මරා දැමීමක්" ගැන කථා කරති. මිලට ගත යුත්තේ "පාරේ ලේ හැලී ඇති විටයි" – යනුවෙන් ප්‍රකට වෝල් ස්ට්‍රීට් (Wall Street) කියමනකි. ("You buy when there's blood in the streets"). වෙළඳ සමාගම් තරඟ වැදී ඇත්තේ, මිල යුද්ධය (Price wars) තුළයි. අමෙරිකානු දේශපාලනය නිදහස් මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදය මත පදනම්ව ඇත. පක්ෂ ප්‍රචාරක කාර්යධුරය "පාබල හමුදව" නැතිනම් "බල ඇණි"ය. ව්‍යවස්ථාදායකය තුළ පනත් මරා දමති. ඒ අතර දරිද්‍රතාව, අපරාධ, මත් ද්‍රව්‍ය සහ වෙනත් සමාජ ගැටළුවලට එරෙහිව ජාතිය "යුධ වැදී" සිටියි. ජාතික ක්‍රීඩාව වන්නේ බේස් බෝල්ය; අපේක්ෂාභංගයට හා අසතුටට පත් ක්‍රීඩා ලෝලීහු "අම්පයරයා (විනිසුරුවා) මරාපියව්" යනුවෙන් සම්ප්‍රදායානුකූලව කෑගසති. ක්‍රීඩා විචාරකයින් සාහසික පාපන්දු කණ්ඩායම් හඳුන්වන්නේ "මිනීමරුවන්" කියාය: එහිදී ක්‍රීඩකයෝ "ආයුධ" වෙති. පන්දුව යැවීම "දිග බෝම්බය". පිලක් පරාජයට පත් වන්නේ, "ඝාතක සහජාසය" ප්‍රමාණවත්ව නැති හෙයිනි. ආගමික නිදහස ගැන ආඩම්බර වන අමෙරිකානුවෝ, සාමයේ කුමරාට වන්දනාමාන කරන අතරම "කිතුනු සොල්දාදුවනි, ඉදිරියටම යව්" යනුවෙන් ගායනා කරති. කුරුස යුද්ධවල සහ ප්‍රොතෙස්තාන්ත ප්‍රතිසංස්කරණයේ භාරය පිළිබඳු කරමින් ඔවුනු "කුරුසියේ සොලදදුවන්" ලෙස, අත්වැල් ගායනා ඔස්සේ "යාකොබ්ගේ ඉණිමගේ" ඉහලට නගිති. ජීවිතය ගත වෙද්දී, මුණ ගැසෙන විවේක විශ්‍රාමීය අවස්ථා ඔවුනට දැනෙන්නේ "කාලය මැරීමක්" ලෙසටය.

වර්ගවාදී මෙන්ම, ලිංගවාදී භාෂාවේ උපද්‍රවකාරී බලපෑම් ගැන වඩ වඩා සවිඥානක වන මුත්, අමෙරිකානුවෝ, කිසිදු සංවේදිතාවයකින් තොරව මාරකත්වයේ භාෂාව දිගටම භාවිතා කරති. අමෙරිකානු ඉංග්‍රීසියේ "ආයුධ ගබඩාව" ඉතිහාසයේ දක්නට ලැබුණු සියලු ආකාරයේ ආයුධ, ඒවා භාවිතා කරන හැටි, ඒවායේ ගති ලක්ෂණ නිරතුරුව මතක භූමියට කැඳවයි. පාවා දීම "පිටට පිහියෙන් ඇනීම"කි. අයවැය යෝජනාවලට "පොරොවෙන් කොටනු" ලැබේ. උත්සාහයක් යනු "කුරුමාණම් අල්ලා තබන වෙඩිල්ලකි". අදහස් "ටෝපිඩෝ" කළ හැකිය. විරුද්ධ පක්ෂය "ප්‍රති–ගුවන් ප්‍රහාරක පද්ධතියකි." ක්‍රියාවන්ගේ විපාක "විරසක වීම්" ය. නීතිඥයෝ "කුලියට ගත් තුවක්කු" වෙති. ඇතැම් සුරූපී සිනමා නිළියෝ නිසැකින්ම "ධවලකේෂී බෝම්බ"වෙති.

අතිත් අතට, වාගාලංකාර නැතහොත් "හුරතල් වචන" සිරිතක් වශයෙන් සැබෑ ඝාතනය හා මාරකත්වය වසං කරයි; B – 29 බෝම්බ ප්‍රහාරක ගුවන් යානයේ සිට හිරෝෂිමා නගරය මත හෙළන ලද ලෝකයේ ප්‍රථම න්‍යෂ්ටික බෝම්බය "කුඩා කොළුවා" නම් විය. ඊළඟට, නාගසාකි මත හෙළන ලද ප්ලූටෝනියම් බෝම්බය "බොක්ගේ රියෙන්" වැටුණු "මහත මිනිසා" වූයේය. නාගරික ජනතාවන් සමූහ ඝාතනයට ලක් කිරීමට හැකියාවක් ඇති අන්තර්–මහද්වීපික න්‍යෂ්ටික මිසයිල "සාම නිර්මාපකයෝ" වෙති. යුද්ධයේ භාෂාව ක්‍රීඩාවේ භාෂාව මගින් විස්ථාපනය කෙරේ. සමූහ ඝාතනයට සූදානම් වන හමුදා අභ්‍යාස හුදෙක් "ක්‍රීඩා" වෙති. යුද ගැටුමකදී සිවිල් පුරවැසියන් හෝ හමුදා භටයින් ඝාතනයට ලක් වීම හුදෙක් "සම්පාර්ශවික හානි" නම් වේ. ඒ අනුව බලන විට හිටපු ජනාධිපති රොනල්ඩ් රේගන්ගේ "නූතන ඉතිහාසයේ යුද–නැඹුරුව අවම, වඩාත්ම සාමකාමී ජාතිය අමෙරිකාවයි" (PBS, 1993) යන කියමනට අපූරු අර්ථයක් තිබේ.

පුරවැසියන් එකිනෙකා අතරත් කණ්ඩායම් අතරත්, ඔවුන් සහ රාජ්‍ය නියෝජිතයින් අතරත් වාරිකව මතුවන රංචු ප්‍රචණ්ඩත්වය අමෙරිකානු මාරකත්වයට නවත් මානයක් එකතු කරයි. 1992 දී, ලොස් ඇන්ජලීස් නගරයේ දකුණේ මැද ප්‍රදේශයේ කළු පුරවැසියෙකුට එරෙහිව ක්‍රියාත්මක වූ පොලිස් මෘගත්වය සාධාරණීකරණය කළ අධිකරණ තීන්දුවකට ප්‍රතිචාර වශයෙන් සිදු කෙරුණු වෙඩි තැබීම්, මංකොල්ලකෑම් සහ ගිනි තැබීම් නිසා පුද්ගලයින් 52 ක් මරුට ගොදුරු විය. 2000 කට තුවාල සිදුවිය. 8000ක් සිරභාරයට ගැනුණි. එවිට අවට ප්‍රදේශයේ සිටි බියට පත් පුරවැසියන් අතර තුවක්කු 70,000 ක් විකුණා දමනු ලැබිණ. මේ මහා ලේ වැගිරීම, වොට් (Watts) හි, (1965 දී 34), නෙවාක් හි (1967 දී 26), ඩෙට්‍රොයිට් හි (1967 දී 46) සිදු වූ ඝාතන මෙන්ම, 18 සහ 19 ශතවර්ෂවලදී වහලුන්ගේ නැගිටීම්වලදී සිදුවූ ජීවිත හානි බඳු නූතන ඉතිහාසයේ එබඳුම ඝාතන රාශියක් අනුස්මරණය කරන සුළුය. 1967, ඩෙට්‍රොයිට් නගරයේ සිදුවූ කැළඹීම් සමනය කිරීම සඳහා ජාතික ආරක්ෂක හමුදා භටයන් 1600 ක් සහ අවි ගත් රාජ්‍ය හමුද භටයන් 360 දෙනෙකු යොදවනවාට අමතරව, පැරාමිලිටරි භටයන් 4700 ක් ගුවනින් පතිත කරන්නට සිදුවිය. (1969, Locke).

හොබේසියානු–වේබරියානු රාජ්‍යය, ලොකියානු දෙවන සංශෝධනයේ උරුමය සමග සංයෝජනය කිරීමේ ආදීනව, 1993 වැකෝ සහ ටෙක්සාස් නගරවලද, 1995 දී ඔක්ලහෝමා නගරයේද සිදුවූ ඝාතන විසින් සංනිදර්ශනය කෙරෙන්නේය; වැකෝ හි සන්නද්ධ රාජ්‍ය නිලධාරීහු, සන්නද්ධ ආගමික කල්ලියකට එරෙහිව නීතිය පිහිටුවන්නට උත්සාහ දරති. එවිට ෆෙඩරල් නිලධාරීන් 4 ක් ඝාතනයට ලක් වේ. දුසිමක් තුවාල ලබති. ආගමික කල්ලියේ ගැහැණුන්ද – ළමයින් ද ඇතුළු සාමාජිකයෝ 89 ක් හමුදා ගිනි තැබීමකින් මරණයට පත් වෙති. මේ ඛේදවාචකයේ දෙවන සංවත්සරයේදී, පෙනෙන ආකාරයට, පළිගැනීමේ චේතනාවෙන් ආවේශ වූ රාජ්‍ය විරෝධියෙක්, ට්‍රක් රථයක සවිකරන ලද බෝම්බයක් උපයෝගී කර ගෙන ඔක්ලහෝමා නගරයේ ෆෙඩරල් රාජ්‍ය කාර්යාලය පුපුරුවා හරියි. ගැහැණුන් ද, දරුවන් ද ඇතුළු 168 ක් ඉන් මරුමුවට පත් වෙති.

අවාසනාවකට, තමන්ගේ දේශ සීමාවලින් ඔබ්බෙන් බලද්දී අමෙරිකානුවන්ට පෙනෙන්නේ ද "නිර්ඝාත සමාජයක් පැවතිය නොහැකිය" යන විශ්වාසය තහවුරු කරන්නා වූ අප්‍රමාණ සාධකය. මනුෂ්‍ය වර්ගයාගේ වඩාත්ම මිනීමරු යුගය වන විසිවන ශත වර්ෂය මහා පරිමාණ ඝාතන සංහාරයන් සඳහා මිනිසා සතු හැකියාවන්ගේ භයංකර බව පූර්ණ ලෙස ප්‍රදර්ශනය කළේය. රුඩොල්ෆ් ජේ. රම්මෙල් විසින් සිදුකරන ලද පර්යේෂණයක් මිනිසාගේ ලේ වැගිරවීම් ඓතිහාසික සහ ගෝලීය පර්යාලෝකයක් තුළ තබන්නට ආධාර වේ. තරමක් "අවප්‍රමාණය" කරමින්, වාර්තාගත ඉතිහාසය තුළ ඝාතනවල පරිමාණය රම්මෙල් විසින් ගණනය කරන්නේ, **ජන සංහාර** (Democide) (රාජ්‍යය විසින් තම ජනයා සමූහ වශයෙන් ඝාතන කිරීම, මරණ දඬුවම, සමූහ ඝාතන, මිනිසා විසින් නිර්මාණය කරන ලද සාගත) සහ **යුද විපත්** (Battle deaths in war) (ලෝක යුද්ධ, කලාපීය යුද්ධ, සිවිල් යුද්ධ, විප්ලව කැරලි, ගරිල්ලා යුද්ධ) එකිනෙක වෙන් කොට, පහත දැක්වෙන වගුවේ ආකාරයට, හඳුනා ගනිමිනි:

**වගු අංක 1**

ඉදින්, ඇතැම් විට, මිනිසුන් දශලක්ෂ 400 කට ආසන්න

ප්‍රමාණයක්, සාමාන්‍ය මිනීමැරීම් ඇතුළත් නොවන, මේ කී ආකාරයේ,

**1987 දක්වා ජන සංහාර සහ යුද විපත් නිසා සිදුවූ මරණ**

| | 1900 ට පෙර | 1900-1987 | මුළු ගණන |
|---|---|---|---|
| ජන සංහාර | 133,147,000 | 169,198,000 | 302,345,000 |
| යුද්ධ | 40,457,000 | 34,021,000 | 74,478,000 |
| මුළු ගණන | 173,604,000 | 203,219,000 | 376,823,000 |

මූලාශ්‍රය Rummel 1994; Table 1.6; 66-71

ඓතිහාසික-දේශපාලන ඝාතනයේ ගොදුරු බවට පත්වන්නට ඇතැයි අනුමාන කළ හැකිය. රම්මෙල් මේ ජනසංහාර ධාරිතාවෙන් වැඩි හරියක් කොමියුනිස්ට් රාජ්‍යයන්ටද, දෙවනුව ඒකාධිපති සහ අධිකාරවාදී රාජ්‍යයන්ට ද, අවම ප්‍රමාණයක් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්ට ද පවරයි. අමෙරිකානු මතකය තුළ හිට්ලර්ගේ ලෝක ජන සංහාරයද, ස්ටාලින්ගේ මර්දනයද, ජපන් ආක්‍රමණයද, මාඕවාදී ඝාතනද තවමත් අලුත්ය.

විලියම් ජේ. ඒක්හාඩ්ට් සහ ඔහුට පසුව පැමිණි අය 1900-1995, එනම් 20 ශතවර්ෂය තුළ යුද්ධ ආශ්‍රිත ඝාතන අවම වශයෙන් 106,114,000 විය යුතු යැයි ගණනය කරති. එම සංඛ්‍යාවට සිවිල් පුරවැසියන් 62,194,000 සහ හමුදා භටයින් 43,920,000 ක් අයත්ය. (Sivard 1996; 19). "සීතල යුද්ධයේ" "සාමකාමී" සමයේ, 1945-1992 අතර, ජන ඝාතන ප්‍රමාණය අවම වශයෙන් 22,057,000 ක් යැයි ගණන් බලා ඇත. යුද්ධ 149 ක් තුළ මෙලෙස සිවිල් පුරවැසියන් 14,505,000 ක් ද සටන්කරුවන් 7,552,000 ක් ද මරු මුවට පත්ව ඇත. (Sivard 1993; 20-1). 1996 වසර තුළ අඩුම වශයෙන් යුද්ධ 30 ක් වත් ලෝකයේ තැන තැන ඇවිලෙමින් පැවතිණ.

ඇතැම් විටෙක දීර්ඝ කාලයක් තිස්සේ පවතින වෛරයන්, නැතහොත් මෑත කාලීන කෲරත්වයන් සහ පළිගැනීම් තුළ මුල් ඇදුනු, වර්තමාන අවශ්‍යතා තෘප්ත කිරීමේ නොහැකියාවෙන් වෙර ගන්වනු ලබන ලොව පුරා සිදුවන ලේ හැලීම්වල රූප රූපවාහිනී තිර වාරිකව ප්‍රක්ෂේපණය කරති. එක් ඝෝර අර්බුදයක් පසු පස තවත් එකක් නොකඩවා එන බවක් හැඟී යන්නේ ජන සංනිවේදන

මාධ්‍ය මොහොතක් පාසා එකකින් එකකට මාරුවෙමින් සිටින බැවිනි. ලේ හැලීම් විවිධාකාරය. එසේ නමුත් සියල්ලම මැරීමට ඇති සූදානම මත මුල් අල්ලා ඇත. ජාත්‍යන්තර යුද්ධ, සිවිල් යුද්ධ, විප්ලව, බෙදුම්වාදී යුද්ධ, ත්‍රස්තවාදී කෲරත්වය, දේශසීමා අරගල, හමුදා කුමන්ත්‍රණ, ජන ඝාතන, වාර්ගික - ආගමික–ගෝත්‍රික සංහාර, මිනීමැරුම්, විදේශීය සන්නද්ධ මැදිහත් වීම්, මෙන්ම, මැරීම වක්‍රව සිදු කරන්නා වූ කෲර වධ හිංසා සහ අහිමි කිරීම් (සම්බාධක) යනාදී වශයෙනි. 1993දී නිව්යෝර්ක් නගරයේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ (WTC) බෝම්බ පිපිරවීමේදී මෙන්, ඇතැම් විට අමෙරිකානුවන් අමෙරිකාවේදී ඝාතනයට ලක් වන්නේ, එම රාජ්‍යය විදේශීය රාජ්‍යයන් සමග ඇති සතුරු ඝර්ෂණයන් හේතු කොට ගෙනය. එක්සත් ජනපදය, ඊශ්‍රායල රාජ්‍යයට ආධාර කරනවාට විරුද්ධව සිටින කණ්ඩායම් විසින් කරන ලද ප්‍රහාරයක් වූ එයින් සය දෙනෙක් මරු මුවට පත් වූ අතර දහසක් දෙනා තුවාල ලැබූහ. විදේශයන් හිදී ද එබඳු ඝාතන සිදුවෙයි. 1998 දී, නයිරෝබියේ සහ දූර් එස් අලාම් නගරවල පිහිටි අමෙරිකානු තානාපති කාර්යාල සමගාමී ට්‍රක් රථ බෝම්බ ප්‍රහාරයන්ට ලක්වීමෙන් අමෙරිකානුවන් 12 ක් සහ අප්‍රිකානුවන් 300 ක් මරණයට පත්වූ අතර තවත් 5000 ක් පමණ දෙනා තුවාල ලැබූහ. බැස යන 20 වන සියවසේ ලොව දෙස කවුළුවකින් බලන අමෙරිකානු දේශපාලන නායකයෝ හොබ්ස් සිහිගන්වමින් "එළියේ ඇත්තේ ඝන කැලෑවකි" යන සිතිවිල්ලට නැඹුරු වෙති. ඉදින්, "සාමය අවශ්‍ය නම් යුද්ධයට සූදනම් වෙනු" (si vis pacem para bellum) යන, අභාවයට ගිය රෝම අධිරාජ්‍යයේ සටන් පාඨය, නැවත නැවතත් නිර්දේශ කිරීමට පෙළඹෙති.

*****

ප්‍රාථමික විශ්වාස, දාර්ශනික උරුමය, දේශප්‍රේමී සමාජානුයෝජනය, මාධ්‍ය වෙර ගැන්වීම, සංස්කෘතික තත්වාරෝපණය සහ ගෝලීය ලේ වැගිරීම යන සියල්ලෙන් සපිරි සන්දර්භයක් තුළ බොහෝ අමෙරිකානු දේශපාලන විද්‍යාඥයින් සහ ඔවුන්ගේ ශිෂ්‍යයන් විසින් නිර්ඝාත සමාජයක භව්‍යතාවය අවධාරණාත්මකව ප්‍රතික්ෂේප කිරීම පුදුමයක් නොවේ.

විශ්ව විද්‍යාල පරිසරයක් තුළ, ආරම්භක පාඨමාලා පන්තියක

සිට උපාධි අපේක්ෂක සම්මන්ත්‍රණාගාර දක්වා, ප්‍රථම හමුවකදී මේ ප්‍රශ්නය නැඟුනු විට මනුෂ්‍ය ස්වභාවය, ආර්ථික හිඟතම් සහ ලිංගික සහ වෙනත් පදනම් මත සිදු කෙරෙන ප්‍රහාරවලින් ආරක්ෂා වීමේ අවශ්‍යතාව යන කරුණු මූලික විරෝධතාවන් ලෙස සිරිතක් වශයෙන් ප්‍රකාශයට පත් වේ. මේ ප්‍රතිචාර සංස්කෘතික වශයෙන් රටාගත වන්නේ මුත්, මතුවෙන විචල්‍යයන්ට සහ විස්තාරණයන්ට කෙළවරක් නොමැති තරම්ය.

ප්‍රශ්නය නැගෙන සෑම විටකම කිසියම් අලුත් ප්‍රවාදයක් අපේක්ෂා කළ හැකි වෙයි; මනුෂ්‍යයා වනාහි බලයට කෑදරය, ආත්මාර්ථකාමීය, ඊර්ෂ්‍යා සහගතය, නපුරුය, උන්මත්තකය. ආත්මාරක්ෂාව සඳහා මැරීම ජීව විද්‍යාත්මක ගතිකයකි. එය අනුලංඝනීය මනුෂ්‍ය අයිතියක් ද වේ. මනුෂ්‍යයා ආර්ථික වශයෙන් කෑදරය; තරඟකාරීය. සමාජීය විශේදනයත් මෙන්ම, ගැටෙන්නා වූ අවශ්‍යතා විසින් ඝාතනය අනිවාර්ය බවට පත් කරයි. අනිත් අතට, තිබිය හැකි විකල්ප ඝාතනයට වඩා භයානකය - මානසික හිංසාව සහ ආර්ථික අහිමි කිරීම්. නිර්ඝාත සමාජයක් සර්වාධිකාරී (Totalitarian), නිදහස අහිමි කරන ලද සමාජයක් වීම නිසැකය. එයට අනිවාර්යයෙන්ම විදේශ ආක්‍රමණයන්ට ගොදුරු වී යටත්වන්නට සිදුවනු ඇත. දේශපාලක මූලධර්මයක් ලෙස ගත් විට, නිර්ඝාත සංකල්පය සදාචාර විරෝධී වන්නේය. ආක්‍රමණයක ගොදුරු බේරා ගැනීම සඳහා ඝාතනයක් කිරීම සෑම විටම සාධාරණ ලෙස සැලකිය යුතු නොවේද? දඬුවම් වශයෙන් සහ ආදර්ශයක් ඇති කිරීම සඳහා අපරාධකරුවන් ඝාතනයට ලක් කිරීම සමාජයට වැඩදයකය. ආයුධ නිර්මාණය වී තිබේ – දැන් එය ආපස්සට හැරවිය නොහැකිය. මාරක තාක්ෂණය සෑම කල්හිම පවතිනු ඇත. මුළු ඉතිහාසයේම නිර්ඝාත සමාජයක් පැවති බවට තොරතුරක් නැත. කොටින්ම, එය අචින්ත්‍යය.

පන්ති කාමර මට්ටමේ පූර්ණ එකඟතාවක් සෑම තැනම, සෑම විටම ඇති බවක් යට කී සියල්ලෙන් ගම්‍ය නොවේ. ඇතැම් අමෙරිකානු විද්‍යාර්ථීහු, මිනිසුන් තුළ නිර්මාණයට සහ මෛත්‍රියට හැකියාවක් තිබෙන නිසා නිර්ඝාත සමාජයක් අධ්‍යාපනය හරහා ඉදි කළ හැකි වෙනැයි යෝජනා කරති. තවත් සමහරු සිතන්නේ නිර්ඝාත කොන්දේසි කුඩා පරිමාණයේ සමාජයන් තුළ පිහිටුවිය හැකි වුවත්, විශාල සමාජයන් තුළ හෝ ගෝලීය වශයෙන් එය සාක්ෂාත් කළ

නොහැකි අරමුණක් බවයි. තවද, මේ සියල්ලෙන්, වෙනත් රටවල දේශපාලන විද්‍යා මහාචාර්යවරුන්ට සහ විද්‍යාර්ථීන්ට වඩා කැපී පෙනෙන ලෙස අමෙරිකානු ශාස්ත්‍රීය පර්ෂද ප්‍රචණ්ඩත්වය භාර ගැනීමට නැඹුරු බවක් ගම්‍ය නොකෙරේ. එවැන්නක් සනාථ කිරීමට නම් විධිමත් තුලනාත්මක අධ්‍යයනයක් අවශ්‍ය වනු ඇත. එහෙත් අනුමාන කළ හැක්කේ දේශපාලන විද්‍යා වෘත්තිය තුළ, ජාත්‍යන්තර වශයෙන්ම, පොදු අඝුනවාදී නැඹුරුවක් ප්‍රමුඛ ලෙස ව්‍යාප්තව දක්නට ඇති බවය.

කෙසේ වෙතත් නිර්ඝාත සමාජය විය හැක්කක්ද? යන මේ අචින්ත්‍ය ප්‍රශ්නය වෙනත් දේශපාලන සංස්කෘතීන් වෙත යොමු කරන විට ලැබෙන ප්‍රතිචාර නම් විශ්මයජනක ලෙස වෙනස්ය.

**මීට පෙර කවදවත් මම මේ ගැන හිතල නැහැ..**

අහිංසාවාදී දේශපාලන විද්‍යාවක් පිළිබඳ අදහස සාකච්ඡා කිරීමට 1980 දී ස්ටොක්හෝම් නුවරට රැස් වූ ස්වීඩනයේ අනාගතවාදීන්ගේ සම්මන්ත්‍රණයකදී එක්තරා ස්වීඩන් ජාතික විද්වතෙකු දැක්වූ ප්‍රතිචාරය එයාකාර විය. "මීට පෙර කවදාවත් මම මේ ගැන හිතල නැහැ. ඒ නිසා කල්පනා කරන්නට යම් කාලයක් අවශ්‍යයි." පුදුමය නම් මෙතැන යාන්ත්‍රික නිෂේධනයක් හෝ යාන්ත්‍රික එකඟත්වයක් නොමැති වීමයි. ප්‍රශ්නය අවලෝකනයට භාජනය විය යුතු සහ තවදුරටත් සිතා බැලිය යුත්තක් වශයෙන් භාර ගැනෙයි. එපරිද්දෙන්ම, 1997 සෝල් නුවර පැවති පද්ධති විද්‍යාඥයන්ගේ ජාත්‍යන්තර සමුළුවකදී රසායන විද්‍යාව පිළිබඳ නොබෙල් ත්‍යාගලාභියෙකුගේ ප්‍රතිචාරය වූයේ "මා දන්නෙ නැහැ" යන්නයි. ප්‍රතිචාරයක් සඳහා ප්‍රාමාණික විද්‍යාත්මක පදනමක් නොපෙනෙන විට, සිරිතක් වශයෙන් ඔහු ප්‍රශ්නයකට ලබා දෙන පිළිතුරයි ඒ. ඉන්පසුව, ඔහු මේ ප්‍රශ්නය බැරෑරුම් ලෙස භාර ගත්තා මෙන් සමුළුවෙන් ඉල්ලා සිටින්නේ "විද්‍යාවද, ශිෂ්ටාචාරයද ඉදිරියට යන්නේ අභව්‍ය සේ පෙනෙන දේ ප්‍රශ්න කිරීම තරහා බව" අවධාරණය කරමිනි.

**එවැන්නක් ගැන සිතිය හැකියි. නමුත් ..**

1979 දී, ජාත්‍යන්තර දේශපාලන විද්‍යා සංගමයේ 11 වන සමුළුවේදී රුසියානු ශාස්ත්‍රඥයින් දෙදෙනෙකු විසින් "නිර්ඝාත දේශපාලන

විද්‍යාවක්" යන පත්‍රිකාවට ප්‍රතිචාර දක්වන ලද්දේ, ප්‍රශ්නය ගැන බැරෑරුම් ලෙස සලකා බැලීමට කැමති බව ප්‍රකාශ කරමිනි. මේ දෙදෙනාම, දේශපාලනයේ සහ දේශපාලන විද්‍යාවේ අරමුණ විය යුත්තේ අහිංසාවාදී සමාජයක් නිර්මාණය කිරීමය - යන ප්‍රස්තුතය සමග විශ්මය දනවන අයුරින් එකඟ වෙති. "නමුත්, නිර්ඝාත දේශපාලනයේ සහ නිර්ඝාත දේශපාලන විද්‍යාවේ ආර්ථික පදනම කුමක්ද?" යනුවෙන් එක් අයෙක් ප්‍රශ්නයක් නඟද්දී, අනෙකා "නමුත් චිලියේ (ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පත් වූ සමාජවාදී ආණ්ඩුව හමුදා කුමන්ත්‍රණයක් මගින් පෙරළා දමනු ලැබිණ), නිකරාගුවාවේ (ප්‍රචණ්ඩ මර්දනය සහ විප්ලවය පිළිබඳ විත්‍රයකි) නැතහොත් කම්පුචියාවේ (නාගරික-පන්තික ජන සංහාරයක් මගින් දශ ලක්ෂකට වැඩි ජනතාව විප්ලවවාදීන් විසින් ඝාතනය කරනු ලැබිණ.) වැනි ඛේදවාචකයන්ට අප මුහුණ දෙන්නේ කෙසේද?" යනුවෙන් විමසා සිටියේය.

හැබැවටම, වර්තමාන "ධනපති ක්‍රමය" හෝ "කොමියුනිස්ට් ක්‍රමය" මෙන් ඝාතනය මත රඳා පවතින්නේ හෝ ඊට දායක වන්නේ හෝ නැති අර්ථ ක්‍රමය කුමක්ද? එමෙන්ම, මිනීමරු නෘශංසත්වයන්ගේ මාරක ප්‍රතිඵල නිවාරණය කිරීමට, නැවැත්වීමට සහ ඉවත් කිරීමට නිර්ඝාත දේශපාලනයට හැකි වන්නේ කෙසේද? අහිංසාවේ භව්‍යතාවය භාර ගැනෙන අතර, බැරෑරුම් විද්‍යාත්මක ගවේෂණයන් ඉල්ලා සිටින ප්‍රශ්න මෙහිදී මතු කරනු ලැබ ඇත.

**මනුෂ්‍යයන් ස්වභාවයෙන් ප්‍රචණ්ඩ නොවන බව අපි දනිමු, නමුත් ..**

1981 දී, අම්මාන්හි ජෝර්දාන් විශ්ව විද්‍යාලයේ අරාබි ජාතික දේශපාලන විද්වතුන් සහ මහජන පරිපාලන ක්ෂේත්‍රයේ විද්වතුන් කණ්ඩායමක් වෙත ප්‍රශ්නය යොමු කරනු ලැබිණ. එක්තරා මහාචාර්යවරයෙක් පොදු එකඟතාවක් ප්‍රකාශයට පත් කරමින් කියා සිටියේ "මනුෂ්‍යයන් ස්වභාවයෙන් ප්‍රචණ්ඩ නොවන බව අපි දන්නවා, නමුත් ආත්මාරක්ෂාව සඳහා සටන් කරන්නට අපට සිදුවෙලා තියෙනවා" යනුවෙනි. මනුෂ්‍යයන් සහජයෙන්ම, එබැවින් නියතවාදී ලෙස, ප්‍රචණ්ඩය යන ප්‍රාථමික තර්කය ප්‍රශ්නයට භාජනය වන තැනදී, කිසිවෙක් කිසිවෙකු විසින් ඝාතනය නොවන කොන්දේසි කවරේදැයි සෙවීමට අවකාශ විවෘත වේ.

**එය අභව්‍යය, නමුත්...**

1985, හිරෝෂිමා විශ්ව විද්‍යාලයේ සාම විද්‍යා ආයතනයේ 10 වන සංවත්සරයේ සම්මන්ත්‍රණ සැසියකදී ප්‍රධාන වශයෙන් ජපන් සහභාගිකයන්ගෙන් සමන්විත වූ සභාව එකඟ හා නොඑකඟ වශයෙන් සමාන පාර්ශව දෙකකට බෙදුණි. එහිදී, අධ්‍යාපනවේදී මහාචාර්යවරයෙක්. "එය අභව්‍යය, නමුත් එය භව්‍ය වීම සඳහා භව්‍යතාවක් තිබේ." යනුවෙන් ප්‍රකාශ කළේය. ඉන් අදහස් වූයේ නිර්ඝාත සමාජය ක්ෂණික වශයෙන් සාක්ෂාත් කළ නොහැකි අරමුණක් වුවත්, අනාගතයේ එවැන්නක් ඇති වීමේ අවකාශ ප්‍රතික්ෂේප නොකළ යුතු බවයි. අනතුරුව ඔහු "නිර්ඝාත සමාජයක් නිර්මාණය කිරීමට දායක විය හැකි අධ්‍යාපන ක්‍රමය කවරාකාරද?" යන ප්‍රශ්නය සභාවට යොමු කරයි. ඒ වනාහි සැබැවින්ම නිර්මාණශීලීව ප්‍රශ්න විසඳීම උදෙසා ඉදිරියට යොමු කෙරෙන ආරාධනයක් වන්නේය.

**ඔව්, පූර්ණ භව්‍යතාවක් ඊට තිබේ...**

1987 දෙසැම්බර් මාසයේදී, කොරියානු සමාජ විද්‍යාඥයන්ගේ සංගමයේ සභාපති සහ පියොංයැංහි දේශපාලන නායකයා ද වන කොරියානු ජාතික, දර්ශනය පිළිබඳ මහාචාර්යවරයෙක් විශ්මය දනවමින්, කිසිදු පැකිළීමකින් තොරව "ඊට පූර්ණ භව්‍යතාවක් තියෙනවා" යි කියා සිටියේය; "ඇයි? ප්‍රථම කොට මනුෂ්‍යයන්ට නොමරා ඉන්නට බැරියාවක් ස්වභාවයෙන් නැහැ. ඔවුන්ට, මාරකත්වය ප්‍රතික්ෂේප කිරීමට හැකියාව ලබා දෙන "විඥානය", "බුද්ධිය" සහ "නිර්මාණශීලිත්වය" උරුමයි. දෙවනුව, ආර්ථික දුෂ්කරතා ඝාතනය සාධාරණීකරණය කිරීමේ ලා භාවිතා නොකළ යුතුයි. මන්ද, මනුෂ්‍යයන් භෞතිකයේ වහලුන් නොවන හෙයිනි. අඩුපාඩු, හිඟකම් "නිර්මාණශීලීත්වය" සහ "ඵලදායකත්වය" මගින් සහ "විශේෂයෙන්ම සාධාරණ ලෙස බෙදා හැරීමේ ක්‍රමයක් මගින්" ජය ගනු ලැබිය හැකියි. තුන්වනුව, ස්ත්‍රී දූෂණය නිර්ඝාත සමාජයක් ප්‍රතික්ෂේප කිරීමට පදනමක් ලෙස ගැනීම වැරදියි. ඒ වෙනුවට කළ යුත්තේ "අධ්‍යාපනය" සහ "නිසි සමාජ වාතාවරණයක් සැකසෙන විධිවිධාන සහ ප්‍රතිපාදන, හරහා එය සමාජයෙන් ඉවත් කර දැමීමයි."

2000 පෙබරවාරි මාසයේදී, කොලම්බියාවේ මැනිසාලෙස් නුවර ප්‍රජා නායකයින් 200 දෙනෙක් පමණ සහභාගි වූ රැස්වීමකදී "නිර්ඝාත සමාජයක් පැවතිය හැකිද" යන ප්‍රශ්නය ඔවුන් වෙත යොමු කරන ලද විට, කෙතරම් විශ්මයජනක ප්‍රතිචාරයක් ලැබුණේද යත්, "බැහැ" යයි කියන්නට එකම අතක්වත් එසවුනේ නැත. අනතුරුව, ඒකමතික එකඟතාවය පළ කරමින් සියලුම අත් "ඔව්" යන්න සඳහා ඔසවනු ලැබිණ.

කොරියාවේ සහ කොලම්බියාවේ යට කී ධනාත්මක ප්‍රතිචාර, එම ප්‍රකාශන පසුබිමේ ඇති ප්‍රචණ්ඩ සන්දර්භයන් ගැන සලකන විට, විශේෂ අවධානයට ලක්විය යුතුය. කොරියා ප්‍රජාතන්ත්‍රවාදී ජනතා සමූහාණ්ඩුවේ ප්‍රචණ්ඩ දේශපාලන සම්ප්‍රදායය, යම් ස්ථානවලදී, අමෙරිකා එක්සත් ජනපදයේ සම්ප්‍රදායයට සමාන්තර ලක්ෂණ පෙන්වයි; විජිත-විරෝධී සන්නද්ධ විප්ලවය, ඒකාබද්ධ වීම අරමුණු කරගත් සිවිල් යුද්ධය සහ දේශීය-විදේශීය සතුරන්ට එරෙහිව ආරක්ෂක සහ ප්‍රහාරාත්මක ශක්තිය තර කිරීම සඳහා වූ සාධාරණීකෘත දෘෂ්ටිය යනාදියෙන් එය සංලක්ෂණය වන්නේය. එමෙන්ම, දශක ගණනාවක් තිස්සේ කොලම්බියානු සමාජය හමුදා, පොලිස්, පැරාමිලිටරි, ගරිල්ලා සහ සාපරාධී ඝාතකයින් යනාදී වශයෙන් වූ තෙරක්, අග-මුලක් නොපෙනෙන මාරකත්වයේ බලවේගයන්ට ගොදුරු වී තිබිණ.

### විවිධ සමාජ ප්‍රතිචාර

විවිධ කණ්ඩායම්, රටවල් සහ සංස්කෘතීන් තුළ පූර්ව සාකච්ඡාවක් නොකොට නිර්ඝාත සමාජයක භව්‍යතාවය පිළිබඳ ප්‍රශ්නය නඟන ලද අවස්ථාවන්හිදී එකඟතාවයකට හෝ එකඟ නොවීමකට පදනම් විය හැකි අනේක විධ සමාජ නැඹුරුතාවන් කණ්ඩායම් තුළ සහ ඒවා හරහා ප්‍රකාශයට පත් වන බව පෙනේ. එයින්, විධිමත් ගෝලීය මට්ටමේ විමර්ශනයක් සඳහා ප්‍රතිඥාවක් මතු වන්නේය.

1998 මැයි මාසයේ ලිතුවේනියාවේ විල්නුස් නුවර විවෘත සමාජ ආයතනය මගින් සංවිධානය කරන ලද "නව දේශපාලන විද්‍යාව" යන තේමාව යටතේ පැවති සමීක්ෂණ සම්මන්ත්‍රණයකදී, පෙර සෝවියට් කඳවුරේ රටවලින් පැමිණි දේශපාලන විද්වතුන්ගෙන් පැදුම් ලත් සහභාගික කණ්ඩායමෙන් අට දෙනෙක් "නැහැ" යි කී අතර,

එක් අයෙක් "ඔව්" යැයි කීය. 1999 මාර්තු මාසයේ සෝල් ජාතික විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයන් සඳහා පැවති දේශපාලන විද්‍යා සම්මන්ත්‍රණයේදී දොළොස් දෙනෙක් "නැහැ" යනුවෙන් ද, පස් දෙනෙක් ඔව් යනුවෙන් ද ප්‍රතිචාර දැක්වූ අතර, තවත් දෙළොස් දෙනෙක් "ඔව්" සහ නැහැ" යනුවෙන් පිළිතුරු දුන්හ. 1998 පෙබරවාරි මාසයේ හවායි හි හොනොලූලු නගරයේ පැසිෆික් කලාපීය පාර්ලිමේන්තු නියෝජිතයින්ගේ සමුළුවකදී සය දෙනෙක් "ඔව්" යනුවෙන්ද පස් දෙනෙක් "නැහැ" යනුවෙන්ද දෙදෙනෙක් "ඔව් – නැහැ" යනුවෙන්ද පිළිතුර දුන්හ. නිරීක්ෂකයින් ලෙස ජපානයෙන් පැමිණි කාන්තා පිරිසෙන් දෙළොස් දෙනෙක් "නැහැ"යනුවෙන්ද, එකොළොස් දෙනෙක් "ඔව්" සහ එක් කෙනෙක් "ඔව් සහ නැහැ" යනුවෙන් ද ප්‍රතිචාර දැක්වූහ.

කොලම්බියාවේ මෙඩලින් නුවර 1998 නොවැම්බර් මාසයේ පැවති "අධ්‍යාපනයේ අනාගතය" තේමා කොට ගත් ජාතික සමුළුවකට පැමිණ සිටි අධ්‍යාපනඥයින්ගෙන් දෙසිය හැත්තෑ පස් දෙනෙක් "ඔව්" යනුවෙන්ද විසි පස්දෙනෙක් "නැහැ" යනුවෙන්ද කියා සිටියහ. එහි සිටි මෙඩලින් පවුල් සමාජ සේවක පිරිසෙන් තිස් දෙනෙක් "ඔව්" යැයි කී අතර, දහසය දෙනෙක් "නැහැ" යයි කීහ. මෙඩලින්හි ***සිකාරියෝස්*** (Sicarios - පුංචි පිහි) නමැති කුලී ඝාතකයන් ද සහිත තරුණ මැර කල්ලියකින් ප්‍රශ්නය ඇසූ විට, දහසය දෙනෙක් "නැහැ" යනුවෙන් ද සය දෙනෙක් "ඔව්" යනුවෙන්ද කියා සිටියහ. ඔවුන්ගේ විනිශ්චයන්ට පදනම් වෙන හේතු සාධක ගැන විමසන ලද කල්හි, එක් ඝාතකයෙක් පැහැදිලි කළේ "දුවරුන් දෙන්නා රැක බලා ගැනීමට මට මරන්න වෙනවා, වෙන රස්සා නැහැ" යනාදී වශයෙනි. "ඔව්" යැයි කී නැතැත්තෙක්, "පොහොසතුන් සහ දුප්පතුන් අතර පරතරය වැහෙනකොට අපට මරන්නට සිද්ධ වෙන්නේ නැහැ" යනුවෙන් තම මතය දැක්විය.

1997 ඔක්තෝම්බර් මාසයේ කැනඩාවේ එඩ්මොන්ටන් නගරයේදී "ලෝක සාමය උදෙසා වූ මහත්මා ගාන්ධි කැනඩා සදනම" විසින් සංවිධානය කරන ලද "සාර ධර්ම සහ 21 සියවස" නම් සම්මන්ත්‍රණයට සමගාමීව රැස් වූ උසස් පාසල් ශිෂ්‍ය කණ්ඩායමකින් හතලිස් අට දෙනෙක් "නැහැ" යනුවෙන්ද, විසිපස් දෙනෙක් "ඔව්" යනුවෙන්ද පිළිතුරු දුන්හ. ජෝර්ජියාවේ ඇට්ලන්ටා නුවරදී, 1999

අප්‍රේල් මාසයේ, පැවති "මාටින් ලූතර් කිං අහිංසාවාදී සමාජ පරිවර්තනය උදෙසා මධ්‍යස්ථානය" මගින් සංවිධානය කරන ලද "අහිංසාවාදය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේදී" හතලිස් දෙනෙක් "ඔව්" යනුවෙන්ද තිදෙනෙක් "නැහැ" යනුවෙන්ද ප්‍රතිචාර දැක්වූහ. 2000 පෙබරවාරි මාසයේ, රුසියාවේ ඔම්ස්ක් නගරයේ අවුරුදු 17–26 දක්වා වයස් කාණ්ඩවල සාහිත්‍ය සිසුන් කණ්ඩායමකින් එකසිය විසි එක් දෙනෙක් "නැහැ" යයි කියද්දී, තිස් හතර දෙනෙක් "ඔව්" යනුවෙන් ද තිදෙනෙක් "ඔව් සහ නැහැ" යනුවෙන්ද කියා සිටියහ.

*****

නිර්ඝාතක සමාජය විය හැකි දෙයක්ද? ප්‍රචණ්ඩ විසිවෙනි සියවසේ ප්‍රචණ්ඩ අවසානය හමුවේ, ගෝලීය වශයෙන් ව්‍යාප්ත ඝාතන සහ ඝාතන තර්ජන මධ්‍යයේ දේශපාලන විද්වතුන්ට සහ ඔවුන්ගේ ශිෂ්‍යයන්ට, සම්පූර්ණයෙන් එය අචින්ත්‍යය යනුවෙන් නිගමනය කිරීමට ඕනෑවටත් වඩා සාධක ඇත. එනමුත්, එම ප්‍රශ්නය බැරෑරුම් අවලෝකනයට පාත්‍ර කරන්නට ඇති කැමැත්ත ගැනද සංඥා ලැබී තිබේ. - එය සිතිය හැකි දෙයකි. එය හව්‍ය දෙයකි. තවදුරටත් පෙනෙන පරිදි, මනුෂ්‍ය පැවැත්මට එරෙහි පෙර නොවූ විරූ තරමේ තර්ජන තිබියදී, එම බලවේගයන්ට හරස්ව යමින් රැල්ල හැරවීමට ක්‍රියාත්මක වන අධ්‍යාත්මික, විද්‍යාත්මක, ආයතනික සහ විශ්වාසය ශක්තිමත් කරන්නා වූ අත්දැකීම්ද ඇතුළත් වන ගෝලීය සම්පත් නිසා අවසානයේදී එය පූර්ණ වශයෙන් හව්‍ය වන්නේය.

# 2 පරිච්ඡේදය

# නිර්ඝාත සමාජයක් සඳහා හැකියා - අවස්ථා

*"විකල්පයන් හඹා යන්නට අපි අදිටන් කරන්නේ නම් ප්‍රචණ්ඩත්වයේ යුගය නිමා කිරීමට මිනිසාට අවශ්‍ය තරම් දැනීම දැනටමත් අප වෙත ඇතුවා විය යුතුය."*

*- ඩේවිඩ් එන්. ඩැනියල්ස් සහ මාර්ෂල් එෆ්. ගිලුලා*
*මනෝ චිකිත්සා පීඨය, ස්ටැන්ෆර්ඩ් විශ්ව විද්‍යාලය, 1970*

නිර්ඝාත සමාජය විය හැකි සිදුවීමකැයි සිතන්නට පදනම් විය හැකි සාධක කවරේද? විශ්වීය පරිමාණයෙන්ම, ජීවිතයට ගෞරවයෙන් සැලකීමට මනුෂ්‍යයා සමත් වේ යැයි සිතන්නට ඇති අවකාශ මොනවාද?

**නිර්ඝාත මනුෂ්‍ය ස්වභාවය**

ආධ්‍යාත්මික පදනම් දෙස බලමින් මේ විමසුම ආරම්භ කළ හැකි මුත්, පළමු කොට සම්පූර්ණයෙන්ම ඓහ-ලෞකික කරුණක් ගැන සිත යොමු කරන්න. බහුතර මනුෂ්‍යයෝ මිනී නොමරති. වර්තමානයේ ජීවත් වන සියළුම මිනිසුන් ද මේ තාක් ජීවත් වූ සියළුම මිනිසුන් ද අතුරින්, ඝාතකයින් වන්නේ ඉතා සුළුතර සංඛ්‍යාවකි. ඕනෑම සමාජයක මිනී මැරුම් පිළිබඳ සංඛ්‍යා ලේඛන විමසා බලන්න.

යුද්ධ නිසා සිදුවන ජීවිත හානි ගැනද සලකා බලනු මැනවි. මනුෂ්‍ය වර්ගයාගෙන් භාගයක් වන ස්ත්‍රීන්, යුද්ධවල ප්‍රධාන රණවිරු ඝාතකයන් වූ අවස්ථා ගැන ලෝකයේ යුද්ධ සහ ජනශ්‍රැති කෞතුකාගාර සාක්ෂි සපයනවා නම් ඒ ඉතා අල්ප වශයෙනි. එහෙත් ගැහැණු ද මරති. සමහරු යුද්ධ සහ විප්ලව පෙරමුණුවල සටන් කර ඇත. සමහර සමාජවල ගැහැනු පමණක් නොව - ළමයින් පවා පරාජිත සතුරන්ව යාතු කර්ම ආකාර වූ වධදීම්වලට සහ ඝාතනයන්ට ලක් කරන්නට සහභාගී වී ඇත. එමෙන්ම ඇතැම් නූතන හමුදා සේනාංක සඳහා ඝාතක වෘත්තිකයන් ලෙස ගැහැනුන් ද බඳවා ගනිති. ඒ සියල්ල එසේ වුවත්, අති බහුතරයක් ස්ත්‍රීහු, රණවිරුවන් හෝ හමුදා ඝාතකයින් නොවූහ. මේ කරුණට, යුද සටන්වලට සහභාගි

වන්නේ පිරිමින් අතුරින් ද සුළුතරයක්ය යන කරුණ එකතු කළ යුතුය. ඇත්ත වශයෙන්ම, ඝාතනයට ඍජු ලෙස සම්බන්ධ වන්නේ එයිනුත් සුළුතරයක් පමණි. මේ අය අතුරින් බොහෝ දෙනෙක් චෛතසික පැකිළීම් අත් විඳිති. අනතුරුව පශ්චාත්තාපය ඔවුන් කරා පැමිණේ. දැඩි වික්ෂෝභයකින් තොරව දිගටම ඝාතනය කරන්නට හැකියාව ඇත්තේ සමහර විට එයිනුත් සියයට දෙකක තරම් සුළු පිරිසකටය. යුද බිමේදී පිරිමි සොල්දාදුවන් අතර මරන්නට ඇති පැකිළීම පිළිබඳ සමීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙෆ්ටිනන්ට් කර්නල් ඩේව් ග්‍රොස්මන්, එහි ලා මෙසේ පවසයි: "යුද්ධය වනාහි, කිසියම් ප්‍රමාණවත් කාලයක් තුළ, ඊට සහභාගි වන සියළුම අයගෙන් 98%ක් දෙනාගේ මානසික සෞඛ්‍යය දුබල කෙරෙන්නා වූ වාතාවරණයක් ඇති කරන්නේය. යුද්ධය විසින් උන්මත්තක භාවයට නොපමුණුවන්නේ යැයි පෙනෙන 2% ක පිරිස ඇත්තෙන්ම, ඒ වන විටත් උමතුය. ඔවුහු යුද බිමට පැමිණෙන්නට පෙරම ප්‍රචණ්ඩ මනෝව්‍යාධිකයන් ව සිටියහ." (Grossman 1995;50). මේ අනුව මනුෂ්‍යයන් වූ කලී සහජ ඝාතකයන්ය' යන සම්ප්‍රදායික දේශපාලන විද්‍යාවේ උපකල්පනයට ප්‍රතිපක්ෂව, හමුදා පුහුණුවේ මුඛ්‍ය කාර්යභාරය වන්නේ, "සාමාන්‍ය පුද්ගලයන් තුළ ගැඹුරේ තැන්පත් ව පවතින ඝාතනයට එරෙහි මානසික ප්‍රතිරෝධය ජය ගැනීමයි" (295).

මනුෂ්‍යයාගේ පවුල ද, මනුෂ්‍යයාගේ නිර්ඝාතන ස්වභාවය ගැන තවදුරටත් සාක්ෂි දක්වයි. මනුෂ්‍ය සත්වයා ස්වභාවයෙන්ම ඝාතකයෙක් නම්, මනුෂ්‍ය වර්ගයාගෙන් භාගයක් පමණක් වුව නොවැළැක්විය හැකි ලෙසට මිනීමරන්නට නැඹුරු නම්, නොයෙක් ආකෘතීන් තුළ නිරූපිත පවුල නම් ආයතනය පවතින්නට නොහැකිය; පියවරු මව්වරුන් ද, මව්වරු පියවරුන් ද ඝාතනය කරත්හ. සිද්ධි වශයෙන් මේවා දැනටමත් දැකිය හැකි බව සැබෑය. එහෙත් ඒ තත්වය මනුෂ්‍ය වර්ගයාගේ ඉරණම පාලනය කරන මාරකාන්වයේ කිසියම් ස්වභාවික නීතියක් ලෙස පවතින්නේ නැත. එවැනි ස්වභාවික නීතියක් ක්‍රියාත්මක වූවා නම්, ලෝකයේ මනුෂ්‍ය ජනගහනය බොහෝ කලකට පෙර වඳ වී මිහිපිටින් අතුරුදන් වන්නට තිබුණි. ඊට ප්‍රතිපක්ෂව, ද්‍රව්‍යමය අහිමි වීම්, අගහිඟකම් සහ අසාධාරණය උග්‍ර වන තත්වයන් මැද්දේ පවා, මිනිස් පවුල

පෙර නොවූ විරූ පරිමාණයෙන් ජීවිතය නිර්මාණය කරමින් සහ පවත්වා ගනිමින් පැමිණ ඇත.

පිළිගත හැකි සාක්ෂි මත විශ්වසනීය ලෙස විසඳීමට අභියෝගයක්ව ඇති, ඒ සඳහා නැවත නැවත ප්‍රයත්න දරනු ලැබෙන නිර්ඝාන ගෝලීය ප්‍රහේලිකාවක් ඇත. එය නම්, සියලුම කල්හි මිහිපිට ජීවත් වූ මිනිසුන් ප්‍රමාණය කොතරම් ද? ඒ අතුරින් ඝාතකයන් වූයේ කී දෙනෙක්ද? එසේ නොවූවෝ කොපමණද? යන්න ගණනය කිරීමයි. එක් ගණනයකට අනුව, ක්‍රිස්තුන්ගේ උපතට වසර දශලක්ෂයකට පෙර සිට ක්‍රි.වර්ෂ 2000 දක්වා ජීවත් වූ මුළු මනුෂ්‍ය සංඛ්‍යාව 91,100,000,000ක් තරම් වන්නේය. (1966, Keyfitz ගේ ගණනය සහ 1996 Weeks ගේ ගණනයන් සමාලෝචනය කරමින් 1999 Ramsey කළ ගණනය). අපි රම්මෙල්ගේ යුද සහ ජන සංහාර ඝාතන ප්‍රමාණය බිලියන භාගයක් තරම් දක්වා ප්‍රසාරණය කොට, තවද ඒ එක් එක් ඝාතනයක් සිදු කරන ලද්දේ වෙන වෙන ඝාතකයින් යැයි වැරදියට උපකල්පනය කොට, අනතුරුව මිනීමැරුම් සංඛ්‍යාව හිතුමතේට නය ගුණයකින් වැඩි කොට, එම ඝාතකයින් ප්‍රමාණය ද පෙර ලෙසම ගණනය කළහොත්, ක්‍රි.පූර්ව 1000 සිට මේ දක්වා (ක්‍රි.පූ. දසලක්ෂයේ සිට ගණනය කිරීමට දත්ත නැත.) මුළු ඝාතකයින් ප්‍රමාණය 3,000,000,000ක් පමණ වෙතැයි සිතාගත හැකි වෙයි. එහෙත් මෙම දළ රළු සහ අවධාරණාත්මකව අධි ප්‍රසාරිත සංඛ්‍යාව පවා දෙස් දෙන්නේ, මිනිසුන්ගෙන් අවම වශයෙන් 95% ක් වත් ඝාතකයින් නොවූ බවය. අමෙරිකා එක්සත් ජනපදයේ මිනීමැරුම් සංඛ්‍යාව 100,000කට 10 ක් වුවත් සෑම වර්ෂයකදීම ජනගහනයෙන් ඝාතකයින් වන්නේ .01%ක්ය. ජනගහණයෙන් 100,000කට මාරක ප්‍රහාර 500ක් වෙතැයි සැලකුවහොත්, එවිට නව්‍ය ඝාතකයින් හෝ ඝාතකයින් වීමට ඉඩ ඇති සංඛ්‍යාව හුදෙක් 0.51%ක් පමණකි. මේ සංඛ්‍යා දෙස බලන විට නිසැකයෙන්ම අනුමාන කළ හැකි දෙය නම්, සියලුම මනුෂ්‍ය සත්වයින්ගෙන් සමහර විට 2% ක් නැත්නම් 1% කටත් අඩු ප්‍රමාණයක් පමණක් මිනීමරුවන් වන්නට ඇති බවයි. නිසැකයෙන්ම, ඝාතක ප්‍රතිශතය සමාජයෙන් සමාජයට, යුගයෙන් යුගයට සහ සංස්කෘතියෙන් සංස්කෘතියට සාපේක්ෂව බෙහෙවින්ම විචල්‍ය වනු ඇත. (Keeley :1996). ඒ සියල්ල කෙසේ වෙතත්, මනුෂ්‍ය වර්ගයා ආරක්ෂා වී පැවතීමත්, බෝ වී ජනගහනය වර්ධනය වීමත් විසින්

තහවුරු කරන්නේ, මනුෂ්‍ය ස්වභාවය තුළ මාරකත්වය පරයා ජීවයාගේ නැගී සිටීමයි.

**ආධ්‍යාත්මික මූලයෝ**

මනුෂ්‍යයාගේ ආගමික සම්ප්‍රදායයන් තුළ ඝාතන රහිත සමාජයක් සාක්ෂාත් කළ හැකිය යන්න ගැන ශ්‍රද්ධාවක් නැතහොත් විශ්වාසයක් සඳහා හේතු සාධක දක්නට ලැබේ. ඒ සමග මිනිස් බිලිපූජා කර්මවල සිට ජන සංහාර හරහා න්‍යෂ්ටික සමූල ඝාතන දක්වා බිහිසුණු ජන ඝාතන සාධාරණීකරණය කිරීමට ආගම් මෙහෙයේ යොදවනු ලැබ ඇති බව, පිළිගත යුතු වෙයි. (Thompson, 1988). එහෙත් දෙවියන් වහන්සේගේ, මහා නිවැවුම්කරුවාගේ, බ්‍රහ්මන්ගේ, ඒ කවරෙක්ගේ වුවද මූලික පණිවුඩය වූයේ 'මනුෂ්‍ය පුත්‍රයිනි, මගේ වචන අසාපල්ලා! යනු, ගොස් වෙනත් මිනිසෙක් - ගැහැණියෙක් හෝ පිරිමියෙක්- හමුවී ඔහු හෝ ඇය මරා දමනු'' යන්න නොවේ. ඊට සපුරාම ප්‍රතිපක්ෂව පණිවුඩය වී ඇත්තේ "ජීවිතයට ගෞරව කරන්න, මරන්නට එපා!'' යන්නයි.

ලෝකයේ සියලුම ආධ්‍යාත්මික විශ්වාසයන් තුළ නිර්ඝාත මූලධර්මය ගැබ් වී ඇත. දේශපාලනය තුළ ඝාතනයට ඇති අත්‍යවශ්‍යභාවය සමග අධ්‍යාත්මික මාර්ග එකට නොපෑහෙන්නේ යැයි මැක්ස් වේබර් නිගමනය කළේ ඒ නිසයි. ජෛන සහ හින්දු යන ආගම් දෙකම 'අහිංසාව පරම ධර්මය' වේ ය යනුවෙන් පිළිගනිති. බෞද්ධයෙක් විසින් රැකිය යුතු පළමුවන ව්‍රතය වන්නේ, 'ප්‍රාණ ඝාතයෙන් වැළැක්මයි.' යුදෙව්, ක්‍රිස්තියානි සහ ඉස්ලාම් ආගම් තුනම, 'තුඹ නොමැරිය යුතුය' යන දිව්‍ය පනත එකට පිළිගනිති. (ශුද්ධ බයිබලය 'නික්ම යාම 20;,13); අති පුරාණ යුදෙව් ඉගැන්වීම්වලින් එකක් වන්නේ, 'එක මනුෂ්‍යයෙකුගේ ජීවිතය ආරක්ෂා කොට දෙන කවරෙක් වුවත් ඔහු විශාල ජනකායකගේ ජීවිත ආරක්ෂා කර දුන්නා වැනිය. එහෙත් එක මිනිසෙකු ගේ ජීවිතය විනාශ කරන්නා මුළු ලෝකයම විනාශ කරන්නේය' යනුවෙනි. (Eisendrath:144).

මෙම ඉගැන්වීමේ මූලික හරය යම් සංකීර්ණතා මැද නමුත්, ඉස්ලාම් ධර්මය තුළට ද අඛණ්ඩව ගලා ගොස් ඇත. ඝාතනයකට හෝ දූෂණය පැතිරවීමට දඬුවම් වශයෙන් හැර 'මනුෂ්‍යයෙක් මරන්නා මුළු මිනිස් සංහතියම විනාශ කරන්නේය. මනුෂ්‍ය ජීවිතයක්

ආරක්ෂා කරන්නා මුළු මිනිස් වර්ගයාම රකින්නේය.' (අල් - කුරානය 5:32). යුදෙව්, ක්‍රිස්තියානි සහ ඉස්ලාම් ආගම්වල උගැන්වීම් සංස්ලේෂණය කරගෙන ඇති බහායි ධර්මය 'දෙවියන්ට බය වෙන්න, අහෝ මිනිසුනි, කිසිවෙකුගේ හෝ ලේ සෙලවීමෙන් වළකින්න' යනුවෙන් (**Baha'u'llah 1983:277**) උපදෙස් දෙයි.

ලෝකයේ මානවවාදී සම්ප්‍රදයයෝ නිර්ඝාත සමාජයක්, මිනිසාට උචිතය එය භව්‍යය' යන ආස්ථානය දරති. කොන්ෆියුසියානුවාදයට අනුව, පාලකයින් සදචාර සම්පන්න වන විට, මරණ දඬුවම අනවශ්‍ය දෙයක් බවට පත් වෙයි. (**Fung, 1952:60**). තාඕවාදයට අනුව, මනුෂ්‍යයින් ස්වභාවධර්මය සමග සුසංගතව සරල සහ නිරායාස ජීවිතයක් ගත කරන්නේ නම්, 'යුද ආයුධ තිබෙන්නට ඇතැම් විටක ඉඩක් තිබුණත්, කිසිවෙකුත් ඒවා සමග හරඹ නොකරනු ඇත.' (**Fung 1952:190**). නූතන සමාජවාදී චින්තාව කියා සිටින්නේ 'එකිනෙකා මැරීම සඳහා ආධාර කිරීමට ශ්‍රමිකයින් ප්‍රතික්ෂේප කරන්නේ කවදාද? එතැන් සිට යුද්ධ අහෝසි වන' බවයි. පළමුවන ලෝක යුද්ධය ප්‍රතික්ෂේප කළ සමාජවාදී ප්‍රකාශනයක් මෙසේ කියා සිටියේය:

> *"ලෝකයේ කාර්මික කම්කරුවන් අතුරින් සියලුම පන්ති විඥානයෙන් යුත් සාමාජිකයෝ මනුෂ්‍යයින්ගේ ලේ හැලීමට එක හෙළා විරුද්ධ වෙති. ඒ ක්වේකර්වරු (Quakers) සහ මිත්‍ර සමාජ මෙන් ආගමික හේතු නිසා නොවේ. අප විශ්වාස කරන්නේ ශ්‍රමික පන්තියේ සියල්ලන්ගේ මූලික අවශ්‍යතා සහ සුබසිද්ධිය සඳහා සාධක සර්වප්‍රකාරයෙන්ම එක හා සමාන බවයි. යුද්ධය සම්බන්ධයෙන් අධිරාජ්‍යවාදී ධනේශ්වර ජර්මන් ආණ්ඩුවට අප තරයේම විරුද්ධ වන අතර, කවර රටක වුවත් ශ්‍රමිකයින් ඝාතනය කරනවාට හෝ ඔවුන්ට ශාරීරික විපත් පමුණුවනවාට අපි විරුද්ධ වෙමු." (True 1995: For a courageous example, Baxter 2000 බලන්න).*

සියලුම සමාජ තුළ ඝාතනය හෙළා දකිනු ලැබ ඇත. ජීවිතය පිළිබඳ ආගමික භක්තියට සමාන්තරව මානවවාදී සම්ප්‍රදයය ජීවිතය කෙරේ ගෞරව දක්වයි.

ලෝකයේ ආගමික සහ මානවවාදී සම්ප්‍රදයයන් තුළ නිර්ඝාත චර්යාධර්ම මූලයක් පැවතීම නිසා, නිර්ඝාත සමාජයන් සාක්ෂාත් කර ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් ලැබෙන සහතිකයන් වේද? එක් පැත්තකින් ඉන් අදහස් වන්නේ, මනුෂ්‍ය වර්ගයාගේ විඥානය තුළ ජීවිතය පිළිබඳ ගැඹුරු ගෞරවයක් තැන්පත් කිරීමට දිව්‍යමය

අභිලාෂයක් පවතින බවයි. අනිත් අතින් බලන විට පෙනී යන්නේ ඒ ආකාර මූලධර්මයක් ග්‍රහණය කරගන්නට, එවැන්නකට සංවේදීව ප්‍රතිචාර දක්වන්නට, නොඑසේ නම් එවැන්නක් නිර්මාණය කරගන්නට මනුෂ්‍යයා තුළ පවත්නා ශක්‍යතාවයි. ඉදින්, මනුෂ්‍යයා නිසර්ගයෙන්ම ඝාතකයෙක් නම්, නිර්ඝාත මූලධර්මය ග්‍රහණය කරගන්නට, ප්‍රක්ෂේපණය කරන්නට හෝ එවැන්නක් නිර්මාණය කරන්නට කිසිදු හැකියාවක් නැඹුරුතාවක් නොපෙන්වනු ඇත. ඉදින් යම් හෙයකින්, නිර්ඝාත අධ්‍යාත්මික චර්යා ධර්මය වූ කලී විප්ලවයන් දුබල කිරීමට ප්‍රභූන් විසින්, නැතහොත් පීඩකයින් අධෛර්යමත් කිරීමට පීඩිතයින් විසින්, එසේත් නොමැති නම් වන්දි නොගෙවා පැන යනු පිණිස ඝාතකයින් විසින් සොයා ගන්නා ලද උප්පරවැට්ටියක් ලෙස සැලකුවත්, එබඳු කාරණයකින් පවා නොවරදවා ගම්‍ය වනු ඇත්තේ එයින් ආමන්ත්‍රණයට ලක් කෙරෙන මිනිසුන් ඊට ධනාත්මකව ප්‍රතිචාර දැක්වීමට සමත් බවයි.

ඉතිහාසයේ වඩාත්ම බිහිසුණු ලේ වැගිරීම්වලට පූර්වයෙන්, එම කාලය තුළ සහ ඊට පසුව, නිර්ඝාත මූලධර්මයේ ජීව ගුණය ජනතාව අතර නැවත නැවත මතුවන බව නිරීක්ෂණය කළ හැකිය. ජනතාවගේ එකී නිර්ඝාත සම්භාෂණය වූ කලී ඝාතකයින් විසින් ධර්මිෂ්ඨ ආකාරයෙන් පිරිනමන ප්‍රදානයක් නම් නොවේ. ඉතිහාසය තුළ පශ්චාත්-කුරුස යුද්ධ ක්‍රිස්තියානිය, පශ්චාත් - විජයග්‍රහණ ඉස්ලාමය, පශ්චාත්-ලෝක අග්නිහෝම (දෙවන ලෝක යුද්ධය) යුදෙව් ධර්මය, පශ්චාත්-යුද්ධ බෞද්ධ මාර්ගය මෙන්ම, ලෝකයේ බොහෝ පශ්චාත්-විජිත දේශීය ජන සම්ප්‍රදයයන් ද විසින් නැවත නැවත පිරිනමන ලද නිර්ඝාත ජීව ගුණය, වර්තමාන යුගය තරා අඛණ්ඩව පැමිණ මාරනත්වයෙන් නිදහස ලබා ගැනීම උදෙසා අපට අනුප්‍රාණය සපයන්නේය. මිනීමරු විසිවන ශතවර්ෂයේදීම අහිංසාවාදී ගෝලීය පරිවර්තනයක් උදෙසා ධෛර්යමත් ලෙස එකී ජීව ගුණයෙන් සම්මාදම් වන චින්තකයින් හා ආධ්‍යාත්මික සම්ප්‍රදයයන් රාශියකි; ලෙව් තෝල්ස්තෝයි සහ මාටින් ලූතර් කිං (කනිෂ්ඨ) - ක්‍රිස්තියානි සම්ප්‍රදයය, මහත්මා ගාන්ධි - හින්දු සම්ප්‍රදයය, අබ්දුල් ගෆාර් ඛාන්, - මුස්ලිම් සම්ප්‍රදය, ජෝශප් අබිලා - යුදෙව් සම්ප්‍රදයය, දලයි ලාමා - බෞද්ධ සම්ප්‍රදය, පෙට්රා කේලි - හරිත දර්ශනය මෙන්ම, ජාත්‍යන්තර ගෞරවයට පාත්‍ර වූ තවත් ප්‍රකට පුද්ගලයින් රාශියක්

මෙන්ම, අප්‍රකට, එහෙත් බලගතු දයකත්වයක් ලබා දුන් පුද්ගලයින් ද අප්‍රමාණ පිරිසකි.

සෑම ආගමික සහ ආධ්‍යාත්මික සම්ප්‍රදයක් තුළම නිර්ඝාත ජීව ගුණය පැවතීමත්, එමෙන්ම ඊට සම්පූර්ණයෙන්ම නැපවීම පිළිබඳ බලගතු (පුද්ගල) උදහරණත් විසින්, එම සම්ප්‍රදයයන්ගේ ආනුභාවය තුළ සිටින කෝටි සංඛ්‍යාත අනුගාමිකයන්ගේ පිබිදීමටත්, ඔවුන් විසින් එම ජීව ගුණය ධනාත්මක ලෙස සනාථ කිරීමටත් මාර්ග විවෘත කරන්නේය. නිර්ඝාත මූලධර්මයේ අත්‍යවශ්‍යතාවය හෙවත් අනිවාර්යතාවය පිළිබඳ විඥාකය සහ ඝාතනය හා එහි වේදනාකාරී විපාක පිළිබඳ වගකීම භාර ගැනීම යන සංසිද්ධීන් අතර පැනෙන විසංවාදී ආතතිය හේතු කොට ගෙන, නිර්ඝාත පුද්ගලත්වය සහ ඊට අදළ සමාජ පරිවර්තනය සඳහා දැඩි පෙළඹීමක් ජනනය වෙයි. ඉහත කී සෑම සම්ප්‍රදයයක් තුළම, නිර්ඝාත මූලධර්මයේ මුල් සොයා ගත හැකි බැවින්, මනුෂ්‍ය වර්ගයාගේ පොදු ආධ්‍යාත්මික උරුමය තුළ එකී මුල් දිස් වන්නේ මහා නුගයක ජීවය රක්නා එහි විස්තීර්ණ හා බහුවිධ මූල පද්ධතිය මෙනි. අනුප්‍රාණය සහ දරා සිටීමේ ශක්තිය සමස්ත මුල් පද්ධතියෙන් මෙන්ම, එහි ඕනෑම කොටසකින් ඇද ගත හැකිය. මන්ද යත් සෑම මුලක්ම ජීව ශක්තිය උරා ගන්නා බැවිනි. ආගමික හා මානවවාදී සම්ප්‍රදයයන් තුළ ඇති ජීවිතය කෙරේ ගෞරවය පිළිබඳ යථාර්ථය වූ කලී, ගෝලීය වශයෙන්ම නිර්ඝාත සමාජයක් ඇති කළ හැකිය' යන විශ්වාසය සඳහා ප්‍රබල ආධ්‍යාත්මික පදනමක් සපයන්නේය.

**විද්‍යාත්මක මූලයෝ**

'ආගමේ පිහිටෙන් පමණක් කිසි දිනෙකත් අපට අහිංසාව ළඟා කර ගත නොහැකි වනු ඇත.' ඉන්දියාවේ ප්‍රමුඛතර ආගමික නායකයෙක් සහ අහිංසාවාදී පුරාතන ජෛන සම්ප්‍රදයයේ නිර්මාණශීලී අනුප්‍රාප්තිකයෙක් වන ආචාර්ය මහාප්‍රඥා ගේ උපදේශය එබඳුය. ජෛන චින්තාවට අනුව 'අහිංසාව වනාහි ජීවිතයේ සියළු අවධීන්ගේ හදවතයි. සියළු ශුද්ධ සංහිතාවන්ගේ අරටුවයි. සියළු ශීලයන්ගේ හා ප්‍රතිඥාවන්ගේ සමුච්ඡයයි හරයයි.' (Jain and Varni 1993;139). ආචාර්ය මහාප්‍රාඥ දකින පරිදි, නිර්ඝාත සමාජයක් සාක්ෂාත් කර ගැනීමේ මග වන්නේ නවීන ස්නායුවේදය සහ

ආධ්‍යාත්මික සත්‍යයන් එකට සම්බන්ධ කිරීම මගින් තමන් තුළ වූ නිර්සාත ස්වභාවය සොයා ගැනීමටත්, සමාජයීය වශයෙන් එය ප්‍රක්ෂේපණය කිරීමටත් පුද්ගලයින් ශක්තිමත් කිරීමයි. ඔහුගේ විග්‍රහයට අනුව, ප්‍රචණ්ඩත්වයට හේතු කාරක වන්නේ අන්තරාසර්ග ග්‍රන්ථීන් (endocrine glands) විසින් අනුවේගී සහ පාරඅනුවේගී ස්නායු පද්ධතීන් කෙරේ බලපෑමක් ඇති කරමින් නිපදවන්නා වූ චිත්තවේගයන් ය. අප ගන්නා ආහාරද මේ ක්‍රියාවලීන්ට සම්බන්ධතාවක් දක්වයි. තවදුරටත් සලකන්නේ නම්, අපගේ ස්නායු පද්ධතීන් පිළිබඳව දැනට සම්පාදිත විද්‍යාත්මක ඥානයට අනුව වුවද, සරල භාවනා ක්‍රම හරහා අපගේ මොළයේ ශක්තිය අරමුණක් කෙරේ නාභිගතව යෙදවීමට පුහුණු කළ හැකිය. එමගින් අහිංසාව අප තුළ වර්ධනය කර ගනිමින්, අහිංසාවාදී සමාජ ජීවිතයක් සඳහා කැපවීමට අපට පූර්ණ හැකියාවක් තිබේ. (Mahaprajna 1987 and 1994; Zaveri and Kumar 1992).

මනුෂ්‍යයාගේ නිර්සාත ශක්‍යතාවන් ගැන විශ්වාසය ඇති කරන විද්‍යාත්මක පසුබිම කවරාකාරද? විද්‍යාව යනුවෙන් අදහස් කෙරෙන්නේ ප්‍රශ්න කිරීම සහ පර්යේෂණ කාර්යයන් - දත්ත, න්‍යාය, සප්‍රමාණතාවය සහ විශ්වාසනීයත්වය නිර්ණය කරන්නා වූ ක්‍රමවේද - හරහා ලබා ගන්නා ලද සියලුම දැනුම් වර්ග සහ එහි ආකාරයි. කිසියම් දර්ශනිකයෙක් විසින් ඒ වන විට පිළිගැනීමට භාජනයව ඇති, යම් මතයක්, අදහසක් ප්‍රශ්න කිරීම ආරම්භ කරද්දී එතැන විද්‍යාත්මක විප්ලවයක පෙරනිමිති දැකිය හැකිය.

අහිංසා මූලධර්මය ඉදිරියට ගෙනෙමින් මේ ආකාර වූ ප්‍රශ්න කිරීමට ඉහළින්ම දායක වූ ඒ.රිචර්ඩ් කොන්රඩ් (1974) ස්ත්‍රී දූෂණයේ සිට ලෝක අග්නිහෝමය දක්වා වූ ප්‍රචණ්ඩ සංසිද්ධීන්ට මුහුණ දීමට ඇති එකම කාර්යක්ෂම ක්‍රමය නම් ඝාතනයට සූදානම් වීමයි' යන සම්ප්‍රදායයික පිළිගැනීම තදින් අභියෝගයට ලක් කරයි. ප්‍රශ්න විසඳීමේ ලා ප්‍රචණ්ඩත්වය ඒකායන මාර්ගය ලෙස භාර ගැනීම උපකල්පන තුනක් මත රඳා සිටින බව කොන්රඩ් තර්ක කරයි; එනම් සියලුම අහිංසාවාදී විකල්ප හඳුනාගෙන අවසානය; ඒවා සියල්ලම භාවිතාවේ යොදවා බලා ඇත; ඒවා සියල්ලම අසාර්ථක වී ඇත. එනමුත් මෙකී උපකල්පන සුළු ප්‍රශ්න කිරීමකින් පවා බිඳ වැටෙන්නේ ය. ප්‍රශ්ණ විසඳීමේ අහිංසාවාදී විකල්ප වනාහි උපන්‍යාසීය

වශයෙන් සීමාරහිතය. කාලය හා සම්පත් යනාදිය පිළිබඳ ප්‍රායෝගික සීමා සහ වෙනත් සාධක විසින්, හඳුනාගෙන ඇති විකල්ප පවා අත්හද බැලීම වළකා ලන්නේය. මේ නිසා ප්‍රශ්න විසඳීමේ ප්‍රචණ්ඩ ඒකායන විකල්පය සාර්ථක විය හැකි එකම විකල්පය යැයි නිශ්චිතව සිතීමට නුපුළුවන. එබැවින් ප්‍රචණ්ඩත්වය එකලාව . පිළිගැනීමේ දර්ශනික පූර්ව-මතයෙන් බැහැර වී අහිංසාවාදී විකල්ප නිර්මාණය කිරීමේ සහ අත්හද බැලීමේ පදනමකට මාරුවීම අවශ්‍ය යැයි කොන්රඩ් පෙන්වා දෙයි. එබඳු ප්‍රවේශයක් විසින් මිනිසාගේ මාරක ස්වභාවය අනිවාර්ය තත්වයක් යැයි සැලකීම නිෂ්ප්‍රභා කරන නව විද්‍යාත්මක සොයා ගැනීම් ද අපට ලබා දීමට ඉඩ තිබේ. (Yoder, 1983 ද බලන්න).

මනුෂ්‍යයාගේ සත්ව ස්වභාවය හේතුකොට ගෙන නිසගයෙන්ම ඔවුහු ඝාතකයින් වන්නෝය' යන උපන්‍යාසය දැඩි ප්‍රශ්න කිරීමකට ලක් වෙමින් පවතී. ටියුලේන් විශ්ව විද්‍යාලයේ මනෝවිද්‍යාඥයෙක් වන ලොහ් ත්සෙන්ග් ත්සායි (1963) (Loh Tseng Tsai) මීයන් මරන බළලෙකුට සහ මීයෙකුට එකම බඳුනකින් එකට සාමකාමීව ආහාර ගන්නට උගන්වන්නට හැකි බව නිදර්ශනාත්මකව පෙන්විය. මෙහිලා භාවිතා වූ ක්‍රමවේදය චර්යා ප්‍රතිඵල දේලනය කිරීම මගින් තත්වාරෝපණයට ලක් කිරීම සහ සමාජානුයෝජනය යන දෙකෙහි එකතුවකි. මුලදී සතුන් දෙදෙනා වීදුරු බිත්තියකින් වෙන් කරන ලදී. පොදු ආහාර බඳුනකට ආහාර ද්‍රව්‍ය නිදහස් කර ගැනීමට තම් සමාන්තර ලීවර දෙකක් දෙදෙනා විසින් එකවර තල්ලු කළ යුතු බව සත්තු දෙදෙනා උගත්හ. අභ්‍යාස සැසි 700කට පසු ලේ වැගිරීමකින් තොරව බෙදුම් බිත්තිය අයින් කරනු හැකි විය.

ත්සායිගේ නිගමනය මෙසේය:

> *මීයන්ට සහ බළලුන්ට - එනම් ස්වභාවික සතුරන් යැයි පිළිගැනෙන සතුන්ට-අන්‍යොන්‍ය සහයෝගයෙන් කටයුතු කළ හැකි බවටත්, ඔවුන් එසේ කරන බවටත්, විද්‍යා ඉතිහාසයේ ප්‍රථම වරට තීරණාත්මක පර්යේෂණ මාලාවක් හරහා පෙන්වන්නට අපට හැකි විය. මෙම සොයා ගැනීම විසින් මනෝවිද්‍යාවේ එක් සම්ප්‍රදායයික ආධිපත්‍යග්‍රාහී මතයක් මුලුමනින්ම ඉවත් හෙළනු ලබයි. එය නම් ප්‍රචණ්ඩ කෝලාහල හා යුද්ධ අනිවාර්ය බවට පත් කරන්නා වූ මකා දැමිය නොහැකි සහජාසයක් සත්ව ස්වභාවය තුළ පවතින්නේය යන්නයි. (1963:4).*

'ලෝක සාමය ඇති වීමේ න්‍යායාත්මක හව්‍යතාවයට අදාළ මූලික ජීව විද්‍යාත්මක පදනමේ මුල්ගල මේ පර්යේෂණ විසින් දමා ඇත'යි බොහෝ දෙනා විසින් කල්පනා කරනු ලැබීම නිරීක්ෂණය කරමින් තරඟකාරී මාරකත්වයේ ඊනියා අනිවාර්යතාවයක් නිකම්ම භාර ගන්නවා වෙනුවට, 'සහජීවනය මගින් පැවැත්ම සහතික කිරීමේ' විද්‍යා මූලික දර්ශනික පදනමක් කරා පිවිසීමට ත්සායි ආරාධනා කර සිටින්නේය. ඒ අතර මීට සපුරා වෙනස් ක්ෂේත්‍රයක, එනම් භෞතික විද්‍යාව සහ විද්‍යාවේ ඉතිහාසය පිළිබඳ විද්වතෙක් වන අන්තෝනියො ද්‍රාගෝ කානෝෂියානු සහ නිව්ටෝනියානු යාන්ත්‍රික විද්‍යාවන් අතර තුලනාත්මක විමර්ශනයක් හරහා ගැටුම් සමථකරණය පිළිබඳව අර බඳුම අතිරෝහණක සහයෝගිතා පදනමකට වාසිදායක නිගමන කරා පැමිණෙයි. (Drago 1994). ඒ ආකාරයෙන්ම ජෙරොම් ඩී. ෆ්‍රෑන්ක් නම් මනෝ චිකිත්සකයා, මිනිසුන් අතර මාරක එදිරිවාදිකම් අතික්‍රමණය කිරීම සඳහා අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රායෝජනවත් පොදු අරමුණු ඉලක්ක කර ගැනීම මගින් සහයෝගීතාවය ගොඩනැගීම කළ හැකි බව පෙන්වා දෙයි - (Frank 1960;261-2;1993;204-5).

මිනිස් මාරකත්වය වූ කලී, අපගේ පරිණාමීය සම්භවයේදී ඝාතක වානර විශේෂයක් හැටියට මතුව ඒම කරණ කොටගෙන, මඟ හැරිය නොහැකි ආකාරයට අප තුළ මුල් ඇද ඇති ස්වභාවකැයි යන මතය වානරයන් පිළිබඳ නව අධ්‍යයනයන් නිසා තවදුරටත් අභියෝගයට ලක් වීමට පටන් ගෙන ඇත. උදාහරණ වශයෙන් ජාන විද්‍යාත්මකව මනුෂ්‍යයාට සර්ව-සම වීමට තරම් සමීප බොනොබෝ නම් මධ්‍යම අප්‍රිකාවේ වෙසෙන සම්පූර්ණයෙන් 'නිර්ඝාත' වානර විශේෂය පිළිබඳ අධ්‍යයන ගත හැකිය. (Kano, 1990). කොංගෝවේ මන්ගන්ඩු නම් ජනතාව බොනොබෝ (bonobo) වානරයින් සමග සර්මකලාපීය වනාන්තරය බෙදා හදාගෙන ජීවත් වෙති. මන්ගන්ඩුවරුන්ගේ පුරාවෘත්තයකට අනුව, ඔවුන්ගේ මුතුන්මිත්තන් සහ බොනොබෝ වානරයින් එක ලේ ඥාතීන් මෙන් එකට ජීවත් වී ඇති අතර, ඒ හේතුවෙන් මෙම වානරයින් මැරීමට එරෙහිව දැඩි තහංචියක් අනාදිමත් කාලයක සිට සම්ප්‍රදායය හරහා ඔවුන්ට සම්ප්‍රේෂණය වී තිබේ. (Kano, 1990;62), ගෝරිල්ලන් චිම්පන්සියන් සහ වෙනත් ඉහළ වානර විශේෂවලට වෙනස්ව , බොනොබෝ වානරයින් එකිනෙකා

මරා ගනු කිසිවිටෙකත් නිරීක්ෂණය කර නැත. (Wrangham and Peterson, 1990;Waal, 1997). එපමණක් නොව, ඝාතක සවභාවයක් ඇතැම් විටක පෙන්වන වානරයින් අතර පවා, සාම ක්‍රියාවලීන් සහ අන්‍යෝන්‍ය පරාර්ථකාමය ලකුණු කරන්නා වූ සංසිද්ධීන් පිළිබඳ මෑත අධ්‍යයනයන් විසින්, මනුෂ්‍ය පරිණාමීය ස්වභාවය තුළ මාරකත්වය පමණක් අවධාරණය කිරීම නිවැරදි නොවන බවත් නිර්ඝාත පරිණාමීය විභවයන් මිනිසාට අත්‍යාවශ්‍යයෙන්ම උරුම බවත් පෙන්වා දෙනු ලබයි. (Wall, 1989,1996). සත්ව ස්වභාවය තුළ සාමකාමී පාර්ශවයක් ඇත. විද්වතුන් රාශියක් විසින් පර්යේෂණාත්මකව පෙන්වා දී ඇති අයුරින් (Kropotikin, 1914; Sorokin, 1954; Alfie Kohn, 1990) සහයෝගීතාවය, පරාර්ථකාමය අඩංගු "ආලෝකමත් පැත්තක්" සත්ව සවභාවය තුළ අඩංගුය. එබැවින් මනුෂ්‍ය ස්වභාවය හුදෙක් සත්ව පරිණාමයේ සීමාවේ සිට සිට බැලූවත් "අඳුරු" යැයි කිව නොහැක්කේමය.

සතුන් හා මිනිසුන් අතර නිරීක්ෂිත ආක්‍රමණශීලීත්වය පිළිබඳ ප්‍රබල තුලනාත්මක මානව විද්‍යා අධ්‍යයනයක් (Irenaus Eibl-Eitesfeldt 1979;240-1) විසින් ඝාතනයට එරෙහි අධ්‍යාත්මික නිර්ණය වීමක් උදෙසා ජීව විද්‍යාත්මක පදනමක් ද පවතින බව හෙළි කරනු ලැබ ඇත්තේය. "බොහෝ සත්ව විශේෂ ගැන බලද්දී අන්තඃවිශේෂ ආක්‍රමණශීලීත්වය කෙතරම් දුරට අභිචාරගත වී ඇතිදැයි කිවහොත් එය ශාරීරික හානි ඇති නොකරන සුළුය." ලේ හැලීම වැළැක්වීමට අනුබල දෙන සමාන්තර සහ වඩාත් විස්තීර්ණ ශිල්පක්‍රම මනුෂ්‍ය අභිචාර තුළ අඩංගු වන බව ඔහු නිරීක්ෂණය කරයි. 'එක්තරා දුරකට ජීව විද්‍යාත්මක ප්‍රතිමාණ පෙනේරයක් විසින් "නුඹ විසින් ඝාතනය නොකළ යුත්තේය" යන ප්‍රඥප්තිය මිනිසා තුළ පනවා ඇතිවා සේය' යනුවෙන් ඔහු නිගමනය කරයි. එසේ වුවද මිනිස් සංස්කෘතික ක්‍රියාවලීන් තුළ පැනෙන ව්‍යාජ විශේෂකරණය (අනෙකා තමා මෙන්ම, පූර්ණ මිනිසෙක් නොවේය. එබැවින් ගොදුරු කර ගැනීමට උචිතය, වැනි දිට්ඨීන්ගේ පැන නැගීම) නිසා ඝාතනය තහනම් කෙරෙන ජීව විද්‍යාත්මක ප්‍රතිමාන පෙරනය අතික්‍රමණය කරන්නා වූ මැරීමට ආඥා කරන්නා වූ සංස්කෘතික ප්‍රතිමාන පෙරනයක් මිනිසා විසින්ම ස්ථාපනය කොට ගෙන ඇත්තේය. යුද්ධයේදී මේ තත්වය 'ප්‍රතිමාන අතර ගැටුමක් බිහි කරයි. සතුරා ප්‍රග්‍රහණය කරන

මොහොතේම, ඔහු මනුෂ්‍යයෙක් හැටියටද සම්මුඛ වීම නිසා තම හෘදය සාක්ෂිය විසින් පහරනු ලැබීමට ලක් වීමක් පෙනෙන හෙයින්' මනුෂ්‍යයා මේ ගැන එක්තරා දුරකට සවිඥානික බව කිව හැකිය. 'පිරිසිදු වීම සහ සමාජය විසින් නැවත භාරගනු ලැබීම' උදෙසා සොල්දාදුවන් තුළ පැන නගින පශ්චාත්-ඝාතන මානසික අවශ්‍යතා විසින් මේ කරුණ මැනවින් තහවුරු කරයි.

අයිබල්-අයිබස්ෆෙල්ට් විද්වතා විසින් ගොඩ නඟන යටකී ප්‍රවාදය ග්‍රොස්මන් නම් හමුදා මනෝ-චිකිත්සක පර්යේෂකයකුගේ සොයා ගැනීම්වලින් තවදුරටත් ශක්තිමත් කෙරෙයි. ඔහුට අනුව 'තමන්ගේ ජීවිත හෝ තම සගයන්ගේ ජීවිත බේරා ගැනීමට පවා යුදබිමේදී බහුතරයක් සොල්දාදුවන් සතුරා මැරීමට උත්සාහ නොකරන බව ඉතිහාසය පුරා පෙනී ගොස් ඇත.' (Grossman, 1995;4). යුද බිමට ගිය අය අතුරින් මානසික අනාතුරු සහ රෝගවලට සාපේක්ෂව ගත් විට, වැඩියෙන් ලක්වන්නෝ ඍජුව ඝාතනයේ යෙදුනු සොල්දාදුවෝ වෙති. මෙම විද්වතුන් දෙපලගේ සොයා ගැනීම් එකිනෙක හා මැනවින් ගැලපුනද, ඔවුන්ගේ පර්යේෂණවල අභිමතාර්ථ වෙනස්ය. එබැවින් ඔවුන් ඉදිරිපත් කරන ප්‍රතිපත්ති නිර්දේශ එකිනෙකින් වෙනස්ය. යුද බිමේදී ඝාතනයට එරෙහිව ක්‍රියාත්මක වන අභ්‍යන්තර ප්‍රතිරෝධය මැඩලීමට උපකාරක වන වෘත්තික පුහුණුවක් සොල්දාදුවන්ට ලබාදිය යුතුය යන්නයි'' හමුදා පර්යේෂකයාගේ නිර්දේශය. මානව විද්‍යාඥයා යෝජනා කරන්නේ තිර්සාන මනුෂ්‍ය ජීව-විද්‍යාත්මක මූලයන් හා සංගත වන පරිදි මනුෂ්‍ය සංස්කෘතිය සකස් කළ යුතු බවයි. අයිබල්-අයිස්බස්ෆෙල්ට් අවසාන වශයෙන් තම ධාරණාවන් මෙසේ ගොනු කරයි:

> *විශ්වීය වශයෙන් සාමය කෙරේ ඇති නදබල ආශාව ජනිත වන්නේ මෙකී සංස්කෘතික සහ ජීව විද්‍යාත්මක ප්‍රතිමාන අතර ඇති නොපෑහීම හා ගැටුම නිසාය. මේ නිසා මනුෂ්‍යයාට තම ජීවවිද්‍යාත්මක ප්‍රතිමාන පෙරන සහ සංස්කෘතික ප්‍රතිමාන පෙරන එකිනෙක හා එකඟ කර ගැනීමට මූලික අවශ්‍යතාවක් හට ගනී. අපගේ හෘදය සාක්ෂිය, අපගේ බලාපොරොත්තුවද වෙයි. ඒ මත පදනම්ව හේතුඵල ධර්මයට අනුගතව, විද්‍යානුකූල ආකාරයට පරිණාමීය ගමන සකස් කිරීම මගින් සාමකාමී මිනිස් ශිෂ්ටාචාරයකට දොරටු විවර වනු ඇත. මෙයින් ක්ෂණිකවම මතු කෙරෙන පූර්ව, අවශ්‍යතාවක් වන්නේ, යුද්ධය මගින් දනට මනුෂ්‍යයා විසින් ඉටුකර ගැනීමට අපේක්ෂා කරන යම් ඕනෑ එපාකම් වේද, එම උවමනාවන් ලේ හැලීමකින් තොරව, අහිංසාවාදී මාර්ග හරහා ඉටුකර ගැනීමට අවශ්‍ය බව අප විසින් හඳුනාගැනීමයි. (1979:241).*

නිර්සාත මිනිස් විභවයන් පිළිබඳ විශ්වාසය ජනිත කරන්නා වූ නව දැනුම් සපයන තවත් විද්‍යා ක්ෂේත්‍රයක් වන්නේ මොළ විද්‍යාවයි. සිය ප්‍රවේශය 'ස්නායු යතාර්ථවාදය' නමින් හඳුන්වන බෲස් මෝර්ටන් නම් ස්නායු විද්‍යාඥයා Dual Quadbrain Model of Behavioral Laterality නම් ආදර්ශනයක් සකස් කොට ඉදිරිපත් කරයි. එය වනාහි මනුෂ්‍යයාගේ සාතක මෙන්ම, නිර්සාත චර්යාවට අදාළ ස්නායු - ජීවවිද්‍යාත්මක පදනම විස්තර කරන්නකි. මෙම ආදර්ශනය සංරචක හතරකින් යුක්තය. ඒවා ක්‍රියාත්මක වන්නේ, "ඒකීය චතුෂ්ක පද්ධතියක මානයන් යුගලක්' වශයෙනි." ඒවා නම් මොළයේ මධ්‍ය පද්ධතිය (සහජාසය)- Core system , ලිම්බික් පද්ධතිය (භාව සංවේදනා), Limbic system, වාම සහ දක්ෂිණ අර්ධ ගෝල පද්ධතිය (පරිකල්පනය සහ බුද්ධිය) සහ නව - අනුමස්තිෂ්ක පද්ධතිය (අන්තර්ඥානය) neocerebellar system වෙනි. ඉහළ ආධ්‍යාත්මික හා සමාජයීය විඥාණයේ ප්‍රභවස්ථානය වශයෙන් මෝර්ටන් නව- අනුමස්තිෂ්ක පද්ධතිය ආශ්‍රිත අන්තර්ඥානය හඳුනා ගනී. මේ 'ඉහළ ප්‍රභවය වූ කලී සත්‍යවාදීය, නිර්මාණශීලිය, ස්වයංශික්ෂිතය, පරාර්ථකාමීය, සහයෝගිශීලිය , සහානුකම්පනයෙන් යුක්තය. අහිංසාවාදීය.' මේ ලක්ෂණ මනුෂ්‍ය වර්ගයාගේ දීර්ඝ කාලීන පැවැත්මට අධාරකව පවතින්නෝය.

එමෙන්ම ඒවා 'නිශ්චිත වශයෙන්ම මොළය මූලික කරගත් ලක්ෂණ සමුච්චයක් බැවින්, හැම දෙනාටම ලබාගත හැකිය.' මෙකී ප්‍රභවය මිනිස් විඥානය තුළ පැන නැගීම ආකාර තුනකින් සිදුවිය හැකිය; මරණ මංචක කම්පනය හෙවත් මරණාසන්න ක්ෂතිය නිසා, ඇතැම් භ්‍රාන්තිකාරක ඖෂධ නිසා සහ විශේෂයෙන්ම භාවනාව මගින් වශයෙනි.

එදිනෙද සාමාජීය ජීවිතය තුළ සහක්‍රියා-ශක්තියේ උද්භව වාසි (emergent benefits of synergy) වෙතට යොමු වනු වස්, අවශ්‍ය අන්තර්ඥානය මෙකී ප්‍රභවය විසින් උත්පාදනය කරමින් අහිංසක, සාමකාමී ප්‍රජාවක් දෙසට වැඩීමට ආධාර කරන්නේය. පැවැත්මට එරෙහි මාරක තර්ජන විරහිත තත්වය මෙම ප්‍රභවයේ නැගීමට වාසිදයක වන අතර, පෙරළා එය ඒ සඳහා සේවය කරයි.

මේ ආකාරයට ස්නායු යතාර්ථවාදී මස්තිෂ්ක විද්‍යාව විසින් ස්වයං-ක්‍රියාකාරී අහිංසාවාදී මැදිහත් වීම් සහ සමාජ විපර්යාසය සඳහා සපයනු ලබන්නා වූ පදනම, තිර්සාන අධ්‍යාත්මිකත්වය සහ සානනය පිටු දකින ජීව විද්‍යාත්මක මූලයන් සමග පූර්ණ වශයෙන්ම සම්පාත වෙයි. එමෙන්ම එය 'මහා ආගමික ශාස්ත්‍රාචාරුන් විසින් භාරගන්නා ලද කාර්යභාරය නම්, දෙවියන් බැහැරක සිට මිනිසා වෙතට වැඩමවීම නොව, දැනටමත් තමා තුළ පවතින්නා වූ දේවත්වය බැහැරට ප්‍රක්ෂේපණය කිරීමට සෑම පුද්ගලයෙකුටම උපකාර කිරීමය' යන විවේකානන්ද නම් සුප්‍රසිද්ධ හින්දු ගුරුවරයාගේ දැක්ම සමග මනා ලෙස එකඟ වෙයි. එපරිද්දෙන්ම, "දේව රාජ්‍යය ඔබ තුළය" යනුවෙන් තෝල්ස්තෝයි නමැති සුප්‍රකට ක්‍රිස්තියානුවා විසින් කරන අවධාරණය සමග හොඳින්ම අනුනාද වෙයි. (Tolstoy, 1974). මේ ආස්ථානය පහළොස්වන ශතවර්ෂයේ විසූ ඉන්දියානු ගුප්තවාදී මහා කවියා, කබීර්ගේ මේ පැදියෙන් මතු කෙරෙන අර්ථය සමග සසඳ බලන්න:

*සමිඳුන් සඳෙස රැගෙනා*<br>
*මහ ගුරු නෙත් යුග'තර හිඳිනෙයි*<br>
*සමිඳුන් ඔබේ, ඔබ සිරුර තුළමයි*<br>
*සොයන්නට ඔහු බැහැර නෙත් හරිනු කුමකට?*<br>
*(Sethi, 1984;56-7)*

එහෙත් ජීවවිද්‍යා - මූලික මස්තිෂ්ක ආබාධයක් නිසා ඇතැම් පුද්ගලයෙක් අනිවාර්ය ඝාතකයෙක් බවට පත්වීමේ අනතුර පැවතිය හැකියි නේද? තත්වාරෝපණය සහ සංස්කෘතික හැඩ ගැස්ම නිසා නොව ජීව විද්‍යා පදනමකින් කිසිවෙක් තුළ මාරකත්වය මතු වුවත්, එම පුද්ගලයා ආබාධිත තත්වයෙන් මුදවා සුවපත් කිරීමට තමන්ට හැකියාවක් ඇති බවට විද්‍යාවේ විශිෂ්ඨ නව පෙරමුණු සහතික වන්නෝය. එසේ කරන අතර අනෙකුත් මනුෂ්‍ය ගුණයන්ට හානි පැමිණවීමක් නොකිරීමේ අතුරු සහතිකයක් ද දැන් අප ඉදිරියේ ඇත. මේ ආකාරයෙන් බලන විට පෙනී යන කරුණ නම්, නූතන ස්නායුවේදයේ 'ජාන විද්‍යාවේ සහ වෙනත් ජීව විද්‍යා ශාඛාවන්ගේ ප්‍රගමනය විසින් 'මනුෂ්‍ය ස්වභාවයේ අනිවාර්ය මාරකත්වය' යන ප්‍රපංචය, එය අසාමාන්‍ය අයුරින් ජීව විද්‍යාත්මක පදනමක් සමග ගැට ගැසී තිබුණත්, සම්පූර්ණ වශයෙන් මේ වනවිට නිෂ්ප්‍රභා වී ඇති බවයි.

මේ සහතිකය සම්බන්ධයෙන් පුරෝගාමී උදහරණයක් සංවර්ධන ස්නායු - මනෝවිද්‍යාඥයෙක් වන ජේම්ස් ප්‍රෙස්කොට් සහ ස්නායු - මනෝචිකිත්සක රොබට් හීත් යන දෙපළ විසින් කරන ලද මූලික හා ව්‍යවහාරික පර්යේෂණයක් තුළින් ඉදිරිපත් වී ඇත. (Restak, 1979; 118-133). ඇතැම් පුද්ගලයෙක් ඝාතනයට අත්‍යාවශ්‍ය ආකාරයෙන් තල්ලු වන්නේ මොළයේ භාව-සංවේදන සම්බන්ධක පථ (ලිම්බික් පද්ධතිය) සහ කායික චර්යා සම්බන්ධනා පථ (අනුමස්තිෂ්කය) සම්බන්ධ කරන්නා වූ විද්‍යුත් පරිපථවල (සුබවීථි) කිසියම් දුබලතාවක් නිසා යැයි ඔවුහු න්‍යායගත කරති. තවදුරටත් ඔවුන් ප්‍රවාද ගත කරන්නේ මෙකී විද්‍යුත් පරිපථවල ප්‍රවර්ධනය හෝ අඩාල වීම මුල් ළමා වියේ සංවර්ධනය තුළ සිදුවන චක්‍රීය කායික චලනවල ප්‍රමාණය සමග යම් සබඳතාවක් දක්වන බවයි. මේ ප්‍රවාදය චිම්පන්සියන් යොදා කරන ලද විද්‍යාගාර පර්යේෂණ මාලාවක් මගින් තහවුරු කිරීමට ඔවුන් උත්සාහ දරා ඇත; එක් චිම්පන්සින් කණ්ඩායමකගේ හිස් චලනය වීම උපකරණයක ආධාරයෙන් වළකන ලද අතර, තවත් කණ්ඩායමකට රවුමට කැරකෙන ආසන පද්ධතියක ආධාරයෙන් භ්‍රමණය වීමට සලස්වන ලදී. කාලයාගේ ඇවෑමෙන් පෙනී ගියේ හිස් සිර කර තබන ලද චිම්පන්සින් වඩා ආක්‍රමණශීලි නැඹුරුවකින් යුක්ත වූ බවත්. චක්‍රීයව චලනය වීමට ඉඩ ලබාදෙන ලද චිම්පන්සින් වඩාත් සමාජශීලි වූ බවත්ය; ඔවුන්ගේ පර්යේෂණ ව්‍යාපෘතිය, ක්‍රමයෙන්, මනුෂ්‍ය මොළය 'නිරවද්‍ය' කිරීම සඳහා යට නී සොයා ගැනීම් භාවිතා කිරීමේ හැකියාව සෙවීම දෙසට දිගු විය; ආයතනගත ඝාතකයින් පිරිසකගේ මොළයේ පශ්චාත් ප්‍රදේශයේ කුඩා ඉලෙක්ට්‍රෝඩයක් සවි කරන ලදී. එම ඉලෙක්ට්‍රෝඩයේ ක්‍රියාකාරීත්වය උරහිසේ සවි කරන ලද තවත් සියුම් උපකරණයක් සමග සම්බන්ධිතය. එම උපකරණය අදාළ පුද්ගලයාටම ලබාදෙන කුඩා අත් උත්තේජයක් මගින් ස්වයං-පාලනය කළ හැකි වෙයි. මෙම පද්ධතිය 'අනුමස්තිෂ්ක උත්තේජකයක්' වශයෙන් සරලව නම් කළ හැකිය. දැඩි ආතෘප්තිකර මානසික තත්වයක් පැන නගිමින් ඝාතන උත්ප්‍රායයක් මතු වන විට එම පුද්ගලයාට එකී මානසික තත්වය ඉවත් කර ගැනීමට අවශ්‍ය නම් අනුමස්තිෂ්කයේ සුබ වීථි ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලැබේ. වර්ෂ ගණනාවක් රැකවල් පිට හුදෙකලා කුටිවල රඳවන ලද 'සාපරාධී උන්මන්තක' ස්වභාවයේ පසුවන්නන්

ලෙසින් හඳුනා ගෙන තිබූ එකී පිරිසෙන් සමහරු, මෙම පර්යේෂණ චිකිත්සාවේ ප්‍රතිඵලයක් වශයෙන් ක්ෂණික සහනයක් ලැබීම අත් දුටහ. තවත් සමහරු මැරීමට සහ දිවි නසා ගැනීමට වරින් වර බල කෙරෙන මානසික උත්ප්‍රාය තමන් තුළින් ක්‍රමයෙන් තුනී වී අතුරුදහන් වන බැව් නිරීක්ෂණය කළහ. එහෙත් අසාර්ථක වීම් ද තිබුණි. එක් අවස්ථාවකදී රෝගියෙකුගේ අනුමස්තිෂ්කයට සම්බන්ධ කරන ලද විද්‍යුත් රැහැනක් බිඳී ගියේය. රෝගියා එසැණෙහි කතුරකින් ඇන අසල වූ හෙදියක් මරා දැම්මේය. කෙසේ නමුත්, මෙම පුරෝගාමී ක්‍රියා මාර්ගයේ මූලික සාර්ථකත්වය සනාථ කර සිටින්නේ, නව න්‍යායික සහ තාක්ෂණික නිර්මාණශීලී ප්‍රවේශයන් ඔස්සේ ද මාරක ජීව විද්‍යා අසුභවාදයෙන් මනුෂ්‍යයාව නිදහස් කළ හැකි බවයි.

සම්මත දේශපාලන විද්‍යාවේ අසුභවාදයට ප්‍රතිපක්ෂව නිර්සාත සුභවාදයක් සඳහා වූ අවකාශය, ස්ටැන්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ මනෝචිකිත්සකයන් විසිතුන් දෙනෙකුගේ නිගමන තුළින් තවදුරටත් ප්‍රසාරණය වෙයි. ඔවුහු වනාහි මාටින් ලූතර් කිං (කනිෂ්ඨ) සහ සෙනට් සභික රොබට් කෙනඩි ඝාතනය කර දැමීමෙන් පසුව අමෙරිකාවේ ප්‍රචණ්ඩත්වයේ අර්බුදය අධ්‍යයනය කිරීම සඳහා ඇති කර ගන්නා ලද විශේෂ කමිටුවක සාමාජිකයෝ වෙති. (Daniels, Gilula and Ochberg, 1970). ජීව විද්‍යාව, මනෝගතික විද්‍යාව, පරිසරය, කෝපය. අන්තර් කණ්ඩායම් ගැටුම්, ජන සන්නිවේදනය, ගිනි අවි, මානසික ආබාධ, මත්ද්‍රව්‍ය භාවිතය සහ තවත් සාධක ගණනාවකට අදාළව ප්‍රචණ්ඩත්වය සහ ආක්‍රමණශීලීත්වය ගැන බහුමාතීය ගවේෂණයක යෙදුනු මෙම කමිටුව වෙනුවෙන් ඩැනියල්ස් සහ ගිලූලා පහත නිගමනයට පිවිසෙති. 'විකල්පයන් සෙවීමට අප අධිශ්ඨානශීලී වන්නමෝ නම් ප්‍රචණ්ඩ යුගය නිමා කිරීමට අවශ්‍ය තරම් දැනීම දැනටමත් මනුෂ්‍යයා සතුව තිබෙනවා විය යුතුය.' (Daniels, and Gilula 1970;441).

'මනුෂ්‍ය ස්වභාවයට' දෙස් තබමින්, විසඳුම් රහිත මාවතකට වැටීමට ප්‍රතිපක්ෂව, මනෝචිකිත්සක ජෝජ් සොලමන් (1970) විසින් ඉදිරිපත් කොට ඇති මිනිස් ඝාතන පිළිබඳ ප්‍රත්‍යක්ෂ අධ්‍යයන, ඝාතනය වනාහි වටහාගත හැකි සහ උචිත මාර්ග හරහා වළක්වා ගත හැකි ප්‍රපංචයක් බව පෙන්වා දෙති. එක් සිද්ධියකදී චිත්තාවේගයන්ගෙන් තොර බවක් පෙන්නුම් කළ සසම්භාවී

ආකාරයට ගැහැණුන් මරා දමූ තුවක්කුකරුවෙකුගේ සමාජීකරණ අත්දැකීම් මෙආකාර විය; සුදුවට ඇබ්බැහි වූ පියා විසින් නොසලකා හරිනු ලැබීම, සුරා ලෝලී සහ ලිංගික සීමා නොරක්නා මව විසින් ව්‍යභිචාරයට පොළඹවා ගැනීම, තුවක්කුවලට ඇල්මක් ඇති වීම, ව්‍යභිචාරයේ වරදකාරීත්වය නිසා නිපන් සෝර චිත්තරූපවලින් මිදීම සඳහා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම යනාදී වශයෙනි.

තවත් සිද්ධියකදී, කලින් බිරිඳගේ නව සැමියා මරා දමූ ඝාතකයෙකුගේ පසුබිම මෙබඳුය: අන්ත දරිද්‍රතාවය, මවට දරුණු ලෙස හිංසා කළ පියා කෙරේ වෛරය, පියා විසින් හිසට දරුණු ලෙස පහර දීමකින් පසුව ආක්ෂේප (වලිප්පු) තත්වයක් ඇති වීම, මවගේ හාස්‍යයට නිතර ගොදුරු වීම, සහෝදරියන් ගේ පහර දීම්වලට ලක් වීම, නාවික බල ඇණියක සාජන්ට්වරයෙක් බවට පත් වීම, ගණිකා නිවාසයකදී හමු වූ ගණිකාවක් සමග විවාහ වීම, ඇය නිසා දරු දෙදෙනෙකුගේ පියෙක් වීම, තමන් රාජකාරී සඳහා මුහුදු ගිය කාලවලදී බිරිඳ වෙනත් සබඳතා පවත්වන බව හෙළිදරව් වීම නිසා, ඇයට පහර දී අතක නහර කපා ගනිමින් දිවි නසා ගැනීමට තැත් කිරීම, පිස්තෝලයක් අතින් ගත් බිරිඳගේ මරණ තර්ජනයට ලක් වීම, දික්කසාදය සහ දරුවන්ගේ රැකවරණයට හා දරුවන් බැලීම සඳහා පැමිණීමට ඇති අයිතිය මුල්කොට ගෙන ඇතිවූ තුන්කොන් බහින්බස් වීමකදී තම සේවා පිස්තෝලයෙන් කලින් බිරිඳගේ නව සැමියාට වෙඩි තබා මැරීම.

සොලමන්ගේ නිගමනය යට දැක්වේ.

> *මනුෂ්‍ය චර්යාව අවශ්‍ය ලෙසට විකරණය කළ හැකිය' යන අදහසට මනෝචිකිත්සකයෙක් ලෙස මම සම්පූර්ණයෙන්' කැපවී සිටිමි. ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ නිවාරණය සම්බන්ධයෙන් අපගේ අසාර්ථක භාවය පදනම් වී ඇත්තේ නොදන්නාකම මතයි. එනමුත් ජනන සාධක පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කිරීම හරහා තත්වය වෙනස් කළ හැකි යැයි මම විශ්වාස කරමි; පිළිගත් මූලධර්ම හිසි ලෙස භාවිතාවේ නොයෙදීම , නව්‍යකරණය සඳහා වූ මැළිකම, ප්‍රචණ්ඩත්වයට නැඹුරු පුද්ගලයන්ගේ අභ්‍යන්තර රෝගී තත්වය ගැන නොසොයා ඔවුන්ගේ සමාජ අපගාමී චර්යාවට දඬුවම් කිරීම, වර්ධනයට සහ සුවපත් වීමට මනුෂ්‍යයාට ඇති ශක්‍යතාවය අප්‍රමාණය; එබැවින් ප්‍රචණ්ඩත්වයේ මාවත මුළුමනින්ම වසා දැමිය හැකිය.*

මේ ආකාරයෙන්ම මානව විද්‍යා ක්ෂේත්‍රය තුළද, ප්‍රචණ්ඩත්වය සහ ආක්‍රමණය පිළිබඳ සම්ප්‍රදායික අවධාරණය තුනී වෙමින්, අහිංසාව සහ සාමකාමී සහජීවනය අරබයා මනුෂ්‍යයා තුළ ඇති ශක්‍යතාව පිළිබඳ නව උද්යෝගයක් ජනිත වන අතර, ඒ ඔස්සේ මතු කෙරෙන නව දැනීම නිර්සාන සමාජයක් අභව්‍යය යන දැක්ම තවත් වටයකින් ප්‍රශ්න කරයි. (Sponsel and Gregor, 1994; Sponsel 1996) ලෙස්ලි ස්පොන්සල් පැහැදිලි කරන පරිදි "අහිංසාවාදී සහ සාමකාමී සමාජ විරල බවක් පෙනී යන්නේ, ඒවා සැබෑ ලෙසම විරල නිසා නොව, පර්යේෂණවලට, මාධ්‍යයට හා වෙනත් ක්ෂේත්‍රවලට ඒවා ඉලක්ක වන්නේ ඉතා විරල වශයෙන් නිසාය. අහිංසාවේ සහ සාමයේ ලක්ෂණ, තත්වයන්, හේතු සාධක, කාර්යයන්, ක්‍රියාවලීන් සහ විපාක අවබෝධ කර ගැනීම ප්‍රචණ්ඩත්වයේ සහ යුද්ධයේ එකී හේතු ප්‍රත්‍යයන් අවබෝධ කර ගන්නා තරමටම වැදගත්ය.' (Sponsel 1994 a ; 18-19).

ප්‍රාග් යුගවල මානවයින් අතර විශ්වීය වශයෙන් මාරක ප්‍රචණ්ඩ ලක්ෂණ පැතිර තිබිණැයි කියන හොබේසියානු මතිය විද්‍යාත්මක ප්‍රශ්න කිරීමට භාජනය කිරීම පියාරෝ ගියෝර්ගි (1999) සහ ජේ. එම්. ජී. වැන් ඩර් ඩෙනන් (1990,1995) යන දෙපළ අතින් තවදුරටත් ඉදිරියට සංවර්ධනය වී ඇත. 'ප්‍රාථමික' යැයි සැලකෙන ජනතාවන් 50,000ක ප්‍රමාණයක් ආශ්‍රිත කලහ සහ යුද්ධ පිළිබඳ පසුගිය ශතවර්ෂයේ සම්පාදිත මානව වංශ ලේඛණවල වාර්තාගත වී ඇති සාක්ෂි පිළිබඳ සමීක්ෂණයක් හරහා වැන් ඩර් ඩෙනන් පෙන්වන්නේ, ප්‍රචණ්ඩ ගැටුම් පිළිබඳ නිශ්චිත තොරතුරු ඇත්තේ, ඇත්ත වශයෙන් එයින් 2000කට අදළව පමණක් බවය. යුදකාරී බවක් පිළිබඳ තොරතුරු ඉතිරි සමාජවලට අදළව නොමැති වීම, ඔවුන් නිසැකින්ම සාමකාමී ජනතාවන් වේය' යන්නක් තහවුරු නොකරන බව පිළිගන්නා වැන් ඩර් ඩෙනන්, එනමුත් විශ්වීය වශයෙන් (ප්‍රාග්) මනුෂ්‍ය සමාජ රණකාමීය යන්න ආධානග්‍රාහී ලෙස භාර ගැනීම නොකට යුතු බව පෙන්වා දෙයි. (1990:257, 259, 264-9), තවද ඔහු එකී මානව වංශ ලේඛනවලින් ඉදිරිපත් වන තොරතුරු ඇසුරින් 'පැහැදිලිවම යුදකාමී නොවන්නා වූ' යැයි හඳුනාගත හැකි සමාජ 365ක් - ආදිවාසීන්ගේ සිට පූනිවරු දක්වා - ලයිස්තු ගත කරයි. (1995:595-619).

මේ ආකාරයෙන්ම, මානවවංශ ලේඛණ සමීක්ෂණයක් කරමින් බෲස් බොන්ටා(1993) නම් මානව විද්‍යාඥයා සාමකාමීව ජීවත්වීමට පැහැදිලි ශක්‍යතාවක් පෙන්වන මානව සමාජ හතලිස් හතක් හඳුනාගනී.

> *සාමකාමීබව වනාහි ඒක ජීවිතයේ සාපේක්ෂව ඉහළ මට්ටමක අන්තර්-පුද්ගල ප්‍රසංවාදීබවක් රැකෙන තත්වයක් වශයෙන් නිර්වචනය කළ හැකිය; වැඩිහිටියන් අතර, වැඩිහිටියන් සහ දරුවන් අතර ස්ත්‍රී - පුරුෂ පාර්ශව අතර කායික ප්‍රචණ්ඩත්වය අවමය. ප්‍රචණ්ඩත්වය වලක්වා ගැනීමට මෙන්ම ගැටුම් සමථනරණය සඳහා භාවිතාවේ යෙදවිය හැකි සාර්ථක උපායමාර්ග වර්ධනය කොට ගෙන ඇත. වෙනත් ජනතාවන් සමග ප්‍රචණ්ඩ ගැටුම් (යුද්ධ වැනි) මග හැර යාමට කැපවී සිටිති. දරුවන් හදවඩා ගැනීමේදී සාමකාමී චර්යා හා ජීවන කුසලතා පුහුණු කෙරේ. එමෙන්ම තමන් සාමකාමී ය යන ප්‍රබල හැඟීමක් ඔවුන් සතුව ඇත. (4)*

මෙබඳු දර්ශකවලින් සංලක්ෂණය කෙරෙන්නා වූ සාමකාමී සංස්කෘතියක් දක්නට හැකි සමාජ, බොන්ටා විසින් මෙලෙස ලයිස්තුගත කරයි; අමිෂ්වරු, ඇනාබැප්ටිස්ට්වරු, බාලි වැසියෝ, බාටෙක්වරු, බිර්හෝර්, බ්‍රෙත්රන්, බුයිඩ්, චෙවොන්, ඩුබොබෝර්, ෆීපා, ගෙරෙ, ගව්, හුටෙරයිට්වරු, ඉෆාලුක්, ඉනුයිට්, ජේනයෝ, කදර්වරු, කුන්ග්, ලඩාකි වැසියෝ, ලෙප්චාස්වරු, මලපන්දරම්, නායක්වරු, නුබියන්වරු, ඔන්ගේ, ඔරන්ග් අස්ලි, පලියාන්, පියරෝවා, ක්වේකර්වරු, උතුරු අයර්ලන්තයේ ගැමි ජනයා, තායි ගැමි ජනයා, සැන්වරු, සැන්පොයිල්, සැල්ටෙයූ, සෙමායි, තහිති ජනයා, තන්කාවරු, තෙමියාර්, තොරාජා, ට්‍රිස්ටන් ද්‍රූපත්වාසීනු, වවූරා, යනාඩි , සැපොටෙක්වරු සහ සූනිවරු .

මෙයින් සමාජ විසිහතරක් තුළ ගැටුම් සමථනරණ ක්‍රියාවලීන් වැඩි දුර අධ්‍යයනයට භාජනය කරන බොන්ටා (1996) මෙසේ ලියයි;

> *මෙම සමාජ තුළ විද්‍යමාන වන සාමකාමී ලෙස ගැටුම් සමථනර ගැනීමේ සාර්ථක පිළිවෙත් දෙස බලද්දී, ගැටුම් සහ ගැටුම් සමථනරණය පිළිබඳ බටහිර ශාස්ත්‍රඥයන් විසින් තහවුරු කරන පොදු මතීන් කිහිපයක්ම ප්‍රශ්න කිරීමට ලක් කරනු හැකියවයි; නම් වශයෙන් ගතහොත්, සියළුම සමාජ තුළ ප්‍රචණ්ඩ ගැටුම් අනිවාර්ය අංගයකි; දඬුවම් හා සන්නද්ධ බලය මගින් අභ්‍යන්තර සහ බාහිර ප්‍රචණ්ඩත්වය වළකා ගනු ලබයි; ගැටුම් වැලැක්වීමට නිශ්චිත දේශපාලන ව්‍යුහයන් අවශ්‍යය; ගැටුම් වනාහි සමාජයකට අවශ්‍ය සහ ධනාත්මක ප්‍රපංචයක් වශයෙන් ගත යුතුය. මේවාට අභියෝග කරන්නා වූ සාක්ෂි මෙබඳුය; යටකී සාමකාමී සමාජවලින් භාගයකට වඩා ඒවා තුළ ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තාගත*

*ඉතිහාසයක් නැත. ඔවුන් වැඩිහිටියන්ට දඬුවම් කරන්නේ ඉතා කලාතුරකිනි. (නෙරපීමේ තර්ජන භාවිතා වේ); තමන්ට බාහිර සමාජ සමග ඇතිවන ගැටුමක් සමථ කිරීමට ඔවුන් ප්‍රවේශ වන්නේ සිය අභ්‍යන්තර ගැටුමක් විසඳගන්නා වූ සාමකාමී ආකාරයටමය; සිය අභ්‍යන්තර ගැටුම්කදී බාහිර ආණ්ඩුවලින් ආධාර නොපතති. ගැටුම් පිළිබඳ ඔවුන් තුළ ඇත්තේ තදබල ඍණ ආකල්පයකි. (403)*

ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ඉහළ හෝ පහළ මට්ටම් පෙන්වන සමාජ එකිනෙකින් වෙනස් වන්නා වූ අනෙකුත් කාරණා අතර දරුවන්ගේ සමාජීකරණය සහ ප්‍රජාවේ ස්වයං-අනන්‍යතාවය ඉතා වැදගත්ය, යන කරුණ පුනරාවර්ති මානව විද්‍යා නිරීක්ෂණයකි. (Fabbro, 1978). මෙක්සියානු සැපොටෙක් ගම්මාන දෙකක ප්‍රජාවන්ගේ ජීවිතය තුලනාත්මක අධ්‍යයනයකට බඳුන් කරන ඩග්ලස් ෆ්‍රයි (1994) ගේ ගවේෂණය තුළ යට කී ප්‍රස්තුතයේ වටිනාකම පැහැදිලිව සනාථ කෙරෙයි. මෙම ගම්මාන දෙකෙහි සමාජ-ආර්ථික පසුබිම සමාන වන මුත්, ප්‍රචණ්ඩත්වය විද්‍යාමාන වීමේ මට්ටම් සම්බන්ධයෙන් ඒවා අතර පැහැදිලි වෙනසක් නිරීක්ෂිතය. ලාපාස් නමැති සාමකාමී ගමේ මිනිස් ඝාතන ඉතා විරලය. මෙහි වැසියන් තමන් ගැන දරන අදහස නම් 'තමන් සාමකාමී, ගෞරවනීය, ඊර්ෂයා හැඟුම් නැති, සහයෝගිශීලී ප්‍රජාවක්ය' යන්නයි. (140). මීට ආසන්නයේ පිහිටා ඇති ප්‍රචණ්ඩත්වය බහුල සැන් ඇන්ඩ්‍රියාස් ගමේ වැසියන් අතර 'ප්‍රචණ්ඩත්වයට අනුබල දෙන්නා වූ සියුම් ප්‍රතිවාදී විශ්වාස නොහොත් වටිනාකම් පද්ධතියක්' දක්නට ලැබුනි. (141). මීට සමාන්තරව, මේ ගමේ කාන්තාවන්ට ඇති ගෞරවය අඩුය. ගෘහස්තව ගැහැනුන්ට පහර දෙති, දරුවන්ට කායික දණ්ඩන පමුණුවති, දරුවෝ අකීකරුය, බැණ අඩගැසීම් බහුලයි, බීමත් කෑගැසීම් සුලබය, ලිංගික ඊර්ෂ්‍යාව කරණ කොට මිනී මරති, දීර්ඝ කාලීන හබ සහ පළිගැනීම් දක්නට ලැබේ. ද්‍රව්‍යමය සහ සමාජ ව්‍යුහාත්මක තත්වයන් අතින් එකිනෙකට සම්පව සමාන වන මේ ගම් දෙකින් සැන් ඇන්ඩ්‍රියාස් හි මිනිස් ඝාතන අනුපාතය 100,000ට 18.1 ක් වූ අතර, ලාපාස් හි එම ප්‍රමාණය 3.4 ක් පමණය. මෙම තුලනාත්මක අධ්‍යයනය ඉතා පැහැදිලිව පෙන්වා සිටින්නේ 'මනුෂ්‍ය ස්වභාවය' පිළිබඳ අසුභවාදී ආකල්ප සහ ප්‍රචණ්ඩත්වයට අනුබල දෙන ප්‍රජා සමාජ-සංස්කෘතික ප්‍රතිමාන, ඝාතනය සමග ඍජු අන්‍යොන්‍ය සම්බන්ධයක් දරන බවයි; අනිත් අතට අහිංසාවාදී විශ්වාස හා වටිනාකම් නිර්ඝාත සමාජයක් වෙතට දොරටු විවර කරන බවයි.

නිර්ඝාත මනුෂ්‍ය ශක්‍යතා පිළිබඳ විශ්වාසය ශක්තිමත් කරන්නා වූ දයකාන්වයක් ප්‍රධාන පෙළේ ජාත්‍යන්තර විද්‍යා සමූළුවකින් ඉදිරිපත් වී තිබේ. 1986 මැයි 16 දින, සත්ව චර්යාව, චර්යා ප්‍රවේණි විද්‍යාව ජීව විද්‍යා මානවවේදය, චර්යා විද්‍යාව, ස්නායු කායික විද්‍යාව, භෞතික මානව විද්‍යාව, දේශපාලන මනෝවිද්‍යාව, මනෝ-චිකිත්සාවේදය, මනෝ-ජීව විද්‍යාව, මනෝ විද්‍යාව, සමාජ මනෝ විද්‍යාව, සහ සමාජ විද්‍යාව යන ක්ෂේත්‍ර නියෝජනය කරමින් පැමිණි විශේෂඥ කණ්ඩායමක් ප්‍රචණ්ඩත්වය පිළිබඳ ඓතිහාසික ලේඛණයක් - සේවිල් ප්‍රකාශනය-සම්මත කොට ගෙන ප්‍රකාශයට පත් කළහ. එහිලා මේ විද්වත්තු මෙසේ කියති;

> *අප අපගේ සත්ව මීමුත්තන්ගෙන් යුධ කිරීමට නැඹුරුතාවක් උරුම කරගෙන ඇතැයි කීම **විද්‍යාත්මකව වැරදිය**... යුද්ධය හෝ වෙනත් ප්‍රචණ්ඩ චර්යාවන් අපගේ සවභාවය තුළ ජානමය පදනමකින් ස්ථාපනය වී ඇතැයි කීම **විද්‍යාත්මකව වැරදිය** .... මනුෂ්‍ය පරිණාමීය ක්‍රියාවලිය තුළ ආක්‍රමණශීලී චර්යාවන් අනෙකුත් චර්යාවන් අභිබවා ධනාත්මක වරණයකට ලක් වී ඇතැයි කීම විද්‍යාත්මක වැරදිය. මනුෂ්‍යයාට 'ප්‍රචණ්ඩ මොළයක්' උරුමව ඇතැයි කීම **විද්‍යාත්මකව වැරදිය**. යුද්ධය වනාහි සහජාසය හෝ කවර නමුත් තනි අභිප්‍රේරණයකින් උත්පාද වේ යැයි කීම **විද්‍යාත්මකව වැරදිය**.*

ස්ටැන්ෆර්ඩ් මනෝචිකිත්සකයන්ගේ නිර්ඝාත ශුභවාදය සමග සහනුකම්පනය වෙමින් සේවිල් හි විද්‍යාඥයෝ මෙසේ ද කියා සිටිති;

> *ජීව විද්‍යා පදනම විසින් මානවයා යුද්ධයට තල්ලු නොකරන බව අපි නිගමනය කරමු. ජීව විද්‍යා අශුභවාදයේ රැහැණින් මිදී, මෙම ජාත්‍යන්තර සාම වර්ෂයේ මෙන්ම ඉන් ඔබ්බට, විපර්යකාරක කාර්යභාරයන්ට උරදීමට අවශ්‍ය ආත්ම විශ්වාසයෙන් යුතුව බල ගැන්වීමක් ඇති කර ගැනීමට මනුෂ්‍යවර්ගයාට ශක්තියක් ඇතැයි අපි විශ්වාස කරමු. මෙම කාර්යභාරයට මුහුණ දීම එක් අතකින් ආයතනික සහ සාමූහික කටයුත්තකි. එනමුත්, අනෙක් අතින්, ශුභවාදය සහ අශුභවාදය තීරණාත්මක වන පුද්ගල විඥාණය මතද එය රඳා පවතින්නේය. "යුද්ධය ආරම්භ වන්නේ මිනිසුන්ගේ මනස් තුළය" යන්න පැබැවත් වන තරමටම සාමය ආරම්භ වන්නේ ද අපගේ මනස් තුළය. යුද්ධය නිර්මාණය කළ වර්ගයාට සාමය නිර්මාණය කිරීමටද ශක්තියක් ඇත්තේය. මේ පිළිබඳ වගකීම අප සැම කෙනෙක්ම පුද්ගලිකව භාර ගත යුත්තෙමු. (Adams, 1989:120-1;1997).*

පරමාණු භෞතික විද්‍යාව වර්ධනය වී ඇති මට්ටම කෙසේද යත් මහත් සේ බලගතු නව පන්නයේ බෝම්බ නිපදවීම දැන් විශ්වාස කළ හැකි දෙයක්' යැයි 1939 අගෝස්තු 02 ද ඇල්බට් අයින්ස්ටයින්, ජනාධිපති ෆ්‍රැන්ක්ලින් ඩී.රූස්වෙල්ට් වෙත ලිපියක් ලියා දැන්වීය.

(Nathan and Norden, 1968:295). මෙහි ක්ෂණික ප්‍රතිඵලය වූයේ විශේෂ උපදේශක කමිටුවක් සම්පාදනය වීම සහ එක්සත් ජනපද රාජ්‍යය විසින් ආරම්භක ඩොලර් 6000ක ආයෝජනයක් මේ සඳහා යෙදවීමයි. ඉක්මණින්ම එම පියවර නිසා ඩොලර් බිලියන ගණනාවක් යට කරන ලද මැන්හැට්න් ව්‍යාපෘතිය බිහි වූ අතර, එහි ප්‍රතිඵලය වශයෙන් ඉන් වසර හයකට පසු, ලෝකයේ ප්‍රථම යුරේනියම් සහ ප්ලූටෝනියම් බෝම්බ නිපදවීම හා ප්‍රායෝගිකව භාවිතා කිරීම සිද්ධ විය. ඉන් අවුරුදු හැටකට පසු අද වන විට නිර්ඝාතන මිනිස් ශක්‍යතා පිළිබඳව ප්‍රමාණවත් තරමේ විද්‍යාත්මක සාක්ෂි සහ සාධක මතුවී තහවුරු වී ඇතැයි සහතික විය හැකිය. ඒවා ක්‍රමානුකූලව අනුකලනය කොට ඉදිරියට ගෙන යන්නේ නම් නිර්ඝාතන මිනිස් ශිෂ්ටාචාරයක් අරබයා වූ අතිමූලික ස්වයං-පරිවර්තනයක් සඳහා බලගැන්වීමකට අවකාශ පවතින බව සුපැහැදිලිය. මානව විද්‍යාව, අධ්‍යාපනවේදය, ඉතිහාසය, භාෂාව, සාහිත්‍යය, දර්ශනය සහ දේවවේදය යනාදී ඥාණ ශාඛා ආශ්‍රිතව ''අහිංසාව'' පිළිබඳ අධ්‍යයන වාර්තා කරන්නා වූ ආචාර්ය උපාධි පර්යේෂණ කෘති, අමෙරිකාවේ පමණක්, සියයකට වැඩි ප්‍රමාණයක් 1963 සිට මේ වන විට ත්වරණයෙන් යුතුව සම්පාදනය වීම ඉහත තත්වය පිළිබඳ සංඥා කරන එක දර්ශකයකි. (Dissertation Abstracts International 1963).

මෙයට එකතු කළ හැකි තවත් දර්ශක වෙති; ඉන්දියාව බඳු අනෙකුත් රටවල සහ ඉංග්‍රීසි භාෂාව හැර අනෙකුත් භාෂාවලින් සම්පාදිත අධ්‍යයන, ශාස්ත්‍රාලීය සම්මන්ත්‍රණ, අන්තර්-විෂයික සම්භාෂණ සහ සාකච්ඡා ලේඛණ සංග්‍රහ යනාදියට ඉදිරිපත් කරන ලද ලිපි ලේඛණ සහ පත්‍රිකා (Kool 1990; 1993), සූයරෝගාමී අනුකලනාත්මක විශ්ලේෂණ (Gregg, 1966), අභිනව වාරික සඟරා (International Journal of Nonviolence 1993), අහිංසාවාදී පර්යාලෝකය, පිළිවෙත් සහ ක්‍රියාමාර්ග ගැන වූ විස්තරාත්මක ග්‍රන්ථ ලේඛණ සමීක්ෂාව (McCarthy and Sharp 1997) ඇතුළු වෙනත් මූලාශ්‍ර යනාදී වශයෙනි. ඉතා පැහැදිලි කරුණ නම් 'සාමය' සහ 'ගැටුම් සමථකරණය' පිළිබඳ ලෝක සාහිත්‍යයට අමතරව, අහිංසාව පිළිබඳව සැලකිය යුතු තරමේ ඥාණ සම්භාරයක් වේගයෙන් වැඩෙමින් පවතින බවයි. වර්තමාන අහිංසාවාදී පමුච්ඡ ඥාණයේ

විභව ශක්තිය, 1939 දී පරමාණු භෞතික විද්‍යාවේ තත්වය සමග තෘතීයාත්මකව තුලනය කළ හැකිය.

## නිර්ඝාත හැකියාවේ කැපී පෙනෙන සිඛර

නූතන සමාජ විද්‍යාවේ පුරෝගාමියෙක් වන එමිල් ඩර්ක්හෙයිම් (1858-1917) න්‍යායික වට්නාකමක් පෙන්වන ගැටළුවලට අනුකූලව 'සමාජ ජීවිතයේ කැපී පෙනෙන මතුවීම්' වෙත අවධානය යොමු කළ යුතු යැයි අවධාරණය කළේය. නෝත්වෙස්ටන් විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා උපාධි අපේක්ෂකයින්ට, 'ස්වභාවිකව සිදුවන සමාජ පර්යේෂණ' අධ්‍යයනය කිරීමට අවදිව සිටින්නැයි, ඩර්ක්හෙයිම්ගේ යටකී අදහස ඉදිරියට ගෙන යමින්, ඩොනල්ඩ් ටී. කැම්බල් කියා දුන්නේය. මේ කියන "ස්වභාවික සමාජ පර්යේෂණ" පර්යේෂණාගාරයක නිර්මාණය කළ හැකි ඒවාට වඩා අමුතු වන්නේ නැත. (Paige, 1971). තථ්‍ය ජීවිතය නිරීක්ෂණය තරම්න්ම න්‍යාය ගොඩ නැගීමට දේශපාලන විද්‍යාව නැඹුරුවී සිටියි. මැකියාවෙල්ලිගේ The Prince කෘතියේ ලා සම්පාදිත න්‍යායික ප්‍රක්ෂේපණය වූ කලී Cesare Borgia නම් වූ සාහසික පාලකයාගේ ශිල්පී ක්‍රම නිරීක්ෂණය කිරීම හරහා ගොඩ නැගී ඇත්තේය. එපරිද්දෙන්ම 'ස්වභාවිකව' ඓතිහාසික සහ වර්තමාන සමාජ අත්දැකීම් ඇසුරින් උත්පාදනය වන නිර්ඝාත චර්යාව පිළිබඳ උදාහරණ, එබැවින් අහිංසාවාදී සමාජ පරිවර්තනයක් උදෙසා සුවිශේෂ වට්නාකමක් දරන්නේය.

නිර්ඝාත ශක්‍යතා පිළිබඳ කැපී පෙනෙන විද්‍යාමානවීම් අතර පොදු ප්‍රතිපත්ති රාමු, විශේෂ ආයතන, සංස්කෘතික ප්‍රකාශණ, අහිංසාවාදී දේශපාලන අරගල, ඓතිහාසික උදාහරණ සහ කැපවූ පුද්ගලයන් ඇතුලු බොහෝ 'ස්වභාවික හා සමාන්‍ය' දේ අඩංගුය.

## පොදු ප්‍රතිපත්ති

නිර්ඝාත සමාජයක් නිර්මාණය වීම දෙසට යොමු වූ දේශපාලන තීරණ සහ ප්‍රතිපත්ති පිළිබඳ කැපී පෙනෙන උදාහරණ පෙන්වා සිටින සමාජයන්, මරණ දඬුවම අහෝසිකරන ලද රටවල්, හමුදාවක් රහිත රටවල්, සහ හමුදා සේවයට අනුබද්ධ ඝාතනයට එරෙහිව හෘදය සාක්ෂියේ විරෝධයට ඇති අයිතිය පිළිගන්නා රටවල් තුළින් හමුවේ. ලෝකයේ ප්‍රදේශ සහ රටවල් 195කින් 73ක්, 2000 අප්‍රේල් මාසය වන

විට සියලුම ආකාරයේ අපරාධ ආවරණය වන පරිදි මරණ දඬුවම අහෝසි කර ඇත.

රටක මරණ දඬුවම අහෝසි කිරීමේ සෑම අවස්ථාවක්ම විද්‍යාත්මක වශයෙන් ද, මහජන ප්‍රතිපත්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ද දැඩි අවධානයක් ඉල්ලා සිටින සිද්ධීන් වෙති. ඒ ඒ ආණ්ඩු ඝාතනය

**වගු අංක 2**

**ලෝකයේ මරණ දඬුවම රහිත ප්‍රදේශ සහ රටවල්**

| | | |
|---|---|---|
| ඇන්ඩෝරාව | හන්ගේරියාව | සාම් තෝමේ පහ ප්‍රින්සිපේ |
| ඇන්ගෝලාව | අයිස්ලන්තය | සීෂල්ප් |
| අසයිර්බජානය | අයර්ලන්තය | ස්ලෝවැක් සමූහාණ්ඩුව |
| ඕස්ට්‍රේලියාව | ඉතාලිය | ස්ලොවේනියාව |
| බෙල්ජියම | කිරිබාති | සොලොමන් දූපත් |
| බල්ගේරියාව | ලිච්ටෙන්ස්ටීනය | දකුණු අප්‍රිකාව |
| කාම්බෝජය | ලිතුවේනියාව | ස්වීඩනය |
| කේප් වර්දි | ලක්සම්බර්ගය | ස්විට්සර්ලන්තය |
| කොලොම්බියාව | මැක්ඩෝනියාව | තුර්ක්මෙනිස්ථානය |
| කොස්ටරිකා | මාෂල් දූපත් | තුවාලු |
| ක්‍රොඒෂියාව | මොරිෂප් දූපත් | යුක්රේනය |
| චෙක් සමූහාණ්ඩුව | මයික්‍රොනේසියාව | එක්සත් රාජධානිය |
| ඩෙන්මාර්කය | මොල්දේවා සමූහාණ්ඩුව | උරුගුවේ |
| ජිබුටිය | මොනාකෝ | වනු ආතු |
| ඩොමින්කානු සමූහාණ්ඩුව | මොසැම්බික් | වතිකානු රාජ්‍යය |
| නැගෙනහිර ටිමෝරය | නැම්බියාව | වෙනිසියුලාව |
| නේපාලය | නෙදර්ලන්තය | |
| ඒක්වාදෝරය | නවසීලන්තය | |
| එස්තෝනියාව | නිකරාගුවාව | |
| පින්ලන්තය | නොර්වේ | |
| ප්‍රංශය | පැලාවු | |
| ජෝර්ජියාව | පැනමාව | |
| ජර්මනිය | පැරගුවේ | |
| ග්‍රීසිය | පෝලන්තය | |
| ගිනි බිසව් | පෘතුගාලය | |
| හයිටි | රුමේනියාව | |
| හොන්ඩුරාසය | සැන් මැරියන් | |

මූලාශ්‍රය **Amnesty Jnternational, April 2000.**

නවත්වා දැමීමට නෛතික තීරණයක් ගන්නේ කවර අවස්ථාවකද, කෙසේද, ඇයි? ලෝකයේ සමහර ප්‍රදේශ, සමහර රටවල් සහ සමහර සංස්කෘතීන් මේ වන විට ඝාතනය නැවැත්වීමටත් අනෙක්වා නැවී පෙනෙන අයුරින් එසේ නොකර සිටීමටත් පසුබිම් වන හේතු සාධක මොනවාද? නව්‍යකරණයේ හා විසරණයේ කවර ඓතිහාසික ක්‍රියාවලීන් ඝාතන ප්‍රතිපත්ති පිළිබඳ වර්තමාන ගෝලීය රටාවන්ට බලපා තිබේද? මෙකී අහිංසාවාදී විපර්යාකාරක උදාහරණ, නිර්ඝාත සමාජ විශ්වීය මට්ටමින් අනාගතයේ විකසිත කර ගැනීමේ ලා කවර මෙහෙයක් කරනු ඇතිද?

මරණ දඬුවම පූර්ණ වශයෙන් අහෝසි කර ඇති රටවල්වලට අමතරව තවත් රටවල් 14ක් සාමාන්‍ය අපරාධ සඳහා මරණ දඬුවම පැනවීම නවතා දමා ඇත. යුද්ධය හෝ යුධ නීතියට අදාළ විශේෂ අවස්ථාවලට පමණක් සීමා වන පරිදි පමණය මේ රටවල මරණ දඬුවම ක්‍රියාත්මක වන්නේ. (උදාහරණ : ආර්ජන්ටිනාව, බොස්නියා-හෙරේසගොවිනා, බ්‍රසීලය, ඊශ්‍රායලය, මෙක්සිකෝව). තවත් රාජ්‍ය විසි තුනක් මරණ දඬුවම නෛතික වශයෙන් බල ගන්වා තිබුණේ වුවද පසුගිය වසර දහයට හෝ ඊට වැඩි කාලයක් තිස්සේ කිසිවෙකුත් එමගින් ඝාතනය කොට නැත. (උදාහරණ: ඇල්බේනියා, බෲනෙයි, දරුසලාම්, කොන්ගෝව, පැපුවා නිව්ගිනියා, සෙනෙගාලය, ශ්‍රී ලංකාව, තුර්කිය, බටහිර සැමෝවා). ලෝකයේ රටවල් අනූ එකක් තුළ මරණ දඬුවම බලපැවැත්වෙනවා මෙන්ම, එය ප්‍රායෝගිකව භාවිතාවේ ද යෙදවේ. (උදාහරණ : චීනය, ඊජිප්තුව, ඉන්දියාව, ඉන්දුනීසියාව, ජපානය, නයිජීරියාව, පාකිස්ථානය, රුසියාව සහ අමෙරිකා එක්සත් ජනපදය). අමෙරිකාවේ මරණ දඬුවම ෆෙඩරල් රජය මට්ටමින් (ජාතික මට්ටමින්) බල පැවැත්වෙන්නේ මුත්, එහි ප්‍රාන්ත 50න් දොළහක් ද කොළොම්බියා දිස්ත්‍රික්කය එය තම ප්‍රදේශය තුළ අහෝසි කර ඇත. (ඇලස්කාව, හවායි, ඉයෝවා, මයිනෙ, මැසචුසෙට්ස්, මිචිගන්, මිනෙසෝටා, උතුරු ඩැකෝටාව, රෝඩ් දූපත, වර්මොන්ට්, බටහිර වර්ජිනියාව සහ විස්කොන්සින්).

මරණ දඬුවම ඉවත් කිරීම සහ නැවත පැනවීම අතර යම් දෝලනයක් දක්නට ලැබුනත් සිය ප්‍රචණ්ඩ සම්ප්‍රදායයන් අතික්‍රමණය කරමින්, දඬුවම් ඝාතනය අහෝසි කර දැමීම දෙසට ආණ්ඩු ගමන්

කරන්නා වූ ප්‍රවණතාවක් ගෝලීය වශයෙන් මතු වී දක්නට ලැබේ. මේ තත්වය නිසාකින්ම නිර්ඝාත සමාජ නිර්මාණය කිරීමේ හැකියාව පිළිබඳ අපගේ විශ්වාසය තර කරයි; රූසෝ ගේ 'සමාජ ගිවිසුම' තුළ පුරවැසියන් මැරීම අංගයක් වීම අවශ්‍ය නැත. මැක්ස් වේබර්ට ප්‍රතිපක්ෂව, ඝාතනය දේශපාලනයේ ජෛන්ද්‍රිය ලක්ෂණයක් වීමද අවශ්‍ය නැත.

මෙලෙසින්ම, 2001 වන විට, හමුදාවක් රහිතව පවතින රටවල් විසිහත ගැන මෙනෙහි කරන්න. කුක් දූපත්, නියූ, සහ වතිකානය හැරෙන්නට ඒවා සියල්ලම එක්සත් ජාතීන්ගේ සංගමයේ සාමාජික රටවල් වෙති.

මීට අමතරව සෝවර් රාජ්‍යයක් යටතේ, එහෙත් සාපේක්ෂ ස්වායත්ත භාවයක් භුක්ති විඳින භෞමික ප්‍රදේශ හෝ ප්‍රාන්ත අඩුතරමින් 18ක් ගිවිසුමක ආවරණය ලබමින් තම බල ප්‍රදේශ නිර්-හමුදාකරණය කොට ගෙන තිබේ. (උදාහරණ: පින්ලන්තයේ ඇලෙන්ඩ් දූපත්). ඇතැම් විට යම් ප්‍රදේශ (ඇන්ටාර්ටිකාව, මූන් ප්‍රදේශය වැනි) (Barbey 2001). 'නිර්-හමුදාකරණය' කිරීමට ජාත්‍යන්තර ගිවිසුම් ඇති වී තිබේ.

එමෙන්ම හමුදාවක් පවතින ඇතැම් රටක පවා, හෘදය සාක්ෂිය මත පදනම්ව හේවායනයට (අනිවාර්ය හමුදා සේවයට) විරෝධය පා ඊට නොබැඳී සිටීමට ඇති අයිතිය පිළිගන්නා තත්වය ලෝකයේ නිර්ඝාත දේශපාලන විභවයන් පිළිබඳ තවත් සාක්ෂියක් වෙයි. 1998 වන විට රටවල් 47 ක් හමුදා සේවය නිසා ඝාතනයේ යෙදීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කිසියම් හෝ නීතිමය ආකෘතියක් මගින් පිළිගෙන ඇත.

විවිධ රටවල්වල ඝාතනයේ යෙදීමට එරෙහිව හෘදය සාක්ෂියේ විරෝධය පිළි ගැනෙන්නා වූ නෛතික පදනම්, සරල ආගමික අවශ්‍යතාවක සිට වඩා පුලුල් වූ ආධ්‍යාත්මික, දර්ශනික, චර්යාධර්මීය, සදාචාරාත්මක, මානවධර්මීය හෝ දේශපාලන හේතූන් දක්වා වූ විශාල පරාසයක් තුළ විවිධ ස්වභාව දරයි. එමෙන්ම හමුදාව තුළ විකල්ප සේවාවන් හි නියුක්ත වීමට කෙනෙකුට ඇති අයිතිය, නැතහොත් දනට හමුදා සේවයේ ඉන්නා වූ සොල්දාදුවන්ට ඝාතන ක්‍රියාවන්ගෙන් බැහැර වීමට ඇති අයිතිය මෙන්ම, මෙකී නීති

**වගු අංක 3**

**හමුදා නොමැති රටවල් (27)**

| හමුදවක් නැත (19) | හමුදවක් නැත (ආරක්ෂක ගිවිසුමක් ඇත) |
| --- | --- |
| කොස්ටාරිකා | ඇන්ඩොරාව (ස්පාඤ්ඤය හා ප්‍රංශය සමග) |
| ඩොමිනිකා | කුක් දූපත් (නවසීලන්තය සමග) |
| ග්‍රෙනාඩා | අයිස්ලන්තය (නැටෝ, අමෙරිකාව සමග) |
| හයිති | මාෂල් දූපත් (අමෙරිකාව සමග) |
| කිරිබාති | මයික්‍රොනේසියාව (අමෙරිකාව සමග) |
| ලිච්ටෙන්ස්ටීනය | මොනාකෝ (ප්‍රංශය සමග) |
| 'මාල දිවයින | නිඋෟ(නවසීලන්තය සමග) |
| මොරිෂස් දූපත් | පැලාවු (අමෙරිකාව සමග) |
| නාඌරු | |
| පැනමාව | |
| සැන් කිට්ස් සහ නෙවිස් | |
| සැන් ලූෂියා | |
| සැන් වින්සන්ට් සහ ග්‍රෙනාඩිනය | |
| සැමෝවා | |
| සැන් මැරිනෝ | |
| සොලමන් දූපත් | |
| තුවාලු | |
| වැනු ඇතු | |
| වතිකානු රජය | |

මූලාශ්‍රය: **Barbey, 2001,**

ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමේ විශ්වාසනීයත්වයද සැහෙන පරාසයක් තුළ විචල්‍ය තත්වයක පවතී. (Moskos and Chambers, 1993). වඩාත් නිදහස්කාමී ලෙස නිර්ඝාත අයිතිය ව්‍යවස්ථා මට්ටමින් රැකදෙන අවස්ථාවක් නූතන රාජ්‍ය ඉතිහාසයේ දක්නට ලැබේ; ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ මූලික නීතියේ (1949), 4 වන වගන්තිය මෙසේය; සිය හෘදය සාක්ෂියට එරෙහිව ආයුධ සන්නද්ධ හමුද සේවයට බැඳීමට කිසිවෙකුටත් බල නොකෙරෙනු ඇත' (Kahlmann and Lippert, 1993: 98).

රාජ්‍ය ක්‍රමයන් තුළින් මරණ දඬුවම අහෝසි කිරීමේ උදහරණ, සහ හමුදව රහිතව රජයක් පවත්වා ගැනීමේ උදහරණ මෙන්ම හෘදය සාක්ෂිය මත පදනම්ව හමුද ඝාතකයන් ලෙස සේවයට බඳවා ගැනීමට විරුද්ධ වීමේ අයිතිය පිළිගැනීමේ උදහරණද අරබයා වූ

ප්‍රභවයන්, ක්‍රියාවලීන්, ගෝලීය රටාවන් සහ දේශපාලනික පිළිගැනීමට ඇති අවකාශ යනාදිය විද්‍යාත්මක කුතුහලය ජනනය කරන, අද්විතීය අධ්‍යයන වටිනාකමක් ඇති කරුණු වෙති.

**සමාජ ආයතන**

අනාගත නිර්සාත සමාජ සඳහා ගැලපෙන, හෝ ඒ වෙනුවෙන් වෙහෙසෙන ආයතනවලට කිට්ටුවෙන් තැබිය හැකි ආයතන විශේෂ ලෝකයේ නොයෙක් ප්‍රදේශවල බිහිවෙමින් පවතී. ඒවාද ඝාතනය සම්පූර්ණයෙන් පිටු දකීමට මනුෂ්‍යයා තුළ ඇති කැපවීම ගැන සාක්ෂි දරති. මෙලෙස විසිරී ඇති ආයතනික ශක්තීන් නිර්මාණශීලී ලෙස ඒකාබද්ධ කිරීමට හා අනුකලනය කිරීමට හැකි නම්, සහ දෙන ලද

**වගු අංක 4**

**හමුදා සේවයට එරෙහිව හෘදය සාක්ෂියේ විරෝධය පිළිගන්නා රටවල් සහ ප්‍රදේශ (47)**

ඕස්ට්‍රේලියාව
ඔස්ට්‍රියාව
අසයිර්බජානය
බෙල්ජියාව
බර්මුඩා
බ්‍රසීලය
බල්ගේරියාව
කැනඩාව
ක්‍රොඒෂියාව
සයිප්‍රසය (ග්‍රීක සයිප්‍රසය)
චෙක් සමූහාණ්ඩුව
ඩෙන්මාර්කය
එස්තෝනියාව
ෆින්ලන්තය
ප්‍රංශය
ජර්මනිය
ග්‍රීසිය
ගයනාව
හන්ගේරියාව
ඉතාලිය
කිර්ගිස්ථානය
ලැට්වියාව
ලිතුවේනියාව
මෝල්ටාව
මෝල්දෝවා සමූහාණ්ඩුව
නෙදර්ලන්තය
නෝර්වේ
පැරගුවේ
පෝලන්තය
පෘතුගාලය
රුමේනියාව
රුමේනියාව
ස්ලෝවැකියාව
ස්ලෝවේනියාව
දකුණු අප්‍රිකාව
ස්පාඤ්ඤය
සුරයිනාමය
ස්වීඩනය
ස්විට්සර්ලන්තය
යුක්රේනය
එක්සත් රාජධානිය
අමෙරිකා එක්සත් ජනපදය
උරුගුවේ
උස්බෙකිස්ථානය
යුගොස්ලෝවියාව
සිම්බාබ්වේ

මූලාශ්‍රය : **Horeman and Stolwijk, 1998**

එක් සමාජයක සංයුක්ත අවශ්‍යතාවන්ට සරිලන පරිදි ගලපා ගත හැකි නම් දැන්මම, හුදු උපන්‍යාසීය නිර්සාත තත්වයක් වශයෙන් නොව, සැබෑ මනුෂ්‍ය අත්දැකීමක් වශයෙන් එවැනි සමාජයක් අපට දක බලා ගන්නට තිබුණි. එවැනි ආයතනික රාශියකින් ස්වල්පයක් පිළිබඳව ඉතා සංක්ෂිප්ත සටහනක් මෙහි ලා දක්වේ. ඒ සෑම ආයතනයක් ගැනම විස්තරාත්මකව ඉදිරිපත් කළ යුතු කථාවක් තිබේ.

## ආධ්‍යාත්මික ආයතන

නිර්සාත දර්ශනයන් හෝ විශ්වාසයන් ඇසුරු කොටගෙන බිහි වූ ආගමික ආයතන ලෝකය පුරා දැකිය හැකිය. පෙරදිග ජෛන අනුගාමිකයෝ, අපරදිග ක්වේකර්වරු, ජපානයේ විශ්ව සාමයේ සහ සහෝදරත්වයේ සංගමය, ප්‍රංශයේ බෞද්ධ "ප්ලම් ගම්මානයේ ප්‍රජාව," අප්‍රිකාවේ සයිමන් කිම්බන්ගු දේවස්ථානය, රුසියාවේ සහ කැනඩාවේ දූක්බොබොර් (Spirit Wrestler) සාම වාදියෝ සහ ඇමෙරිකාවේ යුදෙව් සාම සාමාජිකත්වය ඒ අතර වෙති. 1919 දී පිහිටුවන ලද සමාදානකරණයේ ජාත්‍යන්තර සාමාජිකත්වය, සෑම ආගමිකම ස්ත්‍රීන් හා පුරුෂයන් ගෝලීය වශයෙන් ඒකරාශි කරයි; එහි පරමාර්ථය වන්නේ 'සාධාරණත්වය සම්පාදනය කිරීම උදෙසා ද ප්‍රජා ජීවිතය ප්‍රතිසංස්ථාපනය කිරීම උදෙසා ද ආදරයේ සහ සත්‍යයේ ශක්තිය මත විශ්වාසය තබන්නා වූ පදනම මත සිට, ජීවන ක්‍රමයක් ලෙසින් ද, පුද්ගලික, සාමාජීය, ආර්ථික සහ දේශපාලනික පරිවර්තන උදෙසා මාර්ගයක් ලෙසින් ද සක්‍රීය අහිංසාවාදයක් වෙනුවෙන් කැපවීමයි.'

## දේශපාලන ආයතන

රොනල්ඩ් මැලෝන්, ජොන් ලවර්සීඩ් ඇතුළු අනෙකුත් ක්‍රිස්තියානි සමවාදීන් සහ දෙවන ලෝක යුද්ධයට සහභාගී වූ සෙබළුන් පිරිසක් එක් වී 1955 වර්ෂයේ දී පිහිටුවා ගන්නා ලද බ්‍රිතාන්‍යයේ ෆෙලොෂිප් පක්ෂය අහිංසා ප්‍රතිපත්තියට මූලික වශයෙන් කැපවන මැතිවරණ දේශපාලන පක්ෂයකට පුරෝගාමී උදාහරණයක් වෙයි. ආර්ථික හා සමාජ සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටීමද, කලා සහ ක්‍රීඩා ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂයෙන් මැදිහත් වීමද එම පක්ෂයේ කාර්ය භාරයට අයිති යැයි සැලකෙන අතර, ප්‍රධාන කොටම සියළුම ආකාරයේ යුධ සූදානම් වීම්වලට එරෙහි මහජන ව්‍යාපාරයක්

සඳහා එය කැපවෙයි. 1979 වර්ෂයේ දී පෙට්රා කේලි ඇතුළු ක්‍රියාකාරීන් 30 දෙනෙක් එකතු වී ජර්මනියේ පිහිටුවා ගන්නා ලද හරිත පක්ෂය සිය පරිසර හිතකාමී දර්ශනයට අඩංගු අති මූලික වටිනාකමක් වශයෙන් 'අහිංසාව' පිළිගනියි. එම පක්ෂයේ බිහිවීමට අනුප්‍රාණය සැපයූ මූලාශ්‍ර අතර ගාන්ධි සහ මාටින් ලූතර් කිංග් (කණිෂ්ඨ) විසින් ජනිත කරන ලද අහිංසාවාදී ව්‍යාපාර ප්‍රධාන තැනක් ගන්නේය. (Kelly, 1989).

ලෝකය පුරා හරිතවාදී පක්ෂ පැන නැගෙමින්, එම ප්‍රතිපත්ති විසරණය වීමේදී යම් සංස්කරණයන්ට භාජනය විය හැකිය. ඒ නමුත් නව්‍යකාරක සමාජ ව්‍යාපාරයක් තුළින් බිහි වූ මැතිවරණ පක්ෂයක් වශයෙන් අහිංසා මූලධර්මය වෙත එය දක්වන ලද ආරම්භක කැපවීම ඉතා වැදගත් දේශපාලන පූර්වාදර්ශයක් ලෝක ප්‍රජාව වෙත ඉදිරිපත් කරයි. බ්‍රැඩ්ෆර්ඩ් ලයිට්ල්ගේ නායකත්වය යටතේ 1983 පිහිටුවන ලද එක්සත් ජනපදයේ සාමවාදී පක්ෂය සිය දර්ශනය සහ ප්‍රතිපත්ති සකස් කර ගෙන ඇත්තේ අධ්‍යාත්මික, විද්‍යාත්මක සහ මානවවාදී මූලධර්ම සමුච්චයක් පදනම් කොට ගෙනය. 1996 සහ 2000 වර්ෂවලදී ජනාධිපති අපේක්ෂකයා ලෙස බ්‍රැඩ්ෆර්ඩ් තරඟයට ඉදිරිපත් කළ එම පක්ෂය අමෙරිකානු සමාජයත් අමෙරිකාවේ ජාත්‍යන්තර භූමිකාවත් අහිංසාවාදී පරිවර්තනයකට භාජනය විය යුතුය' යන අදහස ජනතාව අතරට ගෙන යන්නට උත්සුක විය. ටී. කේ. එන්. උන්නිතාන්ගේ නායකත්වය සහිතව ක්‍රියාත්මක වූ පර්ෂදයක් විසින් බිහිකරන ලද ඉන්දියාවේ සර්වෝදය පක්ෂය මැතිවරණ වේදිකා පාවිච්චි කරන්නේ සියළු දෙනාගේ සුබ සිද්ධිය අරමුණු කරගත් සමාජ සංවර්ධන මාවතක් උදෙසා ගාන්ධි පෙන්වා දුන් අහිංසාවාදී දර්ශනය ඉදිරියට ගැනීම සඳහාය. දේශපාලනයෙන් දුරස්ව සිටීමේ ගාන්ධි පිළිවෙතින් තමන් බැහැර වීම ගැන සර්වෝදය පක්ෂය මෙසේ පැහැදිලි කරයි; "බලය, එහි ආරම්භක සවභාවයෙන් නිර්-පාක්ෂිකය. එය දූෂණකාරී බවට පත් වන්නේ දූෂිත මිනිසුන් අත සමණය." ලෝක මට්ටමින් ගත් කළ, 1987, ඉතාලියේ Partito Radicale පක්ෂය තුළින්, ගාන්ධියානු අහිංසාවාදයේ අනුප්‍රාණය හා ආවේෂය ලබමින් පාර-ජාතික රැඩිකල් පක්ෂය (Transnational Radical Party) උපත ලැබීය. එහි මූලික පරමාර්ථය වන්නේ එක්සත් ජාතීන්ගේ සංගමය වෙත අහිංසාවාදී දර්ශනයේ බලපෑමක් ජාත්‍යන්තර

මට්ටමින් ඇති කිරීම සඳහා කැපවීමයි. උදහරණ වශයෙන් ලෝක ව්‍යාප්ති වශයෙන් මරණ දඬුවම ඉවත් කිරීම, සාතනය ඇතුල් කර ගත් හමුදා සේවයට නොබැඳී සිටීමට ඇති අයිතිය පිළිගැනීම, යුධ අපරාධකරුවන් අධිකරණ ක්‍රියාවලීන් තුළට ගෙන ඒම යන අභිමතාර්ථ ගත හැකිය. එක්සත් ජාතීන්ගේ සංගමයේ සාමාජික රටවල් තම දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට එකක් අරමුදල් වශයෙන් ලබා දිය යුතු යැයි සිතන මේ පක්ෂය ජාතික මැතිවරණ සඳහා තරඟ නොකරයි. එහි සාමාජිකයන්ට වෙනත් මැතිවරණ පක්ෂයක සාමාජිකයෙක් වීමේ තහනමක් නැත. ගාන්ධිගේ පිළිරුව යට සිට මේ පක්ෂය ප්‍රකාශ කරන්නේ 'වඩා යහපත් ලොවක් තනා ගැනීම සඳහා ඇති වඩාත් කාර්යක්ෂම හා රැඩිකල් මාර්ග වන්නේ පාර-ජාතික නීතිය සහ අහිංසාවයි.'

## ආර්ථික ආයතන

අහිංසාවාදී මූලධර්ම පදනම් කොට ගෙන ක්‍රියාත්මක වන ආර්ථික ආයතන අතර ධනවාදී අන්‍යෝන්‍ය කොටස් අරමුදලක් ද වේ. (Pax World Fund). එය කවර හෝ යුධ කර්මාන්ත උදෙසා මුදල් ආයෝජනය කරන්නේ නැත; ගාන්ධිගේ සහ ලූතර් කිංග් ගේ අහිංසාවාදී දර්ශනය ගුරු කොට ගත් කම්කරු සංගමයකි -සීසර් චාවේස් සහ ඩොලරිස් හෙරුවා විසින් ආරම්භ කරන ලද United Farm Workers of America ; අහිංසාවාදී බෞද්ධ පිළිවෙත් ආශ්‍රය කොට ගෙන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පූර්ණවාදී ප්‍රජා සංවර්ධන ව්‍යාපාරයකි. ඒ. ටී. ආරියරත්න විසින් නායකත්වය දෙනු ලබන සර්වෝදය ශ්‍රමදාන සංගමය; මේ ආකාරයේ ආයතන රාශියක් අතර, ඉඩම් අහිමි ජනයාට ඉඩම් ලබා දීම අරමුණු කොට ගෙන ඉන්දියාවේ ක්‍රියාත්මක වූ භූදාන් ව්‍යාපාරය සඳහන් කරනු වටී. විනෝබා භාවේ (1994) සහ ජයප්‍රකාශ් නාරායන් (1978) විසින් නායකත්වය දෙනු ලැබූ මෙම ව්‍යාපාරය ගාන්ධිගේ 'භාරකාරීත්වය' පිළිබඳ ආර්ථික න්‍යායෙන් ආවේශය ලබා ඇත. මෙම ව්‍යාපාරයේ සාර්ථකත්වය සීමාසහිත වුවත්, සීමිත සම්පත් අහිංසාවාදී ලෙස බෙදා හදා ගැනීම කළ හැකිය' යන විශ්වාසය එමගින් තහවුරු කරන ලදී. ලෝකයේ ව්‍යාප්තව ඇති පරාර්ථකාමී පදනම් (Philanthropic Foundations) සමාජයට අහිංසාවාදී සේවාවන් ප්‍රදානය කරමින් එම මූලධර්මය නගා සිටුවති; ලන්ඩනයේ ගාන්ධි පදනම, බැංගලෝරයේ සර්වෝදය ජාත්‍යන්තර භාරකාර

පදනම, නිව්යෝක් නගරයේ ඒ. ජේ. මුස්තේ ආයතනය උදහරණ කිහිපයකි. ගාන්ධියානු සම්ප්‍රදයය තුළින් මතු වූ ප්‍රබල අධ්‍යාපනඥයෙකු වූ ආචාර්ය ජී. රාමචන්ද්‍රන් (1903-1995) විශේෂ ආකාරයේ විශ්ව විද්‍යාලයයක් ලෙස සැලකෙන තමිල් නාඩුවේ ගාන්ධිග්‍රාම ග්‍රාමීය ආයතන (Gandhigram Rural Institute) පිහිටු වීය. මේ වනාහි මනුෂ්‍ය අවශ්‍යතාවන් සපුරනු වස් අහිංසා දර්ශනය සහ එය පෝෂණය කරන්නා වූ බහුආගමික මූලාශ්‍ර ආශ්‍රය භූමි කොට ගෙන සම්පූර්ණ විශ්ව විද්‍යාලයයක්ම ගොඩ නැගීමට හැකි බව පෙන්වන සංනිදර්ශනයකි. මේ ආයතනය, අවට ප්‍රදේශයේ විශාල ගම්මාන තිහකට සෘජුවම නම සේවාවන් සපයයි. ගාන්ධි ග්‍රාම විශ්ව විද්‍යාලයේ ප්‍රාරම්භක ලක්ෂණ අතරː

1) විෂය-මූලික අධ්‍යාපනය ප්‍රජා-මූලික භාවිතය සමග ඒකාබද්ධ කිරීම උදහරණ ː දේශපාලන විද්‍යාව සහ ග්‍රාමීය තීරණ ක්‍රියාවලීන්, ජීව විද්‍යාව සහ සෞඛ්‍ය ආරක්ෂණය, කලාව සහ නිර්මාණශීලී ළමා විය සංවර්ධනය ආදී වශයෙන්

2) සෑම උපාධි අපේක්ෂකයෙක්ම ගැටළු විසඳීමේ පර්යේෂණ නිබන්ධයක් සම්පාදනය කිරීම

3) ත්‍රෛභාෂික ප්‍රවීණත්වය; දෙමළ භාෂාව ප්‍රජා අවශ්‍යතා සඳහා, හින්දි භාෂාව ජාතික අනුකලන අවශ්‍යතා සඳහා, ඉංග්‍රීසි භාෂාව ලෝකයට දෙරටුවක් ලෙස

4) විශ්ව විද්‍යාලයේ මණ්ඩපවල සම්පත් කළමනාකරණය සහ සේවා, විශේෂ කාර්ය මණ්ඩලයක ආධාර රහිතව ශිෂ්‍ය-ශිෂ්‍යාවන් ගේ ශ්‍රම දයකත්වය මගින් ම පවත්වා ගෙන යෑම.

මෙහි ලා රාමචන්ද්‍රන්ගේ තවත් විශේෂ දයකත්වයක් වන්නේ හමුද පුහුණුවට අහිංසාවාදී විකල්පයක් මෙම උසස් අධ්‍යාපන ආයතනය තුළින් නිර්මාණය කොට පෙන්වීමයි. ශාන්ති සේනා නම් වූ මෙම අහිංසාවාදී සාම බලමුළුවේ ප්‍රධාන සංවිධායකයා වූයේ මානව ශාස්ත්‍ර අධ්‍යයන ක්ෂේත්‍රයේ ප්‍රකට විද්වතෙක් වූ මහාචාර්ය එන්. රාධක්‍රිෂ්නන්ය. (1992:1997) 'සාමය සඳහා ක්‍රියාත්මක වීමටත්, අවශ්‍ය වුවහොත් මාගේ ජීවිතය ඒ සඳහා කැප කිරීමටත්' සූදනම් යැයි ප්‍රතිඥා දුන් ස්වේච්ඡා පදනමින් පුහුණුව ලබා ප්‍රවීණයන් වූ තරුණ

තරුණියන් 5000ක් 1958 සිට 1988 කාලය තුළ ශාන්ති සේනා ව්‍යාපාරය විසින් සමාජයට ලබා දෙන ලදී. අධ්‍යාත්මික, කායික, බුද්ධිමය සහ සංවිධානමය ක්ෂේත්‍ර හරහා යන අනුකලනාත්මක පුහුණුවක් ලබා ගන්නා ශාන්ති සේනා ක්‍රියාකාරිකයෝ, ගැටුම් සමථකරණය, ආරක්ෂණ සේවා සැලසීම, ස්වභාවික විපත් අවස්ථාවලදී සහන සාධනය, සහ ප්‍රජා අවශ්‍යතාවන් ඉටු කර ගැනීම සඳහා සමූපාකාර ප්‍රජා සේවා වැඩසටහන් හා ව්‍යාපෘති ගොඩ නැගීම යනාදිය ඉලක්ක කොට ගෙන සූදනම් වෙති. ශාන්ති සේනා ක්‍රියාකාරීත්වයේ මූලික ප්‍රවේශයක් වන්නේ ප්‍රජා සංවර්ධනය සඳහා සැම විටම ගැමි ජනතාව සමග එකට වැඩ කිරීමය. 1970 දශකයේ මැද භාගයේදී ඉන්දියාවේ ඇතැම් නාගරික විශ්ව විද්‍යාල, මර්දන ආයතන ලෙස බැණ අඩ ගැසීමට පාත්‍ර වෙමින් ගිනි බෝම්බ ප්‍රහාරයන්ට ලක් වෙද්දී, ගාන්ධිග්‍රාම් ප්‍රදේශයේ ගම්මානවල වැසියෝ සිය ග්‍රාමීය ආයතනය රජය විසින් විශේෂ විශ්ව විද්‍යාලයයක් (Deemed University) ලෙස පිළිගැනීම නිමිත්තෙන් මහා උත්සව පැවැත් වූහ. විශ්ව විද්‍යාලවල ආරක්ෂාව තියුණු ප්‍රශ්ණයක්ව පවතිද්දී, මෙම නව විශ්ව විද්‍යාලයේ ආරක්ෂාව ශාන්ති සේනා ක්‍රියාකාරිහු නිල වශයෙන් භාර ගත්හ. නේරු, ඉන්දිරා ගාන්ධි යන අගමැතිවරුන් සහ වෙනත් ප්‍රභූවරුන් විශ්ව විද්‍යාලයයට යම් අවස්ථාවක පැමිණි විටකදී පවා කිසිදු සන්නද්ධ පොලිස් නිලධාරියෙක් හෝ ආරක්ෂකයෙක් එය තුළට වැද්ද නොගන්නා ලදී.

## පුහුණු ආයතන

සමාජ විපර්යාසය, ගැටුම් අඩවි තුළට මැදිහත් වීම, සමාජ ආරක්ෂාව සහ වෙනත් සමාජමය අවශ්‍යතා සඳහා අහිංසාවාදී එළඹුමක් සහිත පුහුණුවක් ලබා දෙන ආයතන වේගයෙන් බිහි වෙමින් තිබේ. ප්‍රවීණ පුහුණුකරුවෝ වනාහි, රටවල් තුළද දේශ සීමා හරහා ද විශාල ඉල්ලුමකට පාත්‍ර වෙමින් සිටිති. මේ කරුණ ද, නැවත වරක්, ගැටුම් නිරාකරණය කිරීමේලා ප්‍රචණ්ඩ මාර්ග වෙනුවට අහිංසාවේදී ක්‍රමවේද ආදේශ කිරීමට මිනිසාට හැකිය' යන විශ්වාසය ශක්තිමත් කරයි. මීට අදාළ සංවිධාන කිහිපයක් සහ ඒවාට අනුබද්ධ ප්‍රකට පුහුණුකරුවන් කිහිප දෙනෙක් පමණක් පහත සඳහන් වේ. (Beer, 1994): ජී. රාමචන්ද්‍රන් අහිංසාවාදී පාසල - G. Ramachandran School of Nonviolence (එන්. රාධක්‍රිෂ්නන්), ජාත්‍යන්තර සාම හමුදාව -Peace

Brigades International (නාරායන් දේසායි), ලාගෝ සහ සහකරුවන් සමග සම්බන්ධිත අහිංසාවාදය සඳහා වූ ෆ්ලොරිඩා හි මාටින් ලූතර් කිං (කණිෂ්ඨ) ආයතනය - Florida Martin Luther King, Jr.Institute for Nonviolence with Lafayette & Associates (බර්නාඩ් ලාගෝ, කණිෂ්ඨ, චාල්ස් එල්. ඇල්ෆින්, ජ්‍යෙෂ්ඨ සහ ඩේවිඩ් ජෙන්සන්), සමාදානකරණය පිළිබඳ ජාත්‍යන්තර සාමාජික සභාව - International Fellowship of Reconciliation (හිල්ඩෙගාඩ් ගොස් මයිර් සහ රිචඩ් ඩීට්ස්), පුහුණු මධ්‍යස්ථාන වැඩමුළුව - Training Centre Workshops (ජෝර්ජ් ලැකේ), යුධ ප්‍රතිරෝධකයන්ගේ ජාත්‍යන්තරය - War Resisters International (හවාඩ් ක්ලාක්), අහිංසා අධ්‍යයන සඳහා පලස්තීන මධ්‍යස්ථානය - Palestinian Centre for the Study of Nonviolenc (මුබරක් අවාඩ්), අහිංසාවාදී ජාත්‍යන්තරය - Nonviolence International (මයිකල් බියර්) සාමය සහ සාධාරණත්වය සඳහා වූ සේවාව (Servicio Paz Justicia) (ඇඩොල්ෆො පෙරස් එස්ක්විවල්), මැදිහත් කාරක බෞද්ධයන්ගේ ජාත්‍යන්තර ජාලය - International Network of Engaged Buddhists (යෙෂුවා මොසර් - පුන්ග්සුවාන්), සහ ට්‍රාන්සෙන්ඩ් - Transcend (ජොහාන් ගල්තුං).

අහිංසාවාදී පුද්ගලභාව විකාශයනය සහ පුද්ගලික ආරක්ෂාව අරමුණු කොට ගත් පුහුණුවක් සඳහා වැදගත් මූලාශ්‍රයක් ලෙස ජපානයේ බිහි වූ අයිකිඩෝ නම් සටන් කලාව සැලකිය හැකිය. මේ වූ කලී අහිංසාවාදී සමාජ විපර්යාසයන් දෙසට උපාය මාර්ගිකව යොමු වන්නා වූ සැබෑ ගම්‍යමානයක් සහිත නිර්මාණශීලී සංස්කෘතික භාවිතාවකි. එහි නිර්මාතෘ මොරිහෙයි උයෙෂිබා උගන්වන පරිදි "බිඳීම, කුඩාල කිරීම, විනාශ කිරීම යනු මනුෂ්‍යයෙකු විසින් කළ හැකි ලොකුම පාපයයි." අයිකිඩෝ කලාවේ අභිමතාර්ථය වන්නේ විශ්වයේ ජීව ප්‍රාණය සමග සහානුනාද වීමයි. "අයිකිඩෝ යනු ආදරය විද්‍යාමාන වීමකි." (Stevens 1987:94, 112;Yoder 1983:28).

**ආරක්ෂක ආයතන**

ලෝකය පුරා වූ ආයතන කිහිපයක්, හිර් - මාරක ක්‍රම විධීන් ඔස්සේ ප්‍රජා ආරක්ෂාව සැපයීමට ඇති ශක්‍යතාව ගැන සංනිදර්ශන වෙති. අදළ රටවල් අතර සම්පූර්ණයෙන් පාහේ අසන්නද්ධ පුරවැසියන් වෙසෙන ඒවා ඇත. (ජපානය). සම්පූර්ණයෙන් පාහේ ගිනි අවි

නොදරන පොලිසියක් ක්‍රියාත්මක වන රටවල් (බ්‍රිතාන්‍යය), සන්නද්ධ ආරක්ෂකයින් නොමැති සිරගෙවල් දැකිය හැකි රටවල් (පින්ලන්තය), අවිමුක්ත සාම කලාප ඇති රටවල් (Sitio Cantomanyog- (පිලිපීනය), අසන්නද්ධ පුරවැසි ආරක්ෂක සංවිධාන ඇති රටවල් - Bund for Soziale Verteridigung, Minden, Germany) මෙන්ම යුධ කලාප තුළ සමථකාරී මැදිහත් වීම් කරන අහිංසාවාදී සංවිධාන ඇති රටවල් ද ගණනාවක් ඇත. (Moser-Puangsuwan and Weber 2000; Mahony and Egureu 1997). අවි මුක්ත ලෝකයක් නිර්මාණය කිරීම සඳහා පුරවැසි සංවිධාන හා ඇතැම් විට ආණ්ඩු විසින් දියත් කරන විවිධාකාර ව්‍යාපාර ද මේ ලයිස්තුවට ඇතුළත් විය යුතුය. න්‍යෂ්ටික අවි, ජීවවිද්‍යාත්මක අවි සහ රසායනික අවි අහෝසි කිරීම සඳහාද අත් තුවක්කු, බිම් බෝම්බ, ප්‍රහාරක අවි යනාදිය තහනම් කිරීම සඳහා ද ලෝකය පුරා ක්‍රියාත්මක වන ව්‍යාපාර ඇත. කොස්ටා රිකාහි ජනාධිපති ධූරය දැරූ, ගැටුම් සමථනය සහ නිර්-හමුදාකරණය උදෙසා 1987, නොබෙල් සාම ත්‍යාගයෙන් සම්මානනීය වූ ඔස්කාර් අරියාස් සාන්චේස් විසින් ආරම්භ කරනු ලැබූ සාමය සහ සමාදානකරනය සඳහා වූ මධ්‍යස්ථානය -Centre for Peace and Reconiliation ඉන් එකකි. වහල් වෙළඳමට විරුද්ධව ක්‍රියාත්මක වූ ව්‍යාපාරයේ අත්දැකීම්වලින් පන්නරය ලබන ආයුධ වෙළෙඳම අහෝසි කිරීම සඳහා වූ ව්‍යාපාරය ද මෙහිලා සිහිකළ හැකිය; වඳ වී යන සත්ව කොට්ඨාශයක් ලෙස සලකා මනුෂ්‍යවර්ගයා බේරාගත යුතු යැයි කියන, රෙනාල්ඩෝ පාචෙකෝ සහ හේඩී යොරාක් පිලිපිනයේ පිහිටුවන ලද Nature Gunless Society නම් සංවිධානය ද එම අරමුණම සහිත ධෛර්යවන්ත සංවිධානයකි. (Villavincensio - Paurom, 1995).

**පර්යේෂණ ආයතන**

අපරදිග; ජීනෝ ෂාප් විසින් පිහිටුවන ලද ඇල්බට් අයින්ස්ටයින් ආයතනය (The Albert Einstein Institute, Cambridge, Massachusetts), ප්‍රජාතන්ත්‍රවාදය, ආරක්ෂාව සහ සාධාරණත්වය අරමුණු කරගත් ලොව පුරා අහිංසාවාදී අරගල පිළිබඳ පර්යේෂණවල නිරත වෙයි. පෙරදිග; ජයප්‍රකාශ් නාරායන් විසින් පිහිටුවන ලද ගාන්ධියානු අධ්‍යයන ආයතනය (*The Gandhian Institute of Studies, Varanasi, India*) අහිංසාවාදී සමාජ පරිවර්තනයන්ට අධාරවන සමාජ විද්‍යාත්මක

පර්යේෂණවල නිරත වෙයි. පාර-ජාතික මට්ටමේදී, තියඩෝර් හර්මන් විසින් පිහිටුවන ලද ජාත්‍යන්තර සාම පර්යේෂණ සංගමයේ අහිංසාවාදී කොමිසම (Non-violence Commision of the International Peace Research Association) , පර්යේෂණ සොයා ගැනීම්, අධ්‍යාපනය සහ ක්‍රියාමාර්ග ලෝක ව්‍යාප්ත වශයෙන් බෙදහදා ගැනීමට පිටුබලය ලබා දෙයි.

## ගැටළු-විසඳීමේ ආයතන

අහිංසාවාදී මූලධර්ම මත සිට ගැටළු නිරාකරණය කිරීම සඳහා මැදිහත් වන ආයතන අතර ජාත්‍යන්තර ක්ෂමා ආයතනය (Amnesty International; මානව හිමිකම් රැකීම සහ මරණ දඬුවම අහෝසි කිරීම), ජාත්‍යන්තර හරිත-සාම ආයතනය (Greenpeace Internationl; පරිසර සංරක්ෂණය සහ න්‍යෂ්ටික අවිහරණය), ජාත්‍යන්තර යුධ ප්‍රතිරෝධක ආයතනය, (War Resisters International; යුධ සූදානම්වලට එරෙහිව ප්‍රතිරෝධය පෑම, සහ හමුදාවට බඳවා ගැනීමට එරෙහි හෘදය සාක්ෂියේ විරෝධය බල ගැන්වීම), යුධ පෙරමුණුවල වෛද්‍ය සේවා ආයතනය (Medicins sans Frontieries) ප්‍රචණ්ඩත්වයට ගොදුරුවූවන්ට මානුෂික පදනමින් වෛද්‍ය ආධාර සැපයීම) යනාදිය සඳහන් කළ හැකිය.

## ජන සන්නිවේදන මාධ්‍ය

පුරෝගාමී පුවත්පත් කලාවේදියෙකු වන කෝල්මන් මැකාර්ති (1994) විසින් ගොඩ නගන ලද ප්‍රකාශණ ඇතුළු ප්‍රකාශන රාශියක්ම අහිංසාවාදී පර්යාලෝකයක සිට ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර තත්වයන් පිළිබඳව තොරතුරු සපයන්නා වූ විග්‍රහ කරන්නා වූද, සංනිවේදන මාධ්‍යයන්ගේ භව්‍යතාවය තහවුරු කරති. මෙම ප්‍රකාශණ අතර, බ්‍රිතාන්‍යයේ සාමවාදී සාමාජිකත්ව පක්ෂයේ මාසික තොරතුරු සංග්‍රහය වන Day by Day; බැංකොක් හි මැදිහත් කාරක බෞද්ධයින්ගේ Seeds of Peace; ලන්ඩන් හි ප්‍රකාශයට පත්වන ජාත්‍යන්තර ප්‍රකාශණයක් වන Peace News: for Nonviolent Revolution: මොන්ටාගිස් හි ප්‍රකාශයට පත් වන ප්‍රංශ මාසික ප්‍රකාශණය Non-violence Actualite; ඉතාලියේ වෙරෝනාවේ එළි දකින Azione Nonviolenta: ජර්මනියේ ඔල්ඩන්බර්ග් හි වාර්ක සඟරාව Graswurtzelrevolution; සහ අමෙරිකානු

සඟරා වන Fellowship (Nyack N.Y.) සහ Nonviolent Activist (New York) යනාදිය ඉන් කිහිපයක් පමණි. ඒ අතර, Social Alternatives (Brisbane, Australia), Gandhi Marg (New Delhi) සහ International Journal of Nonviolence වැනි ශාස්ත්‍රීය සඟරා විවිධ සමාජ කරුණු පිළිබඳ ප්‍රබල අහිංසාවාදී බුද්ධිමය දායකත්වයක් පළ කරයි. Navajivan (Ahmedabad, India), New Society Publishers (Blaine, Washinton), Non-violence Actualite (Montargris, France) සහ Orbis Books (Maryknoll, New York) යනාදී ප්‍රකාශණ ආයතන අහිංසාවාදී සමාජ පරිවර්තනයට දායක වන පොත්පත් පළ කිරීමට එකලාව කැපව සිටිති.

## සංස්කෘතික සම්පත්

අහිංසාවාදී සංස්කෘතික සම්පත් වනාහි මනුෂ්‍යයා අධ්‍යාත්මික වශයෙන් ඉහළට ඔසවමින්, නිර්ඝාත සමාජයක් කරා ගමන් කිරීම සඳහා අනුප්‍රාණය සහ ප්‍රඥාව ලබා දෙන්නා වූ කලාවේ සහ බුද්ධියේ නිර්මාණයෝ වෙති. නූතන කලා ක්ෂේත්‍රය දෙස බලද්දී, පෙර නොවූ විරූ අයුරින් මේ සම්පත් වර්ධනය වන බව පෙනී යයි. මෙකී සුවිශේෂ අධ්‍යාත්මික බුද්ධිමය ලක්ෂණ දරන්නා වූ නූතන ජන ගී (We shall Overcome), ඔපෙරා ("Satyagraha," Philip Glass), නවකථා (Lay down Your Arms", Bertha von Suttner), කාව්‍ය නිර්මාණ (Johnny's Song, Steve Mason), දෘශ්‍ය කලා (Seed for the planting must not be ground, Kathe Kollwitz) , සහ චිත්‍රපට (Gandhi, Richard Allenborough) සම්භාරයක් අප අතර දැනටමත් ඇත. 1995 මල්ලිකා සරබායි විසින් ඉන්දියාවේ අහ්මදබාද් නගරයේ ආරම්භ කරන ලද The Centre for Nonviolence Through the Arts, යන අහිංසාවාදී කලා ආයතනය දෘශ්‍ය, ප්‍රසාංගික සහ සාහිත්‍ය කලා මාධ්‍යයන් ඔස්සේ සමාජ පරිවර්තනය උදෙසා 'නිර්ඝාත සහක්‍රියා ශක්තියක්' උත්පාදනය කිරීමට කැපව සිටී.

## අහිංසාවාදී දේශපාලන අරගල

ඉතිහාසයේ මෙය අළුත් දෙයක් නොවුවත්, විසිවන සියවසේ දෙවන භාගයේ සිදු වූ අහිංසාවාදී දේශපාලන අරගල, නිර්ඝාත මනුෂ්‍ය විභවය ඉහළින්ම නියෝජනය කරයි. "අහිංසාවාදී දේශපාලන මාර්ගය-හෙවත් ජනතා බලය- ලෝකය පුරා දේශපාලන ගමන් මග හැඩගස්වන ප්‍රධානතම බලවේගයක් වශයෙන් නව දශකයක් ඇතුලත පිළි ගැනීමට ලක් වෙතැයි, 1980 තරම් මෑතදී පවා බොහෝ

දෙනෙකුට අනුමාන කිරීමට පවා නොහැකි විය.'' යනුවෙන් ජීන් ෂාප් නිරීක්ෂණය කරයි. ඔහු සඳහන් කරන පරිදි 1970-1989 දක්වා ලෝකය පුරා අඩු තරමින් යට කියැවෙන ස්ථානවල අහිංසාවාදී අරගල ක්‍රියාදාම දියත් විය; අප්‍රිකාවේ -ඇල්ජීරියාව, මොරොක්කෝව, දකුණු අප්‍රිකාව, සහ සුඩානය; ආසියාවේ - බුරුමය, චීනය, ඉන්දියාව, ජපානය, දකුණු කොරියාව, පකිස්ථානය, පිලිපීනය සහ තිබ්බතය; අමෙරිකාවේ - ආර්ජන්ටිනාව, බොලිවියාව, බ්‍රසීලය, චිලිරට, හයිති, මෙක්සිකෝව, නිකරුගුවාව, පැනමාව සහ අමෙරිකා එක්සත් ජනපදය; යුරෝපයේ - එස්තෝනියාව, ප්‍රංශය, නැගෙනහිර-බටහිර ජර්මනිය, හංගේරියාව, අයර්ලන්තය, ලැට්වියාව, සහ යුගොස්ලොවියාව; මැද පෙරදිග-පලස්තීනය (ඊශ්‍රායලය විසින් පාලනය කරන ප්‍රදේශ), සහ පැසිපික් කලාපය - ඕස්ට්‍රේලියාව සහ නව කැලිඩෝනියාව. පැරණි සෝවියට් දේශයේ, නැගෙනහිර යුරෝපයේ, බෝල්ටික් සමූහාණ්ඩුවල සහ මොන්ගෝලියාවේ පැවති ඒක පාක්ෂික කොමියුනිස්ට් පාලනය, 1989 පසු පැන නැගී අහිංසාවාදී ජන බල ක්‍රියාකාරීත්වය මගින් නාටකීය ආකාරයෙන් අවසන් කොට දැමිනි. එමගින් ජර්මනිය සාමකාමී ලෙස නැවත ඒකාබද්ධ විය. දකුණු අප්‍රිකාවේ වර්ණභේද වාදී පාලනය ද ඒ ආකාරයටම අහෝසි වී ගියේය.

සෑම අහිංසාවාදී ජන අරගලයක්ම පූර්ණ වශයෙන් ප්‍රචණ්ඩත්වයෙන් තොරවී යැයි කිව නොහැකි නමුත්, එමෙන්ම බුරුමයේ (1988) සහ චීනයේ (1989) සිදු වූවාක් මෙන් ඇතැම් අරගල කෲර මර්දන ක්‍රියාමාර්ග මගින් යටපත් කරන ලද්දේ වී නමුත් ඒවා අමෙරිකානු, ප්‍රංශ, රුසියානු, චීන සහ අනෙකුත් ප්‍රචණ්ඩ විප්ලවයන්ගේ ලේ වැකි සම්ප්‍රදායයෙන් කැපී පෙනෙන අයුරින් වෙනස් වන්නාහ. ලෝක යටත්-විජිත ක්‍රමය බිඳවැටීමට දායක වූ ඉන්දියාවේ ගාන්ධියානු නිදහස් ව්‍යාපාරය, ඇමෙරිකාවේ කළු ජනයාගේ සිවිල් අයිතිවාසිකම් සඳහා වූ කිංගියානු ව්‍යාපාරය, පිලිපීනයේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ අහිංසාවාදී ජන බල ව්‍යාපාරය, න්‍යෂ්ටික යුධ විරෝධී ව්‍යාපාරය, පරිසර සංරක්ෂණ අහිංසාවාදී ක්‍රියාමාර්ග සහ වෙනත් අත්දැකීම් ක්‍රම ක්‍රමයෙන් බලගතු අහිංසාවාදී උපාය උපක්‍රම සහ ශිල්ප ක්‍රම පරාසයක් මෙන්ම උචිත නව සංනිවේදන තාක්ෂණ ක්‍රම සහ වෙනත් ඉහළ තාක්ෂණ භාවිතාවන් සමුදායක්

භාවිතාව හරහා මතු කරමින් තිබේ. ඊට සමාන්තරව, ඇතැම් පාලන තන්ත්‍රයන්, සාමය, නිදහස සහ සාධාරණත්වය ඉල්ලා ඉදිරියට එන අහිංසාවාදී ව්‍යාපාර ඉදිරියේ නිර්-මාරක ප්‍රතිචාර දක්වීමට නැඹුරු වීමද වඩ වඩා පෙනෙන්නට තිබේ.

පාලන තන්ත්‍රයන් පරිවර්තනය කිරීමට සහ සමාජ-දේශපාලන ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කිරීමට ශක්‍යතාවක් පෙන්වන පුළුල් අරගලවලට අමතරව තිර්සාර සමාජයක ලක්ෂණ මතු කර ගැනීම උදෙසා සමාජයක් තුළ කිසියම් නිශ්චිත වෙනසක් කිරීම අරමුණු කොට ගෙන ක්‍රියාත්මක වන්නා වූ සමාජ ව්‍යාපාර රාශියකි; මරණ දඬුවම අහෝසි කිරීම, ගබ්සාවට විකල්ප නිර්මාණය කිරීම, හමුදා සේවයට නොබැඳීමට ඇති අයිතිය පිළිගැනීම, හමුදා අහෝසි කිරීම, අහිංසාවාදී පුරවැසි ආරක්ෂක ක්‍රම නිර්මාණය කිරීම, නාගරික හා ග්‍රාමීය සන්නද්ධ ගැටුම් ප්‍රදේශවල අහිංසාවාදී ආරක්ෂක ක්‍රම නිර්මාණය කිරීම, යුධ බඳු අහෝසි කිරීම, න්‍යෂ්ටික, ජීව විද්‍යාත්මක සහ රසායනික අවිහරණය, බිම්බෝම්බ, ස්වයංක්‍රීය ගිනි අවි, සහ අත් තුවක්කු තහනම් කිරීම, මාරකත්වය සඳහා ආර්ථික පිටුබලය අවසන් කිරීම, පුද්ගලයන්ගේ, සුළුතර ජනතාවන්ගේ, ස්වදේශික/ආදිවාසී ජනතාවන්ගේ මානව හිමිකම් සුරැකීම, පරිසර මංකොල්ලය නැවැත්වීම සහ පරිසර සංරක්ෂණය, මෙන්ම වෙනත් සුවිශේෂ දේශපාලන, හමුදමය, ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අරමුණු සාක්ෂාත් කර ගැනීම යනාදී ඉලක්ක අරමුණු කොට ගෙන ඒවා ක්‍රියාත්මක වෙති.

අහිංසාවාදී ජන අරගල ක්‍රියාදාමයන්, 20 ශත වර්ෂය අගභාගය වන විට, මුල් කාලීන ඓතිහාසික ස්වයංසිද්ධීය අදියරෙන් ඔබ්බට වර්ධනය වෙමින් පවතින බව ඉතා පැහැදිලිව හඳුනාගත හැකිය. ජීන් ෂාප්(1993), ජොහාන් ගල්තුං (1992:1996), ජැකස් සෙමලින් (1993), මයිකල් රැන්ඩ්ල් (1994) ඇතුළු විශිෂ්ට විද්වතුන් පරම්පරාවක පුරෝගාමී පර්යේෂණ හා ගවේෂණවලින් ශක්තිය ලබමින් ඒවා අභ්‍යන්තර සවිඥානකත්වයක් ඇති කර ගැනීම හරහා වඩාත් විධිමත්ව සකස් වෙමින් ද වඩාත් නිර්මාණශීලී වෙමින් ද පවතී. තවද, ජගත් සංනිවේදන ජාලයන්ගේ පිටුබලය ඔස්සේ වඩ වඩා ලෝක ව්‍යාප්ති තත්වයට පත්වෙමින් ද තිබේ. ගෝලීයකරණ යුගයේ නොනවත්වා සිදුවන ලේ වැගිරීම් මධ්‍යයේ, රාජ්‍ය සහ සමාජ

ප්‍රචණ්ඩත්වයට මෙන්ම ඊට පදනම් වන අසාධාරණත්වයට ද අභියෝග කරමින් වඩ වඩා ත්වරණාත්මකව, අහිංසාවාදී ව්‍යාපාර ලොව පුරා මතුවෙමින් පැතිරෙන්නේ නව්‍යකරණය, මෙන්ම එහි ප්‍රතිපක්ෂය වන අනුකරණය ද ආධාර කොට ගෙනය. (Powers and Vogele, 1997; Zunes, Kurtz and Asher 1999; Ackerman and Du Vall 2000).

**ඓතිහාසික මූලයෝ**

මනුෂ්‍යයාගේ නිර්ඝාත ශක්‍යතා පිළිබඳව කඳු මුදුන් වැනි සුවිශේෂී විද්‍යාමාන වීම් මනුෂ්‍ය ඉතිහාසය විසින් අප වෙත පිරී තමා සිටී. විශේෂයෙන්ම දරුණු ප්‍රචණ්ඩත්වයෙන් ගහණ යුගවලදී මේවා නිරීක්ෂණයට හසු කිරීම වඩාත් පහසුය. ලෝකය පුරා දැකිය හැකි මේ ආකාර නිර්ඝාත විද්‍යාමානවීම් සමාහරණයට ලක් කෙරෙන විට මනුෂ්‍යයාගේ නිර්ඝාත ඉතිහාසයක් ගොඩ නගා ගැනීම අපට කළ හැකි වන්නේය. එහි අඩංගු විය හැකි සංරචක ගැන දැනටම වුව හැඟීමක් ඇති කර ගැනීමට අපට පිළිවන.

නිර්ඝාත සමාජයක් පිළිබඳ මනුෂ්‍යයා තුළ ඇති විශ්වාසය සහ කැපවීම යටපත් කළ නොහැකිය. අවුරුදු දෙදහසක් ඉක්මවා යන යුදෙව් - ක්‍රිස්තියානි ඉතිහාසය පුරා එහි ලිඛිත සහ වාච්‍ය සම්ප්‍රදයයන් තුළ, "නුඹ විසින් ඝාතනය නොකළ යුතුය" යන සයවන පණත (Exod 20:13), කන්ද උඩ දේශනාව (Matt 5-7) මෙන්ම කුරුසිය මත ක්‍රිස්තුන් පෙන් වූ ආදර්ශය යනාදිය සුරැකී පවත්තා තුරු, මර්දනය සහ මරණය අබියස දී පවා, නුගත් ගැමියන් ගේ සිට වරප්‍රසාදිත ප්‍රභූන් දක්වා වූ ඇතැම් පුද්ගලයෙක් විසින් පෙන්වනු ලබන මාරකත්වයට එරෙහි ධෛර්යමත් ප්‍රතිරෝධය තුළ මනුෂ්‍ය නිර්ඝාත විභවය නැවත නැවත දිදුලමින් ඉදිරි මග ආලෝකමත් කරනු ඇත. (Brock 1968; 1970; 1972; 19919; 19916; 1992). සාමවාදී දුක්බොබොර් ගැමියන් හත් දහසක් ඒකාබද්ධ වී 1895 ජුනි 29ද, රුසියාවේ ස්ථාන තුනකදී මාරක අවි ගිනි තැබීමේ සිද්ධිය එබඳු මහඟු මොහොතකි. මේ නිසා දරුණු මර්දනයකට ලක් වූ දුක්බෝබොර් වරුන්ගෙන් 7500ක් දෙනා, ඉන් අනතුරුව තොල්ස්තොයිගේ ආධාරය සහිතව 1899 වසරේදී කැනඩාවට සංක්‍රමණය වූහ. (Tarasoff 1995:8-9). අනෙකුත් සංස්කෘතික සම්ප්‍රදයයන් තුළද නිර්ඝාත ක්‍රියාකාරීත්වයේ ඓතිහාසික මූලයන් සාද ගත හැකිය. මෙලෙස බෞද්ධ සම්ප්‍රදයයන් තුළ මෙන්ම (Horigan 1996; Paige and Gilliat 1991); ඉස්ලාම් (Banerjee

*2000*; *Crow 1990*; *Easwaran 1999*; *Kristainy 1990*; Paige, Sathanand and Gilliatt 1993 a, Satha-Anand 1990; Tayyebulla 1959); සහ යුදෙව් (Schwarzchild, n.d, Polner and Goodman 1994; Wilcock 1994) සම්ප්‍රදායයන් තුළද ප්‍රබල උදාහරණ දුලබ නැත.

මොස්කොස් සහ චේම්බර්ස් (1993) නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් තුළ හෘදය සාක්ෂිය පදනම් කොට ගෙන හමුදා සේවයට එරෙහි වීමේ තත්වය පිළිබඳව කරන ලද තුලනාත්මක අධ්‍යයනයක් මගින් තවදුරටත් පෙන්වා දෙන පරිදි කල්ලිවාදී හේතූන් නිසා නොව, මානුෂික සහ දේශපාලන හේතූන් නිසාම යුධ ඝාතනය පුරවැසියන් විසින් ප්‍රතික්ෂේප කිරීම එහි ප්‍රධාන ධාරාව වෙමින් තිබේ. ඒ අතර, නිර්ඝාත දර්ශනයේ ලෝකායත ප්‍රවේශයන්ගේ වර්ධනයක් ද සිදුවනු පෙනේ. මිනිසෙකු විසින් මිනිසෙකු ඝාතනය කිරීම ප්‍රතික්ෂේප කරනු වස් මෙලෙස ආධ්‍යාත්මික සහ ලෝකායත පදනම් ද ප්‍රතිපත්තිමය සහ ප්‍රායෝජ්‍යතාවාදී ප්‍රවේශයන් ද එකට සම්මිශ්‍රණය වෙමින් තිබේ.

තවත් වැදගත් ඓතිහාසික නිරීක්ෂණයක් වන්නේ සාමාන්‍යයෙන් ප්‍රචණ්ඩ සම්ප්‍රදායයන් තුළ හැදී වැඩුනු ඇතැම් පාලකයින් සහ දේශපාලන නායකයින් පවා, බෙහෙවින් පුදුමාකාර ලෙස, නිර්ව්‍යාජ සහ බොහෝ විට මරණයට අභියෝග කරන්නා වූ නිර්ඝාත කැපවීම් ඉදිරියේ හිස නමනු දක්නට ලැබීමයි. ප්‍රසියාවේ පළවෙනි ෆ්‍රෙඩ්රික් රජු 1713 දී බලහත්කාරී හමුදා බඳවා ගැනීමෙන් සාමවාදී මෙනොනයිට්වරුන් නිදහස් කර හැරීම එබඳු එක් සිද්ධියකි. මෙනොනයිට්වරුන්ට එබඳුම නිදහසක් රුසියාවේ දෙවෙනි කැතරින් රැජිනද (1763), දෙවෙනි ඇලෙක්සැන්ඩර් රජුද (1875) විසින් ප්‍රදානය කරන ලදී. 1919 දී ලෙනින්, තෝල්ස්තෝයිගේ සහකාරයෙක් වූ වී.ජී.චෙර්ත්කොව්ගේ ආයාචනයට සහ බොල්ෂෙවික් නායකයෙක් වූ වී.සී. බොන්ච්-බෘයෙවිච් ගේ උපදේශයන් වලද කන් දී තෝල්ස්තොයානු සාමවාදීන් මෙන්ම වෙනත් ආගමික සාමවාදී ප්‍රජාවන් ද අනිවාර්ය රතු හමුදා සේවයෙන් නිදහස් කර හැරියේය. බොල්ෂෙවික්වරුන්ගේ මුල්ම තාන්ත්‍රික තීරණවලින් එකක් වූයේ හමුදාව තුළ මරණ දඬුවම අහෝසි කිරීමට ගත් තීරණයයි. මෙම ප්‍රතිපදාව ක්‍රියාත්මක වූයේ කෙටි කාලයක් තුළ නමුත්, ඉතා වටිනා නිර්ඝාත ප්‍රවේශයක් ලෙස එහි ඓතිහාසික වටිනාකම ඉන් අඩු වන්නේ නැත. ජෙරොම් ඩී. ෆ්‍රෑන්ක් පවසන්නේ, නායකයින් සහ අධිකාරිය අනුගමනය කිරීමට

සාමාන්‍ය ජනයා දක්වන නැඹුරුතාවය සැලකිල්ලට ගන්නා විට, නායකයින්ගේ චර්යාව ප්‍රථම කොට වෙනස් කිරීම සාමය සාක්ෂාත් කර ගැනීම උදෙසා ඉතාම ඵලදායී දයකත්වයක් විය හැකි බවයි. එහෙත් ඇතැම් විට නායකයින් පෙරමුණ ගන්නා විට අනුගාමිකයින් පසුගාමී විය හැකිය. බටහිර ප්‍රජාතන්ත්‍රවාදී රටවල මරණ දඬුවම අහෝසි කිරීම පිළිබඳව අධ්‍යයනයක් කරන සිම්රින්ගේ සහ හෝකින්ස් මෙසේ කියති;

> *"ප්‍රජාතන්ත්‍රවාදී රටවල මරණ දණ්ඩනය සැමවිටම පාහේ අහෝසි කරනු ලැබුවේ බහුතර ජනතාවගේ විරෝධතාවය මධ්‍යයේය. ඇමෙරිකා එක්සත් ජනපදය හැරෙන්නට අනෙකුත් සෑම බටහිර ප්‍රජාතන්ත්‍රවාදී රටකම මරණ දඬුවම මේ වන විට නවතා දමා ඇත. එහෙත් එම ප්‍රතිපත්තිය නීතිගත කරන අවස්ථාවේ, එම පියවරට අනුබල දෙන ප්‍රජාතන්ත්‍රවාදී සම්මුතියකට ජනතාව එළඹි අවස්ථාවක් ගැන එකී කිසිදු රටකින් වාර්තා නොවේ. මෙලෙස, ඇතැම් විටක දීර්ඝ කාලයක් තිස්සේ ඊට විරුද්ධ මහජන මතයක් දක්නට ලැබුනේ වුවද, එම ප්‍රතිපදාව සාර්ථකව ඉදිරියට ගොස් ඇත."* (Zimring and Hawkins, 1986:XVI).

කෙසේ නමුත් නිර්ඝාත සමාජ වෙනසක් සඳහා දේශපාලන නායකත්වයේ වැදගත්කම සටහන් කිරීම (Paige 1977;Burns, 1978) මගින් වැඩෙමින් පවතින අහිංසාවාදී බහුජන බලයේ තීරණාත්මක ශක්තිය අවතක්සේරු කිරීමට ලක් නොවිය යුතුය.

තෙවන ඓතිහාසික නිරීක්ෂණය නම් නිර්ඝාත සමාජයක් සඳහා වන කැපවීම, රීතියක් වශයෙන්, අනෙකුත් පීඩාවන් තුරන් කිරීමත්, ජීව-රක්නා පරිවර්තනයක් සමාජය තුළට ඇතුල් කිරීමත් අරමුණු කරගත් ව්‍යායාමයන් සමග එකට අත්වැල් බැඳ සිටීමයි. නිර්ඝාත ප්‍රතිපදාව වනාහි අනවධානය නැතහොත් උදාසීනත්වය හෝ අක්‍රිය බව හෝ ජනනය නොකරයි. උදාහරණ වශයෙන් ජෛන "අහිංසා" ප්‍රතිපදාව මනුෂ්‍ය ජීවිතය පමණක් නොව, සිව්පාවුන්, කුරුල්ලන් සහ වෙනත් ජීවී විශේෂයන් ද රැකගැනීම සඳහා අනුබල දෙයි. (Tobias, 1991). එලෙසම, පුළුල් ව්‍යුහාත්මක පරිවර්තනයන් අත්පත් කර ගැනීම උදෙසා නිර්ඝාත ප්‍රතිපදාව ක්‍රියාත්මක විය හැකි අන්දම ගැන උසස් නිදර්ශනයක් ඉන්දියාවේ ගාන්ධි ව්‍යාපාරය විසින් ලබා දී ඇත. මෙම අහිංසාවාදී ව්‍යාපාරය දේශපාලන නිදහස පමණක් නොව, විශේෂයෙන්ම සමාජයේ දුගීන්, ස්ත්‍රීන්, සුළුතර ජනතාවන් පහළ කුල ජනතාවන් ඇතුළු පීඩිත ජනයාගේ ජීවිතය යහපත් කරනු

උදෙසා ද අන්තර්-වාර්ගික සාමය උදෙසා ද, ආර්ථික, සමාජ, සහ සංස්කෘතික විපර්යාසයන් සමුච්චයක් ඉලක්ක කරගෙන ක්‍රියාත්මක විය. එලෙසම අමෙරිකාවේ කිංගියානු ව්‍යාපාරයට, වාර්ගික සමානාත්මතාවය සහ නිදහස අරමුණු කර ගෙන ඉදිරියට යද්දී, දරිද්‍රතාවයේ සිට යුද්ධය දක්වා සාධක නිර්ණය කරන්නා වූ අමෙරිකානු සමාජයේ ව්‍යුහයන් සහ ආයතනික සම්ප්‍රදායයන් තුළ වූ ගැටළු ඉවත් කිරීම සඳහා කැප වෙන්නට සිදුවිය.

ප්‍රචණ්ඩත්වය සංලක්ෂණය කර ගන්නා වූ නූතන ජාතික රාජ්‍යයන්ගේ ඉතිහාසය තුළ පවා නිර්ඝාතන ශක්‍යතාවන් මතු වූ ආකාරය ගැන සාක්ෂි පෙන්වා දිය හැකිය. අමෙරිකා එක්සත් ජනපදය උදාහරණයකි. මෙකී ඉතිහාසයේ ආධිපත්‍යධාරී ප්‍රචණ්ඩ සම්ප්‍රදායයට සාපේක්ෂව ගත් කළ එහි අහිංසාවාදී විකල්පයන් අසම්පූර්ණ ලෙසත් දුබල ලෙසත් ප්‍රකාශයට පත් වූ හෙයින්, දේශපාලන විද්‍යාර්ථීන් විශාල වශයෙන් එකී නිර්ඝාත මූලයන් ගැන නොදැන සිටීම වටහා ගත හැකි කරුණකි. එහෙත් පුරෝගාමී අධ්‍යයනයන් සරණියක් විසින් ඒවායේ නිසැක ඓතිහාසිකත්වය හොඳින් තහවුරු කර තිබේ. (Brock 1968; Coney and Michalowski 1987; Hawkley and Juhnke 1993; Kapar 1992; Kohn 1987; Lynd and Lynd 1995; Association of American Historians 1994; Schlissel 1968; True 1995; Zinn 1990).

## අමෙරිකා එක්සත් ජනපදයේ නිර්ඝාත ජීවය

අමෙරිකා එක්සත් ජනපදය බිහි වෙද්දී එම නිර්මාණ ක්‍රියාවලිය තුළ පැහැදිලි නිර්ඝාත ශක්තියක් අඩංගු විය. එය ආරම්භ වූයේ ස්වදේශික ජනතාවන් සමග ද සාමවාදී සංක්‍රමණිකයන් සමග ද සාමකාමී සම්බන්ධතා ස්ථාපනය කර ගනිමිනි. උදාහරණ ලෙස, පෙන්සිල්වේනියානු හමුදා-රහිත කොළණියේ විසූ සාමවාදී ක්වේකර්වරු, ඩෙලවෙයා ඉන්දියානු ගෝත්‍රිකයන් සමග වසර හැත්තෑවක් තරම් දීර්ඝ කාලයක් තිස්සේ (1682-1756) සාමයෙන් සහ සහජීවනයෙන් යුතුව ජීවත් වූහ. මේ කාලය තුළ මෙම ප්‍රජාවන් දෙක අතර, මිත්‍ර සන්ථවය උදෙසා එකිනෙකාට දොරවල් හැර තැබීමටත්, සතුරු උපද්‍රව පිළිබඳ ආරංචි ගැන අන්‍යෝන්‍ය උපදේශනය ලබා ගැනීමටත් ප්‍රතිඥා දෙන ගිවිසුමක් බල පැවැත්විය. (Brock 1990: 87-91). පූර්ව-විප්ලවීය අමෙරිකානු කොළණි දහතුනෙන් දෙළහකම නීතිය තුළ' ආගමික-හෘදය සාක්ෂ්‍යමය හේතුන් නිසා

හමුද සේවයේ දී ඝාතනයෙන් බැහැර වීමට ඇති අයිතිය පිළිගන්නා වූ නෛතික ප්‍රතිපාදන අඩංගු වී තිබිණ. මේ අතරින් වඩාත්ම නිදහස් තත්වයක් පෙන් වූ රෝඩ් දූපතේ නීතිය (1673), "ඝාතනයට, ඒ සඳහා එකතු වීමට, සන්නද්ධ වීමට සහ පුහුණු වීමට" තම විශ්වාසයයන් නිසා කිසියම් කෙනෙක් විරුද්ධ වන්නේ ද, එම පුද්ගලයින් හමුදායනයෙන් නිදහස් කරන ලද අතර, තවද ඔවුන් කිසිදු දඬයකට සිරගත කිරීමකට, අඩම්තේට්ටම් කිරීමකට හෝ වෙනත් කවරාකාරයේ දඬුවමකට යටත් නොකළ යුතු යයි ද පැනවීය. (Kohn 1987:8).

නැගී එන ජාතියේ නෛතික කතිකාවත් තුළ නිර්ඝාත ප්‍රතිපදව පැහැදිලිව දක්නට තිබිණි. 1775 මහද්වීපික සම්මේලනය (Continental Congress) විසින් මුල් වටයේ සම්මත කරන ලද ව්‍යවස්ථාපිත නීතියක් මගින් නිර්ඝාත ආගමික හෘදය සාක්ෂියට එරෙහිව "ප්‍රචණ්ඩත්වය නොයෙදීමේ" ප්‍රතිඥාවක් ලබා දුන්නේය. (Kohn 1987:10,13). අයිතීන් පිළිබඳ පරිච්ඡේදය ව්‍යවස්ථාවට එකතු කිරීම උදෙසා 1789 ඇති වූ සම්භාෂණය තුළදී ජේම්ස් මැඩිසන් නම් නියෝජිතයා, සියළුම පුරවැසියන්ට ඝාතනය ප්‍රතික්ෂේප කිරීමට ඇති අයිතිය සහතික කරන්නා වූ ප්‍රතිපාදනයක් එහි දෙවන වගන්තියට එකතු කිරීමට යෝජනා කර සිටියේය; එහිලා "ආගමික හේතූන් නිසා ආයුධ දැරීම ප්‍රතික්ෂේප කරන කවර පුද්ගලයෙක් හෝ වේවා හමුද සේවය සඳහා බලහත්කාරයෙන් බඳවා ගනු නොලැබේ" යනුවෙන් ද සහතිකයක් විය. (Kohn 1987:11). මැඩිසන්ගේ යෝජනාව නියෝජිත සභාව විසින් සම්මත කරන ලදී. එය ප්‍රතික්ෂේප වූයේ ප්‍රාන්ත බලය පුර්කීම් සඳහා වූ සෙනෙට් සභික කමිටුවක් විසිනි. මෙකී කමිටුව ප්‍රාන්ත ආරක්ෂක ආයතනවලට උඩින් ෆෙඩරල් පාලනය ක්‍රියාත්මක වීමේ අනතුර අවධාරණය කිරීම හරහා යට කී ආස්ථානයට එළඹුනි.

අමෙරිකානු විප්ලවයේදී (1775-1783) විවිධ වාර්ගික සහ ආගමික පසුබිම් සහිත කොළඹීකරුවෝ ඝාතනය ප්‍රතික්ෂේප කරනු නිතර දක්නට ලැබිණ. එවැනි සිද්ධීන් අනෙක් පසින් ද වාර්තා විය. තෝමස් වොට්සන් නමැති බ්‍රිතාන්‍ය හමුද භටයා සිය ක්‍රිස්තියානි අගැයුම් නිසා ඝාතනය ප්‍රතික්ෂේප කළ අතර, පසුව මැස්චුසේට් හි ප්‍රකට "ක්වේකර් ජෝෂ්ඨයෙක්" බවට පත් විය. (Brock 1968: 280-87). බොස්ටනය බ්‍රිතාන්‍ය හමුද විසින් වැටලීම නිසා, දීර්ඝ කාලීන (1774-

1776) සංවෘත තත්වයකට කොටු වී අසරණ වූ ජනතාවට සහ සරණාගතයින්ට තමන් විසින් මානුෂික ආධාර ලබා දීමට, ප්‍රතිරෝධය පාමින් සිටින වොෂින්ටන් සහ හෝවේ යන ජනරාල්වරුන් එකඟ කරවා ගැනීමට, බ්‍රිතාන්‍ය සාමවාදී ක්වේකර්වරුන්ට හැකි විය. (Brock 1968: 193-94). මෙහිදී අනතුරු සහ දුෂ්කරතා මැද්දේ වුව නිර්සාන හෘදය සාක්ෂිය පිළිගෙන ඊට ගෞරවය දක්වන ලදී.

නිදහස අහිංසාවාදී අරගලයක් මගින් දිනා ගැනීමේ විකල්පය එවකට ද අවිත්‍යා දෙයක් නොවීය. (Conser, etal, 1986). "විප්ලවවාදී යුද්ධයේ නපුර" (Evils of the Revolutionary war, 1839) නම් ග්‍රන්ථයේ කර්තෘ චාල්ස් කේ. විප්ල් විග්‍රහ කරන පරිදි 'අපි ආයුධ නොගත්තමෝ නම්, මේ තරම්ම විශ්වාසනීයත්වයෙන් යුතුව, මේ තරම් ම වේගයෙන්, එමෙන්ම වඩා ගෞරවාන්විත තත්වයෙන් සහ නිසැකින්ම වඩා වාසිදායක කොන්දේසි යටතේ නිදහස දිනා ගන්නට තිබිණ.' එය සඳහා ඔහු දුටු මාර්ගය කුමක්ද?:(1) අසාධාරණ ඉල්ලා සිටීම් ස්ථාවර ලෙසත් පූර්ණ ලෙසත් ප්‍රතික්ෂේප කිරීම, (2) දුක් ගැනවිලි ගැන මහජන ප්‍රකාශන සම්පාදනය කිරීම සහ එම ගැටළු වහා විසඳන ලෙස බල කර සිටීම,(3) මහජන ප්‍රතිරෝධයට එරෙහිව යටත් කිරීම සඳහා එල්ල කෙරෙන ප්‍රචණ්ඩත්වය ඉවසා දරා සිටීම" යනාදී වශයෙනි. අහිංසාවාදී අරගලයේ ගතිකයන් පිළිබඳව විප්ල් ගේ විග්‍රහය, පසුකාලීන ගාන්ධි චින්තනයේ සෑම වැදගත් මූලිකාංගයක්ම පාහේ කළල ස්වරූපයෙන් අන්තර්ගත කර ගනී. (Gene Sharp 1973). අහිංසාවාදී විප්ලවයේ වාසි පිළිබඳ ගණනයක යෙදෙන විප්ල් නිදහස වෙනුවෙන් එසේ නම් වන්දිය වශයෙන් නැති වන්නට තිබුණේ සාපේක්ෂව ඉතා අඩු ජීවිත ප්‍රමාණයක් යැයි පෙන්වා දෙයි. (සමහර විට නායක මට්ටමේ පුද්ගලයින් 1000ක් සහ පුරවැසි ගැහැණු-පිරිමි 10,000කට අඩු සංඛ්‍යාවක්; වර්ෂ අටක් තිස්සේ දිග් ගැස්සුණු ආයුධ සන්නද්ධ අරගලය හේතුවෙන් 100,000කට වැඩි ගැහැනුන් පිරිමින් සහ ළමුන් සංඛ්‍යාවකගේ ජීවිත විනාශ විය); යුද්ධයට ආර්ථික වශයෙන් ගිය වියදම (ඩොලර් මිලියන 135ක්) මෙන්ම ඉන් අනතුරුව ක්‍රියාත්මක වූ හමුදාකරණය (ඩොලර් මිලියන 300ක්) එසේ නම් වලක්වා ගැනීමට තිබිණ; නව ජාතියේ අධ්‍යාත්මික සහ සදාචාරීය පදනම් එසේ නම් අසමාන ලෙස ඉහළ මට්ටමකින් ස්ථාපනය වන්නට තිබිණ. තවද, අහිංසාවාදී අමෙරිකානු

විප්ලවවාදීන් වහල් ක්‍රමය ක්ෂණිකවම අහෝසි කර දමන්නට තිබිණ. තවද ඔවුන් "මේ රටේ ස්වදේශික ජනතාවන්ගේ ජීවිත වංචාවෙන් ගසා කා, දූෂණය කර ඔවුන් සංහාරයට ලක් කිරීමට පියවර නොගන්නට තිබිණ. 'එමෙන්ම සිය පාලන ක්‍රමයේ ඓන්ද්‍රිය අංගයක් වශයෙන් මරණ දඬුවම ඇතුළු ආයතනගත ප්‍රචණ්ඩත්වය සහ පළි ගැනීමේ සම්ප්‍රදායය තහවුරු කර නොගන්නට තිබිණ." (10).

සිවිල් යුද්ධයට පෙර නිර්සාන ජීවය හොඳින් විද්‍යාමානව තිබුණි. අනේක දුක් පීඩාවන් භාර ගනිමින් දේශප්‍රේමීහු එංගලන්තය (1812) සහ මෙක්සිකෝව (1845) සමග වූ යුද්ධ සමයන් හිදී සාමය සඳහා ද, ස්ත්‍රී අයිතීන් දිනා ගැනීම සඳහා ද විශේෂයෙන්ම වහල් ක්‍රමය අහෝසි කරනු සඳහා ද මහත් කැපවීමෙන් ක්‍රියා කළහ. ඔවුන්තතර පිරිමින් මෙන්ම ගැහැණුන් ද, සුදු ජාතිකයන් මෙන්ම කළු ජාතිකයන්ද, ආගමිකයන් මෙන්ම අනාගමිකයන්ද වූහ. (Cooney and Michalowski 1987: 20-33; Lynd and Lynd 1955:13-41); අහිංසාවාදී වහල් විරෝධීහු උතුරු කලාපයේ ව්‍යවස්ථාකරණයන් තුළට වහල් ක්‍රමය කටු ගා දමන, මිනිස් නිදහස තහවුරු කරන නීති අණ පනත් ආවලියක් ඇතුල් කරන්නට සමත් වූහ. ඒ අතර, දේශසීමාවේ සහ දකුණේ ජනපදවල, ජෝන් වුල්මන් (1720-72) වැනි ක්වේකර් නායකයෙකුගේ අනාගතවාදී විමුක්තිදායී ශ්‍රමය මල්ඵල ගන්වමින්, ආධ්‍යාත්මික හෝ ආර්ථික සාධක පෙරදුරිකරගෙන, ඇතැම් වහල් ස්වාමීහු සිය වහලුන් නිදහස් කර හරින්නට තරම් පරිවර්තනය වූහ. නිර්සාන විමුක්ති මාර්ගය මේ අනුව අචින්ත්‍ය වූයේ නැත. තථ්‍ය වශයෙන් නම්, කැනඩාව මෙන් මව් රට සමග කිසියම් ආකාරයක හෝ ගණුදෙනුවක් පවත්වා ගන්නට අමෙරිකාවට හැකි වී නම් සම්පූර්ණයෙන්ම සාමකාමී ලෙස වහල් ක්‍රමය අහෝසි කරන්නට එයට හැකි වන්නට තිබුණි. මන්ද යත්, 1777 දී බ්‍රිතාන්‍යය නීත්‍යානුකූලව සිය වහල් ක්‍රමය අවසන් කළේය. 1807 දී වහල් වෙළෙඳම තහනම් කෙරුණි; 1833 වන විට මුළු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය පුරාම වහලුන් තබා ගැනීම තහනම් වී තිබිණ.

සිවිල් යුද්ධ සමයේදී (1861-65), වධයට, සිරගත වීමට, මරණ දණ්ඩනයට සහ ඝාතනයට යුධ විරෝධීන් ලක්වීමේ අත්දැකීම් ඉදිරියේ සහසන්ධියතායේ Confederacy (1862) සහ සංගමයේ -Union (1864) නීති කෙටුම්පත් තුළට ඝාතනයට සහභාගි වීමට එරෙහිව හෘදය සාක්ෂියේ

විරෝධය පිළි ගත්තා වූ ප්‍රතිපාදන ඇතුල් කෙරිනි. නීති ක්‍රියාත්මක වීමේ ආකාරය, විශේෂයෙන් පහළ ශ්‍රේණීන් සම්බන්ධයෙන්, සංගත නොවූවත් සංගමයේ නායකයා ඒබ්‍රහම් ලින්කන් ද, යුධ ලේකම් එඩ්වින් ස්ටැන්ටන් ද, සහසන්ධියනයේ නියෝජ්‍ය යුධ ලේකම් ජෝන් ජී. කැම්බල් ද විසින් හමුදාවෙන් ඉවත් වීමට හා ඊට නොබැඳී සිටීමට අවසර ඉල්ලා කරන ලද පෞද්ගලික ආයාචනා කාරුණිකව සලකා බලන ලදී. (Moskos and Chambers, 1993; 30-1). යුද්ධයේ වෙනස් වන වඩදිය-බාදිය තරංග මැද්දේ ටෙනසීහි නිර්ඝාත "ක්‍රිස්තු අනුගාමිකයෝ" (Tennessee Disciples of Christ) සහසන්ධියනයේ එවකට නායකයා වූ ජෙෆර්සන් ඩේවිස් සහ සංගමයේ හමුදා පාලන ප්‍රදේශවල ආණ්ඩුකාරයා, ඇන්ඩෲ ජොන්සන් වෙත පෙත්සමක් ඉදිරිපත් කරමින් හමුදාවට බලෙන් බඳවා ගනු ලැබීමෙන් තමන් නිදහස් කරන මෙන් ඉල්ලා සිටියහ. මේ වූ කලී සාර්ථක ප්‍රතිඵල නිර්ඝාත ප්‍රජාවන්ට අත් කර දුන් ප්‍රථම ඉල්ලීම විය. (Brock 1968; 842-3). මෙලෙස සොයුරු-ඝාතක සිවිල් යුද්ධය මධ්‍යයේ පවා නිර්ඝාත හෘදය සාක්ෂිය නැවත නැවත තහවුරු කරන ලද අතර, එය යුද්ධයේ දෙපාර්ශවය විසින්ම විවිධ මට්ටම්වලින් පිළිගනු ලැබින.

නිර්ඝාත ජන විඥාණය කාර්මීකරණ සහ අධිරාජ්‍යවාදී ව්‍යාප්ති යුගයේද, ඉන් අනතුරුව 20 ශතවර්ෂයේ ලෝක යුද්ධ තුනක් හරහා සහ ඉන් ඔබ්බෙන්ද නොනැසී ජීවමානව පැවැත්තේය. පාලකයින්ගේ, පොලිසියේ සහ රාජ්‍යයේ ප්‍රචණ්ඩ ප්‍රතිචාර මගින් සහ ඇතැම් විට කම්කරුවන්ගේම ප්‍රචණ්ඩ ක්‍රියාවන් නිසා යම් ආකාර අඳුරු අවස්ථා දක්නට ලැබුනේ වී නමුත්, අමෙරිකානු ශ්‍රමික ජනතාවගේ සංවිධානය වීමේ අයිතිය ඇතුළු මූලික කම්කරු අයිතීන් ලබා ගැනීම සහ ජීවන සාධක යහපත් කර ගැනීම උදෙසා වූ අරගලය මූලික වශයෙන්ම අහිංසාවාදී එකක් විය. එය කිසිදු ආකාරයකින් ආයුධ සන්නද්ධ කම්කරු විප්ලවයක් නොවීය. ස්ත්‍රීන්ගේ සමාන අයිතීන් සඳහා වූ ව්‍යාපාරය එලෙසින්ම අහිංසාවාදී එකක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1916 දී මොන්ටානා හි රිපබ්ලිකන් වාදී අපේක්ෂිකාවක් වූ ජෙනට් රැන්කින් ප්‍රථම කාන්තා නියෝජිතවරිය ලෙස කොංග්‍රස් සභාවට තේරී පත් වූවාය. (Josephson 1974). 1917 දී ඇය, පිරිමි නියෝජිතවරුන් 49 දෙනෙක් සහ සෙනෙට් සභිකයන් 6 දෙනෙක් සමග, 1 වන ලෝක යුද්ධයට අමෙරිකා එක්සත් ජනපදය ඇතුල් වීමට එරෙහිව ඡන්දය

ප්‍රකාශ කළාය. 1940 දී ඇය කොංග්‍රස් නියෝජිතවරියක් ලෙස නැවත තේරී පත්ව සිටි අවස්ථාවේ දෙවන ලෝක යුද්ධයට අමෙරිකාව සම්බන්ධ වීමට එරෙහිව තනියම නැගී සිටිමින් සිය ඡන්දය විරුද්ධව ප්‍රකාශ කළාය. පසු කාලයක, ඇය 88 වන වියේ පසු වෙද්දී, වියට්නාමයේ අමෙරිකානු ජන ඝාතක යුද්ධය අවසන් කිරීම සඳහා උද්ඝෝෂණ ව්‍යාපාරයකට නායකත්වය දෙමින්, ස්ත්‍රීන් 5000 ක් "ජෙනට් රැන්කින් බල ඇණිය" ද කැටුව වොෂින්ටන් නුවර වෙත පාද යාත්‍රාවක යෙදුනාය.

පළවෙනි ලෝක යුද්ධයේදී හමුදාවට බලෙන් බඳවා ගනු ලැබූ 4000 ක් පමණ අමෙරිකානුවෝ ඝාතනයේ යෙදීම ප්‍රතික්ෂේප කළහ. මෙයින් 1300 ක් දෙනා සටන් ක්‍රියාන්විතයෙන් බැහැර, මූලික වශයෙන් හමුදා රෝහල්වල සේවයට එකඟ වූහ. තවත් 1500 ක් කෘෂිකර්ම කටයුතු වලට යවන ලදි. 940 දෙනෙක් හමුදා පුහුණු මධ්‍යස්ථානවල සේවය සඳහා යොමු කරන ලදි. ඒ අතර අතියම් ආකාරයෙන් හෝ ඝාතන ක්‍රියාකාරීත්වයට සම්බන්ධ වීම ප්‍රතික්ෂේප කළ 450 දෙනෙක් යුධ අධිකරණය වෙත පමුණුවනු ලදුව, වරදකරුවන් කරනු ලැබ හමුදා සිරකඳවුරු තුළ රඳවනු ලැබූහ. දරුණු වධ හිංසාවෙන් සහ රෝගවලින් බැට කෑ ඔවුන් තරින් දහහත් දෙනෙක් එහිදී මරුමුවට පත් වූහ. (Moskos and Chambers 1993: 34-5; Kohn 1987: 42; Lynd and Lynd 1995: 91-117; Schlissel 1968: 128-175).

දෙවන ලෝක යුද්ධ සමයේ හමුදායනයේදී (1940-1947) පුද්ගලයින් 72,354 දෙනෙක් හෘදය සාක්ෂිය පදනම් කොටගෙන ඝාතන ක්‍රියාවන්ට සම්බන්ධ වීම ප්‍රතික්ෂේප කළහ. ඉන් 25,000 දෙනෙක් සටන් පෙරමුණෙන් බැහැර සේවාවන්ට සම්බන්ධ වූහ. ආගමික කුලක 213 කට අයත් පුද්ගලයින් 11,996 දෙනෙක් සිවිල් මහජන සේවා කඳවුරුවල සේවය කරන්නට එකඟ වූහ. (උප ග්‍රන්ථ D); යුද්ධ ව්‍යාපාරයට කවර ආකාරයේ හෝ සහයෝගයක් ලබා දීම ප්‍රතික්ෂේප කළ පුද්ගලයින් 6,086 ක් දෙනෙක් සිරගත කරනු ලැබූහ. මෙසේ සිර දඬුවමට ලක් වූ පිරිසෙන් හතරෙන් තුනක් අය "ජෙහෝවා ගේ සාක්ෂිකරුවෝ" නම් ආගමික පර්ෂදයට අයත්ව සිටියේය. (Anderson 1994 : 1-2; Moskos and Chambers 1993:37-8; Coonly and Michalowski 1987: 94-5; Gara and Gara 1999).

අමෙරිකානු සමාජයේ නිර්ඝාත විගුවය තෘෂ්ටික යුගයේ සීතල යුද්ධ සමයේදී නැවතත් ප්‍රබල හඬකින් මතුවන්නට විය. (1945-1991), සිවිල් යුද්ධය, පළවෙනි ලෝක යුද්ධය, දෙවන ලෝක යුද්ධය, සහ අමෙරිකානු ඉතිහාසයේ වඩාත්ම ලේ වැකි යුද්ධ වන කොරියානු යුද්ධය (1950-1953) සහ වියට්නාම යුද්ධය (1964-1975) විසින් ගෙන එන ලද අනේක මරණ සහ ශාරීරික හානි අත්දකිමින් අමෙරිකානු සමාජය පැමිණ තිබුණි. සීතල යුද්ධ වකවානුවේදී එක්සත් ජනපදය සහ සෝවියට් සංගමය අතරත්, ඔවුන්ගේ මිත්‍ර කඳවුරු සහ රටවල් අතරත් ඇති වූ "විප්ලවවාදී, ප්‍රතිවිප්ලවවාදී" ගැටුම් සහ රාජ්‍යයන්ගේ භූ-දේශපාලනික මාරතත්වය හේතු කොට ගෙන අවම වශයෙන් ජීවිත මිලියන 20 ක් වත් ලෝකය පුරා බිලිගනු ලැබිණි. කොරියානු යුද්ධයේදී අමෙරිකානු හමුද භටයින් 22,500 ක් පමණ දෙනා ඝාතනයේ යෙදීම ප්‍රතික්ෂේප කළහ. ඉන්පසුව වියට්නාම් යුද්ධයට එරෙහිව රට තුළ කෙතරම් ඉහළ මට්ටමේ ප්‍රතිරෝධ රැල්ලක් මතු වී ආයේද කිවහොත් ඉතිහාසයේ නොවූ විරූ පරිමාණයෙන් හමුද සෙබළු ඝාතනය ප්‍රතික්ෂේප කරන්නට වන්හ. මෙකී නිර්ඝාත ප්‍රතිරෝධය තුළ, ආගමික විඥාණයට වඩා ලෞකලෞකික හේතු සාධක ප්‍රධාන තැනක් ගත් බව නිරීක්ෂණය කළ හැකි විය. (Moskos and Chambers 1993: 39-43). 1972 දී පොරොන්තු ලේඛණවල ලියාපදිංචිය සටහන් වූ අය අතුරින් හමුදවට බඳවා ගනු ලැබූ පිරිසට වඩා හෘදය සාක්ෂිය මත විරෝධය දක්වන්නන් ලෙස හඳුනාගනු ලැබූ පිරිස බහුතරයක් විය. වියට්නාම් යුද්ධයට විරුද්ධ වූ තවත් සමහරු ලියාපදිංචි වීමද මග හැර සිර ගත වූහ. නැතහොත් විදෙස් රටක පිටුවහල් ජීවිතයක් කරා පැන ගියෝය. මේ වනාහි, ස්වකීය රටවල හමුදායනයෙන් බේරීම උදෙසා අමෙරිකාවට පලා එන සාමවාදී සංක්‍රමණිකයන්ගේ ඓතිහාසික ප්‍රවාහය ආපසු හැරවීමක් බඳුවිය. වියට්නාමයේ ජන සංහාරක භීෂණය ඉහළ යන විට පෙරමුණේ වෛද්‍ය සේවා වැනි ක්ෂේත්‍රවල සේවය කරන්නට එකඟ වූ නිරායුධ නිර්ඝාත විරෝධකරුවන් තුළ යුද්ධය සපුරා ප්‍රතික්ෂේප කිරීමේ ආස්ථානය වඩ වඩා ප්‍රබලව මතු වූ බව නිරීක්ෂිතය. (Gioglio 1989).

සීතල යුද්ධයේ අවසාන අඳුරු නිමේශය තුළ, ඉරාකයට එරෙහි ගල්ෆ් යුද්ධයක් සමග අමෙරිකානු නිර්ඝාත විඥාණය ඉතා ඉහළ සිරසක් කරා එසවී විද්‍යාමාන විය. මෙවර එය හමුදනයට ප්‍රතිරෝධය

දක්වන සිවිල් පුරවැසියන් ආශ්‍රිත ක්‍රියාවලියක් නොවීය, මන්දයත් ගල්ෆ් යුද්ධයට අදළව අමතර හමුද බඳවා ගැනීම් සිදු නොවූ හෙයිනි. මෙවර සිදු වූයේ පුහුණු හමුද ක්‍රියාන්විතයන්ගේ සහ සංචිතයන්ගේ සාමාජිකයන් යුධ පෙරමුණු ඝාතනය ප්‍රතික්ෂේප කරන්නට වීමයි. නාවික හමුද පෙරමුණේ හටයින් පනස් දෙනෙක් හෘදය සාක්ෂිය මත ඝාතනය ප්‍රතික්ෂේප කිරීම නිසා යුධ අධිකරණයට පමුණුවනු ලැබ සිර දඬුවම භාර ගත්හ. (Moskos and Chambers 1993; 44).

මරණීය දණ්ඩනය අහෝසි කිරීම අරමුණු කරගත් සමාජ ප්‍රයත්න තුළ අමෙරිකානු ඉතිහාසයේ නිර්ඝාත විභවය තවදුරටත් ප්‍රකාශයට පත් වී ඇත. යටත්විජිත යුගයේ ම යම් අපරාධ සඳහා මරණ දඬුවම ඉල්ලා සිටීම අඩුවීමේ ප්‍රවණතාවක් ආරම්භ විය. මිචිගන් ජනපද රජය, භූමියට ද්‍රෝහි වීම හැරුණු කොට අනෙකුත් අපරාධ සඳහා පැවති මරණ දඬුවම 1846 දී අහෝසි කළේය. රෝඩ් දූපත එය මුළුමනින් අහෝසි කිරීමට 1852 පියවර ගත් අතර, 1853 දී විස්කොන්සිනය ද එම තීරණයට එකතු විය. මේ වන විට කොළම්බියා ප්‍රාන්තය ද ඇතුළත්ව ජනපද රාජ්‍ය 50 න් 12 ක් ද තුළ පවතින නෛතික රාමු විසින් පෙන්වන්නේ අමෙරිකානුවන් සිවිල් ජීවිතය තුළ සාමූහික වශයෙන්ද, යුද්ධය තුළ පුද්ගලික වශයෙන් ද ඝාතනය ප්‍රතික්ෂේප කිරීමට සූදනම් බවයි. එසේ වුවද, පුරවැසියන් ඝාතන දඬුවමට යටත් කිරීම මගින් අමෙරිකානු ව්‍යවස්ථාව උල්ලංඝනය කෙරෙන බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සන්ධීය රාජ්‍ය (ෆෙඩරල්) මට්ටමේ තීරණාත්මක ප්‍රඥප්තියකට තවම ආ යුතුව තිබේ. (Zimring and Hawkins 1986).

අමෙරිකා එක්සත් ජනපදයේ නිර්ඝාත විභවය පෝෂණය කරන්නාවූ මූලාශ්‍ර අතර, යට කී අරගල ක්‍රියාදාමයන්ට අමතරව පහත සඳහන් ජීවාද වැදගත් ස්ථානයන් මේ වන විට හිමි කර ගන්නා බව පෙනේ; නෘෂ්ටික අවි මුක්ත සමාජයක් සඳහා වූ අරගල (අසිපත් තලා නගුල් සෑදීමේ ව්‍යාපාරය); දුගී බවේ ව්‍යූහාත්මක ප්‍රචණ්ඩත්වය තුරන් කළ සමාජයක් සඳහා වූ ව්‍යාපාර (කතෝලික කම්කරු ව්‍යාපාරය); ස්ත්‍රීන්ට එරෙහි පුරුෂාධිපත්‍යයික ප්‍රචණ්ඩ සංස්කෘතිය නිමා කිරීමෙ සඳහා වූ අරගල (ස්ත්‍රී ව්‍යාපාරය); අප්‍රිකානු-අමෙරිකානු ජනතාව ඇතුළු සියලුම ජන වර්ගයන්ට නිදහස් හා සාධාරණ සමාජයක් තුළ සමාන පුරවැසියන් ලෙස ජීවත් වීමේ

අයිතිය සාක්ෂාත් කර ගැනීම සඳහා වූ අරගල (අහිංසාවාදී සමාජ පරිවර්තනයක් සඳහා වූ කිංගියානු ව්‍යාපාරය). 1936 දී අප්‍රිකානු-අමෙරිකානු නායකයින් ගාන්ධිට හමුවූ අවස්ථාවේ ඔවුන් කියා සිටියේ නිග්‍රෝ නව ජන ගායනා (**"Negro spirituals"**) ගාන්ධිගේ අහිංසාවාදී සංදේශය සමග ප්‍රබල ලෙස අනුකම්පනය වන බවත්, එය භාර ගන්නට ඔවුන් මැනවින් සූදනම් බවත්ය. ගාන්ධි එම සඳහනට ප්‍රතිචාර දක්වමින් "බාල නොකරන ලද අහිංසා සංදේශය ලෝකය වෙත සන්නිවේදනය වනු ඇත්තේ සමහර විට නිග්‍රෝවරුන් අතින්" යැයි කියා සිටියේය. (**Kapur 1992: 89-90**). මෙලෙස ගාන්ධියානු සහ කිංගියානු මෙන්ම අනෙකුත් ලෝක අහිංසා ව්‍යාපාර අතර අන්තර්-ක්‍රියාකාරිත්වයන් මෙන්ම ස්වදේශික සහ සංක්‍රමණික සාමවාදී මූලාශ්‍ර මගින් පෝෂණයද පන්නරය ද ලැබූ අමෙරිකාවේ අහිංසාවාදය, ලෝකයේ නිර්ඝාත ඉතිහාසය සමග ගැඹුරින් අනුබද්ධය.

ප්‍රචණ්ඩත්වය උත්කර්ෂයට නංවන්නාවූ දේශපාලන සම්ප්‍රදායයක් ආධිපත්‍යධාරීව පවතින්නේ වුවද, ඊට හරස්ව යන නිර්ඝාත අමෙරිකානු සමාජයක ගැඹුරු මුල්, යටත්-විජිත සමයේ සිට වර්තමානය දක්වා යටපත් කළ නොහැකි ලෙස නැවත නැවත මතු වන ජීව-ධරණී සදාචාරය තුළ පැහැදිලිව දැක ගත හැකිය; යුධ ඝාතනය ප්‍රතික්ෂේප කිරීම; මරණ දඬුවමට විරෝධය පෑම; ගබ්සාවට විරෝධය පෑම; ආයුධ හරණය ඉල්ලා සිටීම; හමුදාකරණයට ප්‍රතිරෝධය; ප්‍රචණ්ඩ ගෝලීය බල ප්‍රක්ෂේපණයට ප්‍රතිරෝධය දැක්වීම; ආර්ථිකයේ සහ ජන වර්ග අතර සබඳතාවේ ව්‍යුහාත්මක පරිවර්තනය උදෙසා අහිංසාවාදී ක්‍රියාමාර්ග; එපරිද්දෙන්ම කාන්තා අයිතීන් සුරක්ෂිත කිරීම සහ සංස්කෘතික අනන්‍යතාවන්ට ගරු කිරීමට අදාළ ව්‍යුහාත්මක පරිවර්තන උදෙසා අහිංසාවාදි ක්‍රියාමාර්ග; ආගමික ප්‍රකාශනයන් සහ සාහිත්‍ය-කලා ප්‍රකාශනයන් යනාදී වූ සාමූහික ක්‍රියාකාරිත්වය මීට අදාල නිශ්චිත උදහරණය. (**True 1995**) **Plaid Cymru** නමැති වේල්සයේ සාමවාදී දේශපාලන පක්ෂයේ නිර්මාතෘ ග්වින්ෆෝර් ඉවන්ස් කියන අන්දමට "අහිංසාවාදී දේශප්‍රේමයක් හෝ අහිංසාවාදී ජාතිකවාදයක්" බවට පත් විය හැකි ඓතිහාසික ක්‍රියාවලියක් හඳුනා ගත හැකිය. ඔහු ව්‍යක්ත ලෙස පෙන්වා දෙන පරිදි (**Evans, 1972**), **"America the Beautiful"** වේල්සයේ ජාතික ගීය විය හැකිය; එහි ජනතාවගේ පාද-

යාත්‍රා ගීතය "We shall overcome" විය හැකිය. එහි යාඥා ගීතය "God bless nonviolent America and nonviolence in the world" විය හැකිය.

අවසාන විග්‍රහයේදී, නිර්ඝාත සමාජයක මුල් ඇත්තේ මනුෂ්‍ය වර්ගයාගේ චරිතාපදානය තුළය; ගැහැණු ද පිරිමිද තනි තනිව ද සාමූහිකව ද සුප්‍රකටයින් ද අප්‍රකටයින් ද, පෙර සිටියවුන් ද, දැන් ඉන්නා අයද සමාජ පරිවර්තනය පිළිබඳ ධනාත්මක ආවේශයක් සමග නිර්ඝාත සමාජයක් නිර්මාණය කරනු වස් ඒකාබද්ධ කැපවීමක් ප්‍රදර්ශනය කරති. යමෙකුට කළ හැකි දෙය අන් අයටද කළ හැකිය.

පැරිසියේ නූතන කලා කෞතුකාගාරයට (Musee Art Moderne de La Ville de Paris) ප්‍රවේශ වන විටම කෙනෙකුට රඕල් ඩුෆි විසින් කරන ලද දැවැන්ත වට බිතු සිතුවම මුණ ගැසේ. එය වූ කලී, දූරාතීතයේ සිටි දර්ශනිකයින්ගේ සිට නූතන විද්‍යාඥයින් සහ නිර්මාපකයින් දක්වා, විද්‍යුතය සොයා ගැනීමට සහ භාවිතාවේ යෙදවීමට දායකවූ මිනිසුන් සංවර්ණනය කරන්නේය. ඊට සාදෘශ්‍ය වශයෙන්, නිර්ඝාත දේශපාලන විද්‍යාව හැදෑරීම පිණිස අනාගත ජගත් කෞතුකාගාරයකට ඇතුල් වෙන විද්වතුන් පිළිගැනීම සඳහා නිර්මිත, නිර්ඝාත ජීව ගුණය ලොව පුරා දැල්වීමට ද එහි න්‍යායික සහ ප්‍රායෝගික සංවර්ධනයට ද විශ්වීය වශයෙන් දායක වූවන් සංවර්ණනය කරන්නාවූ අතිදැවැන්ත පරිදර්ශනයක් (Panorama) ගැන කෙනෙකුට පරිකල්පනය කිරීම අසීරු නැත. මේ ආශ්‍රිත විශ්වීය උරුමය පිළිබඳ ඉඟියක් නූතන සාම නායකයින්ගේ චරිතාපදාන සංග්‍රහයක් වන Biographical Dictionary of Modern Peace Leaders (Josephson, 1985) යන ග්‍රන්ථය පරිශීලනය කිරීමෙන් කෙනෙකුට ලබාගත හැකිය. එය ක්‍රි.ව. 1800-1980 කාලය තුළ රටවල් 39 ක ජීවත්වූ පුද්ගලයින් 717 දෙනෙකු පිළිබඳ ජීවන තොරතුරු ඉදිරිපත් කරයි; පිටු 1,134 ක් පුරා දිවෙන මෙම කුඩා විශ්ව කෝෂය අතිශය පුළුල් තේමා පරාසයක් හරහා නිර්ඝාත ජීවිත පිළිබඳ දත්ත ඉදිරිපත් කරයි. නිදහස් කලා අධ්‍යාපනය, සහ විවිධ වෘත්තීන් අරබයා, නිර්ඝාත ප්‍රවේශ හරහා නිර්ඝාත ලෝකයක් උදකර ගැනීම උදෙසා ක්‍රමෝපායන්; තාවකාලිකව ප්‍රචණ්ඩත්වයට යට වීමේ ජීවන සංසිද්ධීන් සහ නිර්ඝාත ප්‍රතිඥාවන්ට පූර්ණ ලෙස කැපවූ ජීවිත; ඓතිහාසික, භූගෝලීය,

සංස්කෘතික වශයෙන් මෙබඳු ගවේෂණයන් ඉදිරියට ගෙන යන්නේ නම් නිර්සාත ධෛර්යය සහ කැපවීම පිළිබඳ ලෝක උරුමය තවදුරටත් හෙළි පෙහෙළි වීම හේතුවෙන් අප්‍රමාණ නිර්සාත මිනිස් ශක්තියක් අනාගතය ගොඩ නැගීම උදෙසා ජනනය වනු ඇත. නිර්සාත ජීවිත පිළිබඳ තොරතුරු විශ්වය වශයෙන් සොයා ගැනීමත් බෙදා හදා ගැනීමත් අද අත්‍යවශ්‍ය වී තිබේ.

කාලය, අවකාශය සහ සංස්කෘතීන් හරහා නිර්සාත ජීවිත එකිනෙකා සමග අන්තර්ක්‍රියා කරති, සහානුකම්පනය වෙති. පුරාණ පාලකයන් අතර ද උදාහරණ බහුලය. ඊජිප්තුවේ ෂබාකා නම් පාරාවෝ රජු (ක්‍රි.පූ. 760-665) මරණ දඬුවම අහෝසි කරයි. (Bennett, 1988: 11). ඉන්දියාවේ බෞද්ධ අධිරාජයා, අශෝක, කාලිංග මහා සංග්‍රාමයෙන් (ක්‍රි.පූ. 262) පසු යුද්ධය ද සියළු වර්ගයේ ජීවිත විනාශ කිරීමද පිටු දකියි. මෙකී සංග්‍රාමයේදී සෙබළුන් ලක්ෂයක් විනාශ වූ අතර අහිංසක ජීවිත අප්‍රමාණ වශයෙන් විනාශයට ද දුකටද පත් විය. (Chowdhury 1997 : 52). ආධ්‍යාත්මික ශාස්තෘවරුන් හා ගුරුවරයන් විසින් ලොවට උරුම කරන ලද නිර්සාත ජීවන උදහරණ, යුග හා පරම්පරා හරහා ආදර්ශය සහ නිර්මාණශීලී ප්‍රවර්ධනය සඳහා බලගතු පෙළඹවීම් ඇති කරයි. ගෝතම බුද්ධ, මහාවීර, ජේසු, මොහමඩ්, ජෝර්ජ් ෆොක්ස්, ගුරු නානක්, බහා උල්ලා ප්‍රකට උදහරණ වන්නෝය. ඝාතක රාමුවේ සිට නිර්සාත පූසමාදර්ශය කරා පුද්ගලයා මාරු වෙත්ම, ලෞකික මෙන්ම අධ්‍යාත්මික වශයෙන් නාටකීය ආකාරයේ ගැඹුරු පරිවර්තනයක් සිදුවේ; රණකාමී සෙබළු සාමවාදීන් වෙති. (Crozier 1938; Tendulkar 1967; Khan 1997; Boubalt, Gauchard and Muller 1986; Roussel 1997). විප්ලවවාදිහු මාරකත්වය බැහැර කරති. (Narayan 1975; Bendana, 1998). ඝාතනය ප්‍රතික්ෂේප කරන්නෝ හමුදායනයද ප්‍රතික්ෂේප කරති. (Moskos and Chambers 1993). නවසීලන්තයේ ආකිබෝල්ඩ් බැක්ස්ටර් නම් මිනිසා මානවවාදී පදනමක පිහිටා වධකාගාරවලට ද දෙවෙනි ලෝක යුද්ධය සඳහා දියත් කළ හමුද බඳවා ගැනීම්වලට ද ප්‍රතිරෝධය දක්වමින් හුදකලාවම වාගේ අද්විතීය ධෛර්යකින් සහ නිර්සාත ආවේශයකින් නැගී සිටියේය. (Baxter, 2000). බයිබලයට ලැදි ඕස්ට්‍රියානු ගැමියෙක් වූ ෆ්‍රාන්ස් ජොගස්ටාටර්, හිට්ලර්ට පක්ෂව සටන් කිරීම එක හෙලා ප්‍රතික්ෂේප කිරීම නිසා හිස් ගැසුම් කෑවේය. (Zahn 1964). හිට්ලර්ගේ

සංහාරක ව්‍යාපෘතිවලින් යුදෙව්වරුන් බේරා ගැනීම සඳහා අහිංසාවාදී "ගැලවුම් සෙබළු" තම ජීවිත නිතර අනතුරට ලක් කළහ. (Fogdman 1994; Hallie 1979). නවීන යුද්ධ ව්‍යාපෘතිවලට සහ නූතන හමුදා කාර්මික රාජ්‍යයන්ට ද්‍රව්‍යමය වශයෙන්, ශ්‍රමයෙන් හෝ බුද්ධිමය/ආධ්‍යාත්මික වශයෙන් සහය දීම නිර්සාත පුරවැසියන් පුද්ගලික මට්ටමින් ප්‍රතික්ෂේප කරති. (Everltt 1989). තවත් කෙනෙක් මහා පරිමාණයේ සංහාරක ආයුධ කෙලින්ම නිෂ්ක්‍රිය කරන්නට මාර්ග සොයති. (Norman 1989; Polner and O'Grady 1997).

මොහන්දස් කරම්චන්ද් ගාන්ධි නම් වූ අඩි 5 යි අගල් 4 ක් තරම් කුඩා ශරීරයක් සහිත ඉන්දියානුවෙකුගේ අහිංසාවාදී නායකත්වය නිර්නාමික ජනයා දශ ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයෙන් ප්‍රතිචාර දක්වමින් පිළිගනිති. සංස්කෘතික වශයෙන් රණකාමී සහ ප්‍රචණ්ඩ යැයි සැලකෙන පතන් ජනයා අබ්දුල් ගෆාර් ඛාන්ගේ අහිංසාවාදී මුස්ලිම් නායකත්වයට සාමූහිකව ප්‍රාතිචාර දක්වති. (Banerjee 2000; Eswaran 1999). එලෙසම විශිෂ්ඨ ගාන්ධියානු අධ්‍යාපනඥයෙක් වන ආචාර්ය ජී.රාමචන්ද්‍රන් පවසන පරිදි අහිංසාවේ අප්‍රකට වීර ගැහැණු-පිරිමි ප්‍රකට වීරයින්ට වඩා වැදගත්ය. (Ramachandran 1983). අමෙරිකා එක්සත් ජනපදයේ, ගාන්ධියානු ක්‍රමවේදය පිළිබඳ පුහුණුවක් ලැබූ අප්‍රිකානු-අමෙරිකානු විද්‍යාල සිසුන් කුඩා කණ්ඩායමක් සිවිල් අයිතින් ව්‍යාපාරයක් දියත් කරති. පසු කාලයක ආචාර්ය ලූතර් කිං (කණිෂ්ඨ) දේවගැති තුමා නායකත්වයට ඔසවමින් අති දැවැන්ත බහුජන සිවිල් ව්‍යාපාරයක් බවට වැඩෙන්නේ ඒ කුඩා මට්ටමේ අහිංසා ප්‍රයත්නයයි. (Halberstam 1998). අදීන් බැලවූ සහ හෙන්රි ඩේවිඩ් තොරෝ වැනි අහිංසාවාදී අමෙරිකානුවෝ රුසියානු මහා ලේඛක තෝල්ස්තෝයිට අනුප්‍රාණය සපයති. (Christian 1978: 588); තෝල්ස්තෝයි ගාන්ධිට අනුප්‍රාණය දෙයි; ගාන්ධි කිංග්ට අනුප්‍රාණය දෙයි; මේ සියළු දෙනා ජර්මානු හරිත පක්ෂයේ නිර්මාතෘ පෙට්රා කේලිට අනුප්‍රාණය දෙති. (Kelly 1989). අහිංසා තරංග මෙලෙස විසරණය වීමේ ගෝලීය ක්‍රියාවලිය තුළ මෙහිලා නම් නොකරන ලද බොහෝ දෙනා එය ග්‍රහණය කරමින් නිර්මාණශීලි ලෙස හා ස්වකීය මුද්‍රාව ද එක් කරමින් නැවත නැවතත් එය සහ-ශක්තිකරණයට භාජනය කරති.

එක්සත් ජාතීන්ගේ සාංගමික විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර නායකත්ව ඇකඩමියේ 1997 සහ 1998 වර්ෂවල පැවති ප්‍රථම පුහුණු පාඨමාලා දෙකට සහභාගි වීම සඳහා ජෝර්දානයේ අම්මාන් නුවරට රැස් වූ 60 කට අධික රටවල් සංඛ්‍යාවකින් පැමිණි 200 කට අධික තරුණ නායකයෝ වඩාත්ම ආකර්ෂණීය ලෝක නායකයා ලෙසින් තෝරා ගත්තේ ගාන්ධිය.

අහිංසාවාදී නායකයෝ ලෝකය පුරා අද සීඝ්‍රයෙන් මතු වෙති; කාම්බෝජයේ මහා ඝෝෂානන්ද තෙර, කොරියාවේ හැම් සුක් හොන්, නයිජීරියාවේ කෙන් සාරෝ–වීවා, ශ්‍රී ලංකාවේ ඒ.ටී. ආරියරත්න, තායිලන්තයේ සුලක් ශිවරාක්ෂා, ප්‍රංශයේ ලැන්සෝ ඩෙල් වාස්තෝ සහ ජෙනරල් යාක් ඩී බොලාඩියා, එංගලන්තයේ රෝලන්ඩ් මැලෝන්, ඉතාලියේ ඇල්ඩෝ කැපිටිනී, ඉන්දියාවේ එන්. රාධක්‍රිෂ්නන්, බ්‍රසීලයේ ටොම් හෙල්ඩර් කැමාරා, අමෙරිකා එක්සත් ජනපදයේ ඒ.ජේ. මුස්තේ ඉන් ස්වල්ප දෙනෙකි. ගාන්ධි කෙරේ දක්වන ලද ඓතිහාසික නොසැලකිල්ල නිවරද කරමින්, නොබෙල් ත්‍යාග කමිටුව, අහිංසා ප්‍රතිපදාවට කැප වී සැලකිය යුතු කාර්යභාරයක් ඉෂ්ට කළ නායකයින් විශේෂ නොබෙල් සාම ත්‍යාගයක් මගින් පිළිගැනීම ආරම්භ කළේය; දකුණු අප්‍රිකාවේ ඇල්බට් ජේ. ලුතුලි සහ ඩෙස්මන්ඩ් ටුටු, උතුරු අයර්ලන්තයේ මයිරෙඩ් කොරිගන් මැගුවා, ආර්ජන්ටිනාවේ ඇඩොල්ෆෝ පෙරේස් එස්ක්වල්, බුරුමයේ අවුන්ග් සන් සූ-කුයි සහ ටිබටයේ දලයි ලාමා එකී සම්මානලාභි අහිංසා නායකයෝ වෙති.

අහිංසාවාදී ලෝක පරිවර්තනය තුළ ස්ත්‍රී දායකත්වය අති විශේෂ ස්ථානයක් ගනී. සමාජයේ සෑම ක්ෂේත්‍රයකම ව්‍යුහගතව පවත්නා ප්‍රචණ්ඩත්වය අහිංසාවාදී මාර්ග ඔස්සේ පිටු දැකීම සඳහා, තම තමන්ගේ අනන්‍යතාව සහ පසුබිම විදහා දක්වමින්, කාන්තාවෝ ධෛර්යමත්ව පෙරට එමින් සිටිති; ඕස්ට්‍රියාවේ බර්තා වොන් සට්නර්, බාලි දූපත්වල ගෙඩොන් බැගෝස් ඕකා, ඉන්දියාවේ මේධා පත්කාර්, අමෙරිකා එක්සත් ජනපදයේ ඩොරති ඩේ, බාර්බරා ඩෙමින් සහ ජීන් ටූමර් ඉන් කිහිප දෙනෙකි. (Stanfield 1993: 49). බ්‍රිතාන්‍යයේ දෙවන ලෝක යුද්ධ සමයේදී හෘදය සාක්ෂියේ විරෝධය මත කාන්තාවන් 1704 දෙනෙක් හමුදායනය ප්‍රතික්ෂේප කළ අතර, ඉන් 214 දෙනෙක් සාමාන්‍ය සිවිල් සේවාවන්ද ඇතුලුව කවර ආකාරයේ හෝ සේවාවක් යුධ පෙරමුණට ලබා දීම ප්‍රතික්ෂේප කිරීම නිසා

සිරගත කරනු ලැබූහ. (Harries - Jenkins 1993: 77). හමුදා විසින් මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ තත්වයන්ට එරෙහිව කාන්තාවෝ සාමූහික ක්‍රියාමාර්ගවලට යන අවස්ථා දක්නට ලැබේ; බුවනොස් අයිරස් නුවර, ප්ලාසා ඩි මායෝහි මව්වරුන්ගේ අහිංසාවාදී මැදිහත් වීම මෙබඳු අවස්ථාවකි. එලෙසම ඔවිහු වාර්ගික සංහාරයන් තුළදී ප්‍රබල මැදිහත් වීම් කර ඇත. සර්බියාවේ "කලු හැඳ ගත් ගැහැණු" ප්‍රකට උදාහරණයකි. න්‍යෂ්ටික යුද්ධයට එරෙහිවද ඔවුන් සිය අහිංසාවාදී හඬ විහිදුවති. බ්‍රිතාන්‍යයේ Greenham Common Women's Peace Camp- ග්‍රීන්හැම් සාමාන්‍ය ගැහැණුන්ගේ සාම කඳවුර-එක් උදහරණයකි. පරිසර විනාශයට එරෙහිව ඉතා නිර්මාණශීලීව කාන්තාවෝ මැදිහත් වෙමින් සිටිති. ඉන්දියාවේ ප්‍රකට චිප්කෝ ව්‍යාපාරය ("ගස් බදා ගැනීමේ ව්‍යාපාරය") එක අවස්ථාවක් පමණි. අහිංසාවාදී ස්ත්‍රී මැදිහත් වීම් ඉතා පුළුල් පරාසයක් තුළ විහිදේ. (McAllister 182, 1988; Morgan 1984; Foster 1989) . ජොආන් වී. බොන්ඩුරන්ට් (1969), එලීසෙ බෙරල්ඩින් (1980: 1992) සහ බෙරේනිස් ඒ. කැරොල් (1998) වැනි විද්වත් කාන්තාවෝ අහිංසාවාදී සමාජ පරිවර්තනයට අදළ ඥාණ සම්පාදනයේ ලා ඉහළ දායකත්වයන් පළ කරමින් සිටිති.

ඇතැම් විට සංකීර්ණ ශ්‍රම විභජනයක් සහිත පුම්-තිරි යුගල, විවාහක හෝ අවිවාහක වේවා, අන්‍යෝන්‍ය වශයෙන් ඒකාබද්ධව අහිංසාවාදී පරිවර්තන අරගලයට දායක වීමේ දීප්තිමත් උදහරණ විශාල වශයෙන් වාර්තා කළ හැකිය. කස්තරුබා සහ ගාන්ධි, කොරේටා ස්කොට් සහ මාටින් ලූතර් කිං (කනිෂ්ඨ), ඩොලරේස් හුඑර්තා සහ සීසර් චාවේස්, ඩොරති ඩේ සහ පීටර් මැරින්, ෆ්‍රාන්සස් මේ විදර්ස්පූන් සහ චාල්ස් රෙක්ට්, එලිසබෙත් මැක් ඇලිස්ටර් සහ පිලිප් බෙරිගන් ඔවුන් අතරය. ස්ත්‍රී–පුරුෂ දෙපාර්ශවයම සම සමව සහයෝගීව ඒකාබද්ධ ජන බලයක් ප්‍රදර්ශනය කරමින්, 1986 පිලිපීනයේ අහිංසාවාදී ප්‍රජාතන්ත්‍රවාදී වැදිහත් වීම ගොඩ නැගුනු ආකාරය ඉතාම සිත් ගන්නා සුළු ඓතිහාසික අවස්ථාවකි. ඒකාධිපති ක්‍රමය බිඳ හරිමින්, ප්‍රතිවිප්ලවීය ලේ වැකි හමුද සංහාරයක් මග හරවා ගනිමින් පිලිපීනයේ පූජකවරියන්ද, පූජකවරු ද ස්ත්‍රී-පුරුෂ ගිහි ජනයා ද සහ-ක්‍රියාකාරීත්වයක් මතු කරගනිමින් සංවිධිත අහිංසා ජන බලයේ ශක්තිය දීප්තිමත් ලෙස ලොවට පෙන්වා සිටියහ.

(Santiago, A.S. 1995). මූලික මානව අවශ්‍යතාවන් සහතික කර දෙන්නාවූ නිර්ඝාත සාධාරණ සමාජයක් නිර්මාණය කර ගැනීම උදෙසා ගැහැණුන්ට ද පිරිමින්ටද ශක්තිය තිබෙන බව තහවුරු වීමෙන් ගෝලීය වශයෙන් මානව වර්ගයාගේ "චරිතාපදානය" විමසන කා තුළ වුවත් සුපැහැදිලි විශ්වාසයක් සහ අනුප්‍රාණයක් ජනිත වන්නේය.

## නිර්ඝාත සමාජයක් සඳහා ශක්‍යතා

නිර්ඝාත සමාජයකට ඇති හව්‍යතාවය මිනිස් අත්දැකීම් සහ නිර්මාණශීලි ශක්‍යතා තුළ රැඳී පවත්නේය. අති බහුතරයක් මිනිස්සු නොමැරූහ, නොමරති. ඝාතනයේ යෙදීමට අපට පුලුවන් කමක් ඇතත්, අපගේ ස්වභාවය විසින් ඊට බලකිරීමක් නැත. අප දැනට කොතරම් අසම්පූර්ණ ලෙස ක්‍රියාවේ යෙදවුවත්, සැම මහා අධ්‍යාත්මික සම්ප්‍රදයකම ප්‍රධාන උගැන්වීම වන්නේ, ජීවිතයට ගරු කරන්න – එය විනාශ නොකරන්න යන්නයි. ඉතාම දැඩි ප්‍රචණ්ඩ වාතාවරණයන් මැද්දේ පවා මනුෂ්‍යයෝ මෙකී උගැන්වීමට ධනාත්මකව ප්‍රතිචාර දැක්වීමටත්, එය සඳහා පූර්ණ ලෙස කැපවීමටත් තමා තුළ ඇති ශක්තිය ප්‍රකට කර ඇත්තාහ. ඒ අතර, ඝාතන සිද්ධීන් හේතු-ඵල වශයෙන් පූර්ණ ලෙස අවබෝධ කර ගැනීමටත්, එම හේතූන් නිෂේධ කිරීමටත්, පුද්ගලයා සහ සමාජය මාරකත්වයෙන් නිදහස් කර ගැනීමටත් විද්‍යා නිර්මාණශීලීත්වයට වෙන කවරදටත් වඩා අද හැකියාවක් ඇති බවද තහවුරු වෙමින් පවතී.

නිර්ඝාත සමාජයක සංරචක, කළලමය ආකාරයට අතීතයේ ද වර්තමානයේද ගෝලීය අත්දැකීම් තුළ පැහැදිලිව විද්‍යාමාන වේ. ඒවා හුදෙක් උපන්‍යාසීය හෝ පරිකල්පනීය ක්ෂේත්‍රයට අදළ කරුණු නොවෙති. තථ්‍ය මනුෂ්‍ය අත්දැකීම් සම්භාරය තුළ, නිර්ඝාත මූල ධර්ම මත ක්‍රියාත්මක වන අධ්‍යාත්මික, දේශපාලනික, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික ආයතන සහ භාවිතාවන් නිසැක වශයෙන්ම පවතී. දැනටමත්, හමුද රහිත, මරණ දඬුවම රහිත සහ බොහෝ දුරට ආයුධ රහිත සමාජ දක්නට ලැබේ. මනුෂ්‍ය වර්ගයාගේ යහපැවැත්මට සහ පැවැත්මට තර්ජනයක් වන ගැටළු සහ දුෂ්කරතා

විසඳීම සඳහා කැප වූ අහිංසාවාදී සංවිධාන, ආයතන සහ ව්‍යාපාර ලෝකයේ පවතී. වර්තමානයේ සහ අනාගතයේ පරිවර්තක ක්‍රියාවන් ගැන සංඥා කරන්නාවූ දැනීමක් තිර්සාර ඓතිහාසික ගමන් මග තුළින් ගලා ඒ. තිර්සාර ජීවිතවලින් සමන්විත වන්නා වූ මහා උරුමයක් අප සතුය. අතීතයේ ද වර්තමානයේ ද ජීවත් වූ සහ ජීවත්වන පුද්ගලයින්ගේ ධෛර්ය සහ ඔවුන් ඉටු කළ සුවිශේෂ කාර්යභාරයන් අපට දැනීමද අනුප්‍රාණය ද සපයති.

කිසියම් ජනතාවක්, දැනටත් ජීවමාන ගෝලීය මිනිස් අත්දැකීම් සමුදයේ මූලික සංරචක සංයෝජනය කරමින්, අනුවර්තනය කර ගනිමින්, ඒවා ප්‍රවර්ධනය  කිරීමට නිර්මාණශීලීව දායක වෙමින් ඉදිරියට යන්නට තීරණය කළහොත් තිර්සාර සමාජයකට සෑහෙන තරමේ ආසන්න වන තත්වයක් දැන් වහාම සාක්ෂාත් කර ගත හැකි වනු ඇත. භව්‍යතාවය එනමුත් නියතතාවය සඳහා සහතිකයක් නොවේ. එහෙත්, පෙර අවිත්‍යාය ලෙස සැලකුණු දෙය තවදුරටත් එලෙස භාර නොගැනීමට එය සහතිකයක් වෙයි. මනුෂ්‍යයන් වන අපට තිර්සාර ගෝලීය පරිවර්තනයක් සඳහා ශක්තිය ඇත්තේය යන විශ්වාසය තහවුරු කොට ශක්තිමත් කිරීමට එය සෑහෙයි.

## 3 පරිච්ඡේදය

# දේශපාලන විද්‍යාව සඳහා ගම්‍යමාන

*අහිංසාව ආගමික කාරණාවක් පමණක් නොවේ*
*අහිංසාව සමාජයීය කාරණාවක් පමණක් නොවේ*
*අහිංසාව එතාහි බලයේ විද්‍යාවයි.*

*– ජී. රාමචන්ද්‍රන්*

නිර්ඝාත සමාජයන් උදා කර ගැනීමට ඇති හැකියාවන් විසින් දේශපාලන විද්‍යාව නම් ශාස්ත්‍රීය අධ්‍යයන විෂය වෙත ඇති කරන්නා වූ ගම්‍යමාන කවරේද? මාරකත්වය මනුෂ්‍යයා සම්බන්ධයෙන් අනිවාර්ය තත්වයක්ය' යන පිළිගැනීම නිර්ඝාත භව්‍යතාවය පිළිබඳ ආස්ථානය මගින් විතැන් කරනු ලබන්නේ නම්, එවිට දේශපාලන විද්‍යාඥයින් ප්‍රෝත්සාහී විය යුත්තේ කවර වර්ගයේ විද්‍යාවක් නිර්මාණය කිරීමටද? කවර වටිනාකම් සහ සාරධර්ම එකී ප්‍රෝත්සාහයන්ට අනුප්‍රාණය දෙනු ඇතිද? මාර්ගෝපදේශකත්වය සපයනු ඇතිද? කුමන දත්තද එවිට අප සෙවිය යුත්තේ? කවර ආකාරයේ විමර්ශනාත්මක සහ ප්‍රක්ෂේපණාත්මක න්‍යායන් අප ගවේෂණය කළ යුතුද? දැනුමේ කවර වර්ගයේ ව්‍යවහාරයන්ට එවිට අප ඉඩ සැලසිය යුතුද? අප ද අනෙක් අය ද ඒ සඳහා ලබා ගත යුතු අධ්‍යාපනය හා පුහුණුව කවරාකාර විය යුතුද? අප නිර්මාණය කළ යුත්තේ කුමන ආයතනද? නිර්ඝාත ලෝකයක් උදෙසා නිර්ඝාත සමාජයන් සාක්ෂාත් කර ගනු වස් දැනුම සොයා පාදා ගැනීමේ, බෙදහද ගැනීමේ සහ ව්‍යවහාරගත කිරීමේ ක්‍රියාවලින් තුළ අප අනෙක් අය සමග එක්ව ක්‍රියාත්මක විය යුත්තේ කෙසේද?

නිර්ඝාත සමාජයන්ගේ උදාව විය හැකි දෙයක් ලෙස පිළිගැනීම නිර්ඝාත නිර්මාණශීලීත්වය දෙසට ශික්ෂාත්මක සංක්‍රාන්තියක් ගම්‍ය කරන්නේය. දේශපාලන විද්‍යාව මෙන්ම, දේශපාලන භාවිතය සඳහා ප්‍රචණ්ඩත්වය (ඝාතනය) අනිවාර්ය කොන්දේසියක් ලෙස භාර ගන්නා වූද, නිර්ඝාත චර්යාධර්ම ඒ සඳහා නොගැලපෙන්නේ යැයි කියන්නා වූද වෙබරියානු (Weberian) ආධානය එය මගින් ප්‍රශ්න කිරීමට ලක් වෙයි. පෙර අචින්ත්‍ය ගණයේ ලා සැලකුනු අස්ථානය දැන් එය අවම වශයෙන් විවාදාත්මක ගණයට ඇතුල් කරයි.

## නිර්ඝාත දේශපාලන විශ්ලේෂණයේ තර්කනය

දේශපාලන විද්‍යාවේ නිර්ඝාත සුසමාදර්ශ පෙරළියක් විසින් නිර්ඝාත දේශපාලන විශ්ලේෂණයේ චතුරාංගික තර්කනයක අවශ්‍යතාව ගම්‍ය කරනු ලබන්නේය. ඝාතන ක්‍රියාවලීන්ගේ හේතු ප්‍රත්‍යයන්, අහිංසාවේ හේතු–ප්‍රත්‍යයන්, ඝාතනය පවතින සමාජයක සිට නිර්ඝාත සමාජයක් කරා වූ සංක්‍රාන්තියේ හේතු–ප්‍රත්‍යයන් සහ පූර්ණ වශයෙන් නිර්ඝාත ජීවය රජ කරන්නා වූ සමාජයන්හි ලක්ෂණ අප දැන කියා ගත යුතුය.

ප්‍රචණ්ඩත්වය හිස නමා භාර ගන්නා සම්ප්‍රදායයික දේශපාලන අධ්‍යයන ශාඛාවට වෙනස්ව, නිර් ඝාත දේශපාලන විද්‍යාවක් උදෙසා, ඝාතනය පූර්ණ ලෙස අවබෝධ කර ගැනීමට ඉතා ප්‍රබල අවශ්‍යතාවක් මතු වීම එක්තරා විරෝධාභාසයකි. මාරකත්වය සහ ඊට සහසම්බන්ධිත සාධක තත්ත්වයන් තුළට ඒවා වෙනස් කිරීම සඳහා නිර්ඝාත ක්‍රම විධීන් මගින් මැදිහත් වීමේ අභිමතාර්ථය සමග මේ කී සුවිශේෂ ලක්ෂණය සම්බන්ධය. පුද්ගලික සහ සාමූහික අරමුණු අරබයා ක්‍රියාත්මක වීමේදී ඝාතනය අනිවාර්ය මෙන්ම, භාරගත හැකි ප්‍රපංචයක් ලෙස කල්පනා කෙරෙන පරිසරයක, තමන්ගේ ද, අනුන්ගේ ද, අන්තර්–ක්‍රියාත්මක වශයෙන් ද පවතින්නා වූ මාරකත්වය වටහා ගැනීමට සහ නිෂේධ කිරීමට දැඩි හදිසි උවමනාවක් මතු වන්නේ නැත. මේ සන්දර්භය තුළ, ගැටළු සහගත වුවද එක්තරා විදියක ආරක්ෂිත තත්වයක්–හැඟීමක්– මතුවන්නාක් සේ පෙනී යයි; "මම/අපි නුඹ මරන්නෙමි/මු." යන ගම්‍යමානය අවසාන විග්‍රහයේ දී බල පැවැත්වෙන බව දන්නා හෙයිනි. මෙම ගම්‍යමානය නොමැති තැනක ඝාතනයේ සාධක අවබෝධ කර ගැනීම සහ ඒවා දුරිභූත කර දැමීම පැවැත්ම සහ යහ–පැවැත්ම උදෙසා අත්‍යවශ්‍ය කාරණයක් බවට පත් වේ.

හේතුඵල සම්බන්ධය පිළිබඳ සංකල්පය නිර්ඝාත විශ්ලේෂණයේ කේන්ද්‍රීය අගයක් ගනී, මිනීමැරුමක් වේවා, ජන සංහාරයක් හෝ න්‍යෂ්ටික සමූල ඝාතනයක් වේවා, ඝාතන සංසිද්ධියක් පැන නගින්නේ කොතැනද, එහිදී හේතුන්ගේ සහ ඵලයන්ගේ ක්‍රියාවලීන්, ඒවා කෙතරම් සංකීර්ණ අන්‍යොන්‍ය රඳා පැවැත්මක තිබෙන්නේ වුවද, අප විසින් අවබෝධ කොට ගත යුතුය. සෑම ඝාතන සිද්ධියක්ම

හේතුඵල වශයෙන් පැහැදිලි කිරීමක් ඉල්ලා සිටියි. කවුරුන් විසින් ඝාතනය කළේද?, කෙසේද?, කොහිදීද?, කවදාද?, පූර්වාදර්ශ මෙහි වීද?, සන්දර්භ තත්වයන් මොනවාද?, පෞද්ගලික හා සමාජයීය වශයෙන් එහි අර්ථ කවරේද? ඉදිරි ගම්‍යමාන මොනවාද යන ඈ සියල්ල අප තේරුම් බේරුම් කර ගත යුතුය. එලෙසින්, වඩාත් තීව්‍ර අරපරෙස්සම් සහ මාදිලිගත පැහැදිලි කිරීම් උදෙසා අප මාරකත්වයේ හේතු–ඵල සබඳතාවන්ට අදාළව අන්තර්–සිද්ධිමය රටාවන් සොයා පාදා ගත යුතුය.

ඒ ආකාරයෙන්ම නිර්ඝාත පැවැත්මේ හේතුප්‍රත්‍යයන් ද අප අවබෝධ කොට ගත යුතු වෙයි. මනුෂ්‍යයා ඝාතනය නොකරන්නේ ඇයි? මනුෂ්‍ය ජීවිතය තුළ නිර්ඝාත සංකල්පය පැන නැගී ඇත්තේ ඇයි? නිර්ඝාත ප්‍රතිපදාවන්ට මනුෂ්‍යයා කැපවන්නේ ඇයි? තමන් හිනාවට හා ගර්හාවට  ලක් වෙද්දී, කොන් කිරීමට ලක් වෙද්දී, පිටුවහල් කරනු ලබද්දී, දේපල පැහැර ගනු ලබද්දී, සිරගත කරනු ලබද්දී, වධ බන්ධනයන්ට ලක් වෙද්දී, අත–පය සිඳිනු ලබද්දී, මරණ තර්ජන ඉදිරියේ, අවසානයේ  සැහවී සිට මරද්දී, මරණ දඬුවමට යටත්  කරද්දී, සමූල–ඝාතනය කරද්දී, ඉතිහාසය පුරා සමහර මිනිසුන් මාරකත්වයට ප්‍රතිපක්ෂව ජීවිතයට ගරු කිරීමේ ප්‍රතිපදාව අත් නොහැර සිටියේ ඇයි? නිර්ඝාත අභිමතාර්ථ, නිර්ඝාත ක්‍රියාමාර්ග හරහා සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් ඔවුන්, ප්‍රතිපත්ති, භාවිතාවන් හා ආයතන නිර්මාණය කර ඇත්තේ ඇයි?

අනතුරුව, පුද්ගලිකව සහ සාමූහිකව මාරක පැවැත්මක සිට නිර්ඝාත පැවැත්මක් දක්වාත්, නැතහොත් නිර්ඝාත පැවැත්මක සිට ඝාතනය දක්වාත් පරිවර්තනය වීමේ හේතුප්‍රත්‍යයන් කවරේද? ඝාතකයින් ඝාතනය පිළිගැනීමේ සිට, මනුෂ්‍ය ජීවිතය රැකීමේ ප්‍රතිපදාව දක්වා මාරු වී තිබෙන්නේ ඇයි? හමුදා සෙබළුන් සාමවාදීන් බවට පත්වන්නේ, විප්ලවවාදීන් මාරකත්වය ප්‍රතික්ෂේප කර සිටින්නේ, ඝාතකයින්  පූර්ණ අහිංසාවාදීන් බවට පත් වන්නේ ඇයි? අදහස්, පුද්ගලයින්, නායකයින්, සංවිධාන, ආයතන  සහ ප්‍රතිපත්ති අහිංසාවාදය කරා පරිවර්තනය වී ඇත්තේ ඇයි? ඒ අතරම නිර්ඝාත ප්‍රතිපදාවන්ට මුලදී කැපවී සිට, පසුව ලේ හැලීම්වලට සහභාගි වීමට හෝ ආධාර කිරීමට ඇතැමෙක් නැඹුරු  වී ඇත්තේ ඇයි? එමෙන්ම,

ඇතැම් විට රාජ්‍යයන් මරණ දඬුවම අහෝසි කරන්නේ සහ එය නැවත පනවන්නේත්, එලෙසින්ම ඇතැම් සාමවාදියෙක් කිසියම් සුවිශේෂ යුද්ධයකට තාවකාලික එකඟත්වය පළ කරන්නේත් ඇයි? නිර්ඝාත විශ්ලේෂණය අප්‍රතිවර්තය රේඛීය ප්‍රගමනයක් ගැන විශ්වාසය තබන්නේ නැත. සැබැවින්ම නිර්ඝාත පරිවර්තනයේ පහසුකරණය උදෙසා, නිර්ඝාත තත්වයන් කරා වූ සංක්‍රාන්තිය තුළ හමුවන සිද්ධීන්ගේ ආපාතය නොහොත් බහුලත්වය, ඒවායේ මහත්තාව මෙන්ම දෝලනයේ හේතු ද මැනැවින් අවබෝධ කර ගැනීම අවශ්‍ය වෙයි. මෙහිදී අපගේ අවධානය, පුද්ගල මට්ටම්වල සිට ව්‍යුහාත්මක සාධක තරාද, මුළු සමාජයන් කරා ද යොමු විය යුතුය.

සතර වන අවශ්‍යතාව වන්නේ පූර්ණ වශයෙන් ඝාතනයෙන් නිදහස් සමාජවල ලක්ෂණ අවබෝධ කර ගැනීමයි. මෙහිදී අපරිමිත විචලනයන් ඔස්සේ අතිශය විවිධ රූපාකාර මතුවීමේ හව්‍යතාව අපගේ අවධානයට පාත්‍ර විය යුතුය. මිනිසාගේ බහු–විධ උත්පාදක ශක්තිය සැලකිල්ලට ගැනීමේදී මෙකී සමාජ අවශ්‍යයෙන්ම සමාජාතීය හැඩ තල, ලක්ෂණ දරනු ඇතැයි සිතිය නොහැකිය. මෙකී අවශ්‍යතා සතරින් සමහර විට, මෙම සතරවැන්න වඩාත්ම නිර්මාණශීලී කර්තව්‍යය යැයි සැලකිය හැකි මුත්, ඇත්ත වශයෙන් සම්පූර්ණ කාර්යභාරයම ඉතා ඉහළ නිර්මාණශීලිත්වයක් ඉල්ලා සිටියි. මුල් අවශ්‍යතා තුන ඓතිහාසික හෝ සමකාලීන සන්දර්භයන් තුළින් සොයා පාදා ගන්නා කරුණුකාරණාවල සප්‍රමාණත්වය ගැන අගැයීමක් ඉල්ලා සිටී. මේ මගින් ලබා ගන්නා දැනුම, සදාචාරාත්මක වශයෙන් පිළිගත හැකි, ව්‍යුහාත්මක වශයෙන් සාක්ෂාත් කර ගත හැකි සහ සමහර විට උපකල්පනාත්මක වශයෙන් අවලෝකනය කළ හැකි, පුද්ගල, සමාජ සහ ගෝලීය ජීවිතයේ කොන්දේසි පිළිබඳ ප්‍රගතිගාමී ගවේෂණ සමග එකී සතර වැනි අවශ්‍යතාවය විසින් සම්බන්ධ කරනු ලබන්නේය. වෝල්ට් විට්මන් කවියා කරන අභියෝගය බඳු අභියෝගයක් එය අප ඉදිරියේ තබයි. "සීමාවලින් ඔබට පිම්මකි, නමුදු වඩාත් ළඟට ගෙන එයි.": (Whitman 1977 (1855); 71)

ඝාතන–නැඹුරු ලක්ෂණයන්ගෙන් පහරනු ලැබූ කවර සමාජයක් හෝ වේවා, එකී ප්‍රතිබාධක නිසා, නිර්ඝාත ජීවයේ කවර ගති

ලක්ෂණ පරාසයකට මිනිසා සමත්ද, එම පූර්ණ පරාසය මේ දක්වා ප්‍රදර්ශනය කිරීමට අසමත් වූ බව උපකල්පනය කළ හැකිය. එනමුත් ඓතිහාසික සහ සමකාලීන ගෝලීය පරිමාණයේ අත්දැකීම් උපයෝගී කර ගනිමින් – දැනට ප්‍රදර්ශිත හැකියා උපකල්පනාත්මක වශයෙන් සංයෝජනය කිරීමෙන්– කවර සමාජයක් උදෙසා වුව නව නිර්ඝාත හැකියා ප්‍රග්‍රහණය කළ හැකි වනු ඇත. තවද, එබඳු අනුභූතික පදනමකින් නිපන් අන්තර්ඥානය, ඝාතන–මුක්ත සමාජයන්ගේ අපේක්ෂිත ලක්ෂණ සහ ඒ කරා යොමු වන සාධාරණ ක්‍රියාවලීන්, (වර්තමානයේ පවතින තත්වයන් ගෙන් පටන් ගෙන සාක්ෂාත් කර ගන්නා අරමුණින්) හඳුනා ගැනීම දෙසට යොමු වූ "පිරිසිදු න්‍යායික" ගවේෂණයන් තුළට එල්ල කළ යුතුය.

### රූප සටහන 1

### ඝාතනයේ පුනීලය




ව්‍යවහාරික භාවිතාවන්ට දායක වීම් වස්, පිරිසිදු න්‍යාය සංවර්ධනයේ ලා නිරත වන විද්‍යාවන් මෙන් නොව, (උදා: ගණිතය, භෞතික විද්‍යාව, ආර්ථික විද්‍යාව), උපන්‍යාසීය හෙවත් සෝපාධික න්‍යායික පරිකල්පනය කෙරේ නැඹුරුතාවක්, දේශපාලන විද්‍යාව මේ දක්වාම ප්‍රකට කොට නැත. මේ කාරණය, විශේෂයෙන්ම ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රපංචය සම්බන්ධයෙන් සත්‍යය. ප්‍රචණ්ඩත්වයට හිස නමන දේශපාලන විද්‍යාව අහිංසාවාදී නිර්මාණශීලත්වය අධෛර්යමත් කරන සුළුය. වෘත්තික පුහුණුව තුළදී එය, "මනෝරාජික", "විඥානවාදී", සහ "අයතාර්ථවාදී" අපගාමී මාර්ගයක් වශයෙන් ගර්හාත්මකව ඉවතට විසි කෙරෙන තත්වයන් තුළ, දේශපාලන විද්‍යා බුද්ධිය අනවරත මාරකත්වය තුළ සිරගත වීමට තල්ලු කර දැමී ඇත. නිර්ඝාත නිර්මාණශීලිත්වය මෙහිදී නිදහසේ ප්‍රතිඥාවක් පිරිනමා සිටින්නේය.

නිර්ඝාත විශ්ලේෂණයෙන් ගලා එන මූලික දැනීම, 'ඝාතනයේ පුනීලය' නමින් චිත්‍රණය කළ හැකි, අප විසින් හඳුනා ගනු ලබන 'පංච භූමීන්ට', අදළව විකල්පයන් නිර්මාණය කිරීම අරමුණු කර ගත් පරිවර්තක ක්‍රියාමාර්ග තුළට යොදා ගැනීම අවශ්‍යය.

ඝාතන කලාපය වූ කලී, මිනීමැරුම්වල සිට සමූල ඝාතනය දක්වා වූ ලේ වැගුරුම් භූමියයි. සමාජානුයෝජන කලාපය නම් මිනිමැරීමට මිනිසුන් ඉගෙන ගන්නා අවකාශයයි; ඍජුව පුහුණුව ලබා ගැනීමෙන් හෝ වක්‍රව, අනුකරණයෙන් හෝ මේ උගැන්ම සිදුවෙයි. සංස්කෘතික තත්වාරෝපණ කලාපය තුළදී, ඝාතනය මග නොහැරිය හැකි සහ නීත්‍යානුකූල ප්‍රපංචයක් වශයෙන් පිළිගැනීමට අපව නැඹුරු කරවනු ලැබේ. මෙලෙස තත්වාරෝපණය කරන්නා වූ සාධක අතර, ආගම්, දේශපාලන මතවාද, ජයග්‍රහණ සහ කෘෘරත්වය උත්කර්ෂයට නැංවීම, පවුල් සම්ප්‍රදායයන්, නීති සම්ප්‍රදායයන්, ජන සංනිවේදන මාධ්‍ය සහ කලාව යනාදිය ගිණිය හැකිය. ව්‍යුහාත්මක වැරගැන්නුම් කලාපය විසින් සමාජාර්ථික සබඳතා, ආයතන, ද්‍රව්‍යාත්මක මාධ්‍යනය සපයනු ලැබේ. ස්නායු–ජීව–රසායන ශක්‍යතා කලාපය තුළ පැවැත්ම උදෙසා හෝ විලෝපීය ලක්ෂණ නිසා හෝ ඇති මාරකත්වයට (මෙන්ම නිර්ඝාත චර්යාව උදෙසා ද) දායකවන්නා වූ ශාරීරික, ස්නායුවේදීය සහ මස්තිෂ්ක කෘත්‍ය සාධක අඩංගු වන්නේය. (Lopez - Reges 1998; Mortan 2000).

අදාළ සෑම කලාපයක් තුළ මෙන්ම, ඒවා හරහා ද නාභිගත ව්‍යායාමයන් යෙදවීම මගින්, නිර්ඝාත විකල්පයන්ගේ විකසිත වන්නාවූ, දිග හැයරන්නාවූ පංකාවක් බවට මෙකී ඝාතනයේ පුනීලය වෙනස් කිරීමක් වශයෙන් නිර්ඝාත පරිවර්තන කාර්යභාරය පරිකල්පනය කළ හැකිය. (රූපසටහන 2 බලන්න).

මේ වෙනස් කිරීම් වූ කලී ඝාතන කලාපය තුළට කරන්නා වූ යට දැක්වෙන මැදිහත් වීම් හරහා සිදුවෙතැයි අපේක්ෂිතය; අධ්‍යාත්මික සහ නිර්–මාරක අධි තාක්ෂණික ක්‍රමෝපායයන්, නිර්ඝාත සමාජානුයෝජනය සහ සංස්කෘතික තත්වාරෝපණය, සමාජයේ පැවැත්ම සහ පරිවර්තනය සඳහා මාරකත්වය නොඉල්ලන තත්ත්වයන් සහතික කරන දුරට සමාජාර්ථික සාධක ප්‍රතිව්‍යුහගත කිරීම, ඝාතනයට යොමු කරන්නා වූ ජීව–විද්‍යාත්මක

නැඹුරුතාවන්ගෙන් නිදහස ලබා දෙන සායනික, ඖෂධවේදීය, ශෛනික සහ ස්වංය-පරිවර්තක භාවනාමය ක්‍රියාමාර්ග මෙන්ම, ජීව- ප්‍රතිපෝෂණාත්මක පියවර යනාදී වශයෙනි.

**රූප සටහන 2**

**නිර්ඝාතන විකල්පයන්ගේ දිග හැරෙන්නා වූ පංකාව**




## නිර්ඝාතන ක්‍රියා මූලධර්ම

ඝාතනය යථාභූත කරමින් අභිසරණය වන්නා වූ යට කී කලාපයන් තුළ නිර්ඝාතන විකල්පයන් නිර්මාණය කිරීමේ කාර්යභාරයන්ට අදාළ වූ, නිර්ඝාතන දේශපාලන විශ්ලේෂණයේ තර්කනය විසින් ඉල්ලා සිටින දැනීම සම්පාදනය කිරීමට අමතරව, දෛනික ජීවිතයේ සිට ගෝලීය දේශපාලනය දක්වා පුද්ගලික සහ සාමූහික තීරණයන්ට ආධාර කරනු වස් මූලධර්ම පාරප්‍රාප්තියට ගෙන ඒම නිර්ඝාතන සුසමාදර්ශ සංක්‍රාන්තියක් විසින් අවශ්‍ය කර සිටියි. ප්‍රායෝගික අත්දැකීම් ද, ගවේෂණාත්මක ආභාසනය ද සංයෝජනය කර ගන්නා වූ පර්යේෂණාත්මක සප්‍රමාණකරණය මගින් එකී පියවර අභිවර්ධනයට ලක් කළ හැකිය. හමුදා මිනිස්-පරිගණකය සහ එබඳු 'වර්චුවල් යථාමය' (ත්‍රිමාන රූපාකාර පරිගණක උත්පාදිත ආභාසනය) සටන් ආභාෂණයන් මේ වනවිටත් ඉතා දියුණු අදියරකට ගෙනවුත් ඇත.

20 ශත වර්ෂයේ කැපී පෙනෙන මහජන ව්‍යාපාර (ගාන්ධියානු සහ කිංගියානු ව්‍යාපාර බඳු ඒවා) තුළින් නැගී ආ නිර්ඝාතන මූලධර්ම අතර, පහත සඳහන් ඒවා අපගේ විශේෂ අවධානයට ලක් විය මනාය:

* ආගමික වේවා, මානවවාදී වේවා, ජීව–ධරණීය සම්ප්‍රදායයන්ගෙන් ශක්තිය සහ අනුප්‍රාණය ලබා ගන්න.

* තමාගේ ජීවිතයට ද, අනෙකාගේ ජීවිතයට ද ගෞරව කරන්න.

* සියළු දෙනාගේ යහපැවැත්ම සොයා යන්න. ප්‍රචණ්ඩත්වය බිඳින්නේය; අහිංසාව එකතු කරන්නේය.

* ගැටුමකදී යටත් කිරීම, ගර්භාවට පත් කිරීම, විනාශ කිරීම, සමූල ඝාතනය කිරීම නොව මුල සිට අග දක්වාම සමාදානයම සොයා යන්න.

* දුකට පත්වූවන්ගේ දුක් පීඩාවේ හේතු සාධක ඉවත් කිරීම් වස් නිර්මාණශීලි සේවය සඳහා එකතු වන්න.

* නිර්මාණශීලි වන්න. තාක්ෂණික ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය වර්තමාන මට්ටම් කරා ළඟා කිරීමට මහත් වූ නිර්මාණශීලි බවක් අවශ්‍ය විය. නිර්ඝාත පරිවර්තනය සඳහා ඊටත් වඩා නිර්මාණශීලිත්වයක් අවශ්‍ය වනු ඇත.

* විපර්යාසය සඳහා පර්යේෂණකාමී ප්‍රවේශයක් ඇති කර ගන්න. ජයග්‍රහණයන්ගෙන් මෙන්ම පරාජයන්ගෙන් ද ඉගෙන ගනිමින් නිර්ඝාත සමාජයන්ගේ ආසන්න මාදිලීන් අනුක්‍රමික වශයෙන් සොයා යන්න.

* පුද්ගලික සදාචාර සම්පන්න ක්‍රියාවක උදාහරණයේ සිට අහිංසාවාදී ජන බලය යෙදවීම දක්වා වූ පෞද්ගලික මෙන්ම, මහා පරිමාණයේ සමාජ ක්‍රියාවන්ට ගෞරව දක්වන්න.

* අනුමිත වශයෙන් ධෛර්යසම්පන්න වන්න. ප්‍රචණ්ඩත්වයට ආධාර කිරීමෙන් වළකින්න. නිර්ඝාත විකල්පයන් ශක්තිමත් කිරීම උදෙසා එම ආධාරය පිරිනමන්න.

* පොළොව මත සැහැල්ලුවෙන් පියවර තබන්න. පරිසරය මත ද සහෝදර මිනිසුන් මතද, ඝාතනයට දායක වන්නා වූ පැවතුම් පීඩනය අඩු කරන්න.

නිර්ඝාත ගවේෂණයට සහ ක්‍රියාකාරිත්වයට සහභාගි වන සෑම කෙනෙකුටම, ගෝලීය ජීවිතය තුළ ඒ ඒ නිශ්චිත තත්වයන් සහ

සන්දර්භයන්ට උචිත පරිදි, නිර්ඝාත ජීවය පූර්ණ ලෙස තහවුරු කිරීම් වස්, වඩාත් බලගතු මූලධර්ම සහ කුසලතා, ප්‍රගතිගාමී ලෙස පූර්ණත්වයට පත් කරන්නට දායක විය හැකිය. වර්තමාන දේශපාලන විද්‍යාවේ සන්දර්භය සලකා බලන විට, නිර්ඝාත සමාජ සාක්ෂාත් කර ගැනීමේ භව්‍යතාවය පිළිගැනීම විසින්, එහි සෑම අංශයක්ම, පැති කඩක්ම වෙනුවෙන් ප්‍රශ්න මතු කෙරෙයි. ප්‍රචණ්ඩත්වයේ අනිවාර්ය බව සහ සුජාත බව කෙරේ ඇති පොදු හැඩගැස්ම කරන කොට සමාජයේ අනෙකුත් සාමාජිකයින් මෙන්ම, දේශපාලන විද්‍යාඥයින් වන අප තුළ ද පහත දැක්වෙන මතයන් කෙරේ නැඹුරුතාවක් විවිධාකාරයෙන් මතුවනු දැකිය හැකිය; **ප්‍රචණ්ඩවාදී–** සමාජයේ හෝ තමාගේ යහපත සඳහා ඝාතනය ප්‍රයෝජනවත් ලෙස සැලකීම; **ප්‍රචණ්ඩත්වයට නැඹුරු** – වාසිදායක යැයි හැගෙන විට ඝාතනයට යොමු වීම හෝ ඊට අධාර කිරීම; **උභයවාදී** – ඝාතනයට මෙන්ම, ඝාතනය නොකර සිටීමට, ඊට ආධාර කිරීමට හෝ විරුද්ධ වීමට එක සමාන යොමුවක් පෙන්වීම, **ඝාතනය මග හරින** – ඝාතනය කිරීමට හෝ ඊට අධාර කිරීමට නැඹුරුවක් නොපෙන්වන මුත්, ඊට සූදානම්ව සිටීම; **අහිංසාවාදී** – ඝාතනය නොකිරීමට සහ මාරකත්වයට පිටුබලය දෙන සාධක වෙනස් කිරීමට කැප වීම. සමස්ත වශයෙන් ගත් කල, මුල් යොමු සතර ප්‍රචණ්ඩත්වය ගම්‍ය කරන නොහොත් එය පිළිගන්නා සුළු දේශපාලනයක් සහ දේශපාලන විද්‍යාවක් සංලක්ෂණය කරති'යි කිව හැකිය. අවසාන යොමුව නිර්ඝාත දේශපාලන විද්‍යාවක් සම්පාදනය කිරීම සඳහා හඬ නංවයි. විද්‍යාවේ ද සමාජයේ ද නිර්ඝාත පරිවර්තනය සඳහා දායක වීම මෙකී නව දේශපාලන විද්‍යාවේ කාර්යභාරය වන්නේය.

වර්තමාන දේශපාලන විද්‍යාව, විද්‍යාමාන වශයෙන් හෝ අනුශය වශයෙන් ප්‍රචණ්ඩත්වයට පිටුබලය දෙන එකක්, යනුවෙන් අප විසින් ලක්ෂණය කිරීමෙන්, සියලුම දේශපාලන විද්‍යාඥයින් සිය දේශනාගාරවලදී, හමුදා සරඹ නිලධාරීන් මෙන් 'මරනු, මරනු' යනුවෙන් හඬ තලමින් සිය සිසුන් පොළඹවතැයි අදහස් කරනු නොලැබේ. එමෙන්ම, සිවිල් සහ ජාත්‍යන්තර යුද්ධ වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදී ආයතන (පක්ෂ දේශපාලන ක්‍රියාකාරීත්වය, මැතිවරණ, ව්‍යවස්ථා සම්පාදනය, නෛතික ප්‍රවර්ධනය) ආදේශ කිරීම මගින් ප්‍රචණ්ඩත්වය මග හැරීම සහ සංහිඳියාව සඳහා

දේශපාලන විද්වතුන් දක්වන්නා වූ දායකත්වය අවප්‍රමාණ කිරීමක් ද මින් අදහස් නොකෙරේ. එනමුත්, වර්තමාන දේශපාලන විද්‍යාවේ ප්‍රචණ්ඩත්වයට ඉඩ හරින ස්වභාවය මෙන්ම, නිර්ඝාතන විකල්පයන්ගේ භව්‍යතාවය හඳුනා ගැනීම විසින් චර්යාධර්මී-ආනුභවික මෙන්ම ආනුභවික-චර්යාධර්මී අභිවර්ධනය සඳහා ප්‍රතිඥාවක් පිරී නැමෙනු ලැබේ. එමගින්, මෙම ඥාන ශාඛාවේ ප්‍රතිමානක-ආනුභවික සහ ආනුභවික-ප්‍රතිමානක පදනම තුළට, නිදහස, සමානාත්මතාවය, සාධාරණත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මූලධර්ම සමග එක පෙළට, නිර්ඝාතය ද ස්ථානගත කිරීමක් ගම්‍ය කෙරේ.

## අහිංසාවාදී විද්‍යාත්මක විප්ලවය

නිර්ඝාත සමාජයන්ගේ උදව පිළිබඳ භව්‍යතාව පිළිගැනීම, දේශපාලන විද්‍යාවේ අහිංසාවාදී විද්‍යාත්මක විප්ලවයක් ගම්‍ය කරයි. එහිලා අන්‍යෝන්‍ය වශයෙන් බැඳුනු අනු-විප්ලව හතක් අවශ්‍යය; **ප්‍රතිමානක විප්ලවය-** ඝාතනය පිළිගැනීමේ සිට ප්‍රතික්ෂේප කිරීම දක්වා; **සිද්ධිවාචක විප්ලවය**-නිර්ඝාත සමාජ පරිවර්තනයට ආධාරක වන සාධක හඳුනා ගැනීම, **න්‍යායික විප්ලවය** - නිර්ඝාත පරිවර්තනයේ හේතුප්‍රත්‍යයන් සහ ක්‍රියාවලීන් අවබෝධ කර ගැනීම, **අධ්‍යාපනික සහ පුහුණු විප්ලවය-** නිර්ඝාත පරිවර්තනය උදෙසා දැනීම සහ නිපුණතා ලබාදීම, **ව්‍යවහාරික විප්ලවය**-නිර්ඝාත ඥානය භාවිතාවේ යෙදවීම සහ අත්හද බැලීම, **ආයතනික විප්ලවය** -නිර්ඝාත පරිවර්තනය සඳහා පහසු කාරක සංවිධාන නිර්මාණය කිරීම සහ අනුවර්තනය කර ගැනීම සහ **ක්‍රමවේදීය විප්ලවය-** නිර්ඝාත පරිවර්තනය සඳහා වඩාත් උචිත වන්නා වූ විමර්ශන, විශ්ලේෂණ සහ ක්‍රියාමාර්ග සම්පාදක විධික්‍රම නිර්මාණය කිරීම සහ අනුවර්තනය කර ගැනීම.

## ප්‍රතිමානක විප්ලවය

මෙහිලා ගම්‍ය කෙරෙන ප්‍රතිමාන සංක්‍රාන්තිය වනාහි ඝාතන අත්‍යවශ්‍යකත්වයේ සිට නිර්ඝාත අත්‍යවශ්‍යකත්වයක් කරා වන මාරු වීමයි. මෙය සිදුවිය හැකි එක ආකාරයක් නම් චර්යාධර්මීය සහ ආනුභවික සොයා ගැනීම් විසින් අන්තර්-ක්‍රියාකාරිව ජනිත කොට පෝෂණය කරන්නා වූ සමුච්ජගත ක්‍රියාවලියක ප්‍රතිඵල වශයෙන් එය සිදුවීමයි. චර්යාධර්මීය වශයෙන් ගම්‍යමාන ප්‍රගමනය ගන්නේ

මෙබඳු ධාවන මාර්ගයකි; ඝාතනය චර්යා ධර්මීය අත්‍යවශ්‍යකත්වයකි' යන ආස්ථානයේ සිට ඝාතනය විවාදාත්මක අත්‍යවශ්‍යකත්වයකි' දක්වා; එතැනින්, අහිංසාව උපන්‍යාසීය වශයෙන් ගවේෂණය කිරීම ප්‍රඥාගෝචරය යන්න හරහා, අහිංසාව ප්‍රතිමානක ප්‍රඥප්තියකි නොහොත් කැපවීමකි' යන්න දක්වා සමාන්තර ආනුභවික ප්‍රගමනය මේ අකාරය; 'නිර්ඝාත සමාජ අභව්‍යය' යන දැක්මේ සිට නිර්ඝාත සමාජ ප්‍රශ්නකාරීය' යන්න දක්වා; නිර්ඝාත සමාජවල ලක්ෂණ තථ්‍ය වශයෙන් සහ උපන්‍යාසීය වශයෙන් ගවේෂණය කිරීම හරහා නිර්ඝාත ලෝකයක් තුළ නිර්ඝාත සමාජ නිර්මාණය කිරීමට සහ පවත්වා ගැනීමට අවශ්‍ය ඥානය සෙවීම උදෙසා වන විද්‍යාත්මක කැපවීම කරා. චර්යාධර්මීය අභියෝගය ඉදිරියේ ආනුභවික ප්‍රතිචාරය සහ ආනුභවික අභියෝගය ඉදිරියේ චර්යාධර්මීය ප්‍රතිචාරය–යනාදී වශයෙන් වූ අන්තර්– විනිවිදීමේ ක්‍රියාවලීන් ගේ ආධාර ඇතිව, අහිංසාවාදී මූලධර්මය සහ ප්‍රචණ්ඩ දේශපාලනය මැදින් වේබර් ගොඩනඟා ඇති මහා ප්‍රාකාරය තරණය කළ හැකිය. වර්තමාන ශාස්ත්‍රාලීය දේශපාලන විද්‍යාවේ පොදු චර්යාධර්මීය පදනම ලෙස සැලකෙන "සාක්ෂිය සහ අනුමානය පිළිබඳ රීතීන් කෙරේ ඇති දෘඪ කැපවීමට" දැන් මේ ආකාරයට, **ජීවය කෙරේ වූ දෘඪ කැපවීම** ද එකතු කළ හැක්කේය. (Almond 1996:89).

**රූප සටහන 3**

**නිර්ඝාත ප්‍රතිමානක–ආනුභවික සුසමාදර්ශ පරිවර්තනයේ ධාවන ක්‍රියාවලිය**

| ප්‍රතිමානක මාරුව | අන්තර්–ක්‍රියාවලීන් | ආනුභවික මාරුව |
|---|---|---|
| ඝාතනය අත්‍යවශ්‍යය | ⟷ | අහිංසාව අභව්‍යය |
| ↓ | | |
| ඝාතනය ප්‍රශ්නකාරීය | ⟷ | අහිංසාව ප්‍රශ්නකාරීය |
| ↓ | | |
| ඝාතනය පිළිගත නොහැකිය | ⟷ | අහිංසාව ගවේෂණය කළ යුතුය |
| ↓ | | |
| අහිංසාව අත්‍යවශ්‍යය | ⟷ | අහිංසාව භව්‍යය |

## සිද්ධිවාචක විප්ලවය

සිද්ධිවාචක වශයෙන් ගත් කල නිර්ඝාත සංක්‍රාන්තිය, ප්‍රචණ්ඩත්වය භාර ගන්නා කතිකාවන් විසින් මග හැර ගොස් ඇති, නැතහොත් අවප්‍රමාණය කර ඇති නිර්ඝාත මිනිස් ශක්‍යතා පිළිබඳ සාක්ෂි නැවත සොයා ගැනීමක් සහ නිසි අවධාරණයට ලක් කිරීමක් ගම්‍ය කරයි. එබඳු සිද්ධිවාචක දත්ත, ස්නායුවේදයේ සිට නිර්–මාරක අධිතාක්ෂණ ක්‍රමවේදයන් දක්වා වූ පරාසයක පවතින්නේය. ප්‍රචණ්ඩත්වයෙන් පෙඟුණු ඓතිහාසික සහ සංස්කෘතික පරිසරයක් තුළ මතු වූ නිර්ඝාත විභවයන්ගේ විද්‍යාමාන වීම් මෙහිලා විශේෂ වැදගත් කමක් දරයි. උදාහරණ වශයෙන් ක්‍රි:පූ 399 වර්ෂයේ ග්‍රීසියේ, ඇතීනියානු සෙනෙට් මණ්ඩලයේ 500ක් දෙනා අතුරින් 140 දෙනෙක් සොක්‍රටීස්ව මරණ වධයට පත් කරනවාට විරුද්ධව ඡන්දය දුන් බව වාර්තාගතය. (Stone 1989: 187). ජපානයේ බෞද්ධ හෙයිආන් යුගයේ දී (ක්‍රි: වර්ෂ 794–1192), වසර 350ක් පමණ තිස්සේ මරණ දඬුවම පැනවීම නොකරන ලදී. (Nakomura 1967:145). අමෙරිකා එක්සත් ජනපදයේ, 1917 අප්‍රේල් 4 ද සහ 6 ද, සෙනෙට් සභිකයින් හය දෙනෙක් සහ නියෝජිත මන්ත්‍රීවරුන් පනස් දෙනෙක් ජර්මනියට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කිරීමේ තීරණයට එරෙහිව ඡන්දය භාවිතා කළහ. රුසියාවේ 1917, ඔක්තෝම්බර් 23 දා, බොල්ෂෙවික් පක්ෂයේ මධ්‍ය කාරක සභාවේ සාමාජිකයින් නිල වශයෙන්ම දෙදෙනෙක්, (නොනිල වශයෙන් සමහර විට පස් දෙනෙක් හෝ හය දෙනෙක් විය හැකිය) සන්නද්ධ විප්ලවය පිළිබඳ ලෙනින්ගේ ප්‍රතිපත්තියට විරුද්ධ වූහ. (Shub 1976: 271). අමෙරිකා එක්සත් ජනපදයේ, 1945 ජූලි මාසයේ අග භාගයේ දී, එනම් හිරෝෂිමා සහ නාගසාකි පරමාණු බෝම්බ ප්‍රහාරයන්ට දින කිහිපයකට පෙර, මැන්හැටන් ව්‍යාපෘතියේ විද්‍යාඥයින් 150 දෙනාගෙන් 90 දෙනෙක් තමන් දායක වී නිර්මාණය කරන ලද මාරක අවිය කවර හෝ යුද්ධමය ප්‍රහාරයක් සඳහා යොදවනු ලැබීමට එරෙහිව ඡන්දය දුන්හ. (Giovannitti and Freed 1965: 168, Alperovitz 1995). 1996, අමෙරිකානු රජයේ නාවික හමුද සේනාංකයක් (Marine Corps) නිර්–මාරක අවි පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය සහ ලබා ගැනීම උදෙසා ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ද අනෙකුත් රාජ්‍ය ආයතනවල ද, ඊට අදාළ සියළුම ක්‍රියාකාරීත්වය සම්බන්ධීකරණය කරන්නා වූ 'විධායක හස්තය' බවට පත්විය.

(Lewer and Schofield 1997: 45). දැනට, නිර්–මාරක අවි භාවිතා වන්නේ මාරක තාක්ෂණයට ප්‍රතිබද්ධ අවශේෂයක් වශයෙන් වුවද, යට කී අවස්ථාව නිර්ඝාත ආරක්ෂක චින්තනයක් කරා මාරු වීමේ පූර්වගාමී පියවරක් වශයෙන් සැලකිය හැකිය.

සෑම සමාජයකට නිර්ඝාත ප්‍රවණතාවන් පිළිබඳ අතීත සහ වර්තමාන දර්ශක සම්පාදනය කිරීමට, නිර්ඝාත සිද්ධි වාචක සංක්‍රාන්තිය අපේක්ෂා කරන්නේය.

**න්‍යායික විප්ලවය**

පුද්ගලික තීරණයන්ට, සිවිල් සමාජ ක්‍රියාවන්ට සහ මහජන ප්‍රතිපත්ති සම්පාදනයට මෙන්ම, නිර්ඝාත විශ්ලේෂණයේ තර්කනයට අවශ්‍ය කෙරෙන දැනීම අභිවර්ධනය කරනු වස් ප්‍රතිමානක සහ ආනුභවික න්‍යායන් නිර්මාණය කිරීම මෙකී න්‍යායික විප්ලවය ගම්‍ය කරයි. උදාහරණ වශයෙන් න්‍යායික අවලෝකනයේ පුරෝගාමී ප්‍රභවයන් වන මූලධර්මීය, උපයෝගිමය සහ ක්‍රියාවලීන්ට අනුබද්ධ ක්ෂේත්‍රයන්ගේ සංයෝජනය, නිර්ඝාත දේශපාලන බලයේ පරිවර්තනීය ශක්තිය පිළිබඳ ඉතා ඉහළ ප්‍රතිවේධයක් ලබාදීමට සහතික වෙයි. ප්‍රථම ප්‍රභවය වූ කලී, සම්ප්‍රදායයිකව මග හැර යාමට භාජනය වන, සත්‍යය නොහොත් සාධාරණත්වය සොයා යන්නා වූ පුද්ගලික සහ සාමූහික ක්‍රියාවන් තුළ රැඳී පවතින ජීව–ධාරක ආධ්‍යාත්මික බලවේගයේ වැදගත්කම පිළිබඳ ගාන්ධිගේ අවධාරණයයි. මේ කරුණ, උදාහරණ වශයෙන් **සත්‍යග්‍රහයේ විද්‍යාව** (The Science of Satyagraha) යන කෘතියේ ලා ගාන්ධි මැතවින් පහදා දෙයි. (1970); ගාන්ධි ලියූ පරිදි, නිර්ඝාත බලයේ අවිනාශී, අපරාජිත ප්‍රභවය වන්නේ – සෑම ආගමක්ම හරහා යන අධ්‍යාත්මික හුය ලෙස පෙනෙන සත්‍යය, ප්‍රේමය සහ අහිංසාව වශයෙන් නිර්වචනය කළහැකි-දේවත්වය කෙරේ වූ ජීවමාන විශ්වාසයයි. මනුෂ්‍ය ජීවිතයේ මූලික නීතිය වන්නේ අහිංසාවයි. ප්‍රචණ්ඩත්වය යනු එම නීතිය උල්ලංඝනය කිරීමයි.

දෙවැනි ප්‍රභවය, ජීනේ ෂාප් විසින් The Politics of Nonviolent Action: (1973) කෘතියේ ලා සංගෘහිත අහිංසා බලය පිළිබඳ න්‍යායයි. දේශපාලන බලයේ යටහත් වීමේ–පරාධීනකරණයේ ස්වභාවය පිළිබඳව විනිවිදින විශ්ලේෂණයක් මත සිට, ෂාප් (Sharp) අහිංසාවාදී

අරගලයේ ඓතිහාසික වශයෙන් ප්‍රදර්ශනය කෙරුණු ක්‍රමවිධීන් සමුදායයක් හඳුන්වා දෙයි. ඒ හරහා ඔහු, අහිංසාවාදී දේශපාලන පරිවර්තනයේ ගතිකයන් පිළිබඳව උපායමාර්ගික විශ්ලේෂණයක් ඉදිරිපත් කරයි. ෂාප්ගේ ප්‍රවාදය වන්නේ හුදු අහිංසාවාදී දේශපාලන ක්‍රියාවන්, සරලවම, උපයෝගීමය වශයෙන් බලගතු බවයි; මෙහි දී, ආගමික, ආධ්‍යාත්මික හෝ සමාජවාදී ප්‍රතිපත්ති කෙරේ පූර්ව–කැපවීමක් අත්‍යවශ්‍ය නැත.

තිර්සාත න්‍යායික පරිකල්පනයට මූලාශ්‍ර වන තෙවන ප්‍රභවය නම්, ප්‍රචණ්ඩත්වයේ සම්භවයට අදාළව අවශ්‍යතා තෘප්ත නොවීමේ තත්වයන් පිළිබඳව ජෝන් බර්ටන් ගේ විශ්ලේෂණයයි. එහිදී, අහිංසාවාදී පරිවර්තනය සාක්ෂාත් කර ගැනීමේ ලා දායක වන අවශ්‍යතා තෘප්ත කිරීමේ ක්‍රියාවලීන් පිළිබඳ නිර්දේශයක් හෙවත් වට්ටෝරුවක් ඔහු සම්පාදනය කරයි. බර්ටන්ගේ න්‍යාය. Deviance, Terrorism & War: The Process of Solving Unsolved Social and Political Problems (1979) යන කෘතියේ මෙන්ම, ඔහුගේ අනෙකුත් කෘතීන් (1984,1996, 1997) තුළ ද සංගෘහිතය. බර්ටන්ගේ ප්‍රවාදය වන්නේ මිනී මැරීමේ සිට යුද්ධය දක්වා වූ සියලු වර්ගයේ ප්‍රචණ්ඩත්වය මනුෂ්‍ය අවශ්‍යතා උල්ලංඝනය කිරීමේ හේතුවෙන් පැන නගින බවයි. අනන්‍යතාවය සහ ආත්ම ගෞරවය පිළිගැනීම මේ අතර ප්‍රධානය. අනෙකාගේ අවශ්‍යතා උල්ලංඝනය කරන්නන් හට ද ඊට භාජනය වන්නන් හට ද ඇත්තේ එකම අවශ්‍යතාය. අවශ්‍යතා උල්ලංඝනය වන තත්වයන් යටතේ, සාරධර්මවලට ගරු කරන මෙන් ඉල්ලා සිටීමෙන් හෝ මර්දනකාරී පිළිවෙත්වලින් හෝ මාරකත්වය යටපත් කළ නොහැකිය. කළ යුත්ත නම් අවශ්‍යතා උල්ලංඝනය වූවන් සියලු දෙනාට තම අවශ්‍යතා තෘප්ත කර ගැනීම උදෙසා ගැටළු විසඳීමේ ක්‍රියාවලීන්ට සහභාගි වීමට ඉඩ හරින්නා වූ අවකාශයක් නිර්මාණය කිරීමයි. අහිංසාවාදී ලෝකයක අහිංසා සමාජ සාක්ෂාත් කර ගැනීම අරබයා එකී ප්‍රවේශය සැබෑ ප්‍රතිඥාවක් ලබා දෙන්නේය.

අධ්‍යාත්මික බලය, උපයෝගී සමාර්ථ්‍යය සහ සහභාගී ගැටළු නිරාකරණ මාර්ගය යන ප්‍රභවයන් ත්‍රිත්වය විසින්, අහිංසාවාදී න්‍යාය අරබයා පිරිනමන සංරචක, ඓතිහාසික තත්වයන්, රජය, පන්තිය, ආර්ථිකය, ආයතන, සමාජ– ලෛංගිකත්වය, වර්ගය, ජාතිය, ආගම, සංස්කෘතිය, පරිසරය, අනාගත අපේක්ෂා ඇතුළු දේශීය සහ ගෝලීය

වශයෙන් වූ විවිධ පැති කඩවල්වලට අදාළව සන්දර්භගත කළ හැකිය. මෙලෙස අහිංසාවාදී න්‍යායයේ සන්දර්භකරණය සහ නිර්මාණශීලීත්වය අභිවර්ධනය කිරීම උදෙසා වැදගත් දායකත්වයක් පහත කියැවෙන පර්යේෂකයන් විසින් සපයා ඇත. Robert J. Burrowes (1996), Berenice A. Carroll (1998), Johan Galtung (1996), Brian Martin (1989), සහ Kate Mcguinness (1993).

### ව්‍යවහාරික විප්ලවය

ප්‍රතිමානක, සිද්ධිවාචක සහ න්‍යායික වශයෙන් වූ ඒකාබද්ධ මාරුව විසින් නිර්ඝාත දේශපාලන විද්‍යාවට නව ව්‍යවහාරික ආයෝජනයන් නොහොත් කැපවීම් යෝජනා කර සිටිනු ඇත. නිර්ඝාත චින්තනය, පුද්ගලයින්, සංවිධාන, ව්‍යාපාර ප්‍රතිපත්ති සහ ආයතන පිළිබඳ නව උනන්දුවක් සහ ඒවා සඳහා සංවර්ධනාත්මක (එහෙත් විවේචනාත්මක) ආධාරයක් මෙකී ප්‍රතිමානක මාරුව ගම්‍ය කරයි.

ප්‍රචණ්ඩකාරී ලෙස මර්දක රාජ්‍ය තන්ත්‍රයක් අහිංසාවාදී ලෙස පරිවර්තනය කිරීමට ආධාරක වීම අරබයා සුපැහැදිලි කැපවීමක් ෂාප්ගේ න්‍යාය පෙන්නුම් කරයි. තවදුරටත්, ස්ථිතික සහ අසංවේදී ප්‍රජාතන්ත්‍රවාදී තන්ත්‍රයන් කෙරේ ද ධනාත්මක බලපෑමක් කරමින්, ඒවා වෙනස් කිරීමට ඊට ආධාරක විය හැකි බව පෙනී යයි. බර්ටන්ගේ න්‍යාය විසින් දේශපාලන විද්‍යාවේ කේන්ද්‍රීය ව්‍යවහාරික භූමිකාව විය යුතු යැයි යෝජනා කරනු ලබන්නේ, සමාජ–දේශපාලන ගැටළු–විසඳීම අරමුණු කර ගත්, මිනිස් අවශ්‍යතාවන් කෙරේ අහිංසාවාදී ලෙස සංවේදී වන, ජන–සහභාගී ක්‍රියාවලින්ට උපකාර කිරීමයි. ගාන්ධියානු න්‍යාය, ආචාරධර්ම, ක්‍රමවේද සහ අවශ්‍යතා පිළිබඳ සංවේදිතාවය යන මාන ඒකාබද්ධ කර ගනිමින්, දේශපාලන, ආර්ථික, සමාජ සහ සංස්කෘතික වශයෙන් පවතින්නා වූ ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය පරිවර්තනය කිරීම සඳහා පිටුබලය සැපයීමට සුපැහැදිලි කැපවීමක් එය ගම්‍ය කරයි. එකී දැක්මට අනුව, යට කී ප්‍රචණ්ඩ ව්‍යුහ වූ කලී, ඝාතනයේ සහ ඝාතන තර්ජනයේ ප්‍රභවයන් වනවා සේම, එහි ප්‍රතිඵල ද වන්නෝය. නිර්ඝාත අධ්‍යාත්මික ප්‍රතිපදාවන්ගෙන් මග පෙන්වීම ලැබූ ගාන්ධි සහ කිංග් වැනි නායකයින්, අහිංසාවාදී ව්‍යුහාත්මක පරිවර්තනය සඳහා ගැඹුරින් කැප වූ බව මෙහිලා මෙනෙහි කළ හැකිය.

නිර්ඝාත විශ්ලේෂණයේ තර්කනය විසින් යෝජිත දැනුමෙන් පෝෂණය වෙමින්ද, 'ඝාතන පුනීලය අහිංසාවාදී විකල්පයන්ගේ පංකාවක්' බවට පෙරලීමේ කාර්යභාරය ගැන දැනුවත් වෙමින් ද, ව්‍යවහාරික නිර්ඝාත දේශපාලන විද්‍යාව ඉදිරියේ පවතින අභියෝගය වන්නේ ප්‍රජා මට්ටමේ සිට ගෝලීය මට්ටම දක්වා පරිවර්තනයට ආධාර කිරීමයි. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය සහ නිදහස් වෙළඳපළ තත්වයන් යටතේ පෞද්ගලික සහ සාමූහික මාරකත්වය එක දිගට රඳ පැවතීම පෙන්වා සිටින්නේ, මෙකී "ප්‍රජාතන්ත්‍රවාදය" හෝ "නිදහස්" වෙළඳම, ඒවා වර්තමානයේ සකස් වී ඇති ආකාරයට නම්, මනුෂ්‍ය යහපැවැත්ම සම්බන්ධයෙන් සහතිකයක් ලබා දීමට සමත් නොවන බවයි. මෙකී ගැටළු සහගත තත්වයන් "නිර්–ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය" සහ 'නො–නිදහස් වෙළඳපළ' සමග අන්තර්–ක්‍රියාත්මකව ඒකාබද්ධ වීමෙන් ව්‍යවහාරික නිර්ඝාත දේශපාලන විද්‍යා නිර්මණශීලීත්වයට එල්ල කරන්නේ සුවිශාල අභියෝගයකි.

## අධ්‍යාපනික විප්ලවය

නිර්ඝාත දේශපාලන විද්‍යාව තරා වූ ප්‍රගමනය, දේශපාලන විද්‍යාඥයින් සඳහා වූ වෘත්තික පුහුණුවේද, සමාජයේ අනෙකුත් සාමාජිකයින් වෙත ලැබෙන අධ්‍යාපන සේවාවන්ගේ ද සංක්‍රාන්තියක් ගම්‍ය කරයි. මාරක සම්ප්‍රදායයන් ප්‍රතිබිම්බනය කිරීමට හෝ තහවුරු කිරීමට ඍජුව හෝ වක්‍රව සහභාගි වන්නේ නැතිව, දේශපාලන විද්‍යා අධ්‍යාපනය කළ යුත්තේ නිර්ඝාත ගෝලීය පරිවර්තනය සඳහා අත්‍යවශ්‍ය කෙරෙන මහඟු දායකත්වය පිරිනැමීමයි. නිර්ඝාත සමාජ සඳහා උවමනා කෙරෙන නායකත්වයන් ද, පුරවැසි බව ද හදා වඩා පෝෂණය කිරීම එහි අභිමතාර්ථය විය යුත්තේය. මෙහිලා අභියෝගය වන්නේ පර්යේෂණ, ඉගැන්වීම, උපදේශනය, නායකත්වය, ප්‍රජා ක්‍රියාමාර්ග, සහ විචාරාත්මක අවලෝකනය සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රාගුණ්‍යය සහ කෞශල්‍යය, නිර්ඝාත ඥාණයේ සොයා ගැනීම්, යළි පාදා ගැනීම් සහ හුවමාරුව හරහා වර්ධනය කිරීමයි.

මනෝචිකිත්සකයින්ගෙන් සහ අධ්‍යාත්මික උපදේශකවරුන්ගෙන් බලාපොරොත්තු වන ආකාරයේ අති විශිෂ්ඨ ස්වයං–ඥාණයක්, සහභාගිකයන් අතර සම්පාදනය වීම, නිර්ඝාත දේශපාලන විද්‍යා

පුහුණුව විසින් අපේක්ෂා කෙරේ. ප්‍රචණ්ඩත්වය මෙන්ම, නිර්–ප්‍රචණ්ඩත්වය කෙරේ වන අපගේ විශ්වාසයන්ගේ, ආකල්පයන්ගේ සහ සංවේදනාවන්ගේ සම්භවයන් මෙන්ම, ඒවායේ ගම්‍යයන් ගැන ද අප තුළ ඉහළ මට්ටමේ අවබෝධයක් තිබිය යුතුය; නිර්ඝාත සමාජ විපර්යාසය උදෙසා ස්වයං–අවබෝධය පූර්ව අවශ්‍යතාවයකි. විවිධ ආධ්‍යාත්මික ප්‍රවේශයන්ට දෙරවල් හරින භාවනාව සහ චිත්ත සමාධියට අදාළ විද්‍යාත්මක ක්‍රම විධීන් පිළිබඳ පුහුණුව මෙහිලා නිශ්චිත වශයෙන් නිර්දේශ කළ හැකිය. අන්‍යෝන්‍ය යහපත සහ ආධාරය සඳහා පෞද්ගලික සහ වෘත්තික වැඩීමේ අත්දැකීම් එකිනෙකා සමඟ හුවමාරු කර ගැනීමට අවස්ථා සම්පාදනය කිරීම ද අවශ්‍ය කෙරේ. වෙනත් කරුණුවලදී කෙතරම් වෙනස් වන්නේ වුවද, දේශපාලන විද්වතුන් වශයෙන් අපි ජීව–ධාරක මූලධර්මය කෙරේ පූර්ණ ගෞරවයෙන් යුතුව, පුද්ගලිකවද සාමූහිකවද අන්‍යෝන්‍ය වශයෙන් ආධාර කරන සුළු, ජීවිත-කාල අභිවර්ධනයක් සොයා යා යුත්තෙමු. මෙම කැපවීම සැබැවින්ම සමාජයේ ඉතිරි සියලු සාමාජිකයන් දැරිය යුතු කැපවීමෙන් වෙනස් වන්නේ නැත.

මෙලෙස, උපදේශනය සහ වෙනත් ව්‍යාවහාරික භූමිකාවන් සඳහා සූදානම් වීමේදී, නිර්ඝාත දේශපාලන විද්වතුන් විසින් ඉලක්ක කළ යුතු ප්‍රගුණතා මට්ටම, වෛද්‍ය විද්‍යා පර්යේෂකයින්, වෛද්‍යවරුන්, වෛද්‍යවරුන්ගේ ගුරුවරුන් සහ ජීවිතය හා මරණයට අදාළ වෙනත් එබඳු වෘත්තීන් විසින් සාක්ෂාත් කළ යුතු මට්ටමට වඩා අඩු නොවිය යුතුය. එමෙන්ම, නිර්ඝාත සමාජයන්ගේ උදාව සඳහා දේශපාලන විද්වතුන්ගේ දායකත්වයේ වැදගත්කම, පුද්ගලික සහ මහජන සෞඛ්‍යය රැක ගැනීම අරබයා වෛද්‍ය වෘත්තිකයන් සතු කාර්ය භාරයේ වැදගත්කමට කිසිසේත් දෙවෙනි නොවිය යුතුය. මේ දෙපිරිසම මනුෂ්‍ය ජීවිතය, මරණය සහ යහපැවැත්ම ගැන උනන්දු විය යුතුය; විශිෂ්ටතම නව දැනීම මත සිට ඔවුහු රෝග නිධාන ගවේෂණය සහ විනිශ්චය, චිකිත්සා නිර්දේශනය සහ ප්‍රතිකාර සම්පාදනය කළ යුත්තෝය. මේ සමඟ, සමාජයේ සෑම සාමාජිකයෙකුටම නිර්ඝාත ගෝලීය පරිවර්තනය සඳහා දායකයෙක් විය හැකිය. එකී පසුබිම තුළ නිර්ඝාත දේශපාලන විද්‍යාවේ අධ්‍යාපන කාර්යභාරය වන්නේ, නිර්ඝාත නායකත්වයේ සහ පුරවැසි බවේ ජීවිතකාල අභිවෘද්ධිය උදෙසා ආධාරක වන දැනීම සහ

කුසලතාවන් ලබා ගනු පිණිස ද, පුද්ගල වර්ධනය සඳහා ද සෑම මට්ටමක අවස්ථාවන් සම්පාදනය කිරීමයි. සියළු දෙනා උගන්වති. සියළු දෙනා උගනිති.

අධ්‍යාපන ක්ෂේත්‍රයේදී විෂය නිර්දේශ සම්පාදනය විය යුත්තේ නිර්ඝාත විශ්ලේෂණයේ ඥාණ අවශ්‍යතා, ඝාතක නැඹුරුතා නිර්ඝාත විකල්පයන් බවට පරිවර්තනය කිරීම උදෙසා අවැසි ව්‍යවහාරික දැනීම අරබයා වූ උවමනාව, සහ පුද්ගලික සහ සමාජ ක්‍රියාවන් උදෙසා මාර්ගෝපදේශන මූලධර්ම දියුණු කිරීම සඳහා වූ ඉල්ලීම යනාදිය පදනම් කර ගනිමිනි. සමාරම්භක පාඨමාලාවක් හෝ මූලික සම්මන්ත්‍රණයක් විසින්, මාරක ස්වභාවයකින් ක්‍රියාත්මක වීමට මිනිසා ඓතිහාසිකව සහ සමකාලීනව ප්‍රකට කරන ලද ශක්‍යතාව පිළිබඳව ඉදිරිපත් කළ හැකි වඩාත් ගොරබිරම් සාක්ෂි සමග සහභාගිකයින් සම්මුඛ කළ යුතු වන්නේය. එවිට අප එක්ව ජීවිත-කාල අභියෝගයකට මුහුණ දිය යුත්තෙමු; අපගේ ඥාන ශාඛාවේ කාර්යභාරය අන් කිසිවක් නොව, මනුෂ්‍ය ඝාතනය තුරන් කිරීමට දායක වීමයි. සහභාගිකයන් මුහුණ දෙන දෙවන අධ්‍යාපන අත්දැකීම විසින්, අර තරමටම ප්‍රබල ලෙස නිර්ඝාත මිනිස් විභවය පිළිබඳ ගෝලීය වශයෙන් ඇති සාක්ෂි ඔවුන් වෙත යොමු කළ යුතු වන්නේ ය. තෙවන අදියරකදී, පුද්ගලික හා සමාජයීය වශයෙන් සිදුවන පරිවර්තනයන් සහ දෝලනයන් ද හඳුන්වා දීම මැනවි. සතර වන මූල අත්දැකීම ප්‍රථම කොට අපේක්ෂිත සමාජ නිර්මාණය උදෙසා කැපවන දේශපාලන ආයතන ගොඩනැගීමේ ලා මිනිසා පෙන්වන ලද උත්පාදක හැකියාව විමසීමට ලක් කළ මනාය. එමෙන්ම, ඝාතන-මුක්ත සමාජවල ගති ලක්ෂණ පරිකල්පනය කිරීමට අභියෝග කරන අතරේ, එම සමාජ නිර්මාණ කිරීමේලා දේශපාලන විද්‍යාවට දායක විය හැකි ආකාර සාකච්ඡා කළ හැකිය. යට කී සෑම සංරචකයකදීම, ප්‍රජා මට්ටම්වල සිට ගෝලීය මට්ටම දක්වා දැනීම සහ අවශ්‍යතා මෙන්ම, ගෝලීය-ප්‍රජා අන්තර් ක්‍රියාකාරීත්වයන් ද හඳුන්වා දිය මනාය.

මේ ආකාර වූ පදනම් මත නිර්ඝාත අධ්‍යාපනික නව රටාවන් ගොඩනැඟිය හැකිය. අහිංසාවාදී දේශපාලන විකල්පයන් පිළිබඳ උපාධි පාඨමාලාවක් පිළිබඳ උදාහරණයක් මෙබඳුය; තමා පුද්ගලිකව සංවේදී වන, උනන්දු වන ප්‍රවණතාවයේ කිසියම් පැතිකඩක් තෝරා

ගැනීමට සෑම සහභාගිකයෙකුට ආරාධනා කරන ලදී. අනතුරුව එහි ස්වභාවය සහ හේතු ප්‍රත්‍යයන් ගැන විමසීමට ආධාර විය හැකි පවත්නා සාහිත්‍ය මූලාශ්‍ර සහභාගිකයා විසින් අධ්‍යයනය කළ යුතුය. එබඳු ප්‍රචණ්ඩත්වයක් සමග සෘජුව ගනු දෙනු කිරීමට සිදුවන ප්‍රජාවේ සාමාජිකයන් හමුවී, එකී සිදුවීම්, ප්‍රවණතා, හේතුසාධක, විකල්පයන් යනාදිය ගැන ඔවුන්ගේ අදහස් ලබා ගැනීම කළ යුතුය. අනතුරුව තමා ස්වාධීනව විකල්පයන් පිළිබඳව නිර්මාණශීලීව සිතා බැලිය යුතුය, අවලෝකනය කළ යුතුය; ඉන්පසු තමාගේ විශ්ලේෂණය සහ ගැටළු විසඳීමේ යෝජනා අනෙකුත් සහභාගිකයින් සමග බෙදා හදා ගැනීම කළ යුතුය. අවසාන වශයෙන් සොයා ගැනීම් පිළිබඳ සාමූහික අවලෝකන ව්‍යායාමයක් හරහා, සාමූහිකව තීරණ ගැනීමේ ක්‍රියාවලියක් මගින් උචිත යෝජනා හා නිර්දේශ පිළිබඳව පොදු එකඟත්වයකට පැමිණිය යුතුය.

## ක්‍රමවේදීය විප්ලවය

ක්‍රමවේදීය අංශයන්ගෙන් සලකා බැලීමේදී, නිර්සාතන සංක්‍රාන්තියක්, පර්යේෂණ, අධ්‍යාපන, ව්‍යවහාරික දේශපාලන සහ ආයතන ගොඩනැගීමේ ක්‍රම විධීන් ගැන අලුතින් සිතා බැලීමට අභියෝගයක් එල්ල කරයි. අභියෝගය මෙයාකාරය: නිර්සාතන සොයා ගැනීම් උදෙසා පවතින විධික්‍රම අනුවර්තනය කර ගැනීම, නව විධික්‍රම සම්පාදනය සහ ස්නායුවේදය වැනි වෙනත් ඥාන ශාඛාවන් සතු විධි ක්‍රම නිර්සාතන පරිවර්තනය ට අදළ ගැටළු විසඳීම සඳහා යෙදීමට අනුබල දීම යනාදී වශයෙනි. විශේෂයෙන්ම ඝාතන කලාපය තුළ පර්යේෂණ සහ මැදිහත් වීම් සඳහා විධි ක්‍රම සම්පාදනය අභියෝගාත්මකය. ඝාතනයේ අභිසරණාත්මක කලාප තුළ සහ ඒවා හරහා අදාළ විමර්ශන දියත් කිරීමට උචිත විවිධ ක්‍රම ගැන ද කිවයුත්තේ එයමය. එන්න එන්නම ත්වරණයකින් යුතුව වර්ධනය වන්නා වූ විමර්ශන ක්‍රම විධීන්, නිර්සාතන දේශපාලන විද්‍යාවට විශාල පිටුබලයක් ලබා දෙනු ඇත. මේ වන විට අවම වශයෙන් පහත දැක්වෙන ආකාරයේ ක්‍රමවේද නිර්ණය වීමක් නිරීක්ෂණය කළ හැකිය; දර්ශනික, ඓතිහාසික, ආයතනික, සහ නෛතික විශ්ලේෂණ; සම්මුඛ සාකච්ඡා, සහභාගික නිරීක්ෂණ, ප්‍රත්‍යෙක අධ්‍යයන, තුලනාත්මක විමර්ශන, අන්තර්ගත විශ්ලේෂණ, පඨිත අර්ථකථන, ක්‍රීඩා න්‍යාය, මහජන තෝරා ගැනීම් විමසුම, සංඛ්‍යාන

අනුමිතිය, සමීක්ෂණ විමර්ශන, විද්‍යාගාර සහ ක්ෂේත්‍ර පර්යේෂණ, මානව–පරිගණක ආභාසන, සහ මෙකී ඒවා අවශ්‍යතාවයේ පරිදි විවිධාකාරයට සංයෝජනය කිරීම. අධ්‍යාපන ක්‍රම විධීන් සම්ප්‍රදායික දේශණවල සිට, කියවීම්–විමර්ශන, පර්යේෂණ සහකරුවන් සහ අභ්‍යාසලාභීන් අතර සංවාද හරහා ස්වයං–මාර්ගෝපදේශී පරිගණක අනුසාරී ඥාණ ගවේෂණය දක්වා වූ පරාසයක් තුළ විහිදේ. එමෙන්ම, දේශපාලන ව්‍යවහාරික භාවිතාව ගැන සැලකීමේදී, එය මෙබඳු අවස්ථා ඇතුළත් කර ගත හැකිය; ව්‍යවස්ථා නිර්මාණය, ගැටුම් සමථනය, සංවිධාන උපදේශනය, මැතිවරණ උපදේශනය, මාධ්‍ය ව්‍යාපෘතීන් සැලසුම, ආරක්ෂක ප්‍රතිපත්ති උපදේශනය, සහ සමාජ තීරණ ක්‍රියාවලින් තුළ ඍජු නායක–පුරවැසි සහභාගිත්වය යනාදිය වේ.

මේ ආකාර වූ ඉතා පුලුල් පරාසයක් හරහා විහිදෙන බුද්ධිමය සහ ව්‍යවහාරික කෞෂල්‍යයන් වෙත ඉදිරිපත් කෙරෙන ක්‍රමවේදීය ප්‍රශ්නය නම් "මනුෂ්‍ය පැවැත්මෙන් මාරකත්වය ඉවත් කොට දැමීම උදෙසා පැරණි සහ නව ක්‍රමවිධීන් වඩාත් සාර්ථක ලෙස දායක කර ගන්නේ කෙසේද?" යන්නයි.

**ආයතනික විප්ලවය**

නිර්ඝාත සුසමාදර්ශ මාරුවක් ආයතනික වශයෙන් මතු කරන ප්‍රශ්න නම්, දේශපාලන විද්‍යාව නම් වූ ඥාණ ශාඛාව සංවිධානය විය යුත්තේ කෙසේද?, එහි අනුශාඛා කවරේද? එය අනෙකුත් ඥාණ ශාඛාවන් සහ ශාස්ත්‍ර ධාරාවන් සමග ත්, සමාජයේ අනෙකුත් ආයතන සමග ත් පැවැත්විය යුතු සබඳතා කෙබඳුද? යනාදියයි. මේ වනාහි මෙකී ඥාණ ශාඛාවේ පවත්නා ව්‍යුහයන් තුළම ගෝලීය, ජාතික සහ ප්‍රජා මට්ටම්වලට අනුබද්ධව නිර්ඝාත පර්යාලෝකයක සිට කරන්නා වූ ප්‍රශ්න නැගීමකි. එය එක් අතකින්, අලුතින් ඉදිවන ආයතන තුළ නිර්ඝාත දේශපාලන විද්‍යා අංශ නිර්මාණය කිරීමේ හැකියාව ගම්‍ය කරයි. යනාඑසේ නම් අහිංසාවාදී සමාජ අවශ්‍යතා උදෙසා නව අන්තර්–විෂයික හෝ දෙමුහුන් වෘත්තීන් නිර්මාණය කිරීමක් පවා ප්‍රකට කරයි.

අද්‍යතනයේ දී, දේශපාලන විද්‍යාව ගෝලීය මට්ටමින් නියෝජනය කරන්නේ 1949 දී පිහිටුවන ලද **'ජාත්‍යන්තර දේශපාලන විද්‍යා**

**සංගමය'** (International Political Science Association - IPSA) විසිනි. එහි මූල සාමාජිකත්වය ජාතික දේශපාලන විද්‍යා සංගම් හතළිස් දෙකක් විසින් දරනු ලබන අතර, යටත් පිරිසෙයින් සාමාජිකයින් 35,689ක් සම්පූර්ණ වශයෙන් ඊට අනුබද්ධය. ඔව්හු ආයතනික වශයෙන් IPSAවිධායක කමිටුව හරහා නියෝජනය වන්නෝය. (උපග්‍රන්ථ – A). මෙකී විශාල සාමාජිකත්වයේ බහුවිධ අවශ්‍යතා ප්‍රධාන අධ්‍යයන ක්ෂේත්‍ර 18ක් ද, පර්යේෂණ කමිටු 32ක් ද, අධ්‍යයන කණ්ඩායම් 12ක් ද හරහා ව්‍යුහාත්මක වශයෙන් ප්‍රකාශයට පත් වන්නෝය. (උපග්‍රන්ථ – B). මෙකී චිත්‍රය තුළට ජාතික සංගම්වලින් නියෝජනය නොවන්නා වූ රටවල දේශපාලන විද්‍යාඥයින් ද, එලෙසම ජාත්‍යන්තර මට්ටමේ දේශපාලන විද්වතුන්ගෙන් අධ්‍යාපනය හදාරන්නා වූ විද්‍යාර්ථීන් අතිවිශාල සංඛ්‍යාවක් ද ඇතුළත් විය යුතුය.

IPSA ව්‍යාපෘතියක් ඇසුරින්, ලේඛකයින් හතළිස් දෙදෙනෙකුගේ දායකත්වයෙන් බිහි වූ **'දේශපාලන විද්‍යාවේ නව අත්පොතක්'** (A New Hand book of Partical Science, Goodin and Klingemann, eds., 1996) නම් වූ ග්‍රන්ථය මෙකී ඥාණ ශාඛාවේ වර්තමාන තත්ත්වය පිළිබඳ සමීක්ෂණයක් ඉදිරිපත් කර සිටියි. පසුගිය දශක දෙකකට වඩා කාලයක් තුළ වූ වර්ධනයන් ඇසුරින්, මෙම ලේඛකයන් දේශපාලන විද්‍යාවේ ප්‍රධාන අනුශාඛා අටක් හඳුනා ගනිමින් ඒවා ගැන අවලෝකනයක යෙදෙති; දේශපාලන ආයතන (තර්කානුසාරී තෝරාගැනීම් සහ නෛතික පර්යාලෝක), දේශපාලන චර්යාව (බහුපක්ෂ ක්‍රමය සහ ඡන්ද දායකයින් ආමන්ත්‍රණය, ආයතනික සහ පර්යේෂණාත්මක සැලසුම්), තුලනාත්මක දේශපාලනය (මහා පරිමාණික–චර්යා පර්යාලෝක, ප්‍රජාතන්ත්‍රීකරණ අධ්‍යයන), ජාත්‍යන්තර සබඳතා (නව–යථාර්ථවාදය සහ නව–ලිබරල්වාදය, පශ්චාත්-අනුභූතිවාදී සහ ස්ත්‍රීවාදී පර්යාලෝක), දේශපාලන න්‍යාය (දාර්ශනික සම්ප්‍රදායයන්, ආනුභවික න්‍යාය), මහජන ප්‍රතිපත්ති සහ පරිපාලනය (තුලනාත්මක ප්‍රතිපත්ති විශ්ලේෂණය; මත හා අදහස්, අවශ්‍යතා සහ ආයතන), දේශපාලන ආර්ථික විද්‍යාව (සමාජ විද්‍යාත්මක සහ ඩවුන්සියානු පර්යාලෝක), දේශපාලන ක්‍රමවේදය (ගුණාත්මක ක්‍රමවිධි, පර්යේෂණ සැලසුම්කරණය සහ පර්යේෂණ ක්‍රම) යනු

ඒවායි. මෙම ග්‍රන්ථය IPSA සභාපති විසින් "දේශපාලන විද්‍යාව නව ශත වර්ෂය කරා ගෙන යන්නට මීට වඩා හොඳ ශාස්ත්‍රීය සංග්‍රහයක් තිබිය නොහැකිය" යනුවෙන් හඳුන්වනු ලැබ ඇත.

කෙසේ වුවද, එහි ශක්තිමත් අංශ තිබියදීම, මෙකී "නව අත්පොත" පෙන්වා සිටින්නේ දේශපාලන විද්‍යාව තුළ නිර්ඝාත විෂයාත්මක පරිවර්තනයේ අවශ්‍යතාවයි. උදාහරණ වශයෙන් එහි සූචිය තුළ "ප්‍රචණ්ඩත්වය" සහ "නිර්-ප්‍රචණ්ඩත්වය" යටතේ කිසිදු සඳහනක් දක්නට නොලැබෙන අතර "මිනීමැරීම", "සමූල ඝාතනය", "මරණ දඬුවම", "හමුදාව", "ත්‍රස්තවාදය", හෝ "පොලීසිය" යන වචන එහි පිටු අතර දක්නට ලැබෙන්නේම නැත. යුද්ධය යටතේ එහි සඳහන් හැටක් ඇතුල් වී තිබුණේ වුවද, 'සාමය' යටතේ ඇත්තේ අටක් පමණි. නාම සූචිය තුළ 'හිට්ලර්' සහ 'ලෙනින්' සඳහන් වුවද එහි "ගාන්ධි" හෝ 'කිංග්' ගැන සඳහනක් නැත. ප්‍රජාතන්ත්‍රවාදය, ජාතික ආරක්ෂාව, සහ හමුදා කුමන්ත්‍රණ වැළැක්වීම යනාදිය අරමුණු කරගත් අහිංසාවාදී දේශපාලන අරගලයේ න්‍යාය සහ භාවිතය පිළිබඳ ලෝකයේ දැනට සිටින අග්‍රගණ්‍ය දේශපාලන විද්වතා වන ජීනේ ෂාප්ගේ නම හෝ කෘතීන් (උදා. The Politics of Nonviolent Action, Gene Sharp, 1973) එහි ලා හමු නොවේ. ඒ ගණයේම, අහිංසාවාදී ගැටුම් සමථකරණය පිළිබඳ න්‍යායාචාර්යවරයෙක් වන ජෝන් බර්ටන් හෝ ඔහුගේ කෘතීන් ගැන ද (John Burton 1979, 1984), කිසිදු සඳහනක් නැත. ජොහාන් ගල්තුං (Johan Galtung) නමැති ගෝලීය සාම අධ්‍යයන ක්ෂේත්‍රයේ අතිවිශිෂ්ඨ පුරෝගාමියා සහ ඔහුගේ ශාස්ත්‍ර දායාදය ගැන ඇත්තේ සුළු සඳහනකි.

IPSA හි විශාලතම සහ පැරණිම ජාතික සංරචකය නම් 1903 දී පිහිටුවන ලද, සාමාජිකයින් 13,300 කගෙන් සමන්විත අමෙරිකානු දේශපාලන විද්‍යා සංගමයයි. (American Politicl Science Association - APSA). සාමාජික අවශ්‍යතා ප්‍රධාන ක්ෂේත්‍ර අටක්, අනුක්ෂේත්‍ර අනූහයක් සහ විශේෂ අධ්‍යයන තිස් එකක් හරහා ව්‍යුහගත වී තිබේ. (උපග්‍රන්ථ –C). APSA සහ IPSA හි අවශ්‍යතා ව්‍යුහයන් මූලික වශයෙන් සමානය. අමෙරිකානු දේශපාලන විද්‍යාවේ ප්‍රධාන ක්ෂේත්‍ර නම්; අමෙරිකානු ආණ්ඩුව සහ දේශපාලනය, තුලනාත්මක දේශපාලනය, ජාත්‍යන්තර දේශපාලනය, ක්‍රමවේදය, දේශපාලන දර්ශනය සහ න්‍යාය, මහජන නීති සහ අධිකරණය, මහජන (රාජ්‍ය) ප්‍රතිපත්ති,

සහ මහජන (රාජ්‍ය) පරිපාලනය, යන ඒවායි. APSA හි "ගැටුම් ක්‍රියාවලීන්" සහ "ජාත්‍යන්තර ආරක්ෂාව සහ ආයුධ පාලනය" යන තේමා යටතේ විශේෂ අංශ දක්නට ලැබුනත් නිර්සාත දේශපාලන විශ්ලේෂණයේ සහ ක්‍රියාවේ තර්කනයට අනුකූල දැනීම සහ ගැටළු–විසඳීමේ සාධක කෙරේ නාභිගත ලෙස අවධානය දක්වන්නා වූ කිසිදු ආයතනික ව්‍යුහයක් එය සතුව නැත.

උදාහරණ වශයෙන් "ප්‍රචණ්ඩත්වය", "අහිංසාව" හෝ යටත් පිරිසෙයින් "සාමය" යන තේමාව ආවරණය කරන්නා වූ හෝ විශේෂ අංශ නොමැත. (ජාත්‍යන්තර සාම පර්යේෂණ සංගමය සමග සසඳ බලන්න.) පෙනී යන පරිදි, මාරකත්වය මත පදනම් වන සහ එමගින් ආරක්ෂා කෙරෙන "ප්‍රජාතන්ත්‍රවාදය" මානව ශිෂ්ටාචාරයේ අභිවර්ධනය සහතික කළ හැකි ඉහළම බලාපොරොත්තුවයි' යන සංස්කෘතික තත්වාරෝපිත මතය විසින් නිර්සාත ශිෂ්ටාචාර විකල්පයන් ගවේෂණයේ ලා අවශ්‍ය කෙරෙන ආයතනික දිශානතීන් හෝ නාභිගත කිරීම් නිෂේධනයට ලක් කරනු ලැබ ඇත. මේ අනුව බලන කල, අමෙරිකානු සහ ජාත්‍යන්තර දේශපාලන විද්‍යා සංගම් තුළ සම්පාදිත තේමා ව්‍යුහයන් විසින් නියෝජනය කරනු ලබන ශාස්ත්‍ර ධාරාවේ අධ්‍යයන ක්ෂේත්‍ර සහ අනු–ක්ෂේත්‍ර තුළ ද ඒවා හරහා ද මතු දක්වෙන ප්‍රශ්න නැඟීම නිර්සාත සුසමාදර්ශ මාරුවක් ගම්‍ය කරයි; "නිර්සාත සමාජවල හව්‍යතාවය ගැනත්, ඒවා උදා කර ගැනීම පිණිස ගත හැකි නිර්සාත මාර්ග ගැනත් කියා දෙන්නට පුළුවන් මොනවාද?" මෙයින් දැනට දිනාගෙන ඇති කඩඉම් කෙරේ අවධානය යෙදවිය යුතු බවත්, නව සංරචක හඳුන්වා දිය යුතු බවත් අදහස් වෙයි. උදාහරණ වශයෙන් අමෙරිකානු දේශපාලන විද්‍යාවේ "සම්ප්‍රදායයික" ක්ෂේත්‍ර හතර තුළ ප්‍රශ්න මතු කිරීමෙන්, මේ කරුණ සංනිදර්ශන ගත කළ හැකිය; දේශපාලන දර්ශනය සහ න්‍යාය, අමෙරිකානු ආණ්ඩුව සහ දේශපාලනය, තුලනාත්මක දේශපාලනය සහ ජාත්‍යන්තර සබඳතා.

**දේශපාලන දර්ශනය සහ න්‍යාය**

දේශපාලන දර්ශනය සහ න්‍යාය තුළ නිර්සාත සංක්‍රාන්තියකින් ඇඟවෙන්නේ සෑම සංස්කෘතියක් ම ආශ්‍රයෙන් නිපන් දේශපාලන චින්තා උරුමය පුනරාවලෝකනයට ලක් කිරීම හරහා නිර්සාත

ප්‍රතිවේධයන් සොයා පාද ගැනීමක් සහ නව නිර්ඝාත නිර්මාණශීලිත්වයක් හඳුන්වා දීමක්ය. උදාරහණ වශයෙන්, ඩෙනිස් ඩෝල්ටන් පෙන්වා දෙන පරිදි, ප්ලේටෝ නම 'Republic කෘතියේ ලා යුද්ධය, මරණ දණ්ඩනය සහ හමුද සංස්කෘතිය පිළිගත්තේ වුවද, එහිම සංගෘහිත “නිර්–හිංසා” ආචාරධර්මී පරමාදර්ශය වූ කලී දර්ශනිකයින්ට සහ දේශපාලන නායකයන්ට හඹා යන්නට සුදුසු ඉලක්කයකි. මේ පරමාදර්ශයම ප්ලුටාර්ක් ගේ මතු කියැවෙන නිරීක්ෂණය තුළින් ද පිළිබිඹු වේ; “පිහිය කරා යොමු වීම හොඳ වෙදෙක් ගේ හෝ රාජ්‍ය තාන්ත්‍රිකයෙක් ගේ හෝ ලක්ෂණයක් නොවේ. අවස්ථා ද්වයේදීම පෙන්නුම් කෙරෙන්නේ කෞෂල්‍යයේ මඳ බවයි. රාජ්‍ය තාන්ත්‍රිකයෙක් ඒ කරා පසු බසින්නේ නම් එතැන අමතර වශයෙන් අසාධාරණය ද කෲරත්වය ද රැඳී පවතින්නේය. “(Plutarch 10: 249). චීන සම්ප්‍රදායය පිළිබඳ මෙන්සියුස් ගේ නිරීක්ෂණ සමග එය සසඳා බලන්න. (ක්‍රි. පූර්ව 371–289): “ද්‍රව්‍ය බලය යොදවන අතරේ ගුණගරුක බවක් ප්‍රදර්ශනය කරන තැනැත්තා **පා** (ඒකාධිපතියා) නම් වේ.......... එහෙත් යමෙක් ගුණගරුක වෙමින් මිනිස් සුහදත්වය (**ජෙන්**) පුහුණු කරන්නේ ද, හෙතෙම රජෙකි (**වැන්ග්**). (Fung 1952:112). පුරාණ චීන සම්ප්‍රදායය තුළම හමුවන යුද්ධයේ සහ මර්දනයේ විවේචකයෙක් ද, “විශ්ව ප්‍රේමය” පිළිබඳ චින්තකයෙක් ද වන මෝ ට්සු ගේ චින්තන උරුමය ද මෙලෙස ගෝලීය වශයෙන් යළි සොයා ගන්නට වටනේය. (Fung 1952: 76-105).

ප්‍රචණ්ඩත්වයට අනුබල දෙන්නා වූ සම්භාව්‍ය සාහිත්‍ය පඨිත, මාරකත්වය ඉවත් කොට, අහිංසාවාදී ප්‍රතිවේධයන් පාදා අභිවර්ධනය කරනු පිණිස ප්‍රතිකථනයන්ට භාජනය කළ හැකිය. මීට උදාහරණ වශයෙන්, මැකියාවෙල්ලිගේ ප්‍රකට කෘතිය නැවත කියවීමට ලක් කරමින් චයිවත් සතානන්ද් විසින් සම්පාදිත එහි අපූරු ප්‍රතිකථනය The Nonviolent Prince (1981), හඳුන්වා දිය හැකිය. ක්ලෝස්විට්ස් ගේ ප්‍රකට කෘතිය වන On War අහිංසාවාදී ආරක්ෂක උපායමාර්ගවල මූලධර්ම ගවේෂණය කරනු පිණිස බරෝව්ස් විසින් ප්‍රතිකථනයට ලක් කරනු ලැබීම ද එබඳු තවත් අවස්ථාවකි. (Burrowes 1996). මේ ග්‍රන්ථ දෙකම, පුරාණ හින්දු අධ්‍යාත්මික සංහිතාවක් වන **භගවත් ගීතා** වේ අර්ජුන නම් මහා රණ වීරයාට ක්‍රිෂ්ණ දෙවිඳුන් විසින්

දෙන උපදේශ තුළින්, අහිංසාවාදී ක්‍රියා මූලධර්ම ගාන්ධි විසින් පාදා ගනු ලැබීම යම් ආකාරයකින් මතක් කරන සුළුය. (Gandhi, 1971).

ප්‍රචණ්ඩත්වයට අනුගත වන අතීත සම්භාව්‍ය සංහිතාවෝ වර්තමානයේ සහ අනාගතයේ අහිංසාවාදී ක්‍රියාකාරීත්වයට අභියෝග කරන්නෝය. හමුදාමය "යහගුණ" සහිත පාලකයින් විසින් පාලනය කරන්නා වූ සමූහාණ්ඩුවක් පරිකල්පනය කරන්නට ප්ලේටෝ ට හැකි වූවා නම්, නිර්ඝාත මූලධර්මයන් කෙරේ කැපවුනු ධෛර්යසම්පන්න නායකයින් සහ පුරවැසියන් විසින් නිර්මිත අහිංසාවාදී සමූහාණ්ඩුවක් පරිකල්පනය කරන්නට අපට දැන් පිළිවන. එකිනෙකා සමග යුධ කරන්නා වූ ආණ්ඩුවලට උචිත ව්‍යවස්ථාවන් ගැන විස්තර කථනයක යෙදෙන්නට ඇරිස්ටෝටල් ට හැකි වූවා නම් නිර්ඝාත සමාජයන් ගේ උදාවට ආධාරක වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවන් කෙටුම්පත් කිරීමට අපට දැන් පිළිවන. ප්‍රචණ්ඩත්වය හාර ගන්නා පාලන රටාවකට අවශ්‍ය කෞෂල්‍යයන් පිළිබඳ නිර්දේශයක් කරන්නට මැකියාවෙල්ලිට හැකි වූවා නම්, අහිංසාවාදී දේශපාලන බලයේ උපාය උපක්‍රම නිර්ණය කරන්නට අපට දැන් පිළිවන. ප්‍රචණ්ඩත්වයට ඒකාධිකාරී අයිතියක් පැම හරහා බලහත්කාරී ලෙස සමාජ සාමය රකින්නට වෑයම් කරන රකුසු රාජ්‍යයක් යෝජනා කරන්නට හොබ්ස්ට හැකි වූවා නම් මාරකත්වය අවශ්‍ය නොකරන, මානව අවශ්‍යතාවන් කෙරේ සංවේදී වන නව පාලන තන්ත්‍රයන් පිළිබඳ ගවේෂණය කරන්නට අපට දැන් පිළිවන. අත්තනෝමතික පාලනයක් පෙරළා දමනු පිණිස ප්‍රචණ්ඩ විප්ලවයක් සංකල්පනය කරන්නට ලොක්ට හැකි වූවා නම් අහිංසාවාදී ප්‍රජාතන්ත්‍රවාදී පෙරළියක් සඳහා උපාය උපක්‍රම කෙටුම්පත් කරන්නට දැන් අපට පිළිවන. අවසාන "ගණන් බේරා ගැනීමේ ක්‍රමය" ලෙස ප්‍රචණ්ඩත්වය සහිත පන්ති අරගලයක් සංකලපනය කරන්නට මාක්ස්ට සහ එංගල්ස් ට හැකි වූවා නම්, ආර්ථික සාධාරණත්වය පිළිබඳ යුග–සිහිනය සාක්ෂාත් කර ගැනීම සඳහා නිර්–ප්‍රචණ්ඩ අරගල ක්‍රියාදාමයන් සංකල්පනය කරන්නට දැන් අපට පිළිවන. සම්මුතිය උල්ලංඝනය කරන්නවුන්ට එරෙහිව මාරකත්වය යෙදවීමේ පදනම මත පවතින සමාජ ගිවිසුමක් නිර්දේශ කරන්නට රූසෝට හැකි වූවා නම් සහ, අද්‍යතන නායකයින් ද, ප්‍රචණ්ඩත්වය මත පවතින "ගිවිසුම්" සහ "ප්‍රඥාප්තීන්" ගැන දිගටම

කතා කරමින් සිටින්නේ නම්, නිර්ඝාත ප්‍රජාවන් තුළ සියළු දෙනාගේ යහපැවැත්ම උදෙසා අන්‍යෝන්‍ය කැපවීමේ තත්වයන් දකින්නට දැන් අපට පිළිවන. යුද්ධයට නොයැමේ (නිර්-යුද්ධ) නිරූපාධික ආස්ථානයකට දිගටම කැපවීම හරහා "අනවරත සාමයක්" පවත්වා ගැනීම ගැන සංකල්පනය කරන්නට කාන්ට් (1795,1959) ට පිළිවන් වී නම්, නිර්ඝාත ප්‍රතිපදාව ගෝලීය යථාර්ථයක් බවට පෙරළීමට අවශ්‍ය සංරචක හඳුනා ගන්නට දැන් අපට හැකිය. ප්‍රචණ්ඩ නිදහසක් සහ ප්‍රචණ්ඩත්වය තහවුරු කරන ව්‍යවස්ථාවක් පිහිටුවා සිටින සම්භාව්‍ය ප්‍රකාශනයක් අමෙරිකානු දේශපාලන සම්ප්‍රදායය විසින් අපට උරුම කරන්නේ වුවද, දැන් අපට අමෙරිකානු සමාජ ප්‍රචණ්ඩත්වයෙන් නිදහස ලබා දෙන අහිංසාවාදී නිදහස් ප්‍රකාශනයක් ද, නව නිර්ඝාත ව්‍යවස්ථාවක් ද සංකල්ප ගත කළ හැකිය. ප්‍රචණ්ඩත්වයේ අනිවාර්යතාවය පිළිගැනීමට සූදානම් විය යුතු අභිනියුක්තියක් ලෙස දේශපාලනය නම් කිරීමට වේබර්ට හැකි වී නම්, ප්‍රචණ්ඩත්වයෙන් නිදහස් වීමේ භව්‍යතාවය භාර ගන්නා අභිනියුක්තියක් ලෙස දේශපාලනය සහ දේශපාලන විද්‍යාව දැකීමට දැන් අපට පිළිවන. (Ardent 1970; Muller and Semelin;1995; Steger and Lind; 1999).

දර්ශනයේ සහ දේශපාලන න්‍යායේ ක්ෂේත්‍රයන් තුළට ගාන්ධියානු දේශපාලන චින්තාව බැරෑරුම් ලෙස විචාරාත්මක ආකාරයෙන් හඳුන්වාදීම නිර්ඝාත මාරුවක් මගින් ගම්‍ය කෙරෙයි. ප්‍රචණ්ඩත්වය තහවුරු කරන්නා වූ ලෝකයක් තුළ නොබෙල් සාම ත්‍යාගය සඳහා ගාන්ධිව එදා හඳුනා නොගැනීම, යට කී අවශ්‍යතාවයෙන් ගම්‍ය කෙරෙන අඩුව ගැන ඉඟි කරන්නේය. මේ වන විට මෙම කාර්යභාරය සැපිරීම සඳහා විවිධ මතවාදී සහ විෂයාත්මක පර්යාලෝකයන් ඇසුරේ සිට, ප්‍රධාන වශයෙන් ඉන්දියානු අර්ථකථකයෝ ද, ඔවුන් සමග එක්වන පුරෝගාමී ඉන්දියානු-නොවන දායකයෝ ද දැවැන්ත පරිශ්‍රමයක නියැළී සිටිති. (Dhawan 1957; Dange et al. 1977, Iyer 1973; Parekh 1989 a 1989 b; Banduraut 1969; Dalton 1993; Galtung 1992; Sharp 1979; Steger 2000).

අතීතයේ සහ වර්තමානයේ ලෝකයේ සියලුම සංස්කෘතික සංදර්භයන් තුළ බිහි වූ අහිංසාවාදී විකල්පයන් වෙනුවෙන් පෙනී සිටි ප්‍රකාශකයින්ගේ චින්තාවන් විසින් නිර්ඝාත න්‍යායේ

නිර්මාණශීලී අභිවර්ධනය උදෙසා අවස්ථා ඉදිරිපත් කරනු ලබන්නේය. ආතර් සහ ලීලා වෛයින්බර්ග් එකී කරුණට අදාළව ක්‍රි:පූර්ව 550 සිට ඉදිරියට සමීක්ෂණයක් ඉදිරිපත් කරති. (Arthur and Lila Weinberg, 1963). ඒ ආකාරයේම, බහු–ආගමික මූලයන් පිළිබඳ සමීක්ෂණයක් සම්පාදනය වී ඇත. (T.K.N. Unnithan and Yogendra Singh, 1973). ග්‍රීක–රෝමානු සහ යුරෝ–අමෙරිකානු සම්ප්‍රදායයන් තුළ සාමවාදයේ ඉතිහාසය පිළිබඳ අති දැවැන්ත විචාරාත්මක තොරතුරු සංග්‍රහයක් විල් මොරිසි ඉදිරිපත් කරයි. (Will Morrisey, 1996).

මෙලෙස අහිංසාවාදී දේශපාලන චින්තනය පිළිබඳ ගෝලීය පරිමාණයෙන් සමීක්ෂාවන් සහ ගවේෂණයන් දියත් කෙරෙද්දී විශ්මයජනක සොයා ගැනීම් ඇතැම් විට අපේක්ෂා කළ හැකිය. පියොංයෑං නුවර 1987 දෙසැම්බර් 3 දා හ්වාං යං යොප් නමැති දේශපාලන දර්ශනිකයා සමග කරන ලද සම්මුඛ සාකච්ඡාවකදී "දේශපාලනය" යන සංකල්පය පිළිබඳව ඔහු ඉදිරිපත් කළ අහිංසාවාදී නිර්වචනය එවැන්නකි. "දේශපාලනය යනු සෙනෙහස සහ සමානාත්මතාවය මත පදනම් ව සමාජයේ සෑම සාමාජිකයෙකුගේම අවශ්‍යතා සුසංවාදී කිරීමයි." ඒ අවස්ථාවේදී ඔහු හෝ ඔහුගේ සම්භාෂකයා හෝ "සෙනෙහස" සහ "නිර්මාණශීලී පරාර්ථචර්යාව" පිළිබඳ සරෝකින් නමැති සමාජ විද්‍යාඥයා විසින් කරන ලද අද්විතීය අධ්‍යයනයන් ගැන හෝ (Sorokin, 1948, 1954), ඊට සම්බන්ධ කළ හැකි, සාකච්ඡාව, ඒ හරහා තිරණ ගැනීම, සාමූහිකව ක්‍රියාත්මක වීම ගැන ඇරෙන්ඩ්ට් කල අවධාරණය ගැන හෝ (Arendt,1970), මිනිස් අවශ්‍යතාවන් කෙරේ සංවේදීවීමේ ක්‍රියාවලීන් ගැන බර්ටන් කළ අවධාරණය ගැන හෝ (Burton, 1970) දැන නොසිටියහ.

මේ සියල්ල නව නිර්ඝාත න්‍යායේ බීජාණු විය හැකිය.

## දේශපාලන භූමි අධ්‍යයන

ගම් මට්ටමේ සිට ජාතික රාජ්‍යයන්, ඉන් ඔබ්බට පාරජාතික තත්වයන් දක්වාත් (උදාහරණ: අමෙරිකානු රජයේ සහ දේශපාලනයේ භූමිය) වූ දේශපාලනික වශයෙන් සංවිධානය වූ සමාජ සහ ඒවායේ සංරචක පිළිබඳ පූර්ණවාදී අධ්‍යයනයන් තුළ නිර්ඝාත තර්කනය විසින් නව ප්‍රශ්න මතු කරනු ලබයි. මෙහිලා

අනාගතවාදී හැරල්ඩ් ලින්ස්ටන් විසින් සම්මුතියේ "උපකල්පනයන්ගේ ඇදීම" නමින් හඳුන්වන ලද ගැටළුව ජය ගැනීම අරබයා ද ධෛර්යවන්තව ප්‍රශ්න කිරීමක් කළ යුතුය. දේශප්‍රේමයේ බලකොටුව තුළ ප්‍රශ්න කරනු ලැබීමෙන් තොරව කල් යැවීමට දේශපාලන මාරකත්වය නැමැත්තක් දක්වයි. දේශපාලන භූමියක් තුළ ප්‍රශ්න නැගීම කළ නොහැකිද, එවිට ඉන් පිටත සිටින දේශපාලන විද්වතුන් කාර්යය භාර ගත යුතුය. නිර්ඝාත ප්‍රවේශය ප්‍රශ්න කිහිපයකට පිළිතුරු බලාපොරොත්තු වෙයි; ප්‍රථම කොට ඒ ඒ දේශපාලන සමාජයේ උද්භවය, විකාශය සහ පැවැත්ම සඳහා ඝාතනය දායක වී ඇත්තේ කෙසේද? කිසියම් දේශපාලන සමාජයක ස්වයං–ප්‍රතිරූපය සෝෂාකාරී මාරක ඉතිහාසයක් මත කෙතරම් දුරකට රඳා පවතින්නේද? කවර වර්ගයේ ඝාතන -රාජ්‍ය හෝ රාජ්‍ය–නොවන මූලයන් ආශ්‍රිතව සිදුවෙමින්– එක දිගට පවතින්නේද? ඒවායේ අනාගතය කෙබඳුද? නීතිය තුළ හෝ ඉන් පිටත, ආණ්ඩුවට පක්ෂව හෝ ඊට විරුද්ධව, රට තුළ දී හෝ ඉන් පිටතදී ඝාතනයන්ට සහභාගි වීමට හෝ ආධාර කිරීමට පුරවැසියන් සමාජානුයෝජනය වී ඇත්තේ කෙසේද? දේශපාලන, ආර්ථික, සමාජ සහ සංස්කෘතික මතවාද, භාවිතාවන් සහ ව්‍යුහයන් මාරකත්වයට දායක වන්නේ කෙසේද? අවශේෂ වටිනාකම් –භෞතික හෝ භෞතික නොවන, නිදහස සමානාත්මතාවය වැනි– හඹා යාමට යම් දේශපාලන සමාජයක් පෙන්වන හැකියාවට ඝාතනය කවර ආකාරයෙන් බලපා තිබේද?

දෙවනුව, සමාජයක නිර්ඝාත අදහස්, භාවිතාවන්, ප්‍රතිපත්ති සහ ආයතනවල ඓතිහාසික මූලයෝ කවරහුද? ඒවායේ වර්තමාන විද්‍යාමානවීම් කවරාකාරද, අනාගත ශක්‍යතා කෙබඳුද? එහි, ප්‍රචණ්ඩ දේශපාලන බලයට අහිංසාවාදී ලෙස ප්‍රතිරෝධය පෑමේ වාර්තාව කෙබඳුද? නිර්ඝාත සමාජයක් උදාකර ගැනීම උදෙසා වූ නිර්මාණශීලීත්වයේ සහ ගොඩනැගීම් ක්‍රියාවන්ගේ වාර්තාව කෙබඳුද?

දේශපාලන භූමි අධ්‍යයනය තුළ තෙවන අවශ්‍යතාව වන්නේ ඝාතනය සහ නිර්ඝාත තත්ත්වය අතර සංක්‍රාන්තීන්, ආපසු හැරීම් සහ දෝලනයන් පිළිබඳ වාර්තාව ප්‍රශ්න කිරීමයි. කවර ආකාරයේ චරිත, කණ්ඩායම්, සහ සංවිධාන මෙකී සංක්‍රාන්තීන් සම්බන්ධයෙන් වැදගත් වන්නේද? හමුද සෙබළු සාමවාදීන් බවට පත් වී තිබේද?

ඝාතකයින් අහිංසාවාදීන් බවට පෙරළී තිබේද? ප්‍රචණ්ඩ විප්ලවවාදීන් අහිංසාවාදී සමාජ පරිවර්තන මාර්ගයට පිවිස තිබේද? ආගමික චරිත මාරකත්වයේ අනුග්‍රහය ප්‍රතික්ෂේප කරන්නට පෙළඹී තිබේද? ප්‍රචණ්ඩත්වය භාර ගැනීම සහ ප්‍රතික්ෂේප කිරීම අතර සමාජයේ වැදගත් සංස්කෘතික සහ සමාජ නායකයින් දෝලනය වී තිබේද?

මරණ දඬුවම පැනවීම, අහෝසි කිරීම නැතහොත් නැවත පැනවීම අරබයා අදාළ වන්නා වූ සාපරාධී ක්‍රියා පිළිබඳ කවර වෙනස්කම් පැන නැගී ඇත්තේද? හමුදා සේනාංක විසුරුවා හැර තිබේද? විසුරුවා හරිනු ලැබූ ඒවා නැවත කැඳවා තිබේද? හමුදාව අහෝසි කොට තිබේද? පොලීසිය සහ පුරවැසියෝ ආයුධහරණයට පියවර ගෙන ඇතිද? ඔව්හු නැවත සන්නද්ධ වූවෝද? මුලදී මරණීය සතුරන් බවට පත්ව සිටි දෙපාර්ශවයක් අතර සැබෑ සාමකාමී සමථනයක්, සංහිඳියාවක් පැන නැගුණු අවස්ථා ඇත්තේද? සංහිඳියාව කරා ගිය යුධ පාර්ශව දෙකක් අතර නැවත මාරක ගැටුම් පැන නැගී ඇත්ද? ප්‍රචණ්ඩත්වයට ආධාරක වන්නා වූ ආර්ථිකයන් පූර්ණ වශයෙන් නැතහොත්, කොටසක් වශයෙන් අහිංසාවාදී පුද්ගල සහ සමාජ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දක්වමින් පරිවර්තනය වී තිබේද?

සතර වනුව, සංයෝජනය කොට නිර්ඝාත සංක්‍රාන්තික ක්‍රියාවලින් තුළ ප්‍රකාශිත වීමට ඉඩ හරින්නේ නම්, යම් සමාජයක් තුළ අපේක්ෂිත නිර්ඝාත ජීවන තත්ත්වයන් උදාකර ගැනීමට ප්‍රතිඥා දෙන්නාවූ, එකී දේශපාලන සමාජය අභ්‍යන්තරයේ පවතින්නා වූ ඓතිහාසික සහ සමකාලීන දේශපාලන, සමාජ, ආර්ථික සහ සංස්කෘතික අමුද්‍රව්‍ය කවරේද?

එබඳු සන්දර්භයක් තුළ නිර්ඝාත සමාජයේ උදාවට දායක විය හැකි ආගමික, මතවාදී, නෛතික, ආයතනික, ප්‍රතිපත්ති, සමාජ–ආර්ථික ව්‍යුහාත්මක අධ්‍යාපනික, මාධ්‍ය, කලා සහ අන්තර්–දේශපාලන සමාජ සබඳතා යනාදී ක්ෂේත්‍රයන්හි කළ යුතු වෙනස්කම් කවරේද?

ඝාතනයට සහ ඝාතන තර්ජනයට යළි පඩු බැසීමට ආධාරක නොවී නිදහස, සමානාත්මය, භෞතික යහ–පැවැත්ම සහ ආරක්ෂාව වැනි අවශ්‍යතාවල අභිවර්ධනයට පහසුකාරක විය හැකි කොන්දේසි හා සාධක කවරේද?

නිර්ඝාත මානව ශක්‍යතා පිළිබඳ ප්‍රශ්නය තුලනාත්මක දේශපාලන විමර්ශනයේ ක්ෂේත්‍රයට නිර්ඝාත සංක්‍රාන්තියක් විසින් ගෙන ආ යුතුය. සමාජ තුළ සහ ඒවා හරහා පුරවැසියන් සහ ආණ්ඩු විසින්, මාරක බලය භාවිතා කිරීම හෝ එසේ කිරීමේ තර්ජනය, ඉවත් කර දැමීමට අදාළව මත, ආයතන, ව්‍යූහ, ක්‍රියාවලින් සහ ප්‍රතිපත්ති පිළිබඳ ගෝලීය පරිමාණයේ තුලනාත්මක අධ්‍යනයන් මගින් අත්පත් කර ගත හැකි ප්‍රතිවේධයන් කවරේද? නිර්ඝාත විශ්ලේෂණ තර්කනයෙන් මාර්ගෝපදේශනය ලබමින් ප්‍රතිඵලදායි පරිවර්තක භාවිතාවන් සොයා යන තුලනාත්මක විමර්ශනය, තනිව වෙන්කොට ගත් දේශපාලන සමාජයක සීමාවන්ට ඔබ්බෙන් ගමන් කරමින් විකල්පයන් පිළිබඳ දැනීම ගොඩනගයි. ප්‍රජාතන්ත්‍රවාදී ආයතන, මානව හිමිකම්, ස්ත්‍රීන් දරන ස්ථානය, ළමුන්ගේ සුභසිද්ධිය, සහ ආර්ථික වර්ධන මට්ටම් යනාදිය අරබයා කළාක් මෙන්ම, සමාජයන් ඝාතන හෝ නිර්ඝාත නැඹුරුව අනුව තුලනාත්මක අගැයුමට ලක් කිරීමට සහ වර්ග කිරීමට පිළිවන. මාරකත්වයේ මිනුම් දඬු අතරට වෘත්තික ඝාතකයින් කරන ඝාතන, රාජ්‍ය ආරක්ෂක සහ රාජ්‍ය විරෝධී ඝාතන, පුරවැසියන් කරන මිනිමැරුම් සහ දිවිනසා ගැනීම්, ඝාතනය සඳහා වෘත්තික පුහුණුව, තාක්ෂණික ශක්‍යතා සහ මාරකත්වයට අනුබද්ධ දේශපාලන ආර්ථිකයේ භෞතික දර්ශක යනාදිය එකතු කළ හැකිය. එමෙන්ම ඒ ඒ දේශපාලන සමාජ විශ්ලේෂණයට භාජනය කිරීමෙන් නිර්ඝාත ලක්ෂණ අගැයීමට ලක් කොට සමාන්තර වර්ගීකරණයක් කළ හැකිය. මෙලෙස, ඝාතක ජාතීන් සහ නිර්ඝාත ජාතීන් පිළිබඳ තුලනාත්මක වර්ගීකරණයක් වාරික පදනමින් කිරීම ගෝලීය දේශපාලන විද්‍යාවට කළ හැකි මහඟු මහජන සේවාවකි. ගෝලීය කොටස් වෙළඳපල හෝ ක්‍රීඩා තරඟ දිනපතා අධීක්ෂණය කරනවාට වඩා මාරකත්වයේ මට්ටම්වල ඉහළ–පහළ යෑම් පිළිබඳවද නිර්ඝාත පරිවර්තක හැකියාවන්ගේ වර්ධනය හෝ මර්දනය පිළිබඳවද නොකඩවා අධීක්ෂණය කිරීම වඩා ඉහළ වැදගත් කමකින් යුක්තය.

වඩාත් සමාන නැතහොත් අඩුවෙන්ම සමාන කොන්දේසි යටතේ, දේශපාලන සමාජ හරහා මෙන්ම ඒවා තුළ ද සමාජ සංරචක සන්සන්දනයට ලක් කිරීම හේතු ප්‍රත්‍ය සහ විපර්යකාරක අවබෝධය

පුලුල් කිරීමේ ලා අවශ්‍යය. මෙහිලා ආගම්වල, මතවාදවල, කලාවේ, දේශපාලන පක්ෂවල, සමාජ ලෛංගික ප්‍රභේදයන්ගේ, වයස් කණ්ඩායම්වල, අධ්‍යාපන මට්ටම්වල, වාර්ගික කණ්ඩායම්වල, ආර්ථික ව්‍යවසායන්ගේ, විශ්ව විද්‍යාලවල සහ වෘත්තීන්ගේ මාරකත්වය හෝ අහිංසා ප්‍රතිපදාවන් කෙරේ ඇති නැඹුරුතාවයන් සලකා බැලිය හැකිය.

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්, අධිකාරවාදී රාජ්‍යයන්ට සාපේක්ෂව එකිනෙකාට එරෙහිව යුද්ධයට නැඹුරු නොවන බවත්, තමන්ගේම පුරවැසියන් මරන්නේ අඩුවෙන් බවත් කියන වර්තමාන දේශපාලන විද්‍යා ප්‍රවාදය අභිවර්ධනය කරනු වස් නිර්ඝාත තුලනාත්මක අධ්‍යයනයන් අත්‍යවශ්‍යය. පවතින්නේ ජනාධිපති–මූලික හෝ පාර්ලිමේන්තු–මූලික ව්‍යුහයක් වේවා, පැහැදිලිව විද්‍යාමාන වන ප්‍රචණ්ඩ සංස්කෘතියකින් පිටුබලය ලබමින් ලිබරල් ප්‍රජාතන්තවාදී රාජ්‍යයන් විසින් සහ ඒවා තුළ සිදු කෙරෙන්නා වූ අනවරත ඝාතන ක්‍රියාදාමයන් පෙන්නුම් කරන්නේ නිර්ඝාත ව්‍යුහාත්මක සහ සංස්කෘතික විකල්පයන් සඳහා ප්‍රතිවේධයන් දිනා ගැනීම අරබයා තුලනාත්මක අධ්‍යයනයන්ගේ ඇති විශාල වැදගත් කමයි. උදාරහණ වශයෙන් දෙවන පරිච්ඡේදයේ ලා සඳහන්, එකිනෙකාට නුදුරින් පිහිටි මෙක්සිකානු ගම්මාන යුගල ගන්න; ප්‍රචණ්ඩත්ව මට්ටම් අනුව එකක් පහළින් ද එකක් ඉහළින් ද තැබිය හැකි මෙම ගම් දෙක සමාජාර්ථික වශයෙන් එකිනෙකාට බෙහෙවින් සමාන වන්නේ වුවද, ඒ ඒ ගමට ආවේණික සංස්කෘතික ස්වයං–ප්‍රතිරූපය වශයෙන් එකිනෙකාගෙන් වෙනස් වේ. ප්‍රචණ්ඩ ගමේ වැසියෝ තමන් ප්‍රචණ්ඩ ස්වභාවයෙන් යුක්ත යැයි දකිමින් ඒ ප්‍රතිරූපය භාර ගෙන ඒ අනුව ක්‍රියාත්මක වෙති. අහිංසාවාදී ගමේ වැසියෝ තමන් සාමකාමී යැයි හඟිමින් ඒ ගැන අභිමානයෙන් යුතුව ජීවත් වෙති. (Fry 1994).

ප්‍රචණ්ඩත්ව මට්ටමින් ඉහළ ද පහළ ද ඇති ඉන්දුනීසියානු ගම් දෙකක ළමා ක්‍රීඩාවල තුලනාත්මක අධ්‍යයනයක් විසින් සොයා ගනු ලැබුවේ, සාපේක්ෂව ප්‍රචණ්ඩ වූ සංස්කෘතියේ දරුවන් මිනිස් සහ සත්ව යුධ හරඹ සහ සටන් ක්‍රීඩා කෙරෙහි යොමු වී සිටි අතර ප්‍රචණ්ඩත්වය අඩු සංස්කෘතිය තුළ ළමා ක්‍රීඩා බෙහෙවින් උල්ලාසජනක ක්‍රීඩා (උදාහරණ: වැල්වල පැද්දීම, වැඩිහිටියන්ගේ හා සතුන්ගේ හැසිරීම් රටා සාමකාමී ලෙස වින්දනාත්මක අනුකරණයට

ලක් කිරීම ආදී වූ) දෙසට නැඹුරුවක් ගන්නා බවයි. (Royce 1980). මෙබඳු සොයා ගැනීම්, බොක්සිං, හොකී, මල්ලවපොර, රගර් වැනි තරඟකාරී 'ස්පර්ශක' ක්‍රීඩාවන්ට අනුබද්ධ ප්‍රචණ්ඩ සංස්කෘතික සහසම්බන්ධක ගැන ප්‍රතිවේධයන්ට ආධාරක වෙති.

**ජාත්‍යන්තර දේශපාලනය**

ජාත්‍යන්තර දේශපාලනය, ජාත්‍යන්තර සම්බන්ධතා, ලෝක දේශපාලනය යනාදී විවිධ නාමින් ළකුණු කෙරෙන ක්ෂේත්‍රය තුළ සමස්තය සහ පුද්ගලයා කෙරෙහි පෙර නොවූ විරූ උනන්දුවක් සහ සංවේදිතාවක් නිර්ඝාත මාරුවක් විසින් සමගාමීව හඳුන්වා දෙනු ලබයි. එහිලා සම්ප්‍රදායයික වශයෙන් පවතින අතරමැදි ආයතන කෙරේ වූ උනන්දුව සමගම මහේක්ෂ මෙන්ම ක්ෂුද්‍ර (අන්වීක්ෂමය) විමර්ශන අඩංගු කර ගැනීමක් ගම්‍ය වේ. එක් අතකින්, ගෝලීය දේශපාලන සමාජයේ සංරචක (රාජ්‍ය සහ රාජ්‍ය–නොවන), ඒවා අතර සබඳතාවන්ගේ ව්‍යුහ, ගැටළු නිරාකරණයේ ක්‍රියාවලීන් සමස්ත චිත්‍රයකට ගනු ලැබේ. මෙයින් සන්දර්භයන් නොසලකා හැරීමක් හෝ අන්–ඓතිහාසික වීමක් හෝ අදහස් නොකෙරේ; ඉතිහාසය, මනුෂ්‍යවර්ගයාගේ ඉතිහාසයයි. සන්දර්භය නම් ගෝලීය සහ ප්‍රජා මට්ටමේ සාධකයන් අතර අන්‍යෝන්‍ය–පරායත්ත අන්තර්–ක්‍රියාවන්ගේ රටාවන්ය. අනිත් අතට, නිර්ඝාත ගෝලීය සමාජයක් සාක්ෂාත් කර ගැනීමේ යෝජිත භව්‍යතාවය, පරම්පරාවන් මතු වෙමින් සම්මිශ්‍රණය වෙමින්, නැති වී යන අතරේ උපතේ සිට මරණය දක්වා පොළව මත ජීවිතය බෙදා හදා ගන්නා වූ සෑම පුද්ගලයෙකුගේ ම යහපැවැත්ම කෙරේ අවධානය ඉල්ලා සිටියි. නිර්ඝාත දේශපාලන විශ්ලේෂණයේ මූලික ඒකකය නම් මනුෂ්‍ය පුද්ගල යායි. සංවිධාන, ව්‍යුහ සහ ක්‍රියාවලීන් වූ කලී පුද්ගල චර්යාවන්ගේ සමාහරණයේ නොහොත් සමාහාර පුද්ගල චර්යාවන්ගේ ප්‍රතිඵල වෙති. නිර්ඝාත ගෝලීය සමාජය, ඝාතනයේ නොයෙදෙන පුද්ගලයින් මත යැපෙන්නේය. කිසිවෙකුටත් මරන්නට හෝ මරණයට ලක් වීමට සිදු නොවන්නට නම් සියළුම මනුෂ්‍යයන්ගේ අවශ්‍යතා ගණනයට ගත යුතු වන්නේය.

මෙයින් මතු වන්නේ නිර්ඝාත විශ්ලේෂණයේ තර්කනය සහ ක්‍රියාමාර්ග ගෝලීය මනුෂ්‍ය සමාජය වෙත සමස්ත වශයෙන්

යෙදවීමේ අවශ්‍යතාවයයි. ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් එහි අර්ථය නම්, රාජ්‍ය ප්‍රචණ්ඩත්වය, රාජ්‍ය–විරෝධී ප්‍රචණ්ඩත්වය සහ යුද්ධය යනාදී දේශපාලන විද්‍යාවේ සම්ප්‍රදායයික පර්යේෂණ තේමා රාමුව තුළට සමාජයක් තුළ සහ සමාජ අතර පවතින සියළු ආකාරයේ මාරකත්වය ඇතුල් කරගත යුතු බවයි. අහිංසාව සම්බන්ධයෙන් එහි අර්ථය වන්නේ, ගෝලීය පරිමාණයෙන් දේශපාලන ඒකකයන් (සංරචකයන්) තුළ සහ ඒවා හරහා විද්‍යාමාන වන නිර්ඝාත බලවේග හඳුනා ගැනීමයි. අහිංසාවාදී පරිවර්තනය සම්බන්ධයෙන් එහි අර්ථය නම්, ගෝලීය පොදු පද්ධතීන්ගේ සන්දර්භය පසුබිමේ සමාජ තුළ සහ ඒවා හරහා ක්‍රියාත්මක ඝාතක සහ නිර්ඝාත බලවේගයන් අතර අන්තර්–ක්‍රියාවලින් අවබෝධ කර ගැනීමයි.

නිර්ඝාත ගෝලීය සමාජයක ප්‍රායෝගික, භව්‍ය සහ රුචි ගතිලක්ෂණ පිළිබඳ ප්‍රාමාණික අවබෝධයක් ලබා ගැනීමට අතීත සහ වර්තමාන සමාජමය විද්‍යාමානවීම් සහ අභිලාෂයන් ගැන ගවේෂණයක් අවශ්‍යය. මෙහිදී, නිර්ඝාත පූර්ණ සමස්තය තුළ න්‍යායික වශයෙන් අපරිමිත විචල්‍යයන් බලාපොරොත්තු විය යුතු වෙයි. පුද්ගල මට්ටමේදී එහි අර්ථය නම්, පුද්ගලයන්ගේ ප්‍රචණ්ඩ සහ නිර්–ප්‍රචණ්ඩ නැඹුරුතාවන් ද, ඔවුන් තුළ අහිංසාවාදී පරිවර්තනයේ ගතිකයන් ද, සහ පුද්ගල ජීවිත කාලයක නිර්මාණශීලී අහිංසාවාදී විභවයන්ට ආධාරක වන සමාජ සන්දර්භයන්ගේ ලක්ෂණ ද ගැන අවබෝධ කර ගැනීමයි.

ඝාතක පුනීලය නිර්–මාරක විකල්පයන්ගේ පංකාවක් බවට පෙරළීමේ ව්‍යවහාරික දිශානතීන්ට අදාලව ගෝලීය පර්යාලෝකය යනු, මර්දනකාරී මාරක භාවිතාවන් විතැන් කළ හැකි පූර්ණවාදී 'ඝාතන කලාප–මැදිහත්වීම්' සෙවීමයි. එහි එක් අර්ථයක් නම්, නිර්ඝාත ගැටළු විසඳීමේ කාර්යභාරය සඳහා නායකයින් සහ පුරවැසියන් පුහුණු කිරීමට ද ගෝලීය සමාජානුයෝජනයට ද දායකවීමයි. එනම්, නිර්ඝාත පරිවර්තනය සඳහා ගෝලීය සංස්කෘතික දායකත්වයන් හඳුනා ගැනීම සහ ඒවාට ආධාර අනුබල සැපයීමයි. එහිම තවත් අර්ථයක් නම් මාරකත්වයට ආධාරක වන්නා වූ දේශපාලනික, හමුදාමය, සමාජ සහ සංස්කෘතික ව්‍යුහයන් තුළ අහිංසාවාදී ගෝලීය පරිවර්තනයන් හඳුනාගැනීමක් සහ ඊට පිටුබලය සැපයීමක්ය.

## නිර්ඝාත දේශපාලන විද්‍යාව

මනුෂ්‍යයා වනාහී ඝාතන–මුක්ත සමාජ නිර්මාණය කිරීමේලා හැකියාවෙන් යුක්තය' යන පිළිගැනීමේ සිට ඉකුත් වීමේදී සමකාලීන දේශපාලන විද්‍යාවේ සෑම ක්ෂේත්‍රයක්ම, අනු–ක්ෂේත්‍රයක්ම, පැතිකඩක්ම ප්‍රශ්න කිරීමට භාජනය වෙයි. දේශපාලන විද්‍යාවට වටිනාකම් පිළිබඳ ගැටළුවන් නිදහස් විය නොහැකි යැයි සලකන්නේ නම්, නිර්ඝාත විෂයය පිළිගත හැකි අධ්‍යයන වටිනාකමක් දරන්නේද? නිර්ඝාතය පිළිබඳ විෂය දේශපාලන බලයේ න්‍යායට සහ භාවිතාවට, ප්‍රචණ්ඩ සංකල්පනාවන් සහ ඒවායේ විද්‍යාමානවීම් සාර්ථක ලෙස පාලනය කොට අතික්‍රමණය කළ හැකිද? ප්‍රජා මට්ටම්වල සිට ගෝලීය මට්ටම දක්වා නිර්ඝාත ප්‍රජාතන්ත්‍රවාදී ආයතන නිර්මාණය වීමේ භව්‍යතාවය කෙබඳුද? ජාතික ආරක්ෂාව පිළිබඳ පවතින ප්‍රචණ්ඩ ප්‍රවේශය වෙනස් කොට ජාතික සහ ගෝලීය ආරක්ෂාව පිළිබඳ අහිංසාවාදී ප්‍රවේශයක් ඇති කළ හැකිද? එලෙසම, ප්‍රචණ්ඩ දේශපාලන ආර්ථිකයන් අහිංසාවාදී ගෝලීය දේශපාලන ආර්ථිකයක් කරා පෙරළිය හැකිද? සමාජ ලෛංගිකත්වය, වර්ගය, පන්තිය භාෂාව සහ ආගම යනාදී පර්යාලෝකවල සිට නිර්ඝාත න්‍යායට සහ භාවිතාවට දායකත්වයක් ලබා දිය හැකිද? සමාජ ප්‍රචණ්ඩත්වය, අහිංසාවාදී විභවයන්, පරිවර්තක ක්‍රියාවලීන්, සහ රඳ සිටින එනමුත් නිර්මාණශීලීත්වය වශයෙන් විවිධ ආකාර වූ නිර්ඝාත ප්‍රතිඵල ප්‍රක්ෂේපණය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ මාර්ග යනාදිය ප්‍රාමාණික වශයෙන් අවබෝධ කර ගැනීම සඳහා වඩාත් උචිත ක්‍රමවේදයන් කවරේ ද?

මේ සියලු ප්‍රශ්නවලට අදාළව එකී සෑම ක්ෂේත්‍රයක් සඳහාම දේශපාලන විද්‍යාව කිසිදු දායකත්වයක් ලබා දී නැතැයි මින් අදහස් නොකෙරේ. මින් ඉදිරිපත් වන්නේ, නිර්ඝාත ලෝකයක් තුළ නිර්ඝාත සමාජ උදාවීමේ භව්‍යතාවය බැරෑරුම් ලෙස සැලකීමට භාජනය කරන්නාවූ දේශපාලන විද්‍යාවක් කවර ස්වභාවයක් ගනී ද යන්න ගැන සිතා බැලීමට කරන ආරාධනයකි. එකී භව්‍යතාවය පිළිගැනීම කරණ කොට ක්‍රියාකාරි ලෙස නිර්ඝාත ගෝලීය ගැටළු විසඳීමේ මාර්ගයට අවතීර්ණ වන්නට දේශපාලන විද්‍යාවට සිදු වන්නේය.

# 4 පරිච්ඡේදය

# ගැටලු විසඳීමේ ගම්‍යමාන

*ආර්ථික විහීනතාව සහ මන්ද පෝෂණය නිසා දශලක්ෂ ගණන් මරණයට පත් වීමේ ලෝක මානව සංහාරය හෙළා දකිමින් ඊට එරෙහිව සටන් වදින සියල්ලෝම මෙම ව්‍යසනයේ හේතූන් දේශපාලනික යැයි ඒකමතිකව තරයේ පිළිගනිති.*

*– 1981, නොබෙල් ත්‍යාගලාභී*

*පනස් තුන් දෙනෙකුගේ ප්‍රකාශනයෙන්*

## නිර්ඝාත දේශපාලන විද්‍යාවේ ගැටලු විසඳීමේ ගම්‍යමාන කවරහුද?

ගෝලීය ජීවිතයෙන් මාරකත්වය තුරන් කිරීම සමස්තයක් වශයෙන් මෙහි අරමුණයි. මෙයින් ගම්‍ය කෙරෙන්නේ මිහිපිට සෑම මනුෂ්‍යයෙක්ම ඝාතනයේ ගොදුරක් හෝ ඝාතකයෙක් වීමේ භව්‍යතාවය සැලකිල්ලට ගෙන, එම සෑම පුද්ගලයෙකුගේම ජීවිත-කාල යහපැවැත්ම ගැන විශේෂ අවධානයක් යෙදවීමේ අවශ්‍යතාවයි. එය පුද්ගලයා පිළිබඳ සංවේදිතාවද, අරමුණක් කරා නිර්මාණශීලීව හඹා යෑම ද, දේශපාලන විද්‍යාවේ කේන්ද්‍රීය ලක්ෂණයක් බවට පත් කරයි. අනිත් අතට, ආධ්‍යාත්මික, සමාජ ලිංගික, වයස්, වාර්ගික, පන්තිමය, වෘත්තික, ජාතික නැතහොත් දේශපාලනික යනාදී වශයෙන් වූ ඒ ඒ අනන්‍යතාවන් පිළිගන්නා අතරම, ඒවා අතික්‍රමණය කරන්නා වූ ගැටළු–විසඳීමේ මැදිහත් වීම් එමගින් ගම්‍ය වන්නේය. තවද එය, සියළු දෙනාගේ අවශ්‍යතාවන්ට ඝාතනයෙන් හෝ ඝාතන තර්ජනයෙන් තොරව සම්බන්ධ වන්නා වූ ගැටළු විසඳීමේ ක්‍රියාවලීන්ට පහසුකාරක වන අතික්‍රමණික කැපවීමක් සමග ඒකාබද්ධ වූ අහිංසාවාදී "බහුත්ව පක්ෂපාතීත්වයක්" (Guetzkov, 1955) ගම්‍ය කර සිටින්නේය.

නිර්ඝාත දේශපාලන විද්‍යාව මාරකත්වයට පිටු බලය දෙන්නා වූ සාධක ප්‍රමාණය අඩු කිරීමටද, අහිංසාවට හිතකර වන්නා වූ සාධක ශක්තිමත් කිරීමට ද සමගාමී කැපවීමක් කළ යුතු බව ඒ අතර

ගම්‍ය වෙයි. එය අභිසරණාත්මක මාරකත්ව පුනීලයේ (රූප සටහන 1) සහ තිර්සාර විකල්පයන්ගේ පංකාවේ (රූප සටහන 2) සියලු කලාප තුළ සහ ඒවා හරහා ගැටළු විසඳීම අපේක්ෂා කරයි. එයින් අදහස් වන්නේ සමස්තයක් වශයෙන් ගැටළු විසඳීමේ වගකීම් සම්බන්ධයෙන් දේශපාලන විද්‍යා වෘත්තිය ඍජු මැදිහත්වීමක් කරා සම්ප්‍රාප්ත වීමත්, අනෙකුත් අයගේ ප්‍රයත්නයන් හරහා ලැබෙන චක්‍රාකාර ආධාරයන්ය. මීට, පොදු ජන සහ පුද්ගලික ගැටළු විසඳීමේ ක්‍රියා පිළිවෙත්වලට ආධාරක වන පර්යේෂණ සහ පුහුණුව සඳහා පහසුකරණය ද ඇතුළත් වෙයි. තවද, අවශ්‍යතා තෘප්ත කිරීමේ ක්‍රියාවලීන් අරබයා වූ පුද්ගලික සහ සමාජ තීරක ක්‍රියාමාර්ග තුළ සියළු දෙනාගේ සහභාගිත්වය සඳහා පහසුකම් සැලසීම ද මෙයින් අදහස් වේ.

තිර්සාර දේශපාලන විද්‍යාව විසින් ගැටළු විසඳීමේ මෙහෙවර භාර ගන්නවා යනු සියල්ල කළ හැකි බවක්, සර්වඥ බවක් නැතහොත් සර්ව බලධාරීත්වයක් ගම්‍ය නොකරයි. එනමුත් එයින් සමාජ ජීවිතයේ සෑම අංශයක්ම – ආධ්‍යාත්මික, භෞතික, ද්‍රව්‍යමය සහ සංස්කෘතික – යහපැවැත්ම සඳහා විභවාත්මක අදළත්වයක් පිළිබඳව ගම්‍ය කරයි. එලෙසම මෙය මධ්‍යගත–අධිපතිවාදී මැදිහත් වීමක් ද අදහස් නොකරයි. ඉන් හුදෙක් අදහස් කරනුයේ, ශාරීරිකව දිවි රැක ගැනීමේ සිට, ආර්ථික යහපැවැත්ම හරහා මානව අපේක්ෂාවන්ගේ උපරිම ඉලක්ක දක්වා වූ කරුණු මත, දේශපාලන නායකයින්, ආයතන, ආණ්ඩු සහ ඒවාට සහයෝගය දෙන ජනතාව කරන හෝ නොකරන දේ, ගැඹුරට විහිදෙන සමාජ බලපෑම් ඇති කරන බව පිළිගැනීමයි. තිර්සාර සමාජයන්ට සේවය කිරීමට මං සෙවීමේදී වෛද්‍ය සහ මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රවල වෘත්තීන්ට වඩා තදින් තම මැදිහත් වීමේ පරාසයන් සහ දායකත්වයන් සීමා කිරීමට දේශපාලන විද්‍යාව උත්සුක නොවිය යුතුය.

ගැටළු, අපේක්ෂිතය සහ තථ්‍යය අතර පවතින විසංවාදය ලෙසට නිශ්චය කළ හැකිය. සෑම ගැටළුවක්ම අවිනිශ්චිත උප–ගැටළු සංකීර්ණයක් ඉදිරිපත් කරයි; ප්‍රතිමානක (කුමක් විය යුතුද), ආනුභවික (තථ්‍ය ලෙස පවතින) සහ විභවාත්මක (කුමක් විය හැකිද) යනාදී වශයෙනි. සෑම ගැටලුවක්ම තවදුරටත් පද්ධතිමය සංකීර්ණතා, අන්‍යෝන්‍ය පරායත්ත ප්‍රතිපෝෂණ ක්‍රියාවලීන් සහ

අතීත – වර්තමාන – අනාගත කාල සංරචක යනාදියෙන් සමන්විත වෙයි. ආචාර ධර්මීය, දර්ශනික හෝ අනුභූතිමය වශයෙන් ගැටළු කෙතරම් දුෂ්කර සහ සංකීර්ණ වන්නේ නමුත්, මනුෂ්‍ය වර්ගයාගේ පැවැත්ම සහ යහපැවැත්මට තර්ජනය කරන්නා වූ ඒවා විසඳීම සඳහා විස්තරාත්මක ලෙස මැදිහත්වීම තමන්ට අයත් කාර්යයක් නොවේ යැයි නිර්සාත දේශපාලන විද්‍යාව සලකන්නේ නැත. චර්යාත්මක ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා ද, ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයට අදළ සාධක වෙනස් කිරීම සඳහාද, එමෙන්ම ඒ මාන දෙක අන්තර්–ක්‍රියා කිරීමෙන් මතු කරන ගැටළු විසඳීම සඳහා ද නිර්සාත දේශපාලන විද්‍යාව ප්‍රයත්නයන්හි යෙදෙයි. මාරකත්වයේ ආධාරකයන් ඉවත් කිරීමටද, නිර්සාත සේවය සඳහා කැප වූ ආයතනවලට ආධාර කිරීමටද, නව නිර්සාත ප්‍රතිපත්ති සහ ආයතන සම්පාදනය කිරීමට ද එය උත්සුක වෙයි.

දේශපාලන විද්‍යාව, ව්‍යවහාරික විද්‍යා සහ ව්‍යවහාරික මානව ශාස්ත්‍ර ගැටළු විසඳීමේ කාර්යභාරයක් ආරෝපණය වීමේදී, විසඳුම් කල් ඇතිව දැන ගැනීම අවශ්‍ය යැයි ඉල්ලා සිටීම අවිද්‍යාත්මකය. රෝග සුව කළ නොහැකිය යන මතය මෙන්ම, රෝග විනිශ්චයට, චිකිත්සා නිර්දේශයට සහ ප්‍රතිකාරයට පෙර සුව වීමේ ආකාර කල් තබා දැනගත යුතුය' යන මතය ද මූලික සහ ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාවන්ගේ ප්‍රගමනයට බාධක ඇති කරන්නේය. දේශපාලන විද්‍යාවද, එහි පදනමින් ජීවිතය සහ මරණය පිළිබඳ භාවිතාවකි. එසේ නම් එහි ආකල්පය වෛද්‍ය විද්‍යාවට වෙනස් විය යුතු නැත.

ප්‍රචණ්ඩත්වය පිළිගන්නා දේශපාලනයට සහ දේශපාලන විද්‍යාවට විසඳන්නට නොහැකි වූ ගැටළුවලට ක්ෂණික විසඳුම් සැපයීමක් නිර්සාත දේශපාලන විද්‍යාවෙන් බලාපොරොත්තු වීම ඒ තරම් ප්‍රඥාගෝචර නැත. හිංසාව, හිංසක මාර්ග මගින් යටපත් කරනු වස්, අප්‍රමාණ ලේ හැලීම් සමග අති දැවැන්ත පරිමාණයෙන් විද්‍යාත්මක, මානව සහ භෞතික සම්පත් කැපකර ඇත්තේ වුවද, යුද්ධවල සිට ජන සංහාරයන් හරහා න්‍යෂ්ටික බලවතුන්ගේ අග නගරවලම සිදුවන ඝාතන – මිනීමැරුම් දක්වා විහිදෙන ගෝලීය මාරකත්වය අවසන් කිරීමට හැකි වී නැත. ඝාතනය සඳහා අති විශාල නිර්මාණශීලීත්වයක් කැප කොට තිබේ. සාර්ථකව මෙහෙයේ

යොදා ගත හැකි නිර්සාත විකල්පයන් සඳහා අවශ්‍ය කෙරෙන නිර්මාණශීලීත්වය ඊට අඩු විය නොහැකිය.

මනුෂ්‍ය මාරකත්වයේ යුගය නිමා කිරීමේ මෙහෙවර, සත්‍ය වශයෙන්ම දේශපාලන විද්‍යාවේ පමණක් කාර්යභාරයක් නොවේ. එය සියලුම විද්‍යාවන්, මානව ශාස්ත්‍ර ධාරාවන්, වෘත්තීන් සහ සියළු දෙනාම විසින් බෙදා හදා ගත යුතු කටයුත්තකි. එනමුත් මෙහිදී දේශපාලන විද්‍යාවට තමන්ටම අයත් මූල පිරිම් සහ උත්පාදක කාර්යභාරයන් තිබේ. එමෙන්ම ඊට අනෙක් අයගේ මූල පිරිම්වලට ආධාර කිරීමද කළ හැකිය. ප්‍රමුඛතර කාර්යයන් වන්නේ නිර්සාත ලෝකයක් සඳහා නිර්සාත දේශපාලන විද්‍යාවක් නිර්මාණය කිරීමේ කුමන හෝ හැකියාවක් ප්‍රතික්ෂේප කර දමන සුළු, සම්ප්‍රදායිකව මහත් කොට සලකනු ලබන, ගැටලු විසඳීමය. මින් තුනක් ප්‍රභේද සූචක වශයෙන් සැලකිය හැකිය. "හිට්ලර් සහ ලෝක ජනසංහාරය", විප්ලවීය ව්‍යුහාත්මක විපර්යාසය සහ පුද්ගලයාගේ සිට ජාතික රාජ්‍යය දක්වා ආරක්ෂාව යන ගැටලුය.

**නිර්සාතය, හිට්ලර් සහ ලෝක ජනසංහාරය**

හිට්ලර් සහ ලෝක ජන සංහාරය විසින් ප්‍රකට ලෙස සංනිදර්ශනය කරන්නේ වූවද, එයට පමණක් සීමා නොවන දේශපාලන නායකත්වය සහ මාරකත්වය පිළිබඳ ගැටළුවට, කල් පවත්නා මූලික සහ ව්‍යවහාරික විද්‍යා ගැටලු විසඳීමේ ප්‍රයත්නයන් ඇසුරින් ඍජුවම මුහුණ දිය යුතුය. ජන–ඝාතක ආක්‍රමණයන්ගේ අතිඝෝර උදාහරණ, සමාජ ස්ථර පිටින් ජනයා සමූල ඝාතනය කිරීම් හෝ කෲර ප්‍රජා සංහාරයන් විසින් නිර්සාත විද්‍යා නිර්මාණ යාත්‍රාව අඩපණ කරනු ලැබීමට ඉඩක් නොතැබිය යුතුය. එසේ නොවන්නට දේශපාලන විද්‍යාවේ සදාකාලික ඉරණම වනු ඇත්තේ ඍජුව හෝ වක්‍රව ප්‍රති–ප්‍රවාහාත්මක මාරකත්වය සඳහා, සූදානම්ව සිටීමයි. එහෙත් එම "තිල" හිංසනය, ජන–සංහාරක ඒකාධිපතියෙක් හෝ විප්ලවීය පන්ති සංහාරකයෙක් හෝ "උදර චේතනා" නිසා ගම් නගර පිටින් අතුගා පිරිසිදු කරන්නට යන ශීලවන්ත ශෝධකයෙක් හෝ විසින් විද්‍යාමාන කළ හැකි ප්‍රචණ්ඩත්වයට වඩා අත්‍යන්තයෙන් විශාලය.

මෙකී කාර්යයන් ආරම්භ කළ හැකි ප්‍රායෝගික පියවරක් නම්, තවමත් අවවර්ධිත මට්ටමේ පවතින දේශපාලන නායකත්ව

අධ්‍යයනයන් තුළ අන්තර්–විෂයික කටයුතු තීව්‍ර කිරීමය. ඉන් අදහස් වන්නේ මාරකත්වයට නැඹුරු චර්යාත්මක සහ පද්ධතිමය විචල්‍යයන් හඳුනා ගනිමින්, නිර්ඝාත නායකත්වයක් සහ අනුගාමිත්වයක් සාක්ෂාත් කර ගැනීමට හිතකර වන්නා වූ වෙනස්කම් ඇති කිරීමේ මාර්ග සෙවීමය. නාභිගත නිර්ඝාත පරිවර්තනය මැදිහත් වීම් සඳහා හැකියාවක් පෙන්වන්නේ යැයි මේ වනවිට හඳුනාගෙන ඇති ඇතැම් විචල්‍යයෝ නායකත්වය පිළිබඳ “ප්‍රචණ්ඩත්වයට යටත් වීමට” ඉඩ ඇති සංකල්ප වෙති. පෞරුෂත්වය පිළිබඳ පූර්ව–අවශ්‍යතා, භූමිකාවන්ට වෙන් වූ බලය, සංවිධානමය ආධාර, කාර්ය සාධන අපේක්ෂා, වටිනාකම් ප්‍රමුඛතා, තාක්ෂණික හැකියාවන්, සහ ආර්ථික, සමාජ, සංස්කෘතික වශයෙන් වූ ඝාතනයට හිතකර සාධක ඒවා අතර වෙති - (Paige 1977).

විසිවන ශත වර්ෂයේ අත්දැකීම් සමහර ඉකුත් වීමේ ලක්ෂණයන් පෙන්වා දෙයි; ඝාතනයට නැඹුරු අනුගාමිකයින්ගේ ආධාර සහිතව, ඝාතනයට නැඹුරු නායකයින් මතු වීම නැවැත්වීමට නම්, ඉතිහාසයේ එක් අවස්ථාවකදී මිනිසුන් ඝාතනයේ යෙදීම සහ ඝාතක තන්ත්‍රයන්ට සහයෝගය දැක්වීම සරල වශයෙන්ම ප්‍රතික්ෂේප කළ යුතුය. එසේ නොවන්නේ නම් පළිගැනීමට මාන බලන පරාජිතයන් සහ ක්ෂතියෙන් පෙළෙන ජයග්‍රාහකයින් අතර මාරකත්වයේ චක්‍රය දිගටම පෙරළෙනු ඇත. මෙය අති සරල ස්වභාවයක් පෙන්වයි. එනමුත්, විසිවන ශතවර්ෂයේ කෲරත්වය දෙස ආපසු හැරී බලන විට, පෙනී යන්නේ යුද්ධය අහෝසි කිරීමට මං සෙවූ දහනම වන ශතවර්ෂයේ අග භාගයේ සිටි සෑම චින්තකයකුම සම්පූර්ණයෙන්ම නිවැරදි බවයි. පළමුවන ලෝක යුද්ධයේ, දෙවන ලෝක යුද්ධයේ, සීතල යුද්ධයේ සහ ඉන් ඔබ්බේ කෲර ක්‍රියාවන් අතර පැහැදිලි සම්බන්ධයක් දකින්නට පුළුවන. කෲරත්වයේ චක්‍රයන්ගේ පෙරළීම වළක්වනු සඳහා දේශපාලන විද්‍යාවට ලබා දිය හැකි දායකත්වයක් නම්, තවදුරටත් කෲර ක්‍රියාවන් මතුවන්නට පෙර, කොතරම් මෑත කාලීන හෝ දුරාතීතයට අයත් වූ හෝ වේවා, අරටු බැහැගත් කෝන්තර හඳුනා ගැනීමට සහ සංසිඳවීමට මැදිහත් වීමයි. පළිගැනීම සඳහා සතුරු සංහාරය උත්කර්ෂයට නංවන්නා වූ නායකයින් සහ අනුගාමිකයින් මතු වීම නැවැත්වීම අරමුණු කොට ගෙන ඝාතන වැළැක්වීමටත්, කෝන්තර සමථයට පත් කිරීමටත්, නිර්ඝාත ජීවිතය

සඳහා සාධක නිර්මාණය කිරීමටත් දේශපාලන විද්‍යාව පැහැදිලිව කැප විය යුතුය.

හිට්ලර්ලා, ස්ටාලින්ලා, මාඕලා, අමීන්ලා, පොල්පොට්ලා සහ න්‍යෂ්ටික බෝම්බ හෙළන්නට කැමති ට්‍රෑමන්ලා පවා, නැවත නැවත මතු වීම වැළැක්වීමට නම්, දේශපාලන නායකත්වය පිළිබඳ සංකල්පය මාරක සෙන්පතියාගේ සිට සමාජ ගැටලු විසඳීමේ නිර්ඝාත පහසුකාරකයෙකු දක්වා ප්‍රතිකථනයට ලක් කරන්න; ආක්‍රමණශීලී, ප්‍රචණ්ඩත්වයට නැඹුරු පෞරුෂයන් සහිත නායකත්ව අපේක්ෂකයින් කල් වේලා ඇතිව හඳුනාගෙන, ඔවුන්ට ආධාර කිරීම නවත්වන්න; නායකත්ව වගකීම් භාරයෙන් ඝාතන කැමැත්තට ඇති අපේක්ෂාවන් සහ ඝාතන සිදු කිරීමට අණ දීමේ බලය ඉවත් කරන්න; වඩ වඩා භයානක මාරක අවිවලින් සන්නද්ධ වන, කීකරුව සිටීමට ප්‍රතිඥා දෙන වෘත්තික ඝාතක කල්ලි–සංවිධාන සමග සම්බන්ධ වීමට නායකයින්ට ඉඩ නොතබන්න; ඝාතන-නැඹුරු සංවිධානවලට ආගමික, ව්‍යාපාරික, ශ්‍රමික, විද්‍යාත්මක සහ කලාත්මක සහයෝගය දීම නවත්වන්න; නිර්ඝාත විකල්පයන් සඳහා කැපවන්න; දේශපාලන නායකයින්ගේ සහ පුරවැසියන්ගේ ප්‍රමුඛතර කාර්යය බවට අවශ්‍යතා–සංවේදී ගැටුම් සමථකරණය ඔසවන්න; නිර්ඝාත සාරධර්මයට කැපවීම ජාතික අභිමානයේ සහ අනන්‍යතාවයේ මූලික සංරචකයක් බවට නඟවුරු කරන්න. කිසියම් මිනිස් කණ්ඩායමක් සමූල ඝාතනය කිරීම සාධාරණීකරණයට ඉඩ ලබා දෙන්නා වූ පරිද්දෙන් ඔවුන්ව හෙළා දැකීම (මනුෂ්‍ය මට්ටමට පහළය' වැනි නිර්වචන) ප්‍රතික්ෂේප කරන්න; කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය යහපැවැත්ම සඳහා පොදු සම්භාෂණයක් ගොඩ නගන්න; ප්‍රචණ්ඩත්වය යොදා ගැනීමෙන් තෘප්තියක් ඍජුව හෝ වක්‍රව සොයා යෑමට පුද්ගලයින් සහ කණ්ඩායම් තල්ලු කරන්නා වූ සමාජාර්ථික ඇතුළු වෙනත් ව්‍යුහාත්මක සාධක වෙනස් කරන්න; ජීවිතය රකින්නා වූ මානව අවශ්‍යතාවන්ට සේවය කිරීම උදෙසා ඝාතන ආර්ථිකය පරිවර්තනය කරන්න; කලාවන් සහ විද්‍යාවන් යොදා ගනිමින් නිර්ඝාත සංස්කෘතීන් නිර්මාණය වීමට ආධාර කරන්න.

හිට්ලර්-වර්ගයේ කෲරත්වයන්ට එරෙහිව ඝාතන කලාපයන් තුළට මැදිහත්වීම්, නිර්ඝාත ව්‍යවහාරික විද්‍යා නිර්මාණ යාත්‍රාව ඉදිරියේ වඩාත් විශාල අභියෝගයක් නඟින්නෝය. එහෙත් මේ වනාහී,

විශේෂයෙන්ම පෙර නොවූ විරූ තාක්ෂණික නව්‍යකරණයේ ශක්‍යතා පෙන්වන යුගයක, අචින්ත්‍ය කාර්ය භාරයක් නොවේ. ගැටලු විසඳීමේ ආදර්ශන තුළ සලකා බැලිය හැකි සහ අත්හදා බැලිය හැකි ක්‍රියාපිළිවෙත් මෙබඳු විය හැකිය; ක්ෂුද්‍ර සහ මහේක්ෂ මට්ටමින් නායක – අනුගාමික මට්ටමේ පෙළඹවීම් ජනනය කිරීම (අධ්‍යාත්මික සහ චිත්ත– විද්‍යාත්මක ආකාරයේ, නිර්ඝාත හැකියාවන් ස්පර්ශ කිරීම - ඝාතනයට එරෙහි අභ්‍යන්තර යාන්ත්‍රණයන් මතු කිරීම); ගෝලීය මට්ටමින් හෙළා දැකීමේ ජනමතයන් ගොඩ නැඟීම, ජාත්‍යන්තර ආධාර නතර කිරීම සහ ඝාතනයට ප්‍රතිරෝධය පෑම (හිංසාවට ලක් වෙමින් සිටින අය පමණක් මුහුණ දිය යුතු අභියෝගයක් නොවිය යුතුය); වේගවත් අයුරින් ජනයා ඝාතන කලාපයෙන් ඉවත් කිරීමේ ක්‍රම විධි; ඝාතනය කරන්නා වූ පුද්ගලයින්, කණ්ඩායම් සහ යොදා ගන්නා තාක්ෂණය හුදෙක් 'ක්‍රියා විරහිත' කිරීමේ අරමුණින් අභ්‍යවකාශය – අහස – මුහුද – ගොඩ බිම හරහා ඉහළ තාක්ෂණයෙන් සහ අති–සියුම් ශිල්ප ක්‍රමවලින් සන්නද්ධ වෘත්තික සාම හමුදා බලවේගයන් කරන මැදිහත් වීම්. මාරක බලවේගයන් නිෂ්ක්‍රිය කිරීම සඳහා මෙහිදී හදිසි මැදිහත් කාරක පීඩනයන් (ඍජු සහ බහු–මාර්ග, ධනාත්මක සහ ඍණාත්මක) යෙදවීම ගැන ප්‍රමාණවත් පුළුල් අවධානයක් අත්‍යවශ්‍යය.

හිට්ලර්–වර්ගයේ ක්ෂතිකාරක ව්‍යසනයකින් පසු එන කාල පරිච්ඡේදය තුළ ඝාතකයින්, හිංසනයට පාත්‍ර වූවන් සහ ඔවුන්ගේ සමීපතරයන් අතර නිර්ඝාත ජීව ගුණය තහවුරු කිරීමේ ලා අවශ්‍ය පරිවර්තන සඳහා මං සෙවීම අවශ්‍යය. මෙහිදී, කෲරත්වය පිළිබඳ වගකීම හඳුනා ගැනීමට සහ භාර ගැනීමට, ප්‍රතිස්ථාපනයට, සංහිඳියාවට සහ සමථයට හා විශේෂයෙන්ම නිර්ඝාත ලෝකයක් තුළ නිර්ඝාත සමාජයන්ගේ උදවට හිතකර වන ව්‍යූහාත්මක විපර්යාසයන්ගේ පහසුකරණයට පිටුබලය දෙන්නා වූ ක්‍රියාවලීන් නිර්මාණය කිරීම උදෙසා දේශපාලන විද්‍යාව කැප විය යුතුය. අධ්‍යාත්මික, විද්‍යාත්මක හා සම්ප්‍රදායයික සෑම මූලාශ්‍රයකින්ම පෝෂණය සොයමින් අප කළ යුත්තේ ජනතාවන් අතර, ඔවුන්ගේ අනාගත සංස්කෘතික අනන්‍යතාවේ සහ අභිමානයේ කේන්ද්‍රය බවට නිර්ඝාත ප්‍රතිපදාව සහ නිර්ඝාත ජීවය ගෙන ඒමයි. එබඳු කෲරත්වයන් නැවත කිසි දිනක ඇති නොවීම සහතික කරන්නා

වූ ප්‍රායෝගික ක්‍රියාමාර්ග සහ කැපවීම් අවසාන වශයෙන් ඉතා වැදගත්ය.

ජන ඝාතනවල සිට විශාල යුද්ධ දක්වා වූ මහා පරිමාණ කෲරත්වයේ යුගය නිමා කිරීම සඳහා නිර්ඝාත දේශපාලන විද්‍යාව ව්‍යවහාරික විද්‍යා කාර්යභාරයන් තුනක් භාර ගත යුතුය; වැළැක්වීම, මැදිහත් වීම සහ පශ්චාත්–ව්‍යසන නිර්ඝාත පරිවර්තනය වශයෙනි. නිර්ඝාත ප්‍රතිපත්තීන් මත සිට මෙබඳු කෲරත්වයන් නිෂේධ කළ නොහැකිය' යන සම්ප්‍රදායයික පිළිගැනීම නිසා ඉදිවී ඇති බාධකයන්ගෙන් නිදහස් වී, එය නිර්මාණශීලී සේවයට කැප විය යුතුය.

## නිර්ඝාත ප්‍රතිපදාව සහ ප්‍රචණ්ඩ විප්ලවය

ගැටලු විසඳීමේ ප්‍රයත්නයන්ට අදාළව ඇති දෙවන මූලික ගැටළුව නම්, ප්‍රචණ්ඩ විප්ලවය සහ ප්‍රති-විප්ලවයයි. මීට අනුබද්ධව, හමුදා කුමන්ත්‍රණ, ප්‍රති-කුමන්ත්‍රණ, ත්‍රස්තවාදය, ප්‍රති–ත්‍රස්තවාදය, ගරිල්ලා යුද්ධය සහ විශාල පරිමාණයේ සිවිල් ගැටුම් සහ යුද්ධ සලකා බැලිය හැකිය. සම්ප්‍රදායයික දේශපාලන විද්‍යාව එබඳු විප්ලව සහ ඒවා මර්දනය කිරීම දෙස බලන්නේ එක්තරා ආකාරයකට ප්‍රචණ්ඩත්වය පිළිගන්නා දෙගිඩියාවකිනි. යහපත් පාලන තන්ත්‍රයකට එරෙහිව නොයන, එහෙත් අයහපත් පාලනයකට එරෙහිව යන ප්‍රචණ්ඩත්වය ප්‍රශංසාත්මකය; හොඳ විප්ලවවාදීන්ට එරෙහිව නොව, නරක විප්ලවවාදීන්ට එරෙහි ප්‍රති-ප්‍රචණ්ඩත්වය භාර ගත හැකිය. මෙම අවස්ථා දෙකෙහිදීම, දේශපාලන වෙනසක් ඇති කිරීම හෝ වැළැක්වීම සඳහා ප්‍රචණ්ඩත්වය යොදා ගැනීම සැලකෙන්නේ "පාලනයට නතු කළ නොහැකි" හෝ ඇතැම් විටක 'පුණ්‍යවන්ත' දේශපාලන සංසිද්ධියක් ලෙසිනි. ආර්ථික ප්‍රභූත්වය තම දේපළ ස්වාමිත්වය සහ බලය සාමකාමීව අත් නොහරින බැවින්, විප්ලවීය ප්‍රචණ්ඩත්වය හැර අන් මාවතක් නොවේ' යැයි ඇතැම් අමෙරිකානු ශාස්ත්‍රඥයන් අතර පවා ගැවසෙන සුලබ තර්කය උදහරණ වශයෙන් ගත හැකිය. එහිම අනෙක් පැත්ත නම්, පුද්ගලික දේපළ මත පදනම් වූ සූරාකෑමේ ක්‍රම වෙනස් කිරීමට උත්සාහ කරන කැරළි කරුවන්ට එරෙහිව ප්‍රති-ප්‍රචණ්ඩත්වය යෙදීම තවත් අය අනුමත කිරීමයි. ඇත්ත වශයෙන්ම අමෙරිකානු මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදය යටතේ පවා, කෙනෙක්

විප්ලවීය මාරකත්වයට නිතරම සූදානම්ව සිටිය යුතුය' යන අදහස දිගටම රඳා පවතින බව පෙනේ; පුරවැසියන් විසින් ආයුධ දැරීම සාධාරණීකරණය කෙරෙන මූලික පිළිගැනීමක් වන්නේ දියත් විය හැකි රාජ්‍ය මර්දනයකට එරෙහිව නිදහස වෙනුවෙන් පුරවැසියන් සන්නද්ධ සූදානමකින් සිටිය යුතුය යන්නයි.

එනමුත්, මර්දනකාරී දේශපාලන තන්ත්‍රයන් ඉවත් කිරීමේ අවශ්‍යතාවයද එලෙසම දරා සිටීමට නොහැකි සමාජාර්ථික ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයට අදළ සාධක වෙනස් කිරීමේ අවශ්‍යතාවය ද පිළිගනිමින් නිර්සාත දේශපාලන විද්‍යාව, අහිංසාවාදී විප්ලවීය විකල්පයන් හඳුනා ගැනීමට සහ ඒවාට ආධාර කිරීමට පෙරමඟට බැස්ස මනාය.

මෙහිදී නිසැකින්ම 'විප්ලව අත්‍යවශ්‍යයෙන්ම ප්‍රචණ්ඩ විය යුතුය' යන පිළිගැනීම අභියෝගයට ලක්කළ යුතු අතර ප්‍රතිඵලදායී අහිංසාවාදී විකල්පයන් පිළිබඳ ඥානය සම්පාදනය කළ යුතුය. මූලධර්ම, උපායමාර්ග, උපක්‍රම සංවිධාන ක්‍රම සහ ව්‍යවහාරික කෞශල්‍යය මෙකී සම්පාදිතයන්ට අදාළය.

සීතල යුද්ධයේ අවසාන භාගය තුළදී, ලෝකයේ වඩාත්ම බලගතු ප්‍රචණ්ඩ විප්ලවීය සම්ප්‍රදායයන් තුනක් ඇසුරින් මතු වූ දේශපාලන න්‍යායාචාරීන් විසින් අහිංසාවාදී විප්ලවයේ භව්‍යතාවය පිළිබඳ ප්‍රබලව කැපී පෙනෙන තහවුරු කිරීම් තුනක් ඉදිරිපත් කර ඇත; සම්ප්‍රදායයන් නම් අමෙරිකා එක්සත් ජනපදය, සෝවියට් සංගමය සහ චීනයයි.

අමෙරිකාවේ, ජීන් ෂාප් (1973) නිර්-ප්‍රචණ්ඩ දේශපාලන විප්ලවයන් සඳහා වූ න්‍යාය සහ භාවිතය පිළිබඳ සම්භාව්‍ය ගණයේ ප්‍රකාශයක් ඉදිරිපත් කළේය. මෙය, එක් අතකින්, යටහත් වීමේ නොහොත් කීකරුව භාර ගැනීමේ පදනම් මත දේශපාලන බලය පවතින ආකාරය පිළිබඳව තියුණු විශ්ලේෂණයක් හරහාද, අනෙක් අතින් ප්‍රතිඵලදායී අහිංසාවාදී අරගලයන්ගේ උදහරණ පිළිබඳව ඉතා පුළුල් ඓතිහාසික ගවේෂණයක් හරහා ද සම්පාදනය කෙරී ඇත. ෂාප් අවම වශයෙන් අහිංසාවාදී අරගල ක්‍රම 198 ක් හඳුනා ගෙන ඇත. විරෝධය දැක්වීමේ සහ ප්‍රරෝචනයේ සිට, සමාජ, ආර්ථික, දේශපාලන සත්‍යග්‍රහය හෙවත් හවුල් නොවීම හරහා, ඍජු නිර්-ප්‍රචණ්ඩ මැදිහත් වීම දක්වා වශයෙනි. ඉන් අනතුරුව ඔහු මේ

සියල්ල අහිංසාවාදී පරිවර්තනයේ ගතික න්‍යායක් තුළට සංයෝජනය කරන්නේ, එකී පරිවර්තනය, 'සංවර්තනය' නොහොත් හරවා ගැනීම, ඉඩකඩ ලබාදීම සහ 'ප්‍රරෝධය' නොහොත් බල කිරීම සමග පසුව ඔහු විසින් ඇතුළත් කරන්නට යෙදුණු "පෘථක්කරණය හෙවත් කැබලිවලට බිඳී නිෂේධ වී යෑම" යන ක්‍රියාවලීන්ගෙන් සංයුක්ත වන බව පෙන්වා දෙමිනි. සෝවියට් සංගමයේ ඊ.පී. ප්ලිමාක් සහ වයි.එෆ්. කරයාකින් (1979) විප්ලවය වනාහි "අති බහුතර ජනකායකගේ ජීවිතය තියුණු වෙනසකට භාජනය කරමින්" රාජ්‍ය බලය එක පන්තියක සිට වෙනත් පන්තියකට මාරු වීමක් යැයි නිර්වචනය කළහ. ඉන්පසු ඔවුහු, මාක්ස් – ලෙනින්වාදී න්‍යායික පදනම්වල සිට සහ දෙවන ලෝක යුද්ධයෙන් පසු යුගයේ යටත්-විජිතහරණ සහ ප්‍රජාතන්ත්‍රවාදී අත්දැකීම් මත පිහිටා සාමකාමී සමාජවාදී විප්ලව සඳහා හව්‍යතාවක් ඇතැයි තර්ක කළෝය. සාමකාමී සමාජවාදී විප්ලවය ඔවුන්ගේ නිර්වචනයේ හැටියට "සන්නද්ධ අරගලයෙන් තොරය, සිවිල් යුද්ධයෙන් තොරය. ප්‍රතිවිප්ලවවාදී සන්නද්ධ මැදිහත්වීම්වලින් තොරය. නව ඓතිහාසික තත්වයන් යටතේ සාමකාමී විප්ලව වෙනුවෙන් ක්‍රියාත්මක වීම සඳහා අතීත ඓතිහාසික පරාජයන් බාධාවක් නොවිය යුතු යැයි තර්ක කරන ඔවුහු "සාමකාමී විප්ලවීය වර්ධනයන්... ඒවායේ සෑම අංශයක්ම වශයෙන් සියුම් සහ විෂය මූලික අධ්‍යනයට භාජනය විය යුතු'' යැයි කියා සිටිති. චීනයේ ෂාන්ග් යී පින් (1981:79) එක් අතෙකින් මාක්ස්වාදී න්‍යාය මත පදනම් වෙමින්ද, අනෙක් අතින් ආසියාවේ, අප්‍රිකාවේ සහ ලතින් අමෙරිකාවේ අහිංසාවාදී ජාතික නිදහස් අරගල ක්‍රියාවලින්ගේ සාර්ථක උදහරණ මත යැපෙමින්ද – විශේෂයෙන් ජනතාව දැවැන්ත පරිමාණයෙන් අවදි කොට ඉදිරියට ගැනීමට ඉන්දියාවේ ගාන්ධි ව්‍යාපාරය පෙන්වූ හැකියාව අවධානයට ගනිමින්ද - මෙසේ තර්ක කළේය; "කාලය, ස්ථානය, තත්වයන් ඇතුළු සන්දර්භීය ලක්ෂණ නොසලකමින් ඒක–පාර්ශවිකව ප්‍රචණ්ඩ විප්ලවය නිර්දේශ කිරීමත්, අහිංසාවාදී විප්ලවයේ හව්‍යතාවය අවප්‍රමාණ කිරීමත් න්‍යායික වශයෙන් වැරදිය, භාවිතය වශයෙන් විනාශකාරීය."

මෙලෙස, ඉතා සංකීර්ණ ගෝලීය විප්ලව සහ ප්‍රතිවිප්ලව ලේ වැගිරීම් සමයක් තුළ ප්‍රචණ්ඩ සම්ප්‍රදයයන් තුනක් මැදින් මතුවන

දේශපාලන විමර්ශකයින් තිදෙනෙක් - එකිනෙකාගෙන් ස්වාධීනව සහ පෙනී යන පරිදි, එකිනෙකා ගැන දැනීමකින් තොරව - අහිංසාවාදී විප්ලවයේ න්‍යාය සහ භාවිතය සංවර්ධනය කිරීමේ විද්‍යාත්මක කාර්යභාරයට අත ගසා ඇත. මේ තිදෙනා අතර කැපී පෙනෙන පොදු ලක්ෂණ ගණනක් ඇත. ඒවා අතර ඉන්දියාවේ අහිංසාවාදී ගාන්ධියානු සම්ප්‍රදායය බැරෑරුම් සැලකිල්ලට භාජනය කිරීමත්, දේශපාලන නිදහස පමණක් නොව, සමාජාර්ථික සහ සංස්කෘතික නිදහස ද ඉලක්ක කිරීමත් වේ.

මේ දක්වා "ධනේශ්වර" වේවා, "සමාජවාදී" වේවා, අහිංසාවාදී විප්ලව න්‍යාය සංකල්පනය කරනු ලැබ ඇත්තේ ප්‍රධාන වශයෙන් පීඩිතයාගේ දෘෂ්ටි කෝණයෙනි. මේ සමග තුලනය කළ හැකි අහිංසාවාදී ජන අරගල ප්‍රචණ්ඩ ලෙස මර්දනය කිරීමේ භාවිතයට විකල්ප වන, ප්‍රභූන්ගේ අහිංසාවාදී ප්‍රති-ක්‍රියාවන් පිළිබඳ න්‍යායන් සම්පාදනය වීමේ තත්වයක් විද්‍යාමානව නැත. මේ ප්‍රශ්නාර්ථය තුළ ෂාපියානු විශ්ලේෂණයේ ප්‍රතිවර්තනයක් ගම්‍ය වෙයි; දුගීන්, ඉඩම් විරහිතයින්, මර්දිත ජනකායන්, සුළු ජන කොටස් (නැතහොත් බහුතර ජනයා), මානව හිමිකම් සහ ආර්ථික සාධාරණත්වය සඳහා අහිංසාවාදී ලෙස ඉල්ලීම් කරමින් ඉදිරියට එද්දී, පොහොසත් දේපළ හිමියන්ට වාර්ගික අධිපතීත්වයට, දේශපාලන නායකයින්ට, පොලිසියට නැතහොත් හමුදාවට ආයුධ රහිතව අහිංසාවාදී ලෙස එයට මුහුණ දීමට ධෛර්යයක් හෝ න්‍යායක් තිබිය හැකිද? වරප්‍රසාදිතයින්ට තම වාසිදායක තත්වයන් එලෙසම පවත්වා ගැනීම උදෙසා ප්‍රතියාචනයක් ඉදිරිපත් කරමින්, ගෞරවය සහ පිළිගැනීම දිනා ගැනීමට සංවර්තනය, ඉඩකඩ ලබාදීම සහ ප්‍රරෝධය හරහා ලේ වැගිරීම් වලින් තොරව ක්‍රියාත්මක විය හැකිද?

තව දුරටත් කියන්නේ නම්, පෙර පීඩකයා/වරප්‍රසාදිතයා සහ පීඩිතයා/අවවරප්‍රසාදිතයා අතර අන්‍යෝන්‍ය වශයෙන් තෘප්තදායි සම්බන්ධයකට මඟ හෙළි කරන සමාජ පරිවර්තනයක් උද කරන්නා වූ "අහිංසාවාදී අරගලය" නැතහොත් "අහිංසාවාදී පන්ති අරගලය" සඳහා පවා, ව්‍යවහාරික න්‍යායක් සූත්‍ර ගත කිරීමට නොහැකියාවක් නැත. මෙහිදී, එක් පසෙකින් මනුෂ්‍ය ස්වභාවය තුළ මතු කළ හැකි නිර්ඝාත ලක්ෂණ ගැනද, අනෙක් පසින් සාමකාමී පරිවර්තනයේ ප්‍රකාශකයින් කෙරේ ප්‍රචණ්ඩකාමී ප්‍රභූත්වයන්ද, ඔවුන්ගේ

ප්‍රචණ්ඩකාමී ප්‍රතිපාක්ෂිකයින් ද විසින් ප්‍රක්ෂේපිත නුරුස්නා බව සැලකිල්ලට ගත යුතුය. මෙකී දෙපිරිසම අහිංසාවාදී අරගලයේ ප්‍රකාශකයින් මර්දනය කිරීමට උත්සුක වන්නේ එකම හේතුවක් නිසාය. එම අහිංසාවාදී අදහස් නිසා තමන්ගේම ජනතාවට/පන්තියට අයත් සාමාජිකයින් ඝාතනය කිරීමට සූදානම්ව සිටීමේ "සටන්කාමීත්වය" දුර්වල වේය යන බිය හේතු කොට ගෙනය. උදහරණයක් වශයෙන්, සීතල යුද්ධ ගැටුම් වාතාවරණය තුළ අමෙරිකානු මෙන්ම සෝවියට් දේශපාලන ප්‍රභූත්වය සහ ඔවුන්ගේ මාධ්‍යය, කවර ආකාරයේ හෝ සාමවාදී හඬක් මතු වන සැණෙන් එය ගර්හාවට ලක් කිරීමට හෝ එහි හුස්ම හිර කිරීමට දැඩි මහන්සියක් දැරූහ. එයින් ගම්‍ය කරන ලද්දේ, නිර්ඝාත අදහස් නිසා මතු විය හැකි ධනාත්මක ප්‍රතිචාර නිසා තම යුදවාදයට ඇති සහයෝගී පදනම් දුර්වල වනවා විනා, ඉන් තම ප්‍රතිමල්ලවයින් දුර්වල වන්නේ නැතැයි යන්නයි. මේ ආකාරයටම, සන්නද්ධ ප්‍රතිරෝධ ව්‍යපාරවල ක්‍රියාධර මෙන්ම විද්වත් ප්‍රකාශකයින්ද අහිංසාවාදී විප්ලවීය විකල්පයන් ගවේෂණය කිරීමට එරෙහිව වහාම විරෝධය පාන්නේ පීඩිතයින් අතර එම අදහස් ප්‍රචලිත වේ යැයි යන බිය කරණ කොට ගෙනය. ඉදින්, නිර්ඝාත ප්‍රතිපදාව සහ භාවිතාවන්, පීඩකයින් මෙන්ම, පීඩිතයින්ද අතර පිළිගැනීමට ලක් වේ නම්, නිර්ඝාත පන්ති අරගලයක් ගැන සිතීමට හැකියාවක් ද තිබේ. මෙයින්, යළි ත් වරක්, නිර්ඝාත විප්ලවීය ගැටළු–විසඳීමේ ක්‍රියාවලීන් පහසුකරණය උදෙසා ව්‍යවහාරික භූමිකාවක් දේශපාලන විද්‍යාවට යෝජනා කෙරෙයි.

සමාජ විපර්යාසය සඳහා වූ අහිංසාවාදී අරගලයේ සෑම පියවරකදීම, ප්‍රතිවාදීන් සමග "සමථයකට" පැමිණීමේ අවසාන අරමුණ ගැන අවධාරණය කිරීම සංලක්ෂණය කර ගනිමින් එහි ප්‍රතිඵලදායකත්වය පෙන්වූ ගාන්ධියානු සහ කිංගියානු ක්‍රමවේදයෝ ඉතා ප්‍රබල පූර්වාදර්ශයන් සපයති. මැකියාවෙල්ලි පවා තර්ක කර සිටියේ දේශපාලන තන්ත්‍රයක පූර්ණ පරිවර්තනයක් – "ඒකාධිපතිවාදයේ සිට නිදහස කරා" හෝ එහි ප්‍රතිපක්ෂය- "තම රාජ්‍යය ශ්‍රේෂ්ඨ එකක් බවට පමුණුවමින් එහි පුරවැසියන් පොදු එකඟතාවකට ඒම තුළ" කිසිදු ලේ වැගිරීමකින් තොරව සාක්ෂාත් කර ගත හැකි බවයි. (The Discourses Book 3 Chapter 7).

## නිර්සාත පැවැත්ම සහ ආරක්ෂාව

පුද්ගලික, ප්‍රජා, ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් මාරක ආක්‍රමණයකට එරෙහිව, විශ්වාසදායී ආරක්ෂක විකල්පයන් සම්පාදනය කිරීමේ ගැටළුව නිර්සාත දේශපාලන විද්‍යාව භාර ගත යුතුය. සම්ප්‍රදායික ආරක්ෂණ න්‍යාය සහ භාවිතය අවසාන විග්‍රහයේදී උද්භව වන්නේ මාරකත්වයේ තර්ජනය තුළිනි. "මම/අපි පූර්ණ වශයෙන් ඔබට සහතික වන්නේ, මම/අපි ඔබ, මරණ බවය." නිර්සාත ආරක්ෂාව, කෙසේ නමුත්, ඉකුත් වන්නේ ප්‍රතිපක්ෂ මූලධර්මයෙනි. "මම/අපි ඔබට පූර්ණ ලෙස සහතික වන්නේ, මම/අපි ඔබව නොමරණ බවය. එමෙන්ම මා/අප ඔබ විසින් නොමරණ බවට ඔබ අපට පූර්ණ වශයෙන් සහතික විය යුතුය."

කෙටියෙන් කියන්නේ නම් මූලධර්මය වන්නේ අප එකිනෙකා නොමරන බවට පූර්ණ විශ්වාසයක් - සහතිකයක් එකිනෙකා තුළ තිබිය යුතුය යන්නයි. යමෙක්, කිසිවෙක්ව මරන්නට අධිශ්ඨාන කොට ගෙන ඇති තැනක කිසිවෙකුටත් ආරක්ෂාව නැත. පළිහ, සන්නාහය අගල්, තාප්ප, බලකොටුවල සිට පරමාණු බෝම්බ ආවරණ දක්වා වූ සකල ආරක්ෂණ උපක්‍රම සහ ක්‍රමවිධීන් පසාරු කොට ගෙන යන්නට මාරක නිර්මාණශීලිත්වයට හැකි බව යළි යළිත් තහවුරු වී තිබේ. මාරක ප්‍රතිප්‍රහාරක ආරක්ෂණ විධීන් තරණය කොට ගෙන යන්නට  මාරක ප්‍රහාරක විධීන් සමත් බවද එසේම සටහන් කළ හැකිය; හෙල්ලයට එරෙහිව හීය, අත්තුවක්කුවට එරෙහිව මැෂින් තුවක්කුව, පාබල හමුදවට එරෙහිව කාලතුවක්කු හමුදව, අශ්ව හමුදවට එරෙහිව යුධ ටැන්කි, ටැන්කිවලට එරෙහිව රොකට්, යුධ නැව්වලට එරෙහිව සබ්මැරීන් යාත්‍රා, මේ කියූ සෑම එකකටම පාහේ එරෙහිව ගුවන් සහ මිසයිල් ප්‍රහාර, ඒ සියල්ලටම එරෙහිව න්‍යෂ්ටික, ජීව විද්‍යාත්මක සහ රසායනික අවි කරළියට පැමිණියහ. තුවක්කුවලින් පිරුණු සන්නාහමය නිවසක ජීවත් වීමෙන් ආරක්ෂාව පිළිබඳ සහතිකයක් නොලැබේ. ආක්‍රමණිකයා සතුව සන්නාහ බිත්ති පසාරු කරන මිසයිල තිබිය හැකිය. බර කාල තුවක්කු නැතහොත් සන්නද්ධ සටනේ වඩා සමර්ථ කමක් තිබිය හැකිය. නැතහොත් සරලවම, වායුගෝලය, ආහාර නැත්නම් ජලය විෂ මුසු කිරීමේ හැකියාව තිබිය හැකිය. ඉදින් ආරක්ෂාව සඳහා නියත සහතිකයක්

ලබා දිය හැක්කේ එකම සාධකයකට පමණි. එය නම් මරන්නට අධිෂ්ඨානයක් නොමැති බවයි. නිර්-මාරක ආරක්ෂණ සංකල්පයන් සහ ක්‍රමවිධීන් කරා වූ සංක්‍රාන්තියේ දී දේශපාලන විද්‍යාවේ භූමිකාව වන්නේ, මාරක අවි භාවිතා කිරීමට හෝ එම තර්ජනයට ආදේශක වශයෙන් විශ්වාසදායි විකල්පයන් සම්පාදනය කිරීම සඳහා න්‍යාය සහ භාවිතාව සංවර්ධනය කිරීමට ආධාර කිරීමයි. මෙහිදී විභවාත්මක ප්‍රතිවාදීන් අතර මාරක අධිශ්ඨානයන් ජනිත වී වර්ධනය වීම වැළැක්වීමේ නිර්ඝාත ක්‍රියාමාර්ග ද අදාළය. සම්ප්‍රදායයික දේශපාලන විද්‍යාව තුළ මේ දක්වා අවධානයට පාත්‍ර වී නැති වුවද, යට කී අභියෝගයට අදාළව වර්ධනය වන්නා වූ සාහිත්‍යයක් සහ ඒකරාශී වූ අත්දැකීම් සමුදායයක් දැනටමත් පවතී. මේ කී ගවේෂණයන් අතර, නාසි ජන-ඝාතන සන්දර්භය තුළ සිවිල් ජනතාව ප්‍රතිරෝධය පෑ ආකාර (Hallie 1979; Fogelman 1994; Semelin 1994); මාෆියා සාපරාධී ක්‍රියා පරිසරය තුළ ඩැනිලෝ ඩොල්සි ගේ අහිංසාවාදී ප්‍රජා ප්‍රතිරෝධ ව්‍යාපාරය (Amato 1979; Chaudhuri 1998) ; මානව හිමිකම් ක්‍රියාකාරීන්ගේ ආරක්ෂාවට නිරායුධ ආරක්ෂකයින් ක්‍රියාත්මක වීම් (Mahony and Eguren 1997); හමුදා කුමන්ත්‍රණවලට එරෙහිව අහිංසාවාදී ප්‍රතිරෝධය පෑම් (Roberts 1975; Sharp 1990; 1993); ජාතික, පුරවැසි, සමාජ අහිංසාවාදී ආරක්ෂණ ක්‍රියාමාර්ග (Boserup and Mack 1974; Sharp 1990; Martin et al. 1991; Randle 1993; Burrows 1996); සම්ප්‍රදායයික හමුදා සේනාංක නිර්-මාරක සේවයේ යෙදවීම් (Keyes 1982); විකල්ප අහිංසාවාදී හමුදා/ බල ඇණි (Banerjee 2000; Weber 1996; Moser-Pungsuwan and Weber 2000); සහ නිර්-මාරක අවි සංවර්ධනය (Lewer and Schofield 1997) යනාදිය පිළිබඳ සෙවීම් සහ විමසුම් දක්නට ලැබේ.

සම්ප්‍රදායයික හමුදා මාධ්‍යයට අමතර සහ ආධාරක වශයෙන් සලකමින් වුවද, ආණ්ඩු කිහිපයක් අහිංසාවාදී සිවිල් ආරක්ෂාව පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයන් දියත් කර තිබේ. ස්වීඩනය, නෝර්වේ, ඩෙන්මාර්කය, නෙදර්ලන්තය, ස්විට්සර්ලන්තය සහ පින්ලන්තය මෙකී රටවල් අතර වෙති. (Schmid 1985; Sharp, 1990; Randle 1994: 121-37)

තායිලන්තයේ 1997, නව තායි ව්‍යවස්ථාවේ ලා, අනාගත හමුදා කුමන්ත්‍රණවලට එරෙහිව අහිංසාවාදී ප්‍රතිරෝධය පෑම සුජාත කරන්නා වූ අද්විතීය පූර්ව-ගාමී ප්‍රතිපාදනයක් ඇතුල් කොට තිබේ; "ව්‍යවස්ථානුකූල නොවන ආකාරයට පරිපාලන බලය අත්පත් කර

ගැනීමේ ඕනෑම ප්‍රයත්නයකට එරෙහිව සාමකාමී ලෙස විරෝධය පෑමට ජනතාවට අයිතිය තිබේ". අමෙරිකා එක්සත් ජනපදය තුළ, හමුදාවේ සහ පොලීසියේ භාවිතය සඳහා නිර්-මාරක අවි යොදා ගැනීම පිළිබඳ පර්යේෂණ අඩු තරමින් 1965 දී පමණ සිට දියත් වූ අතර, 1990 දශකයේ දී එම කටයුතු වේගවත් විය. මෙහිලා පුළුල් තාක්ෂණික පරාසයක් ගවේෂණයට ලක් වී තිබේ - ලේසර්, ආලෝක, ධවනි, විද්‍යුත් චුම්බක, රසායනික, ජීව විද්‍යාත්මක සහ තවත් අවි වර්ග රාශියක් මීට ඇතුළත්ය. මින් සමහරක් පොලිස් සේවාව තුළද විදේශයන් තුළ හමුදා ක්‍රියාමාර්ග තුළද දැනටමත් භාවිතාවට ගෙන ඇත.(Lewer and Schofield 1997).

සමාජ ආරක්ෂාව පිළිබඳ ආණ්ඩුවල උවමනාව මෙන්ම, නිර්-මාරක අවි පිළිබඳ මතු වී ඇති උනන්දුව දැනට සැලකෙන්නේ සම්ප්‍රදායික මාරක හැකියාවන්ට ආධාරක වන අමතර ශක්තියක් වශයෙන් පමණය. එනමුත්, සම්ප්‍රදායික ප්‍රචණ්ඩ ආරක්ෂණ යාන්ත්‍රණයන් තුළ වූ විශේෂඥයින්, නිර්ඝාත විකල්පයන් බැරෑරුම් ලෙස සැලකිල්ලට ගැනීම පිළිබඳ කාරණය දේශපාලන විද්‍යාවේ ඉහළම අවධානයට පාත්‍ර විය මනාය. එකී ප්‍රවණතාවය එහි ප්‍රාමාණික ප්‍රයත්න හරහා ධෛර්ය ගැන්විය මනාය. අභියෝගය වන්නේ පූර්ණ නිර්ඝාත ආරක්ෂණ තත්වයන් කරා සංක්‍රාන්තියට අදාළ ගැටළු විසඳීමයි. නිර්-මාරක ආරක්ෂාව කරා ගමන් කිරීම සංඥා කරන තවත් දර්ශකයක් මාරක ගැටුම් වැළැක්වීම පිළිබඳ කානගී කොමිසමේ අවසාන වාර්තාවේ දක්නට ලැබේ. (Carnegie Commission on Preventing Deadly Conflict, 1997). එය අායාචනා කර සිටින්නේ ව්‍යුහාත්මක වැළැක්වීම, මාරක ගැටුම්වල මූල හේතුන්ට ආමන්ත්‍රණය කරන්නා වූ උපාය මාර්ග, සහ වැළැක්වීමේ සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා ක්‍රියාත්මක වීමටය. මෙයින් තවදුරටත් ගම්‍ය වන්නේ නිර්ඝාත පුද්ගල සහ ගෝලීය ආරක්ෂාව කරා ඉදිරියට ගමන් කිරීමේ හැකියාවයි. ගෝලීය අහිංසාවාදී සාම බලකායක් සංවිධානය කිරීම සඳහා ඇති යෝජනාව මීට උදාහරණ වේ. (www.nonviolentpeaceforce.org)

නිර්ඝාත සමාජ උදාකර ගැනීමට එරෙහිව පවතින තරණය නොකළ හැකි බාධක ලෙස මේ දක්වා සැලකෙන ගැටළු විසඳීම සඳහා නිර්ඝාත දේශපාලන විද්‍යාව දැන් උත්සුක විය යුතුය.

ආක්‍රමණශීලී භෞතික ප්‍රචණ්ඩත්වය මගින් මුලිනුපුටා දැමීම සඳහා කෙරෙන ඍජු තර්ජන අතික්‍රමණය කිරීම මෙහිලා අත්‍යන්තයෙන් වැදගත් වෙයි. ප්‍රථම කොට, මන්දයත්, පැවතීම තහවුරු නොකොට වෙනත් කිසිදු ගැටළුවක් විසඳිය නොහැකි බැවිනි. දෙවනුව, මන්ද යත්, ඝාතනය සඳහා අනවරත කැපවීමක් පවතින්නේ නම්, එම තත්වය දිගටම ව්‍යුහාත්මක සහ පාරිසරික ප්‍රචණ්ඩත්වයට දායක වෙමින් පුද්ගල, සමාජ සහ ගෝලීය යහපැවැත්ම අනතුරට ලක් කරන බැවිනි.

සමාජ ගැටළු විසඳීමේ ක්‍රියාවලීන් තුළ නිර්ඝාත ප්‍රවේශය අවධාරණයට ලක් කිරීමේ දී මතු දක්වෙන ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවේ; මානසික හිංසනය, වධයට පාත්‍ර කිරීම, වර්ගවාදය, ලිංගිකවාදය, ආර්ථික සූරාකෑම සහ ඒකාධිපතිත්වය යනාදී සාධක භෞතික මාරකත්වයට වඩා ඇතැම් විට දුක්වේදනාවන් සහ මරණ ජනනය කරන්නේ නම් නිර්ඝාත ප්‍රතිපදාව වෙතම එකලා අවධානයක් යොමු කිරීම සාධාරණද? මෙම ප්‍රශ්නවලින් ගම්‍ය කෙරෙන්නේ යට කී ගැටළු විසඳීමට හැකි වන්නේ ඝාතන විකල්පය පිළිගන්නේ නම් පමණක් බවය. ලබා දිය හැකි එක පිළිතුරක් නම් මරණ ජනනය කරන්නා වූ සහ ඝාතනයට විරාමයක් වශයෙන් සිදු කෙරෙන මනෝ-භෞතික වධයන්ට හේතු වන්නා වූ සමාජ-ආර්ථික ව්‍යුහාත්මක ගැටළු පිටුපස තිබෙන පදනම් සාධක වන්නේ ඝාතන මානසිකත්වය, ඝාතන හැකියාව සහ ඝාතන සංස්කෘතිය බවයි. ඝාතන තර්ජනය සහ මරණයට ඇති බිය මත නොවේ නම් මානසික හිංසාව, වධබන්ධන, වර්ගවාදය, ස්ත්‍රීන්ට එරෙහි පීඩනය, ආර්ථික සූරාකෑම සහ ඒකාධිපතිවාදය යන ඈ සියල්ලම පවත්වා ගත හැක්කේ වෙන කවර සාධකයක පිහිටෙන්ද? එබැවින්, මානව අත්දැකීම් තුළින් මිනීමැරුම්වල සිට යුද්ධය දක්වා වූ ඝාතන පරාසය ඉවත් කොට දැමිය හැකි නම්, මනුෂ්‍ය වර්ගයා මුහුණ දෙන අන් ගැටළු - අධ්‍යාත්මික, මානසික, භෞතික, ප්‍රජාතන්ත්‍රවාදී සහ පාරිසරික ක්ෂේත්‍ර ඔස්සේ - විසඳා ගැනීමට අති විශාල දායකත්වයක් ලැබෙනු ඇත.

මනුෂ්‍ය වර්ගයාගේ පැවැත්මට සහ යහපැවැත්මට තර්ජනය කරන්නා වූ ඒ ඒ යුගයට ආවේණික ගැටළු විසඳලීමට දේශපාලන විද්‍යාවේ මැදිහත් වීම නිර්ඝාත ප්‍රතිපදාවට කැපවීමෙන් ගම්‍ය කෙරෙනු

ඇත. ගම්මානවලට ආමන්ත්‍රණය කිරීමේ දී මූලික ගැටළු විසඳීමේ කාර්යභාරය ගැන පෙන්වා දීම සඳහා සිය වම් අතේ ඇඟිලි ගණන් කිරීමට ගාන්ධි පුරුදුව සිටියේය: අස්පර්ශක ජනතාවට සමානත්වය; ආර්ථික විමුක්තිය උදෙසා ස්වයං-පෝෂණය අර්ථවත් කරන කපු රෙදි වීම; මත්ද්‍රව්‍ය සහ මත්පැන් දුරු කිරීම; හින්දු-මුස්ලිම් මිත්‍රත්වය; ස්ත්‍රීන් සඳහා සමානත්වය යන කරුණු සහ ඔහු මෙලෙස නම් කරයි. අනතුරුව ඔහු ඇඟිලි දරා සිටින මැණික් කටුව පෙන්වා එය අහිංසාවට සමාන කරයි. (Ashe 1969:243). මෙයට අනුරූපීව, ගෝලීය වශයෙන් කැපී පෙනෙන ගැටළු පහක් නම් කිරීම අපට කළ හැකිය: දිගින් දිගටම ඝාතනය පැවතීම සහ අවි හරණයේ අවශ්‍යතාව; දරිද්‍රතාවය පමුණුවන ජන සංහාරය සහ ආර්ථික සාධාරණත්වයේ අවශ්‍යතාව; මනුෂ්‍ය ගරුත්වය කෙළෙසීම සහ මානව හිමිකම් රැකීම සඳහා අන්‍යොන්‍ය වශයෙන් කැපවීමේ අවශ්‍යතාව; ජෛවී ගෝලයේ විනාශය සහ පෘථිවි ජීව-ධාරක පද්ධතීන් රැකගැනීමේ අවශ්‍යතාව; සහ මේ සියල්ල විසඳ ගැනීමට බාධක වන වෙනත් විවිධාකාර විභේදනයන් සහ එකී ගැටළු විසඳීම සඳහා සහයෝගී ඒකාබද්ධ ප්‍රයත්නයන්ගේ අවශ්‍යතාව යනු මෙකී පංච අභියෝගයයි.

මේ ගැටළු පහ පුද්ගලයා, පවුල, ප්‍රජාව, ජාතිය සහ සමස්ත මනුෂ්‍ය වර්ගයා යන සෑම මට්ටමකටම පොදුය. අප සියළු දෙනාටම ඝාතනය කරනු ලැබීමේ බියෙන් ද, ආර්ථික විහීනතාවයෙන් ද, විෂ සහිත පරිසරයෙන් ද, ගෞරවය ලබා නොදීමේ තත්වයෙන් ද, මේ ප්‍රශ්න විසඳ ගැනීම සඳහා ඒකාබද්ධව කටයුතු කිරීමට අසමත් වීමේ තත්වයෙන් ද නිදහස් වීමේ සහතිකය අවශ්‍යය. මේ ගැටළු අන්‍යොන්‍ය සහ-සම්බන්ධයෙන් යුක්ත වන අතර, අවසාන විසඳුම් කාරකය ලෙස මාරකත්වය මත දිගටම යැපීම තුළින් ඒවා තව තවත් භයානක ලෙස උග්‍ර වෙති; ඝාතනය මගින් ආරක්ෂාව සොයන අපි ඒ සඳහා සන්නද්ධ විය යුත්තෙමු. එමගින් ප්‍රති-ඝාතන තර්ජන නිර්මාණය කරන්නෙමු. ඝාතනය සඳහා සන්නද්ධ වීම ආර්ථික විහීනතාවයට දායක වෙයි. එය ව්‍යුහාත්මක අසමානතාව සහ අසාධාරණය උග්‍ර කරයි; මානව හිමිකම් තහවුරු කිරීමේ හෝ නිෂේධ කිරීමේ අභිප්‍රායයෙන් කරන ඝාතනද දීර්ඝ කාලයක් තිස්සේ ඇදෙන මාරක නොත්තර ජනනය කරයි; යුධ ගැටුම් සහ යුධ කාර්මිකකරණය පරිසරය භයානක ලෙස සෝද පාළු කර දමයි; අනතුරුව, බියෙන්

තැති ගැනී තම තමන්ගේ සර්ෂණකාරී ද්‍රෘය රාමුවලට කොටු වී සිටීමෙන් හුදෙක් සිදුවන්නේ සියළු දෙනාටම යහපත සලසන ගැටළු-විසඳීමේ කාර්යය ඉදිරියට ගෙන යෑමට අවශ්‍ය කෙරෙන සහයෝගිතාවය වර්ධනය නොවී ඇනහිටීමයි.

නිර්ඝාත ගැටළු විසඳීමේ පිළිවෙත ඝාතනය නිෂේධ කිරීම පමණක් නොව අවශ්‍යතා තෘප්ත කෙරෙන තත්වයන් වර්ධනය කිරීමේ නිර්මාණශීලී කාර්යය ද ගම්‍ය කරයි. එයින් අදහස් වන කරුණු කාරණා මෙබඳුය; යුද්ධය සහ එහි ආයුධ අහෝසි කිරීම සඳහා කොන්දේසි රහිතව ක්‍රියාත්මක වීම, දරිද්‍රතාවය අහෝසි කිරීම, මානව අයිතීන් සහ වගකීම් පිළිබඳව අහිංසාවාදී මැදිහත් වීම, පාරිසරික චිරස්ථායිභාවය සඳහා ක්‍රියාන්විත අනුබලය ගොඩ නැගීම, මනුෂ්‍ය අවශ්‍යතාවන්ට සංවේදී වන ගැටළු-විසඳීමේ ක්‍රියාවලීන්ට දයක වීම සහ එමගින් පුද්ගලයා සහ සමස්ථ මනුෂ්‍යවර්ගයා තුළ අප්‍රමාණ නිර්මාණාත්මක විභවයන් අවදිකිරීම යනාදී වශයෙනි.

මෙවැනි න්‍යාය පත්‍රයක් මනෝරාජික වශයෙන් පෙනී යාමට පුලුවන. එනමුත් එය උරුමයක් වශයෙන් මේ යුගයේ ප්‍රායෝගික කාර්ය සාධනයන් පිළිබඳ ඉහළම අත්දැකීම් ඇති දේශපාලන, යුධමය, ආර්ථික, විද්‍යාත්මක, සංස්කෘතික සහ සිවිල් සමාජ යනාදී ක්ෂේත්‍රවල සමහර නායකයින් විසින්ම අප වෙත පවරා දී ඇතැයි කීම අතිශයෝක්තියක් නොවේ. ඔවුන්ගේ ඒ දයාදය පුරාතනයේ ද දක්නට ලැබුනු මූලික මනුෂ්‍ය සංවේදිතාවන් සමුච්ඡයක් නව ගෝලීය යුගයක් තුළ අනුනාද දීමක් බඳුය. මෙහිදී, දේශපාලන විද්‍යාඥයින් විසින් යට දක්වෙන නිරීක්ෂණය අවධාරණයෙන් සටහන් කර ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. එය නම්, එක්සත් ජාතීන්ගේ සංගමය හෝ වෙනත් එබඳු ජාත්‍යන්තර ව්‍යුහයන් විසින් කැඳවනු ලැබූ ගැටළු-විසඳීමේ සෑම සම්මන්ත්‍රණයකදීම පාහේ අපේක්ෂිත වෙනස්කම් ඇති කරනු වස් 'දේශපාලන අධිශ්ඨානය' අත්‍යවශ්‍ය බව පෙන්වමින් එය නිර්මාණය කිරීම සඳහා ඇපකැප වීමට ලෝකයේ ජනතාවන්ට ආයාචනා කෙරී තිබීමයි. මෙම ආයාචනා එල්ල වන්නේ හුදෙක් ආණ්ඩුවලට පමණක් නොවේ, සහයෝගිතා පදනමක් නිර්මාණය කළ හැකි ගැටළු-විසඳීමේ සෑම මූලාශ්‍රයක් වෙතටමය. පක්ෂ, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ කොම්පැනි, සංගම්, විශ්ව විද්‍යාල, මාධ්‍ය, ආගම් සහ කලාව පවා මෙම අඬගැමට ලක් වෙයි. මිහිපිට ජීවිතය

මුලිනුපුටා දැමීමට තර්ජනය කරන ගෝලීය ගැටළු තීව්‍ර වත්ම හදිසි තත්වයක් එළඹෙන බව වඩ වඩා උග්‍රව දැනෙමින් පවතී. ඒ සමග වර්තමානයේ අප ක්‍රියාත්මක වීමට අසමත් වුවහොත් අනාගතයේ මුහුණ දීමට සිදුවන ව්‍යසනයන් පිළිබඳ අවබෝධය ද වර්ධනය වෙමින් පවතී. මේවා අතර, සීමාරහිතව ආයුධ ව්‍යාප්ත වීම; උග්‍රවන ආර්ථික පරතරයන් සමග වේගයෙන් වර්ධනය වන ජනගහණය නිසා ජාතීන් තුළ සහ අතර, දරා සිටීමේ භෞතික සහ මානසික සීමා බිඳ හෙලෙමින් දරුණු පිපිරීම් ඇති වීම; ස්වභාවධර්මය අසීමාන්තිකව තාර්මික සහ තෘෂිකාර්මික සූරාකෑමට ලක්වීම නිසා මිහිපිට ජීවය අනතුරට පාත්‍ර වීම; පිළිගත හැකි මට්ටමේ ජීවන තත්වයක් ඇති කර ගැනීම සඳහා ස්ත්‍රීන්, ස්වදේශික ජනතාවන්, පීඩිත සුළු ජනයා සහ වෙනත් අප්‍රමාණ සංස්කෘතික කණ්ඩායම් සමාන සහභාගිත්වයේ  අයිතිය උදෙසා කරන ඉල්ලීම්වලට ගරු නොකිරීම නිසා ඇතිවන ස්වයං-විනාශකාරී තත්වය යනාදිය අවධානයට යොමු කරනු වටී. තනි ජාතික රාජ්‍යයක කෝණයෙන් ලෝකය දෙස බලන විට පෙනෙන තත්වයට වඩා වෙනස්ව, ගෝලීය යතාර්ථය ගැන වඩාත්ම ප්‍රාමාණික දැනුමක් තිබෙන අය - උදහරණයක් ලෙස, යුනෙස්කෝ ආයතනයේ අධ්‍යක්ෂ ෆෙඩ්රිකෝ මේයර් වැනි අය-දකින චිත්‍රය නම් කිසිම කටයුත්තක් සාමාන්‍ය අන්දමට කළ නොහැකි 'හදිසි තත්ව යුගයකට' අප සේන්දු වී ඇති බවයි. (Mayor 1995:83-93). දේශපාලන විද්‍යාව ඉදිරියේ ඇත්තේ මීට වෙනස් යුගයක් නොවේ.

## නිර්ඝාත ප්‍රතිපදව සහ නිරායුධකරණය

විසඳීම සඳහා අප ඉදිරියේ ඇති ගැටළු හෝ ඒවා විසඳීමට මතු වූ අහිංසාවාදී ව්‍යාපාර හෝ ශාස්ත්‍රාලීය දේශපාලන විද්‍යා නිර්මාණයන් නොවෙති. ඒවා සමකාලීන ගෝලීය දේශපාලන ජීවිතය විසින්ම මතු කරනු ලැබ ඇත. දේශපාලන විද්‍යාවට පැවරී ඇත්තේ එම ගැටළු විසඳීම සඳහා කැප වීමයි. එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ නිරායුධකරණය පිළිබඳ ප්‍රථම සැසිවාරයේ (U. N. General Assembly 1978) අවසාන වාර්තාව තුළ ගැටළු-විසඳීම පිළිබඳව සුපැහැදිලි අභියෝගයක් අඩංගු වී ඇත; එය ආරාධනා කරන්නේ 'ජාත්‍යන්තර පාලනය යටතේ දියත් වන පොදු සහ පූර්ණ අවිහරණයකට' නොහොත් සමස්ත නිරායුධකරණයකටයි. රාජ්‍යයන්

159ක් (ඇලබේනියාව හැරුණු කොට) සියළුම න්‍යෂ්ටික අවි අහෝසි කිරීමට පොදුවේ එකඟතාවය පළ කළහ. තවද සියළුම ජීව-රසායන අවි සහ වෙනත් සංහාරාත්මක අවි අහෝසි කිරීමටද; සියළුම විදේශීක හමුදා කඳවුරුවලින් ඉවත් වීමටද; සීමිත භෞමික ප්‍රදේශයන්ගේ ආරක්ෂාවට සෑහෙන්නාවූ මට්ටම් දක්වා හැර ඉතිරි හමුදා අතිරික්තයන් නිෂේධ කිරීමටද; සම්ප්‍රදායයික අවි සංචිතයන් අඩු කිරීමටද; ගෝලීය වශයෙන් හමුදා වියදම් සඳහා විනාශකාරී ලෙස යොදවන අති දැවැන්ත සම්පත් ප්‍රමාණයන් ආර්ථික වශයෙන් අඩුවෙන් සංවර්ධිත රටවල ආර්ථික සහ සමාජ අවශ්‍යතාවන් ඉටු කර ගැනීම සඳහා හැරවීමට ද, ඊට අමතරව, මීට අදාළ තවත් යෝජනා රාශියකට ඔව්හු එකඟතාවය පළ කළහ. මේ වනාහි ප්‍රධාන වශයෙන් ප්‍රචණ්ඩ රාජ්‍යයන් විසින් අහිංසාවාදී ගෝලීය පරිවර්තනයක් සඳහා කරන ලද සම්භාව්‍ය ඓතිහාසික හඬ නැංවීමකි. අවාසනාවට දේශපාලන විද්‍යාර්ථීන් බොහෝ දෙනෙකු මේ කරුණ ගැන දන්නේ නැත.

## නිර්ඝාත ප්‍රතිපදාව සහ ආර්ථික විහීනතාවය

ගැටළු විසඳීමේ ආරම්භයන්ට අත වනන තවත් සම්භාව්‍ය ආයාචනයක්, රසායන විද්‍යාවේ සිට භෞතික විද්‍යාව දක්වා වූ ක්ෂේත්‍රවල නොබෙල් ත්‍යාගලාභීන් පනස් තුන් දෙනෙක් එක්ව කරන ලද 'ප්‍රකාශණයේ' අඩංගු වෙයි. වළක්වා ගත හැකි ආර්ථික විහීනතාවය නිසා ගෝලීය 'අග්නිහෝමයක්' නොහොත් අති දැවැන්ත පරිමාණයේ ජන සංහාර තත්වයක් ඇතිවීම නැවැත්වීම ඔවුන්ගේ මෙම ප්‍රකාශණයේ අරමුණ විය. (Nobel Prize Winners 1981:61-3). ඔව්හු මෙසේ කියා සිටිති. 'ආර්ථික විහීනතාවය සහ මන්ද පෝෂණය නිසා දශ ලක්ෂ ගණන් මරණයට පත් වීමේ ගෝලීය පරිමාණයේ ව්‍යසනය හෙළා දකිමින් ඊට එරෙහිව සටන් වදින සියල්ලෝම එහි හේතූන් දේශපාලනික යැයි ඒකමතිකව තරයේ පිළිගනිති'.

*පුරවැසියන් ද දේශපාලන නායකයින් ද ඒ ඒ මට්ටම් වලදී - මැතිවරණ, පාර්ලිමේන්තුව, ආණ්ඩුව හෝ ජාත්‍යන්තර සභාවන් තුළ - මන්දපෝෂණයෙන් සහ ඌණ සංවර්ධනයෙන් විපතට පත් වූ බිලියන ගණන් ජනතාවන්ගේ ජීවිත රැක ගැනීම සඳහාත්, සෑම පරම්පරාවකම කුසගින්නෙන් මියයන දශලක්ෂ සංඛ්‍යාත ජනයාගේ ජීවිත රැක ගැනීම සඳහාත් සම්පාදිත නව නීති, නව අයවැය, නව ව්‍යාපෘතීන්, සහ නව ක්‍රියාපිළිවෙත් වහාම ක්‍රියාවට යොදනු පිණිස තම ඡන්දය භාවිතා කිරීම අත්‍යවශ්‍යව ඇත.*

*තවද, 'ජීවය දරන සියල්ල රැක ගනු පිණිස, ඝාතනය සහ සමූලඝාතනය නොකරනු පිණිස, සමහර විට ක්‍රියාත්මක වීමට අසමත් වීම නිසා නැතහොත් අනවධානය හෝ වැරදි පුරුදු නිසා ජීවිතය විනාශ වීම වැළැක්වීම පිණිස' ඔව්හු විපර්යකාරක අහිංසාවාදී ආර්ථික විප්ලවයක් වෙනුවෙන් හඬ නගති.*

> *මේ මිහිපිට වෙසෙන බලවතුන් වඩාත් ඉහළ වගකීමක් දරන මුත්, වගකීම ඔවුන්ගේ පමණක් නොවේ. අසරණයෝ තම ඉරණම තමන්ගේම අත්වලට ගන්නෝ නම්, මානව හිමිකම්වලට එදිරිව යන අන් කවර නීතියකට වුවත් හිස නැමීම ඔව්හු ප්‍රතික්ෂේප කර සිටින්නෝ නම්, දුබලයෝ ස්වයං - සංවිධානය වී ඔවුන්ට ලබාගත හැකි ප්‍රබලම ආයුධය වන ගාන්ධි විසින් සංනිදර්ශනය කරන ලද අහිංසාවාදී ක්‍රියාමාර්ග භාවිතා කරන්නෝ නම්, සීමිත සහ උචිත ඉලක්ක කරා හඹා යන්නට ඔව්හු සූදානම් වන්නෝ නම්; ඔව්, එසේ නම් මේ දුර්දශාව අවසන් කිරීමට හැකි බව නියතය.*
>
> *(63).*

ඔව්හු තම ප්‍රකාශනය මෙසේ නිමා කරති. 'ක්‍රියාත්මක වීමට කාලය එළඹ ඇත. නිර්මාණය කිරීමට කාලය එළඹ ඇත. අනෙක් අයටත් ජීවත් වීමට ඉඩ ලබා දෙන අයුරින් ජීවත් වීමට කාලය දැන් එළඹ ඇත'.

අසමානතාවය, ජනගහන වර්ධනය සහ හමුදාකරණය අන්‍යොන්‍ය ලෙස ප්‍රතික්‍රියා කරමින් ආර්ථික මාරකත්වය, ප්‍රචණ්ඩත්වය සහ පරිසර විනාශය උග්‍ර කරති. 1999 ලෝක බැංකු වාර්තාවට අනුව දිනකට ඩොලර් 1ට අඩු ආදායමක් ලබන 'පරම දරිද්‍රතා' මට්ටමේ ජීවත් වන ජනගහණය සමහර විට මිලියන 1.5 ක් පමණය ඩොලර් 2ට අඩු ආදායම් මට්ටමේ සිටින ජනගහණය ඊට අනුව බිලියන 3 ක් පමණය. ඉන්දියාවේ පමණක් පරම දරිද්‍රතා මට්ටමේ ජනගහනය 1980 අගභාගයේ සිට මේ වන විට මිලියන 300 සිට මිලියන 340 දක්වා වර්ධනය වී ඇත. **(world Bank 1999).** සමගාමීව ආදායම් අසමානතාවය වර්ධනය වෙයි. එක්සත් ජාතීන්ගේ විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර නායකත්ව ඇකඩමියේ ප්‍රථම වැඩසටහනට සහභාගි වූ 160ක් තරුණ නායකයන්ගේ පරිශීලනය සඳහා 1997 ජූනි මාසයේදී ලෝක බැංකුවේ තරින් හුසේන් විසින් සම්පාදිත වාර්තාව මෙසේ පවසයි;

> *ලෝකය, 1990 මැද භාගය වන විට 1980 තත්වයට වඩා උග්‍ර ලෙස ධ්‍රැවීකරණයට ලක්ව ඇත. ලෝකයේ 20% වන වඩාත්ම දුගී ජනකාය,*

> *පසුගිය 30 වසර තුළ, ගෝලීය ආදායමෙන් තම කොටසව පැවති 2.3%, තව දුරටත් පහළට වැටෙමින් 1.4%ක් බවට පත් වූ සැටි නිරීක්ෂණය කළහ. මේ අතර වඩාත්ම පොහොසත් පිරිස, තම කොටස 70% සිට 85% දක්වා ඉහළ නගින සැටි අත් දුටහ. මෙලෙස පොහොසතුන් ගේ සහ දුප්පතුන්ගේ කොටස් අතර අනුපාතය 30:1 සිට 61:1 දක්වා මාරුවිය. ලෝකයේ සුපිරි පොහොසතුන් 360 දෙනාගේ වත්කම් ලෝකයේ ජනගහණයෙන් 45% ක් වෙසෙන රටවල්වල ඒකාබද්ධ වාර්ෂික ආදායමට වඩා දත් වැඩිය. (Husain 1997:13).*

ලෝක බැංකුවේ සභාපති ජේම්ස්.ඩී. වූල්ෆොන්ෂොන් අසමානතාවය ප්‍රචණ්ඩත්වය වෙතට පාර කපන බවට මහත්මා ගාන්ධි සමග එකඟ වෙයි. ඔහු මෙසේ ප්‍රකාශ කරයි. 'අසමානතාවය අස්ථාවරභාවය ජනිත කරයි. දරිද්‍රතාවය යුද්ධය නිපදවයි' (Husain 1997:6). ගාන්ධි ඒ ගැන මෙසේ පවසා ඇත. 'පොහොසතුන් සහ කුසගින්නෙන් පහරනු ලබන දශලක්ෂ ගණන් අතර මහා පරතරයක් තිබෙන තුරු අහිංසාවාදී ආණ්ඩු ක්‍රමයක් දිනාගැනීම පැහැදිලි වශයෙන් කළ නොහැකිය .....පොහොසත්තු ධනය ද, ධනය ලබාදෙන බලය ද පොදු යහපත සඳහා බෙදා හදා ගනු පිණිස ස්වේච්ඡාවෙන්ම අත් නොහරින්නෝ නම් .... ප්‍රචණ්ඩ සහ ලේ වැකි විප්ලව ඇතිවීම නියත තත්වයකි'. (Gandhi, Collectedworks 75 (1941): 158). පරම්පරාවෙන් උරුම වූ ධනස්කන්ධයෙන් වැඩි හරියක් අත් හළ බෙස්ට් ඩියුරන් නමැති තරුණ අමෙරිකානු සාම ක්‍රියාකාරිනිය ගාන්ධිගේ සහ ලෝක බැංකු සභාපතිගේ අන්තරාවලෝකනයන් එකට එකතු කරමින් මෙසේ ප්‍රකාශ කරයි. චිරස්ථායි සාමයක් දිනා ගැනීමේ එකම ක්‍රමය නම් ධනය නැවත බෙදා හැරීමයි. තමන්ගේ අවශ්‍යතාවන්ට වඩා වැඩි ප්‍රමාණයක් බදා ගෙන සිටින අය එම ග්‍රහණය නිසාම දරිද්‍රතාවය ද, යුද්ධයද, දුක්වේදනාවන් ද නිර්මාණය කරති, (Mogil and Slepian 1992:100). ලෝක බැංකු සභාපති, ගාන්ධි සහ තරුණ අමෙරිකානු ක්‍රියාකාරිනියගේ අදහස් සමග, අවුරුදු 2300කට පෙර ජීවත් වූ ඇරිස්ටෝටල් ගේ මේ අදහස් අනුනාද දෙයි;

> *පුද්ගලයින් වේවා, ආණ්ඩුවේ පක්ෂයන් වේවා නැතහොත් ගෝත්‍රික කණ්ඩායම් වේවා, බලය භාවිතා කරන ලොකු පොඩි ඒ කවරෙක් වුවත් විප්ලවයන් ජනනය කරන කැළඹීම් ඇති කරන්නෝ ඔව්හුය. මවුන් අතින් මෙය වක්‍රව සිදුවිය හැකිය. ඒ ඔවුන්ගේ බලය කෙරේ අනික් අය ඊර්ෂ්‍යා කරන බැවිනි. එහෙත් ඔව්හු සෘජුවම ද මෙය කරති. ඒ තමන් අනෙක් අයට වඩා වෙනස් සුපිරි පිරිසක් ය යන මානයෙන් අනෙක් අය සමග සමානාත්මතාවයෙන් ජීවත් වීම ප්‍රතික්ෂේප කරන හෙයිනි. (Aristotal 1962:199).*

වේගවත් ලෝක ජනගහණ වර්ධනය (1950 බිලියන 2.5-2000 දී බිලියන 6.1 ක් වන බවට ගණන් බලා ඇත. 2050 දී, එම ප්‍රමාණය 8.9ක් පමණ වන බවට අපේක්ෂිතය.) අහිංසාවාදී ගැටළු-විසඳීමේ ප්‍රයත්නයට බලගතු අභියෝගයක් එල්ල කරයි. 2050 වන විට ලෝකයේ වැඩිම ජනගහණයක් සහිත රටවල් වනු ඇත්තේ ඉන්දියාව (1,529,000,000), චීනය (1,478,000,000), අමෙරිකා එක්සත් ජනපදය (349,000,000), පාකිස්ථානය (345,000,000) සහ ඉන්දුනීසියාවයි (321,000,000). ලෙස්ටර් බ්‍රවුන් සහ වර්ල්ඩ්වොච් ආයතනයේ ඔහුගේ සහකරුවන් විශ්ලේෂණය කරන ආකාරයට සෑම වසරකටම මිලියන 80ක් පමණ ජනගහණයක් එකතු වීම, පෘථිවියේ ජීව-ධාරක පද්ධතීන් මත උග්‍ර පීඩනයක් ඇති කරන්නට පටන් ගෙන ඇත. ක්ෂේත්‍ර 19ක් හරහා මෙම තර්ජනය මෝදු වන බව ඔව්හු පෙන්වා දෙති; ඒවා නම්, ජල සැපයුම, ධාන්‍ය නිෂ්පාදනය, බල ශක්තිය, ශෂ්‍ය භූමි ප්‍රමාණය, වනගහණ ප්‍රදේශය, ජෛව - විවිධත්වය, දේශගුණික විපර්යාසයය, රෝග, නාගරීකරණය, නිවාස සැපයුම, අධ්‍යාපනය, රැකියා සහ රටවල් තුළද ඒවා අතරද ගැටුම් ජනනය වීම වශයෙනි. **(Brown, Gardner and Halweil 1999)**.

යුද්ධය, ජනඝාතනය, ළදරු ඝාතනය, ගබ්සාව, මෙන්ම තියභය සහ වසංගතය බඳු ජනගහණ පාලනයේ සම්ප්‍රදායික මාරක ක්‍රමවේදයන් හා සාධකයන් සෑම අතින්ම ගැටළු සහගත වන බැවින් නිර්ඝාත දේශපාලන විද්‍යාවට එල්ල වන අභියෝගය නම් අහිංසාවාදී විකල්පයයන් සෙවීමට සහ භාවිතාවේ යෙදවීමට ආධාර කිරීමයි. මෙයින් අදහස් වන්නේ දේශපාලන න්‍යායේ කේන්ද්‍රය තුළට මනුෂ්‍ය ජීවිතයේ ගුණාත්මක අවශ්‍යතාවන්ට ගරු කිරීමද, ජීව-ධාරක පරිසරය ද රැගෙන ආ යුතු බවයි. එය ආර්ථික ගැටළු-විසඳීමේ භාවිතාවන්ට ආධාරක විය යුතුය.

ආර්ථික නිර්-හමුදාකරණයේ අවශ්‍යතාවය පිළිබඳව තියුණු ප්‍රතිවේධයක් පෙන් වූවන් අතර ලෝකයේ වඩාත්ම වර්ණනාවට පාත්‍ර වූ හමුදා නායකයින්, වෘත්තික ඝාතකයින්, සිටිති. ඔවුන් අතරින් එක් පුද්ගලයෙක් නම් අමෙරිකාවේ ජනාධිපති ධූරයට පත් වූ, දෙවන ලෝක යුද්ධයේ සෙන්පති ඩ්වයිට් ඩී. අයිසන්හවර්ය. (1953-1961). ඝාතන සංස්කෘතිය සහ ආර්ථික ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය අතර

පවතින අන්‍යොන්‍ය සම්බන්ධය පිළිබඳව ඔහු පෙන්වන නියුණු ප්‍රතිවේධය, කිසිදු සාමවාදී ප්‍රකාශකයෙක් පසු කර ගොස් නැතැයි කිව හැකි තරම්ය;

> *නිපදවන ලද සෑම තුවක්කුවක්ම, දියත් කරන ලද සෑම යුද්ධ නෞකාවක්ම, මුදා හරින ලද සෑම රොකටයක්ම සංඥා කර සිටින්නේ, අවසාන විග්‍රහයේදී, ආහාර ලබා නොදීම නිසා කුසගින්නෙන් පෙළෙන ජනකායගෙන් ද, වස්ත්‍ර නොදීම නිසා සීතලෙන් දුක් විඳින ජනකායගෙන් ද ධන සම්පත් සොරා ගෙන ඇති බවයි. අවි දරා සිටින්නා වූ ලෝකය ඒ සඳහා වියදම් කරන්නේ මුදල් පමණක් නොවේ. එය තම ශ්‍රමිකයන්ගේ දහඩිය ද විද්‍යාඥයින්ගේ නිර්මාණ කෞශල්‍යය ද, දරුවන්ගේ බලාපොරොත්තු ද ඒ සඳහා කැප කරයි... සැබෑ අර්ථයෙන් මෙය ජීවත් වීමට සුදුසු ක්‍රමයක් නොවේ. යුද්ධ තර්ජනයේ අඳුර මැද්දේ යකඩ කුරුසියක එල්ලා ඇත්තේ මනුෂ්‍යත්වයයි. (Address to the American Society of Newspaper Editors, April 16, 1953).*

මනුෂ්‍යත්වයට 'යකඩ කුරුසියක් මත එල්ලී සිටීමට' සිදුව ඇති එක හේතුවක් නම්, අමෙරිකා එක්සත් ජනපදයේ න්‍යෂ්ටික අවි ව්‍යාප්තියේ වටිනාකම පියවීමට කර ඇති 'සොරකමයි'. 1940 සිට 1996 දක්වා ඒ වෙනුවෙන් යට කර ඇති ධනය ඩොලර් ට්‍රිලියන 5.821ක් වශයෙන් ගණනය කර ඇත. (Schwartz 1998). ගෝලීය හමුදා වියදම් සඳහා කෙරෙන අති දැවැන්ත ධන-සම්පත් විනාශය ගැන ඉහත දත්ත ඉඟියක් සපයති. ගෝලීය වශයෙන්, 1990 දශකයේදී, යුධ වියදම්වල මධ්‍ය අගය වසරකට ඩොලර් බිලියන 500 කට අධික වූ බව ගණනය කර ඇත. (Sivard 1996:7). ගෝලීය හමුදාකරණය නිසා සිදුවන ආර්ථික විහිනතාවය තවදුරටත් පිළිගැනීම ප්‍රතික්ෂේප කළ යුතු බව නිර්ඝාත දේශපාලන විද්‍යාව කියා සිටියි. මනුෂ්‍යත්වය යකඩ කුරුසියෙන් ගලවා, දරිද්‍රතාවයේ ලෝකව්‍යසනය නිමා කිරීමට සංවර්ධනාත්මක මැදිහත් වීමක් කිරීම සඳහා දයක විය යුතු බව එය පිළිගනියි.

## නිර්ඝාත මානව හිමිකම් සහ වගකීම්

විශ්ව මානව හිමිකම් ප්‍රකාශණය ද, (1948), එය ක්‍රියාවට නැංවීම අරබයා සම්පාදිත සිවිල්, දේශපාලන, සමාජ, ආර්ථික ගිවිසුම් සහ ප්‍රඥාප්තීන් ද ගැටළු විසඳීමේ කාර්යභාරය මත අත්‍යවශ්‍ය අභියෝගයක් පවත්වයි. එකී මූලික ලේඛණය සෑම දේශපාලන විද්වතෙකුටම, ගෝලීය පුරවැසියෙකුටම හුරුපුරුදු එකක්ව තිබිය යුතුය.

විශ්වීයත්වය සහ සංස්කෘතික සුවිශේෂත්වය අතර විවාද පවතින්නේ වුවද, මානව හිමිකම් කවර ආකාරයකට නිර්වචනය වුවද අහිංසාවාදී ක්‍රමවිධීන් හරහා ඒවා තහවුරු කිරීමට සහ රැකීමට නිර්ඝාත දේශපාලන විද්‍යාව බැඳී සිටියි. තවදුරටත්,' ඝාතනයට භාජනය නොවීමේ අයිතිය සහ අනෙක් අය ඝාතනය නොකිරීමේ වගකීම විශ්වීය වශයෙන් පිළිගැනීමට පත් කිරීමටත්, එම මූලධර්මය ව්‍යවහාරික වශයෙන් ක්‍රියාත්මක කිරීමටත් එය අරමුණු කරයි. එහිලා අවශ්‍ය කෙරෙන එක් පියවරක් වන්නේ විශ්ව ප්‍රකාශණය තුළටත්, ගෝලීය භාවිතය තුළටත් යට කියැවෙන ප්‍රතිපාදනය ඇතුල් කිරීමයි;

*වගන්තිය 3(2). ඝාතනයට භාජනය නොවීමේ අයිතිය සියළු දෙනා සතු වන අතර, අනෙක් අය ඝාතනය නොකිරීමේ වගකීම සියළු දෙනා දැරිය යුතුය.*

සෑම මට්ටමකදීම මානව හිමිකම් සුරැකීම සහ අභිවර්ධනය උදෙසා ක්‍රියාත්මක වන පුද්ගලයින්ට සහ සංවිධානවලට ආධාර කිරීම සඳහා අවශ්‍ය කෙරෙන පර්යේෂණ, පුහුණුව, උපදේශණය සහ ක්‍රියාත්මක වීම එල්ල කොට ගෙන තම සම්පත් සාර්ථක ලෙස යෙදවීම නිර්ඝාත දේශපාලන විද්‍යාව ඉදිරියේ ඇති අභියෝගයකි. උදහරණයක් වශයෙන් ස්ත්‍රීන් සහ ගැහැණු දරුවන්ට එරෙහි සෑම ආකාරයේම ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම අරමුණු කොට ගෙන 1995 බෙයිජිං සමුළුවේ සම්මත කර ගත් වැඩ සැලැස්ම එබඳු ක්‍රියාත්මක කිරීම සඳහා විශාල කැපවීමක් ඉල්ලා සිටින න්‍යාය පත්‍රයක් වෙයි. (United Nations 1996).

අහිංසාවාදී පිළිවෙත් ඔස්සේ මානව හිමිකම් රැකීම අරබයා පූර්ණ - පරාඝීය දේශපාලන විද්‍යා මැදිහත් වීමක් 1961 පිහිටුවන ලද ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය (Amnesty International) විසින් සංනිදර්ශනය කරනු ලැබ ඇත. එහි කටයුතු පදනම් ව ඇත්තේ විශ්ව මානව හිමිකම් ප්‍රකාශනයේ ලා සංගෘහිත මෙබඳු මූලධර්ම මතයි; 'කිසිවෙකුත් වධයට, නැතහොත් කෲර, අමානුෂික, ගර්හාත්මක සැලකීමට හෝ දඬුවමට පාත්‍ර නොවිය යුත්තේය'. (5 වගන්තිය), 'කිසිවෙකුත් හිතුවක්කාර ලෙස සිර කරනු ලැබීමට, රඳවා තැබීමට හෝ පිටුවහල් කිරීමට පාත්‍ර නොවිය යුත්තේය'. (9 වගන්තිය) සහ මත දැරීමේ සහ ප්‍රකාශ කිරීමේ නිදහසට ඇති අයිතිය

සියළු දෙනා සතු වෙයි; මේ අයිතිය, බාධා කිරීම්වලින් තොරව මත දැරීමටත්, තොරතුරු සහ අදහස් දේශ සීමා නොතකා කවර මාධ්‍යයක් ඔස්සේ හෝ ලබා ගැනීමටත් ප්‍රකාශ කිරීමටත් ඇති නිදහස අඩංගු කර ගනියි'. (18 වගන්තිය). ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය මරණ දඬුවම සහ වධදීම ගෝලීය වශයෙන් අහෝසි කිරීමටද, සියළු දෙනාට සාධාරණ නඩු ඇසීම් ලබා ගැනීමටද, ප්‍රචණ්ඩත්වයේ නොයෙදුනු සහ ඒ වෙනුවෙන් පෙනී නොසිටින හෘදය සාක්ෂිය නිසා සිරගත වූවත් සියළු දෙනා වහාම නිදහස් කර ගැනීමටද කැපවෙයි. මේ කටයුතුවලදී අහිංසාවාදී දේශපාලන ක්‍රියාවන්ගේ සියළු ආකාර ක්‍රමවිධීන් භාවිතාවේ යොදා ගනු ලැබේ.

දේශපාලන විද්‍යාඥයින්ගේ අවධානය ඉල්ලා සිටින තවත් මානව හිමිකම් සංවිධානයක් නම් 'නියෝජනය නොවන ජාතීන්ගේ සහ ජනතාවන්ගේ සංවිධානයයි'. (Unrepresented Nations and Peoples Organization- UNPO). 1991 දී පිහිටුවන ලද මෙම සංවිධානය මහාද්වීප පහේ වෙසෙන ස්වදේශික ජනතාවන් 50කට වැඩි ගණනකගේ සාමූහික මානව හිමිකම් සියළු දෙනා විසින් පිළිගනු ලැබීම උදකර ගැනීම සඳහා ව්‍යාපාරයක නිරතව සිටියි. UNPO ගිවිසුමට ලිඛිත මාර්ගයෙන් බැඳීම හරහා සාමාජිකයින් වීමෙන් පහත දක්වෙන මූලික ප්‍රතිපත්තිය සමග බැඳී ක්‍රියාත්මක වීමට අවස්ථාව ලැබේ; ප්‍රතිපත්ති උපකරණයක් ලෙස ප්‍රචණ්ඩත්වය ප්‍රතික්ෂේප කිරීම සහ අහිංසාවාදය ප්‍රවර්ධනය කිරීම. UNPO සංවිධානය ප්‍රචණ්ඩ භාවිතාවන් අඩු කිරීම සඳහා පැහැදිලි සහ නිශ්චිත ප්‍රතිපත්ති සම්මත කර ගන්නා මෙන් ආණ්ඩුවලින් ද ජාත්‍යන්තර සංවිධානවලින් ද, රාජ්‍ය නොවන සංවිධානවලින් ද ඒවායේ නායකයින්ගෙන් ද ඉල්ලා සිටියි. තම අරමුණු පිළිබඳව ඔව්හු තවදුරටත් මෙසේ කියති;

> *ප්‍රමාණය, සංස්කෘතිය හෝ ආගම ගැන නොතකා සුළුතර ජනතාවන්ද ඇතුළු සියළු ජනතාවන්ගේ සමාන අයිතීන් පිළිගැනීම සහ ඒවාට ගරු කිරීම, නියෝජනය නොවන ජනතාවන්ගේ හා සුළුතර ජන කොට්ඨාශවල අවශ්‍යතා සහ අදහස් බැරෑරුම් ලෙස සැලකිල්ලට ගැනීම; තම අරමුණු ඉටු කර ගැනීම සඳහා සාමකාමී සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම විධීන් භාවිතා කරන ආණ්ඩුවල හෝ ව්‍යාපාරවල සුජාතභාවය පිළිගැනීම; එබඳු සියළුම ව්‍යාපාර සහ ආණ්ඩු සමග විවෘත සහ අවංක සම්භාෂණයක යෙදීම හා අහිංසාවට ඇති ඔවුන්ගේ කැපවීම අගැයීම සහ රජයන් ද, රජයන් විසින් තම අධිකාරිය පවත්වන ජාතීන්, ජනතාවන් සහ සුළුතර ජනතාවන්*

*අතර ද වූ ගැටුම් සමථනය සඳහා සාමකාමී විසඳුම් සෙවීමට ක්‍රියාකාරී සහයෝගය ලබා දීම. යනාදිය එහි අභිමතාර්ථ තුළ අඩංගු වෙති. (UNPO 1998:8).*

තවද, 'ජනතාවන්ගේ පැවැත්ම රඳා පවතින ස්වභාවික සම්පත් නිර්දය ලෙස සහ ප්‍රචණ්ඩ ලෙස සූරාකෑම නැවැත්වීම අවශ්‍යය; එමෙන්ම වගකීම් රහිත ආයුධ වෙළෙඳාම හරහා ද, මාධ්‍ය තුළින් සහ වෙළෙඳ භාණ්ඩ තුළින් ප්‍රචණ්ඩත්වය වාණිජකරණය කිරීම හරහා ද හිංසනය ප්‍රවර්ධනය කිරීම නැවැත්වීම අවශ්‍යය'. යනුවෙන් එය සමාගම් සහ මූල්‍ය ආයතන අමතා කියා සිටියි.

ජනඝාතනයන්ට, වාර්ගික-ඝාතනයන්ට, පරිසර සංහාරයන්ට මුහුණ දුන් ජනතා පිරිස්වල අහිංසාවාදී දේශපාලනයට ඇති මෙකී කැපවීම නිර්ඝාත දේශපාලන විද්‍යාව ඉදිරියේ පැහැදිලි අභියෝගයක් තබා ඇත. ලෝකයේ ස්වදේශික ජනතාවන්ගේ සහ සුළුතර ජනතාවන්ගේ සංඛ්‍යාව සහ ඔවුන්ගේ අනන්‍යතාව පිළිබඳ අවශ්‍යතාවන්ගේ පරිමාණය සලකා බලන විට පෙනී යන්නේ එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍ය සංඛ්‍යාවට වඩා UNPO හි සාමාජිකත්වය කාලයාගේ ඇවෑමෙන් වැඩි විය හැකි බවයි.

## නිර්ඝාත ප්‍රතිපදාව සහ පාරිසරික යහපැවැත්ම

පාරිසරික මාරකත්වයෙන් නිදහස ලබා ගැනීමට මනුෂ්‍ය වර්ගයාට උපකාර කිරීමත් නිර්ඝාත දේශපාලන විද්‍යාව ගම්‍ය කරයි. අපි පරිසරය විනාශ කරමු; පරිසරය අප විනාශ කරයි. නිර්ඝාත සමාජයකට නිර්ඝාත පරිසරවේදයක් අවශ්‍යය.

*ජෛවී ගෝලයේ ජීව-ධාරක ශක්තිය මනුෂ්‍යයා විසින් විනාශ කිරීම පිළිබඳව වඩ වඩා තීව්‍ර අනතුරු ඇඟවීම් විසිවන ශතවර්ෂය අගවන විට ඇසෙන්නට විය. හමුදා කාර්මීකරණය සහ යුද්ධ මගින් පෘථිවියේ ජෛව පද්ධතීන් අනතුරට ලක් කිරීම මෙකී ව්‍යසනය වඩාත් උත්සන්න කරන්නා වූ මාරක දායකත්වයක් බවට දැන් පෙරළී ඇත. 1982, ඔක්තෝබර් 28 ද එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ මහා සමුළුවේ දී සාමාජික රටවල් 111 විසින් එක්ව සම්මත කර ගන්නා ලද ස්වභාවධර්මය පිළිබඳ ලෝක ප්‍රඥප්තිය (The World Charter for Nature) මෙසේ ප්‍රකාශ කරයි; 'යුද්ධය සහ වෙනත් එදිරිවාදිකම් නිසා සිදුවන හානිවලින් ස්වභාවධර්මය ආරක්ෂා කර ගනු ලැබේ' (Art.1.sect.5). මෙම ප්‍රතිපදාව ඛේදනීය ලෙස උල්ලංඝනය කෙරුණු අවස්ථා මෑත ඉතිහාසයේ පවා වාර්තාගතය; වියට්නාම් යුද්ධයේදී අමෙරිකා එක්සත් ජනපදය විසින් රසායනික ද්‍රව්‍ය යොදා ගනිමින් කැලෑවල කෘතිම පත්‍ර පතනයක් ඇති කිරීම, ගල්ෆ් යුද්ධයේ*

*දී ඉරාකය විසින් තෙල් ළිං ගිනි තැබීම, ප්‍රකට උදාහරණ දෙකකි. බැරී කොමනර් සූත්‍රගත කොට ඇති අභියෝගය නිර්ඝාත දේශපාලන විද්‍යාව ඉදිරියේ පවතින්නේය; 'පෘථිවිය සමග සාමයක් ඇති වීමට එය මත වෙසෙන මිනිසුන් අතර සාමය උදාකර ගැනීම අවශ්‍යය'. (Commoner 1990:243).*

1992, රියෝ ද ජැනීරෝ නුවර පැවති 'පරිසරය සහ සංවර්ධනය' පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රධාන සම්මන්ත්‍රණයේ මහලේකම් ධූරය දැරූ මවුරිස් එෆ්. ස්ට්‍රෝන්ග් තවත් අභියෝගයක් දෙසට ඇඟිල්ල දිගු කරයි; 'ලෝකය වඩාත් ආරක්ෂිත, චිරස්ථායී සහ සාධාරණ තැනක් වීම කරා යන පාරට ප්‍රවේශ කරවීම සඳහා ද පාරිසරික විප්ලවයක් අවශ්‍ය වෙයි.' (United Nations 1993:1). සම්මන්ත්‍රණයේ අනුගමනීය ක්‍රියාමාර්ග ගැන සාකච්ඡා කෙරෙන Agenda 21 නම් ලේඛණය මෙසේ දක්වයි; චිරස්ථායි සංවර්ධනය අඩාල කරන විනාශකාරී භාවිතාවන් අතර යුද්ධය ප්‍රධානය. (Principle 24). එමෙන්ම, සාමය, සංවර්ධනය සහ පරිසර සංරක්ෂණය අන්‍යොන්‍ය වශයෙන් රඳා පවතින අතර අවියෝජනීය ද වෙති. (Principle 25). එහිලා ගැටළු විසඳීමේ ක්‍රියාමාර්ගවලට බැසීම සඳහා රජයන්ට, ආණ්ඩුවලට, පුරවැසියන්ට, ස්ත්‍රීන්ට, තරුණ ජනයාට සහ ස්වදේශික ජනතාවන්ට ආයාචනා කොට තිබේ. එම ලැයිස්තුවටම, හමුදා, යුධ කර්මාන්ත, සමාගම්, කම්කරු සංවිධාන සහ දේශපාලන විද්වතුන් ද ඇතුළත් කළ හැකිය.

පැවැත්ම සහ යහපැවැත්මට එරෙහිව ඇති අනෙකුත් තර්ජන මෙන්ම පාරිසරික ගැටළුද සංකීර්ණ, අන්තර්-විෂයික සහ ගෝලීය ස්වභාවයක් ගනිති. මීට අදාළ මහජන ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාවට නැඟීම, නිර්ඝාත පර්යාලෝකයක සිට දියත් කිරීම අවශ්‍යය. කවර පාරිසරික තර්ජන මනා ලෙස අවබෝධ වී තිබේ ද, ඒ අතරින් හදිසි විසඳුම් ක්‍රියාමාර්ග අවශ්‍ය වන්නේ මොනවාටද, හදිසි පර්යේෂණ අවශ්‍ය වන්නේ කුමන ගැටළුවලටද, අවශ්‍යතා මූලික සමාජමය තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හිදී වඩාත් හොඳින් විද්‍යාත්මක ඥාණය හඳුන්වා දෙන්නේ කෙසේද? යනාදී කරුණු හඳුනා ගැනීම මෙහි ලා පවතින විද්‍යාත්මක කාර්යභාරයයි. රාජකීය ස්වීඩන් විද්‍යා ඇකඩමිය මීට අදාළ ආදර්ශන ප්‍රවේශයක් ඉදිරිපත් කර ඇත. (Royal Swedish Academy of Sciences 1983; Sebek 1983).

අහිංසාවාදී ලෙස පාරිසරික ගැටළු විසඳීම සඳහා කැපව සිටින පුද්ගලයින්, සංවිධාන සහ සමාජ ව්‍යාපාර ගැන විශේෂ අවධානයක් සහිතව ඇපළපකාර කිරීමක් නිර්සාත දේශපාලන විද්‍යාව ගම්‍ය කරයි. තත්කාලීන අහිංසාවාදී පාරිසරික ව්‍යාපාර අතර කැපී පෙනෙන ඒවා කිහිපයක් මෙසේය. රුක් රැක ගැනීම සඳහා ගැමි ස්ත්‍රීන් දියත් කළ ඉන්දියාවේ චිප්කෝ ව්‍යාපාරය, (Weber 1989; Nautiyal 1996), සෘජු ක්‍රියාවන් හරහා මහජන සහ පෞද්ගලික ප්‍රතිපත්ති වෙනස් කිරීමට ප්‍රයත්න දරන ග්‍රීන්පීස් (Greenpeace) ව්‍යාපාරය, (Stephenson 1997), සහ පාරිසරික ව්‍යාපාරයක් ලෙස ආරම්භ වී දේශපාලන පක්ෂයක් බවට පත් වූ හරිත පක්ෂය ;Die Grunen (The Greens).

හරිත පක්ෂයේ නිර්මාතෘවරුන්ගෙන් කෙනෙක් වූ පෙට්රා කාරින් කේලි (Petra Karin Kelly 1947-1992), දයාද කර ඇති උරුමය විසින් 21 ශතවර්ෂය සඳහා ගැටළු විසඳීමේ න්‍යාය පත්‍රයක් නිර්සාත දේශපාලන විද්‍යාවට ප්‍රදානය කරනු ලැබ තිබේ. ඇයගේ ආමන්ත්‍රණය තුළ නිරායුධකරණයේ සිට ආර්ථික අභියෝග, මානව හිමිකම් හරහා පෘථිවිය රැක ගැනීම සඳහා ලෝක ව්‍යාප්ත සහයෝගීතා ක්‍රියාමාර්ග දක්වා තීරණාත්මක ගැටළු සියල්ලම අන්තර්ගත වී තිබේ. ඇය 'පාරිසරික වගකීම් පිළිබඳ ගෝලීය සංස්කෘතියක' අවශ්‍යතාවය ගැනත්, 'සියලුම රටවල් අතර පාරිසරික සම්බන්ධතා පාලනය පිළිබඳ වගකිමට බැඳීමේ ප්‍රතිපත්ති' සම්පාදනය කිරීමේ අවශ්‍යතාවය ගැනත් අවධාරණය කරන්නීය. (Kelly, 1992:76). පෙට්රා කේලි, නිර්සාත ගෝලීය පරිවර්තනය සඳහා විසිවන සියවස තුළ සහ ඉන් ඔබ්බට විශාල දයකත්වයක් පිරිනමා ඇති බව හඳුනා ගනිමින් අනාගතයේ දී ඇගේ නම ටෝල්ස්ටෝයි, ගාන්ධි, අබ්දුල් ගෆාර් ඛාන්, සහ මාටින් ලූතර් කිංග් (කණිෂ්ඨ) වැනි දැවැන්තයන් ගේ නම් සමග එක පෙළට තැබෙනු ඇත. (Kelly 1989; 1992; 1994; Parkin 1994).

## නිර්සාත ප්‍රතිපදාව සහ ගැටළු-විසඳීමේ සහයෝගීතාවය

සරලව හඳුනාගත හැකි කාර්ය භාරය වන්නේ පුද්ගල මට්ටම්වල සිට ගෝලීය මට්ටම දක්වා සාමකාමී ගැටළු-විසඳීමේ ක්‍රියාවලීන්ට ආධාර කිරීමයි. ආධාර අවශ්‍ය වන්නා වූ සියළු දෙනා අතර ජීවිතය

පිළිබඳ බහුමානයෙන් යුත් සහයෝගිතාවක් නොමැත්තේ නම් ආරක්ෂාව හෝ ආර්ථික යහපැවැත්ම හෝ, මානව හිමිකම් සඳහා ගෞරවය හෝ, පාරිසරික යහපැවැත්ම හෝ වෙනත් අත්‍යවශ්‍ය ජීව-ධාරක කොන්දේසියක් හෝ සාක්ෂාත් කර ගත නොහැකි වනු ඇත. මෙයින්, දේශපාලන විද්‍යාව සෑම ප්‍රශ්ණයක්ම විසඳන මුත් ගැටළු-විසඳීමේ සහයෝගීතාවයට අනුබද්ධ ක්‍රියාවලින් ආධාර දීමේ වගකීම නම් මග හරින්නේ යැයි ගම්‍ය නොකෙරේ. එනමුත් එයින් සියල්ල ආවරණය කිරීමේ තත්වයක් ද නොහැකේ. අරාජිකවාදීහු පවා තමන්ගේ නිදහස සඳහා අවශ්‍ය වන සහයෝගිතා ක්‍රියාකාරීත්වයට ගෞරව කිරීමක් අනෙකුත් අරාජිකවාදීන්ගෙන් බලාපොරොත්තු වෙති. ආධිපත්‍යය සඳහා වූ තරඟය සහ ගැටුම මත පදනම් වන්නා වූ දේශපාලනයෙන් ඉවත් වීමක් නිර්ඝාත ප්‍රවේශය ගම්‍ය කරයි. එකී දේශපාලනයේ අවසාන තීරකයා වන්නේ විද්‍යාමාන වන නැතහොත් සැඟවී පවතින ප්‍රචණ්ඩත්වයයි. අනික් අතට, නිර්ඝාත දේශපාලනය විසින් ගම්‍ය කරනු ලබන්නේ ජීවිතය උත්කර්ෂයට නංවන්නා වූ, අන්‍යෝන්‍ය ගෞරවය සංලක්ෂණය කර ගත් අනවරතව පළල් වීමක් පෙන්වන අන්‍යෝන්‍ය සහයෝගී ගැටළු-විසඳීමේ චක්‍රයි. ප්‍රචණ්ඩත්වය අධිකාරීත්වයක් මුද්‍ර හරිමින් බෙදීම් ඇති කරද්දී, අහිංසාව සහයෝගීතාවය ජනනය කරමින් ඒකාබද්ධ කරන්නේය. එබැවින් නිර්ඝාත දේශපාලනය, ගැහැණුන් සහ පිරිමින්, ආගම් සහ ශිෂ්ටාචාර වර්ග, වාර්ගික ප්‍රභේද, පංති, ප්‍රජාවන්, රාජ්‍යයන්, ජාතික සහ පාර-ජාතික සංවිධාන සහ ගෝලීය ව්‍යාපාර අතර ඒකාබද්ධ- සහයෝගී ක්‍රියාවන්ගේ අවශ්‍යතාව අවධාරණය කරයි. අභිමතාර්ථය වන්නේ ඝාතනය හෝ ඝාතන තර්ජන රහිතව සියළු දෙනාගේ යහපැවැත්ම උදෙසා ගැටළු විසඳීමයි. මෙහිලා ගැටුම් සමථකරණය පිළිබඳ න්‍යාය සහ භාවිතය සම්බන්ධයෙන් අන්තර්-විෂයික සහ වෘත්තික උනන්දුවක් මතුවී වර්ධනය වීම - ඒ තුළ සාකච්ඡාව සහ සම්මන්ත්‍රණය හරහා ධනාත්මක, 'දෙපාර්ශවයම දිනන්නාවූ' විසඳුම් සහිතව ගැටුම් නිරාකරණය සොයා යෑම මගින් ඉදිරිපත් වී ඇත්තේ අති ප්‍රමුඛ පහසුකරණ මූලාශ්‍රයකි. (Fisher and Ury 1981; Burton 1996).

ප්‍රචණ්ඩත්වයෙන් සංලක්ෂිත රාජ්‍ය සහ සිවිල් සමාජ නිර්ඝාත සමාජ බවට පරිවර්තනය වීම සඳහා උපකාර කිරීමට, නිර්ඝාත දේශපාලන විද්‍යාව අභිවර්ධනය වන්නා වූ පර්යේෂණ මත පදනම්

වෙමින් මැදිහත් වනු ඇත. ඇතැම් දේශපාලන සැකසුම් තුළින් ප්‍රකාශ වන ප්‍රජාතන්ත්‍රවාදී සංවර්ධනයේ ඓතිහාසික ජයග්‍රහණයන් එය පිළිගනියි. එහෙත් 'නිදහස් දේශපාලනය' හෝ 'නිදහස් වෙළෙඳපොළ' විසින් විසඳුම් ලබා දී නොමැති චර්යාත්මක සහ ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටළුවලට එය විසඳුම් සොයයි. අත්තනෝමතික බලය පාලනය කිරීම උදෙසා පුරවැසියන් විසින් අගයක් ලබා දී ඇති ව්‍යවස්ථාවන්ගේ වටිනාකමද, පුරවැසි නිදහස ආරක්ෂා කිරීමේ අරමුණින් සම්පාදිත අයිතීන් පිළිබඳ අණ පනත්වල අගයද, නූතන රාජ්‍යයේ ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන අංශ තුනේ ආයතනික වශයෙන් වූ තුලන සහ සංවරණ ක්‍රියා පිළිවෙත්වල ප්‍රයෝජනවත් බවද නිර්සාත දේශපාලන විද්‍යාව පිළිගනී. තවද, සිවිල් යුද්ධ වාතාවරණයන් හුදෙක් මැතිවරණ පක්ෂ අතර තරඟයක් බවට පත් කළ හැකි නම් එය යහපත් දෙයක් බවද එය සටහන් කරයි. ඊට අමතරව වෘත්තික නිලධරයේ සේවය, ආගමික නිදහස, මත දැරීමේ සහ ප්‍රකාශණයේ නිදහස අගැයීමට ලක් කරමින්, ඡන්දය දීමේ අයිතිය විශ්වීය සහභාගිත්ව අයිතියක් තරා පුලුල් කළ හැකි අයුරු ගැනද කල්පනා කරයි. (Finer 1997; Goldman 1990). තව දුරටත් එය, යට කී නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් සතුව පවතින ප්‍රචණ්ඩ හමුද සහ පොලිස් බලයට විකල්පයන් අවශ්‍ය බව හඳුනා ගනිමින් ඒ ගැන සෙවීම තම න්‍යාය පත්‍රයට ඇතුල් කරගනී. එකී ප්‍රචණ්ඩ බලවේග, බොහෝ විට එම රාජ්‍යයන්ගේ සම්භවයට සහ විකාශයට ආධාරක වූ බවද, දැන් ඒවායේ පැවැත්ම එකී ප්‍රචණ්ඩත්වය සමග ගැඹුරින් බැඳී ඇති බවද මෙහිලා සටහන් කිරීම ප්‍රයෝජනවත් වෙයි.

ඉතාම 'දියුණු' යැයි කියනු ලබන ප්‍රජාතන්ත්‍රවාදී රටවල් තුළ පවා මනුෂ්‍ය අවශ්‍යතාවන් කෙරේ සංවේදීව ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් පද්ධතිමය අසාර්ථකත්වයක් ප්‍රදර්ශනය වන අතර එය භෞතික සහ ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය වශයෙන් ප්‍රකාශයට පත් වේ. සමකාලීන විද්‍යාමානවීම් කිහිපයක් සිහි කැඳවනු වස් අමෙරිකාව උදහරණයට ගෙන බලන්න; පවුල තුළ සහ පාසල තුළ මිනීමැරුම් සහ ප්‍රචණ්ඩත්වය; ප්‍රචණ්ඩ කල්ලි, මත්ද්‍රව්‍ය සහ දිවිනසා ගැනීම්වලින් ප්‍රකාශිත තරුණ අසහනය; මැතිවරණ තුළ ඡන්දය පාවිච්චි කිරීමේ ඉතා පහළ මට්ටම්වලින් තරමක් දුරට ප්‍රකාශ වන

දේශපාලනය සහ ආණ්ඩුව ගැන දැඩි අවිශ්වාසය සහ සමාජය පුරා ව්‍යාප්තව ඇති දරුණු දේශපාලනික පරාරෝපණය; අර්ථ විරහිත හමුදා වියදම් නිසා දැවැන්ත ධන සම්පත් නිකරුණේ විනාශ වීම; ජනගහණයෙන් අවම වශයෙන් සියයට විස්සක් වත් ආන්තිකරණයට ලක්ව මන්දපෝෂණය, සෞඛ්‍ය ගැටළු සහ නිවාස හිඟකම නිසා පීඩා විඳීම; ඔවුන්ට නිසි අධ්‍යාපනයක් නොලැබීම සහ පවුල් බිඳී විසිරී යාම; සන්නද්ධ මංකොල්ලකෑම්; වෛරය නිසා ජනිත වන සාපරාධී ක්‍රියා; සමාජ ලෛංගික සහ වාර්ගික අසාධාරණය; ජනගහණයෙන් නවත් සියයට විස්සක් තරම් වන සුපිරි ධනවත් ඉහළ පන්තිය අත ධනය වඩ වඩා ඒකරාශි වන අතර ඊට සහසම්බන්ධිත අතරමැදි පන්තීන්ගේ ආධාරය සහිතව, පොලිස් බලය දියුණු කිරීම, සිරගෙවල් වර්ධනය කිරීම, වඩාත් තදබල දඩුවම් පැමිණවීම, සහ හමුදා බලය යනාදිය මගින් ආරක්ෂාව සහතික කර ගැනීමට උත්සුක වීම - ඒ සියල්ල ප්‍රචණ්ඩ සංස්කෘතික අනන්‍යතාවක් නිර්මාණය වීමට ආධාරක වීම.

නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක සහ වර්ධිත සිවිල් සමාජයක ලක්ෂණ අඩුවෙන් පවතින රටවල තත්වය මීටත් වඩා ගැටළු සහගතය; වචනයෙන් කිව නොහැකි තරමේ භෞතික සහ ව්‍යුහාත්මක කෲරත්වයන්, අසීමාන්තික ලෙස මාරක අත්තනෝමතික පාලනයන් හා ආර්ථික විහීනතාවය නිසා උත්පාදනය වෙන අතර ප්‍රචණ්ඩත්වය එහිදී වඩාත් තියුණු හා අනේක රූප ගන්නේය. ජනතාවන්ට විඳින්නට වෙන දුක් වේදනාවන් ද මේ තත්වයන්ට අනුරූප ඝෝර අගයන් කරා ඉහළ නගින්නේය. මෙකී තත්වයන් අගැයීමට යොදා ගත හැකි දර්ශක කිහිපයක් පහත දැක්වේ; මරණ දඬුවම ලබා දීම්, වධ දීම්, දේශපාලන (මැතිවරණ) ඝාතන, ජනඝාතන, වාර්ගික කොටස් ඝාතනය කිරීම්, සන්නද්ධ පැහැර ගැනීම්, ත්‍රස්තවාදය, සන්නද්ධ විප්ලව, සහ රාජ්‍ය-අනුග්‍රාහී ආර්ථික විහීනතාවය නිසා සිදුවන සාමූහික මරණ.

ප්‍රජාතන්ත්‍රවාදී ශක්තිය අඩු හෝ වැඩි කවර රටක නමුත් මනුෂ්‍ය අවශ්‍යතාවන් කෙරේ සංවේදී වන වඩා දියුණු ක්‍රියාවලීන්ගේ නැගීමට දායක වීම නිර්ඝාත දේශපාලන විද්‍යාවේ ගැටළු-විසඳීමේ කාර්ය භාරයට අයත් කටයුත්තකි. නිසැකින්ම විද්‍යාත්මක සහ මානව

නිර්මාණශීලීත්වයට මෙහිදී එල්ලවන අභියෝගය අති දැවැන්තය. එහෙත් දනටම පැහැදිලි වෙමින් පවතින සත්‍යයක් ඇත. එය නම් නිර්සාත වට්නාකම් සහ නිර්සාත මනුෂ්‍ය ශක්‍යතාවන් පිළිබඳ නව තොරතුරු සහ දත්ත පුලුල් ලෙස හඳුන්වා දීම, ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වයන් සහ පුරවැසිභාවයන් තුළට නව නිර්සාත නිපුණතා ඇතුල් කිරීම, ප්‍රතිපත්ති නිර්මාණය සඳහා සහභාගිත්වය පහසුකරණය, සහ නව පත්නයේ අහිංසාවාදී ගැටළු විසඳීමේ ආයතන නිර්මාණය කිරීම යනාදිය හරහා අදාළ ක්‍රියාවලීන් තුළ සංවර්ධනාත්මක වෙනස්කම් සිදුකළ හැකි බවයි. මෙම පරිවර්තනයන්ට සාර්ථක අයුරින් ආධාර කිරීමට නම්, තමන් ස්ථිර සාර ලෙස අඩිය ගසා සිටින බිම වශයෙන් නිර්සාත ප්‍රතිපදව තෝරා ගැනීම කෙරේ පැහැදිලි කැපවීමක් දේශපාලන විද්‍යාවට පෙන්වන්නට සිදුවෙනු ඇත. පුද්ගලයා සහ පවුලේ සිට ලෝක සමාජය දක්වා ඉෂ්ට නොවූ මානව අවශ්‍යතා කෙරේ ආයතනික සහානුකම්පනයක් සහ ප්‍රතිචාර දක්වීමක් එය ප්‍රදර්ශනය කළ යුතුය.

# 5 පරිච්ඡේදය

# ආයතනික ගම්‍යමාන

*යම්කිසි ආයතනයක් අත්‍යවශ්‍ය ලෙස අප සලකන්නේ එය බොහෝ විට අපට හුරුපුරුදු වී ඇත්තක් නිසාම පමණකි. සමාජ සංයුතිය තුළ අඩංගුව ඇතිශක්‍යතා ක්ෂේත්‍ර ඒ ඒ සමාජයන්හි ජීවත් වන්නන් සිතනවාට වඩා බොහෝ සෙයින් පුළුල් වේ.*

*– ඇලෙක්සිස් ද ටොකවිල්*

*පෘථිවිය මත පවත්නා ජීවිතයට තර්ජනය කරන ගැටළු නිපදවනු ලැබ ඇත්තේ සාමූහිකවය. ඒවා අපට බලපාන්නේ ද සාමූහිකවය. ඒවා වෙනස් කිරීමට අප ක්‍රියා කළ යුත්තේ ද සාමූහිකවය.*

*– පෙට්රා කේ. කේලි*

තිර්සාත පදනමක් මත දේශපාලන විද්‍යාව තුළ ඇති කෙරෙන චර්යාධර්මීය-ආනුභවික මාරුවීමක් ආයතනික වශයෙන් ඇති කරන්නේ කුමන ගම්‍යයන් ද? එවැනි භාවිතයක යෙදෙන අය අරබයා ද එය විෂයයක් ලෙස දැනුමේ වෙනත් ක්ෂේත්‍රයන්ට එහි ඇති සම්බන්ධය අරබයාද, දේශීය ප්‍රජාවේ සිට සමස්තයක් වශයෙන් මානව වර්ගයා දක්වා තිර්සාත සමාජ බිහි කිරීම සඳහා අවශ්‍ය වන නොයෙක් සංස්ථා සඳහා ද මෙය මතුකරන ගම්‍යයන් කවරේද? ආයතන වනාහි, මානව අවශ්‍යතා සහ අපේක්ෂාවන්ට ප්‍රතිචාර වශයෙන් බිහි වෙන අරමුණු සහගත සමාජ සම්බන්ධතාවන්ගේ සමාකෘතීන් විශේෂයක් ලෙස දැකිය හැකිය.

ශිෂ්ටාචාරයේ ඉතිහාසය බොහෝ සෙයින්ම ආයතන නවීකරණය කිරීමේ ඉතිහාසයකි. පන්සල්, සිනගෝග (Synagogues), පල්ලි හා දේවස්ථාන හා සබැඳුනු ප්‍රජාවන් නොයෙක් ආගම් මගින් බිහි කර ඇත. පක්ෂ, මැතිවරණ හා පාර්ලිමේන්තු දේශපාලන සහභාගිත්වයේ අවශ්‍යතා මත බිහිව ඇත. පොලීසිය, උසාවි හා සිර ගෙවල් සමාජ

පාලනයේ අවශ්‍යතා මත බිහිවේ. යුද්ධ කිරීමේ අවශ්‍යතාව නිසා දිය, ගොඩ හා ගුවන් සටන් සඳහා තාක්ෂණික බලවේග බිහිවෙයි. හමුදු වියදම් සහ රාජ්‍ය කටයුතු සඳහා බදු අය කිරීමේ අවශ්‍යතාවයන් මත නිලධරයෝ බිහි වෙන්නාහුය (Finer 1977; 16-17, 20-21). පරමාණු බෝම්බය තැනීම සඳහා මැන්හැටන් ව්‍යාපෘතිය යටතේ ජාතික සම්පත් මෙහෙයවනු ලැබීය. නොදන්නා ක්ෂේත්‍ර සහ මාන ගවේෂණය කිරීම සඳහා අධ්‍යාත්මික ප්‍රයත්න, විද්‍යාව, තාක්ෂණය සහ කුසලතාවන් මෙහෙයේ යෙදෙවෙන්නෝය; නාවිකයා යැයි නම් ලද හෙන්රි කුමාරයාගේ පසළොස් වැනි සියවසේ ගවේෂණ මෙන්ම, සඳ මතට මිනිසකු යැවීම සඳහා විසිවන සියවසේ දී දියත් කෙරුණු ඇපලෝ ව්‍යාපෘතියද සඳහා සම්පත් ඉඳිවුනේ ඒ ආකාරයටයි.

නිර්ඝාත ගෝලීය සමාජයක් කරා පරිවර්තනය වීම සඳහා දයකත්වයක් දැරීමට නම්, දේශපාලන විද්‍යාව කුමන වර්ගයේ වෙනස්කම් ඇති කර ගත යුතුද? ගෝලීය ජීවිතය තුළ නිර්ඝාත කොන්දේසි බිහි කිරීමට අරමුණු සහිතව ක්‍රියා කිරීම, තත්කාලීන සන්නිවේදන හා තොරතුරු තාක්ෂණයන්හි ගෝලීය ව්‍යාප්තිය හා සම්බන්ධ වූ වෙනස්කම්වලට මෙන්ම, සර්ව-ව්‍යාපී වන සංස්ථාමය වෙනස් කම්වලට මග පාදයි. දේශපාලන විද්‍යා විශේෂ අංශ හරහා, සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ ලිංගිකත්වය, වර්ගය, පන්තිය සහ පාරිසරික ප්‍රශ්න අනුකලනය කිරීමේ උත්සාහයන් හිදී සිදුවන්නාක් මෙන්ම, නිර්ඝාත ඉදිරි දර්ශනයක් පැරණි ව්‍යුහය තුළට උකහා ගැනීම හෝ ඒකාබද්ධ කිරීම හෝ කළ හැකිය. එසේ නැතහොත් එය පැරණි දෙය ප්‍රතිව්‍යුහගත කිරීම හෝ සමාන්තර සංක්‍රමණීය සංස්ථා ස්ථාපිත කිරීම හෝ නිර්ඝාත පරිවර්තනයක් ඇති කර ගැනීම සඳහා සෑම ශක්තියක්ම ඒකරාශී කරන්නා වූ සම්පූර්ණයෙන්ම අලුත් හෝ දෙමුහුන් සංස්ථා පිහිටුවීමට තුඩු දිය හැකිය.

නිර්ඝාත සමාජ පිහිටුවීම කළ හැකි බව බැරෑරුම්ව පිළිගැනීම මගින් නිර්ඝාත විද්‍යාත්මක හා මානවාදී ගවේෂණයන් සඳහාත්, අහිංසාව සඳහා අධ්‍යාපනය හා පුහුණුව සඳහාත්, ජීවිතයේ වටිනාකම තහවුරු කරන ගැටළු විසඳීම සඳහාත් නිර්ඝාත ආරක්ෂාව සඳහාත්, සමාජයේ සෑම අංශයකම නිර්ඝාත යහ-පැවැත්ම සඳහා සේවාවන් නිර්මාණය කිරීම සඳහාත්, කැපවුනු සංස්ථාවල අවශ්‍යතාවය මතු කෙරේ.

ප්‍රජාතන්ත්‍රවාදී පද්ධතීන් ගොඩ නගන්නෝ ඒවායේ ස්වභාවය වටහා ගන්නා වූත්, ඒවා මනා ලෙස ක්‍රියාත්මක කරවන්නේ කෙසේද යන්න දන්නා වූත්, ඒවා ක්‍රියාත්මක කරවීමේ අරමුණ දරා සිටින්නා වූත්, ප්‍රජාතන්ත්‍රවාදීයෝ'ය. නිර්ඝාත දේශපාලන විද්‍යාව සම්බන්ධයෙන් ද එය එසේම වේ. නිර්ඝාත උදවක් සඳහා මාවත් ගණනාවක් පැවතිය හැකි අතර, ඒ සඳහා සියල්ලන්ටම වලංගු වන එක් මාවතක් නිර්දේශ කිරීමට නුපුළුවන. උපත, ආගමික විශ්වාසය, බුද්ධිය, සතිය, කරුණාව, පිරිවැය - ප්‍රතිලාභ විශ්ලේෂණය, සමහර තත්වයන් නිර්මාණය කර පෙන්වීම සහ භාවනා කිරීම යන මේ සියල්ල නිර්ඝාත ගවේෂණය කිරීම සහ එහි ක්‍රියාකාරීත්වය සඳහා මාවත්ය. නිර්ඝාත පිළිවෙත් අනුගමනය කිරීමට ඇති මානව ශක්‍යතාවය තහවුරු කෙරෙන දැවැන්ත ඓතිහාසික හා තත්කාලීන සාක්ෂි, අප සතු පරිවර්තනීය ශක්‍යතා සොයා ගැනීමට අපව උනන්දු කරනු ඇත.

## නිර්ඝාත දේශපාලන විද්‍යා අධ්‍යයන අංශයක්

පවතින සෑම දේශපාලන විද්‍යා විශේෂ ක්ෂේත්‍රයක් තුළට ද අධ්‍යයන අංශ තුළට ද සංගම් තුළට ද, නිර්ඝාත ජීවය ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය පවතින අතර, නව නිර්ඝාත අධ්‍යයන අංශයන් වර්තමානයේ පවතින සංස්ථා ප්‍රතිව්‍යුහගත කිරීමේ දී අනුගමනය කළ යුතු මූලික උදාහරණ සඳහා ද ඉදිරියෙහි බිහිවන්නා වූ ලෝක විශ්ව විද්‍යාල තුළ නව අධ්‍යයන අංශ ආරම්භ කිරීම සඳහා ද යොදා ගත හැකිය.

මේ අධ්‍යයන අංශය පොදු අරමුණක් පිළිබඳ හැඟීමෙන් වැඩට බසී. එය වූ කලී ඝාතන ද, ඝාතන තර්ජන ද, ඒවායේ මාරක සහ බන්ධනයන් ද ගෝලීය ජීවිතයෙන් දුරිභූත කර දැමීමයි. මේ නිසා එය, ප්‍රචණ්ඩත්වය මත පදනම් වන ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය දෙසට, නැඹුරු හෝ, විද්‍යාත්මක සමාජවාදය දෙසට නැඹුරු හෝ අධිකාරවාදී තන්ත්‍රයන්ට සම්බන්ධ හෝ අධ්‍යයන අංශ වලින් කැපී පෙනෙන අයුරින් වෙනස් වේ. නිර්ඝාත අධ්‍යයන අංශය කිසියම් වටිනාකම් මාලාවක් මගින් පීඩනයට ලක් වන්නේ නොවේ. එයම වෙනස් වටිනාකමකි. ආචාර්ය නිබන්ධන දක්වා දැනුම වර්ධනය කිරීමේ වත්මන් ක්‍රමය අනුගමනය කරන මෙම අධ්‍යයන අංශයේ පැහැදිලි

අරමුණ වන්නේ, තිර්සාර සමාජ බිහි කිරීම සහ පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය චරිත ලක්ෂණ හා නිපුණතාවන් ගොඩ නැගීමයි. මෙහිදී නිපුණතා හතරක් මූලික වෙයි: ඒවා නම්, පර්යේෂණ කටයුතු, අධ්‍යාපනය හා පුහුණුව, ක්‍රියාකාරීත්වය සහ සන්නිවේදන මාධ්‍යයන් තුළින් හා එදිනෙද ජීවිතයේ දී ප්‍රකාශයට පත්වන විවේචනාත්මක පරිකල්පනය සම්බන්ධ නිපුණතාය.

ශිෂ්‍ය ශිෂ්‍යාවන් මානව ඉතිහාසයේ ප්‍රචණ්ඩ උරුමය සමග විචිත්‍රාකාරයෙන් මුණ ගස්වන අතර, වෘත්තීය දේශපාලන විද්‍යාඥයින් ලෙස ද, පුරවැසියාගේ සේවක–නායකයින් ලෙස ද මානව පැවැත්ම තුළින් ඝාතනය ඉවත් කිරීමේ අභියෝගය භාර ගැනීමට ඔවුන්ට ආධාර කෙරෙනු ලැබේ.

ඉන්පසුව ඔවුන් නිර්මාණශීලීත්වය සඳහා (Boorstin 1983; 1992; 1998) ද දේශපාලන නිර්මාණශීලීත්වය සඳහා ද, සමාජ ජීවිතයේ සෑම අංශයකම මානව ගරුත්වය වෙනුවෙන් සාමකාමීව සේවය කිරීමේ ජීවිත අනුගමනය කිරීම සඳහා ද (Josephson 1985) ඇති මානව ධාරිතාවන්ගෙන් සවි-බල ගන්වනු ලැබේ.

ඊළඟ අදියරක් වන්නේ ගැටළු විසඳීමේ ක්‍රියාකාරීත්වය (ප්‍රචණ්ඩත්වය, ආර්ථිකය, මානව අයිතීන්, පරිසරය, සහයෝගිතාවය), තත්කාලීන දේශපාලන සංස්ථාවලට හා ගැටළු විසඳන ක්‍රියාදාමයන්ට (කලාපීය, ජාතික, ජාත්‍යන්තර, ගෝලීය) සහ නිර්සාර අනාගතයන් සාක්ෂාත් කර ගැනීමේ තීන්දු ඉදිරිපත් කිරීම සඳහා ආධාර කිරීමට හැකි නිර්සාර විඥානයේ සහ ක්‍රියාකාරී සිද්ධාන්තවල තර්කනයට සම්බන්ධ වූ ඉතාමත්ම අලුත් ඥානයට ඇති ප්‍රධානම තත්කාලීන අභියෝගයන් සමාලෝචනය කිරීමයි.

තවත් අදියරක් නම්, අවශ්‍යතා සහ දක්ෂතා පරීක්ෂණයට සහ ගැලපීමට ඉඩ ලබා දෙන්නා වූ විකල්ප වූ නමුත්, එකිනෙක ට සම්බන්ධ වන ගැටළු - විසඳීමේ ක්‍රියාකාරීත්වයන් හා ප්‍රජා සේවාවන් මාලාවක් ගවේෂණය කිරීමට ශිෂ්‍යයින්ට අවස්ථාවන් සැපයීමයි. මේ සඳහා පර්යේෂණ, අධ්‍යාපනික පුහුණුවීම්, පුරවැසි නායක ක්‍රියාකාරීත්වයන් සහ විවේචනාත්මක දේශපාලන ඇගයීම් කිරීම සඳහා නිපුණතාවයන් හඳුන්වාදීම අවශ්‍ය වනු ඇත. මෙයින් අදහස් වන්නේ බහු විධ අවශ්‍යතා සහ නිපුණතාවන් ඇති වීමේ හැකියාව

ප්‍රතික්ෂේප කිරීම නොවේ. එහෙත් එය, අහිංසාවාදී සමාජ පරිවර්තනය පහසු කිරීම සඳහා මෙම ක්‍රියාකාරීත්ව විධි සතරම අනුගමනය කළ යුතු බව පිළිගැනීමකි. ගැමි ශිල්පීන්ගේ ක්‍රීඩා කණ්ඩායම්වල ද ලක්ෂණයක් වූ අන්‍යොන්‍ය වශයෙන් උදවු කරගන්නා කුසලතා ඇති පුද්ගලයින්ගේ හැකියාවන් පිළිගැනීමට ලක් කිරීම සහ සහයෝගිත්වය ඇති කිරීම අවශ්‍ය වේ.

මෙවැනි සූදනම් කිරීම්වල දී ඊළඟ අදියර නම්, ගැටළු විසඳීමේ සහයෝගිතාවයට බාධා කෙරෙන ශාරීරික ප්‍රචණ්ඩත්වය, ව්‍යුහගත ප්‍රචණ්ඩත්වය, මානව අයිතීන් උල්ලංඝනය කිරීම්, පාරිසරික විනාශය සහ ප්‍රචණ්ඩත්වයට තුඩු දෙන ප්‍රතිවිරුද්ධතා යනාදියට විකල්පයන් නිර්මාණය කෙරෙන්නා වූ නිසි පර්යේෂණ නිපුණතා, අධ්‍යාපන සහ විවේචනාත්මක පරිකල්පනය සොයා යැමයි. මෙම ව්‍යාපෘති ප්‍රාදේශීය, ජාතික, ජාත්‍යන්තර හෝ ගෝලීය තත්වයන් වෙත මෙහෙය වීමට හැකිය. උපාධි නිබන්ධනයන් ලෙස ඉදිරිපත් කෙරෙන මෙම ව්‍යාපෘතීන්ගේ ප්‍රතිඵල අධ්‍යයන අංශයේ පුස්තකාලයේ තැන්පත් කෙරෙන අතර, සමාජීය හා පුද්ගල තීන්දු ගැනීමට උදව් කිරීම සඳහා අන්තර්-ජාලය හරහා ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

උපාධිලාභීහු රජයේ සේවයේ සහ සිවිල් සමාජයේ නිර්මාණාත්මක රැකියාවන්වලට ඇතුළත් වෙති. (ඒ හා සම්බන්ධ වූ සංස්ථා සඳහා පහත බලන්න) ඔවුන් නිර්ඝාත දේශපාලන විද්‍යාවේ එකිනෙකට සම්බන්ධ වූ ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි පාඨමාලා තුළ උසස් පුහුණුවක් ලබා ගන්නවා ඇත. එසේත් නැතහොත්, දේශපාලන විද්‍යා ගවේශණය පිළිබඳ පවතින ක්ෂේත්‍රවලට ඇතුළත්වීම හෝ දේශපාලන විද්‍යා විමර්ශනය පිළිබඳ නව ක්ෂේත්‍ර විවෘත කිරීම ඔවුන්ට කළ හැකිය. (උප ග්‍රන්ථ **B** සහ **C**.) එසේත් නැතහොත් තම උනන්දුව වෙනත් විෂයයන් හෝ රැකියාවන් කරා ගෙන යා හැකිය.

නිර්ඝාත අධ්‍යයන අංශය පැහැදිලිව සේවා සහ වෘත්තීය එල්ලයන් සහිත වූවකි. එය ආරම්භක අධ්‍යයනයන්හි සිට උසස් ආචාර්ය උපාධි අධ්‍යයනයන් දක්වා ඒකරාශී වන්නා වූ ඥාන වර්ධනයක් අන්තර්ගත කර ගනියි. ක්‍රියාකාරීවීමේ විධි, විශේෂිත ගැටළු-විසඳීමේ අවශ්‍යතාවයන්ට යෙදවීමේදී බෙදා හදා ගන්නා වූ අවශ්‍යතාවයන් වටා නොයෙක් මට්ටම් හරහා නිර්මාණාත්මක

ක්ෂේත්‍රයන් පීඨය හා උපාධි අපේක්ෂකයින් විසින් ගොඩනඟනු ලැබෙයි. නව ඥානය ගවේෂණය කර ගැනීම, අධ්‍යාපනයේදී සහ පුහුණුවේදී එය පාවිච්චි කිරීම සහ සමාජ ගැටළු විසඳීමේදී එය ප්‍රායෝගිකව යෙදවීම අතරේ අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගී වන්නා වූ සම්බන්ධතා බිහිවීමට උදව් කිරීමට අධ්‍යයන අංශය පැහැදිලිවම ක්‍රියා කරයි. තමාගේම කතිකාවත්වලදී ද, ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රමවලදී ද, එය නිර්ඝාත සමාජයක ලක්ෂණ ක්‍රමයෙන් ඇති කිරීමට අපේක්ෂා කරයි. නිර්ඝාත සමාජයක හදවත වෙමින් සමානතාවය මත පදනම් වන්නාවූ ගැහැනුන් හා පිරිමින් අතර සහ- ස්ත්‍රී-පුරුෂ සම්බන්ධතාමය සංස්කෘතියක් මේ මගින් උත්කර්ෂණයට හා ගෞරවයට ලක් කෙරෙනු ලැබේ. පර්යේෂණ සඳහා නව අවශ්‍යතාවයන් හඳුනා ගැනීමටද, කලින් දැක ගත නොහෙන කර්තව්‍යයන් සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් වඩා හොඳින් සූදානම් කිරීම සඳහා ද, උපාධිධාරීන්ගෙන් ජීවිත කාලයක් තිස්සේ කාලයෙන් කාලයට කෙරෙන ප්‍රතිපෝෂණ කාර්යය සඳහා ද අවස්ථා නිර්මාණය කර ඇත. වෙනත් ශික්ෂාවන් (Discipline) හරහා පැමිණි අත්දැකීම් බහුල ප්‍රජා නායකයින් සමහර අවස්ථාවලදී ඒකාබද්ධ සේවා පත්වීම් තුළ යොදා ගැනීම මගින් විද්‍යාලීය නිර්මාණශීලීත්වයට ප්‍රදානයන් එක් කෙරේ. නිර්ඝාත ඥානය හා නිපුණතා ගෝලීය ස්වභාවයක් ගන්නා බැවින් අධ්‍යයන අංශය ඍජු සහභාගිත්වය මගින් ද පරිගණකමය හා වෙනත් සන්නිවේදන ක්‍රමයන් මගින් ද ලොව පුරා උසස් අධ්‍යාපනික ආයතනවල කුසලතා උපයෝගී කර ගැනීම සඳහා ඉදිරියට යයි. ප්‍රාදේශීය ප්‍රජාව, මෙහිදී දකිනු ලැබෙන්නේ ගෝලීය හිත සුවයට බල පාන්නා වූ ගැටළුවලට මුහුණ දීමේ කෘත්‍යාත්මකව එක සමාන වන්නා වූ සන්දර්භයක් ලෙසය.

## විශ්ව විද්‍යාල ශාන්ති සේනා (සාම සාධන හමුදවක්)

නිර්ඝාත සමාජයන්ට පරිවර්තනය වීම ලෝකයේ බොහෝ විද්‍යාල හෝ විශ්ව විද්‍යාල සඳහා ලබා දී ඇති හෝ නිර්දේශ කර ඇති යුද පුහුණුවට විකල්පයක් ලෙස අහිංසාවාදී ශිෂ්‍ය ප්‍රජා සේවයක් පිහිටුවීම ගම්‍ය කෙරෙයි. නායකත්වය දේශපාලන විද්‍යා අධ්‍යයන අංශයක් මගින් භාර ගැනෙන නමුදු, සාමාජිකයින් සියලුම විෂයයන් තුළින් තෝරාගත හැකිය.

**ශාන්ති සේනා** – මෙය කුමන නමකින් හැඳින්වුවත් කම් නැත; අහිංසාවාදී ගැටුම් නිරාකරණය කිරීම සහ යළි සමගි වීම, ප්‍රජා ආරක්ෂාව සහ සිවිල් ආරක්ෂාව, අර්ථ-වෛද්‍යමය ජීවිත ආරක්ෂාව, ව්‍යසන සහන සේවා, සහ ප්‍රජා අවශ්‍යතාවයන්ට සාධනීය සේවා සැපයීම සඳහා තම සාමාජිකත්වය පුහුණු කැරෙන්නා වූ, විනයගත වූත්, පැහැදිලිව හඳුනාගත හැකි වූත්, බලවේගයකි. මෙහි සහභාගීත්වය, නායකත්වයේ චරිතය හා නිපුණතා වර්ධනය කරමින් ශාස්ත්‍රීය වැඩ කටයුතු සමග සමාන්තරව ගමන් කරන අතර, ඊට ඌනපූරණයක් ද වෙයි. එය, සියළුම ආගම්වල පවතින ජීවය ආරක්ෂා කරන්නා වූ උද්වේගයද, සංගීතය හා කලාවන්හි පවතින එසවුම් කාරක අධ්‍යාත්මයද, ක්‍රීඩාවේ පවතින ජීවමය ගතිය ද, අන් අයට සැබෑ සේවයක් කිරීම මගින් ලැබෙන සතුට ද, තමා වෙතට ඇද ගනියි. සරසවි භූමි ඇතුළත හා පිටත ඇතිවන අර්බුදවලදී ශාන්ති සේනාව සේවයට කැඳවිය හැකිය. එය අනෙක් සමාජ සංස්ථාවලට නායකත්ව නිපුණතා සඳහා සම්පත් ගබඩාවක් ලබා දෙයි. තත්කාලීන යුද පුහුණුව සඳහා සැපයෙන මූල්‍ය හා වෙනත් ආධාරවලට අඩු වූ සම්පත්වලින් ඊට ආධාර සැපයිය හැකිය. මෙය පූර්ව විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා ද උපයෝගී කර ගත හැකිය. අධ්‍යාපන සංස්ථාවන් තුළ ශාන්ති සේනාවක් සංවිධානය කිරීම ගැන වටිනා ප්‍රායෝගික අත්දැකීමක් ඉන්දියාවේ ගාන්ධි ගැමි විශ්ව විද්‍යාලය තුළ මහාචාර්ය එන්. රාධාක්‍රිෂ්ණන් ගේ වැඩ කටයුතුවලින් සැපයෙයි. (**Radhakhrishnan: 1997 a : 1997 b**). 1930 - 1947 දක්වා ඉන්දියාවේ පැවතියා වූත්, 80,000 ක සාමාජිකත්වයක් සිටියා වූත්, කුඩෙයි කිතමතගාර් නමැති අවිහිංසාවාදී මුස්ලිම් විමුක්ති සංවිධානය තුළින් ඉස්මතු වන පුහුණු කිරීමේ සිද්ධාන්ත සහ භාවිතයන් ද (**Banarjee 2000: 73-102**), අහිංසාවාදී සමාජ පරිවර්තනයන් ඇති කිරීම සඳහා ඇති කල කිංගේ ව්‍යාපාරය (**Lafayettte and Jehnsen 1995: 1996**) සහ අනෙකුත් අහිංසාවාදී පුහුණු වීම් අත්දැකීම් ද (යුද්ධයට ප්‍රතිරෝධ දක්වන්නවුන්ගේ කණ්ඩායම 1989) මෙයට එකතු කිරීමට පුළුවන.

## නිර්ඝාත විශ්ව විද්‍යාල

නිර්ඝාත සමාජවලට පරිවර්තනය වීම සඳහා තනිව ගත් ඕනෑම අධ්‍යයන විෂයයක හෝ විශ්ව විද්‍යාල අධ්‍යයන අංශයක හැකියාවන් ඉක්මවා යන දැනුමක් අවශ්‍ය වේ. එම නිසා, දේශපාලන විද්‍යාවේ

නිර්ඝාත පරිවර්තනය වීම යනුවෙන් අර්ථවත් වන්නේ සියලුම සමාජ විද්‍යාවන්, ස්වභාවික විද්‍යාවන්, මානව විද්‍යාවන්, හා වෘත්තීන් තුළ පවතින ශක්‍යමය ප්‍රදානයන් කැඳවුම් කිරීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම යි. කලාපීය, ජාතික, ජාත්‍යන්තර හා ගෝලීය ප්‍රජාවන් හි ජීවිතයට නිර්ඝාත සේවයක් කිරීමට කැපවුනු විශ්ව විද්‍යාල සඳහා පවතින අවශ්‍යතාවයක් එයින් ගම්‍ය වෙයි.

යුද්ධය තුළදී උපරිම ප්‍රචණ්ඩත්වය සඳහා බුද්ධිමය සහ මානව සම්පත් මුළුමනින්ම මෙහෙයවීමට තමන්ට හැකි බව විශ්ව විද්‍යාල පෙන්වා ඇත. හාවඩ් විශ්ව විද්‍යාලයේ සභාපති ජේම්ස් බී. කොනන්ට් 1942, ජුනි 18 වැනිද ප්‍රකාශ කළ පරිදි "ඇක්සිස් හමුදවන් කොන්දේසි විරහිතව යටත් වන දිනය ඉක්මන් කිරීම සඳහා අපි දැන් ශාස්ත්‍රඥයින් ගේ මෙම පෞරාණික සමාජය කැප කරන්නෙමු". යුද්ධයේ දී සටන් කිරීම සඳහා කැපවීම මගින් හාවඩ් විශ්ව විද්‍යාලයේ සංස්ථාමය ජීවිතය යළි සංස්කරණය වෙද්දී එය "කොනන්ට් ගේ ආයුධ ගබඩාව" යනුවෙන් ප්‍රසිද්ධ විනි. නිව් මෙක්සිකෝ වේ ලොස් ඇලමෝස් හි ක්‍රියාත්මක කෙරුණු අතිශය රහස්‍ය වූ පරමාණු බෝම්බය නිපදවීමේ අන්තර්-විෂයික ව්‍යාපෘතියේ වැඩ කිරීම සඳහා තරුණ හාවඩ් උපාධි අපේක්ෂකයින් බඳවා ගන්නා ලදහ. එයින් එක් අයෙකු ගේ මතකයට අනුව, එය 'එක්තරා විද්‍යාත්මක මනෝරාජ්‍යයක් විය. වයස, තත්වය හෝ කලින් ලබාගත් ජයග්‍රහණ නොතකා නිදහසේ අදහස් හුවමාරු කර ගන්නා වූ සොයාගත හැකි බුද්ධිමත්ම අයගේ විවෘත සමාජයක් විය.' (Harward Magazine, September- October 1995: cover; 32, 43).

මානවයා ගේ අඛණ්ඩ පැවැත්ම සහ අභිවෘද්ධියට තර්ජනය කරන්නා වූ ප්‍රචණ්ඩත්වයේ සියලුම රූපයන් හා යුද්ධ අහෝසි කිරීමේ කර්තව්‍යය පැරණි සහ නව විශ්ව විද්‍යාල විසින් ඉහත සඳහන් කරන ලද උද්යෝගයෙන්ම භාර ගත යුතු නොවේද? "සාම අධ්‍යයන" පාඨමාලා, ක්‍රියාමාර්ග සහ අධ්‍යයන අංශ හඳුන්වා දීමට හෝ, ඩොලර් දශලක්ෂ ගණන් ප්‍රදානයන් මත විශ්ව විද්‍යාලවල ක්‍රියාත්මක වන "සදචාරය" හෝ "හරයයන්" සම්බන්ධ අධ්‍යනයන් තුළ මූලික තේමාවක් ලෙස "අහිංසාවාදය" ඇතුලත් කිරීමට විශ්ව විද්‍යාලවල ඇති කැමැත්ත -අකමැත්ත උසස් අධ්‍යාපනය තුළ අනාගතයේ ක්‍රියාත්මක වන නිර්ඝාත ක්‍රියාමාර්ගයන්හි ඇතිවන දියුණුව මැනිය හැකි පදනමක් සපයයි.

### නිර්සාත දේශපාලන පක්ෂ

ව්‍යවහාරික නිර්සාත දේශපාලන විද්‍යාව, සියලුම දෙනාගේම අභිවෘද්ධිය සඳහා ගැටලු-විසඳීමේ අවශ්‍යතාවලට ප්‍රතික්‍රියා කිරීමේ ක්‍රියාදාමයන් තුළ සහභාගි වන්නා වූ නිර්සාත දේශපාලන පක්ෂවලින් ලබාදෙන සේවාවන් ගම්‍ය කෙරෙයි. මෙවැනි පක්ෂ හැඳින්විය හැකි වර්ගීය නාමයක් වන්නේ 'අහිංසාවාදී සර්වෝදය පක්ෂය' යන්නයි. මෙවැනි පක්ෂ සුවිශේෂ සමාජ සංස්කෘතික තත්වයන් තුළින් සංකල්ප වශයෙන්, නමින් හා සංවිධාන වශයෙන් නිර්මාණාත්මකව බිහිවනු ඇත.

නිර්සාත සමාජවල එල්ලයන් වන්නේ දේශීය හා ගෝලීය වශයෙන් නිර්සාත සමාජ බිහිකිරීමට දායක වීමයි. පන්ති මත පදනම් නොවීම සහ සියලු දෙනාගේම අවශ්‍යතාවයන් ගොනු කිරීමට හා ප්‍රකාශ කිරීමට උත්සාහ දැරීම යන කරුණු මත ඔවුන් අතීතයේ පැවති පක්ෂවලින් වෙනස් වෙයි. මක්නිසාද යත්, මාරක බව හා එහි අනුබන්ධයන් නොපැවතීමත් නිදහස, සාධාරණත්වය හා භෞතික අභිවෘද්ධියෙහි නිර්සාත ස්වභාවයක් පැවතීම නිසාත් සියලු දෙනාටම යහපත සැලසෙන බැවිනි. නිර්සාත ප්‍රතිපත්ති මත පදනම්ව තරඟ කරන පක්ෂ කිහිපයක් පැවතීම, බලාපොරොත්තු විය හැක්කකි. මැතිවරණ තරඟය පොදු මහජන ප්‍රතිපත්ති-සම්පාදනය හා අනිකුත් කටයුතුවල නිරතවන දේශපාලන පක්ෂවල අපේක්ෂිත සාධනීය ප්‍රදානය, සෘජු දේශපාලනික සහයෝගිතාවයට එරෙහි ගාන්ධිවාදී තහංචිවලින් වෙනස් වෙයි. දේශපාලනය නියත වශයෙන්ම දූෂණය වන බැවින්, අහිංසාවාදී සාධනීය කම්කරුවන් වෙත 1947 දෙසැම්බරයේ දී ගාන්ධිගේ අවසාන උපදෙස වූයේ දේශපාලනයෙන් ඉවත්ව සිටින ලෙසය. (එකතු කළ කෘති 90:223-A). ඒ වෙනුවට අහිංසාවාදී සමාජයක් වෙනුවෙන් පෙනී සිටින කම්කරුවන්, දේශපාලඥයින් හා ප්‍රතිපත්ති මත පිටතින් බලපෑම් කරමින්, තමන් තුළ විශාලතම අවශ්‍යතාවයන් පවතින්නා වූ මිනිසුන් අතරෙහි සිවිල් සමාජය තුළ වැඩ කළ යුතුවේ. තර්කානුකූලව මෙයින් අදහස් වන්නේ අහිංසාවාදී ක්‍රියාකාරීන් හා ඔවුන්ගේ ජනතාව දූෂිතයන් හා ඔවුන්ගේ ආධාරකරුවන් හට යහපත් දෑ කිරීම සඳහා බලපෑම් කිරීමට උත්සාහ දරන අතරේ අනෙක් මිනිසුන් හට දූෂණය වීමට ඉඩ සැලසීම සහ ඔවුන්ට, ඩොලර් කෝටි ගණනක බදු නිෂ්කරණය,

ලක්ෂ ගණනක මිනිසුන් හා යුද්ධය, ආරක්ෂාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, අධ්‍යාපනය, ආර්ථිකය, සංස්කෘතිය හා පරිසරය ඇතුළු සමාජීය ජීවිතයේ සියලු රූපකාරයන් හට බලපාන අයුරින් තීරණ ගැනීමට ඉඩ සැලසීමයි. කෙසේ නමුත්, ගාන්ධිගේ දූරදර්ශී භාවයෙහි ශක්තිය කෙසේද යත් ඔහු තමන්ගේ නිර්දේශපාලනික නිර්දේශ අනාගතයේ දී දේශපාලනයට සහභාගි වීමේ අපේක්ෂාවෙන් යුතුව පවත්වාගෙන ගියේය. "නමුත් අපට අවශ්‍ය යැයි ද වෙන කිසිවෙක් නොව අප පමණක් බලයේ සිටිය යුතුයැයි ද මහජනයාටම හැඟී යන්නා වූ සහ එසේ පවසන අවධියක් පැමිණිය හැකිය. ප්‍රශ්ණය එවිට නැවත සලකා බැලිය හැකිවෙයි." (223)

නිර්ඝාත දේශපාලන පක්ෂ, නිර්ඝාත සමාජ විපර්යාසයක් ඇති කිරීම සඳහා උපකාරී කිරීම සඳහා සුදුසුම සංස්ථාවන් වෙයි. ස්වභාවයෙන්ම ඒවායේ බිහිවීම සඳහා වාසිදායක කොන්දේසි පෘථුල ලෙස වෙනස් වෙයි. පක්ෂ, මැතිවරණ හා නියෝජිත පිරිස සමාජීයව පිළිගනු ලබන තැන්හිදී පමණක් නොව වෙන කිසිම තැනක දී හෝ එය පහසු නොවනු ඇත. නිර්ඝාත දේශපාලන පක්ෂවලට සියලු දෙනාගේම අවශ්‍යතාවයන්ට අනුකූලතා දක්වන ක්‍රියාවලීන් හා ප්‍රතිපත්තිවලට සම්මාදම්වීම සඳහා දිගු කාලීන හා වෙහෙසකර පරිත්‍යාගශීලි අරගලයන්ට සහභාගි වීමට පුළුවන. සටනේ පවතින නූතනවාදී විෂයයන් සැලකිල්ලට ගැනීම නව දැනුම, නව නිපුණතා, නව සංවිධාන ආකෘති හා සාධනීය ප්‍රශ්ණ විසඳීමේ ක්‍රියාවන්හි නව ප්‍රතිපත්ති එකට ගැලපීමේ අභියෝගාත්මක කර්තව්‍යය නිදර්ශනාත්මකව විස්තර කරයි. ඒවා අතර ගබ්සාව, මරණීය දණ්ඩනය, අනිවාර්ය යුද්ධ සේවය, යුද්ධය, සන්නද්ධ විප්ලවය, ත්‍රස්තවාදය, ජන ඝාතනය, සාපරාධී භාවය, සමාජ ප්‍රචණ්ඩත්වය, සංස්කෘතික ප්‍රචණ්ඩත්වය, නිරායුධකරණය, හා ආර්ථික හමුදාහරණය වෙයි. එහෙත් නිර්මාණශීලිත්වය, ධෛර්යය, ලෝක සහයෝගීතාව සහ සමාජ ඉගැනුම් ක්‍රියාවලින් හරහා ප්‍රගතිය ඇති කර ගත හැකිය.

## අහිංසාවාදී රාජ්‍ය සේවා දෙපාර්තමේන්තු

පාලනයේ සෑම මට්ටමකදීම අවශ්‍ය වන්නේ අහිංසාව හා සම්බන්ධිත කැබිනට් වගකීම් සහිත වූ රාජ්‍ය සේවා දෙපාර්තමේන්තුය. ඒවායෙහි කර්තව්‍යය වන්නේ නිර්ඝාත

දේශපාලන විශ්ලේෂණයෙහි තර්කනය හා සම්බන්ධිත ප්‍රජා තත්වයන් අධීක්ෂණය හා පශ්චාත්-මාරක විපර්යාසාත්මක පුනරුත්ථාපනය සඳහා වන වෘත්තීය පුහුණුව සඳහා අනුබල දීම සහ නිර්ඝාත ප්‍රජා සමෘද්ධිය සඳහා පහසුකම් සලසන පොදු ප්‍රතිපත්ති කෙරෙහි උපදෙස් දීමය. ප්‍රචණ්ඩත්වය සඳහා වන තත්වයන් ප්‍රජාවකගේ ජීවිතයෙහි ගුණාත්මකභාවය කෙරෙහි පළල් ලෙස බලපාන බැවින් ඒවා කෙරෙහි රාජ්‍ය සේවා අවධානය යෙදවීම කසල ඉවත් කිරීමට හෝ පිරිසිදු ජල සැපයුමක් සඳහා කටයුතු සැලසීමට වඩා අඩු නොවන කැපවීමේ ගුණයකින් යුක්ත වෙයි.

අහිංසාවාදය සඳහා වන දෙපාර්තමේන්තුවක් සියලු පොදු හා පුද්ගලික මූලාශ්‍රවලින් ප්‍රචණ්ඩත්වය බැහැර කිරීමේ ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය වන ප්‍රචණ්ඩත්ව සංඛ්‍යා ලේඛණ හා උපදේශයන් එක් රැස් කරනු ඇත. එය විසින් රාජ්‍ය පාලනය පිළිබඳ නීති සම්පාදකයින් සහ සිවිල් සමාජයේ සාමජිකයන් වෙත, බොහෝ සෙයින් ස්වාධීන විගණක ඒජන්සියක් මෙන්ම, වාරික වාර්තා සපයනු ඇත. මෙහිදී ප්‍රමාණික වශයෙන් අවධානය අවශ්‍ය කෙරෙන ක්ෂේත්‍ර නම්, මිනී මැරුම්, දිවිනසා ගැනුම්, ගෘහස්ත ප්‍රචණ්ඩත්වය, පාසල්වල ප්‍රචණ්ඩත්වය, වැඩබිම්වල ප්‍රචණ්ඩත්වය, සාපරාධී සහ කල්ලි ප්‍රචණ්ඩත්වය, පොලිස් ප්‍රචණ්ඩත්වය, සිරගෙවල් තුළ ප්‍රචණ්ඩත්වය, මාධ්‍ය ප්‍රචණ්ඩත්වය, ක්‍රීඩාව තුළ ප්‍රචණ්ඩත්වය, ආර්ථික ප්‍රචණ්ඩත්වය, හමුදා-පැරාමිලටරි-ගරිල්ලා ප්‍රචණ්ඩත්වය, ඝාතකයන් තුළ, ඔවුන්ගේ සමීපතරයන් තුළ, ඝාතනයට ලක් වූවන්ගේ සමීපතරයන් තුළ පශ්චාත්-මාරක මානසික පීඩන තත්වයන් සහ ඒවායේ සමාජ විඥාණය මත බලපෑම යනාදියයි.

මෙම වාර්තා අහිංසාවාදී පරිවර්තක හැකියාවන්ගේ ශක්තීන් හා දුබලතා ගැන අවධානය යොදවමින් වඩා සාර්ථක ලෙස ගැටළු විසඳීම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ යුතුය. කාලගුණය, කොටස් වෙළෙඳපොළ හෝ ක්‍රීඩා තොරතුරු මෙන්ම මෙහිදීද ප්‍රගතිය පිළිබඳව අනවරත වාර්තා ක්‍රියාවලියක් අවශ්‍යය.

**පොදු නිර්ඝාත ආරක්ෂක ආයතන**

නිර්ඝාත සමාජවලට සංක්‍රමණය වීමේදී ගොඩ බිම, මුහුදු හා අහස මගින් සිදු කෙරෙන මානව හිතවාදී සේවා මෙහෙයුම් සඳහා

සම්ප්‍රදායික හමුදාවට හා පොලීසියට සමානකම් ඇති, නිර්සාත සාමාන්‍ය ආරක්ෂක සේවා අවශ්‍ය වේ. එවැනි සේවා නිවාරක, අර්බුද මැඩ පැවැත්වීමේ හා ප්‍රතිසංස්කාරක ක්‍රියාමාර්ග සඳහා සහ කාර්යසාධනය පිළිබඳ පසු ක්‍රියාමාර්ගික ඇගයුම් සඳහා පුහුණු කළ යුතුව පවතී. පවතින හමුදා හා පොලිස් ශාස්ත්‍රාලයන් සංවර්ධනය කිරීම මගින් හෝ සියලු දෙනාටම සංඝටිත පුහුණුව (සහ ඉන් පසුව එන විශේෂ කර්තව්‍යයන් සඳහා ශාඛා විශේෂඥ කරණයෙන් ද සමන්විත වන) නිර්සාත සේවා ශාස්ත්‍රාල මගින් හෝ නායකත්වය සම්පාදනය කළ හැකිය. විශ්ව විද්‍යාලවල පිහිටුවන ශාන්තිසේනා, නායකත්වය සඳහා තවත් මූලාශ්‍රයක් විය හැකිය.

සමහර හමුදා සහ පොලිස් ආයතනවල ප්‍රචණ්ඩත්වය වළක්වාලීම, සුළු ආයුධ සහිතව සාම සාධක මෙහෙයුම්වල සහ මානවහිතවාදී සහන සාධනයෙහි නිරතවීම, නිර් - මාරක ආයුධවල වැඩදායි භාවය විමසීම හා ගැටුම් නිරාකරණයේ අහිංසාවාදී විධික්‍රමයන් හා උගැන්වීම් ගැන ඇති වී ඇති උනන්දුව යනාදී වර්තමාන නැඹුරුතාවන් සැලකිල්ලට ගැනීමේ දී අහිංසාවාදී පොදු ආරක්ෂක සේවාවන් වර්ධනය කිරීමේ අපේක්ෂාව පහසුවෙන් ඉවත දැමිය නොහැකිය.

අවිහිංසාවාදී සාමාන්‍ය ආරක්ෂාව සමස්ථ ජනගහනයෙන් ප්‍රාදේශීය, ජාතික, අන්තර්ජාතික මට්ටම්හිදී ක්‍රියාත්මක වීම හඟවයි. නිවාස, පූජාභූමි, රැකියා ස්ථාන හා වැඩ් වශයෙන්ම විද්‍යුත් ජාලකරණය කරන ලද නිර්සාත සාමාන්‍ය ආරක්ෂක ප්‍රජාවන් කේන්ද්‍ර කොට ගත් අහිංසාවාදී අධ්‍යයන කවයන් හා නාගරික ශාන්ති සේනා සංවිධාන කිරීම මගින් මේ සඳහා පහසුකම් සැලසිය හැක. ප්‍රාදේශීය පුරවැසියන් සංවිධානය කිරීමෙහි යොදා ගත හැකි ආදර්ශයන් ක්ෂේත්‍ර ගණනාවකම දැනටමත් පවතී.

තවද අහිංසාවාදී ආරක්ෂාව මගින් ජාතික හා පාරජාතික මට්ටම්වල පවතින අහිංසාවාදී සාමාන්‍ය ආරක්ෂණ මණ්ඩල, අහිංසාවාදී බුද්ධි ඒජන්සි හා එසේම අහිංසාවාදී සංස්කෘතික තානාපති සංස්ථාපනයන් ගැන ද හඟවයි. ප්‍රචණ්ඩ හිතවාදී ජාතික රාජ්‍ය හා ඔවුන් ගේ මාරක මිත්‍රයන්හට විකල්ප ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා අහිංසාවාදී සාමාන්‍ය ආරක්ෂණ මණ්ඩල අවශ්‍ය වේ. උදාහරණ වශයෙන් මාරකත්ව දර්ශකවල පහළතම

මට්ටමේ (න්‍යෂ්ටික අවි රහිත, හමුදා රහිත, මරණීය දණ්ඩනය රහිත, මනුෂ්‍ය ඝාතන අඩු, ආයුධ ව්‍යාපාර රහිත, හා ආදී වශයෙන්) පවතින ජාතීන් මගින් එක්සත් ජාතීන්ගේ මට්ටමේ ලෝක පොදු ආරක්ෂණ මණ්ඩලයක් නිර්මාණය කළ හැකිය. මාරකත්වයේ සියලු ස්වරූපයන් හා තර්ජනයන් හෙළි කිරීමට සහ පොදු සහ පෞද්ගලික විපර්යාසාත්මක ක්‍රියා මාර්ග ප්‍රතියෝජනය කිරීම සඳහා ඇති හැකියාවන් හඳුනා ගැනීමට නම් සන්නිවේදනයෙහි අනුවේෂ්‍යනීය ජන මාධ්‍ය හා පුරවැසි (මහජන) අනතුරු හැඟවීම් හා සම්බන්ධ අහිංසාවාදී බුද්ධි ඒජන්සි අවශ්‍ය වේ. සම්මත මිලිටේරි ආයතන හෝ ආර්ථික සම්බන්ධතා සඳහා වග කියන නිලධාරීන්ට වඩා නොඅඩුවම තානාපති ආයතන තුළ සේවය කරන අහිංසාවාදී විශේෂඥයින් අවශ්‍ය වේ.

අහිංසාවාදී සංස්කෘතික ආයතනයන් සියරට හා ආගන්තුක රටවල් තුළ හිතසුව සඳහා වන මූලාශ්‍රයන් අතර අනාවරණික, අන්‍යොන්‍ය ඉගෙනුම් හා සහයෝගිතා පාලම් ගොඩනැගීමට උත්සාහ දරයි. ලෝක අන්තර්ජාල ශක්‍යතාවයන් සම්මත රාජ්‍ය තාන්ත්‍රික, ආයතනික තත්වය පිළිබඳ මාධ්‍ය නිර්වචනයන් මත පරාධීන නොවන මනාව පිළියෙල කරන ලද අහිංසාවාදී ක්‍රියාමාර්ග සම්පාදනය සඳහා සමර්ථභාවය ද සමගින් වන සාමාන්‍ය ආරක්ෂක තොරතුරු ලෝක ව්‍යාප්ත ලෙස පුරවැසියන් අතර බෙදා හදා ගැනීමේ පෙර නිමිති දක්වයි.

රාජ්‍ය තාන්ත්‍රික හා පෞද්ගලික සංවිධානයන්හි නිර්ඝාත පොදු මහජන සේවාවල නිපුණතාවය වැඩි කිරීම, අහිංසාවාදී පුහුණුව සඳහා යෝග්‍ය ආයතනයන් ඉල්ලා සිටියි. සමහර විට ප්‍රථමයෙන් අනු කොටස් ලෙසත් අවසානයේ දී ක්‍රියාකාරී සම-ආදේශක ලෙසත් යුද්ධ විද්‍යාල, පොලිස් පීඨයන්, රාජ්‍ය පරිපාලන විද්‍යාල සහ සිවිල් සමාජයේ පවතින අනිකුත් ප්‍රචණ්ඩත්වය භාරගන්නා වෘත්තීය පුහුණු විද්‍යාලවලට විකල්ප වශයෙන් අහිංසාවාදී පුහුණු ආයතන අවශ්‍ය වේ.

**නිර්ඝාත සිවිල් සමාජ ආයතන**

නිර්ඝාත සමාජවල ප්‍රභවය, පැවැත්ම හා නිර්මාණශීලීත්වයට උදව් කරන්නා වූ සිවිල් සමාජ ඉඩ ප්‍රස්ථාවන් ශක්‍යතා වශයෙන්

අසීමිත වේ. නිර්සාත නැඹුරුවක් ඇති ආයතන දැනටමත් බිහි වී ඇති අතර විශේෂ වැදගත්කමක් සහිත සෙසු ආයතන අනාගතයෙහි බිහි වෙන බව බලාපොරොත්තු විය හැකිය.

**නිර්සාත අධ්‍යාත්මික මණ්ඩල**

සමාජයේ එක් එක් මට්ටමේ දී හෝ සමාජයේ එක් එක් සම කේන්ද්‍රීය චක්‍රය සඳහා, උපතේ සිට මරණය දක්වා, සෑම කරුණක් සම්බන්ධයෙන්ම, ජීවිතයට පැහැදිලි ගෞරවයක් ඇති කිරීම සඳහා නිර්සාත අධ්‍යාත්මික මණ්ඩල අවශ්‍යය. එවැනි අන්තර්-ආගමික මණ්ඩල සමන්විත වන්නේ තම සම්ප්‍රදායන්ට අයත් නිර්සාත සත්‍යයන් ප්‍රකාශ කිරීමටත් සංකලනය කිරීමටත් නිර්භීත වන අදාළ සෑම ආගමකම නායකයින් හා මානවවාදීන් විග්‍රහකරුවන්ගෙනි.

ප්‍රචණ්ඩත්වයේ සාම්ප්‍රදායික ආගමික හා නිර්-සාමයික ක්ෂමාලාපකයින්ට විකල්පයක් වන එබඳු මණ්ඩල, මනුෂ්‍ය ස්වභාවයෙන් ප්‍රචණ්ඩත්වය ඉවත් කිරීමේ සියලුම ප්‍රසිද්ධ සහ පුද්ගලික ප්‍රාදේශීය, ජාතික හා ගෝලීය උත්සාහයන්ට ආවේශාත්මකව ආධාරය සම්පාදනය කරති. ආවේශයේ සෑම මූලාශ්‍රයකම ආධාර උකහා ගනිමින්, සෑම පුද්ගලයෙක්ම සහ සමාජ සංස්ථාවක් තුළම ආවේණිකව පවතින ශක්‍යතාවන් උද්දීපනය කිරීම මගින් මානව වර්ගයාගේ නිර්සාත හෘද සාක්ෂිය ශක්තිමත් කරන්නා වූ වැදගත් දායකත්වයක් නිර්සාත අධ්‍යාත්මික මණ්ඩලවලට ප්‍රදානය කළ හැකිය.

**නිර්සාත උපදේශක කණ්ඩායම්**

සමාජයන් තුළ හා අන්තර් සාමාජයව ගැටළු නිරාකරණය කරන්නා වූ විකල්ප හඳුනා ගැනීමට උදව් කිරීම සඳහා අවශ්‍යවන්නා වූ නිර්සාත උපදේශක කණ්ඩායම් ගෝලීය සම්පත් තුළින් සපයා ගැනීම අවශ්‍ය වෙයි. එබඳු කණ්ඩායම් කාර්ය-සුවිශේෂ අධ්‍යාත්මික, විද්‍යාත්මක, නිපුණත්ව, සංවිධානාත්මක සහ සෙසු සම්පත් ඒකාබද්ධ කරමින් ලේ හැලීම වලකා ලීමට, සිදුවෙමින් පවතින ඝාතන නතර කිරීමට සහ ස්ථාවර සාමයේ සහ ප්‍රතිනිර්මාණයේ කොන්දේසි නිර්මාණය කිරීමට උත්සාහ කරන සියලු දෙනාටම සෘජුව හෝ වක්‍රව උපකාර කිරීමට ඉදිරිපත් වෙති. එවැනි නිර්සාත උපදේශක

කණ්ඩායම්වල වැඩ කටයුතු, මාරක බලය යෙදවීමේ හෝ ආර්ථික සම්බාධක පැනවීමේ තර්ජනයේ ආධාරය ලබා ගත්, නැතහොත් සදාචාරාත්මක පදනමක් මත තනිව හඬ නගන අයගේ සම්ප්‍රදායික සාකච්ඡාකරුවන්ගේ වැඩ කටයුතුවලින් වෙනස් වෙයි. එසේ වෙනස් වන්නේ එම උපදේශක කණ්ඩායම් නිර්සාතයට ඉතා පැහැදිලි කැපවීම, බහුවිධ නිපුණතාවයන් හා ප්‍රචණ්ඩ රාජ්‍යයන් ද ඔවුන්ගේ මාරක විරුද්ධවාදීන්ගේ ද පාලනයෙන් ස්වාධීන වීම මගිනි. එබඳු උපදේශක සේවාවන් සම්පාදනය කිරීමේ හැකියාව ඇති වූ ද ඔවුන්ගේ අත්දැකීම් ඒකාබද්ධ කරන්නා වූද, ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කර ගන්නා වූ ද, පුද්ගලික මුදල් යොදවා ගොඩ නැගූ ආයතන අවශ්‍ය කෙරේ. ක්‍රිස්තියානි ක්වේකර් නිකාය මගින් පිහිටුවා ඇති ගැටුම් නිරාකරණය කිරීමේ සහ මානවවාදී සේවාවන් මෙන්ම සෙසු ආගමික සහ මානව හිතවාදී සහන ආයතන මගින් ඉටු කෙරෙන සේවාවන් අවශ්‍ය වී ඇති පුරෝගාමී පාර්ශවීය මූලාශ්‍රයන් පිළිබඳ උදහරණ සපයති.

## අන්තර් ජාතික ගැටළු-විසඳීමේ ඒකාබද්ධ සංවිධාන

'උඩ සිට පහළට ගොඩ නැගී ඇති' ලෙස නම් කළ හැකි නිර්සාත දේශපාලන ආයතන (උදහරණ වශයෙන් පක්ෂ, රාජ්‍ය සේවා දෙපාර්තමේන්තු සහ පොදු ආරක්ෂක ආයතනවලට) ඌණ පූරණයක් ලෙස, 'පහළ සිට උඩට ගොඩ නැගී ඇති' බලගතු නිර්සාත පරිවර්තනීය ආයතනවල ඒකාබද්ධ සංගම් අවශ්‍ය කරනු ලබයි. උදහරණයක් නම් නියෝජනය ලැබී නැති ජනතාවන්ගේ සංවිධානය (UNPO) ය. එය තම සාමූහික මානව අයිතීන් පිළිගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට, ආණ්ඩුවලට හා වෙනත් ආයතනවලට බලපෑම් කිරීමේ අහිංසාවාදී ක්‍රියාවන්හි යෙදීමට පැහැදිලිව කැපවීම පිළිබඳ විශේෂිත අනන්‍යතාවයන් ගෙන් සමන්විත වූ ජනතාවන්ගේ සන්ධානයකි. අන්තර් ජාතික මානව හිමිකම් සංවිධානය, හරිතසාම සංවිධානය සහ සාමය පිළිබඳ අන්තර්ජාතික මිත්‍රත්වය සෙසු උදහරන සම්පාදනය කරනු ලබයි. මිහිතලයෙන් ඝාතන ඉවත් කිරීමට පක්ෂවීම හැරුණු කොට සාමාජිකයන් ඉදිරිපත් කරන සියලුම ආස්ථානයන්ට එකඟවීම නිර්සාතන සංවිධානයන්ට සම්බන්ධ වන්නන්ගෙන් බලාපොරොත්තු නොවේ. මෙවැනි හවුල් සංවිධාන, ඝාතන සිදුවන සමාජ පරාසයන් තුළ හා ඒවා අතර ද

ප්‍රචණ්ඩත්වය, ආර්ථිකය, මානව හිමිකම්, පරිසරය හා සහයෝගිතාවය පිළිබඳ ප්‍රධාන ගැටළු-විසඳීමේ හැකීන් තුළින් වර්ධනය කිරීම අවශ්‍යය. ක්‍රමයෙන් තිර්සාර ලෝකයක් සඳහා ගෝලීය පුරවැසියන්ගේ බලගතු සංවිධානයත්, කාන්තාවන්ගේ සහ පුරුෂයන්ගේ සහයෝගීත්වය සහිත විශ්වීය යහපත සඳහා වූ බලවේගයක් පැන නැගිය යුතුය.

**තිර්සාර පුහුණු ආයතන**

ප්‍රචණ්ඩත්වය ව්‍යාප්ත වීමේ තර්ජන ගැන දැනුවත්කම සහ අහිංසාවාදී නිර්මාණාත්මක විකල්පයන් සම්බන්ධ උවමනාව තීව්‍රවත්ම ගැටුම් නිරාකරණය සහ අහිංසාවාදී නායකත්වය සම්බන්ධ නිපුණතා පුහුණුව සහ අහිංසාවාදී සමාජ පරිවර්තනයන් සඳහා ඉල්ලීම් වැඩි වෙමින් තිබේ. කිංගියානු, ගාන්ධියානු, බෞද්ධ-ක්‍රිස්තියානි, මෙන්ම තිර්සාමයික අහිංසාවාදී සම්ප්‍රදායන්ගෙන් නිපුණ පුහුණුකරුවන් සඳහා විශාල ඉල්ලුමක් තිබේ. සමාජ සාධාරණත්වය පිළිබඳ පුරවැසි ව්‍යාපාරයන්ගේ අවශ්‍යතාවයන්ගේ සිට පාසල් වැඩපළවල්, පොලිස් සහ බන්ධනාගාර වැනි ආයතනවල අවශ්‍යතාවයන් දක්වා අවශ්‍යතා පැතිර පවතී. අනෙකුත් කවරාකාරයේ නිපුණතාවයන් සම්බන්ධයෙන් මෙන්ම ප්‍රචණ්ඩත්වයෙන් තොර පුරවැසි පුහුණුව සම්පාදනය කිරීමට සහ වෘත්තීය පුහුණුකරුවන් පුහුණු කිරීමට සහ සහතික කිරීමට සිවිල් සමාජ ආයතනයන් අවශ්‍ය කරනු ලබයි.

**තිර්සාර නායකත්ව අධ්‍යාපනය සහ පුනර්ජීවන මධ්‍යස්ථාන**

පුනර්ජීවනය, සිතා බැලීම, ලිවීම හා අත් දැකීම් හුවමාරු කර ගැනීම සඳහා එක්තරා විවේක කාලයක් ලබා දෙන ආයතන ප්‍රචණ්ඩත්වය පිටු දකින සංවිධාන සහ ව්‍යාපාරවල නායකයින් සඳහා අවශ්‍යය. අහිංසාවාදී සමාජ පරිවර්තනයක් ඇති කිරීම සඳහා ජීවිත හානි සිදුවීමේ තර්ජනය නොතකා ආයාසකර කැපවීම්වල යෙදී සිටින්නා වූ නායකයින්ට ලබාගත හැකි එකම නිවාඩුව වන්නේ සිරගත වීම හෝ රෝහල්ගත වීමය.

මෙහිදී ස්වේච්ඡාමය තිර්සාර ක්‍රියාකාරී තුල්‍යතාවන් අවශ්‍ය කරනු ලබයි. නායකයන්ට වද හිංසා පමුණුවා ඇති අවස්ථාවල දී වද

හිංසාවලට ගොදුරු වූවත් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන සමග සහයෝගය දැක්වීම අත්‍යාවශ්‍යය. ලෝකය පුරා විසිරී ඇති අහිංසාවාදී නායකයත්ව මධ්‍යස්ථානවලට පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඉඩ ප්‍රස්ථා සැපයිය හැකිය. අධ්‍යාත්මික හා කායික ප්‍රතිජීවමයවීම, ස්වයං-චරිතාපදානයමය ආවර්ජනය හා චරිතාපදානමය අධ්‍යයනය, නිර්ඝාත මූල ධර්මවලට තමා මෙන්ම කැප වූ විවිධ රටවල අත්දැකීම් සහිත නායකයන් සමග සංවාද, ඊළඟ ඉදිරි පියවර සම්බන්ධව දූරදර්ශීව ආවර්ජනය කිරීම සඳහා අවස්ථාවන් සම්පාදනය කිරීම; මෙම මධ්‍යස්ථාන පුද්ගලික පරිත්‍යාගයෙන් පිහිටුවනු ලැබූ හෝ ස්වාධීන ආයතන හෝ විය හැකිය. නැතහොත් නිර්ඝාත සමාජ පරිවර්තනයකට කැප වූ සත්කාරක ආයතන විසින් නඩත්තු කරනු ලබන ඒවා විය හැකිය.

## නිර්ඝාත කලා නිර්මාණශීලීත්වය සඳහා මධ්‍යස්ථාන

කලාව තුළත් නොයෙකුත් කලාවන් අතරත් නිර්ඝාත නිර්මාණශීලීත්වය උනන්දු කිරීමේ ආයතන අවශ්‍ය වේ. ස්විස් ජාතික ලේඛක රොමේන් රෝලන්ඩ් ටෝල්ස්ටෝයිගෙන් මෙසේ උපුටා දක්වයි. 'කලාව ප්‍රචණ්ඩත්වය යටපත් කළ යුතු අතර එසේ කිරීමේ හැකියාව ඇත්තේ කලාවට පමණී.' (Rolland 1911: 203) ෂෙලිගේ කාව්‍ය නිර්මාණ තුළ නිර්-ප්‍රචණ්ඩත්වය පිළිබඳ අධ්‍යයනයක දී ආර්ට් යං (Art Young) මෙසේ නිරීක්ෂණය කරයි. "අහිංසාවාදය දේශපාලන චින්තන පද්ධතියකට වඩා වැඩි දෙයකි. ජීවිතයේ සහ කාව්‍යයේ අඩු වැඩිය එයයි." මිලිටරි චිත්ත ධෛර්යය සම්බන්ධයෙන් (1975: 165) මිලිටරි සංගීතයේ වැදගත්කම මතකයට නංවන ආප්තෝපදේශයක් කිංගියානු සම්ප්‍රදයෙහි තිබේ. "ඔබට ගීතයක් නැත්නම් ඔබට ව්‍යාපාරයක් ද නැත." (Young 1996: 161-184)

කලා ක්ෂේත්‍ර තුළ හෝ චිත්‍ර ශිල්පීන්, කවීන් හා ලේඛකයින් අතර නිර්මාණාත්මක සමාජ බිහි කිරීමට අනුග්‍රහය දක්වන පුද්ගලික මධ්‍යස්ථාන අනුව සකස් කරන ලද එක් ආයතනික මොඩලයක් පවතී. ඒවායේ අරමුණ වන්නේ මානව මාරකත්වයට ප්‍රතිවිරුද්ධ ලෙස පරිවර්තනකාරී නිර්ඝාත නිර්මාණාත්මක භාවය ඉස්මතු කර පෙන්වීමයි. නිර්ඝාත නිර්මාණභාවයේ අභියෝගය කලාවන් ඉදිරියට මුණ ගැස්විය හැකිය. එය පිළිගැනීමට හැකි කලාවන් නම් සාහිත්‍යය,

කාව්‍යය, චිත්‍ර ශිල්පය, මූර්ති ශිල්පය, සංගීතය, නර්තනය, නාට්‍යය, චිත්‍රපටිය, රූපවාහිනිය, ඡායාරූප ශිල්පය, ගෘහ නිර්මාණ ශිල්පය, ඇඳුම් නිර්මාණය සහ ජන මාධ්‍ය සමග සම්බන්ධ වූ වාණිජ කලාවෝය. ප්‍රචණ්ඩත්වයෙන් ගැලවීමේ මාවතක් සොයා ගැනීම සියළුම කලාවන් ඉදිරියේ පවතින අභියෝගයකි. උදහරණයක් වශයෙන් සම්ප්‍රදායික ඝාතන අභිරහස්වලට විකල්පයක් ලෙස මිනීමැරුම් සහ සියදිවි නසා ගැනීම් සිදුවීමට පෙර සූක්ෂම ලෙස ඒවා වලක්වන අහිංසාවාදී රහස් පරීක්ෂකයන් නිර්මාණය කළ හැකිය. කලාවන් අතර නිර්ඝාත නිර්මාණශීලීත්වය මගින් ඉදිරියෙහි පවතින තීරණාත්මක පරිවර්තනයන් සඳහා මානව අධ්‍යාත්මය සහ පරිකල්පනය ඉහළ නැංවිය හැකි ය.

ගෝලීය පිළිගැනීමක් සඳහා පරිත්‍යාගශීලීන් කලාවන් සඳහා කරන්නාවූ නිර්ඝාත දයකත්වය වෙනුවෙන්, නොබෙල් ත්‍යාග මගින් කරනු ලබන දිරිමත් කිරීමට වඩා වැදගත් තෑගි ක්‍රම ඇති කළ යුතුය.

**නිර්ඝාත පර්යේෂණ සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ ආයතන**

ජාත්‍යන්තර ආරක්ෂක පිළිවෙත්වල සිට දේශපාලන, ආර්ථික සමාජයීය සහ සංස්කෘතික ජීවිතයේ සෑම අංශයක්ම අලලා යන කරුණු සම්බන්ධයෙන් ආණ්ඩුවලට සහ පොදු මහජනයාට උපදෙස් දීමට පුද්ගලික ආයතනයන් ස්ථාපිත කෙරෙන්නාක් මෙන්ම සමාජමය තීන්දු ගැනීමට උපකාර කරන තොරතුරු ලබා දීමට සහ විශ්ලේෂණ සම්පාදනය කිරීමට නිර්ඝාත ප්‍රතිපත්ති ආයතන අවශ්‍ය වේ. ප්‍රචණ්ඩත්වය, ආර්ථිකය, මානව අයිතීන්, පරිසරය සහ සහයෝගය පිළිබඳ සෑම ක්ෂේත්‍රයකදීම, නිර්ඝාත දේශපාලන විද්‍යාව සම්බන්ධ ගැටළු-විසඳීමේ කැපවීම් ඔවුන්ට වඩාත් ශක්තිමත් කළ හැකිය. නිර්ඝාත අධ්‍යාත්මික මණ්ඩල, දේශපාලන පක්ෂ, පොදු ආරක්ෂක ආයතන උපදේශක කණ්ඩායම්, සෙසු සිවිල් සමාජ ආයතන, සම්බන්ධ ව්‍යවහාරික උත්සාහයන් සඳහා ඔවුන්ට උපකාර කළ හැකිය. එමෙන්ම පුරවැසියන් ඉල්ලා සිටින තොරතුරු ඔවුන්ට සම්පාදනය කළ හැකිය.

## සන්නිවේදනයේ යෙදෙන නිර්ඝාත ජන මාධ්‍ය

පුද්ගලික සහ රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමට සහාය දීම සඳහා තොරතුරු, ප්‍රවෘත්ති සහ විස්තර සම්පාදනය කිරීම සඳහා සන්නිවේදනයේ යෙදෙන නිර්ඝාත ජනමාධ්‍යයන් අවශ්‍ය කෙරේ. මින් අදහස් වන්නේ ඝාතනය කෙරෙහි පවතින මානව ධාරිතාවන් මේකී ජනමාධ්‍ය විසින් නොතකා සිටින බව නොව ඒවා ඝාතනය අනිවාර්ය, බොහෝවිට ප්‍රශංසනීය සහ විනෝදජනක බව කියැවෙන සම්ප්‍රදායික ජනමාධ්‍ය සංදේශනය ඉක්මවා යන බවයි. පරිවර්තනීය යුගයේදී කෙරෙන නිර්ඝාත ජන මාධ්‍ය කර්තෘ මණ්ඩලවලට නිර්ඝාත දේශපාලන විශ්ලේෂණ යේ තර්කනය පිළිබිඹු කළ හැකිය. එනම් ඉදිරිපත් කෙරෙන පණිවුඩ ප්‍රචණ්ඩත්වයේ යතාර්ථයන් ගැඹුරින් පරීක්ෂා කර බලයි. ඊට ප්‍රතිවිරුද්ධව නිර්-ප්‍රචණ්ඩ යතාර්ථයන් පිළිබඳ අවබෝධය ගෙන එයි. පරිවර්තනීය සන්තතිය, ජයග්‍රහණ සහ පරාජයන් සම්බන්ධව වාර්තා කරයි. සකල විධ කලා, විද්‍යා, වෘත්තික සහ දෛනික ජීවිතයේ කටයුතුවල දී නිර්මාණාත්මක නිර්ඝාතක අභිලාෂයන්ට හඬක් ලබා දෙයි. නිරන්තර මාරකත්වය පිළිගැනීමට සහ ප්‍රචණ්ඩ අසාර දර්ශනයෙහිලා ප්‍රකටව හෝ අප්‍රකටව නිරන්තරව දායක වන ජනමාධ්‍යයන්ට වඩා මෙම ප්‍රවිශ්ටය හරයයන් ගෙන් පිරී නොපවතින්නේ නොවේ. ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා, ගුවන් විදුලිය සහ රූපවාහිනිය, චිත්‍රපට සහ පරිගණකගත ගෝලීය තොරතුරු ජාලයන් තුළ මාධ්‍ය විකල්පයන් අවශ්‍ය කරනු ලබයි. නිර්ඝාත දේශපාලන විද්‍යාඥයන්ට විස්තර සහ විශ්ලේෂණ සම්බන්ධ එක් මූලාශ්‍රයක් මෙයින් ඉදිරිපත් විය හැකිය.

## නිර්ඝාත ස්මාරක

මානව ශිෂ්ඨාචාරයේ නිර්ඝාත උරුමය යළි පණ ගැන්වීමට සහ අනුස්මරණය කිරීමට පුද්ගලයන්, කණ්ඩායම්, සංවිධාන, අප්‍රසිද්ධ වීරයන් සහ වීරවරියන් සම්බන්ධ ස්මාරක සහ උත්සව යෑම සමාජයන් තුළ ගෞරවාන්විතව ගොඩ නැගිය යුතුය. ඝාතනය ප්‍රතික්ෂේප කර තිබෙන සහ නිර්ඝාත ගෝලීය ශිෂ්ටාචාරයක් සඳහා වූ දිගු ගමනට දායක වී තිබෙන හැම කෙනෙක්ම අනුස්මරණය කළ යුතු අය වෙති. ඓතිහාසික මාරකත්වයේ යථාර්ථයන් යළි මතකයට

නංවන නිසා මිහිතලය මත පැල්ලම් තැබූ ඉතිහාසයෙහි ජයග්‍රාහී සහ පරාජිත ඝාතකයන්ගේ ප්‍රතිමා සහ ස්මාරක මේ නිසා ඉවත් නොකෙරෙයි. නමුත් මානව පැවැත්ම රැක ගැනීම සඳහා වඩ වඩා අවශ්‍ය කෙරෙන නිර්-ප්‍රචණ්ඩ විකල්පයන්ට පක්ෂවූවන් නිතර සිටි බව අපට යළි මතක් කිරීමට නිර්ඝාත ස්මාරක අවශ්‍ය කරවනු ලබයි. මෙසේ අනුස්මරණ කළ යුත්තන් අතර ආගමික පුද්ගලයෝ, ප්‍රචණ්ඩ බලය ඉදිරියෙහි සත්‍ය කතා කළ යුද විරෝධීහු, හෘද සාක්ෂියට එකඟව යුද්ධයට විරුද්ධ වූවෝ, මරණ දඬුවමට විරුද්ධ වූවෝ, සාමයේ කවියෝ සහ සිරගත කිරීම්, වධ දීම්, සහ මරණයේ අනතුර ඉදිරියේ ප්‍රචණ්ඩත්වයෙන් තොරව අසාධාරණයට විරුද්ධ ව නැගී සිටි ප්‍රශංසා නොලද ස්ත්‍රීහු සහ පුරුෂයෝ සිටිති.

**නිර්ඝාත සාම කලාප**

මෙයින් අදහස් කෙරෙන සිවිල් ආයතනයන් වන්නේ, ග්‍රාමීය සහ නාගරික ජන සමාජවල සිට ජාතික සහ ජාත්‍යන්තර ගිවිසුම් දක්වා විහිදෙන නිර්ඝාත සාම කලාපයෝය. ආගමික අභය භූමි, සන්නද්ධ විප්ලවවාදී සහ ප්‍රති විප්ලවවාදී බලකායන්ට අතර මැදි වූ ගම් විසින් ප්‍රකාශිත සාම කලාප පුළුල් කළ හැකිය. වෙඩි තහනම් කිරීමේ ප්‍රදේශ, ආයුධවලින් තොර සමාජයන් සඳහා වූ ව්‍යාපාර, සාපරාධී සහ සමූහ ප්‍රචණ්ඩත්වය නිසා නිවාස අහිමිව යළි නිවාස ලබා ගැනීමට උත්සාහ කරන පුරවැසියෝ සහ න්‍යෂ්ටික අවිවලින් තොර කලාප තහවුරු කිරීමේ ජාත්‍යන්තර ගිවිසුම් මෙහි පෙර ගමන් කරුවෝ වෙති. එකිනෙකා අතර අන්තර්-සම්බන්ධය සහ අන්‍යොන්‍ය සහයෝගය සහ ව්‍යාප්ත කිරීම සඳහා එබඳු විවිධ සාම කලාප තුළට ආධාරක ඝාතන විරෝධී ආයතනයන් හඳුනා ගැනීම, ඒවා අතර ජාලකරණය හා ඒවා හඳුන්වා දීම නිර්ඝාත සංවිධානාත්මක සංවර්ධනයේ ප්‍රධාන අභියෝගයකි.

**නිර්ඝාත ආර්ථික ව්‍යවසාය**

බොහෝ දෙනෙකුට කිව නොහැකි තරම් මිල අධිකව තිබිය දී පවා යුද්ධයට සම්බන්ධ ව්‍යාපාර සහ ප්‍රචණ්ඩ සංස්කෘතීන් ලාභ දායක යැයි කියනු ලබන්නේ නම්, නිර්ඝාත යහපත සඳහා වන ව්‍යාපාර සියල්ලටම වැඩියෙන් ලාභදායක විය යුතුය. නිර්ඝාත ඉදිරි දර්ශනයකින් සහ නිර්-ප්‍රචණ්ඩ ද්‍රව්‍ය, භාණ්ඩ, සේවාවන් විනෝද

උත්සව සහ විනෝදාත්මක විකල්ප සඳහා වැඩෙන ඉල්ලීම අපේක්ෂා කරනු ලබන ඉදිරි දර්ශනයකින් බැලීමේ දී නිර්ඝාත ව්‍යවසායකත්වය සඳහා අවස්ථාවන් අසීමිතය. විකල්පයන් සඳහා පියවර තැබීම ආරම්භ කිරීමේ එක් ක්‍රමයක් වන්නේ ප්‍රචණ්ඩත්වයට සේවය කරන ව්‍යාපාර ලැයිස්තු ගත කිරීම සහ ඒවායේ ප්‍රතිවිරුද්ධයන් උපකල්පනය කිරීමය. යුද්ධ සෙල්ලම් බඩු වෙනුවට සාම සෙල්ලම් බඩු ආදේශ කරන්න. මාරක වීඩියෝ ක්‍රීඩා වෙනුවට කුතුහලය දනවන අහිංසාවාදී කෞශල්‍යය ආදේශ කරන්න. ආයුධ කර්මාන්ත වෙනුවට නිරායුධ කර්මාන්ත ආදේශ කරන්න. ප්‍රචණ්ඩ මාධ්‍ය විනෝදාත්මක වැඩ සටහන් වෙනුවට නිර්ඝාතක කලාව පිළිබඳ නාටකාකාර නිර්මිත ආදේශ කරන්න සහ විනාශ කිරීමේ ක්‍රමය වෙනුවට ජීවිතය රැකගැනීමේ ඥානය වැඩි දියුණු කරන වැඩ ආදේශ කරන්න. නිර් හමුදකරණ කාල පරිච්ඡේදයක් හා කැටුව එන අහිංසාවාදී ආර්ථික පරිවර්තන පිළිබඳ උදහරණ මගින් අත්දැකීම් ලබා දෙයි. නමුත් සරල ආර්ථික පසු බැසීමෙන් එහා ගෝලීය සන්දර්භයක් තුළ නිර්ඝාත සමාජවලට සංක්‍රමණය වන්නාවූ මහජනයාගේ සැබෑ අවශ්‍යතාවයන් හඳුනා ගැනීමට සහ ඔවුන්ට අනුකූලතාවය දැක්විය හැකි සේවාවන් නිර්මාණය කිරීමට උත්සාහ කළ යුතුය.

**ගෝලීය අහිංසා මධ්‍යස්ථාන**

නිර්ඝාත ලෝකයක් පිළිබඳ දර්ශනය මුළුමනින්ම පූර්ණවාදී ඉදිරි දැක්මක් හරහා සංක්‍රමණය වීමට පහසුකම් සැපයිය හැකි ආයතන ගම්‍ය කරයි. එබඳු ආයතන ගෝලීය අධ්‍යාත්මික සහ සංස්කෘතික සම්ප්‍රදායන්හි පවතින පොදු ලක්ෂණ තුල දැඩිව මුල් බැස ගත යුතු අතර මාරකත්ව සහ එහි විපාකවලින් විමුක්ත වීමේ අහිංසාවාදී මාවත් දැක ගැනීමට මානව වර්ගයාට උපකාර කිරීමට හැකි ගෝලීය විද්‍යාත්මක නිපුණතා, කලාත්මක සහ ආයතනික සම්පත් නිර්මාණාත්මකව බිහි කිරීමේ සාධක බවට පත් වීමට හැකි විය යුතුය. සමකාලීන පරිගණක භාෂාවෙන් පවසතොත් එබඳු මධ්‍යස්ථාන ආණ්ඩුවේ සහ සිවිල් සමාජ ආයතනවල "දෘඪාංග" සේවාවන් හරහා මානුෂික උවමනාවන්ට සේවය කළ හැකි අහිංසාවාදී "මෘදුකාංග" නිර්මාණය කෙරෙන සාධක විය යුතුය. ඵලදායක වීම සඳහා එකී මධ්‍යස්ථාන ප්‍රචණ්ඩත්වය ඉල්ලා සිටින ආණ්ඩුවලින්

සහ නිශේධනාත්මක පුද්ගලික උවමනාවන්වල පාලනයෙන් උපරිම වශයෙන් ස්වාධීන විය යුතුය. ඒව දූරදර්ශී පරිත්‍යාගශීලීන් වැඩි වශයෙන් දායක වීම සහ සෙසු මාධ්‍යයන්ගෙන් සමන් විය යුතුය. ඒවා අනාගත අපේක්ෂාවන් සහිත පරිත්‍යාගශීලී දයකයින් පළල් වශයෙන් බඳවා ගැනීම් සහ වෙනත් මාර්ගවලින් අවශ්‍ය තරම් ලෙස සම්පත් ලාභී ඒවා විය යුතුය.

පහත සඳහන් ක්ෂේත්‍ර තුළ අති මහත් මානවශීලීත්වය ගවේෂණය කිරීම සහ අනාවරණය කිරීම ගෝලීය අහිංසා මධ්‍යස්ථානයක් එහි කර්තව්‍යය කර ගනියි; අධ්‍යාත්මික සහ දර්ශනික සම්ප්‍රදයන් තුළ අහිංසාව, ජීව ස්නායු විද්‍යාව සහ ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රී–පුරුෂ සමාජභාවය සහ අහිංසාව, ආර්ථික විද්‍යාව සහ අහිංසාව, සන්නිවේදනය සහ අහිංසාව, විද්‍යාව, තාක්ෂණය සහ අහිංසාව සහ පරිසරය, වෘත්තීන් සහ අහිංසාව, අධ්‍යාපනය සහ අහිංසාව, කලාවේ අහිංසාවාදය ක්‍රීඩා සහ අහිංසාව. එමෙන්ම නිර්ඝාත පරිවර්තනයේ දී මිලිටරියේ සහ පොලීසියේ කාර්යභාරය, අහිංසාවාදී නායකත්වය සහ නිර්ඝාත මානව අනාගතය ඊට අදල ය.

ප්‍රධාන සන්දර්භාත්මක සහ ඓතිහාසික කර්තව්‍යයක් වන්නේ දේශීයව මධ්‍යගත වූ විමසීමක් මත පදනම් වූ සෑම රටකම සහ කලාපයකම අහිංසාවාදී, ගෝලීය සංස්කෘතික සම්පත් ලැයිස්තු ගත කිරීමය. නිර්ඝාත ඓතිහාසික සම්ප්‍රදායයන්, වර්තමාන ප්‍රකාශනයන් සහ අනාගත වර්ධනයන් ගැන විමසා බැලීමක් එමගින් ඉල්ලා සිටියි. ගෝලීය පරිමාවක ඒකාබද්ධ කෙරුණු එවන් ගවේෂණයන් අනාගත අභිවෘද්ධිය මැන බැලිය හැකි නිර්ඝාත මානව ශක්‍යතාවන් පිළිබඳව මනුෂ්‍ය වර්ගයාට අපගේ ප්‍රථම පෘථුල අවබෝධය සම්පාදනය කරනු ඇත.

ඝාතන, ඝාතන තර්ජන සහ අදළ හානි කර තත්ත්වයන් පිළිබඳ තත්කාලීනව ක්‍රියාත්මක වන යතාර්ථයන් මානව වර්ගයා ඉදිරියේ දක්වා සිටිමින් ඒවාට හරස්ව යන නිර්ඝාත පරිවර්තනීය සම්පත් විචිත්‍රාකාරයෙන් ප්‍රතිවිරුද්ධව පිහිටු වන්නා වූ ගෝලීය තත්ත්ව ඒකක ගෝලීය නිර්ඝාත ඒකක ඇති කළ යුතුය.

මෙම මධ්‍යස්ථාන මාරකත්වයේ අභියෝගයන්ට නිරන්තරයෙන් මුහුණ දෙයි. ඒවාට ඥාණයේ නිර්මාණාත්මක වර්ධනයන් මත පදනම් වෙමින් අධ්‍යාත්මික, විද්‍යාත්මක, නිපුණතා, කලාත්මක සහ ආයතනික සම්පත්වල සංකලනයන් යෝජනා කිරීමට හැකිය. එම සංකලනයන්ගේ එල්ලය වන්නේ පරිවර්තනීය රාජ්‍ය ප්‍රතිපත්තීන්ට, පර්යේෂකයින්ට අධ්‍යාපනයට සහ මානව වර්ගයාගේ දිවි පැවැත්ම ආරක්ෂා කර ගැනීම සහ සුභ සිද්ධිය අපේක්ෂා කරන සෑම දෙනෙකුම විසින්ම කරන පුහුණුවට උදව් කිරීමයි.

**අවශ්‍ය කරනු ලබන නිර්සාත ආයතන**

නිර්සාත සමාජයන් සාක්ෂාත් කිරීමේ කාර්යභාරයට කැප වූ දේශපාලන විද්‍යාවක් තමන්ගෙන්ම පටන්ගෙන සුදුසු ආයතන හරහා ක්‍රියාව සඳහා අධ්‍යාපනය ලබා දීම සහ නව ක්‍රම හඳුන්වා දීම කරනු ඇත. ජීවිතයට ගරු කරන අධ්‍යාත්මික තහවුරුවීම සඳහා ආයතනයන් අවශ්‍ය කරනු ලබයි. එසේ අවශ්‍ය වන්නේ ගවේෂණය ඒකාබද්ධ කිරීම, දැනුම බෙදා ගැනීම සඳහාය. රාජ්‍ය ප්‍රතිපත්ති තීන්දු කිරීම සඳහාය. නිර්සාතක පොදු ආරක්ෂාව සඳහාය. ආර්ථික සුභ සිද්ධිය සඳහාය. සියලු කලාවන් සහ වෘත්තීන්හිදී ජීවිතය සැමරීම සඳහාය.

පරිවර්තනය අත් කර ගැනීමේ කර්තව්‍යයන් විසින් ගෝලීය වශයෙන් විද්‍යාමාන වන අහිංසාව, නිර්මාණාත්මකව ඒකාබද්ධ කිරීමේ මධ්‍යස්ථාන අවශ්‍ය කෙරේ. ඒවා අවබෝධය ඇති කර ගැනීම ද සෑම දෙනාගේම නිර්සාත අවශ්‍යතා සඳහා ද කැප වී සිටියි. නිර්සාත ආයතනවල ශක්තිය පැන නගින්නේ අන්‍යොන්‍ය වශයෙන් ආධාරකාරී පුද්ගලයන්ගෙනි. සෑම දේශපාලන විද්‍යාඥයකුම, සෑම පුද්ගලයෙකුම නිර්සාත අහිංසාවාදී ලෝකයක් සඳහා සංක්‍රමණය වීමට පහසුකම් සපයන අහිංසාවාදී කේන්ද්‍ර ලෙස එවිට හඳුනා ගත හැකිය.

## 6 පරිච්ඡේදය

# ගෝලීය නිර්ඝාත දේශපාලනය

*අප අද ජීවත්වන්නේ නව වකවානුවකය. පැරණි විසඳුම් සහ විධික්‍රම තවදුරටත් ගැලපෙන්නේ නැත. අපට අලුත් සිතුවිලි, අදහස්, සංකල්ප අවශ්‍යය.... අප අතීතයේ විය ගසින් මිදිය යුතුය.*

*– සෙන්පති ඩග්ලස් මැක් ආතර්*

*ඉතිහාසයෙන් අපට උරුම වී ඇති ප්‍රචණ්ඩත්වයේ සහ විනාශයේ යදම් කඩා බිඳ දැමීම සඳහා ප්‍රමාණවත් දැනුවත් භාවයකුත්, ඒ සඳහා උපාය මාර්ගයකුත් කා ළඟ හෝ තිබිය යුතුය.*

*– මාටින් ලූතර් කිං, කනිෂ්ඨ*

*සත්තකින්ම සියළු ඓතිහාසික අත්දැකීම්වලින් තහවුරු වන්නා වූ සත්‍යය නම්, මිනිසා වරින් වර අභව්‍ය දේවල් කරන්නට මහන්සි නොගත්තා නම්, භව්‍ය දේවල් ඔහු කිසි දකත් අත්පත් නොකරගන්නා බවයි.*

*– මැක්ස් වේබර්*

*ඊයේ කරන්නට බැරි වූ දේ අද කිරීමට පුළුවනි, යන සංසිද්ධිය අපි දිනපතා අත්දකිමින් සිටින්නෙමු.*

*– මොහන්දාස් කේ. ගාන්ධි*

### මාරකත්වයේ සිට විමුක්තිය කරා

මනුෂ්‍ය ඝාතනය හැමදමත් ඉවසා දරාගත යුතු වහල් කොන්දේසියක් හැටියට පිළිගන්නවාට වඩා, විසඳගත යුතු ගැටලුවක් වශයෙන් පිළිගත යුතු කාලය දැන් එළැඹ තිබේ. හිතාමතාම එකා බැගින්, සමූහය බැගින්, නොගිණිය හැකි ප්‍රමාණයන් බැගින්, යන්ත්‍ර මගින් ඝාතනය කිරීමේ ක්‍රියාව මේ වනවිට ස්වයං–විනාශකාරී

රෝගයක තත්වයට පත් වී තිබේ. විමුක්තිය, ආරක්ෂාව සහ සමෘද්ධිය අත්පත් කර ගැනීමේ අටියෙන් සිදු කරන්නා වූ ඝාතන, අනාරක්ෂාවේ සහ දරිද්‍රතාවයේ හේතු සාධක බවට පරිවර්තනය වන අතර, දැන් එම ක්‍රියාව මනුෂ්‍ය වර්ගයාගේ සහ පෘථිවියේ පැවැත්මට ද තර්ජනයක් වෙමින් තිබේ. ක්‍රේග් කොම්ස්ටොක් පවසන පරිදි, මනුෂ්‍යයා 'ආරක්ෂාවේ ව්‍යාධිය' වැළඳීම නිසා අප්‍රමාණ දුකට පත්ව සිටී. මෙම ව්‍යාධිය වැළඳුණු විට සිදුවන්නේ ආරක්ෂා කළ යුතු යැයි අරමුණු කර ගත් දෙයම, ස්වයං–විනාශයේ ප්‍රභවයක් බවට පත් වීමයි. (Comstock, 1971); ගෘහයේ ආරක්ෂාවට ලබාගත් තුවක්කුව, ගෙදර සාමාජිකයන් මරා දමන්නෝය. රාජ්‍ය ආරක්ෂකයෝ, රාජ්‍ය නායකයා මරා දමන්නෝය. හමුදාවල් තමන්ගේම ජනතාව වරදකරුවන් කොට, ඔවුන් සංහාරයට ලක් කරන්නෝය. න්‍යෂ්ටික අවි ප්‍රගුණ වී ගොස්, ඒවා නිපද වූ අයටද අයිතිකරුවන්ට ද තර්ජනය කරන්නෝය. ප්‍රචණ්ඩත්වයෙන් විමුක්තිය ලැබීමේ ප්‍රඥාප්තියක්, අපටත් - අපගේ සමාජවලටත් වහා අවශ්‍යය.

නූතන යුගයේදී ප්‍රචණ්ඩත්වය උපයෝගී කර ගනිමින් මනුෂ්‍යයා තම අනේක විධ ප්‍රාර්ථනා පසුපස හඹායෑම කෙළවර වී ඇත්තේ නොගිණිය හැකි තරම් ලේ ගැලීම්වලිනි. වස්තුභංගත්වයෙනි. පරම්පරා ගණනාවක් පුරා දෝංකාර නංවන්නා වූ මානසික ක්ෂතියෙනි. ගත වූ සියවස් දෙක පුරාම මානවයාගේ අපේක්ෂාවෝ ප්‍රංශ විප්ලවය විසින් ගෙන ආ "නිදහස, සමානාත්මතාවය, සහෝදරත්වය" යන පාඨ ලියැවුණු ධජ පතාක මත ලෙළදෙමින් තිබිණ. අමෙරිකානු විප්ලවයේ උරුමය වූයේ නිදහස සඳහා ඝාතනය කිරීමයි. එලෙසින්ම රුසියානු සහ චීන විප්ලව දෙකම අපට දායාද කොට ඇත්තේ සමානාත්මතාවය සඳහා ඝාතනය කිරීමය. මෙලෙස සාමය සඳහා ඝාතනය කිරීම සියවස් දෙකක් පුරා අප කළ යුද්ධ, විප්ලව සහ ප්‍රති–විප්ලව විසින් අපට ලබා දී ඇති උරුමයයි. අප ඉගෙන ගත යුතු පාඩම නම්, මාරකත්වයේ දායාදය අක්මුල්වල සිටම උපුටා දමන්නේ නැතිව සාමයේ පදනම් සාධක වන සැබෑ නිදහස, සමානාත්මතාවය සහ සහෝදරත්වය සාක්ෂාත් කළ නොහැකි බවය. යහපත මෙන්ම, අයහපත වෙනුවෙන් සිය ජීවිත පරිත්‍යාග කළවුන්ගේ මිනී කඳු මුර ගා අපට කියා සිටින්නේ මේ පාඩම ඉගෙන ගන්නා ලෙසය.

මේ පාඩමෙන් අපට අවබෝධ වන්නේ දැනට දේශපාලන විද්‍යාව නමැති ඥාණ ශාඛාව තුළ ලෝක පරිමාණයෙන් මතුවෙමින් පවතින, ඝාතනය නොවැළැක්විය හැකි දෙයක්ය, එමෙන්ම එය මානවයාගේ යහපැවැත්ම සඳහා අවශ්‍යය, යන උපකල්පනයට අභියෝග කොට, එය වෙනස් කළ යුතු බවයි. එහි අර්ථය නම් පුරාතන ප්‍රඥාවේ සහ අද්‍යතන දේශපාලන විශ්වාසයේ වඩාත්ම බලගතු ශික්ෂා පදයක් ප්‍රශ්න කොට, එය කණපිට පෙරලීම අවශ්‍ය බවයි. වෛද්‍ය විද්‍යා ඉතිහාසයේ දක්නට ලැබෙන "ප්‍රශංසනීය සැරව" න්‍යාය කණපිට පෙරළීමේ උදාහරණය මෙහිදී සාදෘශ්‍යයක් ලෙස යොද ගත හැකිය. තුවාලයක් වටේට සැරව සෑදීම, එම තුවාලය සුවපත් වන බව ප්‍රකෘතිය දන්වා සිටින ආකාරයක් යැයි බලගතු ප්‍රාධිකාරී ග්‍රීක චිකිත්සකයෙකු වූ ගේලන් ගේ ඉගැන්වීම ගත වූ ශත වර්ෂ දහහතක් පුරා පිළිගැනී තිබිණ. මීට අභියෝගයක් එල්ල කරන ලද්දේ 1867 දී ලිස්ටර් විසිනි. ඔහු සිය යුගකාරක ලාන්සට් (Lancet) නම් පත්‍රිකාව ඔස්සේ 'ශල්‍යකර්ම භාවිතාවේ විෂබීජ නාශනය' නම් වාද විෂය ගැන ඉදිරිපත් කළ මතය, ඉමහත් ආන්දෝලනයක් මැද්දේ නමුත්, විෂබීජ නාශක නිපදවීමටත් ඒවා බෙද හැරීමටත් මග පෑදීය - (Ackerknecht, 1982: 77; Garison 1929: 116; 589-90). ඝාතනය ස්වභාවිකය, එය දේශපාලනයේදී කෘත්‍යකාරක වශයෙන් යහපත්ය යනාදී විශ්වාස වනාහි දේශපාලන විද්‍යාවේ 'ප්‍රශංසනීය සැරව' න්‍යාය හැටියට හැඳින්විය හැකිය.

පවුල් ජීවිතයේ සිට ලෝක යුද්ධය දක්වා බහුවිධ ආකාරයෙන් ප්‍රකාශයට පත් වන දේශපාලන බලය අධ්‍යයනය කිරීම සඳහා ස්වකීය මුළු ජීවිත කාලයම කැප කළ දේශපාලන විද්‍යාඥයින්, මාරකත්වය නමැති උපකල්පනය බරපතල ලෙස අභියෝගයට ලක් කොට නැත. එසේ නම් ලෝකයේ වෙසෙන දේශපාලන නායකයින් සහ පුරවැසියන් එය කරාවී යැයි අප බලාපොරොත්තු වන්නේ කෙසේද? එසේ නමුත්, ඉතිහාසය පුරාම මෙන්ම, වැඩි වැඩියෙන් අද්‍යතන කාලයේ නිදහස, සමානාත්මතාවය සහ සාමය යන තත්වයන් නිර්ඝාත ප්‍රතිපත්ති මාර්ගයෙන්ම සාක්ෂාත් කර ගැනීමට මං සොයන, කිසිදු දේශපාලන විද්‍යාවක් මගින් ආධාරයක් නොලද නායකයෝ සහ පුරවැසියෝ ඕනෑ තරම් මතුවෙමින් සිටිති. හොඳම උදහරණයක් නම් බලෙන් හමුදාවට බඳවා ගැනීමට එරෙහිව 1895 දී

රුසියාවේ සාමවාදී දුක්බෝබර් (Doukhobors) ගොවි ජනයා හත් දහසක් දෙනා අවි ආයුධ පුළුස්සා දමමින් පෑ විරෝධයයි. (Tarasoff, 1995: 8–10). මාරකත්වය පිළිගන්නා දේශපාලන විද්‍යාව සහ මාරකත්වයට අභියෝග කරන දේශපාලන පුරෝගාමීන් අතර පැහැදිලිව දිස්වෙන විවරයක් තිබේ. දහස් ගණන් අප්‍රකට වීරවරියන් සහ වීරයන් ලබා දුන් ආධාරය සහ අනුප්‍රාණය විසින් අහිංසාවාදී දේශපාලන නායකත්වයන් භව්‍ය බවට පත් කරන ලද පූර්ව සාධකය නිසාවෙන් විසිවන සියවසේ බිහිවූ ටෝල්ස්ටෝයි, ගාන්ධි, අබ්දුල් ගෆාර් ඛාන්, මාටින් ලූතර් කිං (කණිෂ්ඨ), පෙට්‍රා කේලී වැන්නන් දායාද කළ උරුමයෝ – දලයි ලාමා, අවුන් සාන් සූ කී, ඩෙස්මන්ඩ් ටූටූ වැනි නායකයින් දිරිය සම්පන්නව ඉදිරියටම ගෙන යන්නා වූ උරුමයෝ – අනාගතයේ පැන නැගීමට නියමිත බලගතු නිර්ඝාත දේශපාලනයක පෙර නිමිති දක්වන්නෝය.

දිගින් දිගටම ප්‍රචණ්ඩත්වය ප්‍රශ්න කිරීමෙන් තොරව භාර ගන්නා තත්වයට කීකරුව, අනුගත වෙමින් සිටින දේශපාලන විද්‍යාඥයින් නිර්ඝාත දේශපාලන ප්‍රතිපත්තීන් පිළිගන්නට සූදනම් වන්නේ පුද්ගලයින් සහ ජනතා ව්‍යාපාර විසින් ජීවිත පරිත්‍යාගයෙන් යුතුව අවසානයේ ඒවා සාර්ථක අන්දමින් ජයග්‍රහණය කරවීමෙන් පසුවද? එනෙත්, වධබන්ධනයට භාජනය වන්නා වූ සමූහයා එක් රොක් වී, යම් අධිකාරවාදී පාලන තන්ත්‍ර බලයෙන් පහකොට අතු ගාන තුරුම, පරෙස්සම් සහගත ලෙස ඒවායින් ඵල ප්‍රයෝජන ලබා ගනිමින් එල්ලී සිටින දූෂිත වරලාභීන් ලෙසින් ඉන්නට ඔවුන් කල්පනා කරන්නෝද? දේශපාලන විද්‍යාඥයින් බලා සිටින්නේ, සියල්ල අවසාන වූවායින් පසුව උත්සවවලට සහභාගි වන්නටද? නැතහොත් දේශපාලන විද්‍යාව කටයුතු කළ යුත්තේ වෛද්‍ය විද්‍යාවේ කටයුතු සිදු කෙරෙන ආකාරයටද? එනම්, මාරකත්වය නමැති ව්‍යාධිය පරීක්ෂාවට භාජනය කොට, විනිශ්චයට එළැඹ මුළු මහත් ගෝලීය ජීවිතයෙන්ම ඝාතනය දුරිභූත කර දමන්නට බලාපොරොත්තු වෙන සියලු දෙනා වෙත ප්‍රදනය කළ හැකි ඖෂධ සහ ප්‍රතිකාර ක්‍රම සොයා ගැනීමටද?

**නිර්ඝාත හැකියාවන් පිළිබඳ ප්‍රවාදය**

නිර්ඝාත ගෝලීය සමාජයක් වනාහී භව්‍ය කාරණයක් බවත්, එමගින් දේශපාලන විද්‍යාව නමැති අධ්‍යයන විෂය හෙවත් ඥාන

ශාඛාව තුළ විපර්යාස ඇති කෙරෙන බවත්, එම ශාඛාව ඉටු කරන සමාජ භූමිකාව, නිර්ඝාත ගෝලීය සමාජයේ බිහිවීමට ආධාරක වන බවත් මෙහි ලා සංගෘහිත ප්‍රවාදය කියා සිටී.

නිර්ඝාත සමාජයන්ගේ උදව රඳා පවතින්නේ, යටත් පිරිසෙයින් අත්තිවාරම් හතක් මතය. මානව වර්ගයාගේ බහුතරය අන් අය ඝාතනය කිරීමේ යෙදෙන්නේ නැත. බලගතු නිර්ඝාත විභවයන්, මානවයාගේ අධ්‍යාත්මික උරුමය තුළ රැඳී පවතී. විද්‍යාව පෙන්වා දෙන්නේත්, අනාවැකි පළ කරන්නේත් නිර්ඝාත මානව හැකියාවන් පිළිබඳවය. ප්‍රචණ්ඩත්වයෙන් බිහි වූ ජාතික රාජ්‍යයන් තුළ පවා මරණීය දණ්ඩනය අහෝසි කිරීම, හමුදා සේවය ප්‍රතික්ෂේප කිරීමට හෘදය සාක්ෂිය මත පළ කරන විරෝධය භාර ගැන්ම වැනි සංක්‍රාන්තිය නිර්ඝාත මහජන ප්‍රතිපත්ති ක්‍රියාත්මක වෙයි. නිර්ඝාත සමාජවල කාර්ය සාධනයට තුල්‍යාර්ථයන් පෙන්වන නිර්ඝාත ප්‍රතිපත්තීන් මත පදනම් වූ විවිධ සමාජ ආයතන දැනටමත් ක්‍රියාත්මක වෙති. දේශපාලන හා සමාජාර්ථික විපර්යාසයන් සඳහා දියත් කෙරෙන අහිංසාවාදී බහුජන අරගල වලින් පෙන්නුම් කෙරෙන්නේ, විප්ලවීය මාරකත්වය වෙනුවට, බලගතු විකල්පයන් වේගයෙන් පහළ වෙමින් තිබෙන බවයි. නිර්ඝාත ප්‍රෝත්සාහනයේ සහ අත්දැකීම්වල මූලයන් ලොව පුරාම ඓතිහාසික සම්ප්‍රදායයන් තුළ දැක ගත හැකිය. අවසානයේදී නිර්ඝාත සංක්‍රාන්තියේ ප්‍රතිඥාව රඳා පවතින්නේ නිර්ඝාත පුද්ගලයින්, එනම් සුප්‍රකට හෝ අප්‍රකට නිර්ඝාත ගැහැණුන් සහ පිරිමින් මතය. එහි ජයග්‍රහණය රඳා පවතින්නේ ඔවුන්ගේ දිරිය සම්පන්න ජීවන පැවතුම් මතය.

### දේශපාලන විද්‍යාව සඳහා ඇඟෑවුම්

මනුෂ්‍යයෝ වනාහි ජීව විද්‍යාත්මකව ද, තත්වාරෝපණය හේතුවෙන් ද ඝාතනයට මෙන්ම නිර්ඝාතයට ද හැකියාවක් පෙන්වන බව පිළිගත යුතුය. එනමුත් ඉතා වැදගත් නිරීක්ෂණයක් වන්නේ බොහෝ මිනිසුන් ඝාතකයන් නොවූ බවත්, එමෙන්ම නිර්ඝාත සමාජයන් සතු සංරචකවල මූලාදර්ශයක් ලෙස සැලකිය හැකි, නිර්ඝාත ප්‍රතිපදාවන් මත ගොඩ නැඟුණු සමාජ ආයතන ගණනාවක් මේ වනවිටත් නිර්මාණය වී ඇති බවත්ය. තවදුරටත් කියන්නේ නම්, දැනටත් පවත්නා සහ අපේක්ෂිත විද්‍යාත්මක අභිවර්ධනය

ඝාතනයේ හේතු සාධක ඉවත් කිරීමට, නිර්ඝාත පැවැත්මේ හේතු සාධක ශක්තිමත් කිරීමට සහ නිර්ඝාත සමාජ උද්වීම හා සබැඳි තත්වයන් ගොඩනැගීමට අදාළ දැනුම් හා නිපුණතාවන් පිළිබඳ සහතිකයක් ලබා දෙයි. මෙකී තත්වයන් ගණනයට ගන්නා විට, මාරකත්වය මඟ හැරිය නොහැකිය යන ලිහිල් ප්‍රවාදය මත දේශපාලන විද්‍යාවේ ශාස්ත්‍ර ගවේෂණයන් ඉදි කිරීමත්, සමාජ භූමිකාවක් ඊට පැවරීමත්, සෞම්‍යව කියන්නේ නම්, ගැටළු සහගත තත්වයකි. එබැවින් "මරණීය විෂයයක්" යැයි හැඳින්විය හැකි දේශපාලන විද්‍යාව හරහා යමින්, එහි අඩංගු ඝාතනයේ ප්‍රවාදය සහ එකී ගම්‍යයන් ප්‍රශ්නයට ලක් කිරීම අතිශයින්ම උචිතය. දේශපාලන විද්‍යාවද අනෙකුත් ඥාන ශාඛාවන්, ශාස්ත්‍රධාරාවන් සහ වෘත්තික ක්ෂේත්‍රයන් මෙන්ම, අතීතයේ අහිංසාවාදී අත්දැකීම් සොයා පාදා ගත යුතුය. වත්මන් අහිංසාවාදී හැකියාවන් හඳුනාගත යුතුය. අනාගතය සඳහා අහිංසාවාදී විභවයන් ප්‍රක්ෂේපණය කළ යුතුය, එලෙසම, පර්යේෂණ හරහා, අධ්‍යාපනය හරහා සහ නිර්ඝාත සමාජ පරිවර්තනය අරමුණු කරගත් වෙනත් මහජන සේවාවන් හරහා මෙම දැනීම අභිවර්ධනය කරනු වස් දායක විය යුතුය.

නිර්ඝාත සමාජ පරිවර්තනය සඳහා ඒකාබද්ධ කළ යුතු ප්‍රධාන මූලද්‍රව්‍ය ඉතා පැහැදිලිය:

- ජීව ගුණය (අධ්‍යාත්මිකත්වය) – Spirit (S1),

  දර්ශනයන් සහ ආගමික චින්තාවන් තුළින් උකහා ගනු ලබන ඝාතනය නොකිරීමට කැපවීම

- විද්‍යාව (ඥානය) – Science (S2),

  ඝාතනයේ හේතු ප්‍රත්‍යයන්ද, නිර්ඝාත පරිවර්තනයේ හේතු ප්‍රත්‍යයන් ද ගැන සියලුම කලාවන්, විද්‍යාවන් සහ වෘත්තීන්ගෙන් උකහා ගැනෙන දැනුම

- නිපුණතා (ප්‍රාගුණ්‍යය) – Skills (S3),

  පරිවර්තනීය ක්‍රියාවන් තුළ ජීව ගුණය සහ දැනීම ප්‍රකාශ කෙරෙන පුද්ගල සහ කණ්ඩායම ක්‍රම විධීන්

- කලාව (සෞන්දර්ය භාවිතාවන්) – Song (S4),

නිර්ඝාත දේශපාලනයේ විද්‍යාත්මක මෙන්ම, ව්‍යවහාරික භාවිතාවන් ඌණිත සහ ශක්තිය සිඳවන සුළු වීම වැළැක්වීම හා එය ජිවිතයේ බලගතු උත්සවාකාර ප්‍රකාශයක් කරනු වස්, සියලුම කලාවන්ගෙන් උකහා ගත හැකි අනුප්‍රාණය.

මෙකී මූලද්‍රව්‍ය හතර ඒකාබද්ධ කිරීම, සංවර්ධනය කිරීම සහ විස්තාරණය කිරීම කළ හැක්කේ ඒවා මෙහෙයේ යෙදවීම තුළය. ඒ සඳහා නායකත්වය, (Leadership - L) පුරවැසි සාමාර්ථය (Citizen Competence-C) ක්‍රියාවේ යොදවන ආයතන (Implementing Institutions-I), සහ ආධාරක සම්පත් (Resources - R) අවශ්‍ය වේ. මෙකී අමුද්‍රව්‍යයන්ගේ සංයෝජනය මෙලෙස සූත්‍රගත කළ හැකිය.

**$S^4 \wedge$ LCIR = නිර්ඝාත ගෝලීය පරිවර්තනය**

ජීවගුණය, විද්‍යාව, නිපුණතා සහ කලාව යන මූලද්‍රව්‍ය, අවශ්‍යතා - සංවේදී ක්‍රියාවලීන්ට අනුබද්ධ ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වය, පුරවැසියනට බලය ලබා දීම, ඒවා විස්තාරණය කරන්නා වූ ආයතනික ක්‍රියාකාරීත්වය සහ නිසි සම්පත් කැප කිරීම යන සාධක සමග නිර්මාණශීලි ලෙස ඒකාබද්ධ කිරීම හරහා නිර්ඝාත ලෝකය උද කරන්නා වූ ගමන ශක්තිමත් වනු ඇත.

**න්‍යාය සහ පර්යේෂණ**

මිනීමැරුම්වල සිට ජන ඝාතන ද, නගර පිටින් න්‍යෂ්ටික ප්‍රහාර මගින් විනාශ වීමද, මිහිපිටින් සමස්ත ජීව පද්ධතිය තුරන් වීමද දක්වා වූ ව්‍යසනයන් නිර්මාණය කිරීමට මිනිස් මාරකත්වය භයංකාර විභවයන් දරා සිටී. මාරක බලවේගයන් අභිසරණය වෙමින් ඉදිරියට යෑම වළක්වනු පිණිස අවශ්‍ය කෙරෙන දැනුම සම්පාදනය කිරීමට චතුර්-විධ තර්කනයකින් යුක්ත විශ්ලේෂණයක් කරා යොමු වීමට දේශපාලන විද්‍යාවට සිදුවෙයි. දේශපාලන විද්‍යා විඥානයට අනුව, නිසි අවධානය ලබා ගැනීමට නම්, ඝාතන ප්‍රපංචය, විද්‍යාවේ පර්යන්ත සීමාවන්ගේ සිට විශ්ලේෂණයේ සහ ගැටලු-විසඳීමේ ප්‍රබල ආලෝකධාරා පතිත වන කේන්ද්‍රය කරා සංක්‍රමණය විය යුතුය. එවිට මතු වන චතුර්-විධ තර්කනය මෙලෙසය: ඝාතනයේ හේතු ප්‍රත්‍යයන් අවබෝධ කර ගැනීමට, නිර්ඝාත පැවැත්මේ හේතුප්‍රත්‍යයන් අවබෝධ කර ගැනීමට, ඝාතනයේ (ඝාතන සංස්කෘතියේ) සිට

නිර්ඝාතය (නිර්ඝාත සංස්කෘතිය දක්වා) දක්වා සංක්‍රාන්තියේ සහ එහි ප්‍රතිපක්ෂයේ හේතු ප්‍රත්‍යයන් අවබෝධ කර ගැනීමට සහ පූර්ණ නිර්ඝාත සමාජයන්ගේ ලක්ෂණ හඳුනා ගැනීමට නාභිගත ප්‍රයත්නයන් අවශ්‍ය වේ. මාරකත්ව පුනීලයේ අභිසරණාත්මක කලාප හරහා සහ ඒවා තුළ, පරිවර්ත ක්‍රියාවන් සහ නිර්ඝාත විකල්පයන් හඳුනා ගැනීමට ආධාරක වීමට මෙම දැනීම අවශ්‍ය වන්නේය. ඒවා නම්, ස්නායු ජීව විද්‍යාත්මක, ව්‍යුහාත්මක, සංස්කෘතික සමාජානුයෝජන සහ ඝාතන කලාප වශයෙනි.

### අධ්‍යාපනය සහ පුහුණුව

මේ අන්දමේ, දැනුම සොයා යන්නා වූද, විපර්යකාරක වන්නා වූද කාර්යභාරයක් අධ්‍යාපනය සහ පුහුණුව සම්බන්ධයෙන් පැහැදිලි ඇඟයීම් කරයි. දේශපාලන විද්‍යාඥයින්ගේ අධ්‍යාපනය සහ පුහුණුව, විෂයමාලාවන්ගේ ව්‍යුහය, ශාස්ත්‍රාලීය දේශපාලන විද්‍යා අංශවල අභ්‍යන්තර සංවිධානය, අනෙකුත් ඥාන ශාඛා හා ශාස්ත්‍රධාරාවන් සමග සබඳතා සහ සමාජය තුළ දේශපාලන විද්‍යාවේ පර්යේෂණ, අධ්‍යාපන සහ ක්‍රියාන්විත භූමිකාව යනාදියට අදාළ පූර්ව–අවශ්‍යතා මෙහි ලා අවධානයට හසුවේ.

නිර්ඝාත ගැටළු–විසඳීම සඳහා නිර්මාණශීලිත්වය සහ කුසලතා පෝෂණය කිරීම සහ 'හදවඩා ගැනීම', එක් අතකින් දේශපාලන විද්‍යා අධ්‍යාපනයේ සහ පුහුණුවේ සමස්ත අරමුණ බවට පත් වෙයි. නිර්මාණශීලී ජීවිත සහ ආයතනවල උරුමය ප්‍රත්‍යාවලෝකනය කිරීම පුද්ගලයාගේ ඇළුම් ක්ෂේත්‍රය සහ කුසලතා ගවේෂණයට ආධාර කිරීම, සමුච්ඡ දැනීම් සහ කුසලතා වර්ධනය සොයා යෑම, තමන් විසින් තෝරා ගන්නා ලද ගැටළු–විසඳීමේ ව්‍යාපෘතිවල නිරත වීම, සමාන්තර නිර්මාණාත්මක ප්‍රජා සේවාවන් සම්පාදනය කිරීම සහ නිර්ඝාත දේශපාලන විද්‍යා වෘත්තීන් වෙතට යොමුවීම සහ ඒවාට ආධාර කිරීම යනාදිය මෙහිදී භාවිතා කළ හැකි මාර්ගෝපදේශ මූලධර්ම කිහිපයකි.

මාරකත්වයේ සෝර ඉතිහාසය හා නිර්ඝාත නිර්මාණශීලිත්වයේ ආවේශක උරුමය පිළිබඳව විචිත්‍ර හැඳින්වීම්වලින් පසුව, විෂය මාලාව එළඹෙන්නේ නිර්ඝාත දේශපාලන විශ්ලේෂණයේ තර්කනය ඉදිරිපත් කිරීමටත්, ප්‍රතිඵලදායි ගැටලු විසඳීමේ ක්‍රියාවන් උදෙසා අවශ්‍ය

මූලධර්ම සහ ක්‍රියාවලීන් සොයා පාද ගැනීමට ආධාර කිරීමටත්ය. මෙහිදී ඝාත සහ නිර්ඝාත පැවතුම්වල හේතු ප්‍රත්‍යයන් ද, සංක්‍රාන්තියේ හේතු ප්‍රත්‍යයන් ද, නිර්ඝාත සමාජවල ගති ලක්ෂණ පිළිබඳ උපකල්පනයන් ද, සහභාගිකයෝ සමාලෝචනය කරති. මෙම පර්යාලෝකය ඔස්සේ ඔවුහු, ප්‍රජා (දේශීය) මට්ටමින් සහ ගෝලීය වශයෙන් දේශපාලන ආයතනවල ඓතිහාසික වර්ධනය විභාග කරති. අනතුරුව, ගැටලු විසඳීමට අදළ අභියෝග ඉදිරිපත් කෙරේ. මේ යටතේ මිනීමැරුම්, ජන ඝාතන, අවිහරණය, ආර්ථික මාරකත්වය, මානව හිමිකම්වලට එරෙහි කෲරත්වය, ජෛව සංහාරය, විනාශකාරී විභේදනය සහ විවිධත්වය හරහා සහයෝගී සන්ධානය වැනි කරුණු සලකා බැලිය හැකිය. අනතුරුව ගැටළු විසඳීමේ මාදිලීන්ට අදළව කුසලතා වර්ධනය සඳහා අවස්ථා සලසා දෙනු ලැබේ. එහි ලා පර්යේෂණ, ඉගැන්වීම්, සේවක–නායකත්වය සහ විචාරාත්මක සංනිවේදනය ඇතුළත්ය. මෙකී පදනම් මත ගැටළු විසඳීම සහ කුසලතා වර්ධනය අරමුණු කරගත් පුද්ගලික සහ කණ්ඩායම් ව්‍යාපෘතීන් ඉදිරිපත් කිරීමත්, ක්‍රියාත්මක කිරීමත් සිදුවේ. මීට සමාන්තරව ශික්ෂිත ප්‍රජා සේවයට අදළ අනුපූරක නායකත්ව පුහුණුව විශ්ව විද්‍යාල පරාසයක ක්‍රියාත්මක වන ශාන්ති සේනා (සාම හමුදව) විසින් ලබා දෙනු ලැබේ.

සංක්‍රාන්තික රාජ්‍ය සහ පුද්ගලික ආයතනවලට අවශ්‍ය කෙරෙන පර්යේෂකයින්, අධ්‍යාපනඥයින්, නායකයින්, සහ සන්නිවේදකයින් සඳහා වූ ඇබෑර්තු පිරවීමට මෙකී උපාධිධාරීන්ට අවස්ථාව තිබේ. ඔවුහු නිර්මාණශීලි ගැටළු විසඳීමේ සේවය උදෙසා වූ වැඩෙන සමාජ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දක්වති. ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට අදළ කුසලතා සහ නිපුණතා සහ අහිංසාවාදී සමාජ විපර්යාසයට සම්බන්ධයෙන් වැඩෙන සමකාලීන අවශ්‍යතාවන්ට මුහුණ දීමට දේශපාලන ක්ෂේත්‍රය තුළ මෙන්ම, රජයේ සහ සිවිල් සමාජයේ සේවාවන් සඳහා වඩා ඉහළ සූදනම්වීමක් පශ්චාත් උපාධි පුහුණුව විසින් සැපයේ. ගැටළු විසඳීමේ කාර්ය සාධනය, සාමාන්‍ය උපාධි අධ්‍යාපනයට සමාන්තරය; පර්යේෂණ, අධ්‍යාපන, ක්‍රියාන්විත සහ ප්‍රචණ්ඩත්වයේ ගැටළු විසඳීම සඳහා අවලෝකනය, ආර්ථිකය, මානව හිමිකම්, පරිසරය, සහයෝගීතාවය සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් කුසලතා අභිවර්ධනය සඳහා කාර්යසාධක

කණ්ඩායම් නැතහොත් ව්‍යාපෘති කණ්ඩායම් සකස් කරනු ලැබේ. ශාස්ත්‍රවේදී උපාධි අපේක්ෂකයන් සහ ආචාර්ය උපාධි අපේක්ෂකයන් පීඨයන් තුළ උපදේශකවරුන්, පර්යේෂණ කණ්ඩායම් සහභාගිකයින් හෝ උපාධි අපේක්ෂක ව්‍යාපෘතීන් තුළ සහ – විද්‍යාර්ථීන් සහ අධීක්ෂකයින් ලෙස සේවය කරති.

තමන් නිර්මාපකයින් වන අතරේ, අනෙක් අය තුළ නිර්මාණශීලීත්වයට පහසුකාරක වන්නා වූ වෘත්තිකයන් සූදනම් කිරීමට අදාළව, ආචාර්ය උපාධි පුහුණුව සම්බන්ධයෙන් ඉතා ඉහළ අභිලාෂයන් තිර්සාර දේශපාලන විද්‍යාව විසින් ගම්‍ය කරනු ලබයි. අවශ්‍ය සෑම කෞශල්‍යයක්ම සම්බන්ධයෙන් සෑම දෙනාම ප්‍රවීණත්වයක් දිනා ගනු ඇතැයි අපේක්ෂා නොකෙරේ. එහෙත් සෑම දෙනාටම අපේක්ෂිත කාර්යභාරයන් පිළිබඳ අවබෝධය බෙදා හදා ගත හැකිය. සෑම දෙනාටම ප්‍රමාණිකත්වයේ උපරිම සීමාවේ සිට, නිර්මාණශීලීව දායක විය හැකිය. එමෙන්ම සෑම දෙනාටම ශාස්ත්‍රාලීය ප්‍රජාව තුළත්, ඉන් පිටතත්, අනෙක් අයගේ ගැටළු විසඳීමේ වැඩසටහන්වලට උදව් කිරීමට ඉගෙන ගත හැකිය.

ආචාර්ය උපාධි පුහුණුව සඳහා තිර්සාර දේශපාලන විද්‍යාවේ පදනම් පිළිබඳව තීව්‍ර අධ්‍යයනයක් කළ යුතු වෙයි. ප්‍රජා සහ ගෝලීය මට්ටම්වල ගැටළු විසඳීමේ අවශ්‍යතා හඳුනා ගැනීම, තිර්සාර ශාස්ත්‍රඥ නායකත්වය සඳහා කුසලතා පුහුණුව, ගුණාත්මක සහ ප්‍රමාණාත්මක විමර්ශන විධීන් (භාෂාවන් ද ඇතුළුව) අවබෝධ කර ගැනීම, අදාළ කාර්ය භාරයන්ට අවශ්‍ය කෙරෙන පර්යේෂණ විධික්‍රම ගැන ප්‍රවීණත්වයක් ඇති කර ගැනීම සහ ඉහළ ව්‍යාපෘතීන් සමග සම්බන්ධ වීම යනාදිය මීට අදළය. අධ්‍යාපනය සහ පුහුණුව ප්‍රවර්ධනය කරනු පිණිස ද, ආයතනික සංවර්ධනය සහ ගැටළු විසඳීමේ ක්‍රියාවලීන් උදෙසා ද, දනට පවත්නා දැනීම මෙහෙයේ යොදා ගැනීමත්, නව දැනීම සොයා ගැනීමත් අවසානයට කී පියවර තුළින් අරමුණු විය යුතුය.

උවමනා කෙරෙන සමාජ භූමිකාවන්ට අදළව බහු–නිපුණ කාර්ය සාධක ශක්තියක් අත්පත් කර ගැනීම තිර්සාර ශාස්ත්‍රඥ නායකත්වයට අවශ්‍ය වෙයි. මූලික කාරණයක් වන්නේ, සාර සහ තිර්සාර පැවතුම් හා අනුබද්ධ විශ්වාසයන්, ආකල්පයන්, මානසික

නැඹුරුතාවයන් යනාදියේ සම්භවයන් පිළිබඳව ස්වයං–චරිතපදනමය ප්‍රත්‍යාවලෝකනයක් සඳහා වූ ඉඩකඩයි. ශිෂ්‍යයන් තුළ නිර්මාණශීලීත්වය මතු කර ගැනීමේ අරමුණින් ඉගැන්වීමට විශේෂ සූදානම් වීමක් අවශ්‍යය. එලෙසම සහ–ක්‍රියාකාරිකයින් තුළ නිර්මාණශිලිත්වයට ආධාරක වීමටද, අන්තර්–විෂයාත්මක සහයෝගය ගොඩනැඟීමටද අවශ්‍ය අංශ නායකත්වය සඳහා සූදානම් වීමක් උවමනා කෙරෙයි. මීට ඔබ්බෙන්, රජයේ සහ සිවිල් සමාජයේ තිර්සාත පරිවර්තනයේ පහසුකරණයට අවශ්‍ය උපදෙස් ලබා දීමට ද, ජන සංනිවේදන මාධ්‍ය ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් විචාරාත්මක සාධනීය මැදිහත්වීම් කිරීමට ද, තිර්සාත සේවක–නායකත්වය සඳහා ද නාභිගත සූදානම් වීම් අවශ්‍ය වනු ඇත. (Greenleaf 1977).

එක්තරා අවධාරණයක් ඉල්ලා සිටින කරුණක් වන්නේ, තිර්සාත දේශපාලන විද්‍යා අංශයක් සිය සමාජ සම්බන්ධතා තුළදී, තිර්සාත සමාජයක ප්‍රක්ෂේපිත ගති ලක්ෂණ තැත් – වරද (trial and error) ක්‍රමය හරහා ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාවයි. මෙයින් අදහස් වන්නේ, පාර්ශවීය හෝ නිකායවාදී පිළිවෙත්වලින් බැහැරව, පුළුල් මානවවාදී සහ බහු–සාමයික විවෘත භාවයක් සහිත ආධ්‍යාත්මික පදනමකින් ජීවිතය කෙරේ ගෞරවය තහවුරු කළ යුතු බවයි. එය 'බහුජන හිතාය - බහුජන සුඛාය' ආකල්පයකින් ව්‍යුත්පන්න විය යුතුය. මානව අවශ්‍යතා මූලික සහභාගී තීරක ක්‍රියාවලීන් දියුණු කිරීමටද, විවිධත්වය සහ සියලු දෙනාගේ ආත්මාභිමානය ගරුත්වයට පත් කිරීමටද ස්ත්‍රී–පුරුෂයන් අතර, සහයෝගීතාවය සහ බහු නායකත්ව ප්‍රවේශයන් පර්යේෂණාත්මකව දියුණු කිරීමටද, දිග් ගැස්සෙන ගැටුම් ඇති තැන් කරා අවශ්‍ය මොහොතක තිර්සාත ගැටළු විසඳීමේ උපදේශකයින් ලෙස යාමට සූදානම්ව සිටීමද, අනෙකුත් විෂයන් සහ වෘත්තීන් මගින් ලබා ගත හැකි දයකත්වයට විවෘතව සිටීමටද , විද්‍යාත්මක ගැටළු විසඳීම සඳහා නව්‍යකාරක කණ්ඩායම්වලට ධෛර්යය දීමට ද අවසානයේ තිර්සාත ගෝලීය සමාජය පවතින්නේ පුද්ගලයා සහ ප්‍රජාවන් මත බව හඳුනා ගැනීමට ද මෙකී පුළුල් අන්තර්කාරක පදනම අවශ්‍යය.

පර්යේෂණ, අධ්‍යාපන, නායකත්ව, සන්නිවේදන, සහ සමාජ ජීවිතයේ වෙනත් වැදගත් ක්ෂේත්‍ර කරා යන උපාධිධාරීන් සමග

දීර්ඝ කාලීන අන්‍යොන්‍ය උපදේශන සම්බන්ධයක් පිහිටුවා ගැනීම අවශ්‍යය. පර්යේෂණ අවශ්‍යතා නිර්ණය කිරීම, ක්ෂේත්‍ර කටයුතු සඳහා අවශ්‍ය සුදනම් වීම් දියුණු කිරීම, නිර්ඝාත පරිවර්තනය ඉදිරියේ වූ බාධක අතික්‍රමණය කිරීම සඳහා නිර්මාණශීලීත්වය මතු කිරීම යනාදිය සම්බන්ධයෙන් ඔවුන්ගේ අත්දැකීම් ඉමහත් සේ ප්‍රයෝජන වනු ඇත. නිර්ඝාත දේශපාලන විද්‍යාව විසින් ඉදිරිපත් කර සිටින අභියෝගය භාර ගන්නා සියළුම දෙනාට, අනික් ආකාරවලින් ඔවුන් කෙතරම් විවිධ වූවත්, දීර්ඝ කාලීන අන්‍යොන්‍ය සහයෝගය සහ උපකාරය සඳහා එකට එකතු විය හැකිය.

## ගැටළු විසඳීම

විස්තීරණ ගැටළු–විසඳීමේ රාමුවක් තුළ මූලික සහ ව්‍යවහාරික විද්‍යාව ඒකාබද්ධ වීමක්, නිර්ඝාත දේශපාලන විද්‍යාව මගින් ඇඟවේ. සංකීර්ණ සමාජ පරිවර්තන සන්දර්භයන්ට අනුකූලව ගැටළු විවිධාකාර වෙති. ගෝලීය වශයෙන් කැපී පෙනෙන ගැටළු පහක් තීරණාත්මක වැදගත්කමක් උසුලයි; ප්‍රචණ්ඩත්වය සහ නිරායුධකරණය, ආර්ථික හේතු නිසා වන ජන සංහාරය, මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ කෲර තත්වයන්, පාරිසරික ව්‍යසනය, ගැටළු විසඳීම උදෙසා අවශ්‍ය කෙරෙන සහයෝගීතාවය පිළිබඳ දුෂ්කරතා සහ අසාර්ථක වීම් යනු ඒ තරුණු පහයි. මේවා එකිනෙක සමග සහ සම්බන්ධිතය. එමෙන්ම ඝාතනයට ඇති සූදානම විසින් ඍජුව හා වක්‍රව ඒවා තීව්‍ර කරනු ලැබේ. වර්තමානයේ සුලබ සටන් පාඨයක් වන්නේ ''සාධාරණත්වය නැත්නම් සාමයක් ද නැත'' යන්නයි. ඉන් ගම්‍ය කෙරෙන්නේ ප්‍රචණ්ඩත්වය සහ යුද්ධය දිගට පවතින බවත්, එපමණක් නොව, අසාධාරණ තත්වයන්ට අභියෝග කිරීමට සහ වෙනස් කිරීමට ඒවා අවශ්‍ය බවත්ය. එහෙත් නිර්ඝාත පර්යාලෝකයකින් ඉදි විය යුතු සටන් පාඨය නම් 'නිර්ඝාත පැවැත්ම රහිතව සාධාරණත්වයක් ද නොමැත' යන්නයි. මන්ද යත්, ඝාතනය සහ ඝාතන තර්ජන, අසාධාරණත්වය නිර්මාණය කිරීමට සහ පවත්වා ගැනීමට දායක වූ හෙයිනි. උදාහරණයක් ලෙස, ස්ත්‍රීන්ට අසාධාරණ ලෙස සැලකීම ගැන පෙට්‍රා කේලි ගේ නිරීක්ෂණයක් මෙබඳුය: 'බලය අසමානව බෙදී යෑම සහ සම්පත් හා වගකීම් අසාධාරණ ලෙස පරිහරණය කිරීම පැරණි සම්ප්‍රදායයන් විසින් සුජාතත්වයට පත් කරනු ලැබුවේ, නීතිගත කරනු ලැබුවේ, අවශ්‍ය

විටෙක බලහත්කාරයෙන් ක්‍රියාත්මක කරනු ලැබුවේ පුරුෂ ප්‍රචණ්ඩත්වය විසිනිග.'(Kelly 1994:15).

ගැටළු විසඳීමට මැදිහත් වීම නිසා නිර්ඝාත දේශපාලන විද්‍යාව සර්වඥ ලෙස හෝ සෑම විසඳුමකම ප්‍රභවය ලෙස හෝ සැලකෙන බවක් අදහස් නොකෙරේ. එහෙත්, නිර්ඝාත දේශපාලන විශ්ලේෂණයෙන් සහ එකී මූලධර්ම හා භාවිතාවෙන් උකහා ගන්නා දැනුම සියළු දෙනාගේ අවශ්‍යතාවන්ට සංවේදී වන සමාජ තීරක ක්‍රියාවලින් පෝෂණය කිරීමට සමත් වන බව නම් ඉන් කියැවේ. මේ අර්ථයෙන් එය, පවත්නා ප්‍රචණ්ඩත්වය මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායයෙන් ඔබ්බට පියමං කිරීම සඳහා අහිංසාවාදී දයකත්වයක් සහතික කරයි.

**ආයතන**

නිර්ඝාත දේශපාලන විද්‍යාවේ ඥාණ ගවේෂක, අධ්‍යාත්මික පුහුණු සහ ගැටළු විසඳීමේ අභිමතාර්ථයෝ වැඩ සටහන් ක්‍රියාවට නගන්නා වූ නව ආයතන සඳහා ප්‍රබල අවශ්‍යතාවක් ගම්‍ය කරති. අභිනව, නැතහොත් ප්‍රතිව්‍යුහකරණයට ලක් වූ විශ්ව විද්‍යාල දේශපාලන විද්‍යා අංශ, සමහර විට මුළු විශ්ව විද්‍යාල, අහිංසාවාදී ශාන්ති සේනා පුහුණු ඒකක, නිර්ඝාත රාජ්‍ය ප්‍රතිපත්ති ආයතන, නිර්ඝාත පොදු ආරක්ෂක බල ඇණි, නිර්ඝාත දේශපාලන පක්ෂ, සිවිල් සමාජයේ සෑම අංශයක් තුළම නිර්ඝාත ආයතනික නව්‍යකරණ යනාදිය මෙකී ආයතනික අවශ්‍යතා සම්බන්ධයෙන් කැපී පෙනෙන අගයක් ගනිති. ප්‍රජා සහ ගෝලීය ජීවිතයෙන් මාරකත්වය ඉවත් කරනු වස්, යට කී නව ආයතන බිහි කිරීම හා පවත්නා ආයතන පරිවර්තනය කිරීම තුළ, නිර්ඝාත දේශපාලන විද්‍යාව උගන්නා සහ පුහුණු කරන සියලු දෙනාට ඉහළ නිර්මාණශීලිත්වයක් සමග සම්බන්ධ වන නව පන්නයේ වෘත්තීය සහ කාර්ය කොටස් සඳහා අසීමිත අවස්ථාවන් විවෘත වනු ඇත.

**බාධක සහ ප්‍රෝත්සාහන**

විසි එක් වන සියවස උදා වන මේ මොහොතේ, දේශපාලන විද්‍යාවට එල්ල කෙරී ඇති අභියෝගය නම් නිර්ඝාත ගෝලීය සමාජයක උදව සඳහා ක්‍රියාත්මකව සහභාගි වන ලෙසටයි. එය හුදෙක් රුචිකර කරුණක් පමණක් නොවේ, එය අත්‍යවශ්‍යය.

දේශපාලන විද්‍යාඥයින්ට "වටිනාකම් නැඹුරුව" පිළිබඳ ප්‍රශ්ණයක් ඉදිරිපත් කොට මේ වගකීමෙන් පලා යා නොහැකිය; විද්‍යාත්මක 'අපක්ෂපාතීභාවය' හෝ 'උපේක්ෂාව' යන ආස්ථානය තථ්‍ය වශයෙන් පරිවර්තනය වන්නේ ඝාතනයට ඇති සූදානම වශයෙන් බැවිනි. මෙකී අපක්ෂපාතීත්වය කිසි දිනක සත්‍ය කරුණක් නොවීය. එය එසේ වූවා නම්, තමන් ජීවත් වන සමාජය නිදහස් තැනක් ද නිදහස් නැති තැනක් ද, සාධාරණ ද, නැතහොත් අසාධාරණ ද, සශ්‍රීක සෞභාග්‍යමත් තැනක් ද නොඑසේනම් අගහිඟකම් වලින් පහරනු ලබන තැනක් ද, සාමකාමී ද, යුධ වියවුල් වලින් ගහණ ද, ජයග්‍රාහී ද පරාජිත ද යනාදී කිසිදු කරුණක් සම්බන්ධයෙන් කිසිදු උනන්දුවක් නොගන්නට තිබුණි. වටිනාකම් පිළිබඳ ප්‍රමුඛතාවක් නැති කොට, ඔවුන්ගේ පර්යේෂණ, ඉගැන්වීම්, සහ මහජන සේවා ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් තථ්‍ය සමාජයට සම්බන්ධ තීර්ණායක කිසිවක් නොතිබෙන්නට තිබිණ. ඔවුන් හිට්ලර්ගේ ලෝක ජනසංහාරයත්, ගාන්ධිගේ සත්‍යග්‍රහයත් අතර කිසිදු වෙනසක් නොදකින්නට තිබුණි.

එමෙන්ම, දේශපාලන විද්වතුන්ට නිදහස, සමානාත්මතාවය හෝ ආරක්ෂාව යන අනෙක් වටිනාකම් තිර්සාර මූලධර්මයට වඩා වැදගත් වේ, යන පදනමක් ඉදිරිපත් කොට ද, තිර්සාර දේශපාලන විද්‍යාව නිර්මාණය කිරීමේ කාර්යභාරය මග හැර යා නොහැකිය. මෙහිදී කිව යුත්තේ තිර්සාරය, එකී මූලධර්මයන් හා සම තත්වයේ ලා හෝ අවම වශයෙන් සලකනු ලැබීමට බල කෙරෙන තත්වයක් දැන් උදවී තිබෙන බවයි. මන්ද යත් දේශපාලන විද්‍යාව සහ දේශපාලන ජීවිතය තුළ තිර්සාර චර්යාධර්මය කෙරේ බලගතු කැපවීමක් රහිතව මුළින් සඳහන් කරන ලද සියළුම වටිනාකම් අනතුරට ලක්වන්නා වූ තත්වයක් වෙතට මානව වර්ගයා පැමිණ තිබේය යන සත්‍යය මේ වන විට මනා ලෙස තහවුරුව ඇති බැවිනි. ද්‍රව්‍යවාදය ද සදචාරය ද මෙම නිගමනය වෙතටම පැමිණ ඇත්තාහ. සම්ප්‍රදායය 'අපට නිදහස සමානාත්මතාවය සහ ආරක්ෂාව සඳහා මැරිය යුතුයි' යනුවෙන් උගන්වා ඇත. එනමුත් වර්තමානය අපට කියා දෙන්නේ, නිදහස හා සමානාත්මතාවය පමණක් නොව, පුද්ගල, සමාජ සහ පාරිසරික වශයෙන් අපගේ සමස්ත පැවැත්මම අප මැරීම නොනවත්වන්නේ නම් බලගතු අනතුරකට, නොහොත් නැත්තට නැතිවී යාමට ලක් විය හැකි බවයි. විද්‍යාවද, දේශපාලන

භාවිතය ද සමාජයේ සහ ස්වභාවධර්මයා තුළ වූ ජීව ධාරක බලවේග සමග අත්වැල් බැඳ ගත යුතු වූ මොහොතකට අපි සේන්ද්‍ර වී සිටිමු. එය හුදෙක් හොඳ සදචාරාත්මක එළඹුමක් පමණක් නොවේ. එය ප්‍රායෝගික වශයෙන් ප්‍රඥාගෝචර පියවරක් පමණක් ද නොවේ. එය මේ යුගයේ යහපත් දේශපාලන විද්‍යාවක අනිවාර්ය ලක්ෂණයකි.

සංක්‍රාන්තික ක්‍රියාවලින්හිදී, මාරකත්වය දිගටම පැවතීමෙන් වාසි ලබාගන්නා වූද, සිය අනන්‍යතාවය ඉදි කර ගන්නා වූද, චින්තනමය සහ ක්‍රියාන්විත බලවේගවලින් විරෝධයක් සහ ප්‍රතිරෝධයක් ඇත්තෙන්ම බලාපොරොත්තු විය හැකිය. ඒවා අතර, රාජ්‍ය ප්‍රචණ්ඩ හමුද, ඔවුන්ගේ මාරක ප්‍රතිවාදීන්, සහ ඝාතන සංස්කෘතියේ දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික වාසි ලබා ගන්නා වෙනත් පුද්ගලයින් හා කණ්ඩායම් වෙති. මේ අය අතර පෙර යුද්ධවල සහ කැරලි විප්ලවවල සහභාගිකයන් සහ ඔවුන්ගෙන් පැවත එන්නන් සමහරෙක් සිටිය හැකි මුත්, සියළු දෙනාම විය නොහැකිය. සියුම් සහ සංකීර්ණ ආකාරයෙන් මේ තත්වය සමග ඒකාබද්ධ වන පිරිසක් වන්නේ සාමාජීය වශයෙන් උත්කර්ෂයට නැංවෙන 'ධාර්මික මාරකත්වයෙන්' සිය අනන්‍යතාවය සහ අභිමානය ගොඩ නගා ගන්නා උදවියයි. රණවිරුවන්ගේ සොහොන් බිම්වලට ගොස් ඔවුන් සිහිකර ගෞරවය පුද කරන අපි, මිය ගිය සතුරන් කෙරේ අප තුළ අනුවේදනයක් ඇතිවීමට එරෙහිව තත්වාරෝපණය වෙමු. මිය ගොස් ඇති මනුෂ්‍යයින් දෙපිරිසම, දේශපාලනික, සමාජ සංස්කෘතික ව්‍යුහයන්ගේ ගැටළු නිසා විපතට පත් වූවන් ලෙස දකින්නට අපොහොසත් වන අපි එතැනින් යන්නේ එබඳු ඝාතන නැවත ඇති නොවීම සඳහා කැපවීමට සිතමින් නොව මෙබඳු ජීවිත පූජා සඳහා අනවරත සූදනමක් ඇති කර ගනිමිනි.

එහෙත්, නිර්ඝාත දේශපාලන විද්‍යාව දෙසට මාරුවීම සඳහා අනුප්‍රාණය සපයන්නා වූ මූලාශ්‍ර අතර ලෝකයේ ඉහළම ගෞරවයට පාත්‍ර වූ ඇතැම් හමුද නායකයෝ ද වෙති. අමෙරිකානු ලෙජනය අමතා (American Legion, 1955) "විද්‍යාත්මක යතාර්ථවාදයේ" අත්‍යවශ්‍ය පියවරක් ලෙස යුද්ධය අහෝසි කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළ සෙන්පති ඩග්ලස් මැක් ආතර් ගේ ආයාචනය සලකා බලන්න;

*යුද්ධය අහෝසි කිරීම ශත වර්ෂ ගණන් තිස්සේ මිනිසාගේ සිහිනයක්ව තිබූ*
*නමුත් එය අරමුණු කරගත් සැම යෝජනාවක්ම අභව්‍ය සහ මනඃකල්පිත*

> *ලෙස සලකා වහාම ඉවතට විසි කරන ලද බැව් ඔබ වහාම කියනු ඇත. ලෝකයේ සෑම නරුමවාදියෙක්ම, සෑම අසුභවාදියෙක්ම, සෑම වික්‍රමිකයෙක්ම, එය පදනම් රහිත අදහසක් යැයි කියා ඇත. එහෙත් ඒ සියල්ල වූයේ මහා පරිමාණ සංහාරයන් හා විනාශයන් සිදු කිරීමට හැකි බව විද්‍යාව විසින් පසුගිය දශකයේ දී ප්‍රදර්ශනය කරනු ලැබීමට පෙරය. එවකට, යුද්ධ අහෝසි කිරීමේ අදහස තර්ක කරනු ලැබුණේ අධ්‍යාත්මික පහ සදචාර පදනම් මත සිටය. එය පරාජයට පත් විය ... එහෙත් අද්‍යතනයේ, න්‍යෂ්ටික සහ වෙනත් මහා පරිමාණ ලෙස විනාශකාරී තාක්ෂණයන්ගේ වේගවත් වර්ධනය විසින් මෙම ප්‍රශ්නය සදචාර සහ අධ්‍යාත්මික ක්ෂේත්‍රයෙන්, විද්‍යාත්මක යතාර්ථවාදයේ ක්ෂේත්‍රයට ගෙන වුත් ඇත. එය තවදුරටත්, උගත් දර්ශනිකයන් සහ දේවධර්ම ආචාර්යවරුන් විසින් පමණක් පරීක්ෂා කර බැලිය යුතු සුදු ආචාරධර්මීය ප්‍රශ්ණයක් නොව, මෙකී තත්වය නිසා ජීවිත අනතුරට මුහුණ දී සිටින දශලක්ෂ සංඛ්‍යාත ජනතාවන් විසින් තීන්දු තීරණ ගත යුතු දෘඪ ප්‍රායෝගික ප්‍රශ්ණයකි.... මෙහිදී නායකයෝ පසුපසින් ගාටන්නෝය... ශිෂ්ඨාචාරයේ ඉතිරි මහා අඩිය තබන්නට නම් යුද්ධය අහෝසි කර දැමිය යුතුය යන පැහැදිලි සත්‍යය ඔවුන් කියන්නේ නැත... වේගයෙන් විශ්වීය අවශ්‍යතාවක් බවට පත් වෙමින් තිබෙන මෙම විශ්වීය අපේක්ෂාව, යථාභූතය බවට පරිවර්තනය කිරීම උදෙසා ප්‍රමාණවත් පරිකල්පන ශක්තියක් කවද කෙදිනක බලයේ සිටින ඇතැම් මහඅු නායකයින් තුළ ඇතිවේද? අප එළැඹ සිටින්නේ නව යුගයකටයි. පැරණි විධික්‍රම සහ විසඳුම් තවදුරටත් ගැලපෙන්නේ නැත. අපට අළුත් සිතිවිලි, අදහස්, සංකල්ප අවශ්‍යය ... අප අතීතයේ විය ගසින් මිදිය යුතුයි. (Cousins 1987:67-9)*

මෙලෙසම, නොකඩවා වර්ධනය වන ප්‍රචණ්ඩ හමුදකරණය විසින් "නිදහස, සමානාත්මතාවය, සහ සහෝදරත්වය" යන මූලධර්ම කෙරේ ඇති කරන අනතුරුදායක බලපෑම පෙන්වමින් ප්‍රංශ විප්ලවයේ එකී සටන්පාඨ නව අහිංසාවාදී පරිවර්තනයකට ලක් වීමේ අවශ්‍යතාවය පිළිබඳ ඇඟවීමක් සෙන්පති, පසුව අමෙරිකාවේ ජනාධිපති වූ, ඩ්වයිට් ඩී. අයිසන්හවර් විසින් මෙසේ ප්‍රකාශයට පත් කරයි. **නිදහස ගැන;** හමුද කාර්මික සංකීර්ණය විසින් ආණ්ඩුවේ තීරක සභා තුළ අනවශ්‍ය බලපෑමක් අත්පත් කර ගනු ලැබීමට එරෙහිව අප අවදියෙන් සිටිය යුතුය. අපගේ නිදහස් සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් මෙකී ඒකාබද්ධ වීම නිසා අනතුරට ලක් වීමට අප කිසිසේත් ඉඩ දිය යුතු නැත. මේ කරුණේ දී අප සිදුවීම් ඔහේ වෙන්නට ඉඩ හැරීම නොකට යුතුය. (සමුගැනීමේ ආමන්ත්‍රණය January 17, 1961); **ආර්ථික සමානාත්මතාවය ගැන;** "නිපදවන ලද සෑම තුවක්කුවක්ම, දියත් කරන ලද සෑම යුධ නෞකාවක්ම, ඔසවන ලද සෑම රොකට් අවියක්ම, අවසාන විග්‍රහයේ දී සංඥා කරන්නේ ආහාර නොලද කුසගින්නෙන් පෙළෙනවුන්ගෙන් ද, සීතලෙන් ගැහෙන

වස්ත්‍ර නොලැබූ අයගෙන් ද සොරා ගැනීමකි". (පුවත්පත් කතුවරුන්ගේ අමෙරිකානු සංගමය අමතා කළ කථාවක්, April 16, 1953); **සහෝදරත්වය ගැන**; "සත්‍ය වශයෙන්ම, මා හිතන්නේ ජනතාවට සාමය ඉහළින්ම ඕනෑ කරන බවයි. එබැවින්, නුදුරු කාලයේදීම ආණ්ඩු කළ යුත්තේ ඔවුන්ට බාධා නොකර පාරෙන් ඉවත් වී එය ලබා ගැනීමට ඔවුන්ට ඉඩ දීමයි". (බී.බී.සී. රූපවාහිනී සාකච්ඡාව August 31, 1959).

1996 දෙසැම්බර් 4 ද වොෂින්ටනයේ ජාතික ප්‍රවෘත්ති පත්‍ර පර්ෂදය (National Press Club, Washington) ඉදිරියේ කතා කරමින්, අමෙරිකාවේ සියළුම න්‍යෂ්ටික යුධ බල ඇණිවල අණ දෙන නිලධාරියාව සිට විශ්‍රාම ගිය සෙන්පති ජෝජ් ලී බට්ලර්. සියළුම න්‍යෂ්ටික අවි, හුදෙක් අඩු කිරීමට නොව, පූර්ණ වශයෙන් අහෝසි කර දැමීමට අවශ්‍ය බව කියා සිටියේය. ඔහු ඉල්ලා සිටියේ න්‍යෂ්ටික අවිවල නිර්මාපක රට මෙන්ම ඒවා ප්‍රථමයෙන් භාවිතා කළ රටද වශයෙන් අමෙරිකාව මේ කාරණයේ දී පුරෝගාමී විය යුතු බවයි. එසේ නොවන්නේ නම්, අනෙකුත් රටවල් න්‍යෂ්ටික අවි ලබා ගැනීම වැළැක්වීම අරබයා කිසිදු සදචාරාත්මක අයිතියක් අමෙරිකාව සතු නොවන බවද ඔහු තවදුරටත් අවධාරණය කළේය. මේ අවි ගැන ඔහුගේ සමාලෝචනය වූයේ "න්‍යෂ්ටික අවි ස්වභාවයෙන්ම අනතුරුදායකය, නොසෑහෙන ලෙස මිල අධිකය, යුධමය වශයෙන් අකාර්යක්ෂමය, සහ සදචාරාත්මක වශයෙන් භාර ගත නොහැකිය" යන්නයි. මෙලෙස සෙන්පති බට්ලර් එළඹෙන්නේ, "අසිපත් නගුල් බවට හැරවීමේ ව්‍යාපාරය" වැනි අධ්‍යාත්මික හේතුන්ගෙන් ආවේශය ලැබූ ව්‍යාපාරවල සාමාජික අමෙරිකානුවන් බොහෝ කලකට පෙර පැමිණි නිගමනයටමයි. එහෙත් න්‍යෂ්ටික අවිවලට එරෙහිව විරෝධය ප්‍රකාශ කිරීම නිසා අමෙරිකානුවෝ තවමත් සිරගෙවල් කරා යති. න්‍යෂ්ටික අවි හරණ ව්‍යාපාරයේ තාර්කනය අනෙක් ඝාතක අවි සඳහා ද පහසුවෙන්ම යොදා ගත හැකිය.

ඝාතන වෘත්තියේ විශේෂඥයින් වන මෙබඳු ඉහළම හමුදා නිලධාරීන්ට, තමන්ගේ රාජකාරිය සහ එය සමාජයට දක්වන සම්බන්ධය ගැන මේ ආකාර ගැඹුරු ප්‍රශ්ණ නැගීමක් කළ හැකි නම්, තමන්ගේ වෘත්තිය තුළ වූ ප්‍රචණ්ඩත්වය භාර ගන්නා පර්යාලෝක සහ එහි සමාජ භූමිකාව ගැන ප්‍රශ්ණ නැගීමක් දේශපාලන විද්‍යාඥයින්ට කළ නොහැකිද?, ඒ මගින් ගෝලීය

වශයෙන් නිර්භාත සමාජ උදකර ගැනීම සඳහා ප්‍රයත්න දරිය නොහැකිද?

අමෙරිකා එක්සත් ජනපදයේ ශාස්ත්‍රාලීය විෂයක් වශයෙන් දේශපාලන විද්‍යාව නිර්මාණය වීම සඳහා දයකත්වය දුන්නා වූ නිර්භාත අභිප්‍රේරණයන් පිළිබඳව, බොහෝ අමෙරිකානු දේශපාලන විද්‍යාඥයෝ හෝ සමකාලීන අමෙරිකානු දේශපාලන විද්‍යාවේ සංරචක භාර ගන්නා අන්තර්-ජාතික සහ - ක්‍රියාකාරී දේශපාලන විද්‍යාඥයෝ හෝ නොදනිති. මෙහිලා නම් කළ යුතු එක මූලාශ්‍රයක් නම් 1863 දී තරුණ ජනපද (union) සෙබලෙක් වූ ජෝන් ඩබ්. බර්ගස් විසින් ප්‍රකාශිත රණභූමි ප්‍රතිඥාවයි. සිද්ධිය සිදු වූයේ, බටහිර ටෙනිසි ප්‍රදේශයේ දී සහ - සන්ධිය (Confederate) බලවේග සමග දවසක් පුරා ලේ වැකි සටනකින් පසු රාත්‍රී ආරක්ෂක සේවය සඳහා ඔහුව යොදවා තිබියදීය:

> *වැස්ස ඇල්ලකින් මෙන් කඩා වැටෙමින් තිබුණි. නීන්ත පැහැ අහස හරහා විදුලියේ නපුරු දිව පහර දෙමින් තිබිණ. කාලතුවක්කු ගිගුම් මෙන් අකුණු පුපුරන හඬ අහස් ගැඹුර දෙදරවීය. ස්වභාවධර්මයේ මෙම ගර්ජනා ගෙරවිලි මැදින් තුවාල ලැබූ සහ මිය යමින් සිටින සතුන්ගේ කෙඳිරිලි හා කෑගැසීමේ හඬ ද තුවාල ලැබූ සහ මිය යමින් සිටින මිනිසුන්ගේ විලාප සහ අඳෝනා හඬ ද සම්මිශ්‍රව පැතිරී ගියේය. හොඳටම පදම් වූ සෙබළුන්ට වුවද එය ත්‍රාසජනක රාත්‍රියක් විය. මා වැනි තරුණ, හොඳටම සංවේදී අයට එය වචනයට නැගිය නොහැකි ආකාරයේ, භයංකාර දුස්වප්නයක් බඳු දීර්ඝ කාලීන කම්පනයක් ජනිත කළ අතිබිහිසුණු අත්දැකීමක් විය. කෙසේ නමුත් මේ බියකරු රාත්‍රිය මැද්දේයි මගේ ජීවිත කාර්යභාරය පිළිබඳ මුල්ම අදහස මගේ සිතට නැගුනේ. අන්ධකාරය හරහා විනිවිදින්නට ඇස් වෙහෙසවද්දී, ළඟ එන සතුරාගේ හඬ අල්ලා ගන්නට කන් වෙහෙසවද්දී මගේ සිත මෙලෙස කොඳුරන්නට ගත්තේය: දෙවියන්ගේ අනුරුවක් ලෙස බුද්ධිමය ශක්තියක් ඇතිව නිර්මාණය වී සිටින මිනිසාට තමන්ගේ පැවැත්මේ ගැටළු, විනාශකාරී භෞතික ප්‍රචණ්ඩත්වයට යොමු වන්නේ නැතිව යථාවාදී ලෙස කල්පනා කිරීමේ ශක්තිය මගින් විසඳ ගැනීමට නොහැකිද? එවිට මම දෙවියන් ඉදිරියේ ප්‍රතිඥාවක් දුන්නෙමි. මේ යුද්ධයෙන් නොනැසී ජීවිතය රැක ගන්නට මට වරමක් ලැබුනොත්, ලේ හැළීම සහ විනාශය මම පිටු දකින්නෙමි. හේතුවාදී සිතීම හා සම්මුතික ප්‍රවේශයන් හරහා ජීවිතය ගොඩ නැගීමට මගේ ජීවිතය කැප කරන්නෙමි.* **(Burgess 1934:28)**

තමන්ගේ ප්‍රතිඥාවට අනුකූලව ක්‍රියාත්මක වූ බර්ගස් උපාධි අධ්‍යාපනය සඳහා ජර්මනියට ගොස්, ආපසු පැමිණ තිව්යෝක් හි කොලම්බියා කොලේජ් විශ්ව විද්‍යාල ආයතනය තුළ දේශපාලන විද්‍යා පාසලක් 1880 දී පිහිටුවීය.

මහාචාර්ය බර්ගස් ගේ අත්දැකීම් වූ කලී, නිර්ඝාත දේශපාලන විද්‍යාවට දායක වන්නන් ඉදිරියට පැමිණෙන බාධක ගැන අනාවැකි ඉදිරිපත් කරන්නා බඳුය. මේ බාධක ඒ ඒ සන්දර්භයට අනුව, ඉතා සුළු වර්ගයේ උදාහරණ වල සිට ආන්තික වශයෙන් ඉතා තදබල අවස්ථා දක්වා විවිධ විය හැකි අතර, එවා ජයගැනීමට ධෛර්යද ඇතැම් විට ගෝලීය පරිමාණයේ සහයෝගයද අවශ්‍ය කෙරේ. ජර්මානුවන් සහෝදර මනුෂ්‍ය පිරිසක්ය, යන අවබෝධය මත සිට බර්ගස් අමෙරිකාව පළවන ලෝක යුද්ධයට ඇතුල් වීමට එරෙහිව විරෝධය දක්වා සිටියේය. 1917 අගෝස්තු 6 ද, අමෙරිකාව යුද්ධයට ඇතුල් වූ දිනය බර්ගස් ට අනුව "කම්පනාත්මක ප්‍රහාරයක් විසින් මගේ මුළු ජීවිත කාර්යයම පහළට ඇද දමන්නා වූ විනාශයක් මා වටා ඇති කරන" ලද්දක් විය. දේශප්‍රේමී ජර්මන් විරෝධී යුද්ධය මධ්‍යයේ බර්ගස් වේදනාවෙන් බර සිතින් මෙසේ සටහන් කළේය. "සාමයේ සහ යථාවාදී චින්තනයේ ප්‍රකාශකයෙක් වීම නිසා කෙනෙක් ද්‍රෝහියෙක් සහ බියගුල්ලෙක් ලෙස ලෝකයා විසින් අද ගර්හා කරනු ලැබීමට පාත්‍ර වන්නේය" (29). බර්ගස්ට ද හිමි වූයේ යුග හරහා ක්‍රියාත්මක වූ සාම ක්‍රියාකාරීන්ගේ, අප්‍රමාණ ලෙස වේදනාකාරී, ඇතැම් විට ජීවිත පරිත්‍යාගය ඉල්ලා සිටින්නා වූ වර්ගයේ ඉරණමකි.

නිර්ඝාත දේශපාලන භාවිතය තරම්ම, නිර්ඝාත දේශපාලන විද්‍යාවද ජීවිතය කෙරේ වූ අධ්‍යාත්මික සහ මානවවාදී ගරුත්වයෙන් ආවේශණය වූ ගාන්ධියානු මූලධර්ම මගින් මෙහෙයවනු ලැබීම අවශ්‍යය. එයට ධෛර්යය නැතිව බැරිය; මෙක්සිකෝවේ චියපාස් ප්‍රදේශයේ 1992 දී පිහිටුවනු ලැබූ Sociedad Civil Las Abejas (මීමැසි සිවිල් සමාජය) නම් ගැමි ගොවි සංවිධානය පෙන්වනවා තරම්ම ජීවය රක්ෂා කිරීමේ පිළිවෙත් සඳහා මූලික කැපවීමක්, ගෝලීය ලේ වැගිරීම් පරිසරය තුළ දේශපාලන විද්‍යාඥයින් අද පෙන්වා සිටිය යුතුය. සන්නද්ධ සැපටිස්ටා කැරැල්ල සහ ඊට ප්‍රතිපක්ෂ වූ පාලකයින්ගේ කෲර මර්දනය මැද්දේ, 'මී මැස්සෝ' අහිංසාවාදී ලෙස සාධාරණත්වය සොයා යති. ඔව්හු සැපටිස්ටාවරුන්ගේ විමර්ශනය සහ අභිමතාර්ථ පිළි ගනිති. එහෙත් එකඟ නොවන තැනක් ද තිබේ. "අපේ මාර්ගය වෙනස්ය. අපි දෙවියන්ගේ වචනය විශ්වාස කරන්නෝ වෙමු. අපි බයිබලය කියවන්නට දන්නෙමු. ඉදින්, අප අපේ සතුරාට ප්‍රේම කළ යුතුය; මැරීම අපට කළ නොහැකිය. ඒ සියල්ලට පෙර අපි දුප්පත්

ගැමි ගොවියෝය, සහෝදරයින් සහ සහෝදරියන්ය...... අපි මරණයට බිය නොවෙමු. අපි මැරෙන්නට සූදානම් වූවත් මරන්නට සූදානම් නැත". (Peace News, July 1998; 13-14)

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලනය යටතේ ඉන්දියානු ජනතාව තුළින්, ධවල වර්ගවාදී ආධිපත්‍යය යටතේ අප්‍රිකානු - අමෙරිකානු ජනතාව තුළින් නැතහොත් දුගී මෙක්සිකානු ගැමියන් තුළින් මතුව ආවාක් මෙන් නිර්ඝාත ප්‍රතිපදාවන්ට ඇති කැපවීම හැම විටම "පහළ සිට ඉහළට" ගලායන තුරු අප බලා සිටින්නේ ඇයි? එය "උඩ සිට පහළට" ගලන ක්‍රියාවලියක් ද විය නොහැක්කේ මන්ද? දේශපාලන විද්‍යාඥයින්ද ඇතුලත් ප්‍රජා, ජාතික, අන්තර්ජාතික සහ ගෝලීය ප්‍රභූත්වය තුළින් ද මේ කැපවීම ජනිත නොවිය යුත්තේ මන්ද?

නිර්ඝාත ශක්‍යතා සහ හැකියා පිළිබඳ විමර්ශනයන් මගින් පෙනී යන පරිදි නිර්ඝාත ගෝලීය පරිවර්තනයක් ඇති කිරීමට මනුෂ්‍යයා සමත් බවට විශ්වාසයක් ඇති කර ගත හැකිය. නිර්ඝාත සමාජයක් සංයුක්ත කරන්නා වූ සෑම සංරචකයක්ම සහ ලක්ෂණයක්ම පාහේ, මනුෂ්‍ය අත්දැකීම තුළ කොතනක දී හෝ කවරදා හෝ විද්‍යාමාන වී ඇත - සංනිදර්ශනගත වී ඇත. අපට ඉතිරිව ඇත්තේ හුදෙක් ඒවා හඳුනා ගැනීමටත්, අනුපූරණය කිරීමටත් සහ නිර්මාණශීලිව ප්‍රජා සහ ගෝලීය අවශ්‍යතා සහ සාධකයන්ට ගැලැප්පීමටත් පමණය. අතීත සහ වර්තමාන ලේ වැගිරීම්වල කම්පිත මතකය නිර්ඝාත අභිප්‍රේරණය සහ සමාජානුයෝජනය සඳහා බලගතු ප්‍රභවයක් ලෙස සේවයට කැඳවිය යුතුය. අපි මනුෂ්‍යවර්ගයාගේ මරණීය වැරදි නැවතත් නොකළ යුත්තෝ වෙමු. එබැවින් අප ක්‍රියාත්මක විය යුත්තේ ඝාතනය කරා නැවත පසුබැසීමත්, ඝාතනය පවත්වා ගෙන යැමත් නොහැකි වන ආකාරයටය.

1958 සිට අවුරුදු තිහක තරම් කෙටි කාලයක් තුළදී එක්වදෝරයේ වවුරානී නම් ජනකාය, තම සමාජයේ මිනීමැරුම් සංඛ්‍යාව 90%කින් විශ්මය දනවන අයුරින් අඩු කර ගත් බව වාර්තා කරන ක්ලේටන් සහ කැරොල් රොබාචෙක් (Cleyton and Carole Robarchek, 1998) නම් මානව විද්‍යාඥයින් දෙදෙනා, ඉතා වේගවත් නිර්ඝාත පරිවර්තනයක් කිරීමට මනුෂ්‍යයා සමත් බව පෙන්වා දෙති. පසුගිය ශතවර්ෂය තුළ එම සමාජයේ මරණ සංඛ්‍යාවෙන් සියයට හැටක්ම මිනීමැරුම් ව

තිබූ අතර "මානව විද්‍යාව දන්නා වඩාත්ම ප්‍රචණ්ඩ සමාජය" ලෙස වචුරානිවරුන් හඳුනා ගනු ලැබිණ. එකල එහි මිනීමැරුම් අනුපාතය ජනගහණයෙන් 100,000කට 1,000ක් විය. (අමෙරිකාවේ මෙම අනුපාතය 100,000කට 10ක් හෝ ඊට අඩුය). එහෙත් දශක තුනක් තුළ වචුරානි සමාජයේ මිනීමැරුම් අනුපාතය 100,000ට 60ක් දක්වා පහතට බැස ගියේය. මෙම විශ්මයජනක පරිවර්තනයේ ප්‍රධාන දයක මූලාශ්‍රයක් වූයේ ධෛර්යවන්ත නායකත්ව ගුණයක් ප්‍රදර්ශනය කළ ගැහැණුන් දෙදෙනෙකු දියත් කළ ආරම්භනයන්ය. ඔවිහු වනාහි 1956 දී වචුරානිවරුන් සමග ගනුදෙනු කිරීමට ගොස් මැරුම් කෑ ක්‍රිස්තියානි මිෂනාරි පූජකයෙකුගේ බිරිඳක් සහ සහෝදරියක් වූහ. ඔවුන්ගේ දීර්ඝ දුෂ්කර ගමනේ මං සළකුණු මෙබඳුය; වචුරානි ගැහැණුන් කිහිප දෙනෙකුගේ ආධාරය ලබා ගැනීම, විකල්ප නිර්සාත වටිනාකම් පද්ධතියක් ක්‍රමානුකූලව හඳුන්වා දීම, බාහිර ලෝකයේ සිටින්නේ මිනීමස් කන්නන් නොවන බව ඇතුළු, ලෝකය පිළිබඳ සංජානනාත්මක තොරතුරු බාහිර ලෝකය දකින්නට සලස්වන ලද වචුරානි ගැහැණුන් මගින් ප්‍රජාව තුළට ඇතුල් කිරීම; පවුල් පිටින් හෙළි පහරට ගොදුරු කරන්නා වූ තම සමාජය තුළ ඔඩු දුවා ඇති පළිගැනීමේ භයංකාර ලේ වැගිරීම් චක්‍ර අවසන් කිරීමට, වචුරානිවරුන් තුළින්ම ආශාවක් මතු වී ඒම යනාදී වශයෙනි. දේවස්ථාන විසින් ඝාතන නැවැත්වීමට කැපවීමේ යාඥා ක්‍රම සකස් කරන ලදී. මෙලෙස පොලිසියක මැදිහත් වීමක් හෝ වෙනත් බලහත්කාරයකින් තොරව මිනීමැරුම් සංඛ්‍යාව පහළට බැස ගියේය. ඇත්තෙන්ම මෙහිදී සමාජ ආර්ථික ව්‍යුහාත්මක වෙනසක් ආරම්භක වශයෙන් දියත් නොවීය. එනමුත් නව නිර්සාත ආධ්‍යාත්මික පරිවර්තනය සහ සංජානාත්මක පුපුල් වීම් සමග ව්‍යුහාත්මක විපර්යාසයන් ද ක්‍රමානුකූලව ඇතිවන්නට පටන් ගත්තේය. ක්‍රිස්තියානි නොවන වචුරානි කණ්ඩායම් ද මේ සමග විපර්යාසයට භාජනය වීමට පටන් ගත්හ.

රොබාවෙක් දෙපළට, වටිනාකම් සහ ව්‍යුහයන්ගේ මෙකී අද්විතීය පරිවර්තනය, තවම එය සම්පූර්ණත්වයට පැමිණ නැති වුවත්, මනුෂ්‍ය චර්යාව පිළිබඳ වැදගත් න්‍යායික ඇඟවීම් සඳහා නිමිති කාරක වෙයි. "පාරිසරික, ජීව විද්‍යාත්මක හෝ සමාජ සංස්කෘතික නිශ්චායකයන් විසින් පවා හෝ ක්‍රියාවට යොදනු ලැබූ නිෂ්ක්‍රීය යන්ත්‍ර වෙසෙසක් ලෙසින් ජනතාවක් ගැන සිතීම වැරදිය. ඔවිහු වනාහි

අවස්ථාවන් හා සීමාවන් සහිත බිමක් හරහා ක්‍රියාශීලිව තීරණ ගනිමින් පාර සොයා ගෙන යන්නෝ වෙති. එහිදී ඔවිහු, තමන් විසින්ම නිර්මාණය කරන සහ ප්‍රතිනිර්මාණය කරන සංස්කෘතික යථාර්ථය තුළ පුද්ගල සහ සංස්කෘතික වශයෙන් නිශ්චය කෙරෙන ඉලක්ක හඹා යන්නෝය."

නිර්ඝාත දේශපාලන විද්‍යා පර්යාලෝකනයක් තුළින් බලද්දී වවුරානි අත්දැකීම, නිර්මාණශීලි නායකත්වය සතු පරිවර්තක විභවයන් පිළිබඳ ප්‍රබල සාක්ෂි සපයන සුළුය. වවුරානිවරුන්ට කළ හැකි දෙය වෘත්තියක් වශයෙන් සහ සමාජයට සේවයක් වශයෙන් දේශපාලන විද්‍යාවට ද කළ හැකිය. එහෙත් වවුරානිවරුන් ගේ සමාජය හෝ ලෝකය ඝාතන මුක්ත නැත, එබැවින් කළ යුතු දේ බොහෝය. වවුරානිවරුන් තුළ පසුව ඇතිවන සමහර ලේ වැගිරීම් ආරම්භ වූයේ බැහැරින් පැමිණ බලශක්ති ව්‍යාපෘතීන්වල නිරත වන කණ්ඩායම් වල නොමනා ක්‍රියාකාරීත්වය සහ අසල්වැසි කණ්ඩායම්වල ආක්‍රමණ යනාදිය හේතු කොට ගෙනය. ඉන් පෙනෙන්නේ සීමාසහිත ප්‍රදේශවල නිර්ඝාත පැවැත්ම ස්ථාපනය කළ හැකි මුත් එය තහවුරු කිරීමට, අහිංසාවාදී ජීවය සහ භාවිතාව විශ්වීය පදනමකින් ව්‍යාප්ත විය යුතු බවයි.

**ගෝලීය අත්‍යවශ්‍යකත්වය**

නිර්ඝාත දේශපාලන විද්‍යාව ගෝලීය විය යුතුය. සොයා පාද ගැනීම්, නිර්මාණශීලිත්වය, විවිධත්වය සහ ප්‍රතිඵලදායිත්වය වශයෙන් එය ගෝලීය විය යුතුය. ජීව ගුණය, විද්‍යාව, කුසලතා, කලාව ආයතනික ප්‍රකාශණයන් සහ සම්පත් කැප කිරීම් වශයෙන් එය ගෝලීය විය යුතුය. නිර්මාණශීලි නායකත්වය හඳු වඩා ගැනීම සහ මිහිපිට ජීවය ගෞරවයෙන් යුතුව සුරක්ෂිත කිරීමට ඇප කැප වන්නා වූ සියළු දෙනා බලවත්ත කිරීම වශයෙන් එය ගෝලීය විය යුතුය. මනුෂ්‍ය අවශ්‍යතාවන්ට සංවේදී වෙමින් ගැටළු විසඳීම සඳහා වූ මෛත්‍රී සහගත කැපවීම වශයෙන් එය ගෝලීය විය යුතුය. සෑම තැනකම ඝාතනය නැවැත්වීම සඳහා වූ අධිෂ්ඨානය වශයෙන්, මන්ද යත් නොඑසේ නම් කිසිවෙකුත් ආරක්ෂිත නොවන බැවින්, එය ගෝලීය විය යුතුය. ප්‍රජා යහපැවැත්ම සඳහා වූ කැපවීම වශයෙන්, මන්ද යත් විශ්වීය යහපැවැත්මේ බීජාංකුර එහි අඩංගු බැවින්, එය ගෝලීය

විය යුතුය. තම සමාජයේ ද වෙනත් සමාජවලද ජනයාගේ නිර්සාත යහපැවැත්ම සඳහා අවශ්‍ය කෙරෙන විවිධත්වය සඳහා වූ ගෞරවයද, බහුවිධ "භක්තිවන්තභාවයන්" ද වශයෙන් එය ගෝලීය විය යුතුය. නිදහස, සමානාත්මතාවය, සෞභාග්‍යය සහ සාමය පූර්ණත්වයට පත්වීමට එරෙහිව ක්‍රියාත්මක වන මාරකත්ව යුගය අවසන් කිරීම සඳහා ඉගෙන ගන්නා, උගන්වන සහ ක්‍රියාත්මක වන සියළුදෙනා අතර අන්‍යොන්‍ය සහයෝගය හා ආධාරය වශයෙන් එය ගෝලීය විය යුතුය. සඳ මතු පිට සිට අපගේ පෘථිවි නිවහන දෙස බලන විට දුනෙන්නාක් මෙන් එය ගෝලීය විය යුතුය. සෑම මිනිස් ජීවිතයක්ම, ජීවයාගේ ක්ෂණික විද්‍යුත් ගිනි පුපුරකි. එහෙත් නිර්සාත ලෝකයකට දායක වීමට සියළුම දෙනාට විභවයක් ඇති හෙයින් නොවැදගත් කිසිවෙකුත් මේ මිහිපිට නැත. ගෝලීය ජීවිතය තුළින් මාරකත්වය ඉවත් කිරීමේ අරමුණ, ප්‍රචණ්ඩත්වය භාර ගන්නා දේශපාලන විද්‍යාවේ සංක්‍රාන්තියක් සලකුණු කරයි; සංක්‍රාන්තිය ආදරය, යහපැවැත්ම, සහ නිර්මාණාත්මක විභවයන්ගේ නිදහස් ප්‍රකාශණය උදෙසා වූ මූලික මානව අවශ්‍යතාවන්ට සංවේදී වන්නා වූ නිර්සාත විද්‍යාවක් කරාය.

**නිර්සාත සමාජය උදවිය හැකිද?**

**නිර්ඝාත දේශපාලන විද්‍යාවක් තිබිය හැකිද?**

**ඔව්!**

# ජාත්‍යන්තර දේශපාලන විද්‍යා සංගමය; ජාතික සංගම් - 1999

| Name | Year Founded (Predecessor Organization) | Membership |
|---|---|---|
| African Association of Political Science | 1974 (1973) | 1,360 |
| Argentine Association of Political Analysis | 1981 (1957) | 180 |
| Australasian Political Studies Association | 1966 (1952) | 425 |
| Austrian Political Science Association | 1970 (1951) | 537 |
| Flemish Political Science Association | 1979 (1951) | 450 |
| Association Belge de Science Politique/ Communauté Française de Belgique | 1996 (1951) | 50 |
| Brazilian Political Science Association | 1952 | * |
| Bulgarian Political Science Association | 1973 (1968) | 72 |
| Canadian Political Science Association | 1968 (1913) | 1,200 |
| Chilean Political Science Association | * | * |
| Chinese Association of Political Science | 1980 | 1,025 |
| Croatian Political Science Association | 1966 | 100 |
| Czech Political Science Association | 1964 | 200 |
| Danish Association of Political Science | 1960 | 350 |
| Finnish Political Science Association | 1935 | 550 |
| Association française de science politique | 1949 | 1,030 |
| German Political Science Association | 1951 | 1,300 |
| Hellenic Political Science Association | 1957 (1951) | 265 |
| Hungarian Political Science Association | 1982 (1968) | 468 |
| Indian Political Science Association | 1935 | 1,600 |
| Political Studies Association of Ireland | 1982 | 247 |
| Israel Political Science Association | 1950 | 250 |
| Italian Political Science Association | | 220 |

| | | |
|---|---|---|
| Japanese Political Science Association | | 1,278 |
| Korean Political Science Association | 1953 | 2,000 |
| Korean Association of Social Scientists | 1979 | 1,465 |
| Lithuanian Political Science Association | 1991 | 86 |
| Mexican Political Science Association | * | * |
| Dutch Political Science Association | 1966 (1950) | 350 |
| New Zealand Political Studies Association | 1974 | * |
| Nigerian Political Science Association | * | * |
| Norwegian Political Science Association | 1956 | 500 |
| Pakistan Political Science Association | 1950 | 300 |
| Philippine Political Science Association | * | * |
| Polish Association of Political Science | 1950 | 200 |
| Romanian Association of Political Science | 1968 | 188 |
| Russian Political Science Association | 1991 (1960) | 300 |
| Slovak Political Science Association | 1990 | 150 |
| Slovenian Political Science Association | 1968 | 220 |
| South African Political Studies Association | 1973 | 186 |
| Spanish Association of Political and Administrative Science | 1993 (1958) | 253 |
| Swedish Political Science Association | 1970 | 264 |
| Swiss Political Science Association | 1950 | 1,000 |
| Chinese Association of Political Science (Taipei) | 1932 | 350 |
| Political Science Association of Thailand | * | * |
| Turkish Political Science Association | 1964 | 120 |
| Political Studies Association of the UK | 1964 | 1,200 |
| American Political Science Association | 1903 | 13,300 |
| Association of Political Science of Uzbekistan | * | * |
| Venezuelan Political Science Association | 1974 | * |
| Yugoslav Political Science Association | 1954 | * |

Total: 35,689 +

*Data not provided.

Source: *Participation* (2000) 24/3: 24–32. Bulletin of the International Political Science Association / Bulletin de l'association internationale de science politique.

# ජාත්‍යන්තර දේශපාලන විද්‍යා සංගමය; ගවේෂණ ක්ෂේත්‍ර - 1997

**Main Fields**

Central Government
Area Studies
Legislatures
International Relations
Political Executives
International Law
Judicial Systems and Behaviour
Public Administration
Political Parties
Public Policy
Elections and Voting Behaviour
Local and Urban Politics
Pressure Groups
Women and Politics
Political Theory and Philosophy
Developmental Politics
Comparative Politics
Political Science Methods

**Research Committees**

Conceptual and Terminological Analysis
Political Elites

European Unification
Public Bureaucracies in Developing Societies
Comparative Studies on Local Government and Politics
Political Sociology
Women, Politics, and Developing Nations
Legislative Specialists
Comparative Judicial Studies
Global Policy Studies
Science and Politics
Biology and Politics
Democratization in Comparative Perspective
Politics and Ethnicity
Political Geography
Socio-Political Pluralism
The Emerging International Economic Order
Asian and Pacific Studies
Sex Roles and Politics
Political Finance and Political Corruption
Political Socialization and Education
Political Communication
Political Support and Alienation
Armed Forces and Society
Comparative Health Policy
Human Rights
Structure and Organization of Government
Comperative Federation and Federalism
Psycho-Politics
Comparative Public Opinion
Political Philosophy
Public Policy Analysis
Comparative Study of the Discipline of Political Science
Comparative Representation and Electoral System
Technology and Development
Political Power
Rethinking in Political Development
Politics and Business

**Study Groups**

The Welfare State and Developing Societies
Public Enterprises and Privatization
New World Orders
Geopolitics
System Integration of Divided Nations
Religion and Politics
Military Rule and Democratization in the Third World
International Data Development
Politics of Global Environmental Change
Local-Global Relations
Administrative Culture
Socialism, Capitalism and Democracy

Source: *Participation* (1997) 21 (3): 53.

*උප ග්‍රන්ථය C*

## ඇමෙරිකානු දේශපාලන විද්‍යා සංගමය; ගවේෂණ ක්ෂේත්‍ර - 1998

**General Fields (Members on APSA mailing list)**

American Government and Politics (4,265)
Comparative Politics (4,340)
International Politics (3,450)
Methodology (1,062)
Political Philosophy and Theory (2,119)
Public Administration (1,240)
Public Law and Courts (1,032)
Public Policy (2,391)

**Subfields**

Advanced Industrial Societies
Africa
African American Politics
Asian American Politics
Australia
Balkans
Baltics
Bureaucracy and Organizational Behavior
Canada
Caribbean
Central America
Central Asia

China
Civil Rights and Liberties
Conflict Processes
Congress
Constitutional Law and Theory
Criminal Justice
Defense
Developing Nations
East Asia
Economic Policy
Education Policy
Electoral Behavior
Electoral Systems
Energy Policy
Environmental Policy
Ethnic and Racial Politics
Evaluation Research
Executive Politics
Federalism and Intergovernmental Relations
Feminist Theory
Foreign Policy
France
Gender Politics and Policy
Germany
Great Britain
Health Care
History and Politics
Housing
Immigration Policy
India
International Law and Organizations
International Political Economy
International Security
Japan
Judicial Politics

Labor Policy
Latin America
Latino Politics
Leadership Studies
Legislative Studies
Lesbian and Gay Politics
Life Sciences and Politics
Literature and Politics
Mexico
Middle East
Native American Politics
Normative Political Theory
North America
Political Behavior
Political Communication
Political Development
Political Economy
Political Parties and Organizations
Political Psychology
Political Thought: Historical
Positive Political Theory
Post Communist Europe
Post Soviet Region
Presidency
Public Finance and Budgeting
Public Opinion
Regulatory Policy
Religion and Politics
Research Methods
Russia
Scandinavia
Science and Technology
Social Movements
Social Welfare
South Africa

South America
South Asia
Spain
State Politics
Trade
Ukraine
United States
Urban Politics
Western Europe
Women and Politics

**Sections (Members on mailing list)**

Federalism and Intergovernmental Relations (386)
Law and Courts (757)
Legislative Studies (589)
Public Policy (791)
Political Organizations and Parties (540)
Public Administration (612)
Conflict Processes (281)
Representation and Electoral Systems (326)
Presidency Research (394)
Political Methodology (585)
Religion and Politics (415)
Urban Politics (394)
Science, Technology and Environmental Politics (327)
Women and Politics (560)
Foundations of Political Theory (531)
Computers and Multimedia (238)
International Security and Arms Control (441)
Comparative Politics (1,372)
*Politics and Society in Western Europe (390)*
State Politics and Policy (362)
Political Communication (381)
Politics and History (585)

Political Economy (612)
Ecological and Transformational Politics (248)
New Political Science (248)
Political Psychology (299)
Undergraduate Education (329)
Politics and Literature (275)
Domestic Sources of Foreign Policy (310)
Elections, Public Opinion and Voting Behavior (632)
Race, Ethnicity and Politics (442)

Source: American Political Science Association, *Mailing Lists to Reach Political Scientists,* 1998.

*උප ග්‍රන්ථය D*

## දෙවන ලෝක යුද්ධයේ දී හෘදය සාක්ෂියේ පදනම් මත හමුදා සේවයට විරුද්ධ වූ සාමාජිකයන් සහිත ආගමික කුලක

(මහජන සේවා කඳවුරු කරා ගිය සාමාජිකයන් ප්‍රමාණය ඉදිරියෙන් දැක්වේ).

| | |
|---|---|
| Advent Christian | 3 |
| African Methodist Episcopal | 1 |
| Ambassadors of Christ | 1 |
| Antinsky Church | 1 |
| Apostolic | 2 |
| Apostolic Christian Church | 3 |
| Apostolic Faith Movement | 2 |
| Assemblies of God | 32 |
| Assembly of Christians | 1 |
| Assembly of Jesus Christ | 1 |
| Associated Bible Students | 36 |
| Baptist, Northern | 178 |
| Baptist, Southern | 45 |
| Berean Church | 1 |
| Bible Students School | 1 |
| Body of Christ | 1 |
| Brethren Assembly | 1 |
| Broadway Tabernacle | 1 |
| Buddhist | 1 |
| Calvary Gospel Tabernacle | 1 |
| Catholic, Roman | 149 |
| Christadelphians | 127 |
| Christian Brethren | 1 |

| | |
|---|---|
| Christian Catholic Apostolic | 1 |
| Christian Convention | 1 |
| Christian Jew | 1 |
| Christian & Missionary Alliance | 5 |
| Christian Missionary Society | 1 |
| Christian Scientist | 14 |
| Christ's Church | 1 |
| Christ's Church of the Golden Rule | 3 |
| Christ's Followers | 1 |
| Christ's Sanctified Holy Church | 2 |
| Church (The) | 1 |
| Church of the Brethren | 1,353 |
| Church of Christ | 199 |
| Church of Christ Holiness | 1 |
| Church of Christian Fellowship | 1 |
| Church of England | 1 |
| Church of the First Born | 11 |
| Church of the Four Leaf Clover | 1 |
| Church of the Full Gospel, Inc. | 1 |
| Church of God of Abrahamic Faith | 13 |
| Church of God of Apostolic Faith | 4 |
| Church of God Assembly | 1 |
| Church of God in Christ | 12 |
| Church of God, Guthrie, Okla. | 5 |
| Church of God, Holiness | 6 |
| Church of God, Indiana | 43 |
| Church of God & Saints of Christ | 12 |
| Church of God, Sardis | 1 |
| Church of God, Seventh Day | 21 |
| Church of God, Tennessee (two bodies) | 7 |
| Church of God (several bodies) | 33 |
| Church of the Gospel | 1 |
| Church of Jesus Christ | 1 |
| Church of Jesus Christ, Sullivan, Indiana | 15 |

| | |
|---|---|
| Church of Light | 1 |
| Church of the Living God | 2 |
| Church of the Lord Jesus Christ | 1 |
| Church of the Open Door | 1 |
| Church of the People | 1 |
| Church of Radiant Life | 1 |
| Church of Truth (New Thought) | 1 |
| Circle Mission (Father Divine) | 10 |
| Community Churches | 12 |
| Congregational Christian | 209 |
| Defenders | 1 |
| Disciples Assembly of Christians | 1 |
| Disciples of Christ | 78 |
| Dunkard Brethren | 30 |
| Doukhobor (Peace Progressive Society) | 3 |
| Elim Covenant Church | 1 |
| Emissaries of Divine Light | 1 |
| Episcopal | 88 |
| Essenes | 5 |
| Ethical Culture, Society of | 3 |
| Evangelical | 50 |
| Evangelical-Congregational | 2 |
| Evangelical Mission Convent (Swedish) | 11 |
| Evangelical & Reformed | 101 |
| Evangelistic Mission | 3 |
| Faith Tabernacle | 18 |
| Federated Church | 1 |
| Filipino Full Gospel | 1 |
| Fire Baptized Holiness | 3 |
| First Apostolic | 1 |
| First Century Gospel | 28 |
| First Divine Association in America, Inc. | 16 |
| First Missionary Church | 2 |
| Followers of Jesus Christ | 4 |

| | |
|---|---|
| Four Square Gospel | 2 |
| Free Holiness | 3 |
| Free Methodist | 6 |
| Free Pentecostal Church of God | 4 |
| Free Will Baptist | 2 |
| Friends, Society of (Quakers) | 951 |
| Full Gospel Conference of the World, Inc. | 4 |
| Full Gospel Mission | 3 |
| Full Salvation Union | 1 |
| Galilean Mission | 1 |
| German Baptist Brethren | 157 |
| German Baptist Convention of North America | 4 |
| Glory Tabernacle | 2 |
| God's Bible School | 1 |
| Gospel Century | 1 |
| Gospel Chapel | 2 |
| Gospel Hall | 1 |
| Gospel Meeting Assembly | 1 |
| Gospel Mission | 2 |
| Gospel Tabernacle | 2 |
| Gospel Temple | 1 |
| Grace Chapel | 1 |
| Grace Truth Assembly | 1 |
| Gracelawn Assembly | 1 |
| Greek Apostolic | 1 |
| Greek Catholic | 1 |
| Greek Orthodox | 1 |
| Hepzibah Faith | 6 |
| Hindu Universal | 1 |
| Holiness Baptist | 1 |
| Holiness General Assembly | 1 |
| House of David | 2 |
| House of Prayer | 1 |
| Humanist Society of Friends | 2 |

| | |
|---|---|
| Immanuel Missionary Association | 13 |
| Independent Assembly of God | 2 |
| Independent Church | 2 |
| Institute of Religious Society & Philosophy | 1 |
| Interdenominational | 16 |
| International Missionary Society | 2 |
| Jehovah's Witnesses | 409 |
| Jennings Chapel | 9 |
| Jewish | 60 |
| Kingdom of God | 1 |
| Kingdom Missionaries | 1 |
| Latin American Council of Christian Churches | 1 |
| Lemurian Fellowship | 9 |
| Lord our Righteousness | 1 |
| Lutheran (nine synods) | 108 |
| Lutheran Brethren | 2 |
| Mazdaznam | 1 |
| Megiddo Mission | 1 |
| Mennonites | 4,665 |
| Methodist | 673 |
| Missionary Church Association | 8 |
| Moody Bible Institute | 2 |
| Mormons (Church of Jesus Christ of Latter Day Saints | 10 |
| Moravian | 2 |
| Moslem | 1 |
| Multnomah School of the Bible | 2 |
| National Baptist Convention, U.S.A., Inc. | 5 |
| National Church of Positive Christianity | 5 |
| Nazarene, Church of the | 23 |
| New Age Church | 3 |
| Norwegian Evangelical Free Church | 2 |
| Old German Baptist | 7 |
| Open Bible Standard | 1 |
| Orthodox Parsee Z. | 2 |

| | |
|---|---|
| Overcoming Faith Tabernacle | 1 |
| Oxford Movement | 1 |
| Pentecostal Assemblies of Jesus Christ | 1 |
| Pentecostal Assemblies of the World | 3 |
| Pentecostal Assembly | 2 |
| Pentecostal Church, Inc. | 2 |
| Pentecostal Evangelical | 1 |
| Pentecostal Holiness | 6 |
| People's Christian Church | 1 |
| People's Church | 3 |
| Pilgrim Holiness | 3 |
| Pillar of Fire | 1 |
| Pillar and Ground of the Truth | 1 |
| Placabel Council of Latin Am. Churches | 1 |
| Plymouth Brethren | 12 |
| Plymouth Christian | 1 |
| Presbyterian, U.S | 5 |
| Presbyterian, U.S.A. | 192 |
| Primitive Advent | 2 |
| Progressive Brethren | 1 |
| Quakertown Church | 1 |
| Reading Road Temple | 1 |
| Reformed Church of America (Dutch) | 15 |
| Reformed Mission of the Redeemer | 1 |
| Rogerine Quakers (Pentecostal Friends) | 3 |
| Rosicrusian | 1 |
| Russian Molokan (Christian Spiritual Jumpers) | 76 |
| Russian Old Testament Church | 1 |
| Saint's Mission | 1 |
| Salvation Army | 1 |
| Sanctified Church of Christ | 1 |
| Scandinavian Evangelical | 1 |
| Schwenkfelders (Apostolic Christian Church, Inc. | 1 |
| School of the Bible | 1 |

| | |
|---|---|
| Serbian Orthodox | 1 |
| Seventh Day Adventist | 17 |
| Seventh Day Adventist, Reformed | 1 |
| Seventh Day Baptist | 3 |
| Shiloh Tabernacle | 1 |
| Spanish Church of Jesus Christ | 1 |
| Spiritual Mission | 1 |
| Spiritualist | 1 |
| Swedenborg | 1 |
| Taoist | 1 |
| Theosophists | 14 |
| Trinity Tabernacle | 1 |
| Triumph the Church & Kingdom of God in Christ | 1 |
| Triumph Church of the New Age | 1 |
| True Followers of Christ | 1 |
| Truelight Church of Christ | 1 |
| Twentieth Century Bible School | 5 |
| Unitarians | 44 |
| Union Church (Berea, Ky.) | 4 |
| Union Mission | 1 |
| United Baptist | 1 |
| United Brethren | 27 |
| United Christian Church | 2 |
| United Holiness Church, Inc. | 1 |
| United Holy Christian Church of America | 2 |
| United International Young People's Assembly | 2 |
| United Lodge of Theosophists | 2 |
| United Pentecostal Council of the Assemblies of God in America | 1 |
| United Presbyterian | 12 |
| Unity | 3 |
| Universal Brotherhood | 1 |
| Universalist | 2 |
| War Resister's League | 46 |
| Wesleyan Methodist | 8 |

| | |
|---|---|
| World Student Federation | 2 |
| Young Men's Christian Association (YMCA) | 2 |
| Zoroastrian | 2 |
| Total affiliated with denominations: | 10,838 |
| Non-affiliated | 449 |
| Denominations unidentified | 709 |
| **Total:** | **11,996** |

Source: Anderson 1994: 280-6. Cf. Selective Service System 1950: 318-20

# ආශ්‍රිත ග්‍රන්ථ


ACKERKNECHT, ERWIN H. 1982. *A Short History of Medicine.* Baltimore: Johns Hopkins University Press.

ACKERMAN, Peter and DUVALL, Jack. 2000. *A Force More Powerful: A Century of Nonviolent Conflict.* New York: St. Martin's Press.

_____ and KRUEGLER, C. 1994. *Strategic Nonviolent Conflict.* Westport, Conn.: Praeger.

ADAMS, DAVID *et al.* 1989. Statement on violence. *Journal of Peace Research,* 26: 120–21.

_____ 1997. War is not in our biology: a decade of the Seville statement on violence. In Grisolía et al. 1997: 251–56.

ALMOND, GABRIEL A. 1996. Political science: the history of the discipline. In Goodin and Klingemann 1996: 50–96.

ALPEROVITZ, GAR. 1995. *The Decision to Use the Atomic Bomb.* New York: Alfred A. Knopf.

AMATO, JOSEPH A. 1979. Danilo Dolci: a nonviolent reformer in Sicily. In Bruyn and Rayman 1979: 135–60.

AMNESTY INTERNATIONAL. 2000. *The Death Penalty,* ACT 50/05/00, April 2000.

ANDERSON, RICHARD C. 1994. *Peace Was In Their Hearts: Conscientious Objectors in World War II.* Watsonville, Calif.: Correlan Publications.

AQUINO, CORAZON C. 1997. Seeds of nonviolence, harvest of peace: The Philippine revolution of 1986. In Grisolía *et al.* 1997: 227–34.

ARENDT, HANNAH. 1970. *On Violence.* New York: Harcourt, Brace & World.

_____ 1982. *Lectures on Kant's Political Philosophy.* Chicago: University of Chicago Press.

ARISTOTLE. 1962. *The Politics*, trans. T.A. Sinclair. Harmondsworth: Penguin.

ASHE, GEOFFREY. 1969. *Gandhi*. New York: Stein and Day.

AUNG SAN SUU KYI. 1998. *The Voice of Hope*. New York: Seven Stories Press.

BAHÁ'U'LLÁH. 1983. *Gleanings from the Writings of Bahá'u'lláh*. Wilmette, Ill.: Bahá'í Publishing Trust.

BANERJEE, MUKULIKA. 2000. *The Pathan Unarmed*, Karachi & New Delhi: Oxford University Press.

BARBEY, CHRISTOPHE. 2001. *La non-militarisation et les pays sans armée*: une réalité! Flendruz, Switzerland: APRED.

BAXTER, ARCHIBALD. 2000. *We Will Not Cease*. Baker, Ore.: The Eddie Tern Press.

BEBBER, CHARLES C. 1994. Increases in U.S. violent crime during the 1980s following four American military actions. *Journal of Interpersonal Violence* 9(1): 109–16.

BEER, MICHAEL. 1994. Annotated bibliography of nonviolent action training. *International Journal of Nonviolence*, 2: 72–99.

BEISNER, ROBERT L. 1968. *Twelve Against Empire: The Anti-Imperialists, 1898–1900*. New York: McGraw-Hill.

BENDAÑA, ALEJANDRO. 1998. "From Guevara to Gandhi." Managua, Nicaragua: Centro de Estudios Internationales.

BENNETT, LERONE JR. 1993. *Before the Mayflower: A History of Black America*. New York: Penguin Books.

BHAVE, VINOBA. 1963. *Shanti Sena*, 2nd ed., trans Marjorie Sykes. Rajghat, Varanasi, India: Sarva Seva Sang Prakashan.

_____ 1994. *Moved by Love: The Memoirs of Vinoba Bhave*, trans. Marjorie Sykes. Hyderabad: Sat Sahitya Sahayogi Sangh.

BING, ANTHONY G. 1990. *Israeli Pacifist: The Life of Joseph Abileah*. Syracuse, N.Y.: Syracuse University Press.

